සුරක්ෂිත සිහින
ප්‍රබෝධිත ජීවිත



වාර්ෂික **2020** වාර්තාව

HDFC BANK
The Bank for your Home

ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බැංකුව

අතොරක්
නොමැති
විවිධ ජීවිත
අභියෝග හමුවේ
අපි අපගේ ගනුදෙනුකාර
භවතුන්ගේ ජීවන අභිලාෂ සුරක්ෂිත
කරමින් හා ජීවිත පුබුදුවාලමින් දශක
තුනකට අධික කාලයක් තිස්සේ ඔවුන් අසලම
රැඳී සිටින්නෙමු.

පරිවර්තනීය ගමන් මගක් වෙත අප අවතීර්ණ වී සිටින මේ
මොහොත වන විට කර්මාන්තය ආශ්‍රිත වෙනස්කම් සහ පරිභෝගික
අපේක්ෂාවන්ට ඔබින පරිදි විවිධ නව අවස්ථා සහ නවෝත්පාදනීය
තාක්ෂණයන්හි ඵල නෙළා ගැනීමට අප පියවර ගෙන තිබේ.

අපගේ ගනුදෙනුකාර භවතුන්ගේ සහ ආයෝජකයන්ගේ අභිලාෂ
නොකඩවා සුරක්ෂිත කෙරෙන බව හා ඔවුන්ගේ අපේක්ෂාවන්
පුබුදුවාලනු ලැබෙන බව සහතික කරනු පිණිස මනා ලෙස බණ්ඩනය
කරන ලද සේවා කළඹක් පවත්වා ගැනීමේ පරමාර්ථය පෙරදැරි කර
ගනිමින් විවිධාංගීකෘත මූල්‍ය විසඳුම් හඹා යාමට එච්ඩීඑෆ්සී බැංකුවේ
අපි නිරතුරුව කටයුතු කරන්නෙමු. එමෙන් ම, මෙම අතිශය අභියෝග
කර කාල වකවානුවෙහි අපගේ පාර්ශ්වකරුවන් සමග එක්ව නැඟී
සිටීම තුළින් අපගේ සේවාවන් ශ්‍රී ලාංකිකයන් සියලු ම දෙනා වෙත
නගා සිටුවමින් ඔවුන්ගේ මූල්‍යමය අභිලාෂ වෙනුවෙන් සේවා සැලසීම
හා පරිවර්තනීය විධිවිධාන ක්‍රියාවට නැංවීම වෙනුවෙන් අපි ස්ථිරසාර
කැපවීමක් ප්‍රකට කරන්නෙමු.

සුරක්ෂිත සිහින
ප්‍රබෝධිත ජීවිත

අන්තර්ගතය



එච්ඩීඑෆ්සී බැංකුවේ 2020 වසර සඳහා වූ වාර්ෂික වාර්තාවේ අන්තර්ජාල අනුවාදය https://www.hdfc.lk/ වෙතින් ලබා ගන්න.

කවරයේ කතාව 1
වාර්තාව ගැන 3
ප්‍රමාණවත්භාවය 6
මූල්‍යමය තොරතුරු සැකෙවින් 8
මෙහෙයුම් පිළිබඳ විස්තර කරුණු 10

11 - 28
උපායමාර්ගික රාමුව

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් 12
එච්ඩීඑෆ්සී පිළිබඳව කෙටියෙන් 13
අපගේ ගමන් මග 14
වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය 15
තිරසාරතාව කෙරෙහි අවධානය 18
පාර්ශ්වකාර දායකත්වය 20
ව්‍යාපාරික අංශ 22
ශාඛා ව්‍යාප්තිය 27
උපායමාර්ගික දැක්ම (2021-2025) 28

29 - 57
ආයතනික කළමනාකාරිත්වය

සභාපතිතුමියගේ වාර්තාව 30
ප්‍ර.වි.නි./කළ. අධ්‍යක්ෂගේ සමාලෝචනය 34
අධ්‍යක්ෂ මණ්ඩලය 38
ආයතනික කළමනාකාරිත්වය 48
අංශ ප්‍රධානීන් 54
ප්‍රාදේශීය සහ ශාඛා කළමනාකාරවරු 56

58 - 141
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

මෙහෙයුම් පරිසරය 59
ප්‍රාග්ධන වාර්තා
- මූල්‍ය ප්‍රාග්ධනය 61
- සමාජ හා සබඳතා ප්‍රාග්ධනය 65
- මානව ප්‍රාග්ධනය 73
- බුද්ධිමය ප්‍රාග්ධනය 81
- නිෂ්පාදිත ප්‍රාග්ධනය 84
- ස්වභාවික ප්‍රාග්ධනය 86

ආයතනික පාලනය සහ
- අවදානම් අනුකූලතාව පිළිබඳ සභාපතිතුමියගේ වාර්තාව 88
- ආයතනික පාලනය 89
- අවදානම් කළමනාකරණ වාර්තාව 119

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 124
මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 128
අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ සහතිකකරණ වාර්තාව 130
ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ සහතිකකරණ වාර්තාව 132
අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා 134

142 - 191
මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 143
විගණකාධිපති වාර්තාව 145
ආදායම් ප්‍රකාශනය 152
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 153
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 154
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 155
ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය 156
ගිණුම්කරණ ප්‍රතිපත්ති 157
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 167

192 - 202
අතිරේක තොරතුරු

මූල්‍ය උපකරණ මිනුම්ගත කිරීම 193
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව 195
ශේෂ පත්‍රයේ නිරාවරණය මත ගලපන ලද අවදානම - රු. 000' 196
කොටස් තොරතුරු 198
අගය එකතු කිරීමේ ප්‍රකාශනය 201
දස වාර්ෂික සාරාංශය 202
ආයතනික තොරතුරු පසු කවරයේ ඇතුලු පැත්ත

වාර්තාව ගැන

ප්‍රමුඛ පරමාර්ථය

ගත වූ වසරවල වාර්ෂික වාර්තාවලදී මෙන්ම 2020 වාර්ෂික වාර්තාවෙහි පරමාර්ථය වන්නේ ද විශේෂයෙන්ම බැංකු මෙහෙයුම් වෙනුවෙන් ප්‍රාග්ධනය ඵලදායීව වෙන් කිරීමේදී කොටස් හිමියන් හට සහාය වනු පිණිස අංග සම්පූර්ණ තොරතුරු ලබා දීම තුළින් පාර්ශ්වකරුවන් සියලුම දෙනා සවි ගැන්වීමේ අරමුණට අනුගත වන අතරම සංගතභාවයකින් යුතු හා විස්තීර්ණ වාර්තාකරණයක් සිදු කිරීමයි.

ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන ස්වරූප දෙකම අතින් විස්තරාත්මක ලෙස තොරතුරු ලබා දීමේ අරමුණින් මෙම ඒකාබද්ධ වාර්තාව පිළියෙළ කර ඇති අතර මූල්‍ය තොරතුරු අතරට 2020 වසරේ කාර්යසාධනයට අදාළ වෛතිහාසික දත්ත ද ඇතුළත් වේ.

ඒකාබද්ධ ප්‍රවේශය

2005 වසරේදී කොළඹ කොටස් හුවමාරුවෙහි ලියාපදිංචි වීමත් සමගින් අප බැංකුවේ වාර්තාකරණ ගමන් මග ආරම්භ විය. එච්ඩිඑෆ්සී බැංකුවේ ඒකාබද්ධ වාර්තාකරණ ගමන් මග ආරම්භ වූයේ 2010 දී පළ කරන ලද ''ජාතියට රැකවරණය සැපයීම'' (Sheltering the Nation) යන තේමාවෙන් යුතු වාර්තාව පළ කිරීමත් සමගිනි. එතැන් පටන් අප බැංකුව විසින් සිය වාර්ෂික වාර්තාව තුළට ඒකාබද්ධ චින්තන රටාවක් අන්තර්ග්‍රහණය කරන ලදි. විශේෂයෙන්ම, අප බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් සංවර්ධනයන් සන්නිවේදනය කිරීම සහ තොරතුරු බෙදා හැරීම ඊට ඇතුළත් වෙයි.

පරාසය සහ සීමාව

ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වූ මාස 12 ක කාල සීමාව ආවරණය කෙරෙන මෙම වාර්ෂික වාර්තාව මගින් බැංකුවේ මූල්‍ය සහ මූල්‍ය නොවන කාර්යසාධනය ඒකාබද්ධ හා සංගත ස්වරූපයකින් ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාව මගින් 2020 වසරට අදාළ වන වෛතිහාසික සිදුවීම් කෙරෙහි අවධානයක් යොමු කෙරෙනවා පමණක් නොව අනාගත දැක්ම පිළිබඳ පෙරදැක්මක් සැපයීමද සිදු කෙරේ. 2020 වර්ෂය සඳහා වූ වටිනාකම් නිර්මාණය කිරීම, මෙහෙයුම් කාර්යසාධනය, බාහිර ව්‍යාපාරික පරිසරය, බැංකුවේ ආයතනික පාලනය සහ අවදානම් පාලනය සහ අවදානම් කළමනාකරණය මෙන්ම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාව මගින් අවශ්‍යයෙන්ම සම්පාදනය කෙරේ.

කාලයා ඇවෑමෙන් පාර්ශ්වකරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන සැලකිය යුතු පැතිකඩ කිහිපයක් බැංකුව විසින් හඳුනා ගෙන තිබේ. මේ අනුව, මෙම වාර්තාවෙහි ඇතුළත් තොරතුරු එකී කාරණා සහ පාර්ශ්වකරුවන් වෙත ඍජුවම සම්බන්ධ වේ.

2019 වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අමතරව සමාගමේ මෙහෙයුම් පිළිබඳ සාකල්‍යවාදී දැක්මෙහි කොටසක් වශයෙන් අතිරේක තොරතුරුද ඇතුළත් කිරීමට අප බැංකුව පියවර ගත් අතර, වාර්තාකරණය සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රවේශයක් පවත්වාගෙන එය අනුගමනය කිරීමේදී

ස්වභාවික සහ නිෂ්පාදිත ප්‍රාග්ධනය ආදී පැතිකඩද මෙහි ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. අදාළ වන සෑම අවස්ථාවකදීම දීර්ඝ හා අතිරේක තොරතුරු හා දත්ත ගත වූ වර්ෂයේ වාර්තාව සමග සංසන්දනය කරමින් ඉදිරිපත් කිරීමටද අප බැංකුව කටයුතු කර ඇත. අතිරේක ප්‍රමාණාත්මක තොරතුරු සහ මානව ප්‍රාග්ධනය යන කොටසෙහි දක්වා ඇති විශ්ලේෂණයන් ආදී තොරතුරු ඊට ඇතුළත්වේ.

ප්‍රාග්ධනයන්

බැංකුව විසින් ප්‍රධාන ප්‍රාග්ධනයන් කළමනාකරණය කරනු ලැබෙන්නේ කෙසේද යන්න පිළිබඳ මනා සංගතභාවයකින් යුතු විග්‍රහයක් මෙම වර්තාව මගින් සැපයේ. මූල්‍ය ප්‍රාග්ධනයන් යටතේ මූල්‍ය ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සහ ඉන් අනතුරුව මානව ප්‍රාග්ධනය, සමාජ හා සබඳතා ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, නිෂ්පාදිත හා ස්වභාවික ප්‍රාග්ධනය ආදිය පිළිබඳ සංවර්ධනයන් ඇතුළු තොරතුරු ඇතුළත් කිරීම ඊට ඇතුළත් වේ.

තත්ත්ව සහතිකකරණය

වාර්තාකරණ පවරියන් පිළිබඳ වඩා හොඳ දැනුමක් හඹා යන අතරම පාර්ශ්වකරුවන් වෙතින් ලැබෙන ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් සෑම වසරකදීම වාර්ෂික වාර්තාවෙහි තත්ත්වය ඉහළ නැංවීමට එච්ඩිඑෆ්සී බැංකුව කටයුතු කරයි. විස්තර කෙරෙහි සමීප අවධානයක් යොමු කරමින් පාඨමය මෙන්ම රූපමය පැති කෙරෙහිද සැලකිල්ල දක්වමින් මෙම වාර්තාවෙහි ගුණාත්මක තත්ත්වය තක්සේරු කර තිබේ.

වාර්තාව පිළියෙළ කිරීමේ පදනම සහ පරාසය

මෙම වාර්තාව සකස් කර ඇත්තේ ජාත්‍යන්තර වාර්තාකරණ රාමුවේ අදාළ මූලධර්ම යොදා ගනිමිනි. මීට අමතරව, මෙම වාර්තාව සහ මෙහි මූල්‍යමය අන්තර්ගතය පිළියෙළ කිරීමේදී අප බැංකුව අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන රෙගුලාසි සහ අවශ්‍යතා කෙරෙහිද අවධානය යොමු කර ඇත.

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් වන අතර අදාළ නියමයන් සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මීට අමතරව, එච්ඩිඑෆ්සී බැංකුව පහත දැක්වෙන නියාමන, අනුකූලතා සහ අවදානම් පාදක කාර්ය රාමු හා රෙගුලාසි වෙතද අනුකූලතාව දක්වයි.

වාර්තාව ගැන

සමාගම සහ එහි මෙහෙයුම් පිහිටුවනු ලදුව පාලනය කරනු ලැබෙන්නේ 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත සහ ඉන් අනතුරුව ඊට සිදු කරන ලද සංශෝධන මගින් වන අතර එම පනත මගින් අප බැංකුව නිවාස පදනම් වූ මූල්‍ය සේවා ලබා දීමට බලය ඇති අධිකාරියක් ලෙස පිළිගනු ලැබෙයි. එමෙන්ම, බැංකුව ක්‍රියාත්මක විය යුතු පරාස සහ සීමාද එමගින් නිශ්චය කෙරේ.

මූලික වාර්තාකරණ රාමුව

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ (IIRC) ජාත්‍යන්තර ඒකාබද්ධ ඒකාබද්ධ වාර්තාකරණ රාමුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද වාර්තාකරණ මාර්ගෝපදේශ

මූල්‍ය වාර්තාකරණ රාමු

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
2. 1998 අංක 30 දරන බැංකු පනත සහ ඊට සිදු කරන ලද සංශෝධන
3. 2007 අංක 07 දරන සමාගම් පනත
4. 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත
5. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
6. 2005 අංක 5 දරන මුදල් පනත

අනුකූලතාව, ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශන රාමු

1. 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත
   (2003 අංක 15 දරන සංශෝධන පනත සහ 2011 අංක 45 දරන සංශෝධන පනත)
2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ නිසි පිළිවෙත් සංග්‍රහය
3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආයතනික පාලන අවශ්‍යතා
4. බලපත්‍රලාභී සුවිශේෂිත බැංකු සඳහා අදාළ වන 2007 අංක 12 දරන බැංකු පනතේ විධිවිධාන සහ ඊට පසුකාලීනව සිදු කර ඇති සංශෝධන
5. බාසල් III ප්‍රමිති යටතේ ඇති ප්‍රාග්ධන අවශ්‍යතා සහ 2016 අංක 1 දරන බැංකු පනතට අදාළ සංශෝධන
6. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති
7. 2007 අංක 07 දරන සමාගම් පනත
8. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති, 1978 අංක 36 දරන සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත

අනුකූලතාව

මෙහි මතුවට දැක්වෙන මූල්‍ය ප්‍රකාශන මගින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු සැපයෙන බව සහතික කරනු පිණිස ශ්‍රී ලංකා විගණකාධිපති ජනරාල් විසින් ඒවායෙහි නිරවද්‍යතාව සත්‍යාපනය කර තිබේ. ලබා දී ඇති තොරතුරුවල නිවැරදිභාවය සහ විශ්වසනීයත්වය සහතික කළ අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන් විසින්ද එම තොරතුරු අනුමත කර තිබේ.

තොරතුරු ලබා ගැනීම

මෙම වාර්තාව සඳහා උපයෝගී කරගෙන ඇති තොරතුරු බැංකු වාර්තා සහ අදාළ ලිපි ලේඛනවලට අමතරව ඉහළ හා මධ්‍ය කළමනාකරණ නිලධාරීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මාලාවක් ඔස්සේ එක්රැස් කරගෙන තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර ආර්ථික හා මූල්‍ය ආයතන විසින් පළ කර ඇති විශ්වසනීය බාහිර ලේඛන උපයෝගී කරගෙන මෙහි ආර්ථික සංවර්ධනයන් හා බැංකුකරණ අංශය පිළිබඳ තොරතුරු සම්පාදනය කර ඇත.

ඉදිරිගාමී මූල්‍ය ප්‍රකාශන

මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිඵලවලට අදාළ ඉදිරිගාමී ප්‍රකාශන කිහිපයක්ම මෙම වාර්තාවට ඇතුළත් වේ. අනාගතයේදී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු කෙරෙහි අවධානය යොමු කරන මීළඟ වසර පහක කාලය සඳහා වූ උපායමාර්ගික සැලැස්ම එවැනි එක් ක්ෂේත්‍රයකි.

එවැනි ප්‍රකාශන සහ පුරෝකථනික සාධක අනාගත තත්ත්ව මත රඳා පවතින හෙයින් ඒවා ආශ්‍රිතව අවිනිශ්චිතතා ඉස්මතු වීමටද ඉඩ තිබේ. එවැනි අවිනිශ්චි සිදුවීම් නිසා අදාළ ප්‍රතිඵල ළඟාකර ගැනීමට මෙන්ම මූල්‍ය ප්‍රකාශන සහ ඒවායෙහි පැහැදිලි කර ඇති සහ/හෝ ගම්‍ය කර ඇති අපේක්ෂාවලින් වියුක්ත වීමටද ඉඩ තිබේ.

එකී ඉදිරිගාමී මූල්‍ය ප්‍රකාශනවලට වඩා සැලකිය යුතු තරමින් වෙනස් ප්‍රතිඵල උදා කළ හැකි බාහිර සාධක අතරම ආර්ථිකය මත පදනම් වන සංවර්ධනයන් සහ මූල්‍ය වෙළෙඳපොල අනුපාතික, විනිමය අනුපාත හා පොලී අනුපාත, නියාමන සාධක හා කර්මාන්තය ආශ්‍රිත ගතිකයන් ආදිය ඇතුළත් වේ. ණය දීමේ සහ ආයෝජන කටයුතුවලට අදාළ අවදානම් හා තරඟකාරීත්වය පිළිබඳ සාධක නිසාද අනාගතයේ දී එම ප්‍රතිඵල වෙනස් වීමට ඉඩ ඇත.

වසංගත තත්ත්ව සහ ක්ෂණික අනපේක්ෂිත සිදුවීම් වැනි පුරෝකථනය කළ නොහැකි සාධක නිසාද මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු කෙරෙහි බලපෑම් වල්ල විය හැකි අතර එම නිසා ඉහත කී ඉදිරිගාමී මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ප්‍රතිඵල සහ අපේක්ෂා වෙනසට බඳුන් විය හැක. මේ නිසා බැංකුව විගණක විසින් එවැනි ඉදිරිගාමී මූල්‍ය ප්‍රකාශන සියල්ලම සමාලෝචනය කර නොමැත.

වාර්තාකරණ මාධ්‍ය

කොටස් හිමියන් සහ සමස්ථ පාර්ශ්වකාර කණ්ඩායම් සමග සම්බන්ධ වීමේ මූලික සන්නිවේදන මෙවලමක් ලෙස සලකා මෙම වාර්ෂික වාර්තාවේ ඉංග්‍රීසි අනුවාදය සිංහල සහ දෙමළ භාෂා මාධ්‍යයන්ට පරිවර්තනය කරන ලදි. මෙම වාර්තාව රජයේ අමාත්‍යාංශ වෙත බෙදා හරින ලද අතර මෙහි ඉංග්‍රීසි අනුවාදය වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට අවස්ථාව උදා කිරීම සඳහා එය එච්ඩීඑෆ්සී බැංකුවේ නිල වෙබ් අඩවියෙහි පළ කර තිබේ.

ප්‍රතිපෝෂණ

අපගේ 2020 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය සහ ව්‍යුහය වැඩිදියුණු කිරීම සඳහා වැදගත් වන අදහස් සහ සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණු ඉදිරිපත් කරන ලෙස එච්ඩීඑෆ්සී බැංකුව මෙම වාර්තාව කියවන සියලුම දෙනා වෙත ඇරයුම් කරයි. මෙම වාර්තාව පිළිබඳ ප්‍රතිපෝෂණ මෙම ඇමතුම් විස්තර ඔස්සේ යොමු කළ හැක:

ප්‍රධාන මූල්‍ය නිලධාරී

අනුර හෙට්ටිආරච්චි මහතා

විද්‍යුත් තැපෑල: anura.h@hdfc.lk

දුරකතනය: +94 11 2356802, 2446241, 2447354

අපගේ ආයතනික වෙබ් අඩවිය ඔස්සේ මෙම වාර්තාව වෙත ප්‍රවේශ විය https://www.hdfc.lk/pages/abt_us/annual_reports.jsp

කරුණාකර, අතීත වාර්තා කියවීම සඳහා www.hdfc.lk to අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

ප්‍රමාණාත්මකතාව

ප්‍රමාණාත්මක කාරණා යනු ඕනෑම කාල සීමාවක් පුරාවට තම පාර්ශ්වකරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීමට බැංකුවට ඇති හැකියාව වෙත සැලකිය යුතු මට්ටමේ බලපෑමක් චිල්ල කළ හැකි හෝ එම හැකියාව වෙනස් කළ හැකි සාධක වේ. එවැනි සාධක නිරන්තර ඇගයීමට ලක් කිරීම තුළින් නිරතුරුව වෙනස් වන හෝ විකාසනය වන මෙන්ම නොවෙනස්ව, ස්ථාවරව පවතින සාධකද හඳුනා ගෙන සමාලෝචනය කිරීමට අපට හැකියාව ලැබේ. ගත වූ වසරේදී අභ්‍යන්තර සහ බාහිර යන පරිසර දෙක තුළම සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සිදු විය. වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි නිශ්චිතවම බලපෑමක් චිල්ල කළ හැකි පැතිකඩ ආශ්‍රිතව එකී වෙනස්කම් සිදුව ඇති අතර මේ නිසා ඒවා අපගේ කොටස් හිමියන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් කිරීම අපගේ වගකීමක් බවට පත් වේ.

එකී පැතිකඩ හඳුනා ගැනීම සඳහා උපයෝගී කරගන්නා ලද ක්‍රියාවලි

කෝවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙකී පැතිකඩ නැවත ඇගයීමට ලක් කිරීමට කළමනාකාරිත්වයට සිදු වූ අතර අලුතින් ඉස්මතු වූ සැලකිය යුතු මට්ටමේ තේමා කිහිපයක්ම සැලකිල්ලට භාජනය කරන ලදි.

පහත දැක්වෙන සෑම ක්ෂේත්‍රයක්ම සම්බන්ධයෙන් ගත් කල ඒවා නිසා අපගේ මෙහෙයුම් කෙරෙහි චිල්ල විය හැකි බලපෑම වෙත ඉහළ වැදගත්කමක් එච්ඩීඑෆ්සී බැංකුව ලබා දෙයි. මේ සෑම සාධකයක්ම ව්‍යාපාරික මෙහෙයුම් බිඳවැටීමට ලක් නොවීමට මෙන්ම ව්‍යාපාරික හා වෙළෙඳපොල තත්ත්ව වර්ධනය වීමට දායක වන හෙයින් ඒවායෙහි වැදගත්කම සහ බලපෑමේ මට්ටම හඳුනා ගනු පිණිස ගුණාත්මක හා ප්‍රමාණාත්මක තක්සේරුකරණයකට ලක් කරන ලදි.

HDFC BANK
The Bank for your Home

හඳුනා ගැනීම → ඇගයීම → ප්‍රමුඛතා සැකසීම → ඒකාබද්ධ කිරීම

ප්‍රමාණාත්මකතා අවධානය	මෙම වාර්තාවෙහි අදාළ ක්ෂේත්‍ර වෙත යොමුව
ආදායම සහ ලාභදායීතාව	මූල්‍ය තොරතුරු
මෙහෙයුම් පිරිවැය අඩු වීම	මූල්‍ය ප්‍රාග්ධන වාර්තාව
කොටස් හිමියන් සඳහා වූ ලාභාංශ	මූල්‍ය ප්‍රකාශන සහ ඒවාට අදාළ සටහන්
මූල්‍ය ඒකාබද්ධතාව	
සවිමත් මූල්‍ය කළමනාකරණය	
අවදානම් කළමනාකරණය	අවදානම් කළමනාකරණ වාර්තාව
අක්‍රිය ණය අනුපාතය සහ ණය තත්ත්වය	
ණය කළමනාකරණය සහ ණය ඇගයීම	
නියාමන මාර්ගෝපදේශ සහ කාර්ය රාමු	ආයතනික පාලන වාර්තාව
පාලනය	ආයතනික පාලන වාර්තාව
උපායමාර්ගික සැලැස්ම සැකසීම සහ ක්‍රියාවට නැංවීම	උපායමාර්ගික දැක්ම
තිරසාරතා පිළිවෙත්	තිරසාරතාව කෙරෙහි අවධානය
කෝවිඩ්-19 ට රෙහි සෞඛ්‍ය හා සුරක්ෂිතතා විධිවිධාන	මානව ප්‍රාග්ධන වාර්තාව
දුරස්ථ වැඩ	
නව බඳවා ගැනීම් සහ සේවකයන් රඳවා ගැනීම	
පුහුණු හා සංවර්ධන	
දියුණුව හා අනුප්‍රාප්තිකයින් පත් කිරීම	
පාරිතෝෂික සහ කාර්යසාධනය පිළිගැනීම	
වැටුප් හා ගෙවීම්	
දිරිගන්වන සේවා ස්ථානය	
සමාන අවස්ථා	
ඒකාබද්ධතාව සහ විනිවිදභාවය	
සේවක දායකත්වය	
සුභසාධනය	
වෘත්තීය සමිතිය සමග ඇති සබඳතා	

ප්‍රමාණාත්මකතා අවධානය	මෙම වාර්තාවෙහි අදාළ ක්ෂේත්‍ර වෙත යොමුව
සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතභාවය	සමාජ හා සබඳතා ප්‍රාග්ධන වාර්තාව
මූල්‍යමය වශයෙන් අවවරප්‍රසාදිත පුද්ගලයන් සඳහා වූ ඉතුරුම් හා ණය දීම්	
මූල්‍යමය අන්තර්ගෘහිතභාවය	
නිෂ්පාදන විවිධත්වය	
සිල්ලර නාලිකා	
ඩිජිටල් නාලිකා	
නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගීකරණය	
වෙළෙඳපොල සංවර්ධනය	
පාරිභෝගික සේවාව	
වෙළෙඳපොල සහ සන්නිවේදන නාලිකා	
ව්‍යාපාරික අඛණ්ඩතාව	
හවුල්කරුවන් සහ සැපයුම්කරුවන් සඳහා දිරිගැන්වීම්	
හවුල්කාර සහ සැපයුම්කාර සබඳතා	
වෙළෙදාම් සහ කර්මාන්ත සංවර්ධනය	
නූතන තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් තාක්ෂණයන්	බුද්ධිමය ප්‍රාග්ධන වාර්තාව
මෙහෙයුම්වලට සහාය දැක්වීම සඳහා භෞතික වත්කම්	නිෂ්පාදිත ප්‍රාග්ධන වාර්තාව
සවිඥානික බලශක්ති පරිභෝජනය	ස්වභාවික ප්‍රාග්ධන වාර්තාව
පරිසරය සුරක්ෂිත කිරීම	
පුනර්ජනනීය බලශක්තිය	

මූල්‍යමය තොරතුරු සැකෙවින්

	2020 රු. මිලියන	2019 රු. මිලියන	වෙනස %
වසරට අදාළ ප්‍රතිඵල			
ආදායම	7,856	8,090	(3)
බදු අය කිරීමට පෙර ලාභය	1,381	1,244	11
බදු සඳහා ප්‍රතිපාදන	673	769	(12)
බදු අය කිරීමට පසු ලාභය	708	476	49
රජයට ලැබුණු ආදායම	679	774	(12)
දළ ලාභාංශ			
වසර අවසානයේදී			
කොටස් හිමි අරමුදල	5,782	5,119	13
ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු තැන්පතු	47,947	42,504	13
ගනුදෙනුකරුවන්ට ලබා දුන් දළ ණය හා අත්තිකාරම්	42,637	42,360	1
වත්කම්වල එකතුව	61,030	55,955	9
සාමාන්‍ය කොටසකට සාපේක්ෂව තොරතුරු			
ඉපයීම් (මූලික) (රු.)	10.94	7.35	49
මූල්‍ය අනුපාත			
කොටස් හිමි අරමුදල් සාමාන්‍යය මත ලාභය (%)	12.99	9.63	3.36
වත්කම් සාමාන්‍යය මත ලාභය (%)	1.21	0.90	0.31
මුළු වත්කම්වලට කොටස් හිමියන්ගේ සාමාන්‍ය කොටස් (%)	9.47	9.15	0.32
ව්‍යවස්ථාපිත අනුපාත			
ද්‍රවශීල වත්කම් (%)	37.20	26.07	11.13
පොදු කොටස් ස්ථර 1 ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාව 7.00%	19.34%	18.21%	1.13
මුළු ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය - අවම අවශ්‍යතාව - 8.50%	20.20%	19.14%	1.06
මුළු ප්‍රාග්ධන අනුපාතය - අවම අවශ්‍යතාව - 12.50%	20.67%	19.14%	1.53
වෙනත් තොරතුරු			
ශාඛා	39	39	-
සේවකයන් (සේවක සංඛ්‍යාව)	633	647	(2)
ණය ශ්‍රේණිගත කිරීම - Fitch/Lanka Rating	BB+(lka) Stable	BB+(lka) Stable	

දළ ආදායම

රු. මිලියන 7,856/-



ශුද්ධ ලාභය

රු. මිලියන 708/-



මුළු වත්කම්

රු. මිලියන 61,030/-



මුළු තැන්පතු

රු. මිලියන 47,947/-



දළ ආදායමේ අඩු වීම

3%

මෙහි සමාලෝචනයට ලක් වන වස තුළ මුළු දළ ආදායම රු. බිලියන 7.86 ක් ලෙස වාර්තා විය.

ශුද්ධ ලාභයේ වර්ධනය

49%

වසර තුළ බදුවලට පසු ලාභ රු. මිලියන 708 ක් විය.

මුළු වත්කම් වර්ධනය

5 Bn.

මූල්‍ය වර්ෂය අවසාදනය වන විට මුළු වත්කම් 9.07% ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 61 දක්වා රු. බිලියන 5 කින් ඉහළ ගොස් ඇත.

මුළු තැන්පතු වර්ධනය

13%

2020 දෙසැම්බර් 31 වන විට සමාගම රු. බිලියන 47.95 ක් උපයා ගෙන තිබුණි. මුළු තැන්පතු පදනම

මෙහෙයුම් පිළිබඳ වැදගත් කරුණු

ගනුදෙනුකරුවන්

550,000+

විවිධාංගීකෘත වීඩීවීඑස්සී සේවා කළඹෙහි සේවය ලබයි

මුළු තැන්පතු ඉහළ යාම

13%

තැන්පතු රැස් කිරීම රු. බිලියන 48 දක්වා ඉහළ ගොස් ඇත.

ආයතනික ස්ථාවර තැන්පතු පහත බැසීම

3%

සුළු පරිමාණ ස්ථාවර තැන්පතුවල ඉහළ යාම

39%

මුළු වත්කම් ඉහළ යාම

Rs.5.0 Bn.

මෙරට ඉහළම පාරිභෝගික සන්නාම

100

අතරින් වක් සමාගමකි

උපායමාර්ගික

- 2021-2025 කාල වකවානුව සඳහා පංච වාර්ෂික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම උදෙසා සංකල්ප සහ ඇගයීම් සිදු කරන ලදි.
- ගෘහස්ථ ගැනුම්කරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට මූල්‍ය සහාය ලබා දීම සඳහා උපායමාර්ගික හවුල්කාරත්ව

ඩිජිටල්

- වැඩිදියුණු කරන ලද ඊ-බැංකුකරණ සේවා සමඟින් ඩිජිටල් ව්‍යාප්තිය ඉහළ නංවන ලදි.
- භෞතික මුදල් භාවිතයෙන් සහ ගැටීම්වලින් තොර ජංගම ගෙවීම් වෙනුවෙන් JustPay සමඟ හවුල්කාරත්වයක් ඇති කර ගන්නා ලදි.
- වීඩීවීඑස්සී ක්‍රෙඩිට් කාඩ්පත යොදා ගෙන POS ගනුදෙනු සිදු කිරීමට සහාය දැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදන ලදි.
- ජපානයේ JCB සහ Lanka Clear යන ආයතන සමඟ එක්ව වීඩීවීඑස්සී බැංකුවේ ජාත්‍යන්තර EMV චිපය පාදක ATM කාඩ් පත හඳුන්වා දීම සඳහා අවශ්‍ය විධිවිධාන සම්පූර්ණ කිරීම.

තැන්පතු

- සුළු පරිමාණ තැන්පතු රැස් කිරීම ඉහළ යාමත් සමඟ බැංකුවේ තැන්පතු පදනම ප්‍රශංසනීය ලෙස ඉහළ යාම.

ණය හා අත්තිකාරම්

- කෝවිඩ්-19 වසංගතයේ බලපෑමට ලක් විය ව්‍යාපාර සඳහා රු. මිලියන 56 ක කාරක ප්‍රාග්ධන ණය ලබා දීම.
- වසංගත තත්ත්වයේ බලපෑම හමුවේ මූල්‍ය සහන ලබා දීමක් වශයෙන් ගනුදෙනුකරුවන් 24,000 (ආසන්න වශයෙන්) ක් සඳහා ණය ප්‍රමාද සහන කාලයක් ලබා දෙන ලදි.

මෙහෙයුම්

- පිරිවැටුප් කාලය අඩු කරමින් ශාඛා සියල්ලම එකට සම්බන්ධ කෙරෙන වැඩිදියුණු කළ අන්තර්ජාල පාදක පද්ධති හරහා ණය උත්පාදන සහ සැකසීම් ක්‍රියාවලීන්හි කාර්යසාධනය ඉහළ නැංවීම.
- බැංකුවේ ණය දීමේ මෙහෙයුම් සඳහා වඩා කාර්යක්ෂම සහ සවිලදායී රක්ෂණ ක්‍රියාවලියක් පවත්වා ගනු පිණිස ණය හා සබැඳි රක්ෂණාවරණ ලබා ගැනීම උදෙසා බැංකු ශාඛා කාර්ය මණ්ඩලවලට හවුල්කාර රක්ෂණ සමාගම්වල ක්‍රියාවලීන් වෙත අන්තර්ජාලය හරහා ප්‍රවේශ වීමට ඇති හැකියාව.



උපායමාර්ගික රාමුව

දැක්ම

ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමේ පුරෝගාමී මූල්‍ය සේවා ආයතනය වීම අපගේ දැක්මයි.

මෙහෙවර

තිරසාර ජීවන තත්ත්ව උදෙසා මූල්‍ය විසඳුම් ලබා දීම සහ වටිනාකම් නිර්මාණය කිරීම වෙනුවෙන් ව්‍යවසායකයන්ට සහාය දැක්වීම උදෙසා කැපවීම අපගේ මෙහෙවරයි.

වටිනාකම්

- ආචාර ධාර්මිකභාවය
- සුචිලූ බව
- නම්‍යශීලී බව
- විවිධත්වයට ගරු කිරීම
- විනිවිදභාවය

එච්ඩීඑෆ්සී පිළිබඳව කෙටියෙන්

ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති එච්ඩීඑෆ්සී බැංකුව ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු ලෙස වර්ගීකරණය කෙරෙන බැංකු හය අතරින් එකකි.

අප විසින් ලබා දෙන සේවාවන්ටම සුවිශේෂී කාරණය වන්නේ අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු හා සංසන්දනය කිරීමේදී නිවාස මූල්‍ය සම්පාදනය කෙරෙහි අප බැංකුව දක්වන දැඩි අවධානය යි. එච්ඩීඑෆ්සී බැංකුවේ විශාලතම කොටස් හිමියා වන්නේ එහි සමස්ථ කොටස්වලින් 51% ක බහුතරයට හිමිකම් කියන ශ්‍රී ලංකා රජය වන අතර, ඉතිරි කොටස් 49% පෞද්ගලික අංශයේ කොටස් හිමියන් අතර බෙදී යයි.

ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස පදනම් වූ මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීම කෙරෙහි අප බැංකුවේ මූලික අවධානය යොමු වෙයි. රජයේ බහුතර හිමිකාරත්වය යටතේ පවතින බැංකුවක් වශයෙන් අඩු හා මධ්‍ය ආදායම්ලාභී පුද්ගලයන්ගේ ජීවන තත්ත්ව ඉහළ නංවන අතරම ග්‍රාමීය හා බිම් මට්ටමේ ප්‍රජාවන්හි අඩු මූල්‍ය ධාරිතාවක් සහිත ශ්‍රී ලාංකිකයන් සවිගැන්වීමේ අපටම ආවේණික පරමාර්ථය මුදුන්පත් කිරීම වෙනුවෙන් අපි කටයුතු කරමු.

අප විසින් ලබා දෙන ණය යෝජනා ක්‍රමවලින් 70% ක්ම නිවාස ණයවලින් සමන්විත වන අතර, අපගේ ප්‍රමුඛතම ශක්තිය වන්නේ ශ්‍රී ලංකාවේ නිවාස වෙළෙඳපොල ආශ්‍රිතව අප සතු පළපුරුද්ද, ශක්‍යතා සහ පුළුල් අවබෝධයයි. 1984 වසරේදී එච්ඩීඑෆ්සී බැංකුව ආරම්භ කිරීමේ සිට මේ දක්වාම අපි සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ සිහින සුරක්ෂිත කරමින් හා ඉහළ ජීවන තත්ත්ව පිළිබඳ අපේක්ෂා පුබුදුවාලමින් දහස් ගණනක් දෙනා වෙත නිවාස ණය ලබා දී ඇත්තෙමු.

රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම කැප වීමෙන් වැඩ කරන වෘත්තිකයන් හට සේවක අර්ථසාධක අරමුදල පදනම් කරගෙන ණය ලබා දීමේ වරප්‍රසාදය හිමි ආයතන හතරෙන් එකක් ලෙසද අප බැංකුව සුවිශේෂී වෙයි.

ගත වූ වසර 37 ක ඉතිහාසය පුරාවට අප බැංකුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජන ප්‍රජා සමග ඉතා සවිමත් සබඳතා ගොඩනගා ගැනීමට සමත් වී ඇති අතර, අඩු-මධ්‍ය ආදායම් කාණ්ඩ තුළ ජීවත් වන පුද්ගලයන්ගේ සහ පවුල්වල සමාජ හා ආර්ථික තිරසාරතාව සහතික කිරීමට දක්වන අවධානයේ කොටසක් වශයෙන් ගනුදෙනුකරුවන් සමග ඇති සබඳතා තවදුරටත් සවිමත් කර ගැනීමෙහි ප්‍රෝත්සාහී වී සිටියි.

උපකාර අවශ්‍ය වන පුද්ගලයන් සහ ව්‍යාපාර වෙත සළුලදායී හා දරාගත හැකි විසඳුම් ලබා දීම කෙරෙහි බැංකුවේ අවධානය යොමු වී පවතී.

ඒ අනුව, ඔවුන් හට මතු වන අභියෝගවල සීමාවන් අභිබවා ඉදිරිය දැකීමට උපකාරී වීම අපගේ අරමුණයි. ජයගත යුතු අභියෝග කිහිපයක්ම ඇති නමුදු මෙම ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන් බැංකුව සිය ග්‍රාමීය ව්‍යාප්තිය පුළුල් කර ගැනීමට නිරතුරුවම කටයුතු කරයි. මේ වන විට වැඩියෙන්ම අවශ්‍යතා ඇති අයවළුන් වෙත පහසු ප්‍රවේශයක් ඇති මූල්‍ය සේවා ලබා දීම සඳහා වෙන් වූ ශාඛා 39 ක් සහ 100 කට අධික ජංගම බැංකු නිලධාරීන් කණ්ඩායමක් අප සතු වේ.

අප බැංකුවේ ජංගම බැංකු නිලධාරීන් විසින් ග්‍රාමීය මෙන්ම නාගරික ප්‍රදේශ ආශ්‍රිතවද ගනුදෙනුකරුවන් සියලුම දෙනා සිටින ස්ථාන වෙතම ගොස් බැංකු සේවා ලබා දෙනු ලැබේ.

ප්‍රධාන වශයෙන්ම රටෙහි අඩු-මධ්‍ය ආදායම් කාණ්ඩයට අයත් පුද්ගලයන්ගේ නිවාස අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය සම්පාදනය කෙරෙහි අවධානය යොමු කරන අතරම, අප බැංකුව සිය මූල්‍ය සේවා කළඹ සහ එහි සේවා ලබන වෙළෙඳපොල පරාසය ක්‍රමිකව පුළුල් කර ගැනීම වෙනුවෙන්ද කටයුතු කරයි. ආයතනික සමාගම් සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ද ඇතුළුව ආයතනික අංශය වෙත අවධානය යොමු කිරීමද ඊට අයත් වේ.

මූල්‍යමය සහාය ලබා දෙමින් සහ ජාතියේ සමාජ හා ආර්ථික ප්‍රගතිය වෙනුවෙන් දායක වෙමින් එච්ඩීඑෆ්සී බැංකුව මූල්‍ය අවශ්‍යතා රාශියක් ආවරණය කෙරෙන විවිධාංගීකෘත සේවා නිපැයුම් කළඹක් ප්‍රවර්ධය කිරීමෙහිද නියැළී සිටියි. කල්බදු, ස්වර්ණාභරණ ණය, සේවක අර්ථසාධක අරමුදල් පාදක නිවාස ණය, ජීවන තත්ත්ව ණය, අධ්‍යාපන හා සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ණය යෝජනා ක්‍රම සහ ආයතනික මූල්‍ය ණය ආදිය අප බැංකුවටම ආවේණික ණය කළඹෙහි කොටස් වේ.

සෑම වයස් කාණ්ඩයක්ම සහ සමාජ ගතිකයක්ම නියෝජනය කරන ගනුදෙනුකරුවන් වෙනුවෙන් සකසා ඇති ඉතුරුම් ගිණුම් මාලාවක් සහ ආයෝජන සැලසුම් අපගේ ඉතුරුම් කළඹට ඇතුළත් වේ.

මනා උපායමාර්ගික දැක්මක් සහිත එච්ඩීඑෆ්සී බැංකුව මේ වන විට 2021-2025 අතර කාලය සඳහා වූ සිය උපායමාර්ගික සැලැස්ම සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය ඉලක්ක හා අරමුණු ප්‍රතිසංවිධානය කරමින් සිටියි. ශක්‍යතාවලින් උපරිම ඵල නෙළා ගැනීමේ අවශ්‍යතාව මනාව වටහා ගෙන සිටින අප බැංකුව සිය උපායමාර්ගික දැක්ම සාක්ෂාත් කරගනු පිණිස මෙහෙයුම් පිරිවැය අඩු කෙරෙන, අධික කාලයක් වැය වන ක්‍රියාවලි ඉවත් කෙරෙන සහ මෙහෙයුම් කාර්යක්ෂම කෙරෙන නව ඩිජිටල් මෙවලම් හා තාක්ෂණික විසඳුම් වෙනුවෙන් ආයෝජනය කිරීමට අඛණ්ඩව කරයුතු කරයි. තොරතුරු තාක්ෂණය පාදක වර්ධනය වනාහි අපට වැදගත් වන ප්‍රධානතම උපායමාර්ගයකි. වඩා කාර්යක්ෂම සහ අතිශයින්ම ඵලදායී සේවා පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ඒ මගින් බැංකුවේ මෙහෙයුම් හා සේවා ක්‍රමානුකූලව වැඩිදියුණු කෙරෙමින් පවතී.

2005 වසරේ සිට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගතව පවතින එච්ඩීඑෆ්සී බැංකුව සතුව මේ වන විට රු. බිලියන 6.0 ක ප්‍රාග්ධන පදනමක් පවතී.

අපගේ ගමන් මග

වසර ගණනාවක් පුරාවටම එච්ඩීඑෆ්සී බැංකුව අද පවතින තත්ත්වයට නගා සිටුවීමට හේතු පාදක වූ පරිවර්තනයන් රැසක්ම අපි අත්දුටුවෙමු. මුළුමනින්ම රජයේ හිමිකාරත්වයට යටත් ආයතනයක් ලෙස ගමන් ආරම්භ කළ බැංකුව මේ වන විට රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම කොටසක් බවට පත් වී ඇත.

අපගේ ව්‍යාපාරික හා මෙහෙයුම් අවධානය නිරතුරුවම නව හා විවිධාංගීකරණය කරන ලද දිශානුගත වීම් කෙරෙහි යොමුව පවතී.

1984
ජාතික නිවාස පනත යටතේ ලියාපදිංචි කර ඇති ඉදිකිරීම් සමාජයක් ලෙස පිහිටුවන ලදි.

1997
නිවාස කේන්ද්‍රීය මූල්‍ය සේවා ලබා දීම සහ මහජන තැන්පතු භාරගැනීම සඳහා වූ රාජ්‍ය සංස්ථාවක් පිහිටුවමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත සම්මත කරන ලදි.

2000
නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව ස්ථාපිත කරමින් 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත ගැසට් කරන ලදි.

2003
විශේෂිත බැංකුවක් පිහිටුවමින් 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත සංශෝධනය කරන ලදි. ඉන් අනතුරුව සමාගමේ නම

''ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව'' (මින් මතුවට ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බැංකුව ලෙස හැඳින්වෙන) ලෙස වෙනස් කරන ලදි.

2005
එච්ඩීඑෆ්සී බැංකුව කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශය වෙතින් ආයෝජන සිදු වීමට මග පෑදිණ.

2011
ව්‍යාපාරික මෙහෙයුම්වල පරාසය පුළුල් කරමින් එච්ඩීඑෆ්සී පනත වැඩිදුරටත් සංශෝධනය කරන ලදි. ඒ මගින්, 1988 අංක 30 දරන බැංකු පනතේ IV වන උපලේඛනයේ දක්වා ඇති ව්‍යාපාර වර්ගවල නිරත වීම සඳහා අවශ්‍ය බලය අප වෙත පැවරිණ.

2012
ඉන් පසුව එතෙක් ව්‍යාප්ත නොවූ වෙළෙඳපොල කාණ්ඩ වෙතද යොමු වෙමින් බැංකුව විසින් සිය නිපැයුම් හා මූල්‍ය සේවා කළඹ විවිධාංගීකරණය කරන ලදි.

2015
මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය සවිමත් කරමින් එච්ඩීඑෆ්සී බැංකුව ආයතනික ගනුදෙනුකරුවන් වෙත සේවා ලබා දීම වෙනුවෙන් වෙනම අංශයක් පිහිටුවීම තුළින් ආයතනික මූල්‍ය සේවා වෙතද යොමු වෙයි.

2017
ප්‍රධාන බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

ඩිජිටල්කරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වෙත පිය මැනීම.

වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීම

මූල්‍ය උපකාර අවශ්‍ය පුද්ගලයන්ට සහාය වීම

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් ණය ගැණුම්කරුවන් මෙන්ම බැංකුව යන පාර්ශ්ව දෙක සඳහාම ඇති අවදානම් අඩු මට්ටමක පවතින බව සහතික කරමින් සාපේක්ෂව අඩු ණය විශාලත්වයක් සහිත නිවාස ණය ලබා දීම කෙරෙහි එච්ඩිඑෆ්සී බැංකුවේ සේවා අවධානයෙන් 75% ක් ම වෙන්ව පවතී. මීට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හා ක්ෂුද්‍ර හා ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි මූල්‍ය සහාය ලබා දෙමින් එවන් ව්‍යවසායකයන් දහස් ගණනක් මූල්‍යමය වශයෙන් සවිමත් කිරීමට අප බැංකුව කටයුතු කරයි. ඩිජිටල් බැංකු සේවා සහ රක්ෂණාවරණ වැනි අගය එකතු කළ සේවා ක්‍රමානුකූලව ඉහළ නැංවීමට අමතරව ණය හා අත්තිකාරම්, තැන්පතු හා ඉතුරුම් සැලසුම් ආදිය බැංකුව විසින් ලබා දෙන සේවා අතරට අන්තර්ගත වේ. එමෙන්ම, අපගේ බැංකුව සේවක අර්ථසාධක අරමුදල පදනම් කරගත් නිවාස ණය ලබා දීමේ හැකියාව සහිත බැංකු හතර අතරින් එකකි. කල්බදු, ස්වර්ණාභරණ ණය හා විශ්‍රාමිකයන් සහ යුද විරුවන්ගේ ප්‍රතිලාභීන් ආදී පාර්ශ්ව වෙනුවෙන් විශේෂයෙන්ම සකස් කර ඇඩි මූල්‍ය යෝජනා ක්‍රම ආදිය එම සේවා නිපැයුම් කළඹට ඇතුළත් වේ.

ව්‍යාපාර සහ කර්මාන්ත සඳහා සහාය දැක්වීම

විවිධ කර්මාන්තවල නිරත වී සිටින, විශේෂයෙන්ම ස්වයං රැකියා සහ කුඩා පරිමාණ ප්‍රාදේශීය කර්මාන්ත ආදියේ නියැළෙන, පුද්ගලයන් වෙනුවෙන්ද අපගේ බැංකුව මූල්‍ය සේවා ලබා දෙයි. ඔවුන්ගේ ජීවනෝපායයන් තිරසාර බවට පත් කරන අතරම කුඩා පරිමාණ ජාතික කර්මාන්ත, අනෙකුත් නිෂ්පාදන හා සේවා අංශ ආදියේ වර්ධනයට දායක වීමටද අපි සහාය දක්වමු. බැංකුවේ සේවා කළඹ යටතේ දැක්වෙන කර්මාන්ත හරස්කඩට කිරි ගොවීන්, කෘෂිකාර්මික ගොවීන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ස්වයං රැකියාවල නියුතු තාක්ෂණික සුදුසුකම් සහිත තරුණ තරුණියන්, අලුතින් ආරම්භ කරන ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, හරිත හා තිරසාර ව්‍යාපෘති ආදිය අන්තර්ගත වේ.

මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය

අඩු හා මධ්‍ය ආදායම්ලාභී කාණ්ඩ මෙන්ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කෙරෙහි එච්ඩිඑෆ්සී බැංකුව ප්‍රමුඛ අවධානයක් යොමු කරයි.

එමෙන්ම, ග්‍රාමීය ප්‍රදේශවල ජන ප්‍රජාවන් වෙත පුළුල් ප්‍රවේශයක්ද අප බැංකුව සතු වේ. එපමණක්ද නොව, ගත වූ වසර කිහිපයක කාලය මුළුල්ලේ ලාභදායී මූල්‍ය නිපැයුම් හා සේවා ඔස්සේ සැම දෙනාම වෙනුවෙන් මූල්‍ය සේවා සැපයෙන බව සහතික කරන අතරම ආයතනික අංශය වෙත ව්‍යාපාරික ණය ලබා දෙමින් ආයතනික හා සංවර්ධනය මූල්‍ය සේවා ලබා දීම කෙරෙහිද අප බැංකුවේ සේවාවන් ව්‍යාප්ත කරන ලදි.

වටිනාකම් නිර්මාණය කිරීම

අප සතු ප්‍රාග්ධනයන් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් වසරින් වසර අපගේ ගනුදෙනුකරුවන්, කොටස් හිමියන්, සේවකයන්, නියාමන අධිකාරීන්, සැපයුම්කරුවන්, හවුල්කරුවන්, ජන ප්‍රජාව සහ පරිසරය වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කරන අතරම අපේක්ෂිත ප්‍රතිඵල උදා කිරීම බැංකුවේ ඉලක්කය වේ.

වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

බාහිර සහ

යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය
- කොටස් හිමි අරමුදල
- තැන්පතු පදනම
- මුළු වත්කම්
- ණය ගැනීම් සහ ණයකර
- ආයෝජන

මානව ප්‍රාග්ධනය
- ප්‍රතිපත්ති රාමුව
- කාර්යසාධනය ඇගයීම
- බඳවා ගැනීම් සහ වෘත්තීය දියුණුව
- තරගකාරී ප්‍රතිලාභ සහ පාරිශ්‍රමික
- පුහුණු හා සංවර්ධන

බුද්ධිමය ප්‍රාග්ධනය
- සංවිධානමය (ආයතනික) දැනුම
- නිවාස මූල්‍යකරණ දැනුම සහ ක්‍රියාවලිය
- දොරින් දොර බැංකු කටයුතු
- ආවේණික නිපැයුම්
- අති නවීන තොරතුරු පද්ධති

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය
- බහු නාලිකා ඩිජිටල් ස්පර්ශක ස්ථාන
- භූගෝලීය වශයෙන් විවිධත්වයකින් යුතු ජාලය
- සුළු පරිමාණ සහ අති සමීප බැංකුකරණය
- විවිධ ණය සහ තැන්පතු නිපැයුම්
- වර්ධනය වන හවුල්කරුවන්
- විවිධ සැපයුම්කරුවන්
- ප්‍රජා පාදක ආයතන සමග ඇති හවුල්කාරත්ව
- කුඩා ව්‍යාපාර හිමියන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්
- නියාමන සබඳතා
- ප්‍රජාවන්/සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත සහාය දැක්වීම
- සංවර්ධන ව්‍යාපෘති
- ආයතනික සමාජ වගකීම

නිෂ්පාදිත ප්‍රාග්ධනය
- ශාඛා
- දේපල, පිරියත සහ උපකරණ
- තාක්ෂණික යටිතලපහසුකම්
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය

ස්වභාවික ප්‍රාග්ධනය
- ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය
- පුනර්ජනනීය බලශක්තිය
- උපයෝජ්‍යතා සේවා පරිභෝජනය
- ස්වභාවය ධර්මය සුරැකීම

වටිනාකම් නිර්මාණය කෙරෙන ක්‍රියාකාරකම්



ප්‍රතිඵල
- නිවාස ණය - උකස්
- නිවාස ණය - සේවක සේ.අ.අ. මත පදනම් වූ
- නිවාස ණය - ඇප සහිත
- ස්වර්ණාභරණ ණය
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාර ණය

නියාමන පරිසරය

වටිනාකම් නිර්මාණය කරන ක්‍රියාකාරකම්



- ආයතනික ව්‍යාපාරික ණය
- කල්බදු
- ස්ථාවර තැන්පතු
- ඉතුරුම්

අපේක්ෂිත ප්‍රතිඵල

මූල්‍ය ප්‍රාග්ධනය

- අබණ්ඩ ලාභදායීතාව
- ශ්‍රී ලංකා රජයට ලැබෙන බදු ආදායම
- කොටස් හිමියන් සඳහා ලාභාංශ
- ප්‍රමාණවත් ප්‍රාග්ධන පදනමක් පැවතීම
- මනා වත්කම් ගුණාත්මකභාවය
- මනා ණය ගුණාත්මකභාවය

මානව ප්‍රාග්ධනය

- සේවකයන් සියලුම දෙනා වෙත පුහුණුව ලබා දීම
- වෘත්තීය වර්ධනය
- දියුණුව හා අනුප්‍රාප්තිකයින් පත් කිරීම
- බහු-නිපුණතා සහිත බව
- ඵලදායීතාව ඉහළ යාම
- සේවකයින් රැඳී සිටීමේ අනුපාතය ඉහළ යාම
- ස්වයං-මහෙයවීම් ක්‍රියාමාර්ග
- නිර්මාණාත්මක චින්තනය
- බැංකු කටයුතු හා තාක්ෂණය පිළිබඳ දැනුම ඉහළ යාම
- නියාමන රෙගුලාසි වෙත අනුකූලතාව දැක්වීම
- එච්ඩිඑෆ්සී වටිනාකම්වලට අනුව කටයුතු කිරීම
- උපායමාර්ගික අරමුණු කෙරෙහි අවධානය යොමු කිරීම
- ඉලක්ක සාක්ෂාත් කර ගැනීම

බුද්ධිමය ප්‍රාග්ධනය

- නව තාක්ෂණික විසඳුම්
- විවිධාංගීකරණය කරන ලද නිපැයුම්
- ජංගම බැංකුකරණ පහසුකම
- ප්‍රධාන බැංකු පද්ධතිය
- ණය හා මුදල් එක්රැස් කිරීම කළමනාකරණ විසඳුම්
- සන්නාම වටිනාකම
- උපායමාර්ගික සැලැස්ම

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය

- අති සමීප බැංකුකරණ පහසුකම ඔස්සේ මූල්‍ය අන්තර්ග්‍රාහීභාවය ඇති කිරීම
- අඟය එකතු කිරීමේ විධිවිධාන
- නව මූල්‍ය උපකරණ
- ඩිජිටල් බැංකුකරණ සහ ජංගම සේවා
- මූල්‍ය සහාය
- හවුල්කරුවන් සහ සේවා සැපයුම්කරුවන්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

- වත්කම් සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ඉහළ නැංවීම
- ශාඛා සහ ATM ජාලය වර්ධනය කිරීම
- තාක්ෂණික යටිතලපහසුකම් වැඩි කිරීම

ස්වභාවික ප්‍රාග්ධනය

- කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය
- සූර්ය බලශක්ති උත්පාදනය
- කාර්යක්ෂම බලශක්ති පරිභෝජනය
- රුක් රෝපණය

තිරසාරතාව කෙරෙහි අවධානය

තිරසාරතාව සහ තිරසාර බැංකුකරණය දැනටමත් සිදු කෙරෙමින් පවතින අතර බැංකුවේ මෙහෙයුම් රාමුව තුළ අදාළ පැතිකඩ නිරතුරුවද සංවර්ධනය කරන ලදි.

තිරසාරතාව කෙරෙහි අප බැංකුව දක්වන අවධානය මූල්‍ය, සමාජයීය සහ පරිසරික පැතිකඩ සමගද මනාව අනුගත වෙයි. මේ නිසා, මූල්‍යමය මැදහත්කරුවෙකු වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව ශ්‍රී ලංකාවේ අඩු හා මධ්‍ය ආදායම්ලාභී පවුල් නගා සිටුවීම උදෙසා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතරම තිරසාර තීරණ ගැනීම් වෙනුවෙන් නිරතුරුවම ඇපකැප වී කටයුතු කරයි. ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීමේදී සද්භාවයෙන් යුතු පිළිවෙත් අධීක්ෂණය කරන අතරම ගනුදෙනු හා ආයෝජන ආදියට සම්බන්ධ තීරණ ගැනීමේදී ආයතනික යහපාලනය පවත්වා ගැනෙන බවද බැංකුව නිරතුරුවම සහතික කරයි.

මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය

ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුවේ ප්‍රමුඛ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ තිරසාර නිවාස හා ජීවන තත්ත්ව ඇති කිරීම සඳහා මූල්‍යමය විසඳුම්වල සහාය ලබා දීමයි. මෙම පණිවුඩය දැන් අපගේ දැක්ම ප්‍රකාශනය වන 'ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමේ පුරෝගාමී මූල්‍ය සේවා ආයතනය වීම' තුළට පැහැදිලිවම ගැබ් වී ඇත. ප්‍රධාන වශයෙන්ම අඩු-මධ්‍ය ආදායම් මට්ටම් සහිත පුද්ගලයන් සහ ව්‍යාපාර හිමියන් වෙත අන්තර්ග්‍රාහී මූල්‍ය විසඳුම් ලබා දීම සම්බන්ධයෙන් බැංකුව විසින් ඉටු කර ඇති කාර්යභාරය කෙරෙන් ඒ බව මනාව පිළිබිඹු වේ. මෙම විසඳුම් නිසා බිම් මට්ටමේ ණය ගැණුම්කරුවන් හට විවිධ මූල්‍ය අවශ්‍යතා රාශියක් සඳහා වෙන් වූ ණය ලබා ගැනීමට අමතරව සේවක අර්ථසාධක අරමුදල සහ උකස් ඇපකර මත පදනම්ව නිවාස ණය ගනීමට ඉඩකඩ සැලසේ.

සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන් වෙත සේවා සලසන අප බැංකුවේ සේවා කළඹ සීමිත මූල්‍ය ධාරිතා සහිත අයවළුන් හට තිරසාර ජීවන තත්ත්වයක් උදා කර ගැනීමට හැකි පරිදි මනා සමතුලිතභාවයක් සහිතව සකසා තිබේ. එමෙන්ම, බැංකුව සෘජුවම සිය සේවා ජන ප්‍රජාවන් වෙත සමීප කරයි. ඉතා ඉහළ ආදායම් ලබන/නාගරික ප්‍රජාවන්ගෙන් ඈතට අවධානය යොමු කරමින් ග්‍රාමීය ප්‍රජාවන් ආශ්‍රිත සහ සීමිත මූල්‍ය සාක්ෂරතාවක් සහිත ගනුදෙනුකරුවන් වෙත ළඟා වීම කෙරෙහි අප ප්‍රමුඛතාව ලබා දී ඇත.

මේ වෙනුවෙන් අපගේ බැංකුවේ ජංගම බැංකුකරණ ඒකකය (palmtop banking unit) ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන්නේ මිනිය නොහැකි, අසමසම සේවාවකි. ඔවුහු, උපයෝජ්‍යතා සේවා බිල්පත්වලට අමතරව තැන්පතු සහ ණය නැවත ගෙවීම් භාර ගනිමින් නාගරික මෙන්ම දුරස්ථ ප්‍රදේශ වෙතද ගමන් කරති. එමෙන්ම, අපගේ ජංගම බැංකුකරණ කණ්ඩායම මූල්‍ය අන්තර්ග්‍රාහීභාවය ඉහළ නැංවීම වෙනුවෙන් ඉටු කරන සුවිශේෂී භූමිකාවද බැංකුවට අභිමානයක් දනවන්නකි.

තිරසාර බැංකුකරණය

තිරසාර සහ වගවීමෙන් යුතු තීරණ ගැනීමේ ක්‍රමවේදයක් පිහිටුවීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති රාමුවක් යොදා ගනිමින් එච්ඩීඑෆ්සී බැංකුව ශ්‍රී ලංකා බැංකු සංගමය විසින් ආරම්භ කරන ලද තිරසාර බැංකුකරණ මූලධර්ම වෙත අත්සන් තැබීය. පාලන පරිචයන් සවිබල ගන්වන අතරම පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකා බැංකු සංගමයේ තිරසාර බැංකුකරණ සංකල්ප මත පදනම් වෙමින් අප බැංකුව මේ වන විට සිය ව්‍යාපාරික උපායමාර්ගය සංශෝධනය කොට ප්‍රතිසංවිධානය කර තිබේ. බැංකු මෙහෙයුම් දිගින් දිගටම ආර්ථික, සමාජ හා පාරිසරික පැතිකඩ අතින් තිරසාර සංවර්ධන ප්‍රවේශයක් වෙත අවධානය යොමු කරන අතරම සමාජයට වැඩදායී දායකත්වයක් අත්වන වැඩිදුර තිරසාර බැංකුකරණ හා මූල්‍ය විධිවිධාන සක්‍රිය කරනු වස් අප බැංකුවේ ප්‍රතිපත්ති තවදුරටත් සමාලෝචනය කෙරෙනු ඇත.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු

2015 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් තිරසාර සංවර්ධනය සඳහා වූ 2023 න්‍යාය පත්‍රය පිහිටුවා ගන්නා ලදි. මෙම න්‍යාය පත්‍රයේ කේන්ද්‍රීය ඉලක්ක හා බැඳී ඇති අන්තර්සබැඳි අරමුණු 17 ක් ඇතුළත් වේ. ඒ අතරින් කාලගුණික සාධක විෂයික ක්‍රියාකාරකම් සහ දරිද්‍රතාව දුරන් කිරීම වෙත ප්‍රමුඛතම වටිනාකමක් හිමි වේ. ඉලක්ක 169 ක් ආවරණය කෙරෙන මෙම අරමුණු 17 වනාහි මානව වර්ගයා සහ මිහිතලය යන පැතිකඩ දෙකෙම කෙරෙන් තිරසාර වර්ධනය සඳහා වූ මූලික මාර්ගෝපදේශයකි.

රජයයන් විසින් ගනු ලැබෙන තීරණ හා අනුගමනය කෙරෙන ප්‍රතිපත්ති මගින් මිනිසුන්ගේ සහ පෘථිවියේ තිරසාර ජීවන තත්ත්ව කෙරෙහි සෘජු බලපෑමක් එල්ල වන හෙයින් ඉහත කී තිරසාර සංවර්ධන අරමුණු අනුගමනය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් ඉතා වැදගත් වගකීමක් විවිධ රටවල රජයයන්ට පැවරේ.

ඒ අනුව, 2030 අග භාගය වන විට ලොව පුරා රජයයන් සහ ව්‍යාපාරික ආයතන මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් පුරෝගාමී භූමිකාවක නිරත වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අරමුණු ක්‍රියාත්මක කිරීමට නම් සියලුම ආයතනවල සහ මෙම ඉලක්ක රාමුව යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙන් සමාජයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් මෙහෙයවීමට හැකියාවක් ඇති නායකයන්ගේ දැඩි කැපවීම අවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ස්ථාපිත කර ඇති තිරසාර සංවර්ධන අරමුණු ගුරු තන්හි තබා ගනිමින් මේ වන විට එච්ඩීඑෆ්සී බැංකුව සිය මෙහෙයුම් වෙත ඒවායෙහි ඇති අදාළතාව සැලකිල්ලට ගනිමින් ඒවා වෙනුවෙන් දායකත්වය දැක්වීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කර තිබේ. කෙසේ වෙතත්, රටේ ප්‍රගතියට දායක වෙමින් ගනුදෙනුකරුවන්ගේ සමාජ ජීවන තත්ත්ව නගා සිටුවීම වෙනුවෙන්ද අප බැංකුව විසර ගණනාවක් තිස්සේ කටයුතු කර ඇත. මේ නිසා, දරිද්‍රතාව අවම කරමින් ජීවන තත්ත්ව නගා සිටුවීම කෙරෙහි සෘජු දායකත්වයක් ලබා දෙන බැංකුවක් වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව ඉහත න්‍යාය පත්‍රය තුළ ඇති ඉලක්ක බොහොමයක් සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රයත්න දරමින් සිටියි.

කෝවිඩ්-19 ව්‍යසනය විසින් සෑම ජාතියකම දුප්පත්ම ප්‍රජාවන් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් දැඩි පීඩාවකට ලක් කර ඇති පසුබිමක් තුළ දරිද්‍රතාව පිටුදැකීමේ එක්සත් ජාතීන්ගේ ඉලක්ක මේ වන විට සාක්ෂාත් කර ගැනීම අපොහොසත් තත්ත්වයට පත්ව ඇති බවද බැංකුව අවබෝධ කරගෙන සිටී. ලොව පුරාවටම අති විශාල රැකියා අවස්ථා සංඛ්‍යාවක් අහිමි කරමින් මේ වන විට මෙම වසංගතය නිසා මිලියන 71 කට අධික ජනකායක් 202 වසරේදී දරිද්‍රතාවයේ දුෂ්කරම අඩියට ඇදවැටී ඇත.



1 අරමුණ: දරිද්‍රතාව

එච්ඩීඑෆ්සී බැංකුව මෙහෙයුම් ආරම්භ කළ කාලයේ සිට මේ දක්වාම මූල්‍යමය වශයෙන් දිළිඳු බවට පත් වූ දහස් ගණනක් දෙනා වෙනුවෙන් මූල්‍ය සේවා සම්පාදකයා ලෙස කටයුතු කරමින් සිටියි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකයන් හට සිය ජීවනෝපායයන් ආරක්ෂා කර ගැනීමට ඉඩකඩ සලසමින් එවැනි ව්‍යවසායකයන් දහස් ගණනක් ආරක්ෂා කිරීමටද අප බැංකුව දායක වී ඇත. කිසිදු සැලකිය යුතු තරමේ ණය බරකට ගොදුරු නොවී සිය ආසන්නතම ධාරිතාව තුළ නැවත ගෙවිය හැකි ණය ලබා දීම තුළින් ගනුදෙනුකරුවන්ට මූල්‍යමය වශයෙන් ස්ථාවර බවට පත් වීමටද ඉඩකඩ බැංකුව විසින් සැලසේ.

ඉහත කී 1 අරමුණට අදාළ ඉලක්ක සහ දර්ශකවලට අනුව දුගී සහ අවදානමට පහසුවෙන් නිරාවරණය වන ජනතාව වෙත ආර්ථික සම්පත් සඳහා සමාන ප්‍රවේශ අවස්ථා ඇති බවත්, ඉඩම් හා දේපල හිමිකාරත්වය සහ පාලනය සම්බන්ධ හිමිකමක් ඔවුන්ට පවතින බවත් සහතික කිරීම සම්බන්ධයෙන් බැංකුව නිරන්තරයෙන්ම කටයුතු කරයි.

ජාතියේ නිවාස බැංකුව වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුවේ ගනුදෙනුකරුවෙකුට සාපේක්ෂ අලෙවි සාමාන්‍යය (average ticket size) රු. 400,000 ක් ලෙස පැවතීමෙන් ආදායම් පිරමීඩයේ පහළ මට්ටම් වෙත එය දක්වන දායකත්වය මනාව පිළිබිඹු වෙයි. මූල්‍ය මැදහත්කරුවෙකු වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව සිය ජංගම බැංකුකරණ ඒකකය හරහා ක්ෂුද්‍ර මට්ටමේ ජන ප්‍රජාව වෙත සමීප වෙමින් ක්ෂුද්‍ර ව්‍යවසායයන් සඳහා ණය හා මූල්‍ය සේවා ලබා දීමටද පියවර ගනියි.

කෙසේ වෙතත්, අනාගතයේදී ශාඛා 64 ක් අලුතින් විවෘත කිරීමේ සැලැස්මත් සමගින් සිය සුළු පරිමාණ ව්‍යාපාරිත පැවැත්ම ව්‍යාප්ත කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි

2 අරමුණ - කුසගින්න තුරන් කිරීම

2 වන අරමුණ හා සබැඳී ඇති තවත් කාරණයක් වන ග්‍රාමීය සංවර්ධනය සහ තිරසාර කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන්ද එච්ඩිඑෆ්සී බැංකුව ග්‍රාමීය නිෂ්පාදන ප්‍රජා සහ කුඩා ව්‍යාපාර හිමියන්ගේ ව්‍යාපාර සංවර්ධනය කරගැනීමට හෝ අලුතින් ව්‍යාපාර පටන් ගැනීමට අවශ්‍ය මූල්‍ය සම්පාදනය කරමින් කටයුතු කරයි.

ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධන කිරීමේ අරමුණින් අප බැංකුව කෘෂිකාර්මික කටයුතු සහ කිරි ගොවිපල ආශ්‍රිත ව්‍යාපාරවල නිරත වී සිටින පුද්ගලයන් සම්බන්ධයෙන්ද දායකත්වය දක්වයි.

එමෙන්ම, ගොවිපල නිෂ්පාදනය සහ කිරි නිෂ්පාදන වටිනාකම් දාමයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් කිරි ගොවීන්ට සහාය දැක්වීම සහ නැවුම් එළකිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට උපකාර කිරීමේ අරමුණින් එච්ඩිඑෆ්සී බැංකුව 2019 වසරේදී IESE සමග සම්බන්ධ විය.

'වෙළෙඳපොල කේන්ද්‍රීය කිරි කර්මාන්තය' (Market Oriented Dairy) වනාහි එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍යාධාර යටතේ IESE විසින් ක්‍රියාත්මක කරනු ලැබෙන ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම පාර්ශ්වකරුවන් සමග එක්ව කටයුතු කරනු ලැබේ.

5 අරමුණ - ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමානව සැලකීම

එච්ඩිඑෆ්සී බැංකුවේ ස්ත්‍රී පුරුෂ සියලුම දෙනා වෙත එක සමාන අවස්ථා සැලසීමට පියවර ගනේ. සත්‍ය වශයෙන්ම, බැංකුවේ වැදගත්ම කාර්යභාරයයන් අධීක්ෂණය කරන ඉහළ හා ආයතනික නායකත්වයේ බහුතරය කාන්තා වෘත්තිකාවන් වේ.

7 අරමුණ - සුපැහැදිලි සහ පහසුවෙන් ලබාගත හැකි බලශක්තිය

සූර්ය බලශක්තිය වෙනුවෙන් තවදුරටත් ආයෝජනය කිරීමට බැංකුව ඉදිරියටත් කටයුතු කරනු ඇති අතර එහි පළමු ව්‍යාපෘතිය වශයෙන් හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවෙහි සූර්ය බලශක්ති උත්පාදන පැනල ස්ථාපනය කිරීමට නියමිතව තිබේ. ඉන් අනතුරුව අතිරික්ත බලශක්තිය තිරසාර බලශක්ති උත්පාදනයට දායක වීමක් වශයෙන් ජාතික බලශක්ති ජාලය වෙත යොමු කෙරෙනු ලැබේ.

8 අරමුණ - මැනවින් ඔබින කාර්යභාරය සහ ආර්ථික වර්ධනය

විවිධ දිස්ත්‍රික්ක ආවරණය කෙරෙන ග්‍රාමීය නගරවාසී සේවකයන්ගෙන් බැංකුවේ ජංගම බැංකුකරණ ඒකකය සමන්විත වෙයි. මින් බොහෝ දෙනෙකු තමන් සේවා ලබා දෙන ප්‍රජාවන්ටම අයත් අය වීමද විශේෂ කරුණකි. මේ නිසා ඔවුන් මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියා කරන නියමුවන් වනවා පමණක් නොව තිරසාර සේවක ආකෘතියක් හරහා නිසි ලෙස සවිබල ගැන්වූ පිරිසක්ද වේ. මෙම කණ්ඩායමට පුද්ගලයන් 104 ක් ඇතුළත් වන අතර 2020 වසරේදී 12 දෙනෙකු බඳවා ගන්නා ලදි.

වගකීම්සහගත සහ ආචාර ධාර්මික සේවා යෝජකයෙකු වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව බාල වයස්කරුවන්ගේ සේවය ලබා ගැනීමට විරුද්ධව දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. එමෙන්ම, සේවකයන් හට සමාන ලෙස සලකනු ලැබෙන බව මෙන්ම සුරක්ෂිත හා සෞඛ්‍යමත් සේවා පරිසරයක් පවතින බවද බැංකුව සහතික කරයි. එමෙන්ම, එක සමාන රැකියා භූමිකාවල නිරත වන කාන්තා හා පිරිමි දෙපාර්ශ්වය වෙතම එක සමාන ගෙවීමක් සිදු කිරීමටද බැංකුව කටයුතු කරයි.

තැන්පතු ආශ්‍රිත සේවා ලබා දෙන සහ වැඩියෙන්ම එකී සේවා ලබා ගැනීමේ අවශ්‍යතා ඇති පුද්ගලයන් වෙත ණය ලබා දෙන ආයතනයක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව ගරු කටයුතු කාර්යභාරයන් සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට සක්‍රියව දායක වෙයි.

9 අරමුණ - කර්මාන්තය, නවෝත්පාදනය සහ යටිතල පහසුකම්

තිරසාර සංවර්ධන අරමුණු 2 යටතේ සඳහන් කළ පරිදි මූල්‍ය සේවා වෙත ප්‍රවේශය ලබා දීම සහ තිරසාර සංවර්ධන අරමුණු 9 ට අනුව වෙළෙඳපොල සහ සැපයුම් දාම වෙත ප්‍රවේශ වීමට සහාය දැක්වීම සඳහා දරා ගත හැකි කොන්දේසි යටතේ ණය පහසුකම් ලබාදීම ආදී පියවරට සමාන්තරව අංශ පාදක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යසායයන් සහ කුඩා ව්‍යාපාර හිමියන් සංවර්ධනය කිරීම වෙනුවෙන් බැංකුව වැඩි වශයෙන් දායක වෙමින් සිටී.

තිරසාර නිවාස සංවර්ධන පහසුකම් සහ ජීවන තත්ත්ව උදා කිරීමට සහාය වීම වෙනුවෙන් නිරන්තරයෙන් ඇපකැප වී සිටින අප බැංකුව සුළු පරිමාණ කර්මාන්තවල නිරත වන ව්‍යවසායයන් සහ කුඩා ව්‍යාපාර හිමියන් අතර බෙදා හරිනු ලැබෙන ණය අරමුදල් ඉහළ නැංවීමටද පියවර ගනිමින් සිටියි.

2022 වසරේදී කාර්මික සංවර්ධන මණ්ඩලය සමග අත්වැල් බැඳ ගනිමින් සම් සහ පාවහන් අංශයේ දැනටමත් සිටින පාරිභෝගිකයන් ඉහත මණ්ඩලයෙන් තාක්ෂණික මාර්ගෝපදේශන ලබා ගැනීමට යොමු කරන අතරම එම කර්මාන්තය වෙත මූල්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා බැංකුව යොමු විය.

10 අරමුණ - අසමානතා අඩු කිරීම

තිරසාර සංවර්ධන අරමුණු 10 හි ඉලක්ක දර්ශක අංක 10.3.1 මඟින් පැහැදිලිව දැක්වෙන පරිදි කිසිදු ආකාරයක වෙනස් කොට සැලකීම් සම්බන්ධ පැමිණිලි හෝ දුක්ගැනවිලි කිසිවක් 2020 වසරේ මාස 12 තුළ ඉස්මතුව නොමැති බව එච්ඩිඑෆ්සී බැංකුව ඉතා වගකීමෙන් සහතික කරයි.

11 අරමුණ - තිරසාර නගර සහ ප්‍රජාවන්

11 වන තිරසාර සංවර්ධන ඉලක්කය, අඩු මූල්‍ය පහසුකම් සහිත ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිවාස සංවර්ධනය කිරීම උදෙසා දරාගත හැකි කොන්දේසි යටතේ ණය ලබා දීම සම්බන්ධයෙන් බැංකුව අනුගමනය කරන ක්‍රියා පිළිවෙත හා සබැඳෙන්නකි. තිරසාර සංවර්ධන ඉලක්ක 11.1 ට අනුව ප්‍රමාණවත්, සුරක්ෂිත හා දරාගත හැකි කොන්දේසි යටතේ නිවාස හා මූලික සේවා ලබා දීම වෙනුවෙන් බැංකුවේ ප්‍රයත්න දායක වෙයි. තිරසාර නිවාස විසඳුම් ලබා දීමේ රජයේ සැලැස්මට සහාය දක්වන අතරම දරා ගත හැකි ණය පහසුකම් හරහා නාගරික ප්‍රදේශවල නිවාස පහසුකම් ලබා ගැනීමටද අප බැංකුව ගනුදෙනුකරුවන්ට පහසුකම් සලසයි:

16 අරමුණ - සාමය, යුක්තිය සහ සවිමත් ආයතන

ත්‍රස්ත කටයුතු සඳහා මූල්‍ය සම්පාදනය කිරීම් සමග වුවද සබැඳිය හැකි අසාමාන්‍ය ගනුදෙනු නිරීක්ෂණය කරමින් නීති විරෝධී මුදල් ගලනයන් සම්බන්ධයෙන් නිරීක්ෂණාත්මකව කටයුතු කිරීමටද බැංකුව පියවර ගනියි.

2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත වෙතද බැංකුව අනුකූලතාව දක්වයි.

පාර්ශ්වකාර දායකත්වය

ව්‍යාපාරික කටයුතු සංවර්ධනය වෙමින් පවතින අතරම මෙහෙයුම් ව්‍යාප්තිය නොකඩවා සිදු වන්ම විවිධ පාර්ශ්වකරුවන් සමග අපගේ දායකත්වයද දිගින් දිගටම වර්ධනය වේ. දශක තුනක් ඈතට දිවෙන අපගේ ගමන් මග පුරාවට සෑම කේවන හා සමූහ පාර්ශ්වකරුවෙකුම සමග විශ්ව කටයුතු කිරීම නිසැක වශයෙන්ම අපගේ උපායමාර්ගික අවධානය හැඩගැස්වීමට සහ තියුණු කිරීමට හේතු වී ඇති අතර මේ නිසා අපගේ සකලවිධ ව්‍යාපාරික කටයුතු සහ මෙහෙයුම් ක්‍රියාවලි ආශ්‍රිතව නවෝත්පාදනීය ලෙස විකාසනය වීමට දිරිගැන්වීමක් එමගින් අප වෙත ලැබිණ.

අප ගන්නා තීරණ, අපගේ මෙහෙයුම් සහ උපායමාර්ගික සැලසුම් නොකඩවා වර්ධනය වීමත් සමගම කවර වෙනසක් සිදු වුවද එකී වෙනස්කම් හා ඒ ආශ්‍රිත උපායමාර්ගික තීන්දු අපගේ පාර්ශ්වකරුවන් සියලුම දෙනා වෙත සන්නිවේදනය කිරීමේ වගකීමක් අප වෙත පැවරෙයි.

කලින් කලට බැංකු මෙහෙයුම් සහ ක්‍රියාකාරිත්වයන් කෙරෙහි විවිධ බලපෑම් වල්ල කරමින් අපට අදාළ මෙහෙයුම් පරිසරයද ගතික ස්වභාවයකින් සහ අනපේක්ෂිත අයුරින් වෙනස් වන බවද කිව යුතුය. එවැනි වෙනස්කම් සිදු වන අතරතුරේ විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ පාර්ශ්වකරුවන්ට අප වෙත ළඟා වීමට අවස්ථා උදා කරමින් පැහැදිලි හා සෘජු ක්‍රමවේද ඔස්සේ නව සංවර්ධනයන් හා අනාගත ගම්‍යතා පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කිරීමටද අපි නිරතුරුව පියවර ගන්නෙමු.

අපගේ මෙහෙයුම්, මූල්‍යමය ජයග්‍රහණ, තීරණ, කාර්යසාධනය සහ සේවා වෙතින් සෘජු බලපෑමට ලක් වන තනි පුද්ගලයන් සහ විවිධ කොටස්වලට බිඳී ගිය කණ්ඩායම් අප බැංකුවේ පාර්ශ්වකරුවන් අතරට ඇතුළත් වේ. මේ අනුව, පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීමට අප යොදා ගන්නා ක්‍රම යාන්ත්‍රණයන් විවිධ නාලිකා සහ ක්‍රමවේද රාශියකින් සමන්විත වේ.



තවද, පාර්ශ්වකරුවන් සමග අප විසින් පවත්වනු ලැබෙන සෘජු සබඳතා හේතුවෙන් ඔවුන්ගේ අභිලාෂ, එකී අභිලාෂ වෙනස් වීම්, සංජානනයන් මෙන්ම ඔවුන් වෙත ලබා දෙන වටිනාකම කෙටි, මධ්‍ය හා දිගු කාලීනව ඉහළ නැංවීමට අපට හැකි වන්නේ කෙසේද වැනි කාරණා නිවැරදිව හඳුනා ගැනීමට අපට මග පාදයි. ඔවන් සමග නිරන්තර පදනමක් මත සම්බන්ධතා පැවැත්වීම තුළින් උපායමාර්ගික වශයෙන් අපට වැදගත් වන කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම උකහා ගැනීමට අපට අවස්ථාවක් උදා වන බවද අපි උදක්ම විශ්වාස කරමු.

අපගේ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම

පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා	කොටස් හිමියන් සහ ආයෝජකයන්	ගනුදෙනුකරුවන්	සේවකයන්	හවුල්කරුවන් සහ සේවා සැපයුම්කරුවන්	ප්‍රජාවන් සහ පරිසරය	නියාමන අධිකාරීන්
	■ බැංකුවේ මූල්‍යමය තත්ත්වය ■ වාරික හා වාර්ෂික මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය ■ අනුකූලතාව හා ආයතනික පාලනය ■ අවදානම් කළමනාකරණය ■ උපායමාර්ගික සැලැස්ම ■ වගවීමෙන් හා විනිවිදභාවයෙන් යුතු ආචාර ධාර්මික පිළිවෙත්	■ නිවාස මූල්‍යකරණය සාක්ෂාත් කෙරෙන මූල්‍ය නිපැයුම් ■ මූල්‍ය අවශ්‍යතා සන්තෘප්ත කෙරෙන මූල්‍ය නිපැයුම් ■ සුහදශීලී සේවාව ■ මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය ■ සේවා වෙත ප්‍රවේශය සහ ළඟාවිය හැකි බව ■ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ සංවර්ධනය ■ සේවා තොරතුරු ■ මූල්‍යමය වශයෙන් අව වරප්‍රසාදිතයන් සවිගැන්වීම ■ මූල්‍ය අධ්‍යාපනය	■ වැටුප් හා ගෙවීම් ■ පාරිතෝෂික හා පිළිගැනීම ■ පුහුණු හා සංවර්ධන ■ සහයෝගී සේවා සංස්කෘතිය ■ දියුණුව හා අනුප්‍රාප්තිකයින් පත් කිරීම	■ ගිවිසුම් සන්තෘප්ත කිරීම ■ නිසි කලට ගෙවීම් සහ ගාස්තු ■ පහසු සන්නිවේදනයන් ■ සුහදශීලී සබඳතා ■ ව්‍යාපාරික අවස්ථා ඉහළ නැංවීම	■ වරප්‍රසාද නොලැබෙන ප්‍රජාවන්ට සේවය කිරීම ■ සමාජයීය හා මූල්‍යමය වශයෙන් වරප්‍රසාද රහිත අයට සහාය වීම ■ නිවාස හා සබැඳි මූල්‍ය සහාය සැපයීම ■ ප්‍රජාවන්, කුඩා ව්‍යාපාර හිමියන් සහ වෙළෙඳ අංශ වෙත සහාය වීම ■ පරිසරය වෙත සුබවාදී බලපෑමක් ඇති කිරීම	■ නීති සහ රෙගුලාසි වෙත නිසි කලට අනුකූලතාව දැක්වීම ■ ජාතික නිවාස සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය වීම ■ විවෘත හා අවංක තොරතුරු හෙළිදරවු කිරීම් ■ අවශ්‍ය අවස්ථාවලදී අදාළ ලිපි ලේඛන ලබා දීමට ඇති සූදානම
සබඳතා පවත්වන නාලිකා සහ ව්‍යාපාර ගණන	වාර්ෂික මහා සභා රැස්වීම සහ වාර්ෂික වාර්තාව (වාර්ෂිකව) මුහුණට මුහුණ සාකච්ඡා (අවශ්‍ය වූ විට) වාර්තා සහ ප්‍රකාශන සඳහා වෙබ් අඩවිය (නිරතුරුව) වෙබ් අඩවියේ කොටස් හිමියන් පිටුව (නිරතුරුව) පුවත්පත් සහ මාධ්‍ය සන්නිවේදන (අවශ්‍ය වූ විට) කොළඹ කොටස් හුවමාරුව වෙත දැනුම්දීම් (අවශ්‍ය වූ විට) සමාගම් ලේකම් (අවශ්‍ය වූ විට)	ශාඛා (විවෘත කර තැබෙන වේලාවල) ජංගම බැංකු නිලධාරීන් සහ පිරික්සුම් සංචාර (දොරින් දොර සංචාර අතරතුර) ඇමතුම් මධ්‍යස්ථානය (24/7) ප්‍රධාන කාර්යාලය (අවශ්‍ය වූ විට) සමාජ මාධ්‍ය (නිරතුරුව) වෙබ් අඩවිය සහ ඊ-බෑන්කිං (නිරතුරුව) වෙළෙඳ දැන්වීම් (නිරතුරුව) අලෙවිකරණ පත්‍රිකා (නිරතුරුව) සන්තෘප්තතා සමීක්ෂණ (වාර්ෂිකව)	විවෘත දොරටු ප්‍රතිපත්තිය (නිරතුරුව) ඊ-මේල් (නිරතුරුව) රැස්වීම් (මාසිකව හා අවශ්‍ය වූ විට) කාර්යසාධන ඇගයීම (වාර්ෂිකව) වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය (වාර්ෂිකව) පුහුණු වැඩසටහන් සහ වැඩමුළු (නිරතුරුව) දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රමවේදය (නිරතුරුව) විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තිය (නිරතුරුව) සුහසාධන සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් (නිරතුරුව)	රැස්වීම් (අවශ්‍ය වූ විට) ඊ-මේල් (නිරතුරුව) දුරකතන ඇමතුම් (අවශ්‍ය වූ විට) ක්ෂේත්‍ර හෝ කාර්යාලයීය පරීක්ෂාවන් (අවශ්‍ය වූ විට) ටෙන්ඩර් දැන්වීම් සහ සැපයුම්කාර/සේවා සැපයුම්කාර තේරීම් ක්‍රියාවලිය (අවශ්‍ය වූ විට)	මාධ්‍ය සන්නිවේදන සහ මාධ්‍ය නිවේදන (අවශ්‍ය වූ විට) (අවශ්‍ය වූ විට) ප්‍රජා රැස්වීම් (කලාතුරකින්)	දැන්වීම් සහ නිවේදන (අවශ්‍ය වූ විට) සම්මන්ත්‍රණ, ෆෝරම සහ රැස්වීම් (අවශ්‍ය වූ විට) අනිවාර්ය අනුකූලතාව සහ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම් (කලින් කලට) කලින් කලට විගණණ (කලින් කලට) SEC වෙත දැනුම්දීම් (අවශ්‍ය වූ විට)

ව්‍යාපාරික අංශ

සුළු පරිමාණ සහ ආයතනික තැන්පතු

2020 වසරේදී මුල් වරට රට වසා දැමීමත් සමග ආරම්භ වූ කාල වකවානුව ඉතා දුෂ්කර මට්ටමේ අවිනිශ්චිතතා මතු කළ ද තිරසාර සංවර්ධනය පිළිබඳ සුභවාදී බලාපොරොත්තු ඇත කර ගැනීමට හේතුද එමගින් නිර්මාණය කෙරුණි. ඒ අනුව උදා වූ තත්ත්ව යටතේ බැංකුවේ තැන්පතු කළඹ ආශ්‍රිතව ආයතනික තැන්පතුවල පහත වැටීමක් පෙන්නුම් කළ අතර ඉන් අනතුරුව ඊළඟ වර්ෂයේදී සුළු පරිමාණ තැන්පතුවල ඉහළ යාමක් දක්නට ලැබුණි. රාජ්‍ය ආයතන කේන්ද්‍රීය අරමුදල් මෙලෙස ආපසු ගැනීම හේතුවෙන් සුළු පරිමාණ තැන්පතු වෙත ප්‍රමුඛ අවධානය යොමු කිරීමට බැංකුවට දිරිගැන්වීමක් ලැබුණි. සුළු පරිමාණ තැන්පතු ආශ්‍රිත සමස්ථ වර්ධනය අප්‍රේල්, මැයි සහ නොවැම්බර් යන මාසවලදී මුදල් ආපසු ගැනීම නිසා මතු වී තිබුණු හිදැස පිරවීමට යම් පමණකින් දායක විය. මෙම මාස තුනම රට වසා දැමීම් සහ ප්‍රවාහන හා සමාජ ක්‍රියාකාරකම් මත සීමා පැනවුණු කාල විය.

2020 මූල්‍ය වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු රු. බිලියන 40.50 ඉක්මවමින් 12.72% කින් ඉහළ ගියේය. මෙය, මුළු තැන්පතු කළඹෙහි 84% ක කොටසකි. මුළු තැන්පතු පදනම රු. බිලියන 48 දක්වා ඉහළ යාමට දායක වෙමින් සාමාන්‍ය ඉතුරුම් මගින් ඉතුරුම් කළඹ වෙත 16% ක දායකත්වයක් ලැබී තිබුණි.

ප්‍රධාන වශයෙන්ම ආයතනික තැන්පතු ආපසු ගැනීමේ බලපෑමක් වශයෙන් අප්‍රේල් සහ මැයි මාසවලදී ස්ථාවර තැන්පතු ආශ්‍රිත පහත වැටීමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, නිසි කලට සිදු කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් සහ ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් විවිධ ත්‍යාග ආදිය හේතුවෙන් සුළු පරිමාණ තැන්පතු ආශ්‍රිත ඉහළ යාමත් මුළු තැන්පතු පදනම කෙරෙන් විද්‍යමාන විය.

කෙසේ වෙතත්, අවිනිශ්චිත තත්ත්වය පුළුල් ලෙස පැතිරී යාම හේතුවෙන් මුදල් තැන්පත් කිරීමේ මහජන රුචිකත්වය පළුදු වී ගියේය.

2020 වසරේදී මුළු තැන්පතු රැස් වීම 13% කින් වර්ධනය වූ අතර ඒ ආශ්‍රිතව සුළු පරිමාණ ගනුදෙනුකාර තැන්පතුවල 39% ක ඉහළ යාමක් මෙන්ම ආයතනික තැන්පතුවල 3% ක පහත බැසීමක්ද පෙන්නුම් කෙරිණ.

තැන්පතු කළඹ



තැන්පතු පදනමෙන් අති බහුතරය සමන්විත වන්නේ සුළු පරිමාණ ගනුදෙනුකාර තැන්පතුවලින් වන අතර ගනුදෙනුකාර කණ්ඩකරණය සම්බන්ධයෙන් ගත් විට ඊට පසුව ඉහළින්ම පවතින්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය තැන්පතු සහ සමූපකාර බැංකු පදනම් කරගත් තැන්පතු වේ.

දවශීලතා අනුපාතිකය පාදකව ගනුදෙනුකරුවන් බෙදා දැක්වීම රු. බිලියන



තැන්පතු සිදු කළ ගනුදෙනුකරුවන් බෙදා දැක්වීම 2020



උපායමාර්ගික ඉලක්ක

නිපැයුම් විවිධාංගීකරණය සහ නිපැයුම් පාදක අගය වැකතු කිරීම් කෙරෙහි ඉලක්කගත අවධානයක් යොමු කිරීම තුළින් තැන්පතු රැස් කිරීම ඉහළ නංවා ගැනීමට අප බැංකුව දැන් අපේක්ෂා කරයි. මෙහි සමාලෝචනයට ලක් ව මූල්‍ය වර්ෂය තුළදී වර්ධනයක් සනිටුහන් කරන්නට සමත් වූ ස්ථාවර තැන්පතු, ළමා ඉතුරුම් සහ සාමාන්‍ය ඉතුරුම් යනාදිය වැකී තැන්පතු රැස් කිරීමේ ඉලක්කගත අවධානයේ ප්‍රතිඵල වේ.

තැන්පතු රැස් කිරීමේ අපේක්ෂා කෙරෙහි සෘජු බලපෑම් ඇති කරන සාධක වන ආදායම් ධාරිතා ඉහළ යාම සහ සේවා නියුක්තිය ඉහළ යාම ආදිය සැලකිල්ලට ගනිමින් වැටුප් මත පදනම් වූ ඉතුරු සැලසුම් ඇසුරින් නව නිපැයුම් හඳුන්වා දීම අප බැංකුවේ අපේක්ෂාව වෙයි.

සුළු පරිමාණ සහ ආයතනික ණය

උකස් මත පදනම් වූ නිවාස ණය ආශ්‍රිත ආන්තික පහත බැසීමක් සහ සේවක අර්ථසාධක අරමුදල පදනම් කරගත් නිවාස ණය ආශ්‍රිත ආන්තික ඉහළ යාමක් එච්ඩිඑෆ්සී බැංකුවේ මුළු ණය කළඹට ඇතුළත් විය. ඇප පදනම් වූ නිවාස ණය මෙම සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 483 කින් පහත බැස තිබේ. එමෙන්ම, මෙහි සමාලෝචනයට ලක් වන වර්ෂය තුළදී ස්වර්ණාභරණ ණය සහ මුදල් ණය පහසුකම් ලබා ගත් ගනුදෙනුකරුවන්ගේ සුළු ඉහළ යාමක් දක්නට ලැබුණි.

ඇප කේන්ද්‍රීය බෙදී යාම



අක්‍රිය ණය

බැංකු අංශය තුළ අක්‍රිය ණය ඉහළ යාම මනාව පිළිබිඹු කරමින් 2019 දී 25.25 % ක් ලෙස පැවැති එච්ඩිඑෆ්සී බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකයද මෙහි සමාලෝචිත වර්ෂය තුළදී 33.04 % දක්වා ඉහළ ගොස් ඇත.

ගත වූ වර්ෂයේ මෙම කාල සීමාව තුළම 3.85% ක් ලෙස පැවති ස්වර්ණාභරණ ණය කළඹෙහි අක්‍රිය ණය අනුපාතිකය 3.33% කින් සුළු වශයෙන් අඩු වී තිබේ.

ණය කළඹ බණ්ඩ කිරීම %



ණය ආපසු ගෙවීම කල්යාම සහ කාරක ප්‍රාග්ධන ණය

2020 වසරේදී එච්ඩිඑෆ්සී බැංකුවේ සේවාවන් ගනුදෙනුකරුවන් දහස් ගණනකගේ ජීවන සුරක්ෂාව බවට පත් වූ කාල වකවානුවක හැකි හොඳම ඉදිරි පියවර තැබීමට අපි නොපසුබට වූයෙමු. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආයතනික ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය තිරසාරතාව සහතික කිරීම වෙනුවෙන්ම කැප වූ මූල්‍ය මැදහත්කරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 'සෞභාග්‍යා' කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමට එච්ඩිඑෆ්සී බැංකුව කටයුතු කළේය.

එමෙන්ම, 2020 වර්ෂ අවසානයට පෙර හිඟ ණය ගෙවා අවසන් කර තිබූ ගැනුම්කරුවන්ගේ හිඟ මුදල් අත්හැර දැමීමට අමතරව පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ විධිවිධාන සහ ගැලපුම් සිදු කිරීමටද බැංකුව පියවර ගත්තේය.

අප බැංකුව රු. මිලියන 56 ක කාරක ප්‍රාග්ධන ණය ලබා දුන් අතර වසංගත තත්ත්වය සහ රට වසා දැමීම් හේතුවෙන් ව්‍යාපාර බිඳවැටීම් සහ ආදායම් අහිමි වීමෙන් බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් ස්ථාවර තත්ත්වයට පත් කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් ණය සහාය ලබා දෙන ලදි.

උපායමාර්ගික ඉලක්ක

බැංකුවේ ව්‍යාපාරික සහ සේවා ආශ්‍රිත තිරසාර වර්ධනය අරමුණු කරමින් ණය කළඹ වර්ධනය කිරීම සහ සබැඳි සේවා වැඩිදියුණු කිරීම කෙරෙහිද අපි අවධානය යොමු කරන්නෙමු.

සේවා කාර්යක්ෂම කරමින් සමස්ථ සැකසුම් කාලය අඩු කිරීම උදෙසා මේ වන විටත් අපගේ ක්‍රියාවලීන් වැඩ ප්‍රවාහ ප්‍රතිව්‍යුහගත කළ හැකි පරිදි ගලපා තිබේ.

ඉදිරි පෙළ සහ පසු පෙළ ණය මෙහෙයුම් වැඩිදියුණු කිරීම අපගේ අවධානය යොමු වන ප්‍රධාන කාරණාවක් වනු ඇති අතරම, නිවාස සංවර්ධන මූල්‍ය පහසුකම් ආශ්‍රිත සීමිත විවිධාංගීකරණයට අමතරව ආයතනික සහ සංවර්ධන ණය, ස්වර්ණාභරණ ණය සහ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා කාර්ය මණ්ඩල ණය ආදී කාණ්ඩ යටතේ නව ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමද අප බැංකුවේ සැලසුම් අතරවේ.

දැනටමත් පවතින සහ අලුතින් හඳුන්වා දෙනු ලබන ණය නිපැයුම් සඳහා පාවෙන පොලී අනුපාත හඳුන්වා දෙනු ඇති අතර අවදානම් පාදක මිල තැබීමේ සූත්‍ර මත ඉහළ ආදායම්ලාභී ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමේ විධිවිධාන අපගේ ව්‍යාපාරික වර්ධනයේ ප්‍රමුඛ අවධානයක් වනු ඇත.

ණය ඇගයීම සහ අභිනව බැඳීම් පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමද ණය සැකසීම සහ ණය තත්ත්වය ඉහළ නැංවීමේ ඉතා වැදගත් කොටසක් වේ. බැංකුවේ ප්‍රයත්න සැබැවින්ම සාර්ථක වීම උදෙසා ණය ක්‍රියාවලීන්හි ඵලදායීතාව සහතික කිරීම ඉලක්ක කරගෙන මෙකී උපායමාර්ග නිරන්තරයෙන් සමාලෝචනය කිරීමට සහ තක්සේරු කිරීමට අපි පියවර ගන්නෙමු.

ව්‍යාපාරික අංශ

සංවර්ධන සහ ආයතනික මූල්‍ය

වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ වසර සඳහා වූ සැලසුම්වලට අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ ආයතනික ගනුදෙනුකරුවන් වෙත මූල්‍ය සහන හා ණය ලබා දීම කෙරෙහි බැංකුවේ ආයතනික මූල්‍ය හා සංවර්ධනය ඒකකය අවධානය යොමු කරන ලදි. එපමණක්ද නොව, ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් එම ඒකකය කාර්මික ප්‍රජාව සමග උපායමාර්ගික හවුල්කාරත්වයන් කිහිපයක්ම ඇති කර ගන්නා ලදි.

මේ වන විට, ශ්‍රී ලංකා රජය සහ මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද 'සෞභාග්‍යා' සහ 'ස්වශක්ති' ණය යෝජනා ක්‍රම යටතේ මූල්‍ය පහසුකම් ලබා දීමට අමතරව අප බැංකුවටම සුවිශේෂී ණය යෝජනා ක්‍රමද අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කළඹට ඇතුළත් වේ.

8000 ක පමණ ගනුදෙනුකරුවන් පිරිසක් සහිත අපගේ සුළු පරිමාණ ව්‍යවසායික සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායික ගනුදෙනුකාර කළඹට කිරි ගොවිපල පාලනය ආදී කෘෂිකාර්මික කටයුතුවල වැඩි වශයෙන් නිරත වී සිටින පුද්ගලයන් ඇතුළත් වේ. අප බැංකුව නිරන්තරයෙන්ම ඔවුන්ගේ අවශ්‍යතා නිසි ලෙස හඳුනා ගන්නා අතර නිෂ්පාදන සහ වෙළෙඳපොල බාධක ජය ගැනීමට විකී ව්‍යවසායකයන් සවිබල ගන්වනු පිණිස ණය පහසුකම් ලබා දෙයි. 2020 වසර තුළදී අපගේ බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත රු. මිලියන 278.71 ක වටිනාකමකින් යුතු ණය ලබා දෙන ලදි. ගත වූ වර්ෂය පුරාවට පැවැති අස්ථාවර මූල්‍ය පරිසරය හමුවේ ණය ලබා දීම සම්බන්ධයෙන් ඉහළ අවදානමක් පැවැති හෙයින් 'සෞභාග්‍යා කෝවිඩ්-19 පුනර්ජීවන පහසුකමෙහි' ද කොටසක් ලෙස ලබා දෙන ලද මුදල් ඇතුළත්ව සලකා බැලූ විට 2019 වසරේදී ලබා දුන් ණය වටිනාකමට සාපේක්ෂව අඩු වීමක් 2020 දී ලබා දුන් ණය වටිනාකම ආශ්‍රිතව දක්නට හැකි විය.

රජයේ අනුග්‍රහය යටතේ පවතින 'ස්වශක්ති' ණය යෝජනා ක්‍රමය යටතේ එච්ඩීඩීෆ්සී බැංකුව විසින් වසර ගණනාවක් පුරාවට රු. මිලියන 32.20 ක මුළු වටිනාකමකින් යුතු ණය ලබා දී තිබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ අප බැංකුව රු. 500,000 ට වඩා අඩු වටිනාකමකින් යුතු ණය ලබා දෙයි.

මෙම ණය යෝජනා ක්‍රමය හරහා තරුණ ව්‍යවසායකයන් සහ අලුතින් ව්‍යාපාර ආරම්භ කරන ව්‍යවසායකයන් වෙත රු. 50,000 ක ප්‍රදානයක් ලබා දීමටද අප විසින් කටයුතු කර තිබේ.

මෙම ණය යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ ගනුදෙනුකරුවන් සමග බෙදා ගන්නා අතරම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායිකයන් සහ ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායිකයන් සවිබල ගැන්වීමේ රජයේ ප්‍රයත්නය වෙතද බැංකුව දායකත්වය ලබා දෙයි.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී මෙම ඒකකය සම්හා පාවහන්වලට සම්බන්ධ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත ළඟා වීමේ උපක්‍රමයක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය සමග හවුල්කාරත්වයක් ඇති කර ගන්නා ලදි. ගනුදෙනුකරුවන් හට කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික සහාය ලබා ගැනීමට මංපෙත් විවර කරන අතරම එම මණ්ඩලයේ පාවහන් හා සම් නිෂ්පාදන කර්මාන්ත සාමාජිකයන් බැංකුවේ මූල්‍ය සේවා සමග සම්බන්ධ කිරීම මෙම ප්‍රයත්නයෙහි අපේක්ෂිත අරමුණයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපාර රැකවරණ පහසුකම් වෙළෙඳපොල සබඳතා සහ සහායක සේවා ව්‍යවසායක ගනුදෙනුකරුවන් හට දැවැන්ත සවියක් සපයනු නොඅනුමානය.

කුඩා ව්‍යාපාරික කර්මාන්ත සහ දේශීය වෙළෙඳාම් සංවර්ධනය කිරීම ඉලක්ක කරගත් එච්ඩීඩීෆ්සී බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ප්‍රයත්න මේ වන විට බතික් හා අත් යන්ත්‍ර රෙදි කර්මාන්තය සහ වෙනත් විවැනි වෙළෙඳ ක්ෂේත්‍ර වෙතද ව්‍යාප්ත කෙරෙමින් පවතී. දියුණුවට පත් වෙමින් පවතින ක්ෂේත්‍රයක් ලෙස අත්යන්ත්‍ර රෙදිපිලි කර්මාන්තය දියුණු කිරීම සඳහා යොදා ගත හැකි දේශීය නිපුණතා හඳුනා ගැනීම සඳහා බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන අමාත්‍යාංශය සමග සාකච්ඡා පැවැත්වීමටද අප බැංකුව කටයුතු කර ඇත.

මෙම උපායමාර්ගික ක්‍රියාදාමය හරහා සැලසුම් ව්‍යාප්ත කිරීම උදෙසා මෙම සාකච්ඡා කෙටි කාලීනව ඉදිරියටත් පැවැත්වෙනු ඇත.

තිරසාර මූල්‍ය කටයුතු වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් නව පියවරක් වශයෙන් අප බැංකුව පාරිසරික වශයෙන් හිතකර ලෙස ක්‍රියාත්මක වන කර්මාන්ත සඳහා මූල්‍ය සහාය ලබා දීම සඳහා 'හරිත දේශගුණික අරමුදල' සමගද සාකච්ඡා ආරම්භ කළේය.

තිරසාරතාව මූලික කොටගත් මූල්‍ය පහසුකම් ඉහළ නැංවීම සහ තිරසාර බලශක්තිය සම්බන්ධ ජාතික ඉලක්ක වෙත සහාය දැක්වීම වෙනුවෙන් එච්ඩීඩීෆ්සී බැංකුව මේ වන විට ප්‍රගතිශීලී අවධානයක් යොමු කරමින් සිටියි. මෙම ක්‍රියාදාමය යටතේ අනෙකුත් තිරසාර හා පරිසර හිතකාමී විසඳුම්වලට අමතරව හරිත ගොඩනැගිලි සහ හයිබ්‍රිඩ් වාහන සඳහා මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීමට බැංකුව සැලසුම් කරගෙන සිටියි.

ඉදිකිරීම් කර්මාන්තය තුළ නව අවස්ථා රැසක් නැගී එමින් පවතින හෙයින් අනාගතයේදී මෙම දෙපාර්තමේන්තුව ඒ කෙරෙහිද අවධානය යොමු කරනු ඇත. බැංකුව කල්බදු හා අධ්‍යාපනික ණය පහසුකම් වෙතත්, ඉන් අනතුරුව මෑත අතීතයේදී ක්ෂුද්‍ර මූල්‍ය හා ආයතනික ණය වෙතත් යොමු වීමත් සමග ආරම්භ වූ ක්‍රියාදාමයක් වන නිවාස නොවන ණය පහසුකම් සහ මූල්‍ය සම්පාදන කටයුතු වෙත මෙහෙයුම් විවිධාංගීකරණය කිරීම කෙරෙහිද අප දැඩි උනන්දුවකින් කටයුතු අවධානය යොමු කරමින් සිටින්නෙමු.

නිෂ්පාදන කළඹ

- ණය

කැදැල්ල



දේපල ප්‍රාථමික වශයෙන් උකස් කිරීම මත ලබා දෙන නිවාස ණය යෝජනා ක්‍රමය

ශ්‍රම උදාන



සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් හට එහි ශේෂය ඇපයක් ලෙස යොදා ගෙන ලබා ගත හැකි නිවාස ණය පහසුකමකි.

Lifestyle loan



නම් කරන ලද සැපයුම්කරුවන් වෙතින් ගෘහ උපකරණ මිල දී ගැනීම සඳහා.

සිටු සෙවන



ඔබේ ජීවන රටාවට ඔබින අගය එකතු කළ නිවාස ණය පහසුකමකි

අධ්‍යාපනික ණය



උසස් අධ්‍යාපන අවස්ථා හඹා යාමට අදහස් කරන සිසුන් සඳහා වූ ණය යෝජනා ක්‍රමයකි.

රථ වාහන කල්බදු



තනි පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා වූ රථ වාහන කල්බදු පහසුකමකි.

සිරසර නිවාස ණය



දැනටමත් එක්ව සිටින ගනුදෙනුකරුවන්ගේ ජීවන තත්ත්ව ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩිදියුණු කරන ලද නිවාස ණය පහසුකමකි.

දිරිය හා විරුදිරිය



රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූවන් සහ ජීවතුන් අතර නොමැති යුද විරුවන්ගේ පවුල්වල ප්‍රතිලාභීන්ගේ විවිධ මූල්‍ය අවශ්‍යතා සඳහා සහාය වනු පිණිස සැකසූ සුවිශේෂී ණය යෝජනා ක්‍රමයකි.

රන් ණය



හදිසි මුදල් අවශ්‍යතා සඳහා රත්‍රං වටිනාකම මත ණය ලබා දේ.

ආයතනික හා සංවර්ධන මූල්‍ය



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ ආයතනික අංශයට සහාය වීම සඳහාම වෙන් වූ සුවිශේෂී ණය යෝජනා ක්‍රම.

- ඉතුරුම්



දීප ව්‍යාප්ත ATM අන්තර්ජාල බැංකු පහසුකම් සහ ජංගම බැංකු සේවාව හරහා සුවිශේෂී ප්‍රතිලාභ හා මුදල් ආපසු ගැනීමේ පහසුකම සහිත සාමාන්‍ය ඉතුරුම් ගිණුමකි.



නම්‍යශීලී තැන්පතු විකල්ප සහ වෙළෙඳපොලෙහි ඇති උපරිම පොලී අනුපාතිකය සහිත අසමසම ප්‍රතිලාභ උදා කරන විශ්‍රාමික ඉතුරුම් සැලසුමකි.



තරුණ තරුණියන් හට සිය අනාගතය සැලසුම් කර ගැනීමට උපකාරී වනු පිණිස සකස් කරන ලද සුවිශේෂී ධන උත්පාදන යෝජනා ක්‍රමයකි. Set For Life ප්‍රතිලාභ දැනට වෙළෙඳපොලෙහි ඇති තැන්පතු අනුපාතිකයන්ට වඩා ඉහළ පොලී අනුපාතික ලබා දෙයි.



'තිළිණ රැකවරණ' යෝජනා ක්‍රමයට සමාන පහසුකම් සහිත, ශ්‍රී ලංකාවේ බැංකුවක් විසින් දම්ළ ජන ප්‍රජාව වෙනුවෙන්ම සකස් කරන ලද පළමු මූල්‍ය නිපැයුමයි.



ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වෙළෙඳපොලෙහි ඇති සාමාන්‍යයට වඩා ඉහළ පොලියක් උපයා ගත හැකි ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමයකි.



දරුවන්ගේ අනාගත මූල්‍ය සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සකස් කරන ලද සුවිශේෂී ආයෝජන සැලැස්මකි.



ඉතුරුම් ශේෂය ඉහළ යාම මත ආකර්ෂණීය ත්‍යාග ලබා දීමේ වැඩපිළිවෙළක් සහිත බාල වයස්කාර ඉතුරුම් ගිණුමකි.



විශ්‍රාම යාමට පෙර මෙන්ම ඉන් පසුවද ගිණුම් හිමියා සහ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන්ම සුවිශේෂයෙන් සකස් කරන ලද රක්ෂණාවරණ ප්‍රතිලාභ පාදක විශ්‍රාමික ඉතුරුම් සැලසුමකි.



සාපේක්ෂව කෙටි කාලයක් ඇතුළත සිය මූල්‍ය අභිලාෂ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පුද්ගලයන්ට මනාව ගැලපෙන ඉතුරුම් නිපැයුමකි.

ශාඛා ව්‍යාප්තිය

1. කොළඹ
2. හෝමාගම
3. හොරණ
4. හයිඩ් පාක්
5. නුගේගොඩ
6. පිලියන්දල
7. අවිස්සාවේල්ල
8. ගම්පහ
9. ජා-ඇල
10. කිරිබත්ගොඩ
11. නිට්ටඹුව
12. පෑලියගොඩ
13. බදුල්ල
14. මොණරාගල
15. තිස්සමහාරාමය
16. රත්නපුර
17. අම්පාර
18. මඩකලපුව
19. නුවර එළිය
20. කළුතර
21. අම්බලන්ගොඩ
22. ගාල්ල
23. මාතර
24. තංගල්ල
25. ඇඹිලිපිටිය
26. යාපනය
27. වව්නියාව
28. හලාවත
29. කුලියාපිටිය
30. නිකවැරටිය
31. අනුරාධපුරය
32. පොලොන්නරුව
33. ත්‍රිකුණාමලය
34. දඹුල්ල
35. කෑගල්ල
36. මාතලේ
37. කුරුණෑගල
38. මහනුවර
39. ගම්පොල



ශාඛා සංඛ්‍යාව

39

උපායමාර්ගික දැක්ම (2021-2025)

2019 සිට මේ දක්වාම බැංකුවේ නායකත්වය අපගේ උපායමාර්ගික දර්ශනතියට ගැලපෙන පරිදි අරමුණු ප්‍රතිසංවිධානය කිරීමෙහි නිරත වී සිටියි. මීට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ වෙනස් වීම්, බාහිර ව්‍යාපාරික පරිසරයේ වාෂ්පශීලතාව සහ පවතින වසංගත තත්ත්වයේ දැඩි බලපෑම් ආදී සාධක හේතුවෙන් 2020 දී කාර්යක්ෂම උපායමාර්ගික සැලැස්මක් පිළියෙළ කිරීමට බැංකුව තීරණය කළේය.

අප බැංකුවේ අනාගත වර්ධන සැලසුම් ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පුරා විහිදි පවතී. 2022 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති රු. බිලියන 7.5 ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ළඟා කර ගැනීමේ ආසන්නතම ඉලක්කයක් බැංකුවට තිබේ. ප්‍රාග්ධන හිඟය සමනය කර ගැනීමේ ප්‍රයත්නයන්හි කොටසක් වශයෙන් ව්‍යාපාරික වර්ධන අපේක්ෂා පිහිටුවා ගැනීමට ප්‍රධානතම හේතුවක් බවට මෙය පත් වනු ඇත.

2021-2025 සවිස්තර උපායමාර්ගික සැලැස්ම පිළිබඳ දළ සමාලෝචනයක් පහත දැක්වේ.

උපායමාර්ගික ක්ෂේත්‍රය	අරමුණ	කාර්යය සැලැස්ම
ලාභ වර්ධනය	පොලී නොවන ආදායම සහ ලාභදායීතාව ඉහළ නැංවීම	බැංකුව විසින් රක්ෂණකරුවන් සහ තැරැව්කරුවන් පත් කිරීමට යොදා ගන්නා ප්‍රතිපත්ති
		විවිධාංගීකරණය කරන ලද සහ අඩු පිරිවැය ණය පදනම
		බිල්පත් ගෙවීම් රැස් කිරීම ඉහළ නැංවීම
		ඩිජිටල් ගෙවීම් සහ මුදල් යොමු කිරීම් ඉහළ නැංවීම
වෙළෙඳපොල වර්ධනය	ණය දෙන නිෂ්පාදන සහ විසඳුම් විවිධාංගීකරණය කිරීම	ණය නිපැයුම් සහ විසඳුම් විවිධාංගීකරණය ඉහළ ආදායම්ලාභී ගනුදෙනුකරුවන් සඳහා වූ විසඳුම්
		මූල්‍ය සංවර්ධන ව්‍යාපෘති
		පාවෙන පොලී අනුපාත පදනම් වූ නිපැයුම්
		ආයතනික ණය ඉහළ වැඩිදියුණු කිරීම
		ඉහළ කාර්යසාධනයක් ප්‍රකට කරන ගනුදෙනුකරුවන් සඳහා වරණීය පොලී අනුපාත ලබා දීම
		පෞද්ගලික/හරස් විකුණුම
		පවතින ණය විවිධාංගීකරණය කිරීම
	සුළු පරිමාණ තැන්පතු සංයුතිය ඉහළ නැංවීම	ළමා ඉතුරුම් ගිණුම් සහ සාමාන්‍ය ඉතුරුම් ගිණුම් සඳහා ආකර්ෂණීය ත්‍යාග ලබාදීම
		වෘත්තිකයන් සඳහා නව ඉතුරුම් ගිණුම් හඳුන්වා දීම
		ළමා ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම
		නිරන්තර ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන්
	විවිධාංගීකරණය කළ තැන්පතු කළඹ වෙළෙඳපොල ව්‍යාප්තිය ඉහළ නැංවීම	ස්ථාවර තැන්පතු කළඹ තුළ සීමිත තනි තැන්පතුකරුවන් සංකේන්ද්‍රණය කිරීම
		අලෙවි ප්‍රචාරණ ඉහළ නැංවීම
		ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම
		ඩිජිටල් ස්පර්ශක ස්ථාන ව්‍යාප්ත කිරීම
		ජංගම/සමීප බැංකු මෙහෙයුම් ව්‍යාප්ත කිරීම
ඵලදායීතාව	මෙහෙයුම් කාර්යක්ෂමතා ඉහළ නැංවීම කිරීම සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම	වැඩ ප්‍රවාහ සමාලෝචනය කිරීම සහ අවහිරතා ඇති කරන ක්‍රියාකාරකම් ඉවත් කිරීම/ණය සැකසීම සඳහා ගත වන කාලය අඩු කිරීම
ඩිජිටල්කරණය	ඩිජිටල් ස්පර්ශක ස්ථාන සහ ඩිජිටල් බැංකු කටයුතු ඉහළ නැංවීම	ජංගම බැංකුකරණ යෙදුම සංවර්ධනය කිරීම
		සම-සන්නාමිත ඩෙබිට් කාඩ්පත හඳුන්වා දීම
		බැංකුවේ වෙබ් අඩවිය දියුණු කොට යළි දියත් කිරීම
		සමාජ මාධ්‍ය ව්‍යාප්තිය ඉහළ නැංවීම
ව්‍යවස්ථාපිත සහ අනුකූලතාව	ශ්‍රී ලං. මහ බැංකුවේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාව	රු. බි. 7.5 ක අවම ප්‍රාග්ධනයක් ළඟා කර ගැනීම
	ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය ඉහළ නැංවීම	ඉහළ ලාභ රඳවා ගැනීම
	අක්‍රිය ණය අනුපාතිකය අඩු කිරීම	අඩු අවදානම් බර තැබූ වත්කම් වෙත යොමු වීම
		ඉහළ ආදායම්ලාභී ගනුදෙනුකරුවන් ඉලක්ක කිරීම
		නව ණය තත්ත්වය වර්ධනය කිරීම
		ණය වික්රැස් කර ගැනීම සම්බන්ධයෙන් සමීප පසු විපරම් සිදු කිරීම
		දත්ත පදනම් කළමනාකරණ පද්ධති කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහ නිරන්තර පුහුණුව සහ දැනුම්වත්භාවය ඇති කිරීම
		ණය ඇගයීම පිළිබඳ පුහුණුව
		පිළිගත් හා ස්ථාවර ආයතනවල ගනුදෙනුකරුවන්ට ණය ලබා දීම
		ගනුදෙනුකාර-බැංකු සබඳතා නිරතුරුව සවිගැන්වීම
		නම්‍යශීලී නැවත ගෙවීමේ විකල්ප
		ප්‍රධාන කාර්යාලයේ සිට දත්ත පදනම් කළමනාකරණ පද්ධතිය පිළිබඳ නිරන්තර සහ කලින් කලට පසු විපරම් සිදු කිරීම
ෆකාටස් හිමියන්	කොටස් හිමියන්ගේ සහභාගීත්වය වැඩි කිරීම	ඉහළ ලාභදායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම
		නව ලාභාංශ ප්‍රතිපත්තිය
		වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය > වසරකට 1%
සේවකයන්	සේවක අභිප්‍රේරණය සහ ඵලදායීතාව ඉහළ නැංවීම	තාක්ෂණික නිපුණතා ඉහළ නැංවීම සඳහා බාහිර, අභ්‍යන්තර සහ විදේශ පුහුණුවල ලබා දීම
		වගවීම ඉහළ නැංවීම
		හිදැස් හඳුනාගනු පිණිස නිපුණතා පරතර තක්සේරු කිරීම්
		මෘදු නිපුණතා සංවර්ධනය
		කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම



ආයතනික කළමනාකාරිත්වය

සභාපතිතුමියගේ පණිවුඩය



වසන්ති මංචනායක මහත්මිය
සභාපතිනි

කොවිඩ්-19 වසංගත තත්ත්වය අප සියලු දෙනාගේ ජීවිතවල තීරණාත්මක හරවුම් ලක්ෂයක් බවට පත් වූ අතර එය මගින් ඉදිරි වසරවලදීද අප ජීවත් වන ආකාරය තීරණය කෙරෙනු ඇතැයි කිව හැක.

මෙම වසංගතය නිසා සිදු වූ බලපෑම් පූර්ණ වශයෙන් තක්සේරු කිරීමේ හැකියාවක් අපට නොමැති නමුදු අපගේ ගනුදෙනුකරුවන් අති සම්භාරයක්ද ඇතුළත්ව ශ්‍රී ලාංකිකයන් මිලියන ගණනකගේ ජීවනෝපායයන් සහ ව්‍යාපාර බිඳ වැටීමින් එම වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස රට වසා දැමීම් හේතුවෙන් ආර්ථිකය සෘජු පසුබෑමකට ලක් වූ බව නොරහසකි.

පැවැති මෙහෙයුම් පරිසරය දැඩි වාෂ්පශීලිතාවයකින් යුතු, අවිනිශ්චිත එකක් වුවද සියලුම දුෂ්කර තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දෙමින් සමස්ථ ජාතියේම ගනුදෙනුකරුවන් වෙත අපගේ සේවා නොකඩවා ලබා දීමට බැංකුව කටයුතු කළේය.

මෙහි සමාලෝචනයට ලක් වන වර්ෂයට අදාළ අපගේ බදුවලට පෙර ලාභය 2019 වසර හා සැසඳීමේදී රු. බිලියන 1.4 දක්වා, එනම් රු. මිලියන 137 කින්, ඉහළ ගොස් ඇති අතර 2020 වසර පුරාවට බලපැවැත්වුණු ආතති මට්ටම් හමුවේ අත්කර ගත් මෙම වර්ධනය ප්‍රශංසනීය ජයග්‍රහණයකි. මෙම කාල වකවානුව අතිශයින්ම සුපරීක්ෂාකාරීව ගෙවා දමන්නට සිදු වූ මාස 12 ක් වූ අතරම මෙය අපගේ අප්‍රතිහත ධෛර්යය සහ අප සතු පාලන හා අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයන්හි සවිමත්භාවය පරීක්ෂාවට භාජනය කළ කාල පරිච්ඡේදයක් ලෙසද සැලකිය හැක.

බදුවලට පෙර ලාභය රු. මිලියන



උපායමාර්ගික දෘෂ්ටිකෝණයකින් බැලූ කල ශ්‍රී ලංකාව කෝවිඩ්-19 වසංගතයට ගොදුරු වීමට පෙර සිටම අපි ක්‍රමානුකූල නවීකරණයන් සහ උපායමාර්ගික මෙහෙයුම් ප්‍රතිසංවිධානයන් සිදු කරමින් සිටියෙමු. 2020 වසර වෙත අවතීර්ණ වන විට අපගේ තැන්පතු හා ණය වර්ධනය කර ගනිමින් සහ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම සේවා කළඹ වෙත නවීන තොරතුරු තාක්ෂණික සහ ඩිජිටල් මෙවලම් ඇඳා ගනිමින් තැන්පතු වර්ධනය කර ගැනීම කෙරෙහි බැංකුවේ අවධානය යොමු කෙරිණ.

සභාපතිතුමියගේ පණිවුඩය

අප සතු ධෛර්යසම්පන්න කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නොනිමි කැපවීම ඔස්සේ ඉතාම කෙටි කාලයක් තුළ මෙහෙයුම් අඛණ්ඩතාව යළි ලබා ගැනීමට අප බැංකුව සමත් විය. ගනුදෙනුකාර හවතුන් වෙත වැඩිදියුණු කරන ලද අන්තර්ජාල බැංකුකරණ අත්දැකීමක් ලබා දීම අරමුණු කරගෙන අපගේ අන්තර්ජාල බැංකු අවකාශය මාස ගණනාවක් පුරාවට දියුණු කොට නැවත දියත් කරන අතරේ අදාළ නියාමන රෙගුලාසිවලට අනුකූලව අපගේ මෙහෙයුම් යළි ක්‍රියාත්මක කෙරිණ.

ජාතියට රැකවරණය සැපයීම

2020 මාර්තු මස 17 වන දින මුල්ම වරට රට වසා දැමීමෙන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමාගේ නියමය අනුව මාර්තු 19 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සහන සහ ආර්ථික පුනර්ජීවන විධිවිධාන පැනවීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළේය. පුද්ගලයන් සහ ව්‍යාපාර මත පැටවුණු මූල්‍යමය පීඩාව සඳහා සහනයක් ලබා දීම ඉලක්ක කරගත් විධිවිධාන හඳුන්වා දෙමින් මාර්තු 24 දින චක්‍රලේඛයක් නිකුත් කරන ලදි. කල්බදු සහ පුද්ගලික ණය ලබා ගෙන සිටි පුද්ගලයන් වෙත ණය සහන කාලයක් ලබා දීම සහ ව්‍යාපාර සඳහා මූල්‍ය ආධාර ලබා දීම කෙරහි එය ප්‍රධාන වශයෙන්ම මග පාදන ලදි.

එකී සහන පහසුකම් තවදුරටත් දීර්ඝ කරමින් ඉන් ඉදිරියට උදා වූ මාසවලදී එම විධිවිධාන සංශෝධනය කරන ලද අතර මූල්‍ය බැංකු ආශ්‍රිත ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවතින බව සහතික කිරීම සඳහා අති විශේෂ නියාමන විධිවිධාන නිකුත් කිරීමටද ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගත්තේය. නියාමන හේතූන් මත පනවා තිබුණු නවතා දැමීම් ලිහිල් වූ පසුව ප්‍රධාන වශයෙන්ම අඩු ආදායම්ලාභී පුද්ගලයන්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෘත්තිකයන්, ස්වයං-රැකියාවල නියුතු පුද්ගලයන්, රජයේ ආයතන සහ පෞද්ගලික සමාගම් ආදිය කෙරෙන් සමන්විත අපගේ ගනුදෙනුකාර පදනම වෙත ළඟා වීමේ ආසන්නතම කාර්යභාරය එච්ඩීඑෆ්සී බැංකුව වෙත පැවරිණ.

එම පණිවුඩ නිසි කලට සන්නිවේදනය කිරීම සඳහා අපට අවශ්‍ය වූ විධිවිධාන අනුගමනය කිරීමට මෙන්ම සුදුසුකම් ලැබූ ගනුදෙනුකරුවන් සියලුම දෙනා වෙත එකී ප්‍රතිපාදන හිමි වූ බව සහතික කරනු වස් අපි කඩිනමින් ක්‍රියා කළෙමු. ආසන්න වශයෙන් ගනුදෙනුකරුවන් 24,000 ක් වෙත ණය සහන ප්‍රතිලාභ ලබා දීම අප කටයුතු කළ බව මා සඳහන් කරන්නේ නිහතමානී ආඩම්බරයකිනි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික ගනුදෙනුකරුවන්ගේ සුදුසුකම් සහ ආධාර ලබන ව්‍යාපාරවල ජීව්‍යතාව ආදී සාධක මත පිහිටා ඔවුනතරින් 70% ක් පමණ පරිසක් වෙත මූල්‍ය සහාය ලබා දීමටද ඔබේ බැංකුව කටයුතු කර ඇති බව අභිමානයෙන් සඳහන් කරමි.

රාජ්‍ය ආයතන විසින් 2020 වසරේදී ප්‍රතිලාභීන් අතර බෙදා දෙන ලද සමෘද්ධි සහනාධාරය පනම් වූ තැන්පතු ආපසු ගැනීම සඳහාද බැංකුව පහසුකම් සැලසීය. අඩු හා මධ්‍ය ආදායම්ලාභීන්, ස්වයං-රැකියාවල නිරත වන්නන් සහ මූල්‍යමය වශයෙන් අඩු වරප්‍රසාද භුක්ති විඳින් පිරිස වෙත උපකාර වීම කෙරෙහි සවිමත් අවධානයකින් කටයුතු කරන විශේෂිත බැංකුවක් වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව ඉහත කී අතිශයින්ම දුෂ්කර කාල වකවානුව තුළ මූල්‍යමය වශයෙන් අවවරප්‍රසාදිත අපගේ ගනුදෙනුකරුවන් වෙත ළඟා වීම සම්බන්ධයෙන් අපගේ කොටස්හිමියන් සහ පාර්ශ්වකරුවන් අතර පැවැති අපේක්ෂා සහ වගකීම් නිසි ලෙස ඉටු කිරීමටද පියවර ගත්තේය.

හුවමාරු කරගත් වටිනාකම් පෝෂණය කිරීම

මූල්‍ය සහන ලබා දීමට අප දිගින් දිගටම කටයුතු කරන අතරවාරයේදී මෙහෙයුම් කාර්යක්ෂම කිරීම සහ උපායමාර්ගික සැලසුම් සාක්ෂාත් කර ගැනීමට කැපවීම වෙනුවෙන්ද අවධානය යොමු කළෙමු. ප්‍රධාන විධායක නිලධාරී පාලිත ගමගේ මහතාගේ සහ ආයතනික කළමනාකාරිත්වයේ සහායද ඇතිව 2020 වසරේදී අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය 2021-2025 කාල වකවානුව සඳහා අභිනව උපායමාර්ගික සැලැස්මක් සමාලෝචනය කොට කෙටුම්පත් කිරීමටද කටයුතු කළේය. අපගේ වෙළෙඳපොල හා මූල්‍ය තත්ත්ව වර්ධනය කර ගැනීම අරබයා අවශ්‍ය දිශානතිය එම නව සැලසුම මඟින් විදහා දැක්වේ.

උපායමාර්ගික දෘෂ්ටිකෝණයකින් බැලූ කල ශ්‍රී ලංකාව කෝවිඩ්-19 වසංගතයට ගොදුරු වීමට පෙර සිටම අපි ක්‍රමානුකූල නවීකරණයන් සහ උපායමාර්ගික මෙහෙයුම් ප්‍රතිසංවිධානයන් සිදු කරමින් සිටියෙමු. 2020 වසර වෙත අවතීර්ණ වන විට අපගේ තැන්පතු හා ණය වර්ධනය කර ගනිමින් සහ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම සේවා කළඹ වෙත නවීන තොරතුරු තාක්ෂණික සහ ඩිජිටල් මෙවලම් යොදා ගැනීම කෙරෙහිද බැංකුව අවධානය යොමු කළේය. ආයතනික හා සංවර්ධන කළඹ ආශ්‍රිත වර්ධනය හඹා යාම සහ ක්‍රවේදීය අවහිරතා සහ ප්‍රමාද වීම් අඩු කර ගැනීම යනාදියද අපගේ සැලසුම් අතරට ඇතුළත් විය.

ගනුදෙනුකරුවන් හට මුහුණ පාන්නට සිදු වූ මූල්‍යමය දුෂ්කරතා මැඩපවත්වනු පිණිස අපගේ මෙහෙයුම් දිශානතිය වෙනස් කර ගැනීමට අපට සිදු විය. අතිශියින්ම වැඩිදියුණු කරන ලද අපගේ අවදානම් පාලන විධිවිධානවල කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකරුවන් වෙත ණය සහන හා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වයෙහි දරාගත හැකි බවද මෙම තත්ත්වය තුළින් අවධාරණය කෙරිණ.

අපගේ නිවාස ණය සහ රන්ණය අංශ සුළු වශයෙන් වර්ධනය වූ අතර මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී සුළු පරිමාණ තැන්පතු පදනම ප්‍රශස්ථ වර්ධනයක් අත්කර ගැනීමට සමත් වූයේ පැවැති අභියෝගාත්මක සිදුවීම් සියල්ලටම මුහුණ දෙමින් වීමද සුවිශේෂී කරුණකි.

තිරසාර වර්ධනයේ නියමුවෝ

2020 වසරේදී අපගේ අධ්‍යක්ෂවරුන් සිව් දෙනෙකු විශ්‍රාම යාම සහ ඉල්ලා අස් වීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය වෙනසකට ලක් විය. ඉන් අනතුරුව මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අලුතින් සාමාජිකයන් සිව් දෙනෙකු පත් කරන ලදි. මෙම කාල වකවානුව තුළදී අපගේ ආයතනික පාලනය සහ නායකත්වය ලබා දීම පිළිබඳ හොඳම පිළිවෙත් වැඩිදුරටත් සවිගැන්වීමේ උපායමාර්ගික ප්‍රයත්නයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් පිහිටුවා ගන්නා ලදි.

මේ අතරම, කොවිඩ්-19 වසංගතය නිසා ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන නිසි පරිදි බෙදා දීමට පහසුකම් සැලසීම සහ මෙහෙයුම් කාර්යසාධනය අධීක්ෂණය කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය අපගේ ආයතනික කළමනාකාරිත්වය සහ ප්‍රමුඛ පුද්ගලයන් සමග පැහැදිලි සන්නිවේදනයන් පවත්වා ගැනීමටද කටයුතු කර තිබේ.

එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලැබුණු ප්‍රතිපෝෂණ ඔස්සේ ඒ වන විට පැවැති උපායමාර්ගික දිශානතිය සහ විශේෂිත බැංකුවක් වශයෙන් අප විසින් අභිනවයෙන් පිහිටුවා ගෙන තිබුණු අරමුණු පිළිබිඹු කරනු පිණිස අපි අපගේ බැංකුවේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ප්‍රකාශනයද නැවත සකසා ගත්තෙමු.

නියාමන අවශ්‍යතා වෙත අනුකූලතාව දැක්වීම වෙත අවධානය යොමු කරමින් 20.67% තරම් ඉහළ සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගැනීමටද අප බැංකුවට හැකි විය (අවම අවශ්‍යතාව 12.5% කි). කෙසේ වෙතත්, අවම ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන වටිනාකම රු. බිලියන 5 සිට රු. බිලියන 7.5 ලෙස වැඩි කොට සංශෝධනය කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් රු. බිලියන 1.5 ප්‍රාග්ධන හිඟයකට අපි මේ වන විටත් මුහුණ පා සිටින්නෙමු. 2022 වසර අවසානය වන විට අතිරේක කොටස් රැස්කර ගැනීමේ වගකීම මේ වන විට බැංකුවට පැවරී ඇති අතර ඉදිරි මාසවලදී ඒ වෙනුවෙන් විධිවිධාන කිහිපයක්ම ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මෙහෙයුම් දෘෂ්ටිකෝණයකින් බැලූ කල ක්‍රියාවලි කාර්යක්ෂම කරමින් එවා ප්‍රමාද කරන සංකීර්ණතා බවත් කිරීම කෙරෙහිද අප බැංකුවේ අවධානය යොමුව තිබේ. ඒ අනුව අන්තර්ජාලය පාදක කරගත් පද්ධතියක් වෙත මාරු වීම තුළින් ප්‍රගතියක් අත්කර ගැනීමට අපට හැකි විය. ඉහළ කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකරුවන්ගේ පහසුව ඉලක්ක කරගනිමින් තොරතුරු තාක්ෂණික පද්ධති වැඩිදියුණු කිරීම සහ ඩිජිටල්කරණ ක්‍රියාදාම ඔස්සේ ඉදිරි පස් වසර තුළදීද එවැනි අමතර සංවර්ධනයන් සිදු කෙරෙනු ඇත.

වර්ධන දිශානතිය

2021 වසරේදී අපගේ පසු අවුරුදු උපායමාර්ගික සැලැස්ම සැලසුම් කිරීම සහ එය ක්‍රියාත්මක කෙරෙන අයුරු අධීක්ෂණය කිරීම ඉදිරියටත් සිදු කෙරෙනු ඇත.

ඒ අනුව, සාමාන්‍ය කොටස් වටිනාකම රු. බිලියන 11.5 දක්වා ඉහළ නැංවීම, මුළු වත්කම් වටිනාකම රු. බිලියන 116.9 දක්වා වැඩි කිරීම සහ 2025 වන විට අපගේ සුළු පරිමාන තැන්පතු සංයුතිය 70% දක්වා ඉහළ නංවන අතරම අක්‍රිය ණය අනුපාතිකය 6% දක්වා පහත හෙළීම අවසන් වශයෙන් ඉලක්ක කර ගනිමින් අපගේ උපායමාර්ගික අරමුණු සහ වාර්ෂික මෙහෙයුම් අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අපි කටයුතු කරන්නෙමු.

පවතින ශක්‍යතාවන්හි ප්‍රතිලාභ උදාකර ගනිමින් වෙළෙඳපොල අවස්ථා අපගේ සුභසිද්ධිය තකා යොදා ගැනීම සඳහා වූ ව්‍යාපාරික වර්ධන මගපෙන්වීමක් අපගේ උපායමාර්ගික සැලැස්මෙන් ලැබේ. මෙහිදී ශ්‍රී ලාංකිකයන් මූල්‍යමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා අප දක්වන කැපවීමේදී අපගේ අවධානයට ලක් වන තවත් කාරණයක් වන්නේ මධ්‍ය ආදායම්ලාභී පුද්ගලයන් වෙත දරාගත හැකි මුදලකට නිවාස පහසුකම් ලබා දීමේ රජයේ ප්‍රයත්නයයි. නිවාස මිලදී ගන්නා පුද්ගලයන්ගේ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් මෑතකාලීනව හඳුන්වා දී ඇති සහනදායී පොලී අනුපාතවල ප්‍රතිලාභ වාසියක් ලෙස යොදා ගැනීමට මේ සම්බන්ධයෙන් අපි බලාපොරොත්තු වෙමු.

උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අමතරව අඩු අවදානම් බර තැබූ වත්කම් අත්කර ගැනීමටත්, ණය ලබා දීමේදී හිතකර හා විචක්ෂණ පාලනයන් ක්‍රියාවට නැංවීමටත් අපි අපේක්ෂා කරමු.

මෙවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරි වසරේදී වත්කම් තත්ත්වය ඉහළ නැංවීමට සහ සමස්ථයක් ලෙස අක්‍රිය ණය අනුපාතිකය අඩු කර ගැනීමට දායකත්වයක් ලැබෙනු ඇති බවට සුභවාදී බලාපොරොත්තුවක් අප සතුව ඇත.

ණය සහන කාල ලබා දීම හේතුවෙන් අත් විය හැකි ප්‍රතිඵල පූර්ණ වශයෙන් උපකල්පනය කර නොමැති නමුදු, අරමුදල් පිරිවැය සම්බන්ධ වැඩිදුර සීමාවන් සිදු කිරීමට අප බැංකුව කටයුතු කරනු ඇති අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ ආයතනික මූල්‍ය සංවර්ධනය ක්‍රමානුකූලව ව්‍යාප්ත කරන අතරම නිවාස ණය පහසුකම් සීමිත අයුරින් විවිධාංගීකරණ කිරීම කෙරෙහි ප්‍රධාන ලෙසම අපගේ අවධානය යොමු වනු ඇත. අපගේ අබණ්ඩ ව්‍යාපාර විවිධාංගීකරණ උපායමාර්ගය අනුගමනය කරමින් අඩු අවදානමක් සහිත ණය ලබා දීම් වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම අවදානම් කළඹ පහත හෙළීමේ අරමුණින් නිවාස මූල්‍ය පහසුකම් කෙරෙහි අප දක්වන දැඩි කේන්ද්‍රගතභාවය අඩු කර ගැනීමටද අපි බලාපොරොත්තු වෙමු.

ඉදිරි වසරවලදී තවත් ශාඛා 15 ක් අලුතින් එක්කර ගැනීම තුළින් ගනුදෙනුකරුවන් වෙත වැඩි වශයෙන් ළඟා වීම සඳහා අපගේ ශාඛා ජාලය පුළුල් කර ගැනීමටද අපි බලාපොරොත්තු වෙමු. කෙසේ වෙතත්, අමතර වශයෙන් එකතු වූ ප්‍රාග්ධන අවශ්‍යතාව නිසා එය අභියෝගාත්මක ඉලක්කයක් බවට පත්ව ඇති බවද කිව යුතුය.

මේ අතරම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම උදෙසා අපගේ තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීමටද අපි කටයුතු කරන්නෙමු. මීට අමතරව නව ඩිජිටල් විසඳුම් ඔස්සේ අපගේ අඟය එකතු කළ සේවාවන් ඉහළ නැංවීම වෙනුවෙන්ද බැංකුව කටයුතු කරයි. මෙහෙයුම් පිරිවැය පාලනය කර ගැනීමට උපකාරී වන මෙම අරමුණු වෙනුවෙන් වැඩිදුරටත් මුදල් වෙන් කිරීමට බැංකුව අපේක්ෂා කරයි. එසේම, කඩදාසි භාවිතයෙන් තොර මෙහෙයුම් කර යොමු වීමටද අප බලාපොරොත්තුවෙන් සිටින අතර ණය උත්පාදන පද්ධතිය හරහා ලේඛන කළමනාකරණය කිරීම සහ අතථ්‍ය රැස්වීම් පද්ධති ආදී වැඩිදියුණු කිරීම් ඔස්සේ දැනටමත් එකී කාර්යයන් සිදු වෙමින් පවතී.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාව මුල් කරගත් උපායමාර්ගික සැලැස්මට අදාළ කළමනාකාරිත්වයේ කාර්යභාරය සම්බන්ධයෙන් ඉදිරි මාස කිහිපය පුරාවටම අධ්‍යක්ෂ මණ්ඩලය මගපෙන්වනු ඇත.

ස්තුති කිරීම්

මෙරට සමස්ථ බැංකු පද්ධතියම මේ දක්වා මුහුණ පෑ අතිශයින්ම අභියෝගාත්මක කාල වකවානුව තුළ සාර්ථකත්වය කරා අපගේ බැංකුව මෙහෙයවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අපගේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පාලිත ගමගේ මහතා වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. එමෙන්ම, අප කෙරෙහි නිරන්තර අනුග්‍රහය දක්වමින් කටයුතු කළ කොටස් හිමියන් සහ වසර පුරාවටම අප වෙත දැවැන්තම සවියක් වෙමින් නිසි අවබෝධයෙන් දැක්වූ සහයෝගය උදෙසා අපගේ සේවක භවතුන් වෙතද මාගේ නොවක් ස්තුතිය පිරිනැමේ.

වසර ගණනාවක් පුරාවට අප කෙරෙහි විශ්වාසය තබමින් සහ ඒ ඇසුරින් ඉහළ තත්ත්වයේ සේවා ලබා දීමට අවස්ථාවක් අපට උදා කළ ගනුදෙනුකරුවෝද මාගේ සම්භාවනාවට පාත්‍ර වෙති.

ඉදිරි වසර අප සියලු දෙනා වෙත ස්ථාවරභාවය, සාමාන්‍ය දිවි පෙවෙත් සහ සෞභාග්‍යය උදා කරනු එකක් වෙතැයි මම බලාපොරොත්තු වෙමි.



වසන්ති මංචනායක මහත්මිය
සභාපතිනි

සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය



පාලිත ගමගේ මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2020 වසර වෙත පිය මනින විටත් උපායමාර්ගික වර්ධන අරමුණු වේගවත් කිරීමට හේතු වන සැලසුම් කිහිපයක්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බැංකුව අවධානය යොමු කොට තිබුණි. රට පුරා පැතිර යාමට නියමිතව තිබුණු ගෝලීය වසංගත තත්ත්වයේ සම්පූර්ණ හැඩරුව ගැන ඒ වන විට අප අවබෝධ කරගෙන තිබුණේ සුළු තොරතුරු ප්‍රමාණයක් පමණි. කෙසේ වෙතත්, පැවති සන්දර්භය සමග බැඳී තිබුණු අවදානම් සහ අවිනිශ්චිතතා තක්සේරු කිරීමත් සමග මෙම වසංගතය නිසා ව්‍යාපාරික අඛණ්ඩතාව කෙරෙහි දැඩි බලපෑම් එල්ල වනු ඇති බව අපට පෙනී ගියේය.

ඒ අනුව, මෙහෙයුම් ආශ්‍රිත නම්‍යශීලීතාව සවිගැන්වීම සහ ගනුදෙනුකරුවන් හට අපගේ සේවාවන් ලබා ගැනීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම කෙරෙහි එතෙක් පැවැති අනෙකුත් සියලුම ප්‍රමුඛතා අභිබවා වැඩි වැදගත්කමක් ලබා දෙන ලදි. කෙසේ වෙතත්, ඩිජිටල්කරණය සහ තාක්ෂණය පාදක වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ සා උචිත වෙනත් කිසිදු කාලයක් උදා වීමට ඉඩක් නොවූ පසුබිමක ඉන් අනතුරු මාසවලදී අප වැඩි අවධානයක් යොමු කළ එක් උපායමාර්ගික ගමන් මගක් විය.

කෝවිඩ්-19 වසංගතයේ බලපෑම සිහිපත් කරමින්...

මුල් වරට රට සවා දැමීම හේතුවෙන් රටේ ආර්ථික කටයුතු නිහඬ වී සමාජ අන්තර්ක්‍රියා මුළුමනින්ම අඩාල වීමෙන් අනතුරුව උදා වූ තත්ත්ව ඉන් පෙර කිසි කලෙක අප අත් නොවිඳි ඒවා විය. කෙසේ වෙතත්, ව්‍යාපාර හුදෙක් නොනැසී ආරක්ෂා වීමේ පිළිවෙතකට යොමු වූවිම කාලයේදී රටේ මූල්‍ය පද්ධතිය ආශ්‍රිත කඩිනම් සහන විධිවිධාන කරළියට පැමිණුනි.

ඒ වන විට ගනුදෙනුකරුවන් වෙත මූල්‍ය සහන ලබා දීමේ සහ ණය සහන උදා කිරීමේ හැකියාව අප බැංකුව සතුවද පැවතිණ. දිවයින පුරා සමෘද්ධි සහනාධාරලාභීන් වෙත ආර්ථික සහන ලබා දෙමින් සමෘද්ධි සහනාධාර තැන්පතු ආපසු ගැනීමට ක්ෂණිකව සහාය දැක්වීම තුළින් ශ්‍රී ලංකා රජයද අපගේ දායකත්වයට උපකාරී විය.

මෙම සටහන ඔබ වෙත තබන මේ මොහොත වන විට ශ්‍රී ලංකාවේ පළමු කෝවිඩ්-19 ආසාදිත රෝගියා හඳුනාගෙන වසරකට වැඩි කාලයක් ගත වී තිබේ. වයිරසයේ ව්‍යාප්තිය තවමත් රට පුරාම පැතිරී යමින් පවතින පසුබිමක ප්‍රති ඵලන්ත කෙමෙන් ව්‍යාප්ත වීම සහ වැඩිදියුණු කරන ලද පීසීආර් පරීක්ෂණ නිසා වයිරසයේ පැතිරීම හඳුනා ගැනීමට හැකි තත්ත්වයක් උදා වීම නිසා අනාගතය ගැන සුභවාදී අපේක්ෂා දල්වා සිටීමට හේතු අප වෙනුවෙන් බිහි වී තිබේ.

ඉතාම බරපතල ගණයේ ප්‍රතිඵල උදා කරමින් වයිරස ව්‍යාප්තිය පාලනය කිරීම අරබයා ගෝලීය මට්ටමේ බලපෑම්ද කෝවිඩ්-19 වසංගතය නිසා එල්ල විය. එය කිසිදු වෙනසකින් තොරට සමස්ථ ලෝකයේම මිනිස් වර්ගයා එක හා සමාන බියකින් හා කම්පනයකින් වෙළී ගිය කාල වකවානුවක්ද විය. ලොව අතිශයින්ම දියුණු ආර්ථිකයන් සහ සෞඛ්‍යාරක්ෂණ පද්ධති පවා දිනා දින ඉහළ නගිමින් පැවති රෝගීන් සංඛ්‍යා හමුවේ අසරණ තත්ත්වකය ඇද වැටුණි. කෙසේ වෙතත්, අපට සමාන ජනගහණයක් සහිත ඇතැම් සංවර්ධිත රටවල් සමග සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව මෙම වයිරස ව්‍යාප්තිය පාලනය කර ගැනීමට සමත් වූ ආකාරය අප සියලුම දෙනා දිරිමත් කරවන සුළු ය.

මේ නිසා, තමන් ගැන නොසිතා පෙරමුණ ගෙන සුවහසක් ජීවිත බේරා ගැනීම වෙනුවෙන් නිරන්තර කැපවීමෙන් කටයුතු කළ අපගේ සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් ගැන අප නිසැකවම අභිමානයට පත් විය යුත්තෙමු.

වසංගත තත්ත්වය සහ රට වසා දැමීම් හේතුවෙන් එල්ල වූ ආර්ථික බලපෑම් කිසි ලෙසකින් වරදාගත නොහැකි අවස්ථා විය. මේ අනුව පුරවැසියන් තමන් රැඳී සිටින ස්ථාන වෙත සීමා වී කල් හැරීම ප්‍රමුඛ අවශ්‍යතාවක් බවට පත් වුවද දැවැන්ත මූල්‍යමය අලාභද ඒ තුළ විඳීමට සිදු වූ බව නොරහසකි. මිනිසුන් නිවාස තුළට සීමා කොට තැබීම සඳහා ගනු ලැබූ තීරණය හේතුවෙන් රටේ සෞඛ්‍ය පද්ධති කෙරෙහි අනවශ්‍ය පීඩනයක් එල්ල වීම වළකා ගැනීමට හැකි වුවද ඒ හේතුවෙන් ගිණිය නොහැකි තරම් ජීවිත දැඩි දුෂ්කරතාවන්ට ලක් වූ බවද පෙනෙන්නට තිබුණි.

එමෙන්ම, මෙම වසංගතය ඉතා වේගයෙන් පැතිරී යාම නිසා ගෝලීය වටිනාකම් පද්ධති බිඳ දමමින් දේශසීමාන්තර ගමනාගමනයන් මත සීමා පැනවීමටද සිදු වූ තත්ත්වයක් උදා විය. මෙහි ප්‍රතිඵලය වූයේ ගෝලීය ආර්ථිකය -4.3 කින් හැකිළී යාමයි. මේ නිසා දේශීය ආර්ථිකයද -3.6% ක හැකිළී යාමකට ලක් වූ අතර බොහෝ රටවල් දේශ සීමා අතර ගමන් කිරීම කෙරෙහි සීමා පැනවීමත් සමගම සංචාරක කර්මාන්තයද ඇතුළත්ව වෙළෙඳ හා වාණිජ කටයුතු සීමිත වීමේ ප්‍රතිඵලය එමගින් මනාව පිළිබිඹු වෙය



මූලාශ්‍ර: Google COVID-19 Community Mobility Report (database); Haver Analytics; Our World in Data (database); ලෝක බැංකුව, ගෝලීය ආර්ථික පුරෝකථන. 2021 ජනවාරි ලෝක බැංකු සමූහය

UNCTAD ආයතනයට අනුව, 2020 වසරේදී ජාත්‍යන්තර වෙළෙඳාම ආශ්‍රිත දැවැන්ත බිඳ වැටීම් සිදු වූ අතර එහි වැඩිම බලපෑඹ එල්ල වූයේ සේවා අංශය වෙතයි. ලෝක වාණිජ වෙළෙඳාම 9.2% දක්වා ශීඝ්‍රයෙන් පහත වැටී 2021 දී නැවත 7.2% දක්වා ඉහළ නගිනු ඇතැයි ලෝක ලෝක වෙළෙඳ සංවිධානය පුරෝකථනය කළද එම පෙරළා ඉහළ නැගීම පවා මෙම අර්බුදයට පෙර පැවැති මට්ටමට වඩා පහළින් පිහිටන්නකි.

ලෝක බැංකුව විසින් පළ කර ඇති ලෝක ආර්ථික පුරෝකථන (Global Economic Prospects) වල සඳහන් කර ඇති පරිදි නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය ණය 9% කින් ඉහළ යාමත් සමගම ගෝලීය ණය මට්ටමද දැවැන්ත ඉහළ යාමකට ලක් වනු ඇතැයි ප්‍රකාශ විය.

කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය

දේශීය පරිසරය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද සුවිශාල නම්‍යශීලීත්වයකින් යුතු සහ පූර්වාරක්ෂක මූල්‍ය විධිවිධාන නිසැක වශයෙන්ම තාවකාලිකව හෝ ආර්ථික දුෂ්කරතා මගහරවා ගැනීමට දැවැන්ත සවියක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන්ට හා ව්‍යාපාරවලට අදාළ මූල්‍ය බැඳීම් අරබයා කිසියම් විරාම සහනයක් ලැබුණා පමණක් නොව, සිය සීමා සහ කාර්ය පරාස අභිබවා යමින් මූල්‍ය සහන ලබා දීමේදී අවශ්‍ය නියාමනාත්මක ලිහිල් කිරීම් හා දිරිගැන්වීම් මූල්‍ය පද්ධතිය තුළ සක්‍රිය බැංකු වෙතද හිමි විය. එවැනි ප්‍රතිපත්තිමය වෙනස්කම් සුභවාදී වැරගැන්නුම් ලෙස දැකිය හැකි වුවද, ණයවලට අදාළ පොලී අනුපාත අඩු වීම, ණය නැවත ගෙවීමේ කාල සීමා දීර්ඝ කිරීම, අක්‍රිය ණය ඉහළ යාම සහ වත්කම්වල ගුණාත්මකභාවය දුර්වල වීම ආදී ප්‍රතිඵලවල බලපෑම තක්සේරු කළ හැකි වන්නේ ලබා දී ප්‍රමාද සහන කාලවලින් අනතුරුව පමණි.

ආර්ථික සහන සැලසීම

2020 මාර්තු මාසයේදී රට වසා දැමීමේ වාතාවරණයක් තුළ ජනතාවගේ ජීවනෝපායයන් දැඩි බිඳ වැටීමකට ලක් වීමෙන් අනතුරුව අප බැංකුව විසින් ඉටු කළ යුතු වගකීම්සහගත භූමිකා දෙකක් අප වෙත ඉස්මතු විය. ග්‍රාමීය ගනුදෙනුකරුවන් සහ අඩු-මධ්‍ය ආදායම්ලාභීන් වැඩි වශයෙන් සම්බන්ධ වී සිටින බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් ණය සහන ලබා දීමේ කඩිනම් වගකීම එච්ඩීඑෆ්සී බැංකුව වෙත පැවරිණ. එමෙන්ම, කොටස් හිමිකාරත්වයෙන් බහුතරය රජයේ යටතේ පවතින බැංකුවක් වශයෙන්ද ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් සහාය දැක්වීමේ පුළුල් පරමාර්ථයකින් යුතුව අපි කටයුතු කළෙමු.

ඒ වන විටත් ආර්ථික සීමාකම් හේතුවෙන් පීඩාවට ලක්ව සිටි අපගේ ගනුදෙනුකරුවන් අතරින් බහුතරය සතු මූල්‍ය තත්ත්ව වසංගත තත්ත්වය උත්සන්න වීමත් සමග තවදුරටත් බැඳ වැටීමට ලක්ව තිබුණි. මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය වෙනුවෙන් තිර කැපවීමකින් කටයුතු කරන අප බැංකුවේ අවබෝධය සහ උපකාරය ගනුදෙනුකරුවන්ට වැඩියෙන්ම දැනුණු කාල වකවානුව වූයේද මෙයයි.

මේ නිසා, වාරික ගෙවීම් ප්‍රමාද වී තිබුණු ණයවලට අදාළ පොලී කොන්දේසි සහිතව අත්හැර දමන අතරම එතෙක් පැවති ණය ප්‍රතිව්‍යුහගත කිරීමට සහ නැවත ගෙවීමේ කාල දීර්ඝ කිරීමට අමතරව, එච්ඩීඑෆ්සී බැංකුවේ සුළු පරිමාණ ගනුදෙනුකරුවන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ ස්වයං-රැකියාවල නිරත වූවන් වෙත නම්‍යශීලී ණය පහසුකම් ලබා දීම තුළින් මූල්‍ය සහාය ලබා දීමට අපි පියවර ගත්තෙමු.

එමෙන්ම, අපගේ සේවකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතභාවය සහතික කිරීමේ භාරදූර වගකීමද අප වෙත පැවරී තිබුණි. අත් පිරිසිදුකාරක දියර, පාද පිරිසිදුකාරක කළාල හා මුහුණු ආවරණ ලබා දීමට අමතරව ඒ වෙනුවෙන් අප අනුගමනය කළ පළමු පියවර වූයේ අපගේ ශාඛා සියල්ලම හා ප්‍රධාන කාර්යාලය විෂබීජහරණයට ලක් කිරීමයි.

සිය පෞද්ගලික වාහන භාවිත කරමින් සේවයට වාර්තා කළ සේවකයන් හට දීමනාවක් ලබා දෙන අතරම අනෙකුත් සේවකයන් වෙනුවෙන් ප්‍රධාන මාර්ග ඔස්සේ වාහන හයක් යොදා ගෙන ප්‍රවාහන පහසුකම් සම්පාදනය කරන ලදි.

සමස්ථයක් ලෙස ගත් කල මෙහෙයුම් පවත්වා ගැනීම සහ අවම බිඳවැටීම් සහිතව සේවා ලබා දීම සම්බන්ධයෙන් නිසි පාලනයකින් යුතු ක්‍රියා පිළිවෙතක් අප බැංකුව අනුගමනය කළේය. මෙම වසංගත තත්ත්වය ඇති වීමට පෙරාතුව අප විසින් ඉටු කරන ලද මෙහෙවර හේතුවෙන් දීර්ඝ කාලීන උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගත හැකි පරිදි අපගේ ආසන්න කාලීන උපායමාර්ග සමගින් මෙම වයිරසයේ පීඩනය මධ්‍යයේ වුවද ඉදිරියට ගමන් කිරීමට අප වෙත මග පෑදිණ.

මේ නිසා 2020 වසර සම්බන්ධයෙන් බැලූ කල අප ලබා ඇති අවසන් ප්‍රතිඵලය වන්නේ ලාභදායී වර්ෂයක් වාර්තා කිරීමේදී එච්ඩීඑෆ්සී බැංකුව පසුපස ග්‍රාමක බලවේග ලෙස නැගී සිටි අපගේ සේවක කණ්ඩායම් සතු සවිමත්භාවය, ආයතනික කළමනාකාරිත්වය ප්‍රකට කළ දැඩි කැපවීම සහ අප හා රැඳී සිටින ගනුදෙනුකාර භවතුන්ගේ නම්‍යශීලීභාවය මැනවින් පිළිබිඹු වීම බව කිව හැක.

බාධා නොවුණු සංවර්ධනයන්

ගත වූ වර්ෂයේ රු. බිලියන 55.9 ක් ලෙස පැවැති බැංකුවේ මුළු වත්කම් වටිනාකම මෙහි සමාලෝචිත වසර තුළදී රු. බිලියන 5 කින් ඉහළ ගොස් තිබේ. පැවැති අභියෝකර ව්‍යාපාරික පසුතලය හමුවේ වුවද 2020 වසර සඳහා වූ බදුවලින් පසු ලාභය සියයට 49 කින් රු. මිලියන 708 දක්වා වර්ධනය වූ අතර බදුලවලට පෙර ලාභය රු. මිලියන 1,381 ක් ලෙස වාර්තා විය.

ණය සඳහා ගෙවීම් ප්‍රමාද සහන ලබා දීම, මූල්‍ය සහන සහ ශාඛා මෙහෙයුම් සීමා වීම ආදී සිදුවීම් නිසා ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් බැංකුව සතුව පැවති ඉලක්ක කෙරෙහි බලපෑම් එල්ල විය. ණය වාරිකවලට අදාළ ප්‍රමාද ගෙවීම් ගාස්තු නොසලකා හැරීම, නැවත ගෙවීම් කාල ප්‍රතිසැලසුම්ගත කිරීම සහ අයකර ගැනීම් නවතා දැමීම ආදිය වෙතින්ද බැංකුවේ ශුද්ධ ආදායම වෙත බලපෑම් එල්ල විය.

මේ අතරම, ණය අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්වලට අදාළ හානිකරණ ගාස්තු වශයෙන් රු. මිලියන 326 ක් ලබා දීමටද බැංකුව කටයුතු කළ අතර එම මුදලද අක්‍රිය වටිනාකමක් බවට පත් වීමේ අවදානම පැවතුණි.

සේවක අර්ථසාධක අරමුදල හැරුණුකොට අක්‍රිය ණය අනුපාතිකය 2019 දී 13.7% ක් ලෙස වාර්තා වූ අතර 2020 වසරේදී එය 20.2 % දක්වා ඉහළ ගොස් ඇත. මෙය, කොවිඩ්-19 වසංගතයේ ආර්ථික බලපෑම් හේතුවෙන් ණය නැවත ගෙවීමේ කාල දීර්ඝ කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ නැවත ගෙවීමේ ධාරිතා පහත වැටීම යන සාධකවල ඍජු ප්‍රතිඵලයකි. මෙම පසුබිම තුළ <10% ක් වූ අපගේ අක්‍රිය ණය මට්ටම් ඉලක්කය පවත්වා ගැනීම අභියෝගයක් බවට පත් විය.

ණය අවදානම සහ අක්‍රිය ණය අනුපාතිකය ඉහළ නගිමින් පැවති තත්ත්වයක් තුළ වුවද ගත වූ වර්ෂයේදී රු. බිලියන 41.2 ක් ලෙස වාර්තා වූ බැංකුවේ ණය පොතෙහි වටිනාකම මෙම සමාලෝචනයට ලක් වන වසරේදී රු. බිලියන 41.1 ක් ලෙස පවත්වා ගැනීමට අපට හැකි වී ඇති බවද සඳහන් කළ යුතුය. ණය අවදානම සහ අක්‍රිය ණය අනුපාතිකය ඉහළ නගිමින් පැවතියද එකී පහත බැසීම ආන්තික මට්ටම්න් පවත්වා ගැනීමට අපට හැකියාව ලැබී ඇත්තේ බැංකුව විසින් අනුගමනය කළ විවක්ෂණශීලී පිළිවෙත් හේතුවෙනි.

ප්‍රවර්ධනාත්මක ක්‍රියාකාරකම් කිහිපයක්ම ක්‍රියාත්මක කිරීම තුළින් සිය සුළු පරිමාණ තැන්පතු කළඹ සියයට 39 කින් වර්ධනය කර ගැනීමට බැංකුව සමත් වූ අතර ආයතනික තැන්පතු හා සබැඳි මුදල් ආපසු ගැනීම් නිසා ඇති වූ බලපෑම් සමනය කර ගැනීම සඳහා එය අත්‍යවශ්‍ය වැරගැන්නුමක් විය.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී ආයතනික සහ අනෙකුත් සමාගම් පාදක තැන්පතු ආසන්න වශයෙන් 3% කින් පහත බසින ලද නමුදු මුළු තැන්පතු වර්ධනය 12.8% ක් ලෙස පවත්වා ගැනීමට දායක වෙමින් සුළු පරිමාණ තැන්පතු 39% කින් ඉහළ ගොස් තිබේ.

බැංකුවේ තැන්පතු කළඹ වටිනාකම 2020 වසර අවසානය වන විට රු. බිලියන 48 ක් ලෙස වාර්තා වූ අතර ඉන් රු. බිලියන 27.62 ක් ම සුළු පරිමාණ තැන්පතු වටිනාකම් විය.

කාර්මික සංවර්ධන මණ්ඩලය සමග පවත්වනු ලැබෙන සාකච්ඡා ඔස්සේ කුඩා ව්‍යාපාර හිමි වෙළෙඳ අංශය මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙතද සහාය වීම ඉලක්ක කරගත් සුවිශේෂිත අරමුණු හඹා යාමටද බැංකුව කටයුතු කළේය. 2020 වසර තුළදී අප බැංකුව ආයතනික සහ සංවර්ධන මූල්‍ය අංශයේ ගනුදෙනුකරුවන් වෙත රු. බිලියන 1.8 ක ණය මුදලක් ලබා දී තිබේ.

එපමණක්ද නොව, තිරසාරතා මූල්‍යකරණය වෙනුවෙන් ඉදිරි පියවරක් තබමින් අපගේ බැංකුව හරිත දේශගුණික අරමුදල සමගද සාකච්ඡා ආරම්භ කළේය. හරිත සංකල්පය ගරු කරන ව්‍යාපාර සහ පරිසර හිතකාමී වාණිජ ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ අපගේ ප්‍රයත්න ඉදිරියට ගෙන යාම එහි අරමුණයි.

එමෙන්ම, සුළු පරිමාණ මෙහෙයුම් වැඩිදියුණු කිරීම උදෙසා 2020 වසරේදී අපගේ ශාඛා දෙකක් නැවත ඔප් නැංවීමට අප පියවර ගත් අතර තවත් ශාඛාවක් හොඳින් ඉඩකඩ ඇති ප්‍රදේශයක් වෙත ගෙන යන ලදි.

ඩිජිටල් අනාගතයක්

මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ සහ වැඩිදියුණු කරන ලද පාරිභෝගික සේවාවක් ලබා දීමේ මූලික පරමාර්ථය පෙරදැරි කර ගනිමින් 2019 වසරේදී අපගේ බැංකුව විසින් ඉතා ප්‍රවේගාත්මක ඩිජිටල්කරණ උපායමාර්ගයක් ක්‍රියාවට නංවන ලදි. ඩිජිටල් බැංකු අවකාශය වෙත අප අවතීර්ණ වීම සාපේක්ෂ වශයෙන් මෑත කාලීනව සිදු කරන ලද්දක් වුවත් අපගේ ජංගම බැංකුකරණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් නවෝත්පාදනයන් සතුව ඉදිරියේදී වඩා දියුණු නවීකරණයන් හා විශේෂාංග ඒකාබද්ධ කර ගැනීමේ සුවිශාල භව්‍යතාවක් පවතින බව පැවසිය යුතුය. මිනිස් මැදහත්වීම් යොදා ගෙන දැනට ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාවලීන් ස්වයංක්‍රීය අන්තර්ජාලය පාදක පද්ධති දක්වා පරිවර්තනය කිරීමට අප ඉදිරියටත් කටයුතු කරන අතර එහිදී තොරතුරු තාක්ෂණික හා ඩිජිටල් නවෝත්පාදන සංස්කෘතියක් අපගේ සේවකයන් අතරද ව්‍යාප්ත කිරීමට පියවර ගැනෙනු ඇත.

ඩිජිටල් අනාගතයක් උදෙසා පෙරමුණ බලා යන ගමනේදී නවෝත්පාදනය කෙරෙහි අප දක්වන අවධානය මෙම සමාලෝචනයට ලක් වන වසර පුරාවටමද නොනැසී පවත්වා ගැනීමට අපට

හැකියාව ලැබී ඇත. ගනුදෙනුකරුවන් වෙතද පෙර නොවූ පහසුවක් උදා කරමින් 2020 වසරේදී ඒකාබද්ධ කරන ලද ඩිජිටල් පරිවර්තනයන් විසින් මේ වන විට අපගේ අභ්‍යන්තර මෙහෙයුම් වෙත කාර්යක්ෂමතාව උදා කෙරෙමින් පවත

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුව සතු 'HDFC Click' නමැති ඊ-බැංකුකරණ අවකාශය වැඩිදියුණු කිරීමටද අපගේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම කටයුතු කළේය. එමෙන්ම, 'LankaPay' සමාගම විසින් හඳුන්වා දී ඇති 'JustPay' ගෙවීම් පද්ධතිය සමග සම්බන්ධ වීම තුළින් ජංගම ගෙවීම් යෙදුම් ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහසුකම් සැලසීමටද අපගේ බැංකුව කටයුතු කළ අතර, සිය 'ප්‍රතිභා' ඉතුරුම් ගිණුම වෙතින් මුදල් යොමු කිරීම තුළින් ගනුදෙනුකරුවන් සිදු කරන මිල දී ගැනීම් සඳහා අදාළ මුදල් ගෙවීමට සහ ඔවුන්ගේ උපයෝජ්‍යතා බිල්පත් ගෙවීමට අවස්ථාව එමගින් සැලසේ.

මෙම විද්‍යුත් අවකාශය බැංකුව සඳහා තරගකාරී වාසියක් බවට පත් කරමින් එය නිරන්තරයෙන්ම වර්ධනය කිරීමට අපි අපේක්ෂා කරමු.

2020 වසරේදී මෘදුකාංග පාදක පුළුල් ක්ෂේත්‍ර ජාලයක් (Software-Defined Wide Area Network) jk SD-WAN වෙත මාරු වීමටද බැංකුව කටයුතු කළේය. මෙම ජාලය හරහා දිවයින පුරා විසිරී ඇති අපගේ ශාඛා 39 ම සහ ප්‍රධාන කාර්යාලය අතර අසීමිත සබැඳියාවක් ඇති කෙරේ. මෙම ජාල යටිතලපහසුකම මගින් ආපදා ප්‍රතිසංධාන පද්ධතිය ස්වයංක්‍රියකරණයට ලක් කෙරෙන අතර බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතාව පවත්වා ගැනීමට එය උපකාරී වෙයි.

සුළු පරිමාණ සේවා සඳහා ස්පර්ශක මධ්‍යස්ථාන සංඛ්‍යාව ඉහළ නැංවීමේ අපගේ සැලසුම්ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ජංඩ සඳහා සහාය දක්වන අපගේ ඩෙබිට් කාඩ්පත දියත් කිරීම සඳහාද කටයුතු පිළියෙළ කෙරෙමින් පවතී. පැවති වසංගත තත්ත්වය හේතුවෙන් එම පද්ධතිය 2020 දී ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුවද 2021 දී එය දියත් කිරීමට බැංකුව දැන් සැලසුම් කරගෙන සිටියි.

අනුකූලතාව හා ආයතනික පාලනය

මෙම තීරණාත්මක කාල වකවානුවේදී ශ්‍රී ලංකාවේ බැංකු සඳහා සහාය දැක්වීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සාක්ෂාත් කළ යුතු අවසන් දිනය 2020 අවසාදන දක්වා දීර්ඝ කරමින් සංශෝධනය කළ අතර එමගින් අපට අමතර ප්‍රාග්ධන සම්පාදනය සඳහා විකල්ප සොයා යාමට ඉඩකඩ විවර වේ. ව්‍යාපාර විවිධාංගීකරණ, වෙළෙඳපොල සංවර්ධනයන් සහ තාක්ෂණය පාදක වර්ධන අරමුණු සමගින් අපගේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මෙහි කොටසක් වශයෙන් බැංකුව ඉදිරි දෙවසරක කාලය තුළ සවිමත් වර්ධන සැලැස්මක් අනුගමනය කිරීමට නියමිතව ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාභදායීතාව ඉහළ යාම නිසා ලාභ රඳවා ගැනීම තුළින් බාසල් ස්ථර ෂ ට අනුකූල රු. බිලියන 7.5 ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීමට බැංකුවට හැකියාව ලැබෙනු ඇත.

සභාපතිතුමියගේ පණිවුඩයෙහි සඳහන් වූ පරිදි විවිධ අංශයන්හි වසර ගණනාවක පළපුරුද්ද සහිත පුද්ගලයන්ගේ විශේෂඥතාවෙන් ඵල නෙළා ගැනීමේ අරමුණින් නව පත්කිරීම්ද කිහිපයක් සිදු කරමින් අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය අලුත් කිරීමටද මෙම සමාලෝචිත වසර තුළදී පියවර ගන්නා ලදි.

බාහිර බලපෑම් අවම කිරීමට ගන්නා ලද පියවර මගින් වගවීම හා විශ්වසනීයත්වය පිළිබඳ අපගේ ප්‍රමුඛතාවලට හානියක් සිදු නොවූ බව සහතික කරමින් නිසි ආයතනික පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීමටද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ තම දායකත්වය ලබා දුන්හ.

එමෙන්ම, මෙහි සමාලෝචනයට ලක් වන අතිශය අභියෝගාත්මක වසර තුළදී ව්‍යාපාරික වර්ධනය අතින් ඉතාම තීරණාත්මක කාරණා සාකච්ඡාවට ලක් කිරීම, නව උපායමාර්ගික සැලැස්ම සහ ඩිජිටල්කරණ ප්‍රයත්න ආදිය සම්බන්ධයෙන් තම මත හා විදසුන් ලබා දෙමින් මෙන්ම අවශ්‍ය අනුමත කිරීම් සිදු කරමින්ද අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සහාය ලබා දෙන ලදි.

විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය නිරතුරුවම සමාලෝචනය කොට සවිමත් කෙරෙන අතර පැවති වසංගත තත්ත්වයේ ආර්ථික බලපෑම් නිසා ඵල්ල වූ පීඩනය දරා සිටීමට හැකියාවක් ඇති බව සහතික කරමින් එම කාර්යය 2020 වසර පුරාවටමද සිදු කෙරිණ.

2019 වසරේදී වඩා හොඳ වත්කම් ගුණාත්මකභාවයක් පවතින බව සහතික කරනු පිණිස විචක්ෂණශීලී පාලන විධිවිධාන පිහිටුවීමට බැංකුව පියවර ගත් අතර 2020 වසර පුරාවටම ඒවාට අනුකූලව කටයුතු කරන ලදි. එමෙන්ම, 2019 වසරේදී ස්ථර දෙකින් යුතු මධ්‍යගත ණය ලබා දීමේ ක්‍රියාවලියක් අප බැංකුව විසින් පිහිටුවා ගන්නා ලද අතර දැනට එය සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයද සහිතව ණය පරිපාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍යව තිබේ.

රු. මිලියන 1.5 සීමාවට වඩා වැඩි වටිනාකමකින් යුතු ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් ස්වාධීනව තක්සේරු කිරීමේ වගකීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පැවරේ. අදාළ නිර්ණායක වෙත අනුකූලතාව දක්වන බව සහ ප්‍රධාන කාර්යාලය විසින් මෙම ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කරන බව සහතික කිරීම සඳහා එය වෙත නව තොරතුරු තාක්ෂණික පද්ධති ඒකාබද්ධ කරනු ලැබේ. මෙම නව පියවර හරහා 2019 වසර ආරම්භයේ සිට අලුතින් ලබා දුන් ණයවලට අදාළ අක්‍රිය ණය අනුපාතිකය සැලකිය යුතු ලෙස අඩු වී තිබේ.

පෙරමග

අප බැංකුවේ වඩාත් කඩිනම් අවධානය යොමු වනුයේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම වෙතයි. 2020 වසර අවසානය වන විට එය නිසි ලෙස සපුරා ගැනීම වෙනුවෙන් නිරතුරුව කැප වී සිටින අපගේ කළමනාකාරිත්වය විසින් එය අපගේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මෙහි ඉහළම ප්‍රමුඛතාවක් බවට පත් කර තිබේ.

කලින් කලට සමාලෝචන සහ සංශෝධන සිදු කරමින් එය ක්‍රියාවට නැංවීම 2021 වසර සඳහා වූ ප්‍රධානතම ප්‍රමුඛතාවක් ලෙස පවතිනු ඇත.

මෙම ව්‍යාපාරවල සමස්ථ කාර්යසාධනය මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු අතර එය ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය වසරකට දෙවරක් සමාලෝචනය කළ යුතු වේ.

සමාලෝචන සහ සන්නිවේදනයන් සිදු කිරීම සම්බන්ධ සමස්ථ වගකීම ප්‍ර.වි.නි. සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වෙත පැවරී ඇත. මෙම සැලැස්ම ඉදිරි වසර පහක කාලය පුරාවට සමාලෝචනය කොට සුදුසු පරිදි ගැලපීමට පියවර ගැනෙනු ඇත.

ස්තුති කිරීම්

විචක්ෂණ නායකත්වයක් සහ ප්‍රයෝජනවත් ලබා දෙමින් අපගේ සමස්ථ කාර්ය මණ්ඩලය සතු ශක්‍යතා තීව්‍ර කර ගැනීම තුළින් වඩා හොඳ ප්‍රතඵල බැංකුවට අත්කර ගැනීමට අවකාශ සැලසීම සම්බන්ධයෙන් අපගේ සභාපතිනි වසන්ති මංචනායක මහත්මිය වෙත මාගේ හදපිරි ස්තුතිය පුද කරමි.

2020 වසර පුරාවටම ස්ථාවරව නැගී සිටීමට හැකි වන පරිදි මනා අධීක්ෂණයක් සහ මගපෙන්වීමක් ලබා දෙමින් බැංකුවේ උපායමාර්ගික විධිවිධාන සම්බන්ධයෙන් වටිනා ප්‍රතිපෝෂණ ලබා දුන් අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද මම මහත් සේ ස්තුතිවන්ත වෙමි.

මෙම කාල සීමාව පුරාවටම අපගේ සේවක මණ්ඩලය ඉතාම දැඩි කැපවීමකින් යුතුව ගනුදෙනුකරුවන් වෙත සේවා ලබා දෙමින්, රට වසා දමා තිබුණු කාලයේ පවා තිරසාර ලෙස බැංකුවේ මෙහෙයුම් පවත්වා ගැනීම වෙනුවෙන් දැක්වූ දායකත්ය අති මහත් ය. මේ නිසා ඔවුන්ගේ කැපවීමත අතිශයින්ම ප්‍රශංසනීය බව කෘතඥපූර්වකව සිහිපත් කරමි.

පැවති අවිනිශ්චිත වාතාවරණය හමුවේ විචක්ෂණ සැලසුම්කරණය තුළින් ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කරමින් නව සාමාන්‍යය වෙත අනුගත වීම සඳහා බැංකුවට විශිෂ්ට හා අඛණ්ඩ සහායක් ලබා දුන් ආයතනික කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන් වෙතද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. ගනුදෙනුකරුවන් සමග සාවධානව කටයුතු කරමින් අමිල මෙහෙවරක් ඉටු කළ, එමෙන්ම ආර්ථික වශයෙන් සමස්ථ රට බිඳ වැටී තිබුණු කාල වකවානුවක ගනුදෙනුකරුවන්ට වඩාත් අවශ්‍ය සහාය ලබා දීමට නිරතුරුව ඇපකැප වී කටයුතු කළ ප්‍රාදේශීය කළමනාකාරවරුන් සහ ශාඛා කළමනාකාරවරුන් වෙතද මාගේ නොමසුරු ප්‍රශංසාව හිමි වේ.

හිතවත් ගනුදෙනුකාර භවතුනි, තැන්පත්කරුවනි, එච්ඩිඑෆ්සී බැංකුව ඔබගේ සමීප බැංකු සහකරු බවට පත්කර ගැනීම පිළිබඳව මම ඔබ සියලු දෙනා වෙත උදක් ම ස්තුතිවන්ත වෙමි. ඔබේ ප්‍රගතිය අප බැංකුවේ සාර්ථකත්වයේ පදනම බව අපගේ අචල විශ්වාසය වන හෙයින් ඉදිරියටත් උපරිම ශක්‍යතාවෙන් ඔබ සියලු දෙනා වෙත සහාය දීමට අපි නිරතුරුව කටයුතු කරන්නෙමු.



පාලිත ගමගේ මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට:

ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා
අධ්‍යක්ෂ

පී. ඒ. එස්. ඒ. කුමාර මහතා
අධ්‍යක්ෂ

ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය
සභාපතිනි

ඩබ්. ඊ. එස්. සිල්වා මහතා
අධ්‍යක්ෂ



වමේ සිට දකුණට:

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වී. පයමහ
අධ්‍යක්ෂ

එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා
අධ්‍යක්ෂ

ආචාර්ය එස්. චින්. මොරායස්
අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය
සභාපතිනි/විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ

ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරියක ලෙස පත් කරන ලදුව 2020 ජනවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාපති තනතුරට පත් කරන ලදි.

වෘත්තියෙන් නීතිඥවරියක වන මංචනායක මහත්මිය 1984 වර්ෂයේ සිට තක්සේරුකාරියක වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වෘත්තීය සේවා ලබා දුන් අතර ඉන් පසුව 2014 වසරේදී එහි කොමසාරිස් ජනරාල් තනතුරට උසස් කරන ලදි.

ඉන් අනතුරුව 2015 සිට 2019 අතර කාලය තුළ එතුමිය මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ බදු ප්‍රතිපත්ති උපදේශිකාවක ලෙස සිය වෘත්තීය විශේෂඥතාව ඇසුරින් සේවය ලබා දෙන ලදි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය තුළදී ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සක්‍රිය දායකත්වයක් දැක්වීමට එතුමිය කටයුතු කළාය.

මීට අමතරව, එතුමිය සිංගප්පූරු ඊ-රාජ්‍ය නායකත්ව මධ්‍යස්ථානයේදී පැවැත්වුණු ඊ-රාජ්‍ය පරිචයන් සහ නවෝත්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන, ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ පැවැත්වුණු බදු වංචා විගණන සහ බදු රැස්කර ගැනීමේ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන, මැලේසියාවේ පැවැත්වුණු බදු ගිවිසුම් පිළිබඳ සම්මුති සාකච්ඡා පුහුණු වැඩසටහන, නාගපූර් හා දිල්ලි නගරවල පැවැත්වුණු බදු පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන්, පැරිස් නුවර පැවැත්වුණු ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයේ හුවමාරු මිලකරණ වැඩසටහන සහ තායිලන්තයේ පැවැත්වුණු රාජ්‍ය සේවා නිසි පිළිවෙත් පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන ආදිය ඇතුළු දෙස් විදෙස් පුහුණු වැඩසටහන් හා වැඩමුළු රාශියකට සහභාගී වී තිබේ.

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයෙන් ප්‍රථමික හා ද්විතීයික අධ්‍යාපනය හමාර කළ මංචනායක මහත්මිය කැළණිය විශ්වවිද්‍යාලයෙන් කාර්මික කළමනාකරණය පිළිබඳ විශේෂතාවක් සහිතව ආර්ථික විද්‍යාව පිළිබඳ සිය ප්‍රථම උපාධිය ලබා ගෙන ඇත.

ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලයෙන් විදේශ භාෂා සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ලබා ගත් ඩිප්ලෝමා සුදුසුකමක්ද එතුමිය සතු වේ.

මීට අමතරව එතුමිය ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතීඥවරියක ලෙසද නිසි සුදුසුකම් සපුරා ඇත. මංචනායක මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් උසස් වෘත්තීය ඉංග්‍රීසි නිපුණතා පිළිබඳ ඩිප්ලෝමා සුදුසුකමක්ද සපුරා ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එතුමිය වෙත තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ප්‍රදානය කරන ලද අතර 2009 වසරේදී රාජ්‍ය කළමනාකරණය පිළබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීමටද ඇය සමත් වූවාය.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

මහාචාර්ය කෙනඩි ඩී. ගුණවර්ධන මහතා 2019 මාර්තු 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩීඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදි.

රාජ්‍ය හා පෞද්ගලික අංශවල ප්‍රමුඛ ආයතන කිහිපයකම සභාපති තනතුරේ සේවක කිරීමෙන් ලද විශේෂඥ පළපුරුද්දක් එතුමා සතු වෙයි. මේ වන විට මහාචාර්ය ගුණවර්ධන මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සාමාජිකයෙකු වන අතරම කොළඹ විශ්වවිද්‍යාලයේ Syndicate Committee of Institute of Human Resource Advancement හි සාමාජිකයෙකුද වේ.

ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ මහාචාර්ය ධූරයද දරයි.

එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලයේ සභාපති තනතුරද දරන එතුමා කළමනාකරණය අධ්‍යයන සහ වාණිජ පීඨය විසින් ලබා දෙන කළමනාකර වැඩසටහන් කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධි සම්බන්ධීකාරක ලෙසද කටයුතු කරයි.

උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය, ගිණුම්කරණ තොරතුරු පද්ධති, ගිණුම්කරණය ආශ්‍රිත පර්යේෂණ හා ගිණුම්කරණ ක්‍රමවේදය සඳහා වූ කෘතිම බුද්ධි ජාල (Artificial Neural Network) ආදී ක්ෂේත්‍ර කෙරෙහි එතුමාගේ ඉගැන්වීම් විශේෂඥතාව විහිදී පවතී.

ආයතනික අංශයේ මූල්‍ය පුරෝකථන ලබා ගැනම සඳහා ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රය වෙත කෘතිම බුද්ධිය සම්බන්ධ කළ පළමු ශ්‍රී ලාංකිකයා වන්නේද මහාචාර්ය ගුණවර්ධන වන අතර එය පදනම් කරගෙන ඔහු විසින් ගිණුම්කරණය සඳහා කෘතිම බුද්ධිය යොදා ගැනීම පිළිබඳ නව අධ්‍යයන පාඨමාලාවක්ද හඳුන්වා දෙන ලදි. මේ වන විට එය විශ්වවිද්‍යාල සිසුන් අතර ජනප්‍රිය පාඨමාලාවක් බවට පත්ව තිබේ.

මීට අමතරව ජ්‍යේෂ්ට මහාචාර්ය ගුණවර්ධන ගිණුම්කරණය, කළමනාකාරණ තොරතුරු පද්ධති සහ පර්යේෂණ ක්‍රමවේදය ආදී විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් මොරටුව, කැළණිය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා ආරාධිත මහාචාර්යවරයෙකු ලෙසද කටයුතු කරයි.

මහාචාර්ය ගුණවර්ධන විසින් විවිධ සම්මන්ත්‍රණ ඉලක්ක කරගෙන පර්යේෂණ පත්‍රිකා 100 ට අධික සංඛ්‍යාවක්, වෙනත් ලිපි හා කෘති විශාල සංඛ්‍යාවක්, ඉංග්‍රීසි මාධ්‍ය පාඨ ග්‍රන්ථ 6 ක් සහ සිංහල මාධ්‍ය පාඨ ග්‍රන්ථ 3 ක් ද පළ කර ඇති අතර එතුමාගේ නම යටතේ ජාත්‍යන්තර කෘතිවල පරිච්ඡේද 2 ක් ද පළ වී ඇත.

ශාස්ත්‍රීය ලෝකයේ ඉගැන්වීම, පුහුණුව හා පර්යේෂණ සම්බන්ධයෙන් ඉහළින්ම සිටින විද්වතෙකු ලෙස එතුමා පිළිගැනේ.

දැනට ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්යවරයා ලෙසද කටයුතු කරයි.

අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ



ආචාර්ය ඩබ්. එන්. මොරායස්
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ආචාර්ය මොරායස් මහතා 2019 ජූනි 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩීඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

ජාත්‍යන්තර මට්ටමේ පුළුල් වෘත්තීට නිරාවරණයක් සහිත පළපුරුදු සංවර්ධන ආර්ථික විශේෂඥයෙකු වශයෙන් ආචාර්ය මොරායස් මේ වන විට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී ලෙස කටයුතු කරයි. ඉගැන්වීම, පර්යේෂණ, ශාස්ත්‍රීය පරිපාලන සහ ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් ආශ්‍රිත පුළුල් අත්දැකීම් සමුදායකට උරුමකම් කියන ආචාර්ය මොරායස් එක්සත් ජාතීන්ගේ පද්ධතිය යටතේ ප්‍රතිපත්ති සම්පාදනයට සක්‍රීයව දායක වී සිටියි. එමෙන්ම, එතුමා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන සමඟද සක්‍රිය දායකත්වයක් ලබා දෙමින් සිටියි.

පශ්චාත්-යුද ආර්ථික පුනර්ජීවන පරිවර්තන ක්ෂේත්‍රය වෙනුවෙන් සක්‍රිය මෙහෙවරක් ඉටු කරන එතුමා විසින් ලබා දී ඇති දායකත්වයන් 2014 වසරේ සිට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මානව සංවර්ධන වාර්තා සැකසීමට සම්බන්ධ වී සිටින වෘත්තික කණ්ඩායම්වල ඉහළ සම්භාවනාවට පත් වී ඇත.

ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් ඔස්සේ ජනතාව සවිගැන්වීම උදෙසා අනුගමනය කළ හැකි ප්‍රායෝජනික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දක්වන එතුමා ශ්‍රී ලංකා මහ බැංකුවේද සහාය ඇතිව ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල අධ්‍යයන වැඩසටහනක් සකස් කිරීමේදී ප්‍රමුඛ දායකත්වයක් ලබා දී තිබීම සුවිශේෂී වේ.

එම වැඩසටහන, ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන බැංකුකරණ කටයුතුවලට අදාළව බැංකු නිලධාරීන් සවිගැන්වීම අරමුණු කරගත්තකි.

ස්වීඩනයේ ලුන්ද් විශ්වවිද්‍යාලය සමග අත්වැල් බැඳගනිමින් සකස් කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය පර්යේෂණ වැඩටහන එතුමා විසින් දායකත්වය ලබා දෙන ලද අනෙකුත් වැඩසටහන් අතරට ඇතුළත් වේ. එක්සත් රාජධානිය, දකුණු අප්‍රිකාව, උගන්ඩාව සහ තවත් අරවල පැවැත්වුණු ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගී වී ඇති එතුමා ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව සංවර්ධනය කිරීමට අදාළ ගැටළු ජාත්‍යන්තර කරළියේ ඉදිරිපත් කර තිබේ.

විශේෂයෙන්ම යුද තත්ත්වයෙන් පීඩාවට පත් වූ ජනතාවගේ ජීවනෝපායයන් නගා සිටුවීම ඉල්ලකක කරගත් ව්‍යාපෘති වෙනුවෙන් දායකත්වය ලබා දීමේ පළපුරුද්දක්ද ආචාර්ය මොරායස් සතුව ඇත.

ශාස්ත්‍රීය ප්‍රවේශයකින් මතු නොව යුද්ධයෙන් පීඩාවට පත් වුණු තත්ත්වයන් සැබැවින්ම අත්දුටු පුද්ගලයෙකුගේ දෘෂ්ටි කෝණයෙන්ද ආන්තිකකරණයට ලක් වූ ජන ප්‍රජාවන් මුහුණ පාන සමාජ ආර්ථික පීඩාවන් මනාව අවබෝධ කර ගැනීමට වුතුමාට එමගින් සහායක් ලැබිණ.

භෞතික හා ද්‍රව්‍යමය සංවර්ධනය සහ ආධ්‍යාත්මික හා සංස්කෘතික සංවර්ධනය අතර මන සමතුලිතභාවයක් පවත්වා ගැනීම තුළින් මානව වර්ගයා විෂයෙහි සාකල්‍යවාදී ප්‍රගතියක් උදාකර ගැනීමට හැකි බව එතුමා උදක්ම විශ්වාස කරයි.

ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්වයක් මත තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයෙන් ආචාර්ය උපාධිය ලැබූ එතුමා කොලඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියකටද හිමිකම් කියයි.



පී. ඒ. එස්. අතුල කුමාර මහතා
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

පී. ඒ. එස්. අතුල කුමාර මහතා 2019 මාර්තු 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩිඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදි.

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදි සිසුවෙකු වන එතුමා දශක දෙකකට අධික කාලයක් ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ සවිමත් පසුබිමක් ගොඩනගාගත් වෘත්තිකයෙකි. 1991 දී විගණකාධිපති ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂවරයෙකු ලෙස රාජ්‍ය සේවයට බැඳුණු අතුල කුමාර මහතා 1992-1997 අතර කාලය තුළ පොලොන්නරුව ලංකාපුත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ අනුරාධපුර තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරවරයෙකු ලෙස සේවය කර තිබේ. 1997-2005 අතර කාලයේදී එතුමා උතුරු මැද පළාතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරවරයෙකු ලෙසද සේවය කළේය. 2007 දක්වා වූ කාලය තුළ අතුල කුමාර මහතා බත්තරමුල්ලේ පිහිටි මහවැලි, වාරිමාර්ග රජරට සංවර්ධන හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවය කළේය.

ඉන් අනතුරුව 2007 වසරේදී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත බැඳුණු එතුමා එහි තනතුරු කිහිපයක්ම දරා ඇත. දැනට එතුමා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරයි.

මීට අමතරව, Hotel Developers Lanka PLC, Selendiva PLC, De La Rue Lanka Security Print and Currency Ltd සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යන ආයතනවල අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

අතුල කුමාර මහතා කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, මන්තායි ලුණු (පුද්.) සමාගම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සිලෝන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් සහ ලංකා සෙරමික් සමාගම යනාදියේ අධ්‍යක්ෂවරයෙකු/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සිය සේවය ලබා දෙයි.

එපමණක්ද නොව, ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල විශේෂඥ කමිටු කිහිපයකම සාමාජිකයෙකු ලෙසද එතුමට කටයුතු කර ඇත. කුමාර මහතා 2012-2014 අතර කාලයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කර තිබේ.

පිළිගත් ජාත්‍යන්තර ආයතන/විශ්වවිද්‍යාල වෙතින් ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ විදේශ පුහුණුවක් සහ නිරාවරණයක් ලබා ගැනීමටද කුමාර මහතා සමත් වී ඇත.

1992 වසරේදී එතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය (රාජ්‍ය පරිපාලන විශේෂවේදී) පිළිබඳ BSc. උපාධිය ලබා ගත්තේය. එමෙන්ම 2015 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීමටද එතුමා සමත් විය. මීට අමතරව, ශ්‍රී ලංකා ගණගාධිකාර සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතුල කුමාර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් රාජ්‍ය ගණකාධිකාරවරයෙකුද වේ.

එපමණක්ද නොවන ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය හා ගිණුම්කරණ ආයතනයේ සාමාජිකත්වයද එතුමා සතු වේ.

අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ



එල්. ඊ. සුසන්ත සිල්වා මහතා
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

සුසන්ත සිල්වා මහතා 2020 අගෝස්තු 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

සිල්වා මහතා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද දශක හතරකට ආසන්න කාලයක් විවිධ ආයතනවල නායකත්ව භූමිකා මෙහෙයවා පළපුරුද්ද ලබා ඇති වෘත්තිකයෙකි. දෙස් විදෙස් වෘත්තීය ආයතනවල විවිධ අධි සාමාජිකත්ව සුදුසුකම් රැසක් එතුමා සතු වෙයි.

ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකාරණ ගණකාධිකාරවරුන්ගේ සමාජයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය කළමනාකාර ආයතනයේ සාමාජිකයෙකු ද වේ. මීට අමරව ඕස්ට්‍රේලියාවේ Certified Practicing Accountants සහ Association of Computer Society of Australia යන ආයතනවල සාමාජිකත්වයද එතුමා සතු වේ.

කැළණිය විශ්වවිද්‍යාලයෙන් B.Com. (Sp) උපාධිය ලබා ඇති සිල්වා මහතා මැලේසියාවේ විවෘත විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

දැනට ඒ මහතා ප්‍රෙස්ටිජ් ගෘප් (බිවිමිඩබිලිවි හා බලයලත් අලෙවි නියෝජිත) සමූහ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි.

මීට අමතරව, කැළණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව නියෝජනය කරන එතුමා එම විශ්වවිද්‍යාලයේම පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සභා සාමාජිකයෙකුද වේ. එම විශ්වවිද්‍යාලයේ විගණන කමිටුවේ සභාපති වන්නේද එතුමා ය. සිල්වා මහතා වීම පෙර ලිට්‍රෝ ගෑස් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයෙකු, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු මෙන්ම අවස්ථා කිහිපයකදීම ලිට්‍රෝ ගෑස් සමාගමේ වැඩබලන සභාපති ලෙසද සේවය කර තිබේ.

ශ්‍රී ලංකාවේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු කිහිපයකම තනතුරු රැසක්ද එතුමා දරා ඇත.

එපමණක්ද නොව, ඕස්ට්‍රේලියාවේ සදර්න් ක්‍රොස් විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පැපුවා නිව් ගිනියාවේ අයිබීඑස් විශ්වවිද්‍යාලයේ උපකුලපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස මෙන්ම එක්සත් රාජධානිය පාදක සමාගම් සමූහවල අප්‍රිකානු ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳ කලාපීය අධ්‍යක්ෂ වශයෙන්ද කටයුතු කර තිබේ.

ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුද වූ එතුමා 2019 දී එහි විගණන කමිටුවේ සභාපති ලෙස සේවාව ලබා දුන්නේය.

මීට අමතරව, සිල්වා මහතා 2012 ජූනි සිට 2015 මැයි මාසය දක්වා කාලය තුළ එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් එහි විගණන කමිටුවේ සභාපති ලෙසද කටයුතු කළේය.

එක්සත් රාජධානිය, අප්‍රිකාව, මාලදිවයින, මැද පෙරදිග සහ පැපුවා නිව් ගිනියාව යන රටවල බහුජාතික සමාගම් රැසක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තනතුරුද සිල්වා මහතා හොබවා ඇත. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය වෙත සමීප සම්බන්ධයක් ඇති එතුමා ජාත්‍යන්තර සන්දර්භය තුළ පැපුවා නිව් ගිනියාවේ පරිගණක සමාජයේ සභාපති වශයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇති අතර දේශීය ආයතනවල තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු සඳහාද පුරෝගාමී දායකත්වයක් ලබා දී තිබේ.

මීට අමතරව, සිල්වා මහතා මානව ප්‍රාග්ධන සංවර්ධනය පිළිබඳ පුහුණුකරුවෙකුද වන අතර දෙස් විදෙස් මට්ටමින් පිළිගත් ආයතන හා විශ්වවිද්‍යාල රැසක දේශකයෙකු වශයෙන් වෘත්තීය මගපෙන්වීම ලබා දීමට කටයුතු කළ වෘත්තිකයෙකි.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ 2020 අගෝස්තු 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදි.

කැළණිය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තු ප්‍රධානී, ගණකාධිකරණ දෙපාර්තමේන්තු ප්‍රධානී සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සම්බන්ධීකාරක වශයෙන් වසර 35 කට අධික කාලයක් පුරාවට ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයමහ මහතා සේවය කර ඇත. දැනට ඒ මහතා එම විශ්වවිද්‍යාලයේම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරයි.

සිය ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් 2005 දී ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය බලා ගිය එතුමා 2010 වසරේදී එම උපාධිය ලබා ගැනීමට සමත් වූයේය. එම ආචාර්ය උපාධිය වෙනුවෙන් එතුමා පර්යේෂණ සිදු කළ ක්ෂේත්‍රය වූයේ ''ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ මූල්‍ය ආයතන සතු ගිණුම්කරණ හා මූල්‍ය පරිචයන් සහ ඒවායෙහි කාර්යක්ෂමතාව'' යි.

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරගත් එතුමාගේ පර්යේෂණයේ ප්‍රතිඵල දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කරන්නට යෙදුණු අතර, දෙස් විදෙස් ශාස්ත්‍රීය ප්‍රකාශන රැසක පළ වී තිබේ. ලොව පුරා පර්යේෂණ කටයුතු බොහොමයක් සඳහා ඒවා යොදාගෙන තිබීමද විශේෂයකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයමහ මහතා 'ජයමහ, පුෂ්පකුමාර සහ සමාගමේ' පූර්වගාමී හවුල්කරුද වේ.

ශ්‍රී ලංකාව තුළ සිටින ඉහළ සුදුසුකම් සැපිරූ වරලත් ගණකාධිකාරවරයෙකු වශයෙන් ජයමහ මහතා විවිධ වැඩසටහන් සඳහා උපදේශකයෙකු ලෙස සිය සේවය ලබා දී ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පද්ධතියේ සුභසිද්ධිය වෙනුවෙන් වූ ප්‍රතිපත්ති සම්පාදනය උදෙසාද දායකත්වය ලබා දෙන්නට එතුමාට හැකි වී තිබේ.

එමෙන්ම, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබෙන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ ආයතනික සමාලෝචන ක්‍රියාවලියෙහි සමාලෝචකයෙකු ලෙසද සේවය ලබා දෙන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයමහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුද වේ.

අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ



ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා 2020 අගෝස්තු 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදි.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ඇසුරේ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ දසනායක මහතා සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ පැවති සමූපකාර සේවක කොමිෂන් සභාවේ (2005-2015) සභාපති ධුරය ඇතුළු ප්‍රධාන තනතුරු රැසක් හොබවා ඇත.

මේ වන විට ඒ මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපති ලෙස සේවය කරයි. වෘත්තියෙන් නීතීඥයෙකු වන ඒ මහතා ජාතික තාක්ෂණ ආයතනය වෙතින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (කෘෂිකර්මාන්තය) සුදුසුකමක්ද ලබා ගෙන ඇත.

පිලිපීනයේ මැනිලා නුවරදී ආසියා හා ශාන්තිකර කලාපය සඳහා වූ සංවර්ධන උපදේශකයන් (Development Consultant for Asia and the Pacific (DCAP)) විසින් පවත්වන ලද 'Developing and Managing Extension Approaches' ආදී ප්‍රමුඛ පෙළේ දෙස් විදෙස් පුහුණු වැඩසටහන් රැසක්ම සඳහා චිතුමා සහභාගී වී ඇත.

මීට අමතරව, රුසියාවේ Centro Soyuz විශ්වවිද්‍යාලයේදී පැවැත්වුණු කළමනාකරණ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන, 1991 වසරේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද කාර්යක්ෂමතා සංවර්ධන වැඩසටහනක්, 1993 වසරේදී ජාතික වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වන ලද 'කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම' පිළිබඳ පුහුණු වැඩසටහනක් සහ ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් ආදී දෙස් විදෙස් වැඩසටහන් රැසකටම සහභාගී වී සිය විශේෂඥතාව පුළුල් කර ගැනීමේ අවස්ථාව චිතුමා ලබා ගෙන තිබේ.



එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා 2019 දෙසැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්ඩිඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

රාජ්‍ය සේවයේ දශක තුනකට අධික කාලයක සේවා පළපුරුද්දෙන් පොහොසත් පතිරණ මහතා මේ වන විට කම්කරු අමාත්‍යාංශයේ ලේකම්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ සභාපති සහ ජාතික කම්කරු අධ්‍යයන ආයතනයේ සභාපති වශයෙන් සේවය ලබා දෙමින් සිටියි.

එපමණක්ද නොව, රාජ්‍ය සේවයේ ඉහළම විශේෂඥතාවකින් යුතු වෘත්තිකයෙකු වශයෙන් ඒ මහතා ණය ලබා ගැනීම් සුරක්ෂිත කිරීම අරබයා බහුජාතික සමාගම් සහ ද්විපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් සමග සම්මුති සාකච්ඡා සඳහා සහභාගී වී ඇති ප්‍රමුඛතම නිලධාරියෙකුද වෙයි.

ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබෙන ප්‍රමුඛතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සහ ආයෝජකයන් තෝරා ගැනීම උදෙසා කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු කිහිපයක්ම නියෝජනය කිරීමට අමතරව පතිරණ මහතා මහා භාණ්ඩාගාරයේ සාමාජිකයෙකු වශයෙන් රජයට අයත් පොදු ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය කරමින් විශිෂ්ට සේවයක් ඉටුකර තිබේ.

පතිරණ මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණි නිලධාරියෙකු ලෙස පිළිගැනෙන අතර, ආසියා පැසිෆික් කලාපයේ විශාලතම බහුජාතික සංවර්ධන ආයතනය වන ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර තිබේ. ටෝකියෝහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශකයෙකු ලෙසද එතුමා කටයුතු කර ඇත. කම්කරු අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කිරීමට පෙරාතුව එතුමා කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, මහවැලි සංවර්ධන සහ පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ එම අමාත්‍යාංශයේම අතිරේක ලේකම් ආදී ඉහළම රාජ්‍ය තනතුරු රැසක් හොබවා තිබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ධුරය ඇතුළු තනතුරු දරමින් මුදල් අමාත්‍යාංශය සඳහාද එතුමා සේවය කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වතු කළමනාකරණය සහ ප්‍රමාණකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති පතිරණ මහතා නවසීලන්තයේ කැන්ටබරි නුවර පිහිටි ලින්කන් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය යටතේ වාණිජ සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

මීට අමරව එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද කොළඹ ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානය වෙතින් ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ඩිප්ලෝමාවද ලබා තිබේ.

ආයතනික කළමනාකාරිත්වය



පාලිත ගමගේ මහතා

ප්‍ර.වි.නි. / කළමනාකාර අධ්‍යක්ෂ
BSc. විද්‍යාවේදී (ඉංජිනේරු) ගෞරව උපාධිය (මොරටුව විශ්වවිද්‍යාලය),
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය -
ආසියානු තාක්ෂණ ආයතනය, තායිලන්තය.
පත් වූ දිනය - 2018 අගෝස්තු 16)

බැංකු ක්ෂේත්‍රයේ වසර 30 කට අධික කාලයක පළපුරුද්ද ඇති පාලිත ගමගේ මහතා 2018 අගෝස්තු 16 දින ශ්‍රී ලංකා ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදි. ගමගේ මහතා බැංකු ක්ෂේත්‍රයේ සිය වෘත්තීය ගමන් මග ආරම්භ කරන ලද්දේ 1987 වසරේදී ඩීඑෆ්සීසී බැංකුව ඇසුරේ ය. 1978 දී ඩීඑෆ්සීසී බැංකුව වෙත බැඳීමට පෙර ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ සිවිල් ඉංජිනේරුවෙකු ලෙස සේවය කළේය.

ඩීඑෆ්සීසී බැංකුවේ සේවය කළ කාලයේදී එතුමා ආයතනික බැංකුකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණය, ආයෝජන බැංකුකරණය, සැලසුම් සහ මෙහෙයුම් ආදී අංශවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු රැසක් දරා තිබේ. මීට අමතරව, ඒ මහතා ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ ආයතනික ණය අංශ ප්‍රධානී වශයෙන්ද සේවය කළේය. කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව සමග සම්බන්ධ වූ කාලයේදී එතුමා ඩීඑෆ්සීසී බැංකුවේ විධායක උප සභාපති (ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) / ප්‍රධාන අවදානම් නිලධාරී තනතුර දරමින් සිටියේය.

2010 වසරේ සිට වසර තුනක කාලයක් පුරාවට ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස සේවය කළ එතුමා ජාතික වත්කම් කළමනාකරණ සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් 2014 වසරේ සිට වසර 4 ක කාලයක් කටයුතු කළේය. මීට අමතරව, ඒ මහතා ජාතික වත්කම් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති වශයෙන් දෙවසරක කාලයක් කටයුතු කළ අතර Acuity Securities Ltd හි අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධානී ලෙසද සේවය කළේය.

සිය වෘත්තීය ජීවිතය තුළදී ගමගේ මහතා බැංකු ක්ෂේත්‍රයට අදාළ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කළ දෙස් විදෙස් පුහුණු වැඩසටහන් රැසක් සඳහා සහභාගී වී තිබේ. වක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනයේ (Chartered Institute of Management Accountants) හි අවසන් විභාගය සමත් වී සිටින ඒ මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකුද වේ.



ඒ. ජේ. අතුකෝරල මහතා

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
පත් වූ දිනය - 2009 ජූලි 01

බැංකු ක්ෂේත්‍රයේ වසර 30 කට අධික පුළුල් අත්දැකීම් සමුදායක් අතුකෝරල මහතා සතු වේ. එච්ඩීඑෆ්සී බැංකුවට බැඳීමට ප්‍රථම එතුමා සෙලාන් බැංකුවේ සහ මහජන බැංකුවේ වසර 10 කට අධික කාලයක් බැගින් සේවය කර තිබුණි. බැංකු ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට ප්‍රථම එතුමා නිෂ්පාදන අංශයේ සේවය කර තිබේ.

එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරන එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ඇත්තෙකි. මීට අමතරව එතුමා ඇමරිකා එක්සත් ජනපදයේ පද්ධති විගණන හා පාලන සංවිධානයේ (Systems Audit & Control Association) 'සහතිකලත් තොරතුරු පද්ධති විගණක' සහ 'සහතිකලත් තොරතුරු ආරක්ෂණ කළමනාකාර' තනතුරුද දරන අතර, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයෙන් පරිගණක පද්ධති සැලසුම්කරණය සම්බන්ධයෙන් ඩිප්ලෝමා සුදුසුකමක්ද ලබා ඇත.



ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. එස්. සී. පෙරේරා මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති හා අයකර ගැනීම් -
නීතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස්
පත් වූ දිනය - 1992 නොවැම්බර් 16

එච්ඩිඑෆ්සී බැංකුවේ නීති නිලධාරිණියක ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ පෙරේරා මහත්මිය 2001 වසරේදී කළමානාකාර - නීති තනතුර සඳහා උසස් කෙරිණ. අනතුරුව 2015 වසරේදී ඇය සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති තනතුරට පත් කරන ලදි.

නිවාස මූල්‍ය පහසුකම් සම්පාදනය, බැංකකරණ සහ නෛතික විධිවිධාන ආදී ක්ෂේත්‍ර සම්බන්ධ විශේෂඥතාවක් සහිතව වසර 31 කට අධික කාලයක නීති ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇය සතු වේ.



සී. ආර්. පී. බාලසූරිය මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර සහ ගෙවීම්
මූල්‍ය හා ආර්ථිකය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, වාණිජවේදී (විශේෂ) උපාධිය, MAAT (පත් වූ දිනය - 2004 මාර්තු 22)

විශේෂිත හා වාණිජ බැංකු ක්ෂේත්‍රයේ දශක දෙකකට අධික කාලයක වෘත්තීය පළපුරුද්දක් බාලසූරිය මහතා සතු වේ.

ආයතනික කළමනාකාරිත්වය



මංජුල කිත්සිරි දිසානායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
- ACA, ADCM (IBSL)
පත් වූ දිනය - 2012 ජූනි 18

ණය හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 21 කට අධික කාලයක සේවා පළපුරුද්දක් දිසානායක මහතා සතු වේ. එච්ඩීඑෆ්සී බැංකු හා සම්බනධ වීමට පෙර ඔහු පෞද්ගලික අංශයේ ප්‍රමුඛ පෙළේ මූල්‍ය ආයතනවල ණය නිලධාරී, ගිණුම් කළමනාකාර, ජ්‍යෙෂ්ඨ ගිණුම් කළමනාකාර, ගණකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - ණය හා මෙහෙයුම් ආදී තනතුරු රැසක් දරා තිබේ.

විගණන, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, මෙහෙයුම් සහ ණය කළමනාකරණය පිළිබඳ වෘත්තිය පළපුරුද්දක් මංජුල කීර්ති දිසානායක මහතා සතු වේ.



කේ. ටී. දර්ශනී ඩී. ද සිල්වා මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් කළමනාකරණ සහ සමාගම් ලේකම්. නීතීඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ බැංකු මූල්‍ය හා රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව. (පත් වූ දිනය - 1999 සැප්තැම්බර් 01)

නීති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නීතීඥයෙකු ලෙස එච්ඩීඑෆ්සී බැංකුවේ වෘත්තීය ජීවිතය ආරම්භ කළ දර්ශනී ද සිල්වා මහත්මිය ඉන් අනතුරුව බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පත් කරන ලදි. නීතීඥවරියක වශයෙන් වසර 27 ක වැඩි සේවා පළපුරුද්දක් සහිත ඇය දැනට දරන සමාගම් ලේකම් ක්ෂේත්‍රයට අමතරව නෛතික විධිවිධාන, අයකර ගැනීම්, මානව සම්පත් කළමනාකරණ ආදී අංශවල මනා පළපුරුද්දක් ලබා ඇත. සිය වෘත්තීය ජීවිතයේ මුල් අවධියේදී සිවිල් නීතිඥවරියක ලෙස කටයුතු කළ ඇය එච්ඩීඑෆ්සී බැංකුවේ සේවයට එක් වීමට පෙර Alliance Finance Company හි සේවය කළාය.



එච්. ඒ. අනුර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
MBA,PGDM (RJT), B.Sc. Accy (Sp) (USJ), FIPA (Au),FFA(UK), MAAT, Inter. of CA Sri Lanka,
පත් වූ දිනය - 2004 ඔක්තෝබර් 01

බැංකුකරණය, ණය, අයකර ගැනීම්, අරමුදල් රැස් කිරීම, ශාඛා මෙහෙයුම්, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, විගණන, භාණ්ඩාගාර කළකළමනාකරණය, අනුකූලතාව, ආයතනික මූල්‍ය වාර්තාකරණය හා වාර්ෂික වාර්තා, අයවැය කටයුතු සහ මූල්‍ය කළමනාකරණය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දශක දෙකක පමණ පළපුරුද්දක් අනුර මහතා සතු වේ.

1996 වසරේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සහ ලංකා ධීවර සංස්ථාව ආශ්‍රිතව සිය ගිණුම්කරණ වෘත්තීය ජීවිතය ආරම්භ කළ විතුමා 1998 වසරේදී විගණන/විධායක නිලධාරී භූමිකාව සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග එක්වූ අතර ඉන් අනතුරුව එහි සහකාර කළමනාකාර තනතුර දක්වා උසස් විය. ඉන් පසුව අනුර මහතා ගම්පහ ශාඛා කළමනාකාර වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව වෙත එක් විය. 2007 සිට මේ දක්වා ඔහු භාණ්ඩාගාර ගණකාධිකාරී, මූල්‍ය ගණකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මූල්‍ය යන තනතුරු දරා තිබේ.



ඩබ්ලිව්. එන්. ඩී. බොතේජු මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන. BSc. ව්‍යාපාර පරිපාලනය (විශේෂවේදී)
CBA (CA Sri Lanka), CBF
පත් වූ දිනය - 1995 ජූලි 01

කළමනාකරණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය සහ තවත් ක්ෂේත්‍රවල වසර 30 කට අධික කාලයක සේවා පළපුරුද්දක් බොතේජු මහත්මියට සතු වේ.

එච්ඩීඑෆ්සී බැංකුවේ සේවයට එක් වීමට පෙර විතුමිය අපනයන අංශයේ ගණකාධිකාරවරියක ලෙස සේවය කළාය. 1995 වසරේදී බොතේජු මහත්මිය ණය නිලධාරිණියක් වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව හා එක් විය. විතැන් පටන් අප බැංකුවේ ගණකාධිකාරිණී - භාණ්ඩාගාර, කළමනාකාරිණී - ගිණුම් පාලන, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී (මානව සම්පත්) සහ ප්‍රධාන කළමනාකාරිණී (මානව සම්පත් හා පරිපාලන) යන තනතුරු දරා ඇති ඇය 2020 වසරේදී සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන) වශයෙන් උසස්වීමක් ලැබුවාය.

ආයතනික කළමනාකාරිත්වය



කේ. ආර්. එම්. අනුර බණ්ඩාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා නිලධාරී
B.Com (Special), CBA (CA Sri Lanka),
SAT (AAT Sri Lanka), CBF
පත් වූ දිනය - 1999 මැයි 03

රාජ්‍ය හා පෞද්ගලික අංශවල විගණන සහ ගිණුම්කරණ ක්ෂේත්‍ර තුළ වසර 31 කට අධික කාලයක පළපුරුද්ද අනුර බණ්ඩාර මහතා සතු වේ. එච්ඩීඑෆ්සී බැංකුව වෙත එක් වීමට පෙර එතුමා රාජ්‍ය සංස්ථාවල විගණන කටයුතු පිළිබඳ විශේෂඥ පළපුරුද්දක් උකහා ගනිමින් සහ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක විගණන විධායක වශයෙන් විගණන පරීක්ෂකවරයෙකු ලෙස සේවය කර තිබේ.

2012 ජනවාරි 02 දින සිට අනුර බණ්ඩාර මහතා අප බැංකුවේ අනුකූලතා ප්‍රධානී ලෙස පත් කරන ලදි.



ඒ. එම්. නීලචන්ද්‍ර මහතා
ප්‍රධාන කළමනාකාර - තොරතුරු තාක්ෂණ
Bsc, NIBM, CCPSP
පත් වූ දිනය - 1997 දෙසැම්බර් 01

බැංකු හා රාජ්‍ය අංශවල තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු වශයෙන් වසර 25 කට අධික පළපුරුද්දක් නීලචන්ද්‍ර මහතා සතු වේ. එසේම, එතුමා යුනික්ස් පාදක පද්ධති පුළුල් පරාසයක් ස්ථාපනය කිරීම, වින්‍යාසගත කිරීම සහ නඩත්තු කිරීම මෙන්ම දත්ත පදනම් හා ජාල පරිපාලනය සම්බන්ධයෙන්ද පළපුරුද්ද අතින් පොහොසත් වෘත්තිකයෙකි.

එච්ඩීඑෆ්සී බැංකුවේ නව ප්‍රධාන බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පද්ධති පරිවර්තනය සම්බන්ධ වගකීම් දැරූ ව්‍යාපෘති කළමනාකාරවරයා වශයෙන්ද එතුමා සේවය කළේය.

එමෙන්ම, මීට පෙර දෙවසරක කාලයක් එතුමා පරිගණක හා තාක්ෂණ සභාවේ සේවය කර තිබේ.



අයි නිශාන්ත මහතා
ප්‍රධාන කළමනාකාර - අවදානම් කළමනාකරණ
MBS, Bsc. Business (sp.), AIB, LICA
පත් වූ දිනය - 2000 ජූනි 26

ශ්‍රී ලංකා බැංකු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අයි. නිශාන්ත මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ඇත. 2000 වසර් එච්ඩීඑෆ්සී බැංකුව වෙත එක් වීමෙන් සිය බැංකුකරණ වෘත්තීය ජීවිතය ආරම්භ කළ නිශාන්ත මහතා ඊට පෙර ගත වූ වසර විස්සක කාලය තුළ 2011 දෙසැම්බර් මාසයේදී අප බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රධානී ලෙස පත් වන තුරු අයකර ගැනීම්, මූල්‍ය, ණය පරිපාලනය සහ ශාඛා මෙහෙයුම් යන ක්ෂේත්‍රවල තනතුරු කිහිපයක්ම දරා ඇත.

2017 වසරේදී සම්පූර්ණ වූ අපගේ අභිනව ප්‍රධාන බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ එතුමා ප්‍රමුඛ භූමිකාවක් ඉටු කළේය.

අංශ ප්‍රධානීන්



ටී. එච්. කේ. පී. ද සිල්වා මහතා
ප්‍රධාන කළමනාකාර
- තොරතුරු ආරක්ෂාව



ඩී. එන්. ධර්මරත්න මහතා
ප්‍රධාන කළමනාකාර
- ණය



ඩබ්ලිව්. ඩී. කේ. සෙනෙවිරත්න මහතා
ප්‍රධාන කළමනාකාර - අයකර ගැනීම්



ආර්. ආර්. ගුණවර්ධන මහත්මිය
ප්‍රධාන කළමනාකාර
- ණය



එම්. ආර්. එස්. ප්‍රනාන්දු මහත්මිය
ප්‍රධාන කළමනාකාර
- නීති



එම්. යූ. එස්. ද කොස්තා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර
- මෙහෙයුම්



ඩී. එම්. ඒ. දිසානායක මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - ආයතනික සහ සංවර්ධන මූල්‍ය



එල්. ඩී. එස්. එච්. ලියනගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාර
- ගෙවීම්



ඩබ්ලිව්. එම්. චන්ද්‍රසේන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර
- ප්‍රමාණකරණ



ජී. ඩී. කේ. එච්. පෙරේරා මහතා
කළමනාකාර
- තැන්පතු හා ව්‍යාපාර සංවර්ධන



බී. එම්. පී. පෙරේරා මහතා
කළමනාකාර
- ණය පරිපාලන



ටී. බී. කරුණාබන්දු මහතා
කළමනාකාර
- රන්ණය



කේ. එච්. ඩී. ප්‍රියංකා මහත්මිය
කළමනාකාර
- අලෙවිකරණ



එන්. එල්. විජේසිරි මහතා
කළමනාකාර
- තාක්ෂණික හා පරිශ්‍ර කළමනාකාර



ආචාර්ය කේ. ඒ. ඒ. නිර්මලී
කළමනාකාර
- ගිණුම් පාලන

ප්‍රාදේශීය කළමනාකාරවරු



ආර්. ඒ. ජේ. එන්. රණසිංහ මහතා
1 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර



එල්. ගුණතිලක මහතා
2 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර



බී. ඩබ්ලිව්. එම්. සී. කුමාරසිරි මහතා
3 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර



ජී. ඩබ්ලිව්. ඒ. එන්. කාලින්ද මහතා
4 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර



අයි. කේ. දවටංග මහතා
5 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර



එච්. එම්. යූ. සමරවීර මහතා
6 කලාපය - ප්‍රාදේශීය කළමනාකාර

ශාඛා කළමනාකාරවරු

අනු. අංකය	තත්ත්ව නාමය	නම	ශාඛාව
1	මිය.	ඒ. ඒ. එස්. අයි. ටී. සෝමතිලක	අම්බලංගොඩ
2	මිය.	එච්. එම්. ඩී. කුමාරිහාමි	අම්පාර
3	මිය.	ආර්. ඒ. පිලපිටිය	අනුරාධපුර
4	මයා.	ඩී. ආර්.ජී. ඩී. බී. ජයතිලක	අවිස්සාවේල්ල
5	මිය.	එම්. ජී. ඩී. පී. සෙනෙවිරත්න	බදුල්ල
6	මයා.	එල්. ජයශංකර්	මඩකලපුව
7	මයා.	එස්. එච්. කේ. ගමගේ	හලාවත
8	මයා	ඩී. කේ. පී. ද සිල්වා	කොළඹ
9	මයා.	ඩී.එස්.ආර්. දිසානායක	දඹුල්ල
10	මයා.	එච්. ඩී. එස්. සේනාරත්න	ඇඹිලිපිටිය
11	මයා.	එස්. ඒ. ආර්. සී. පී. කුමාර	ගාල්ල
12	මිය.	ඩබ්ලිව්. බී. එම්. ඒ. ප්‍රනාන්දු	ගම්පහ
13	මිය.	එන්. ඒ. ඒ. එන්. එස්. නිශ්ශංක	ගම්පොල
14	මිය.	ඩී. ටී. ඒ. ජයසිංහ	හෝමාගම
15	මයා.	පී. ඒ. විරාජ් සම්පත්	හොරණ
16	මයා.	ඒ. අයි. කිරිඇල්ල	හයිඩ් පාක්
17	මයා.	කේ. ඒ. ඒ. පී. එස්. කුමාර	ජා-ඇල
18	මිය.	එස්. සුයානියා	යාපනය
19	මිය.	ආර්. එස්. අයි. සිල්වා	කළුතර
20	මයා.	එල්. එස්. බී. රත්නායක	මහනුවර
21	මයා.	ආර්. ඒ. සී. එස්. පුෂ්පකුමාර	කෑගල්ල
22	මයා.	එච්. ඒ. එස්. එල්. හපන්ගම	කිරිබත්ගොඩ
23	මයා.	ඒ. එම්. යූ. එස්. බී. අත්තනායක	කුලියාපිටිය
24	මිය.	සී. ඒ. කේ. අබේකෝන්	කුරුණෑගල
25	මයා.	ටී. ජී. ආර්. එම්. ආර්. එම්. රත්නායක	මාතලෙ
26	මයා.	පී. ඒකනායක	මාතර
27	මයා.	එම්. පී. ඩෙකම්	මොණරාගල
28	මයා.	ඩී. ඒ. එන්. පී. කේ. පියදාස	නිකවැරටිය
29	මිය.	එස්. කේ. පී. සමන්ති	නිට්ටඹුව
30	මිය.	ඒ. යූ. ටී. ප්‍රනාන්දු	නුගේගොඩ
31	මිය.	එච්. ආර්. එස්. පී. සේනානායක	නුවර එළිය
32	මයා.	ටී. එච්. එම්. ඒ. හේවගේ	පෑලියගොඩ
33	මයා.	එච්. එන්. ජේ. පෙරේරා	පිලියන්දල
34	මයා.	එච්. ආර්. එම්. තාරක	පොලොන්නරුව
35	මයා.	එස්. එම්. එස්. කේ. බණ්ඩාර	රත්නපුර
36	මයා.	එම්. ඒ. එස්. දේශප්‍රිය	තංගල්ල
37	මයා.	එම්. එල්. එන්. අනුරාධ	තිස්සමහාරාමය
38	මයා.	ඒ. ජී. ස්ටෙෆන්	ත්‍රිකුණාමලය
39	මයා.	ටී. වෙල්ෂ්කුමා	වව්නියාව



කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

මෙහෙයුම් පරිසරය

ආර්ථික කාර්යසාධනය

2020 වසරේදී ගෝලීය ආර්ථිකය -3.5% කින් හැකිළී යනු ඇති බවට තක්සේරු කර තිබුණි.1 මේ අතර පැතිරී යමින් තිබුණු වසංගත තත්ත්වයේ වැඩිම බලපෑමට ලක් වූ පිරිස් වශයෙන් දිළිඳු ජනතාව, තරුණ ප්‍රජාව හා කාන්තාවන්, අවිධිමත් රැකියාවල නිරත වූවන් සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ අය හඳුනාගත හැකි විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර ඇති පරිදි 2019 දී පැවැති 2.3% සමඟ සැසඳීමේදී 2020 ශ්‍රී ලාංකීය දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 3.6% කින් හැකිළී ගොස් තිබේ. මෙරට ප්‍රධානතම කාර්මික කලාප හා ව්‍යාපාර පිහිටා ඇති කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක 2020 අප්‍රේල් මාසයේදී වසා දැමීමට තීරණය කිරීම නිසා ආර්ථිකයේ අංශ ගණනාවක වර්ධනය වෙත ඍණාත්මක බලපෑමක් එල්ල වූ අතර එහි ප්‍රතිඵලය වූයේ 2020 දෙවන කාර්තුවේදී ආර්ථිකය 16.4% ක බිඳවැටීමකට ලක් වීමයි. කෙසේ වෙතත්, 2020 අවසන් කාර්තුව තුළදී ආර්ථිකය 1.3% ක වර්ධනයක් පෙන්නුම් කළේය.2

ආනයන වියදම් සීමා වීම හේතුවෙන් 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල වකවානුව තුළ වෙළෙඳ මූල්‍ය හිඟය 2019 එම කාල සීමාවම හා සැසඳීමේදී අඩු වී තිබේ. කෙසේ වෙතත්, එම කාල සීමාව තුළ අපනයන ආදායම්ද සාපේක්ෂ මට්ටමේ පහත බැසීමකට ලක්ව තිබේ.

වෙළෙඳ පරතරය ඇ.ඩො. මිලි. වලින්



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්තවලට අනුව ප්‍රධාන ආර්ථික අංශ තුනේම වර්ධනය කෙරෙහි ඍණාත්මක බලපෑම් එල්ල වී ඇති අතර ඒ අතරින්ද වැඩිම බලපෑමකට ලක්ව ඇත්තේ කර්මාන්ත අංශයයි. පිළිවෙළින් විදුලිසංදේශන (15.4%) සහ මූල්‍ය සේවා (10.9%) පුළුල් ලෙස ව්‍යාප්ත වීම හේතුවෙන් සේවා අංශයේ කාර්යසාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් එල්ල වී ඇත. කර්මාන්ත අංශය සැලකිල්ලට ගැනීමෙදී ඛෂණික ආහාර හා පාන සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන මෙන්ම රසායනික නිෂ්පාදන නිපදවීම 4.4% කින් වැඩි වී ඇත. සාගර ආශ්‍රිත ධීවර කටයුතු, පොල් වැනි තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන භෝග වගා කිරීම, වනාන්තර හා දැව නිෂ්පාදන කටයුතු සහ තේ වගාව හැර අන් සියලුම කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සැලකිය යුතු හැකිළීමකට ලක් වී තිබේ. ධාන්‍ය හා අනෙකුත් පාන වගාවන් ආශ්‍රිතව පිළිවෙළින් 41.3% සහ 21.6% ක ප්‍රශංසනීය වර්ධනයක් සිදුව ඇති බව වාර්තා වෙයි.

මූල්‍ය ප්‍රතිපත්තිය

කොවිඩ්-19 වසංගතය සහ රට වසා දැමීම් නිසා එල්ල වූ ආර්ථික බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේදී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන යාමට තීරණය කරන ලදි. ඒ අනුව 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි කාලවලදී අවස්ථා කිහිපයකදීම නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය අඩු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගත් අතර වසංගත තත්ත්වය නිසා ඇති වූ පීඩනයට ලක්ව සිටි පුද්ගලයන්ට හා ව්‍යාපාරවලට සහාය වීමේ සහ රටේ ආර්ථික කටයුතු පුනර්ජීවනය කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් එපරිද්දෙන්ම නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා ව්‍යාවස්ථාපිත සංචිත අනුපාතිකයද අඩු කරන ලදි. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ආශ්‍රිත වැඩිම පහත බැසීමක් සිදු වූයේ 2020 ජූලි මාසයේදී ය.

මෙම වසංගතය හමුවේ රටක ප්‍රතිපත්තිමය පොලී අනුපාතික පහත හෙළීමට පියවර ගත් පළමු මහ බැංකුව වූයේද ශ්‍රී ලංකා මහ බැංකුවයි. අඩු කරන ලද වෙළෙඳපොල ණය දීමේ අනුපාතික හේතුවෙන් කොරෝනා වයිරසයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ට හා ව්‍යාපාරවලට මූල්‍ය සහන ලබාදීමට හැකි වීම උදෙසා පහසුකම් සැලසීමේ අරමුණින් මෙම පියවර අනුගමනය කරන ලදි.

වාණිජ බැංකුවලට අදාළ රුපියල් තැන්පතු වගකීම් මත පනවා තිබුණු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය අඩු කිරීම නිසා රු. බිලියන 180 ක වටිනාකමකින් යුතු අමතර ද්‍රවශීලතාවක් ද දේශීය වෙළෙඳපොල වෙත සපයන ලදි. මේ නිසා බලපත්‍රලාභී වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය අඩු කෙරුණා පමණක් නොවන කවර හෝ ඍණාත්මක ප්‍රතිඵලයක් වී නම් එය වෙනස් කර ගැනීම සඳහා ප්‍රමාණවත් අතිරික්තයක්ද එමඟින් සැපයිණ. කෙසේ වෙතත්, මෙවැනි විධිවිධාන ගෙන තිබුණ නමුදු පෞද්ගලික අංශය වෙත මුදල් ගලනය අත්හිටුවී ගිය ආර්ථික කාල සීමාවක් තුළ අවදානම් නිරාවරණයන් හමුවේ ණය ලබා දීම නිසා අපේක්ෂා කළ පරිදි සිදු නොවීය.

2020 මැද භාගය වන විට විදේශ ණය ආපසු ගෙවීම්, භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීම් සහ නැවත ප්‍රතිමිලදී ගැනීම් ආදියේ ප්‍රතිඵලයක් ලෙස ද්‍රවශීලතාව රු. බිලියන 120 දක්වා පහත වැටුණි. ප්‍රතිමිලදී ගැනීම් ද්‍රවශීලතා අවශෝෂණය වීම් තරමක් දුරට සමනය කර ගැනීම සඳහා නිසි කලට ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි පවත්වන අතරම මූලික වශයෙන්ම රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම තුළින් විදේශ ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත සහාය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රයත්න දරමින් සිටියි.

1. මූලාශ්‍රය - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (2021 ජනවාරි), ලෝක ආර්ථික පුරෝකථන යාවත්කාලීනය.
2. මූලාශ්‍රය - 2021, 4 වන කාර්තුව සහ වාර්ෂික, ශ්‍රී ලංකා ජාතික ගිණුම් ඇස්තමේන්තු, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
3. මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව, 1 පරිච්ඡේදය, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා.
4. මූලාශ්‍රය - 2021, 2020 ජාතික ගිණුම් ඇස්තමේන්තු වාර්ෂික, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
5. මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව, 2020, 7 පරිච්ඡේදය, මූල්‍ය ප්‍රතිපත්තිය, පොලී අනුපාත, මුදල් හා ණය, ආර්ථික ප්‍රවණතා.

මෙහෙයුම් පරිසරය

මූල්‍ය සහන

මෙම වසංගත තත්ත්වය නිසා ඵල්ල වූ ආර්ථික බලපෑම් සමනය කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද විධිවිධාන අතරින් ප්‍රමුඛතම පියවර වූයේ තනි පුද්ගලයන්, ස්වයං-රැකියාවල නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහාය වීමේ අරමුණින් රු. බිලියන 50 ක ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීමයි. මේ අනුව, ණය සහන සහ 4% ක වාර්ෂික පොලියක් යටතේ කාරක ප්‍රාග්ධන ණය පහසුකම් හඳුන්වා දෙන ලදි. එම දෙවන ප්‍රතිපාදනයට අදාළ සුදුසුකම් නිර්ණායකද හඳුන්වා දෙන ලදි. ඒ අනුව ඒ සඳහා සුදුසුකම් ලත් කර්මාන්ත වශයෙන් සංචාරක, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, කුළුබඩු, තේ සහ කාර්ය හා පහසුකම් සම්පාදන ආදී අංශ කරෙහි අවධානය යොමු කෙරිණ. ජාත්‍යන්තර මට්ටමින් රටවල් වසා දැමීම සහ සංචරණ සීමා හේතුවෙන් වැඩිම බලපෑමකට ලක් වූයේ එම අංශයි.

මේ අතර, ඒ වන විටත් ණය ලබාගෙන සිටි පුද්ගලයන් වෙත ණය සහනවල ප්‍රතිලාභ කිහිපයක්ම ලබා දෙමින් සක්‍රිය ණය සඳහාද මහ බැංකුව විසින් සහන ලබා දෙන ලදි. අක්‍රිය ණය සඳහාද සහන පහසුකම් හඳුන්වා දෙන ලද අතර, ණය නැවත හා අත්තිකාරම් නැවත ගෙවීමේ කාල දීර්ඝ කොට නිශ්චිත කාල වකවානුවක් දක්වා දඩ පොලී මුදල් කපා හරින ලදි.

මෙපරිද්දෙන්ම, සක්‍රිය හා අක්‍රිය ණය ලබාගෙන සිටි ණය ගැනුම්කරුවන් දෙවර්ගයම අතරින් සුදුසුකම් සපුරා තිබුණු පුද්ගලයන් වෙත කොන්දේසිවලට යටත්ව කාරක ප්‍රාග්ධන ණය සහ ආයෝජන ණය ලබා දෙන ලදි.

එමෙන්ම, ක්‍රෙඩිට් කාඩ්පත්, උකස් කිරීම්, තාවකාලික බැංකු අයිරා සහ දඩ මුදල්වලට අදාළ පොලී අනුපාත අඩු කිරීමටද ශ්‍රී ලංකා මහ බැංකුව විධිවිධාන යොදන ලදි. බලපත්‍රලාභී බැංකු විසින් ලබා ගෙන තිබුණු ප්‍රතිමූල්‍ය ණයවලට අදාළ ප්‍රාග්ධන නැවත ගෙවීම් විලම්බනය කිරීමටද රජය සලකා බැලුවේය.[6]

බැංකුකරණ අංශය

2020 ජනවාරි-අගෝස්තු කාල සීමාව තුළ වත්කම් වර්ධනයද 2019 වසරේ එම කාලසීමාවටම සාපේක්ෂව ඉහළ ගොස් ඇති අතර එය රු. ට්‍රිලියන 13.8 දක්වා වූ 10.5% ක වර්ධනයකි. තැන්පතු සහ ණය ගැනීම් නිසා මෙම අංශයේ වත්කම් පදනම වෙත අරමුදල් සම්පාදනය කෙරිණ. මෙහි සමාලෝචනයට ලක් වන කාල සීමාව අවසානය වන විට ණය වර්ධනයද (වර්ෂාන්තර) 13.5% කරා ළඟා වී තිබුණි. 2019 මෙම කාල සීමාවම තුළ වර්තා වූ 1.3% ක වර්ධනය සමග සංසන්දනය කිරීමේදී මෙම අංශයේ ණය හා අත්තිකාරම්ද 8.9% කින් වර්ධනය වී ඇත. රජය සහ රාජ්‍ය ව්‍යාපාර වෙත ලබා දුන් ණය මෙම මුළු ඉහළ යාමෙන් විශාල කොටසකට දායක වී ඇත.

අංශයේ අක්‍රිය ණය අනුපාතිකය 5.4% දක්වා වර්ධනය වූ අතර වර්ෂාන්තර ණය වර්ධනය 13.5% ක් විය. තැන්පතු ආශ්‍රිත වර්ධනයද 17.1% ක් ලෙස (වර්ෂාන්තර) වාර්තා විය. මෙම කාල සීමාවම තුළ මුළු වත්කම්වලින් 74.8% ක් සඳහා දායකත්වය සැපයූ තැන්පතු නිසාද මෙම අංශයේ වර්ධනයට දායකත්වයක් ලැබී තිබේ.[7]

ආර්ථික පුරෝකථන

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවලට අනුව පිළිවෙළින් 2021 හා 2022 වසරවලදී ගෝලීය ආර්ථිකය 4.2% ක වර්ධනයක් අත්කර ගනිමින් 5.5% දක්වා ඉහළ නගිනු ඇතැයි පුරෝකථනය වී තිබේ. කෙසේ වෙතත්, පවතින කොරෝනා වසංගතයේ බලපෑම්ද තවදුරටත් ඉහළ නගිනු ඇතැයි එම ආයතනය පුරෝකථනය කරන හෙයින් 2022 සඳහා වූ ගෝලීය ආර්ථික අපේක්ෂාව 3.8% දක්වා බිඳ වැටෙනු ඇතැයි සැලකේ. එහෙත් කොවිඩ් වින්නත් පුළුල් ලෙස ව්‍යාප්ත වීමත් සමගින් වසංගත තත්ත්වය කෙමෙන් පහව යනු ඇති බවට සුභවාදී බලාපොරොත්තුවක්ද වී සමගම පවතී. එමෙන්ම, 2020 පසු භාගයට අදාළ ආර්ථික දත්ත කෙරෙන්ද සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

ලොව පුරාම ජනතාව සතුව එමම වින්නත් ලබා ගැනීම සඳහා සමාන ප්‍රවේශ අවස්ථාවක් ඇති බව සහතික කිරීම තුළින් වසංගතයේ ඍණාත්මක බලපෑම් අඩපණ කිරීමේ හැකියාව බහුජාතික සමාගම් සතුව පවතින බවද පෙනී යයි. ගෝලීය ප්‍රජාවෙන් ලැබෙන සහාය මගින්ද සංවර්ධනය වෙමින් පවතින හා අඩු ආදායම්ලාභී රටවල් මත පැටවී ඇති අධික ණය බර අවම කිරීමට සහායක් ලබා ගත හැක.[8]

ශ්‍රී ලංකාවේද 2020 අග භාගය වන විට ව්‍යාපාර සාමාන්‍ය අතට හැරෙමින් පැවති හෙයින් බලාපොරොත්තුවේ අපේක්ෂා දල්වා ගැනීමට ඉඩකඩක් විවරව පවතී.

6. මූලාශ්‍රය: බ අංක 05, 2020, ශ්‍රී ලංකා මහ බැංකුව

7. මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2020, 8 පරිච්ඡේදය, මූල්‍ය ප්‍රතිපත්තිය, පොලී අනුපාත, මුදල් හා ණය, ආර්ථික ප්‍රවණතා.

8. මූලාශ්‍රය: ජනවාරි 2021, ලෝක ආර්ථික පුරෝකථන යාවත්කාලීනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල.

ප්‍රාග්ධන වාර්තා

මූල්‍ය ප්‍රාග්ධනය



මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී වාණිජ කටයුතු බිඳ වැටී දැවැන්ත ආර්ථික බලපෑම්වලට මුහුණ පාන්නට සිදු වුවද කොටස් හිමියන්ගේ අභිලාෂ තිරසාර ලෙස ආරක්ෂා කරමින් සහ අපේක්ෂා සුරක්ෂිත කරමින් ලාභදායී වසරක් වාර්තා කිරීමට හැකි වූ බව එච්ඩීඑෆ්සී බැංකුව දැනුම් දෙන්නේ මහත් අභිමානයෙනි.

මූල්‍ය කාර්යසාධනය

ලාභදායීතාව

2020 වූ කලී බැංකුවේ මූල්‍ය දර්ශක පදනම් කරගත් ඉලක්ක කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළ පෙර කිසිදු කලක නොවූ විරූ අභියෝග රැසක් ඉස්මතු කළ වසරක් බව නොරහසකි. මෙම වාර්තාව පුරාවටම සාකච්ඡා කෙරෙන පරිදි කොවිඩ්-19 වසංගතය සහ රට වසා දැමීම් හේතුවෙන් බැංකු අංශය කෙරෙමි සුවිශාල බලපෑමක් එල්ල විය. ආර්ථික ක්‍රියාකාරකම් බිඳ වැටී තිබුණු සහ විවිධ නියාමන අවශ්‍යතා රැසක් මතුව තිබුණු තත්ත්වයක් තුළ මතු වූ අභියෝග මධ්‍යයේ වුවද ගත වූ වර්ෂයේදී රු. මිලියන 475 ක් ලෙස වාර්තා වූ එච්ඩීඑෆ්සී බැංකුවේ බදුවලට පසු ලාභය මෙම සමාලෝචිත වසරේදී රු. මිලියන 708 දක්වා වර්ධනය විය. බැංකුවේ බදුවලට පෙර ලාභයද ගත වූ වර්ෂයේදී රු. බිලියන 1.24 ක් ලෙස වාර්තා වුවද මෙම සමාලෝචිත වර්ෂයේදී 11% ක වර්ධනයක් අත්කර ගනිමින් රු. බිලියන 1.38 දක්වා ඉහළ ගොස් ඇත.

විවේකශීලී වත්කම් හා වගකීම් කළමනාකරණය, අවදානම් පාලන සම්බන්ධ අනලස් ඉදිරි ක්‍රියාමාර්ග සහ පිරිවැය කාර්යක්ෂමකරණය ආදී සාධක කිහිපයක සංකලනයෙන් මෙම වර්ධනය උදාකර ගැනීමට අපට හැකි විය. මෙම සුභවාදී ප්‍රතිඵලය උදාකර ගැනීමට හැකි වූයේ බිඳ වැටුණු ආර්ථික කාර්යසාධනයක් පැවති සහ බාහිර පරිසරය තුළ වාණිජ ක්‍රියාකාරකම් පසුගාමී තත්ත්වයක පැවැති අවදානම්කාරී පරිසරයක් තුළ වීම සුවිශේෂී කරුණකි.



ප්‍රාග්ධන වාර්තා

මූල්‍ය ප්‍රාග්ධනය

ආදායම සහ වියදම

පොලී ආදායම සහ වියදම

මෙහි සලකා බැලෙන කාල සීමාව තුළ බැංකුවේ ආදායම රු. මිලියන 8,090 සිට රු. මිලියන 7,856 දක්වා 3% දක්වා පහත වැටිණ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ණය සහනවල ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතික අඩු වීම, ණය කළඹ මෙන්ම ණය ආපසු ගෙවී මී ආශ්‍රිත වර්ධනයක් සිදු නොවීම ආදී හේතූන් නිසා පොලී ආදායම පහත බැස ඇති බවක් පෙනී යයි. 2019 වර්ෂයේදී රු. බිලියන 7.6 ක් ලෙස වාර්තා වූ පොලී ආදායම මෙම සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ වාර්තා වූයේ රු. බිලියන 7.4 ක් වශයෙනි.

මේ අතර, 2019 වසරේදී රු. මිලියන 407 ක් ලෙස වාර්තා වූ පොලී නොවන ආදායමද 2020 දී රු. මිලියන 399 ක් දක්වා පහත වැටී ඇත. මේ අතර, 2019 වසරේදී රු. මිලියන 741 ක් ලෙස වාර්තා වූ පොලී නොවන ආදායමද 2020 දී රු. මිලියන 686 ක් දක්වා පහත වැටී ඇත. මෙහි සමාලෝචනයට ලක් වන කාල වකවානුවෙහි පැවැති පොලී තත්ත්වය පදනම් කරගෙන ඊට සුදුසු පරිදි අභිනව ණය දීම් සියල්ලටම අදාළව මිල නියම කිරීම සිදු කෙරිණ.

2020 දී පොලී ආදායමද රු. බිලියන 4.8 සිට රු. බිලියන 4.5 දක්වා පහත වැටිණ. වෙනත් ගැනුම්කරුවන්, ණය සුරැකුම්පත් හිමියන් සහ තැන්පත්කරුවන් වෙත ලබා දිය යුතුව තිබුණු පොලී මුදල්ද මෙම සමාලෝචනයට ලක් වන වසර තුළදී පහත බසින ලද අතර බැංකු වෙත ලබා දිය යුතු වූ මුදල්ද මෙම පහත බැසීමට හේතු විය.

පොලී ආදායම සහ වියදම් රු. මිලියන



2019 වසරේදී රු. මිලියන 358 ක් ලෙස වාර්තා වී තිබුණු ශුද්ධ ගාස්තු ආදායම සහ කොමිස් ගාස්තු 2020 දී රු. මිලියන 303 දක්වා පහත බසින ලදි. එමෙන්ම, 2019 දී රු. බිලියන 2.89 ක් ලෙස පැවැති ශුද්ධ පොලී ආදායමද මෙහි සමාලෝචනය කෙරෙන වර්ෂය තුළදී රු. බිලියන 2.98 දක්වා වර්ධනය වී තිබේ.

ආදායම රු. මිලියන



මෙහෙයුම් ආදායම සහ වියදම්

හානිකරණයට පසු ශුද්ධ මෙහෙයුම් ආදායම මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී රු. බිලියන 3.1 දන්වා වර්ධනය වී ඇති අතර මෙය ගත වූ වසරේ සිට රු. බිලියන 2.98 ක ඉහළ යාමකි. වෙනත් මෙහෙයුම් ආදායම්වල ඉහළ යාමට සාපේක්ෂව එම ඉහළ යාම සිදු වී තිබේ. වෙනත් වියදම් සහ ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් ආශ්‍රිත බිඳවැටීම් නිසා මෙහෙයුම් වියදම් රු. මිලියන 66 කින් අඩු වී ඇත.

තැන්පතු සහ ණය

තැන්පතු රැස් කිරීම

මුළු තැන්පතු කළඹෙන් 84% ක් ම ස්ථාවර තැන්පතු කෙරෙන් නියෝජනය වී ඇති අතර ඉතුරුම් පාදක තැන්පතු මගින් සමස්ථ අංශයෙන් 16% ක් නියෝජනය වී ඇත. සමස්ථයක් ලෙස ගෙන බැලූ විට බැංකුවේ ස්ථාවර තැන්පතු පදනම සහ ඉතුරුම් තැන්පතු පදනම පිළිවෙළින් 12.72% සහ 13.28% කින් වර්ධනය වී තිබේ. 2020 වසර අවසානය වන විට මුළු ඉතුරුම් තැන්පතු පදනමේ වටිනාකම රු. මිලියන 7,445 ක් ලෙස වාර්තා වූ අතර, මුළු ස්ථාවර තැන්පතු පදනමේ වටිනාකම රු. බිලියන 40.50 ක් ලෙස වර්තා වී තිබේ.

බැංකුවේ අලෙවිකරණ හා ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් මෙන්ම ජංගම බැංකු මෙහෙයුම් ඒකය විසින් සිදු කරන ලද හරස් විකුණුම් ක්‍රියාදාමයන්ද ඉතුරුම් සහ තැන්පතු ඉහළ යාම කෙරෙහි දායක වී ඇති බව පෙනී යයි. එයට අදාළ ක්‍රියාකාරකම්, පහළ හා මධ්‍ය ආදායම්ලාභී කණ්ඩායම්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කරන ලදි.

ණය කළඹ

ණය ලබා දීම් සහ ණය ලබා ගැනීම යන ක්‍රියාකාරකම් දෙවර්ග යන ඇණහිට තිබුණු කාල වකවානුව තුළ බැංකුවේ ණය පොතෙහි වටිනාකම 2019 දී රු. බිලියන 42.19 ක් ලෙස පැවතියද 2020 දී රු. බිලියන 41.21 දක්වා බිඳ වැටීමක් පෙන්නුම් කර ඇත. මෙම සමස්ථ ණය කළඹෙන් 80.90% ක් ම නිවාස ණය මගින් සමන්විත වූ අතර ඉන් පසුව දැක්ය හැකි විශාලතම දායකත්වය වූයේ මුළු ණය කළඹින් 10.25% ක් නියෝජනය කළ ආයතනික සංවර්ධන ණය පහසුකම් විය. 2020 අග භාගය වන විට ආනතනික 2% කින් පහත බැස්සේය. බැංකුවේ ණය කළඹ වෙත ප්‍රමුඛතම දායකත්වයක් ලබා දී ඇත්තේ ඇප මත පදනම් වූ ණය වෙතින් වන අතර, පදිංචි දේපල උකස් කොට ලබා ගත් ණයවලින් 34% ක දායකත්වයක් ඊට ලැබී

ඇත. ඉන් අනතුරුව සේවක අර්ථසාධක අරමුදල පාදක කරගත් ණයවලින් 28% ක සහ පුද්ගල ඇප මත ලබා දුන් ණයවලින් 20% ක ද දායකත්වයක් ණය කළඹට ලැබී තිබේ.



ණය ගැනීම් සහ ආයතනික ණයකර

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී පියවීමට නියමිතව තිබුණු රු. බිලියන 2.5 ක ණයකර වටිනාකමක් ගෙවා දැමීමටද බැංකුව කටයුතු කළේය. 2013 දී ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 2,000 ක ණයකරයක් සහ ඉන් අනතුරුව 2015 දී එළැඹී රු. මිලියන 4,000 ක දෙවැනි ණයකරයක් පියවීමෙන් අනතුරුව එය සිදු කරන ලදී. 2013 දී ක්‍රියාත්මක කරන ලද ණයකරය 2016 වසරේදී පියවීමට බැංකුව කටයුතු කළ අතර, ඉන් අනතුරුව ණයකර පියවීම සඳහා තවත් රු. මිලියන 1,080 ක මුදලක් 2018 දී වැය කරන ලදී.

අක්‍රිය ණය

ගත වූ වර්ෂයේ සංඛ්‍යා දත්ත හා සැසඳීමේදී මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ බාහිර සාධක නිසා පැනවුණු සීමා හේතුවෙන් බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකය ඉහළ යාම සිදු විය. 2021 වසර සම්බන්ධයෙන් බැලූ විට බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකය සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස ගෙන ලබා ගත් ණය බැහැර කළ විට 20.22% ක් ලෙස පැවතිණ. රට වසා දැමීම් හේතුවෙන් ඉස්මතු වූ මූල්‍යමය දුෂ්කරතා සමනය කරනු පිණිස ක්‍රියාත්මක කරන ලද නව නියාමන අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරුවන් ණය නැවත ගෙවීමේ කටයුතු සම්බන්ධයෙන් පැනවුණු තාවකාලික සහන විධිවිධාන එකී බාහිර සාධක අතරට ඇතුළත් විය. එමෙන්ම, සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස තබාගෙන ලබා ගන්නා ලද ණය කෙරෙන් අක්‍රිය ණය තත්ත්වය වඩා හොඳින් විද්‍යමාන විය.

සමාජ සංචරණයන් අඩපණ වීම සහ සමාජ හා වාණිජමය කටයුතු අඩාළ වීම ආදී හේතු නිසා 2020 වසරේදී ණය අයකර ගැනීම සම්බන්ධයෙන් බැංකුවට අභියෝගවලට මුහුණ පාන්නට සිදු වූ අතරම, නිවාස මූල්‍ය පහසුකම් ලබාගෙන තිබුණු ගනුදෙනුකාර කාණ්ඩය තුළ අඩු හා මධ්‍ය ආදායම්ලාභීන් ණය ගෙවීම් සීමාසහිත වීමේ තත්ත්වය වෙතද බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකය නිරාවරණය විය. කෙසේ වෙතත්, මෙවැනි අභියෝග රැසක් මධ්‍යයේ වුවද, එකී අක්‍රිය ණය අනුපාතිකය අනාගතයේදී වැඩිදුරටත් ඉහළ යාම වැළැක්වීම අරමුණු කරගත් විචක්ෂණශීලී අවදානම් පාලන විධිවිධාන සහ සවිමත් ණය තත්ත්ව පාලන ක්‍රියාවලියක් අනුගමනය කිරීමට බැංකුව පියවර ගත්තේය.

එමෙන්ම, අක්‍රිය ණය අනුපාතිකය ඉදිරියේදී එලෙස ඉහළ යාම සීමා කිරීම වනාහි තරමක් දුරට ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක්ද වේ. රු. මිලියන 1.5 සීමාව ඉක්මවා යන ණය නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් එම ක්‍රියාවලිය මගින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වැඩි අධීක්ෂණ භූමිකාවක් ලබා දෙන ලදී.

වත්කම් සහ වගකීම්

මුළු වත්කම්

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ බැංකුවේ මුළු වත්කම් වටිනාකම රු. බිලියන 61 ක් ලෙස වාර්තා වී ඇත. වෙනත් බැංකුවල රඳවා තිබූ මුදල්වල රු. බිලියන 9.9 ක ඉහළ යාමක් සහ ණය හා වෙනත් මූල්‍ය උපකරණවල රු. බිලියන 7.5 ක ඉහළ යාමක්ද මුළු වත්කම් වටිනාකම වර්ධනය වීමට ඇතුළත් විය. එමෙන්ම, මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී මුදල් හා මුදල් සමාන වටිනාකම්ද රු. මිලියන 421 සිට රු. මිලියන 305 දක්වා පහත බැස තිබේ.

මුළු වගකීම්

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී වෙනත් බැංකු වෙත ගෙවිය යුතු අරමුදල් රු. මිලියන 953 සිට රු. බිලියන 2.4 දක්වා වැඩි වීමද මුළු වගකීම් ඉහළ යාමට ඇතුළත්ව තිබේ. තැන්පතුකරුවන් සහ ණය ලබා ගන්නා ලද පුද්ගලයන් වෙත ගෙවිය යුතු මුදල් ඉහළ යාමද මුළු වගකීම් ඉහළ යාමට හේතුවක් වී ඇත. මෙහි සමාලෝචිත වර්ෂය තුළදී තැන්පතුකරුවන් වෙත ගෙවිය යුතු මුදල් වටිනාකම වැඩි වීමට එක් හේතුවක් ලෙස මුදල් තැන්පතු ආශ්‍රිත වර්ධනය සඳහන් කළ හැක. 2020 නොවැම්බර් මාසයේදී කල් පිරුණු වසර පහක කල් පිරීම් කාලයක් සහිත ණයකරයක් පියවීම හේතුවෙන් මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ බැංකුවේ ණය සුරැකුම්පත් ආශ්‍රිතව ගෙවිය යුතු වූ මුදල් ප්‍රමාණය යම් අඩු වීමකට ලක් විය. ඉතිරි ණයකර වටිනාකම 2025 දී පියවා දැමීමට නියමිතව ඇත.



ආයෝජන කළඹ

2020 වසර අවසානය වන විට බැංකුවේ ආයෝජන කළඹ රු. බිලියන 17 ක මුළු එකතුවකින් සමන්විත විය. වෙනත් බැංකුවල, රජයේ සුරැකුම්පත්වල හා වාණිජ පත්‍රවල අරමුදල් තැන්පත් බිරීම ඔස්සේ බැංකුවේ ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම සඳහා දරන ලැබූ ප්‍රයත්නයන්හි දායකත්වය ඊට ලැබී තිබුණි. එමෙන්ම, අනිවාර්ය ද්‍රවශීල වත්කම් කළඹ, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය පවත්වා ගැනීම උදෙසා බැංකුව ප්‍රකට කළ කාර්යසාධනයද ඊට දායක වී තිබේ.

ප්‍රාග්ධන වාර්තා

මූල්‍ය ප්‍රාග්ධනය

කොටස් හිමියන් සඳහා වූ ප්‍රතිලාභ සහ ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් හිමියන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීම

ව්‍යාපාරික වාෂ්පශීලතාවන්හි බලපෑමක් සහති සහ ඉහළ බලපෑමක් එල්ල කළ නියාමන විධිවිධාන අනුගමනය කර තිබුණු සන්දර්භයක් තුළ කොටස් හිමියන් වෙනුවෙන් වැඩි වැඩියෙන් මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් එච්සීවිග්සී බැංකුව කැප වීමෙන් කටයුතු කළ බව කිව මනාය. 2019 වසරේදී රු. බිලියන 7.35 ක් ලෙස පැවති කොටසකට ඉපයීම් මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී රු. බිලියන 10.94 දක්වා 49% කින් ඉහළ ගොස් ඇති අතර ප්‍රධාන වශයෙන්ම ඊට හේතු වී ඇත්තේ ලාභය ඉහළ යාමයි. එමෙන්ම, මෙම වසර තුළදී කොටස් හිමි අරමුදල්ද 13% කින්, රු. මිලියන 5,782 දක්වා ඉහළ ගොස් තිබේ. එපමණක්ද නොව, කොටසකට ශුද්ධ වත්කම් වටිනාකමද රු. බිලියන 79.11 සිට 2020 වසරේදී රු. බිලියන 89.35 දක්වා ඉහළ ගොස් ඇති අතර මෙය 13% ක වර්ධනයකි. මේ අතර, ප්‍රකාශික ප්‍රාග්ධනය රු. මිලියන 962 ක් ලෙස නොවෙනස්ව පැවත තිබේ.

සාමාන්‍ය කොටස් (ස්කන්ධය) සහ වගකීම්

බැංකුවේ මුළු ස්කන්ධ සහ වගකීම් වටිනාකම රු. බිලියන 61 ක් ලෙස වාර්තා වන අතර මෙය ගත වූ වර්ෂය හා සැසඳීමේදී රු. බිලියන 56 ක ඉහළ යාමකි. 2020 වසර අවසානය වන විට බැංකුවේ රඳවා ගත් ඉපයීම් රු. බිලියන 3.6 සිට රු. බිලියන 4.2 දක්වා ඉහළ ගොස් ඇති අතර ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් වටිනාකමද රු. මිලියන 35 කින් වර්ධනය වී ඇත. කොටස් හිමියන් සඳහා වූ මුළු ස්කන්ධ වටිනාකම වර්තා වී ඇත්තේ රු. බිලියන 5.8 ක් වශයෙනි.

බදුවලට පසුව මුළු ලාභය සලකා බැලීමේදී වත්කම් සාමාන්‍යය මත ප්‍රතිලාභය ආශ්‍රිතව 34% ක ඉහළ යාමක් පෙන්නුම් කරන අතර 2019 වසරේදී 0.90% ක් ලෙස පැවති එය 2020 දී 1.21% දක්වා වර්ධනය වී ඇත. සමස්ථයක් ලෙස බැංකුවේ ස්කන්ධ සාමාන්‍යය මත ප්‍රතිලාභය 35% කින් ඉහළ ගොස් ඇති අතර 9.63 ක් ලෙස පැවැති මෙය 2020 දී 12.99 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2020 මූල්‍ය වර්ෂයේදී මුළු වත්කම්වලට කොටස් හිමි ස්කන්ධ අනුපාතිකය ආශ්‍රිතවද 0.33% ක සුළු ඉහළ යාමක්, 9.15 සිට 9.47 දක්වා පෙන්නුම් කෙරේ.

රැඳවුම් අනුපාතය



ස්කන්ධය මත ප්‍රතිලාභ 2019 දී 9.63 ක් ලෙස වාර්තා වූ අතර 2020 වසරේදී එය 12.99% දක්වා ඉහළ ගොස් ඇත. ණය අයකර ගැනීමේ බද්ද සහ ජාතික ගොඩනැගීමේ බද්දට අදාළ බදු නීති වෙන්සවීම කෙරෙන්ද සැලකිය යුතු ප්‍රතිලාභයක් බැංකුවට අත් විය.

ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

ද්‍රවශීලතාව

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී මනා ද්‍රවශීලතා පදනමක් පවත්වා ගැනෙන බව සහතික කරනු පිණිස බැංකුව විචක්ෂණ විධිවිධාන අනුගමනය කළේය. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ 43% වර්ධනයක් අත්කර ගත් බැංකුවේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකයද 20% ක් වූ අනිවාර්ය නියාමන අවශ්‍යතා සීමාව ඉක්මවා යමින් 37.20% ක් ලෙස වාර්තා වී තිබේ. මෙපරිද්දෙන්ම නියාමන අවශ්‍යතාව ඉක්මවා යමින් බැංකුව සිය ද්‍රවශීලතා ආවරණ අනුපාතිකයද 138% ක් ලෙස පවත්වා ගැනීමට සමත්ව ඇත. මූල්‍යමය වශයෙන් අභියෝගාත්මක තත්ත්වයන්ට සාපේක්ෂව වසර ගණනාවක් පුරාවටම බැංකුවේ ආතති මට්ටම් තක්සේරු කිරීම සිදු කරන ලද අතර ඒ අනුව අවධානය යොමු විය යුතු පැති අපගේ වත්කම් සහ වගකීම් කමිටුව විසින් අධීක්ෂණය කරන ලදි. බැංකුවේ ද්‍රවශීලතා මට්ටම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති අවම සීමා අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සතුටුදායක ලෙස පවත්වා ගෙන ඇති බව එම කමිටුව විසින් සහතික කරන ලදි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බැංකුවේ රඳවා තිබුණු ආයතනික තැන්පතු ආපසු ගැනීම නිසා ඇති වූ තත්ත්වය සමබර කර ගැනීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ කඩිනම් ක්‍රියාමාර්ග නිසාද 2020 වසර පුරාවටම වඩා හොඳ ද්‍රවශීල වත්කම් කළඹක් උපරිම මට්ටමින් පවත්වා ගැනීමට සහායක් ලැබිණ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාව ආශ්‍රිතව උද්ගත වූ හිඟය පියවා ගැනීම සඳහා මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුව රු. මිලියන 692 ක මුදලක් සම්පාදනය කළ අතර මේ නිසා 2019 වසර අවසානය වන විට පැවැති රු. බිලියන 2.2 ක ප්‍රාග්ධන හිඟය 2020 දී රු. බිලියන 1.5 දක්වා අඩු කර ගැනීමට හැකි විය. දැනට පවතින එම හිඟයද 2022 අවසානය වන විට සපුරා ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රමාණවත් ප්‍රාග්ධන අතිරික්තයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් බැංකුව සතු විශ්වසනීයත්වය සනාථ කරමින් සාමාන්‍ය ස්කන්ධ ස්ථර 1 අනුපාතිකය (CET 1), මුළු ස්ථර 1 අනුපාතිකය සහ මුළු ප්‍රාග්ධන අනුපාතිකය අවම අවශ්‍යතා සීමාවන්ට වඩා ඉහළින් පවත්වා ගත් බවද සහතික කෙරුණි. 2020 සඳහා පැවැති 7.00%, 8.50% සහ 12.50% යන අවම නියාමන අවශ්‍යතා සීමාවන්ට සාපේක්ෂව එකී අනුපාතික පිළිවෙළින් 19.34%, 20.20% සහ 20.67% වශයෙන් පවත්වා ගෙන තිබේ.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය



සබඳතා සුරැකීම

මූල්‍ය මැදහත්කරුවෙකු වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව තමන් සහ පාර්ශ්වකරුවන් යන දෙපාර්ශ්වයම වෙනුවෙන් අර්ථවත් සබඳතා ගොඩනගා ගැනීමේ වටිනාකම කෙරෙහි විශ්වාසය තබයි. මෙම විශ්වාසය ගුරුකොට ගනිමින් ගනුදෙනුකරුවන් සමග සිදු කෙරෙන සෑම ගනුදෙනුවකදීම සියලුම දෙනා වෙත ගරු කරමින් හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අරම අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණ පෑමේදී ආචාර ධාර්මික හා නම්‍යශීලී පිළිවෙත් අනුගමනය කිරීම සඳහා කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට නිරතුරුව කටයුතු කරයි.

ගනුදෙනුකරුවන්

විශේෂිත බැංකුවක් වශයෙන් සමාජ හා ආර්ථික වර්ධනය ළඟාකර ගැනීම වෙනුවෙන් ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීමේ වගකීම එච්ඩිඑෆ්සී බැංකුව වෙත පැවරී තිබේ. මෙම අවධානය සිත්හි තබා ගනිමින් අප බැංකුව ගනුදෙනුකරුවන් වෙත සහකම්පනාත්මක සේවාවක් ලබා දෙමින් වර්ධන ප්‍රතිලාභ ඔවුන් හා බෙදාහදා ගැනීම උදෙසා උපරිම ප්‍රයත්න දරයි.

ග්‍රාමීය ප්‍රජාවන්, අඩු-මධ්‍ය ආදායම්ලාභී පවුල් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායිකයන් අතර අප බැංකුව කෙරෙහි පවතින කීර්තිය හේතුවෙන් අපගේ සමාජ ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට හැකි වී ඇති අතර විවිධ ප්‍රයත්න, නවෝත්පාදනයන් සහ ක්‍රියාදාම රැසක්ම ඔස්සේ එය සුරැකිව පවත්වා ගැනීමට අපි නිරතුරුව පියවර ගනිමු. බිම් මට්ටමේ ප්‍රජාවන් ඇසුරෙහි සිය ගමන ආරම්භ කළ බැංකුවක් වශයෙන් තවත් පරම්පරාවක් වෙත රැගෙන යා හැකි නව අන්තර්පුද්ගල සබඳතා නිර්මාණය කර ගනිමින් එච්ඩිඑෆ්සී බැංකුව මේ වන විටත් නව ගනුදෙනුකාර කාණ්ඩ වෙත ව්‍යාප්ත වෙමින් පවතී.

බැංකුවේ තැන්පතු සහ ණය කළඹ ආශ්‍රිත ස්ථිර වර්ධනය කෙරෙන් මෙම වර්ධනය පැහැදිලිවම ප්‍රකට කෙරෙන අතර, සියලුම ගනුදෙනුකාර කාණ්ඩ වෙත වඩා හොඳ සේවාවක් ලබා දීමේ හැකියාව දින දින ඉහළ යන බවක් එමගින් ගම්‍ය වේ.

ආරම්භක ගනුදෙනුවට පසුව ගනුදෙනුකරුවන් සමග සිදු කෙරෙන සන්නිවේදනයන් සවිගැන්වීම උදෙසා විවිධ විවෘත සන්නිවේදන ක්‍රමවේද රැසක්ම බැංකුව පවත්වා ගනියි. මේ සම්බන්ධයෙන් බැංකුව සතු වටිනාකම්, ශාඛා ව්‍යාප්තිය, සමාජ මාධ්‍ය ව්‍යාප්තිය, වෙබ් අඩවිය සහ ජංගම බැංකුකරණ නාලිකා ආදිය කෙරෙන් අර්ථවත් සබඳතා පෝෂණය කර ගැනීම වෙත ඉහළ වටිනාකමක් නිර්මාණය කෙරේ.

ප්‍රාග්ධන වාර්තා

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

සබඳතා පෝෂණය කරන වටිනාකම්

සමාජ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීම සහ හි වටිනාකම ඉහළ නංවා ගැනීම එච්ඩීඑෆ්සී බැංකුවේ ප්‍රමුඛ වටිනාකම් තුළම ගැබ් වී ඇත. ගනුදෙනුකරුවන් අතර මූල්‍ය තිරසාරතාව පිළිබඳ දැනුම පතුරුවා හරිමින් අවංකභාවය, නම්‍යශීලීතාව සහ සුහදශීලී සේවාව යන මූලධර්ම වෙත ගරු කරමින් කටයුතු කරන ලෙස බැංකුව නිරන්තරයෙන්ම සිය සේවක මණ්ඩලය වෙත සිහිපත් කරයි. බැංකුව ගනුදෙනුකරුවන් වෙත සමීප වන්නේ ශාඛා ජාලය හෝ කෙෂ්ත්‍ර මෙහෙයුම් යන මේ කවර ක්‍රමවේදය ඔස්සේ වුවද අභියෝගාත්මක කාලවලදී පවා එකී වටිනාකම් ගුරු තන්හි තබා කටයුතු කිරීමට අපගේ සේවකයෝ නිරතුරුව කටයුතු කරති.

අපගේ සේවක මහත්ම මහත්මීන් කිසිදු ඉල්ලීමක් නොකරමින් නිරන්තර කැපීමෙන් යුතුව කොවිඩ්-19 වසංගතයේ මහ රට වසා දැමීම්වල බලපෑම් හමුවේ ඉටු කළ සේවය කෙරෙන් මෙය මනාව ප්‍රත්‍යක්ෂ විය.

භූගෝලීය වශයෙන් විවිධත්වයකින් යුතු ශාඛා ජාලය

භූ ගෝලීය වශයෙන් විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති ශාඛා 39 කින් සමන්විත ශාඛා ජාලය හරහා ගනුදෙනුකරුවන් සමග සිදු කෙරෙන ගනුදෙනු සහ වඩා ඉහළ විනිවිදභාවක් පවත්වා ගැනීම උදෙසා 2019 වසරේදී හඳුන්වා දෙන ලද අලෙවිකරණ වැඩසටහන් සහ විද්‍යුත් අත්සන් පුවරු ආදී ක්‍රම ඔස්සේ තොරතුරු බෙදා හැරීම ඔවුන් සමග සෘජු සබඳතා පවත්වා ගැනීමට බැංකුව කටයුතු කරයි. ඉදිරියේදී වැඩිදුර වෙළෙඳපොල අංශ වෙත ළඟා වෙමින් සහ මූල්‍ය අන්තර්ග්‍රාහීභාවය ඉහළ නංවන අතරම අපගේ ශාඛා ජාලය ස්ථාන 54 ක් දක්වා වැඩි කර ගැනීමේ උපායමාර්ගික සැලැස්මක්ද අප බැංකුව සතු වේ.

අබගේ බැංකුව සතු ප්‍රධාන ප්‍රමුඛතාවක් ලෙස ව්‍යාපාරික ව්‍යාප්තිය පවත්වා ගන්නා අතර, වඩා කාර්යක්ෂම සහ සුහදශීලී සේවාවක් ගනුදෙනුකරුවන් වෙත ලබා දීම උදෙසා පවතින ශාඛා ජාලය නවීකරණය කිරීම කෙරෙහිද අපි අවධානය යොමු කරමු. 2020 වසරේදී තිස්සමහාරාමය ශාඛාවද ඇතුළු ශාඛා පහක වැඩිදියුණු කිරීම් සිදු කෙරිණ.

ජංගම බැංකුකරණ පහසුකම

සේවකයන් 104 කට අධික සංඛ්‍යාවකින් සමන්විත ජංගම බැංකු නිලධාරීන් ලෙස සේවය කරන කණ්ඩායමක් රටෙහි නගර 140 කට අධික ප්‍රමාණයක් ආවරණය කරමින් දොරින් දොර බැංකු සේවා ලබා දෙමින් ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර හිමියන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා රට පුරා සංචාරය කරයි. බැංකුවේ මූල්‍ය සේවා සමග ගනුදෙනුකරුවන් සම්බන්ධ කරමින් එච්ඩීඑෆ්සී බැංකුවේ ජංගම බැංකුකරණ ඒකකය ඉතාම අත්‍යවශ්‍ය භූමිකාවක් ඉටු කරමින් සිටියි. සාමාන්‍යයෙන් බැංකු පහසුකම් වෙත ප්‍රවේශය නොමැති ගනුදෙනුකරුවන් වෙත ළඟා වීමටද අපගේ ජංගම බැංකු නිලධාරියෝ පියවර ගනිති.

ලබා දෙන නව සේවා සහ අඟය එකතු කළ සේවා

2020 වසරේදී අප බැංකුව ඇපකරුවන් සහිත ණය හා කල්බදු පහසුකම් හරහා අපගේ පාවෙන පොලී අනුපාතික මත පදනම් වූ ණය කළඹ වර්ධනය කර ගෙන තිබේ. පාවෙන පොලී අනුපාතික සඳහා කැමැත්තක් දක්වන ගනුදෙනුකරුවන්ට ස්ථාවර හෝ පාවෙන පොලී අනුපාතික යටතේ දැන් නිවාස ණය ලබා ගැනීමට හැක.

මීට අමතරව, බැංකුවේ ඩෙබිට් කාඩ්පත හරහා ඡඩි ගනුදෙනු සිදු කිරීම පහසු කිරීම සඳහා අපගේ ප්‍රධාන බැංකු පද්ධතිය වැඩිදියුණු කරන ලදි. මෙම වාර්ෂික වාර්තාව පිළියෙළ කළ කාලය වන විට ඒ සඳහා වූ ප්‍රාරම්භක පියවර සියල්ලම ක්‍රියාත්මක වෙමින් පැවතිණ. Point- of-Sale (POS) ගනුදෙනු මුදල් රහිත ක්‍රමවේදය හරහා සිදු කිරීමේ තෝරාගැනීම ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන අතරම මෙම නව සේවාව නිසා වෙළෙඳපොල තරගකාරිත්වය ඉහළ යනු ඇත.

බැංකුවේ නව ව්‍යාපාර පිළිබිඹු කරමින් 2019 දී විදේශ ගනුදෙනු ආශ්‍රිත ප්‍රමාද වීම් සහ අවහිරතා ඉවත් කිරීම සඳහා එච්ඩීඑෆ්සී බැංකුව පියවර ගත් බවද සඳහන් කළ යුතුය. ඩොලර් ගිණුම් රඳවා ගැනීම සඳහා බැංකුවට බලය පවරා නොමැති හෙයින් එම අඩුපාඩුව මගහරවා ගැනීම උදෙසා අපි පුරෝගාමී වාණිජ බැංකුවක් සමග හවුල්කාරත්වයක් ඇති කර ගත්තෙමු.

ජපාන ණය කාර්යාංශය සහ Lanka Clear ආයතන සමග ඇතිකර අත්වැල් බැඳ ගනිමින් බිහි කරන ලද, එමෙන්ම, 2021 වසරේදී දියත් කිරීමට නියමිතව ඇති බැංකුවේ ජාත්‍යන්තර EMV චිපය පාදක ATM කාඩ්පත හරහා ජාත්‍යන්තර ගනුදෙනු සිදු කිරීමට ඉඩකඩ එමගින් සැලසේ.

එමෙන්ම, පරිපාලනමය ක්‍රියාවලි දුෂ්කරතා සහ ප්‍රමාදවීම් අඩු කරමින් ගනුදෙනුකරුවන් වෙත අන්තර්ජාලය පාදක කරගත් විසඳුම් ලබා දීම සඳහා රක්ෂණ සේවා සැපයුම්කරුවන් සමගද බැංකුව අත්වැල් බඳගන්නා ලදි. මේ වන විට එම පද්ධතිය නිසා රක්ෂණාවරණ සම්බන්ධ මිල නියම කිරීම් සඳහා තථ්‍ය කාලීනව සහාය සැපයේ. එය ඔස්සේ ගනුදෙනුකරුවන්ට කිසිදු අමතර ගාස්තුවක් ගෙවීමකින් තොරව රක්ෂණ වාරික සසඳා බලමින් වඩාත්ම ඔබින රක්ෂණාවරණය ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතතාව සහතික කිරීම

වසංගත තත්ත්වයේ පැතිරීම හේතුවෙන් ගනුදෙනු කටයුතු සහ අදාළ ක්‍රමවේදවල සේවය ලබා ගැනීම උදෙසා ප්‍රධාන කාර්යාලය හා ශාඛා වෙත පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලුම විධිවිධාන බැංකුව විසින් අනුගමනය කරන ලදි.

මේ අනුව, නිසි දුරස්ථකරණ පහසුකම් සලසා ඇති බව සහතික කරමින් අප සේවකයන් හා ගනුදෙනුකරුවන් අතර අන්තර්ක්‍රියා සිදු වන ස්ථාන සහ ගෙවීම් කවුන්ටර ආශ්‍රිතව පොලිතීන් ආවරණ යෙදීමට අපි පියවර ගත්තෙමු. මීට අමතරව, නිතර නිතර මිනිසුන්ගේ ස්පර්ශ කිරීම්වලට ලක් වූ උපකරණ, දොරවල් හා අනෙකුත් පෘෂ්ඨ විෂබීජහරණයට ලක් කිරීමට අමතරව කාර්යාල විෂබීජහරණයට ලක් කිරීමටද ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ කළමනාකාරවරු පියවර ගත්හ.

මූල්‍ය සහන

ජනතාවට මූල්‍ය සහාය හා සහන සැලසීම අත්‍යවශ්‍යම වී තිබුණු කාල වකවානුවක් වූ 2020 වසරේදී ගනුදෙනුකරුවන් වෙත සේවා ලබා දෙන අතරේ මූල්‍ය ප්‍රතිලාභ වෙත ජනතාව අභිමුඛ කිරීමටද අප බැංකුව කටයුතු කළේය.

වසංගතයේ සහ ඉන අනතුරුව පනවන ලද රට වසා දැමීමේ පියවර නිසා ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙකු වෙත අභියෝග රැසක් මතු කරන ලදී. ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, අඩු හා මධ්‍ය ආදායම්ලාභීන් සහ දෛනික වැටුප් ලබන්නන් වෙත සේවා ලබා දෙන බැංකුවක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද සහන විධිවිධාන සියල්ලම ගනුදෙනුකරුවන් වෙනුවෙන් සැලසීමට පියවර ගත්තේය. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද 'සෞභාග්‍ය' කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය ගුරුකොට ගනිමින් බැංකු කළමනාකාරිත්වය ව්‍යාපාර 46 ක් වෙත කාරක ප්‍රාග්ධන ණය ලබා දුන්නේය. සමස්ථයක් ලෙස ගත් විට සේවක අර්ථසාධක අරමුදල පදනම් කරගත් ණය හැරුණුකොට ගනුදෙනුකරුවන් 40% කට අධික පිරිසක් වෙත අප බැංකුව විසින් ණය සහන පහසුකම් ලබා දෙන ලදී.

නියාමන අධිකාරිය විසින් නියම කරන ලද මූල්‍ය සහනයට අමතරව, වසංගතය හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් වෙත මූල්‍ය සහන ලබා දීම උදෙසා ණය ගෙවීම් සහන කාල දීර්ඝ කරමින් අපගේ බැංකුව විසින්ද ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කරන ලදී. මීට අමතරව, 2020 දෙසැම්බර් 31 දිනට පෙර නැවත ගෙවීම් පදම් කරගත් ණය හා කල්බදු පහසුකම් ලබාගත් ගනුදෙනුකරුවන් සඳහා වූ හිඟ ගාස්තු කපා හැරීමටද බැංකුව පියවර ගත්තේය. එමෙන්ම, බැංකුවේ වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය අවකාශ සහ සෑම ශාඛාවකම ප්‍රදර්ශනය කර තිබුණු ඩිජිටල් පුවරු ආදිය ඔස්සේ මූල්‍ය සහන පිළිබඳ දැනුම්දීම් පළ කරන ලදී. අයදුම්පත් යොමු කිරීම සඳහා ගනුදෙනුකරුවන් වෙත නව විද්‍යුත් තැපැල් ලිපිනයක්ද ලබා දෙන ලදී. මීට අමතරව, ගනුදෙනුකරුවන් ඉදිරිපත් කළ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහාම වෙන් වූ දුරකතන අංකයක්ද බැංකුව විසින් ලබා දෙන ලදී.

සංවර්ධන ණය

ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව නිරන්තරයෙන්ම ගනුදෙනුකරුවන් වෙත ණය ප්‍රතිලාභ උදා කිරීම සඳහා පියවර ගනියි. ද සොයිසා පෙදෙස නිවාස ව්‍යාපෘතියෙන් නිවස වීකක මිල දී ගැනීමට අදහස් කළ පුද්ගලයන් වෙත නිවාස ණය ලබා දීම උදෙසා 2020 වසරේදී අපගේ බැංකුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග සාකච්ඡා පවත්වන ලදී.

ඊටද අමතරව නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති වෙතින් මහල් නිවාස සංකීර්ණවල බද්ධ නිවාස ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලයන් වෙත නිවාස ණය පහසුකම් ලබා දීම උදෙසා බැංකුවේ සභාපතිනිය, ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර අධ්‍යක්ෂ සහ ඉහළ කළමනාකරණ නිලධාරීන් නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය සමගද සාකච්ඡා පවත්වන ලදී. 2020 දී රජය විසින් යෝජනා කරන ලද 7% කා වාර්ෂික සහන පොලී අනුපාතිකය යටතේ වූ ණය යෝජනා ක්‍රමයට අනතුරුව එම ක්‍රියාමාර්ග දෙකම ආරම්භ කරන ලදී.

ඩිජිටල් පරිවර්තනයන් වෙත යොමු වීම

එච්ඩිඑෆ්සී බැංකුවේ ඩිජිටල් ව්‍යාප්තිය කෙමෙන් ඉහළ යන්නකි. කෙසේ වෙතත්, ඩිජිටල් හා ස්වයංක්‍රියකරණ විසඳුම් වෙත බැංකුව යොමු වූයේ සාපේක්ෂ වශයෙන් ප්‍රමාද වී වුවද, ඩිජිටල් ස්පර්ශක ස්ථාන සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් මේ වන විට අප බැංකුව ඩිජිටල් හා තොරතුරු තාක්ෂණය පදනම් වූ වර්ධන උපායමාර්ගයක් සමග ප්‍රගතිය කරා ගමන් කරමින් සිටියි. ඉදිරිපෙළ හා පසුපෙළ මෙහෙයුම් නවීකරණය කිරීම සහ ඩිජිටල් අවකාශ ව්‍යාප්ත කිරීම සඳහා සිදු කෙරෙන ආයෝජනද ඉහළ නැංවීමට පියවර ගැනීමට නියමිතය.



ඩිජිටල් නිෂ්පාදන, කාඩ්පත් පාදක මූල්‍ය උපකරණ, ජංගම යෙදුම් හා වැඩිදියුණු කරන ලද ඊ-බෑන්කින් සේවා ආදිය වෙනුවෙන් ආයෝජනය කිරීමට බැංකුව අරමුණු කරයි.

සමාජ මාධ්‍ය හා අන්තර්ජාල වෙළෙඳ ප්‍රචාරණ

විවිධ ජන ප්‍රජාවන් නියෝජනය කරන ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගනිමින් එච්ඩිඑෆ්සී බැංකුව සමජ ජාල අවකාශ කිහිපයකම සක්‍රීයව සිටියි.

අලෙවිකරණ මෙවලමක් වශයෙන් සමාජ මාධ්‍ය සතු අතිශය වැදගත් භූමිකාව සහ ඩිජිටල් අවකාශය තුළ තිරසාර පැවැත්මක නිර්මාණයට කර ගැනීම සඳහා ඉන් ලැබෙන දායකත්වය ගැන අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. සමාජ ජාලකරණය සහ එය අන්තර්ක්‍රියාකාරී මෙවලමක් වශයෙන් එය යොදා ගැනීම මගින් පරිශීලකයන් විසින් මතු කරන අවධානයට ලක් කළ යුතු කාරණා සහ වැදගත් ප්‍රතිපෝෂණ සම්බන්ධයෙන් කඩිනම් ප්‍රතිචාර දක්වන අතරම, ගනුදෙනුකරුවන්ගේ චර්යාවන් හඳුනා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා නිසි ලෙස අවබෝධ කර ගැනීමට බැංකුවට හැකියාව ලැබේ.

ප්‍රාග්ධන වාර්තා

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

බැංකුවේ ෆේස්බුක් ගිණුම ආශිතව 14,000 ඉක්මවන පරිශීලක පිරිසක් සම්බන්ධ වී සිටින අතර මේ නිසා අලුතින් එක් කර ගැනීමට හැකියාවක් ඇති නව ගනුදෙනුකරුවන් වෙත තොරතුරු ලබා දෙන අතරම නිරන්තර පදනමක් මත අප කෙරෙහි පාක්ෂිකත්වය දක්වන ගනුදෙනුකාර භවතුන් සමග සම්බන්ධතා පැවැත්වීමට ඉඩ සැලසේ. දැනට අප විසින් වැඩියෙන්ම ප්‍රයෝජනයට ගනු ලබන ප්‍රධාන ධාරාවේ නොවන ප්‍රචාරණ මාධ්‍යය වන්නේද මෙම සමාජ ජාල අවකාශයයි.

ගනුදෙනුකරුවන් සමග ඍජු සබඳතාවක් නිර්මාණය කරමින් කල්බදු විසඳුම් අලෙවිකරණය හා සන්නිවේදනය උදෙසා යොදා ගත හැකි

ඊ-වාණිජ්‍ය අවකාශයක් සමගද බැංකුව හවුල් විය. 1000 කට වැඩි විමසීම් ප්‍රමාණයක් බැංකුව තුළට ගලා ඒමට මග වීම සන්නිවේදන මාධ්‍යය නිසා විවර විය.

ජංගම ගෙවීම් යෙදුම

2019 වසරේදී අපේක්ෂා කළ පරිදි නම්චිජ්හ සේවාව හරහා ජංගම උපාංග පාදක ගෙවීම් යෙදුමක් වෙනුවෙන් ආයෝජනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීමටද බැංකුව කටයුතු කළේය. එච්ඩීඑෆ්සී බැංකුවේ ගනුදෙනුකරුවන් හට දැන් වීම ඩිජිටල් විසඳුම උපයෝගී කර ගනිමින් ඕනෑම ජංගම උපාංගයක් හරහා පියවර කිහිපයකින් ගෙවීම් සිදු කිරීමට, වෙළෙඳ ගිණුම් වෙත මුදල් යැවීමට මෙන්ම උපයෝජ්‍යතා බිල්පත් ගෙවීමටද හැකියාව ඇත.



මේ හරහා JustPay සේවාව මගින් සවිගැන්වීම ලබන එච්ඩීඑෆ්සී බැංකුවේ ගනුදෙනුකරුවන් හට වීම පද්ධතිය යටතේ ලියාපදිංචි වී ඇති ජංගම යෙදුම් 14 ක් සමග සම්බන්ධ විය හැක. ඒ අනුව, ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් ගිණුම්වල සිට ඍජුව මුදල් වෙළෙන්දෙකුගේ ගිණුමක් වෙත හෝ උපයෝජ්‍යතා සේවා සැපයුම්කරුවෙකු වෙත හෝ යොමු කිරීම තුළින් රු. 10,000 ක උපරිමයක් දක්වා සුළු පරිමාණ ගෙවීම් සිදු කළ හැක.

මෙය ගනුදෙනුකරුවන් සඳහා අතිශය තරගකාරී හා ප්‍රතිලාභ උදා කරන ඩිජිටල් ගෙවීම් විසඳුමක් බවට පත් කරමින් මෙම ජාලය වර්ධනය වනු ඇත යන්න එච්ඩීඑෆ්සී බැංකුවේ අපේක්ෂාවයි.

වෙබ් අඩවිය

2020 වසරේදී බැංකුවේ අන්තර්ජාල බැංකු පද්ධති අතුරු මුහුණතද ගනුදෙනුකරුවන්ගේ පහසුව තකා වැඩිදියුණු කරන ලද විශේෂාංග එකතු කරමින් දියුණු කරන ලදි. බැංකුවේ වෙබ් අඩවිය හරහා ගනුදෙනුකරුවන්ට තැන්පතු හා ණය, ශාඛා සහ ATM යන්තු පිහිටි ස්ථාන ආදී විස්තරාත්මක තොරතුරු සියල්ලම වෙත ප්‍රවේශ විය හැක. මීට අමතරව, අදාළ අයදුම්පත්‍ර, පොලී අනුපාතික සහ අන්තර්ජාල ඊ-බෑන්කින් පහසුකම වෙත ප්‍රවේශ වීමට අවස්ථාවද වීම වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

HDFC Click

'HDFC Click' ඊ-බැංකුකරණ වෙබ් අඩවිය තුළට මේ වන විට ඊ-බැංකුකරණ පහසුකම් සියල්ලම අන්තර්ගත කර ඇති අතර, ශාඛා වෙත ගමන් කිරීමකින් තොරව ගනුදෙනු කටයුතු සිදු කිරීමේ පූර්ණ පහසුව වීමගින් ගනුදෙනුකරුවන් වෙත ලැබේ. වීම පද්ධතිය ආශ්‍රිත සුරක්ෂිතතාව ඉහළ නැංවීම හා අමතර පහසුකම් ඊට එකතු කිරීම සඳහා මෙම අවකාශය 2020 දී තවදුරටත් දියුණු කරන ලදි. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී ඕනෑම බැංකුවක් වෙත අන්තර්ජාලය හරහා මුදල් යැවීම සඳහා පහසුකම් සලසමින් අප බැංකුව පොදු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචය නොහොත් 'සී ඊ එෆ් ටී එස්' ක්‍රමවේදය ක්‍රියාත්මක කළේය.



ගිණුම් ශේෂ පරීක්ෂා කිරීමේ සිට බිල්පත් ගෙවීම් හා අතීත ගනුදෙනු වෙත ප්‍රවේශ වීම ආදී සේවා රැසක් සඳහා දැන් HDFC Click ඊ-බැංකුකරණ අවකාශය මගින් පහසුකම් සැලසේ.

ගනුදෙනුකාර සහභාගීත්වය

අන්තර්ක්‍රියාකාරී මාධ්‍ය

සිත්ගන්නා සුළු ප්‍රවර්ධනාත්මක වීඩියෝ නිර්මාණය කිරීම වෙනුවෙන් එච්ඩීඑෆ්සී බැංකුව ප්‍රකට යූ ටියුබ් ශිල්පීන් දෙදෙනෙකු වන 'ජනයි ප්‍රියයි' සමග එක් විය.යූ ටියුබ් වීඩියෝ අවකාශයේ පළ කරන ලද එම වීඩියෝව සැලකිය යුතු ප්‍රේක්ෂක සංඛ්‍යාවක් විසින් නරඹා තිබේ.

මිහිර-එච්ඩිඑෆ්සී ළමා දින තරඟාවලිය

2020 ලෝක ළමා දින සැමරුමට සමගාමී වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව විසින් වයස අවුරුදු 11 ට අඩු දරුවන් සඳහා විශේෂ තරඟයක් පවත්වන ලදි.ඒ අනුව, හරස් පද ප්‍රහේලිකාවක් 'මිහිර' පුවත් පතෙහි පළ කරන ලද අතර කූපන් පතක් දිනා ගැනීම සඳහා ඊට පිළිතුරු යොමු කරන ලෙස කුඩා දරුවන්ට ඇරයුම් කරන ලදි. අප බැංකුව විසින් කුඩා දරුවන් වෙනුවෙන් ලබා දෙන ළමා ඉතුරුම් සේවාවෙහි සන්නාමය විමසා ලබා දුන් ඉඟියකට අමතරව, සාමාන්‍ය දැනීම් පිළිතුරු සඳහා ඉඟිද ඊට ඇතුළත් විය.



මිහිර ප්‍රහේලිකා තරඟයේ ජයග්‍රාහකයෝ

ලේක්හවුස් පරිශ්‍රයෙහි පැවැති දිනුම් ඇදීමකදී මෙහි ජයග්‍රාහකයන් තිදෙනෙකු සහ සැනසිලි ත්‍යාග දිනුම් ලැබූවන් 10 දෙනෙකු තෝරා ගන්නා ලද අතර බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙහි පැවැත්වූ උත්සවයකදී ඔවුන් හට ත්‍යාග ලබා දෙන ලදි. ජයග්‍රාහකයන් වෙත ත්‍යාග වශයෙන් බයිසිකල් ලබා දෙන ලදි.

ගනුදෙනුකරුවන් හට ලබා දුන් තිළිණ

බැංකුවේ සුළු පරිමාණ තැන්පතු රැස් කිරීම ඉහළ නැංවීමේ අරමුණක් වශයෙන් රු. මිලියන 1 ට වඩා වැඩි තැන්පතු සිදු කළ ගනුදෙනුකරුවන් වෙත රු. 5,000 ක වටිනාකමකින් යුතු මුදල් වවුචර ලබා දෙන ලදි. එයට ඉතාම සාධනීය ප්‍රතිචාරයක් ගනුදෙනුකරුවන් වෙතින් ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 වසරේදී බැංකුවේ සුළු පරිමාණ තැන්පතු කළඹ ආශ්‍රිතව 39% ක ඉහළ යාමක් දක්නට ලැබුණි.

ප්‍රචාරණ සහ සන්නාම ප්‍රවර්ධනයන

ක්ෂේත්‍ර ප්‍රවර්ධන

වසර ගණනාවක් පුරාවට දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය කරමින් සේවා හා තොරතුරු ලබා දීම සහ මූල්‍යමය අන්තර්ග්‍රාහීභාවය ඉහළ නැංවීම වෙනුවෙන් කැප වූ අපගේ ජංගම බැංකු නිලධාරීන් කෙරෙහි බැංකුව දැඩි විශ්වාසයක් තබා ඇත. 2020 වසරේදී තෝරාගත් ඇඟළුම් හා රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තශාලාවල සේවක පිරිස් හා ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන් වෙත ගමන් කිරීම තුළින් මූල්‍ය විසඳුම් කෙරෙහි සමාජ අවධානය යොමු කිරීම සඳහා අපගේ මෙම පුද්ගල කේන්ද්‍රීය ජංගම බැංකුකරණ ඒකකය නිරතුරුව කටයුතු කළේය.

ශාඛා ප්‍රවර්ධන කටයුතු

2020 සැප්තැම්බර් මාසයේදී අපගේ අනුරාධපුර ශාඛාව විසින් විශේෂ ප්‍රවර්ධනාත්මක වැඩසටහනක් දියත් කරන ලද අතර එය සඳහිරු සෑය පරිශ්‍රයෙහි ක්‍රියාත්මක කරන ලදි. එහිදී, ප්‍රාදේශීය කළමනාකාර, ශාඛා කළමනාකාර යන නිලධාරීන් සහ ශාඛා කාර්ය මණ්ඩලය විසින් නිලධාරීන් 300 ක් පමණ වෙත දැනුම්වත් කිරීමක් ලබා දෙන ලදි. එම දැනුම්වත් කිරීම ප්‍රධාන වශයෙන්ම සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස තබා ලබා ගන්නා ණය හා ඇපකරුවන් සහිත ණය ආදිය සම්බන්ධයෙන් සිදු කරන ලද අතර විශ්‍රාම රැකවරණය, ස්මාර්ට් ගෝල්ස් සහ ප්‍රතිලාභ ආදිය ඇතුළු ඉතුරුම් හා ආයෝජන සැලසුම් පිළිබඳවද දැනුම ව්‍යාප්ත කරන ලදි.

සේවක අර්ථසාධක අරමුදල මත පදනම් වූ සහ ඇපකරුවන් සහිත ණය පහසුකම් ප්‍රවර්ධනය කරමින් බැංකුවේ අලෙවිකරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් කාර්මික සේවා ස්ථාන කිහිපයකම පවත්වන ලද අතර, අනුරාධපුර හා මොණරාගල ශාඛාවල කාර්ය මණ්ඩල විසින් ඒ සඳහා අවශ්‍ය වූ බිම් මට්ටමේ විධිවිධාන සලසන ලදි.

බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන තවත් ප්‍රවර්ධන වැඩසටහන් වර්ගයක් වන්නේ වීටි පාදක ප්‍රවර්ධනයන් ය. 2020 වසරේදී මාතර, ගාල්ල සහ අම්බලන්ගොඩ ශාඛා විසින් එම ශාඛාවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වය ඇතිව එකී වැඩසටහන් පවත්වන ලදි.

අන්තර්ජාලය ආශ්‍රිත ප්‍රවර්ධන කටයුතු

ෆේස්බුක් සමාජ ජාලය තුළ පරිශීලක සහභාගීත්වය ඉහළ නැංවීමේ අරමුණින් 2020 ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරඟාවලිය අතරතුරදී ක්‍රිකට් ලෝලීන් ඉලක්ක කරගත් තරඟාවලියක් සංවිධානය කිරීමටද බැංකුව කටයුතු කළ අතර, එහි ජයග්‍රාහකයන් 103 දෙනෙකු වෙත ත්‍යාග වශයෙන් ජංගම දුරකතන රිලෝඩ් ලබා දෙන ලදි. එම තරඟයේ අරමුණ වූ ක්‍රිකට් තරඟාවලියේ ජයග්‍රාහී කණ්ඩායම නිවැරදිව අනුමාන කළ ක්‍රිකට් ලෝලීන් 7 දෙනෙකු වෙත බ්ලූටූත් ස්පීකර් සහ බ්ලූටූත් ඉයර්ෆෝන් ත්‍යාග වශයෙන් පිරිනමන ලදි.

ප්‍රාග්ධන වාර්තා

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

මාධ්‍ය සන්නිවේදන

බැංකුව විසින් ලබා දෙනු ලබන සේවා හා නිපැයුම් පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබා දීමේ අරමුණින් දිවයිනේ ප්‍රමුඛතම රූපවාහිනී නාලිකාවක ප්‍රවෘත්ති විකාශය අතරතුරදී රූපවාහිනී දැන්වීම් ප්‍රචාරය කිරීම වෙනුවෙන්ද අපි ආයෝජනය කළෙමු. මීට අමතරව, මාස හයක කාලයක් පුරාවට සෑම මාසයකදීම සතියක කාලයක් අලෙවි ප්‍රචාරණ කටයුතු සඳහා දිවයිනේ ප්‍රමුඛතම ගුවන් විදුලි නාලිකාවක කාර්යබහුල ගුවන් කාල යොදා ගැනීම සඳහාද බැංකුව ආයෝජන කරන ලදි.එමෙන්ම, අප බැංකුවේ මූල්‍ය නියැයුම් ප්‍රවර්ධනය කරමින් අපගේ සභාපතිනි වසන්ති මංචනායක මහත්මිය මෙරට ජනප්‍රිය තරුණ ගුවන් විදුලි නාලිකාවක සජීවී වැඩසටහනක් සඳහා ආරාධනා ලැබ සහභාගී වූවාය.

ප්‍රදර්ශන

මහජනතාව අතර අපගේ සේවා පිළිබඳ අවබෝධය පුළුල් කිරීමේ අරමුණින් සෑම වසරකදීම බැංකුව විවිධ ප්‍රදර්ශනවලට සහභාගී වෙයි. 2020 ඔක්තෝබර් මාසයේදී අපගේ බැංකුව බිල්ඩ් ශ්‍රී ලංකා නිවාස හා ඉදිකිරීම් ප්‍රදර්ශනයට සහභාගී විය. එහිදී බැංකුව විසින් පැවැත්වූ අලෙවි කුටිය වෙත 10,000 කට අධික පිරිසක් පැමිණියහ.



එච්ඩීඑෆ්සී බැංකුව බිල්ඩ් ශ්‍රී ලංකා නිවාස හා ඉදිකිරීම් ප්‍රදර්ශනයට සහභාගී විය.

ඇමතුම් මධ්‍යස්ථානය

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අපගේ ඇමතුම් මධ්‍යස්ථාන සේවාවන්ද වැඩිදියුණු කරන ලද අතර කාර්ය මණ්ඩලය වෙත අලුතින් ඇමතුම් මෙහෙයවන්නෙකු බඳවා ගන්නා ලදි. මෙම ඇමතුම් මධ්‍යස්ථානය හරහා සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ගනුදෙනුකරුවන්ට සහාය ලබා දේ.

ඉදිරිපෙළ හා පසුපෙළ මෙහෙයුම් නවීකරණය කිරීම සහ ඩිජිටල් අවකාශ ව්‍යාප්ත කිරීම සඳහා සිදු කෙරෙන ආයෝජනද ඉහළ නැංවීමට පියවර ගැනීමට නියමිතය.

2020 දී මුහුණ පෑ සීමා

පැවති වසංගත තත්ත්වය හා නියාමන පසුතලය හමුවේ සමස්ථයක් ලෙස රට හා විවිධ ආයතන පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක නොවූ බව නොරහසකි. අමතර ප්‍රවර්ධන සහ ප්‍රජා පාදක ක්‍රියාකාරකම් දියත් කිරීමේදී එච්ඩීඑෆ්සී බැංකුවටද එම තත්ත්වයටම මුහුණ පාන්නට සිදු විය. කෙසේ වෙතත්, මෙවැනි අභියෝග මධ්‍යයේ වුවද, ගනුදෙනුකරුවන් සියලුම දෙනා වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කරමින් ඇතැම් නවීකරණයන් සහ තොරතුරු තාක්ෂණය පාදක කරගත් උපායමාර්ග ඔස්සේ සිය ව්‍යාපාරික දිශාගත වීම නැවත සකසා ගැනීමට අප බැංකුව කටයුතු කළේය.

හවුල්කරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සැපයුම්කරුවන්

මෙහෙයුම් කෙෂ්ත්‍ර සියල්ලම පුරාවට එච්ඩීඑෆ්සී බැංකුව රක්ෂණ සේවා සැපයුම්කරුවන්, විකුණුම්කරුවන් හා තුන්වැනි පාර්ශ්වයේ සැපයුම්කරුවන් සමග සේවා සහ භාණ්ඩ යන දෙඅංශය වෙනුවෙන්ම එක්ව කටයුතු කරයි. ඒ අනුව 2020 වසරේදී අපගේ හවුල්කරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සැපයුම්කරුවන් වෙනුවෙන් රු. මිලියන 148 ක වටිනාකමක් නිර්මාණය කරන ලදි.

හවුල්කාරත්ව

රක්ෂණ

නිවාස ණය සහ කල්බදු පහසුකම් ලබා ගන්නා ගනුදෙනුකරුවන් වෙත රක්ෂණ සේවා ලබා දීම සඳහා එච්ඩීඑෆ්සී බැංකුව රක්ෂණ සමාගම් සමග හවුල්කාරත්වයන් ඇති කර ගැනීමට ඉදිරියටත් කටයුතු කරනු ඇත. ගනුදෙනුකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කරන අතරම සමාජ ප්‍රාග්ධනය වැඩි කර ගැනීමේ අරමුණු ද්විත්වයම සාක්ෂාත් කර ගැනීම සඳහා කදිම සහායක් මෙබඳු හවුල්කාරත්වයන් කෙරෙන් ලැබේ.

දේපල හිමිකම් රක්ෂණාවරණ ලබා දීම උදෙසා 2020 වසරේදී අප බැංකුව රක්ෂණ සේවා තැරැව්කාර සමාගමක් සමග එක් විය. ගනුදෙනුකරුවන්ට දැන් නිවාස ණයක් හෝ කල්බදු පහසුකමක් ලබා ගැනීමට පෙර රක්ෂණාවරණයක් ලබා ගැනීම උදෙසා රක්ෂණකරුවෙකු වෙත භෞතිකව ගමන් කිරීමේ අපහසුව විඳීමෙන් තොරව එම කටයුත්ත බැංකුව හරහාම ඉටු කර ගත හැකි වේ. ගනුදෙනුකරුවන් ලබා ගන්නා ණය මුදල් සඳහා ආරක්ෂණයක් ලෙස ක්‍රියා කරන එවැනි රක්ෂණ ප්‍රතිපත්ති හේතුවෙන් දේපල හිමිකම් ආශ්‍රිත විවිධ අක්‍රමිකතා සහ සාවද්‍යතා හමුවේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සිදු වේ.

අගය වැකතු කළ සේවා ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් වශයෙන් 2019 වසරේදී උකස් දේපලවලට අදාළව ගිනි හා ස්වභාවික විපත් රක්ෂණ පහසුකමක් ගනුදෙනුකරුවන් හට ලබා දීම සඳහා පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම සමග අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ. එච්ඩිඑෆ්සී බැංකුවේ ගනුදෙනුකාර භවතුන්ට දැන් තම දේපල ගිනි ආපදාවලින්, අකුණු ගැසීම්වලින්, ගංවතුර, කුණාටු, භූමි කම්පා සහ සුනාමි ව්‍යසනවලින් සහ අනෙකුත් ස්භාවික විපත්වලින් ආරක්ෂා කෙරෙන රක්ෂණාවරණයක් පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙතින් ලබා ගැනීමට අවකාශ තිබේ.

අවබෝධතා ගිවිසුම් සහ සේවා ගිවිසුම් හරහා අනෙකුත් රක්ෂණ සේවා සැපයුම්කරුවන් සමගද සබඳතා ඇති කර ගැනීමේ සැලැස්මක් අප බැංකුව සතුව ඇත. ගනුදෙනුකරුවන් වෙත අමතර වටිනාකමක් නිර්මාණය කිරීම සහ බැංකුවේ වෙළෙඳපොල තරගකාරීත්වය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ලබා දෙන තරගකාරී ප්‍රතිලාභ මත පදනම්ව එකී රක්ෂණ හවුල්කරුවන් තෝරා ගැනෙනු ඇත.

රාජ්‍ය ආයතන

ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් දැනුම්වත්භාවය වැඩි කිරීමේ වැඩසටහන් සකස් කිරීම උදෙසා බැංකුව සෑම වසරකදීම විවිධ ආයතන සමග හවුලේ කටයුතු කරයි. සම් නිෂ්පාදන හා පාවහන් නිෂ්පාදනයෙහි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත අදාළ මූල්‍ය පහසුකම් ක්‍රම සහ ව්‍යවසායික සංවර්ධනය පිළිබඳ තොරතුරු ලබා දීමේ අරමුණින් අප බැංකුව 2020 වසරේදී කාර්මික සංවර්ධන මණ්ඩලය සමග හවුල්කාරත්වයක් ඇති කර ගත්තේය.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත සහාය දැක්වීම උදෙසා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ බැංකුව අතර හවුල්කාරත්වයක් ඒ අනුව පිහිටුවීමට පියවර ගන්නා ලදි. ඊට අදාළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍ය සහාය ලබා දීම තුළින් ඒවාට අදාළ බැංකුවේ ණය කළඹ ඉහළ නැංවීම සඳහා අවබෝධතා ගිවිසුමක් ක්‍රියාවේ යෙදවීමට එකඟතාවකට එළැඹිණ.

එපරිද්දෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා තිබුණු 7% සහන ණය අනුපාතිකය සැලකිල්ලට ගනිමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නිවාස මිල දී ගැනීමට අදහස් කරන පුද්ගලයන් වෙත සහනශීලී කොන්දේසි යටතේ ණය ලබා දීම උදෙසා එකී ආයතන දෙක සමගද බැංකුව හවුල් විය.

සැපයුම්කරුවන්

2020 දෙසැම්බර් මාසය වන විට විවිධ භාණ්ඩ හා සේවා ලබා දීමෙහි නිරත සහ බැංකුවේ ලියාපදිංචිව සිටි සැපයුම්කරුවන් 323 ක ජාලයක් බැංකුව සතුව පැවතිණ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය

බැංකුව කටයුතු කරන වෙළෙන්දන් සහ සැපයුම්කරුවන් තෝරා ගනු ලබන්නේ එකී සැපයුම්කරුවන් සියලුම දෙනා විසින් ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් ලබා දීම අවශ්‍ය වන විධිමත් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මත පදනම් වෙමිනි. සුරක්ෂිතතාව, නඩත්තුව සහ සනීපාරක්ෂාවට අදාළව බැංකුව ලබා ගන්නා සේවාවන්ට අමතරව, එකී පාර්ශ්ව විසින් කාර්යාල භාණ්ඩ ආදිය, තොරතුරු තාක්ෂණික දෘඩාංග, කාර්යාල ලිපිද්‍රව්‍ය සහ අදාළ යන්ත්‍රෝපකරණ බැංකුව වෙත ලබා දිය යුතු වේ. වසර ගණනාවක් පුරාවට මෙන්ම 2020 වසරේදීද සැපයුම්කරුවන්ගේ කැපවීමට ගරු කරමින් සහ සෑම සේවා සම්පාදකයෙකුම සමඟින් සුහදශීලී සබඳතා පවත්වා ගනිමින් ඔවුන් හා සුපැහැදිලි සන්නිවේදනයන් සිදු කිරීමටද බැංකුව පියවර ගෙන තිබේ.

2020 වසරේදී බැංකුව POS ගනුදෙනු සිදු කිරීමට හැකි වන පරිදි සිය ප්‍රධාන බැංකු පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ඊ-බැංකුකරණ අවකාශය හා බැංකුවේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සේවා සැපයුම්කරුවන් සමග එක්ව කටයුතු කර තිබේ.

නව ඩිජිටල් නිෂ්පාදන, කාඩ්පත් පාදක මූල්‍ය උපකරණ, ජංගම යෙදුම් හා වැඩිදියුණු කරන ලද ඊ-බෑන්කින් සේවා ආදිය වෙනුවෙන් ආයෝජනය කිරීමට බැංකුවේ ඉලක්කය වෙයි.

ප්‍රාග්ධන වාර්තා

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

හවුල්කාර සබඳතා

එච්ඩීඩබ්ලිසී බැංකුව සෑම විටම සිය හවුල්කරුවන් සහ සේවා සැපයුම්කරුවන් සමග සුහදශීලී සබඳතා පැවැත්වීමට වගබලා ගනියි. නිපැයුම් හා සේවා ලබා ගැනීම මත පමණක් නොව, බැංකුව විසින් ලබා දෙන මූල්‍ය විසඳුම් සම්බන්ධයෙන් ඉලක්ක පුද්ගල කාණ්ඩ දැනුම්වත් කිරීම උදෙසා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන සමග සහභාගීව කටයුතු කිරීම මතද අපගේ හවුල්කාරත්වයන් පදනම්ව තිබේ.

එච්ඩීඩබ්ලිසී බැංකුව සේවා ලබා ගැනීමේදී සැපයුම්කරුවන් සහ අනෙකුත් තුන්වැනි පාර්ශ්වයේ සේවා සම්පාදකයන් සමග විධිමත් සන්නිවේදනයන් සිදු කරයි. ඕනෑම සැපයුම්කරුවෙකු හෝ සේවා සම්පාදකයෙකු තෝරා ගැනීමට ප්‍රථමයෙන් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් අනුගමනය කෙරෙන අතර එකී කටයුතු ඉතාම විධිමත් හා විනිවිදභාවයකින් යුතු අයුරින් සිදු කෙරේ.

ප්‍රජාවන්

වසර ගණනාවක් පුරාවට අපගේ බැංකුව තමන් කටයුතු කරන ප්‍රජාවන් වෙනුවෙන් දක්වන දායකත්වය ඉහළ නැංවීම සඳහා සුවිශේෂී විධිවිධාන අනුගමනය කර තිබේ. 1984 වසරේ සිට මේ දක්වා ගත වූ වසර 37 ක කාලය පුරාවටම මූල්‍යමය අභියෝගයන්ට මුහුණ පාන ජනතාව සවිබල ගැන්වීම අපගේ සේවා සියල්ලටම ප්‍රමුඛ වන හා නිපැයුම් සංවර්ධනයන් පසුපස ඇති මෙහෙවර ලෙස නොනැසී පවතී.

නිවාස හා ව්‍යවසායික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් අඩු-මධ්‍ය ආදායම්ලාභීන්, කාර්මික අංශ, කුඩා ව්‍යාපාර හිමි ප්‍රජා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආශ්‍රිත ගනුදෙනුකරුවන්ගේ නිවාස හා ව්‍යාපාරික අවශ්‍යතා වෙනුවෙන් ණය ලබා දීම තුළින් අප බැංකුව ඔවුන්ගේ ප්‍රගතිය වෙනුවෙන් විශේෂ කැපවීමකින් කටයුතු කරයි. ප්‍රජා කර්මාන්ත සහ ආර්ථිකයේ සුළු පරිමාණ වෙළෙඳ අංශ දියුණු කිරීම සඳහා ප්‍රයත්න දැරීම තුළින් මෙරට අඩු වරප්‍රසාදලාභී ජන ප්‍රජාවන් නගා සිටුවීමේ පුරෝගාමියෙකු වශයෙන් එච්ඩීඩබ්ලිසී බැංකුව කටයුතු කරයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ හවුල් වැඩසටහන

එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින සම්භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය සමග අත්වැල් බැඳගත් එච්ඩීඩබ්ලිසී බැංකුව සිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සහ අනෙකුත් ණය නිෂ්පාදන සම්බන්ධ අවබෝධය පුළුල් කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. රටේ විවිධ ප්‍රදේශවල සම් භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් කර්මාන්තයේ නිරත වී සිටි ව්‍යවසායකයන් 125 දෙනෙකු වෙනුවෙන් එය පැවැත්විණ. මෙම වැඩසටහන පවත්වන ලද්දේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් සංවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රයෙහිදීය.



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායිකයන් අතර සිය විසඳුම් ප්‍රවර්ධන කිරීම උදෙසා එච්ඩීඩබ්ලිසී බැංකුව කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්ව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ 'සෞභාග්‍ය' සහ 'ස්වශක්ති' වැනි ණය යෝජනා ක්‍රම පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා එච්ඩීඩබ්ලිසී බැංකුවේ ආයතනික සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව පියවර ගත්තේය. එහි කොටසක් ලෙස එකී ණය යෝජනා ක්‍රම පිළිබඳ සවිස්තර ඉදිරිපත් කිරීම් ඔස්සේ තොරතුරු බෙදා හරින ලදි. එම වැඩසටහනට සහභාගී වූවන් තමන්ට වැදගත් කරුණු මතු කළ විට ඒවා සාකච්ඡාවට බඳුන් කොට අදාළ ශාඛා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කරමින් අන්තර්ක්‍රියාකාරී ස්වරූපයකින් එය පවත්වන ලදි. ණය සඳහා වූ ස්වකීය ඉල්ලීම් තමන්ට ආසන්නතම ප්‍රදේශයක පිහිටි ඕනෑම ශාඛාවක් වෙත ඉදිරිපත් කරන ලෙස එයට සහභාගී වූවන් හට දැනුම් දෙන ලදි.

සංවර්ධන ව්‍යාපෘති

එච්ඩීඩබ්ලිසී බැංකුව International Executive Service Corps සංවිධායන සමග අත්වැල් බඳගන්නා ලදි.

තාක්ෂණික සහාය සහ පුහුණු වැඩසටහන් ලබා දීමේ ප්‍රයත්නයක් වශයෙන් එම සංවිධානය, එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වූ 'Market Oriented Dairy' වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. 2019 වසරේදී කුඩා ව්‍යාපාරික කිරි ගොවීන්ගේ තිරසාර වර්ධනයට මංපෙත් විවර කරමින් එච්ඩීඩබ්ලිසී බැංකුව දේශීය කිරි නිෂ්පාදන කර්මාන්තයට සහාය වීම සඳහා ඉහත කී ෂ්ෂ සංවිධානය සමග එක් විය.

Market Oriented Dairy' වැඩසටහන ක්‍රියාත්මක වන්නේ කිරි නිෂ්පාදන වටිනාකම් දාමය තුළ ඵලදායීතාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම තුළින් නැවුම් එළකිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරි කරගෙනය. කිරි නිෂ්පාදනය හා එහි ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහ අලෙවිකරුවන්ගේ සහ මිල දී ගන්නා පුද්ගලයන්ගේ දායකත්වයද ඒ වෙනුවෙන් ලබා ගැනීම උදෙසා යෙදවුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ නව තාක්ෂණයන් හඳුන්වා දීම සඳහාද මෙම ව්‍යාපෘතිය සහාය වනු ඇත.

ආයතනික සමාජ මෙහෙවර ක්‍රියාදාම - "ඉටුකම" අරමුදල වෙනුවෙන් සේවක මණ්ඩලය ලබා දුන් පරිත්‍යාග

කාරුණිකත්වය සහ ත්‍යාගශීලී ගුණධර්ම පතුරුවා හැරීමේ කාලීන අවශ්‍යතාව පෙරටත් වඩා ඉස්මතු වූ ගෝලීය වසංගත තත්ත්වය හමුවේ අතිගරු ජනාධිපතිතුමා විසින් පිහිටුවන ලද 'ඉටුකම' කෝවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල වෙත එච්ඩිඑෆ්සී බැංකුවේ කාර්ය මණ්ඩලය සිය දිනක වැටුප පරිත්‍යාග කරමින් දායකත්වය ලබා දෙන ලදි. ඒ අනුව රු මිලියන 1.2 ක මුදලක් එකතු කර ගැනීමට අපගේ සේවකයන් සමත් වූ අතර එම මුදල ඉටුකම ගිණුමෙහි තැන්පත් කරන ලදි.



කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමදල වෙත පරිත්‍යාග

නියාමන අධිකාරීන්

නියාමන අධිකාරීන් සමග පැවැත්විය යුතු සබඳතාව බැංකුව සිය මෙහෙයුම්වලට ඒකාබද්ධ වී ඇති කොටසක් ලෙස සලකා කටයුතු කළේය. මූල්‍ය ආයතනයක් වශයෙන් බැංකුවේ කටයුතු සිදු විය යුතු ආකාරය කෙරෙමි සැලකිය යුතු බලපෑමක් එල්ල කිරීමට නියාමන අධිකාරීන්ට හැකියාව ඇති අතර මේ නිසා, එච්ඩිඑෆ්සී බැංකුව අන්‍යොන්‍ය විශ්වාසය හා සහයෝගීතාව මත පදනම්ව ඒ සෑම ආයතනයක් සමගම සහයෝගයෙන් ක්‍රියා කරයි. විනිවිදභාවයෙන් සහ සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම කෙරෙහි සමාජයේ ජනතාව සහ පාර්ශ්වකරුවන් අතර වැඩි වැඩියෙන් ඉල්ලුමක් පවතින පසුබිමක් තුළ හොඳම ආයතනික චර්යාවන් සහ මූල්‍ය කළමනාකරණ පරිචයන් පවත්වා ගැනීම පිණිස සුපැහැදිලි මගපෙන්වීමක් නියාමන අධිකාරීන් සමග අප පවත්වන සබඳතා වෙතින් ලැබේ.

විනිවිදභාවයෙන් සහ සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම කෙරෙහි සමාජයේ ජනතාව සහ පාර්ශ්වකරුවන් අතර වැඩි වැඩියෙන් ඉල්ලුමක් පවතින පසුබිමක් තුළ හොඳම ආයතනික චර්යාවන් සහ මූල්‍ය කළමනාකරණ පරිචයන් පවත්වා ගැනීම පිණිස සුපැහැදිලි මගපෙන්වීමක් නියාමන අධිකාරීන් සමග අප පවත්වන සබඳතා වෙතින් ලැබේ.



අවසාන ප්‍රතිඵලය ලෙස තිරසාර ව්‍යාපාරික වර්ධනය පෝෂණය කරන අවදානම් කළමනාකරණ සංස්කෘතියක් අනුගමනය කිරීම සඳහා නිසි දිශානතිය නියාමකයන් විසින් බැංකුවෙ වෙත සැපයේ. නියාමන අධිකාරීන් සමග පවතින සබඳතා සවිමත් කර ගැනීමේදී බැංකුව විසින් ලබා දිය යුතු තොරතුරු සම්බන්ධයෙන් අනලස් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් නිසි කලට තොරතුරු හෙළිදරවු කිරීම්, කාලික විගණනයන් සහ නිරන්තර වාර්තාකරණයන් සිදු කිරීමට බැංකුව කටයුතු කරයි.

මානව ප්‍රාග්ධනය



ජනතාව නගා සිටුවීම සහ සවිබල ගැන්වීම

බැංකුවේ දෛනික මෙහෙයුම්වලට ඔබින පරිදි එහි උපායමාර්ගික අරමුණු හා මෙහෙයුම් අරමුණු හැඩගස්වනු ලබන උපස්ථම්භකය වන්නේ අපගේ සේවක මණ්ඩලයයි. මානව ප්‍රාග්ධනය වශයෙන් අප නිරතුරුවම සලකනු ලබන්නේ බැංකුවේ සේවකයන් සතු දැනුම, පළපුරුද්ද, නිපුණතා සහ නිර්මාණාත්මක චින්තනය වන අතර එමගින් නිසැක වශයෙන්ම අප ලබා දෙන සේවා සහ පවත්වා ගනු ලැබෙන සබඳතා වෙත ඉහළ වටිනාකමක් එකතු කෙරේ. සේවක මහත්ම මහත්මීන්ගේ ජීවිත සහ අභිප්‍රේරණය නගා සිටුවීම සම්බන්ධයෙන් බැංකුව සේවා යෝජකයෙකු වශයෙන් අති විශිෂ්ට කාර්යභාරයක් ඉටු කරයි.

2020 වූ කලී බැංකු කාර්ය මණ්ඩලයේ දැඩි නම්‍යශීලීතාව මෙන්ම ගනුදෙනුකරුවන්ට සේවා ලබා දීම සම්බන්ධයෙන් ඔවුන් පළ කළ ඉහළ කැපවීමද මනාව පිළිබිඹු කළ අති සුවිශේෂී වසරකි. දිවයින පුරාම මෙන්ම විශේෂයෙන්ම බැංකු ක්ෂේත්‍රය තුළ සේවා සහ මෙහෙයුම් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඩාළ වීමත් සමගම වසංගත කාල අතරතුර, ඉන් පසුව මෙන්ම රට වසා දමා තිබුණු කාලවලදී බැංකුවේ සේවකයෝ අති බහුතරය අතිශයින්ම කැපවීමෙන් කටයුතු කළහ.

බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව අපගේ මානව සම්පත් පාදක උපායමාර්ගික ක්‍රියාමාර්ගයන්හි පදනම ලෙස රැඳී තිබේ. එහි සේවක මණ්ඩලය ප්‍රකට කරන සාමූහික පළපුරුද්ද හා වෘත්තීමයභාවය හේතුවෙන් වසංගත තත්ත්වය නිසා උද්ගත වූ පෙර නොවූවිරූ අභියෝගද ඇතුළත් බොහෝ බාධක ජයගෙන බැංකුව පෙරමුණ කරා රැගෙන යාමට දායක වී තිබෙන බව කිව යුතුය.

2020 වසරේදී මුහුණ පාන්නට සිදු වූ අසාමාන්‍ය තත්ත්ව හමුවේ නොසැලී ඉදිරියට ගමන් කරන අතරම වසංගත තත්ත්වයට පෙරාතුව සැලසුම් කර තිබුණු විවිධ ක්‍රියාදාම ක්‍රියාත්මක කිරීමටද අපගේ මානව සම්පත් දෙපාර්තමේන්තුව සාර්ථකව කටයුතු කර ඇත.සේවක මණ්ඩලයේ වර්ධනයට සහාය වීම සඳහා අපගේ මානව සම්පත් දෙපාර්තමේන්තුව සෑම වසරකදීම ප්‍රමුඛ ක්ෂේත්‍ර කිහිපයක් වෙත අවධානය යොමු කරයි. මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව, පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්ති, සේවක ප්‍රතිලාභ හා ගෙවීම් සහ ඔවුන් සඳහා වූ පිළිගැනීම ආදිය ආශ්‍රිත වෙනස්කම් හා සමාලෝචනයන් ආදිය ඊට ඇතුළත් වේ. 2020 මානව සම්පත් දින දර්ශනයේ හඳුනාගත හැකි ඉතාම වැදගත් කාරණා අතරින් එකක් වූයේ අභිනව කාර්යසාධනය ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දීමයි.

එච්ඩිඑෆ්සී බැංකුවේ සේවකයන් - බැඳියාවේ පුරුක්

අපගේ පොදු ඉලක්ක සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් නිරන්තර සේවයට කැපවීමෙන් ප්‍රධාන කාර්යාලය සහ 39 ක් වූ බැංකුවේ ශාඛා ජාලය හා සම්බන්ධව සේවය කරන සමස්ථ සේවක සංඛ්‍යාව 633 ක් වන අතර, ඔවුන් අතරින් 403 ක් පිරිමි සේවකයන්ද 230 ක් කාන්තා සේවිකාවන්ද වේ. මෙම සංඛ්‍යා සමස්ථයක් ලෙස ගත් විට බැංකු සේවක මණ්ඩලයේ කාන්තා, පිරිමි අනුපාතය 64:36 ක් වේ.

ස්ථිර සේවකයන් (සංඛ්‍යා)

පිරිමි		කාන්තා	
2019	2020	2019	2020
309	308	230	221

පරිවාස සේවකයන් (සංඛ්‍යා)

පිරිමි		කාන්තා	
2019	2020	2019	2020
12	2	2	4

කොන්ත්‍රාත් සේවකයන් (සංඛ්‍ය

පිරිමි		කාන්තා	
2019	2020	2019	2020
54	64	08	05

පුහුණු සේවකයන් (සංඛ්‍යා)

පිරිමි		කාන්තා	
2019	2020	2019	2020
31	19	01	-

බැංකුවේ සේවය නිරත වන කාන්තා සේවිකාවන් 230 අතරින් 221 දෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්තව සිටින අතර මෙය සමස්ථ කාන්තා සේවිකාවන්ගෙන් 96% ක ප්‍රතිශතයකි. එමෙන්ම, බැංකුවේ සමස්ථ පිරිමි සේවක මණ්ඩලයෙන් ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්තව සේවය කරන්නේ 76% ක් පමණි.

අපගේ ශ්‍රම බලකාය දෙස සමීප නිරීක්ෂණයක් සිදු කිරීමේදී පෙන්නුම් කරන්නේ විධායක මට්ටමේ තනතුරු, ජ්‍යෙෂ්ඨ හා ඉහළ කළමනාකාරීත්වයේ තනතුරු ආදියෙන් 53% ක් ම දරනු ලබන්නේ කාන්තා සේවිකාවන් විසින් වන අතර ඔවුහු බැංකුව පුරාවට කළමනාකරණ සහ විධායක මට්ටම්වල වගකීම් රාශියක් වෙනුවෙන් පෙරමුණ ගෙන කටයුතු කරති.

සංයුතිය



රැකියා කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂභාවය ඇසුරින් මුළු සේවක සංඛ්‍යාව:

	2020		2019		2018	
කාණ්ඩය	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා
ආයතනික කළමනාකාරීත්වය	8	3	9	4	8	4
ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු	9	17	4	8	6	7
ප්‍රාදේශීය කළමනාකාරවරු	5		-	5	-	6
විධායක කාර්ය මණ්ඩලය	127	152	83	115	85	117
විධායක නොවන කාර්ය මණ්ඩලය	148	57	171	110	168	110
ව්‍යාපාර ප්‍රවර්ධන සහකාරවරු	12	1	46	3	46	3
කණිෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන සහකාරවරු	22	-	22	-	25	-
ව්‍යාපාර ප්‍රවර්ධන අභ්‍යාසලාභීන්	27	-	31	1	53	1
ජංගම බැංකු සහකාරවරු	45	-	35	-	-	-
එකතුව	403	230	406	241	397	243

ප්‍රාග්ධන වාර්තා

මානව ප්‍රාග්ධනය

සේවකයින් රැඳී සිටීමේ ඉහළ මට්ටම

බැංකුවේ සේවකයින් සේවයේ රැඳී සිටීමේ අනුපාතිකය ඉහළ මට්ටමක පවතින අතර 2020 වසරේදී එය 97.4% ක් ලෙස වාර්තා විය. මීට අමතරව, සේවකයින් බැංකුවේ අඛණ්ඩව රැඳී සිටීමේ සේවා කාල සාමාන්‍යය වසර 12 ඉක්මවමින් වාර්තා වන අතර සේවක සංවර්ධනය සහ යහපැවැත්ම වෙනුවෙන් බැංකුව විසින් අනුගමනය කරනු ලැබෙන සුභවාදී ක්‍රියාමාර්ගයන්හි සාධනීය බලපෑම පිළිබිඹු කෙරෙන විය බැංකුවට දැනවන්නේ අභිමානයකි. සේවකයින් සඳහා උසස්වීම් හා පිළිගැනීමක් ලබා දීම සහ ඉහළ කාර්යසාධනයන් ප්‍රකට කරන සේවකයන් සඳහා පාරිතෝෂික ලබා දීම ආදී වශයෙන් වූ සේවකයින් ඉවත්ව යාම් අවම කිරීමේ විධිවිධානවල ප්‍රතිඵලයක් වශයෙන් 2019 වසරේදී 6.40 අනුපාතය සහිතව පැවැති සේවක පිරිවැටුප 2020 දී 4.36 දක්වා අඩු කර ගැනීමට අපට හැකි වී තිබේ.

633
සේවකයින්

97.4%
රැඳී සිටීමේ අනුපාතිකය

සේවකයින් රැඳී සිටීමේ අනුපාතිකය



විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්

ජනතාව පාදක කරගත් මූල්‍ය ආයතනයක් වීමේ මුඛ්‍ය ප්‍රතිශ්ඨාව ගුරුකොට ගත් එච්ඩීඑෆ්සී බැංකුව ක්‍රියාත්මක වන්නේ විවිධත්වයෙන් යුතු සේවක කණ්ඩායමක් හරහා ය.

බැංකුවේ හිමිකාරත්වය රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයම කෙරෙන් ජනනය වූවක් වීම මගින්ද අපගේ සේවක මණ්ඩලය කටයුතු කරන ආකාරය කෙරෙහි ඵලදායී බලපෑමක් ඇති වේ. මෙම මිශ්‍ර අනන්‍යතාවෙහි ප්‍රතිඵලයක් වශයෙන්, නවීකරණය සඳහා වූ ගාමක අභිප්‍රේරණය පවත්වා ගන්නා අතරම සහ වෙළෙඳපොල තුළ තරගකාරීව රැඳී විටින අතරම එච්ඩීඑෆ්සී බැංකුවේ සේවකයන්ට ස්ථායීතාව හා රැකියා සුරක්ෂිතාව පිළිබඳ අත්දැකීමක් විඳීමටද අපි ඉඩකඩ විවර කර ඇත්තෙමු.

සේවා කාල අනුව සේවකයින්



එච්ඩීඑෆ්සී බැංකුවේ සේවක මණ්ඩලය නියෝජනය කරනු ලබන්නේ විවිධ වයස් හා ජන විකාශනයන් නිරූපණය කරන පුද්ගලයන්ගේ එකතුවකිනි. අපගේ සේවකයන් අතරින් 53% ක් 18-35 වසය් කාණ්ඩයට අයත් වන අතර, 47% ක් වයස අවු. 36 ඉක්මවූ සේවකයන් වේ. දශක ගණනාවක පළපුරුද්දෙන් පොහොසක් සේවකයින් 27% ක් පමණ එච්ඩීඑෆ්සී බැංකුවේ සිටීමද සැලකිය යුතු කරුණකි. විවිධත්වයෙන් යුතු පරම්පරා රැසක් නියෝජනය කරන මෙම සේවක සංයුතිය නිසා අප බැංකුව වෙත අත්දැකීම්, අදහස් හා දැනුම් සම්භාරයක් ගලා විත තිබේ.

වයස අනුව සේවකයන් - 2020



ප්‍රතිපත්ති රාමුව

සේවකයින්ගේ වර්ධනය ඉලක්ක කරගත් වටිනාකමක් නිර්මාණය කිරීම සහ බැංකුවේ වර්ධනය උදෙසා හැකි උපරිම සේවා දායකත්වයක් ඔවුන්ගෙන් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු වූ මනා සමබරතාවකින් යුතු ප්‍රතිපත්ති මාලාවක් එච්ඩීඑෆ්සී බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වේ. සේවකයන්ගේ මෙන්ම ආයතනයේදී වර්ධනය කෙරෙහි හිතකර දායකත්වයක් ලැබෙන පරිසි එකී ප්‍රතිපත්ති සේවක මණ්ඩලයේ වර්ධන අපේක්ෂා මෙන්ම බැංකුවේ මෙහෙයුම් ඉලක්ක හා අරමුණුවලටද ගැලපෙන පරිදි බැංකුව නිරතුරුවම ඒවා සමාලෝචනය කරමින් යාවත්කාල කරයි.

සේවකයන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ වෘත්තීය දියුණුව

එච්ඩිඑෆ්සී බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා සේවකයන් බඳවා ගැනීම ඉහළ ගොස් ඇත්තේ තරමක අඩු ශීඝ්‍රතාවයකින් වුවද ස්ථිරසාර ලෙස වන අතර බැංකුව හමුවේ පවතින අඩු සේවක පිරිවැටුප මීට හේතුවක් ලෙස දැක්විය හැක.

පුරප්පාඩු ඇති වන විට ඒ සඳහා සේවකයන් බඳවා ගැනීම උදෙසා අදාළ තනතුරුවලට වඩාත් සුදුසුම පුද්ගලයන් බඳවා ගැනීම පිණිස ඉතාම විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් පවත්වා ගනිමින් පැහැදිලි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් අප බැංකුව අනුගමනය කරයි.

බැංකුව මෙම ක්‍රියාවලිය ආරම්භ කරන්නේ අභ්‍යන්තර චක්‍රලේඛයක් හරහා බැංකුව ඇතුළතම අදාළ පුරප්පාඩුව පිළිබඳව දැනුම්වත් කරමිනි. බැංකුව අභ්‍යන්තරයෙන් සුදුසු අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් බාහිරින් සේවකයන් බඳවා ගැනීම සඳහා පුවත් පත් සහ වෙබ් අඩවිවල දැන්වීම් පළ කරනු ලැබේ. 2020 වසරේදී බැංකුවේ සේවක මණ්ඩලය වෙත අලුතින් සාමාජිකයන් 17 දෙනෙකු බඳවා ගන්නා ලදි.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුවේ සේවක මණ්ඩලය වෙත හොඳම සේවකයන් හඳුනා ගැනීම සහ බඳවා ගැනීම සඳහා සේවකයින් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදි. පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා අභ්‍යන්තර වශයෙන් හොඳම සුදුස්සන් හඳුනා ගැනීම සහ බාහිරින් සේවකයන් බඳවා ගැනීම සඳහා හොඳම සුදුස්සන් තෝරාගැනීමද මීට ඇතුළත් විය.

2020 වසරේදී එච්ඩිඑෆ්සී බැංකුවේ සේවකයන් 367 දෙනෙකු සඳහා උසස් වීම් ලබා දෙන ලද අතර, එම සංඛ්‍යාව බැංකුවේ සමස්ථ සේවක සංඛ්‍යාවෙන් 58% ක් නියෝජනය කරයි. සේවකයන් අතර ඉහළ පළිගැනීමක් දිනා ගත් මෙම ක්‍රියාදාමය දියත් කෙරුණේ වසර හයකට පසුව ය. බැංකුව විසින් 2020 වසරේදී අභිනවයෙන් ක්‍රියාත්මක කරන ලද සේවක උසස් වීම් ප්‍රතිපත්තිය හරහා එය සිදු කෙරිණ. මේ යටතේ ප්‍රධාන කාර්යාලයේ සේවකයන් 109 ක් ද ශාඛාවල සේවකයන් 258 ක් ද උසස් කරන ලදි.



ප්‍රාග්ධන වාර්තා

මානව ප්‍රාග්ධනය

2020 දී ලබා දුන් උසස් වීම්		
	ප්‍රධාන කාර්යාලය	ශාඛා
ආයතනික කළමනාකාරිත්වය	9	-
ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු	13	1
ප්‍රාදේශීය කළමනාකාරවරු	-	2
ශාඛා කළමනාකාරවරු	-	30
විධායක කාර්ය මණ්ඩලය	69	108
විධායක නොවන කාර්ය මණ්ඩලය	18	117
එකතුව	109	258

අනුප්‍රාප්තික සැලසුම්කරණය

සේවක අනුප්‍රාප්තික සැලසුම්කරණය යනු මානව සම්පත් දෙපාර්තමේන්තුව ප්‍රමුඛ අවධානයක් යොමු කරන කාර්යභාරයකි. විශේෂයෙන්ම කළමනාකරණ සේවක ශ්‍රේණිවලට අයත් ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා නිසි දැනුම හා තරඟකාරිත්වය සහිත අයදුම්කරුවන් පත් කරනු ලැබෙන බව වීමගින් සහතික කෙරේ. මෙහි සමාලෝචිත වසර තුළ අනුප්‍රාප්තික ප්‍රතිපත්තියෙහි කිසිදු වෙනසක් සිදු නොකරන ලද නමුදු 2021 වසරේදී එය සමාලෝචනය කෙරෙනු ඇත.2021

සේවකයින් පුහුණු කිරීම, සංවර්ධනය සහ සවිබල ගැන්වීම

සේවකයින් පුහුණු කිරීම මගින් ඔවුන් සවිබල ගැන්වීම කෙරෙහි විල්ල වන ප්‍රත්‍යක්ෂ බලපෑම විච්ඩිවිෆ්සී බැංකුව මනාව අවබෝධ කරගෙන සිටියි. පුහුණු වැඩසටහන් හේතුවෙන් සේවකයින් සතු තාක්ෂණික දැනුම හා වෘත්තීය ශක්‍යතා තීව්‍ර වනවා පමණක් නොව, සාමාන්‍ය රාජකාරීන්ගෙන් පරිබාහිරව ඔවුන් සමග එක්ව කටයුතු කිරීම සඳහා වීමගින් ලැබෙන වටිනාකමද සුළු කොට තැකිය නොහැක.

මෙහි සලකා බැලෙන මූල්‍ය වර්ෂය තුළදී විවිධ මෙහෙයුම්, තාක්ෂණික සහ විකුණුම් පාදක ක්ෂේත්‍ර රැසක් ආවරණය කරමින් බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩසටහන් 42 ක් පවත්වන ලදි.

මෙවන් පුහුණු වැඩසටහන්වලට පමණක් සීමා නොවූ බැංකුව සිය කාර්යභාරයන් සියල්ලම ආශ්‍රිතව සේවකයින් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින් තවත් ක්‍රියාදාම රැසක්ම දියත් කර ඇත. සේවකයන් සෑම ක්ෂේත්‍රයකම ප්‍රවීණතාවෙන් යුතු බහු-නිපුණතා සහිත පුද්ගලයන් ලෙස සංවර්ධනය කරනු පිණිස රාජකාරී මාරු කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කර තිබේ. අභ්‍යන්තර සේවක උසස් වීම් යනුද දෙනික මෙහෙයුම් හසුරුවා ගැනීමේදී ඉහළ වගකීම් දැරීම සඳහා සේවකයන් සවිබල ගැන්වීමේ තවත් වැදගත් උපායමාර්ගික පියවරකි.



බාහිර පුහුණු වැඩසටහනේ තේමාව	කාණ්ඩය	සහභාගී වූවන් සංඛ්‍යාව
ප්‍රසම්පාදන කළමනාකරණ සහ ටෙන්ඩර් කාර්ය පටිපාටි	පරිපාලන	3
ප්‍රසම්පාදන කළමනාකරණ සහ ටෙන්ඩර් කාර්ය පටිපාටි	පරිපාලන	3
ඩිජිටල් බැංකුකරණය ආශ්‍රිත නැගී එන තාක්ෂණයන්	පරිපාලන	1
බාසල් ෂෂෂ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම	පරිපාලන	1
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	ශාඛාව	4
ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය උදෙසා ග්‍රාමීය සංවර්ධනයේ වැදගත්කම	ශාඛාව	2
ශාඛා කළමනාකාර භූමිකාවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම	ශාඛා කළමනාකාරවරු	2
බැංකු ටෙලර් යන්ත්‍රවලට අදාළ නිසි පිළිවෙත්	මුදල් අයකැමියන්	5
මූල්‍ය ආයතන සඳහා වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අනුකූලතාව	අනුකූලතා	1
ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ණය තොරතුරු කාර්යාංශය	ණය	2
රියදුරන්ගේ කුසලතා ඉහළ නැංවීම	රියදුරන්	1
අයවැය පිළියෙළ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම	මූල්‍ය	1
ප්‍රායෝගික උපයෝජ්‍යතාවන් සහිතව මෑත කාලීන බදු ප්‍රතිසංස්කරණ පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණ සිදු කිරීම	මූල්‍ය හා ප්‍රතිසංධාන	3
සේවකයින් මාරු කිරීම් සහ තනතුරුවල අනුයුක්ත කිරීම් ආශ්‍රිත නෛතික ගම්‍යතා	මානව සම්පත්	2
පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව	මානව සම්පත්	1
සාප්පු සහ කාර්යාලයීය සේවකයින් පිළිබඳ ආඥා පනත යටතේ සේවාස්ථාන කාර්ය සංවිධාන	මානව සම්පත්	1
සේවක විෂමාචාර සම්බන්ධයෙන් සථලදායී ලෙස කටයුතු කිරීම සහ අභ්‍යන්තර විමර්ශන ක්‍රමවේදය	මානව සම්පත්	2
උපයන විට ගෙවීමේ බද්ද	මානව සම්පත් සහ මූල්‍ය	6
කල්බදු - අභියෝගාත්මක කාලවලදී	කල්බදු	6
පොදු පහසුකම් සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	නීති නිලධාරීන්	5
ජාතික නීති සම්මන්ත්‍රණය	නීති නිලධාරීන්	3
මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ අපනයනකරුවන්ගේ විදේශ මුදල් ගිණුම්	මෙහෙයුම් කාර්ය මණ්ඩලය	2
විද්‍යුත් මුදල් යැවීම්වලදී වංචා වැළැක්වීම ආශ්‍රිත නැගී එන ප්‍රවණතා	මෙහෙයුම් කාර්ය මණ්ඩලය	2
මයික්‍රොසොෆ්ට් එක්සෙල් උසස් නිපුණතා	අවදානම්	1
බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	අවදානම්	1
ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සඳහා දුරකතන නිපුණතා සහ ආචාර ධර්ම	දුරකතන ක්‍රියාකරුවන්	2

අභ්‍යන්තර පුහුණු වැඩසටහනේ තේමාව	කාණ්ඩය	සහභාගී වූවන් සංඛ්‍යාව
උකස් කටයුතු පිළිබඳ විශේෂ පුහුණු සැසිය	සහකාර කළමනාකරවරුන්	38
ව්‍යාපාරවලට සම්බන්ධ ණය ඇගයීම 2020	ශාඛා කළමනාකාරවරුන් සහ ණය නිලධාරීන්	39
මෙහෙයුම්වලට අදාළ කාරණා පිළිබඳ සාකච්ඡාව	ශාඛා කාර්ය මණ්ඩලය	48
මෙහෙයුම්වලට අදාළ කාරණා පිළිබඳ සාකච්ඡාව	ශාඛා කාර්ය මණ්ඩලය	33
ශාඛා කාර්යාල නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	ශාඛා කාර්ය මණ්ඩලය	20
ශාඛා කාර්යාල නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	ශාඛා කාර්ය මණ්ඩලය	29
ශාඛා කාර්යාල නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	ශාඛා කාර්ය මණ්ඩලය	19
ශාඛා කාර්යාල නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	ශාඛා කාර්ය මණ්ඩලය	20
ශාඛා කාර්යාල නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	ශාඛා කාර්ය මණ්ඩලය	23
2020 අයවැය සහ තුන් වාර්ෂික පිළිවැටුම් සැලැස්ම	අංශ ප්‍රධානීන්	27
ශාඛා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ක්‍රමෝපායික සැලැස්ම	කල්බදු නිලධාරීන්	22
ව්‍යාපාරික ප්‍රවර්ධනය සඳහා වූ 2020 ඉලක්ක සාක්ෂාත්කරණය	ජංගම මෙහෙයුම්කරුවන්	30
උකස් කටයුතු පිළිබඳ විශේෂ පුහුණු සැසිය	උකස් නිලධාරීන්	41
අයකර ගැනීමේ නිලධාරීන් සඳහා වූ පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය	අයකර ගැනීමේ නිලධාරීන්	48
අයකර ගැනීම් කාර්යක්ෂමව සහ සථලදායී ලෙස සිදු කිරීම	අයකර ගැනීමේ නිලධාරීන්	28
ණය ප්‍රමාද කාල සහන පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	අයකර ගැනීමේ නිලධාරීන්	30

ප්‍රාග්ධන වාර්තා

මානව ප්‍රාග්ධනය

2020 වසරේදී සේවක මණ්ඩලය පුහුණු හා සංවර්ධනය කරනු පිණිස අප බැංකුව විසින් රු. මිලියන 5.2 ක ආයෝජනයක් සිදු කර ඇත. සමස්ථයක් ලෙස බැංකුවේ සේවකයන් අතරින් 88% ක් වෙත ඔවුන්ගේ තාක්ෂණික ක්ෂේත්‍රවලට අදාළ පුහුණුව ලබා දුන් අතර මෙය 633 ක් වූ මුළු සේවක සංඛ්‍යාවෙන් 558 දෙනෙකු නියෝජනය කරයි.

තෝරාගත් සේවකයන්ගේ රැකියා භූමිකා මත පදනම්ව ඔවුන් වෙත පුහුණුව ලබා දීම උදෙසා බැංකුව ෂජඑල ක්ෂී ආදී වෘත්තීය අධ්‍යාපන ආයතන සමග සම්බන්ධතා ගොඩනගා ගෙන තිබේ. ශාඛාවල සේවකයන් උදෙසා වෙබ් අඩවි පාදක කරගත් පුහුණු වැඩසටහන්ද පිහිටුවා තිබේ. මීට අමතරව, අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පැවැත්වීම උදෙසා අභ්‍යන්තර සම්පත් දායකයන්ද හඳුනා ගෙන තිබේ.

අලුතින් බඳවා ගත් සේවකයන් අභ්‍යන්තර සේවා පරිසරය සහ ඔවුන්ට අදාළ වෘත්තීය වගකීම් වෙත අනුගත කරනු පිණිස දිශානුගත කිරීමේ සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

පුහුණු වැඩසටහන්



කාණ්ඩය	වැඩසටහන්
බැංකුකරණ	19
අලෙවිකරණ	2
ඩිජිටල්/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ	3
පාරිභෝගික සේවාව	2
සෞඛ්‍ය හා සුරක්ෂිතතාව	-
වෙනත්	16

පුද්ගලික වර්ධනය

සේවකයන්ගේ පුද්ගලික දියුණුව සහ රැකියා ආශ්‍රිත කාර්යසාධනය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් වශයෙන් බැංකුවේ සමස්ථ කාර්ය මණ්ඩලයම සඳහා ''විශිෂ්ඨතාව අභිබවා යාම'' යන තේමාව යටතේ පුහුණු වැඩසටහනක් බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී පවත්වන ලදි. මෙම වැඩසටහනේ සම්පත් දායකයා වශයෙන් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශවලද වැඩමුළු 2650 කට අධික ප්‍රමාණයක් පවත්වා තිබුණු සහ සේවා අලෙවිකරණ ක්ෂේත්‍රයේ දශක දෙකකට අධික අත්දැකීම් සම්භාරයකින් පොහොසත් පුහුණුකරුවෙකු වන ධම්මික කලපුගේ මහතා සහභාගී විය.

වැටුප් හා ගෙවීම්

සේවකයන්ගේ පුද්ගලික දියුණුව සහ රැකියා ආශ්‍රිත කාර්යසාධනය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් වශයෙන් බැංකුවේ සමස්ථ කාර්ය මණ්ඩලයම සඳහා ''විශිෂ්ඨතාව අභිබවා යාම'' යන තේමාව යටතේ පුහුණු වැඩසටහනක් බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී පවත්වන ලදි. මෙම වැඩසටහනේ සම්පත් දායකයා වශයෙන් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශවලද වැඩමුළු 2650 කට අධික ප්‍රමාණයක් පවත්වා තිබුණු සහ සේවා අලෙවිකරණ ක්ෂේත්‍රයේ දශක දෙකකට අධික අත්දැකීම් සම්භාරයකින් පොහොසත් පුහුණුකරුවෙකු වන ධම්මික කලපුගේ මහතා සහභාගී විය.

ප්‍රතිලාභ	සේවා	පරිවාස	ඉෂ්ටාප්‍රාප්ති	BPT
වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය	✓	✓	-	-
නිවාස ණය	✓	-	-	-
ආපදා ණය	✓	-	-	-
ඇපකාර ණය	✓	✓	-	-
යතුරුපැදි කල්බදු පහසුකම්	-	-	-	✓
ප්‍රසාද දීමනා	✓	✓	✓	✓
ඉතිරි වූ නිවාඩු සඳහා දීමනා	✓	✓	✓	-
යැපීම් දීමනා	✓	✓	✓	✓
අවදානම් දීමනාව (මුදල් අයකැමි සහ ජංගම බැංකු පමණි)	✓	✓	✓	✓
කොමිස්	-	-	-	✓
රථ වාහන ණය	✓	-	-	-
උත්සව අත්තිකාරම්	✓	✓	✓	-
දුෂ්කර ප්‍රදේශ දීමනාව	✓	-	-	-
සම්මාන දීමනා	✓	-	-	-
යතුරු කළමනාකරණ දීමනාව (ආරක්ෂිත යතුර)	✓	-	-	-
ශාඛා කළමනාකරණ දීමනාව	✓	✓	-	-
දෙවන නිලධාරී දීමනාව	✓	✓	-	-

සේවක සංවර්ධනය සහ සේවකයන් සඳහා වූ ගෙවීම් සම්බන්ධයෙන් බැංකුවේ වියදම් ඉහළ නැංවීම හොඳින්ම ප්‍රකට කෙරෙන සාධකය වන්නේ ස්ථාවර ලෙස ඉහළ නගිමින් පවතින සේවකයෙකුට වෙන් වන පිරිවැය යි.

වර්ෂය	2017	2018	2019	2020
මුළු සේවක විකතුව	647	640	647	633
සේවකයෙකුට පිරිවැය (රු. මිලියන)	1.45	1.73	1.81	1.85

එමෙන්ම, විශ්‍රාම යන සේවකයන් වෙනුවෙන් ප්‍රතිලාභ සැලසීමටද බැංකුව කටයුතු කරයි. ඔවුන් විසින් ලබා දෙන ලද සේවාව ඇගයීමට ලක් කරමින් බැංකුවෙන් විශ්‍රාම ගිය සෑම සේවකයෙකුටම සමු දීමේ සාදයක් බැගින් සංවිධානය කෙරිණ. බැංකුවේ වසර 15 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන සේවකයන් හට විශේෂ පාරිතෝෂිකයක් ලබා දෙන අතරම බැංකුවේ සුභසාධන සමිතිය විසින්ද රු. 100,000 ක මුදලක් ගෙවනු ලැබේ. මීට අමතරව, විශ්‍රාම යාමෙන් අනතුරුව අදාළ සේවකයන්ට සිය වෛද්‍ය ප්‍රතිචාර සඳහා වැය වන වියදම් බැංකුවේ ප්‍රතිපූරණය කර ගැනීමේ ප්‍රතිලාභයද හිමි වේ.

සේවක සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව

පැවති මෙහෙයුම් සීමාවන් හා අභියෝගාත්මක තත්ත්ව හමුවේ වුවද රට වසා දමා තිබුණු කාලවලදී පවා අපගේ සේවකයන් රාජකාරී සඳහා වාර්තා කරමින් ගනුදෙනුකරුවන් වෙත සේවය ලබා දීමට කටයුතු කරන ලදි. සේවකයන් සියලුම දෙනාගේ සුරක්ෂිතතාව වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවන් ආශ්‍රිතව පිරිසිදුකාරක දියර සහ මුහුණු ආවරණ ආදී අවශ්‍ය සියළුම කළමනාවන් සූදානමින් තැබීමටද බැංකුව පියවර ගත්තේය.

මීට අමතරව, අපගේ සේවකයන් පාලනය නොවූ තත්ත්වයන්ට නිරාවරණය නොවන බව සහතික කරනු පිණිස සේවකයන් සියලුම දෙනා වෙත ප්‍රවාහන පහසුකම් ලබා දීමට සහ වැඩ මුර ක්‍රමයක් හඳුන්වා දීමටද බැංකුව කටයුතු කළේය.

කොවිඩ්-19 ආසාදිතයන් දින දින ඉහළ නගිමින් පැවති කාල වකවානුවේදී සේවා පැය ගණන් ලිහිල් කිරීමට පියවර ගත් අතර තමන්ට ආසන්නතම ශාඛාව වෙත රාජකාරී වාර්තා කරන ලෙස සේවකයන්ට උපදෙස් දෙන ලදි. එමෙන්ම, දරුඵල අපේක්ෂාවෙන් සිටි සේවිකාවන් සහ ළදරුවන් රැකබලා ගැනීමෙහි නිරතව සිටි සේවිකාවන් වෙනුවෙන් නිවසේ සිට සේවය කිරීමේ විධිවිධානද බැංකුව විසින් යොදන ලදි.

පැවති සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ ඉදිරි ක්‍රියාමාර්ගවලට අනුකූලතාව දක්වමින් සියලුම සේවක මහත්ම මහත්මීන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම නිරන්තරයෙන්ම සිදු කරන ලදි. මීට අමතරව, ප්‍රමාණවත් පිරිසිදුකාරක දියර සහිතව සෑම ශාඛා ප්‍රවේශ දොරටුවකම අත් සේදීමේ පහසුකම් පිහිටුවන ලදි.

2020 වසරේදී ක්‍රියාත්මක කරන ලද අනිවාර්ය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විධිවිධානවලට අමතරව, සේවකයන්ගේ සෞඛ්‍යමත්භාවය සහතික කරනු පිණිස නිසි මූල්‍යමය දිරි දීමනා ලබා දීම තුළින් ඔවුන්ගේ සමස්ථ යහපැවැත්ම තහවුරු කිරීමටද එච්ඩිඑෆ්සී බැංකුව පියවර ගනියි. එමෙන්ම, වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල් ගාස්තු සහ ප්‍රතිකාර ගාස්තුද ප්‍රතිපූරණය කරගැනීමට අවස්ථාව බැංකුව විසින් සේවකයන් වෙත ලබා දේ.

නව කාර්යසාධන ඇගයීම් පද්ධතිය

සේවකයන්ගේ සමස්ථ කාර්යසාධනය මිනුම්ගත කිරීම ඉලක්ක කරගත් නව ව්‍යුහගත කිරීමක් සහිතව 2020 වසරේදී සේවක කාර්යසාධන ඇගයීමද නව මුහුණුවරකින් හඳුන්වා දෙන ලදි. ශාඛා මට්ටමින් සහ තනි පුද්ගල පදනම මත සේවකයන් වෙත පවරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇගයීම සඳහා නව ක්‍රමවේදයක් යොදා ගැනීමද ඊට ඇතුළත් විය. මෙම නව ඇගයීම් ක්‍රමවේදයට අනුව, 70% ක බර තැබීමක් සහිත කණ්ඩායම් ඉලක්ක සාකෂාත්කරණයන් සඳහා අදාළ වන අතර ඉතිරි 30% ක බර තැබීම පදනම් වනුයේ අදාළ සේවකයාගේ පුද්ගලික සාකෂාත්කරණයන් මතයි.

පිළිගැනීම සහ පිරිනැමීම්

බැංකුව සෑම වසරකදීම වාර්ෂික සේවක ත්‍යාග ප්‍රදානෝත්සවයක් සංවිධානය කරයි. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය නිසා මතු වූ සීමාවන් සහ සියලුම දෙනාගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව වෙනුවෙන් පළ කළ දැඩි අවධානය හේතුවෙන් 2020 වසරේදී පවත්වන්නට නියමිතව තිබුණු එම උත්සවය කල් දැමීම සුදුසුම පියවර බව අපට ඒත්තු ගියේය.

2019 වසරේදී එම උත්සවය දිවයින පුරා කාර්ය මණ්ඩල සාමාජිකයන් 500 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹ ගලධාරී හෝටලයේදී පවත්වන ලදි. වසර 25 කට අධික කාලයක් පුරාවට බැංකුව වෙත ඇති විශිෂ්ට සේවාවක් ලබා දුන් සේවකයන් 57 දෙනෙකු එහිදී පිළිගැනීමට ලක් කෙරුණි. එමෙන්ම, කාර්ය මණ්ඩල සාමාජිකයන්ට නිසි පිළිගැනීම ලබා දීමේ වැදගත්කම සහ සේවය කිරීමට ඇති අභිප්‍රේරණය නගා සිටුවීමේදී එහි ඇති වටිනාකම හඳුනාගත් අපගේ බැංකු කළමනාකාරීත්වය විශිෂ්ට කාර්යසාධනයන් ප්‍රකට කළ සේවකයන් ඇගයීමට ලක් කිරීමේ ලිපි නිකුත් කරන ලදි.

2020 වසරේදී රට වසා දැමීමට පියවර ගෙන තිබුණු කාල සීමාව තුළදී අපගේ සේවකයන් අති බහුතරය තමන් වෙත පැවරී තිබුණු රාජකාරීන්ගෙන් ඔබ්බට යමින් අති විශිෂ්ට නම්‍යශීලීත්වයක් පළ කරමින් කටයුතු කරන ලදි. එක්තරා අවස්ථාවදී රට වසා දමා තිබුණු මොහොතක එච්ඩිඑෆ්සී බැංකුවේ මෙහෙයුම් නොකඩවා පවත්වා ගැනීමට කැපවීමෙන් සහාය වූ එක් සේවකයෙකුගේ සේවය අගය කිරීම සඳහා බැංකුව නිසි පියවර අනුගමනය කළේය.

ප්‍රාග්ධන වාර්තා

මානව ප්‍රාග්ධනය

සේවක වෘත්තීය සමිතිය සමග සබඳතා

එච්ඩීඑෆ්සී බැංකු කළමනාකාරිත්වය සෑම විටම සේවක වෘත්තීය සමිතිය සමග සුහදශීලී සබඳතාවක් පවත්වා ගනියි. 2018 සාමූහික ගිවිසුම ප්‍රකාරව එකඟ වූ තුන්වන හා අවසන් වැටුප් වැඩි කිරීම ගෙවීමේ බැඳීමට ගරු කරමින් කටයුතු කිරීමට 2020 ජනවාරි මාසයේදී බැංකුව පියවර ගත්තේය. ආයතනික කළමනාකාරිත්වයද ඇතුළත් බැංකුවේ සේවක මණ්ඩලයෙන් 99.7% දෙනෙකු ලංකා බැංකු සේවක වෘත්තීය සමිතියේ සාමාජිකත්වය දරන අතර මේ නිසා එය සවිමත් සාමූහිකයක් වෙයි.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුව විසින් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ලංකා බැංකු සේවක වෘත්තීය සමිතිය සමග 2018-2020 සාමූහික ගිවිසුමට අත්සන් තබන ලදි. එම ගිවිසුම මගින් සේවකයන් වෙත වැටුප් නොවන ප්‍රතිලාභ සැලසේ.

වාර්ෂික සේවක සුහද හමුව

බැංකුවේ ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් අපගේ සුභසාධන සමිතිය විසින් අවිස්සාවේල්ල Lavenro Gardens හෝටලයෙහි සුහද හමුවක් සංවිධානය කරන ලදි. නැටුම් ගැයුම්, විවිධ තරග හා විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ දරුවන් සඳහාම වෙන් වූ තරග ආදී ඉසවු ගණනාවක් එම විනෝද උත්සවයට ඇතුළත් විය. බැංකුවේ සභාපතිනි සහ ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර අධ්‍යක්ෂ සහ ආයතනික කළමනාකාරිත්වය නියෝජනය කරන නිලධාරීන් ඇතුළු බොහෝ පිරිසක් ඊට සහභාගී විය.



බුද්ධිමය ප්‍රාග්ධනය



වර්ධනයට ගාමක බලය සපයන දැනුම

එච්ඩිඑෆ්සී බැංකුවටම ආවේණික සුවිශේෂී නිපැයුම් ලබා දීමට අමතරව, සංවිධානමය හා කාර්යශූර දැනුම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති හා ඩිජිටල්කරණය ආශ්‍රිත දැනුම ව්‍යාප්ත කිරීම ආදිය අපගේ වර්ධනයට ගාමක බලය සපයන බුද්ධිමය ප්‍රාග්ධනයට ඇතුළත් වේ. මෙම අස්පෘශ්‍ය දැනුම හා සංවිධානමය ප්‍රාග්ධනය වෙතින් සැදුම් ලබන සාමූහික දැනුම් පදනමේ සහාය නවීකරණය සමග ඉදිරියට යාමට බැංකුවට ඇති ශක්‍යතාව වෙත ලැබේ. අප බැංකුවටම ආවේණික ලක්ෂණයක් වන සංස්කෘතිය සමග මුහු වූ නායකත්වයද අපගේ නිරන්තර සැලකීමට ලක් වේ.

නිවාස මූල්‍ය පහසුකම් ආශ්‍රිත සංවිධානමය (ආයතනික) දැනුම

රටෙහි පවතින අතළොස්සක් අතරින් එකක් වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව සාපේක්ෂ වශයෙන් අඩු මූල්‍ය ධාරිතාවක් ඇති පුද්ගලයන් වෙත නිවාස හා සබැඳි මූල්‍යමය සහාය ලබා දීම කෙරෙහි දැඩි උනන්දුවකින් අවධානය යොමු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපි එච්ඩිඑෆ්සී බැංකුවටම ආවේණික සුවිශේෂී ක්‍රියාවලි, නිපැයුම් හා සේවාවන් පවත්වා ගන්නා අතර, දේශීය නිවාස වෙළෙඳපොල පිළිබඳ ඉතාම ඉහළ හා මිනිය නොහැකි දැනුමකින් පොහොසක් සේවකයන්ගෙන් සමන්විත අපගේ ශාඛා ජාලයේ නිරන්තර සහාය වය වෙත හිමි වේ.

අපටම ආවේණික මෙම ශක්තිය නිසා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහ ග්‍රාමීය හා මධ්‍ය ආදායම්ලාභී පුද්ගලයන් බැංකුව වෙත ආකර්ෂණය කෙරෙන අතර, මේ නිසා විවැනි දහස් ගණනක් වූ ගනුදෙනුකරුවන් වෙත ලෙස සේවා ලබා දීම සඳහා අවශ්‍ය පළපුරුද්ද, ක්‍රමවේදීය පසුබිම අප වෙත ලැබේ.

ජංගම බැංකුකරණ මෙහෙයුම්

දිවයින පුරාවටම විසිරී සිටින ගනුදෙනුකාර පදනමකින් පොහොසත් එච්ඩිඑෆ්සී බැංකුව රටෙහි දුරස්ථ හා ග්‍රාමීය ජන ප්‍රජාවන් වෙත ළඟා වීමේදී අම්ල මෙහෙයක් ඉටු කරන අපගේ අති සමීප බැංකුකරුවන් / ජංගම බැංකුකරණ සහකරුවන් හරහා අපටම ආවේණික දොරින් දොර බැංකු මෙහෙයුම් ව්‍යාප්තියක් පවත්වා ගැනීමට කරයුතු කරයි. ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත සුළු පරිමාණ ගනුදෙනුකරුවන් හා ව්‍යවසායිකයට මූල්‍ය සහාය ලබා ගැනීම සඳහා පහසුකම් සලසමින් තැන්පතු භාර ගැනීම, ණය වාරික රැස් කිරීම සහ උපයෝජ්‍යතා බිල්පත් ගෙවීම ආදී කටයුතු ඉටු කරමින් අපගේ ජංගම බැංකුකරණ ඒකකය ශාඛාවලින් ඉතා දුර බැහැර ප්‍රදේශ දක්වා ගමන් කරයි.

මෙම සියලු කටයුතු සාර්ථකව ඉටු කරනු ලබන්නේ එච්ඩිඑෆ්සී බැංකුවේ ජංගම බැංකුකරණ නිලධාරීන් ඇතුළු එකී මෙහෙයුම්වල නිරත වන සමස්ථ කණ්ඩායම විසින් සිය ජංගම උපාංග හරහා භාවිතයට ගන්නා අති සමීප බැංකුකරණ මෘදුකාංගයේ පහසුව මගිනි. මෙම මෘදුකාංගය නිසා මුදල් එකතු කිරීම වඩා පහසුදායී වන අතර, බැංකු ශාඛා වෙත ගමන් කිරීමකින් තොරව තමන් විසින් සිදු කළ යුතු ගෙවීම් නිසි කලට ඉටු කිරීමට එමගින් ග්‍රාමීය ගනුදෙනුකරුවන්ට අවස්ථාව උදා කෙරේ.

ප්‍රාග්ධන වාර්තා

බුද්ධිමය ප්‍රාග්ධනය

තාක්ෂණය සහ ඩිජිටල්කරණය

ප්‍රධාන බැංකු පද්ධතිය

තාක්ෂණිකමය වශයෙන් මධ්‍යගත විසඳුම් හා පද්ධති භාවිතයට ගැනීම තුළින් පරිවර්තනීය දිශානතියක් කරා යොමු වූ බැංකුව රු. මිලියන 160 ක ආරම්භක ආයෝජනයක් සහිතව සිය ප්‍රධාන බැංකු පද්ධතිය 2017 වසරේදී ක්‍රියාත්මක කරන ලදි. තාක්ෂණික සේවා සැපයුම්කරුවෙකු හරහා සංවර්ධනය කරන ලද එම ප්‍රධාන බැංකු පද්ධතිය ඔස්සේ සඵලදායී ලෙස ක්‍රියාවලීන් කාර්යක්ෂම කරමින් ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය එකට සම්බන්ධ කෙරේ. මේ අනුව, වඩා මධ්‍යගත හා ඩිජිටල්කරණයට ලක් වූ ශාඛා මෙහෙයුම් ප්‍රවේශයක් ලබා දීම තුළින් අපගේ ප්‍රධාන බැංකුකරණ පද්ධතිය ඔස්සේ ශාඛා සබැඳියාව සහතික කරන ලදි. 2021 දී ක්‍රියාත්මක කිරීමට නියමිත බැංකුවේ ඩෙබිට් කාඩ්පත හරහා POS ගනුදෙනු සිදු කිරීම පහසු කිරීම සඳහා අපගේ ප්‍රධාන බැංකු පද්ධතිය 2020 දී වැඩිදියුණු කරන ලදි. වසංගත තත්ත්වයේ බලපෑම සහ මෙහෙයුම් පරිසරය වෙත වේල්ල වූ අභියෝග හේතුවෙන් එම ඩෙබිට් කාඩ්පත දියත් කිරීම නිසි කලට සිදු කිරීමට නොහැකි විය.

ණය උත්පාදනය සහ ණය කළමනාකරණ පද්ධති

එච්ඩීඑෆ්සී බැංකුවේ ණය නිපැයුම් සහ සබැඳි මෙහෙයුම් ක්‍රමවේද සඳහා සහාය දැක්වීම වෙනුවෙන්ම සකසා ඇති ණය උත්පාදන සහ ණය කළමනාකරණ පද්ධති දැන් අප බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් පද්ධතියෙහිම වීකාබද්ධ අංග ලෙස ක්‍රියාත්මක වේ. 2019 වසරේදී එක් ප්‍රාදේශිකයක් ඉලක්ක කරගෙන දියත් කරන ලද නියමු මෙහෙයුමක් සහිතව බැංකුවේ ණය උත්පාදන පද්ධතිය නවමු මුහුණුවරකින් යළි ක්‍රියාත්මක කිරීම අරඹන ලදි. ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරමින් සහ පද්ධතිය වෙත ප්‍රවේශ ඇති නිලධාරීන් වෙත එය වඩා සඵලදායී හා විනිවිදභාවයෙන් යුතු එකක් බවට පත් කරමින් 2010 දී ශාඛා සියල්ලම දක්වා එම පද්ධතිය ව්‍යාප්ත කරන ලදි.

මේ අනුව, වඩා මධ්‍යගත හා ඩිජිටල්කරණයට ලක් වූ ශාඛා මෙහෙයුම් ප්‍රවේශයක් ලබා දීම තුළින් අපගේ ප්‍රධාන බැංකුකරණ පද්ධතිය ඔස්සේ ශාඛා සබැඳියාව සහතික කරන ලදි. 2021 දී ක්‍රියාත්මක කිරීමට නියමිත බැංකුවේ ඩෙබිට් කාඩ්පත හරහා POS ගනුදෙනු සිදු කිරීම පහසු කිරීම සඳහා අපගේ ප්‍රධාන බැංකු පද්ධතිය 2020 දී වැඩිදියුණු කරන ලදි.

මේ වන විට අපගේ ණය උත්පාදන පද්ධතිය මගින් ණය ඉල්ලීම් අන්තර්ජාලය හරහා අනුමත කිරීමට ඉඩකඩ සැලසේ. අදාළ ණය ඉල්ලීම් ලේඛන ඩිජිටල් ක්‍රමවේද ඔස්සේ ස්කෑන් කොට කළමනාකාරිත්වයේ සමාලෝචනය උදෙසා අන්තර්ජාලය හරහා යොමු කිරීම සම්බන්ධ වැඩි පහසුවක් දැන් අපගේ බැංකු නිලධාරීන් වෙත උදා වී ඇත. ශාඛා අතර ලේඛන භෞතික වශයෙන් හුවමාරු කර ගැනීම නිසා වැය වූ පිරිවැය මෙම පද්ධතිය නිසා ඉවත් වූ අතර මින් පෙර ප්‍රධාන කාර්යාලය සහ සෑම ශාඛාවක්ම අතර ලේඛන සංසරණය කිරීම සඳහා ඉහළ වියදමක් දරන්නට සිදු විය.

සුළු පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය

රු. මිලියන 9.9 ක ආයෝජනයක් සහිතව 2020 වසරේදී දියත් කරන ලද සුළු පැහැර හැරීම් කළමනාකරණ පද්ධතියක් නිසා එච්ඩීඑෆ්සී බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂම කෙරිණ. ණය වාරික ගෙවීම් නිසි කලට ලබා ගැනීම සහ ඒවා නිවැරදිව ලේඛනගත කිරීම කාර්යක්ෂම කිරීම එහි අරමුණ විය. මෙම පද්ධතිය පළු පෙළ පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධතියක් ලෙසද කටයුතු කරන නමුදු එය ප්‍රමාද වූ ගෙවීම් සම්බන්ධ නිවේදන ගනුදෙනුකරුවන් වෙත යවමින් හිඟ ගෙවීම් අයකර ගැනීමේ දුෂ්කරතා වළක්වා ගැනීම වෙත සීමා වී පවතී.

අන්තර්ග්‍රාහී විසඳුම්

දම්ළ බස කතා කරන පුද්ගලයන් සඳහාම සුවිශේෂයෙන් සැලසුම් කර තැන්පතු නිෂ්පාදනයක් නිර්මාණය කිරීම සඳහා පියවර ගත් ප්‍රථම දේශීය බැංකුව වන්නේද එච්ඩීඑෆ්සී බැංකුවයි. 'අරුම්බු' ලෙස නම් කර ඇති මෙම ඉතුරුම් සැලැස්ම දරුවන්ගේ අනාගත මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම සඳහාම වෙන් වූ සුවිශේෂී ආයෝජන විසඳුමකි.

සේවක අර්ථසාධක අරමුදල මත පදනම් වූ ණය මෙහෙයුම්

ශ්‍රී ලංකාව තුළ සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස තබා ගෙන ණය ලබා දීමේ බලයලත් ආයතන හතරෙන් එකක් වන්නේද එච්ඩීඑෆ්සී බැංකුවයි. බැංකු පද්ධතියෙහි පුළුල්භාවය තුළ මෙය ඉතාම සුවිශේෂී පහසුකමක් වන අතර, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු වෘත්තිකයන්ට තම සේවක අර්ථසාධක අරමුදල් ශේෂ ඇපයක් ලෙස තබා ගෙන නිවාස සංවර්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් ලබා දීමේ සුවිශේෂී ශක්‍යතාවක් එමගින් බැංකුව වෙත ලැබේ. මෙම සේවා ලබා දීම ඔස්සේ අප බැංකුවටම සුවිශේෂී ක්‍රමවේද සහිත ආයතනික ප්‍රාග්ධනයක් අප සතු වේ.

ආචාර ධර්ම සහ නියාමන අනුකූලතාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති හා බලපත්‍රලාභී මූල්‍ය මැදහත්කරුවෙකු වශයෙන් වීකාබද්ධතාව සහ ආචාර ධාර්මික පිළිවෙත් පිළිබඳ ඉහළම ප්‍රමිතීන් නගා සිටුවන අතරම මූල්‍ය හා මෙහෙයුම් විනිවිදභාවය පවත්වා ගැනීම සම්බන්ධ සැලකිය යුතු වගකීමක් එච්ඩීඑෆ්සී බැංකුව සතුව පවතී. බැංකුවේ පාර්ශ්වකරුවන් සහ කොටස් හිමියන් සඳහා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුතු මෙහෙයුම් චර්යාවන් අවශ්‍ය වේ.

නියාමන, ආයතනික පාලන සහ නෛතික බැඳීම්වල කොටසක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව අදාළ සියලුම නීති හා රෙගුලාසි වෙත නිසි අනුකූලතාව දක්වයි. ඒ අනුව, බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති නියමයන් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුවට අදාළ වන සියලුම රෙගුලාසිවලට අප බැංකුව අනුකූලතාව දක්වා ඇත.

වගවීමෙන් යුතු සහ ආචාර ධාර්මිකභාව පිළිබෙත් ගුරුතන්හි තබා ගෙන කටයුතු කිරීම වෙනුවෙන් කැප වී සිටින එච්ඩිඑෆ්සී බැංකුවේ කළමනාකාරිත්වය සියලුම සේවකයන් කෙරෙහි අචල විශ්වාසය තබන අතර, තමන් විසින් ගනු ලබන තීරණ සේවකයන් විසින් ක්‍රියාත්මක කිරීමේදී සද්භාවයෙන් යුතු ආචාර ධාර්මිකභාවය අනුගමනය කරනු ඇති බව අපේක්ෂා කෙරේ. ණය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අදාළ පාර්ශ්ව වෙත සෘජුවම නිකුත් කරනු ලබන අරමුදල් ණය ලබා ගන්නන් (ගනුදෙනුකරුවන්) අදාළ අරමුණු වෙනුවෙන්ම යොදා ගැනෙන බවද බැංකුව විසින් සහතික කෙරේ.

බැංකුව සහ එහි ශාඛා සියල්ල පුරාවටම ආචාර ධාර්මික නොවන චර්යාවන් සහ මූල්‍යමය අක්‍රමිකතා අවධානයට ලක් කිරීම සඳහා විවෘතව කටයුතු කරන ලෙස සේවකයන් දිරිමත් කෙරෙන තොරතුරු සැපයීමේ (විස්ල් බ්ලෝවින්) ප්‍රතිපත්තියක්ද බැංකුව විසින් පිහිටුවා ගෙන තිබේ. ඒ අනුව, පවතින ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කිරීම් සහ සෘජු අනනුකූලතා බැංකු කළමනාකාරිත්වයේ අවධානයට ලක් කළ හැකි අතර ඉන් අනතුරුව කළමනාකාරිත්වය විසින් අවශ්‍ය නිසි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

මූල්‍යමය මැදහත්වීම් ලබා දීමට බැංකුවට ඇති හැකියාව කෙරෙහි ගනුදෙනුකරුවන් තබා ඇති විශ්වාසයට ගරු කරමින් අප හමුවේ ඔවුන් රඳවා ඇති මුදල්වල සුරක්ෂිතතාව සහතික කරන අතරම, ඒකාද්ධතාව හා අවංකභාවය නඟා සිටුවීම තහවුරු කිරීමට සහායක් වැවැනි පාලන විධිවිධාන මගින් බැංකුවට ලැබේ. සේවා විසඳුම් සකස් කිරීමේදී සහ මෙහෙයුම් කාර්යක්ෂමතා ඉහළ නැංවීමේදී බැංකුව දැනටමත් රැඳී සිටින සහ අලුතින් එක් වූ ගනුදෙනුකරුවන් වෙත මූලික අවධානය යොමු කරමින් කටයුතු කරයි. එමෙන්ම, අඩු-මධ්‍ය ආදායම්ලාභී ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවන්ට ගැලපෙන අන්තර්ග්‍රාහී සහ සාකල්‍යවාදී විසඳුම් දරාගත හැකි කොන්දේසි යටතේ ලබා දීහට විසඳුම් සකස් කිරීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සහ ඔවුන් මුහුණපාන අභියෝග හඳුනා ගැනීමටද එය නිරතුරුව ඉවහල් වේ.

සන්නාම වටිනාකම

1984 වසරේ සිට මේ දක්වා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ දශක තුනකට අධික අත්දැකීම් සම්භාරයකට උරුමකම් කියන එච්ඩිඑෆ්සී විසින් ඉහළ සන්නාම කීර්ති නාමයක් උපයාගෙන ඇති අතර, දැන් එය අපගේ ගනුදෙනුකරුවන් වෙතින් එය මනාව ප්‍රත්‍යක්ෂ වේ. එමෙන්ම, බැංකුව නිරන්තරයෙන්ම විවිධාංගීකරණය වත්ම වඩා හොඳ ගනුදෙනුකාර අත්දැකීමක් අරමුණු කර ගනිමින් ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, සේවා කඩිනමින් ලබා දීම සහ ඩිජිටල් පහසුදායී බව වැඩි කිරීම කෙරෙහි සවිමත් අවධානයක් යොමු කරමින් ගනුදෙනුකරුවන් වෙත නව සේවාවන් සහ අගය එකතු කළ සේවා ලබා දීමට කටයුතු කෙරෙනු ඇත.

තැන්පතු සහ ණය කළඹ පුරාවටම සන්නාමිත මූල්‍ය නිපැයුම් සහ විසඳුම් ලබා දීමට අමතරව බැංකුව සිය සන්නාමයද බුද්ධිමය ප්‍රාග්ධනයක් ලෙස සලකයි.

උපායමාර්ගික දැක්ම

නවීකරණය සහ විවිධාංගීකරණය පදනම් වූ වර්ධනය ඉලක්ක කරගත් බැංකුවේ සැලසුම්වලට අනුකූල වන පරිදි වඩා පුළුල් වෙළෙඳපොල හිමිකාරත්වයක් ළඟා කර ගැනීම සහ පවතින තත්තවයට වඩා සවිමත් මූල්‍යමය තත්ත්වයක් අත්කර ගැනීම උදෙසා ක්‍රියාවලි, සේවා සහ තාක්ෂණික නවෝත්පාදනයන් ප්‍රතිසංවිධානය කිරීම කෙරෙහි බැංකුව දැනටමත් අවධානය යොමු කර තිබේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා බැංකුවේ කළමනාකාරිත්වය විසින් පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කොට අනුමත කරගෙන සිටී: මෙය, බැංකුවට සිය ප්‍රමුඛ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට උපකාරී වනු පිණිස ප්‍රධාන කාර්යයන්, පද්ධති සහ ක්‍රියාවලි යළි සකසා ගැනීමට සහාය දක්වන මාර්ග සිතියමක්ද වේ.

ප්‍රාග්ධන වාර්තා

නිෂ්පාදිත ප්‍රාග්ධනය



වර්ධනයට ඉවහල් වන වත්කම්

ගනුදෙනුකරුවන් වෙත ළඟා වීම සහ දැනටමත් සේවා ලබා ගන්නා පුද්ගලයන් වෙත අබණ්ඩව මූල්‍ය සේවා ලබා දීම සඳහා වූ භෞතික වත්කම් සියල්ලම එච්ඩීඩීඑෆ්සී බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධන සංචිතයට ඇතුළත් වෙයි.

එමෙන්ම, බැංකුවේ නිෂ්පාදන අතරට ප්‍රධාන කාර්යාලය, ශාඛා පරිශ්‍ර, දේපල සහ උපකරණ, තොරතුරු තාක්ෂණ පද්ධති හා අස්පෘශ්‍ය වත්කම් සහ මූල්‍ය නිපැයුම් හා සේවා ලබා දීමට අදාළ සියළුම වැදගත් අංග ආදිය ඇතුළත් වේ. වසර ගණනාවක් පුරාවටම අපගේ බැංකුව සමාජයේ විවිධ ප්‍රජාවන් ආශ්‍රිත ගනුදෙනුකරුවන් වෙත සමීප කිරීමේදී නිෂ්පාදිත ප්‍රාග්ධනය ඉතාම වැදගත් භූමිකාවක නිරත වී ඇත. ශ්‍රී ලාංකිකයන් දහස් ගණනක් වෙත මූල්‍ය සහාය හා සවිබල ගැන්වීම ලබා දීමට අවස්ථාව බැංකුවට උදා කරමින් කරමින් දිවයින පුරාවටම අපගේ මෙහෙයුම් ව්‍යාප්ත කිරීමට එමගින් ජවය ලැබේ.

බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ඉහළ නැංවීම සහ සිය මෙහෙයුම් ව්‍යාප්ත කිරීමේ හා කළමනාකරණය කිරීමේ ධාරිතාව වැඩි කිරීම උදෙසා රු. මිලියන 55.14 ක ප්‍රාග්ධන වියදමක් දරමින් බැංකුව 2020 දී කොවිඩ්-19 වසංගතය නිසා උද්ගත වූ බාධක හමුවේ වුවද දේපල, පිරියත සහ උපකරණ වෙනුවෙන් නොකඩවා ආයෝජන සිදු කරන ලදි. මේ වන විට එච්ඩීඩීඑෆ්සී බැංකුවේ මුළු දේපල, පිරියත සහ උපකරණ වටිනාකම රු. මිලියන 1,005 ක් ලෙස වාර්තා වේ.

මුළු දේපල, පිරියත සහ උපකරණ
රු. මි. 1,005

ප්‍රාග්ධන වියදම් (2020)
රු. මි. 55

ATM වෙත ප්‍රවේශය
5,075

ශාඛා සංඛ්‍යාව
39

සංයුක්ත ශාඛා අවකාශය ව. අඩි.
105,524

ගොඩනැගිලි සහ කාර්යාල
රු. මි. 386

දේපල, පිරියත සහ උපකරණ

කොළඹ කොටුවේ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ දිවයින පුරා විසිරී ඇති ශාඛා 39 බැංකුවේ ඉතාම වැදගත් ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන වේ. වසර ගණනාවක් පුරාවටම බැංකුවේ ශාඛා ගොඩනැගිලි සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර රටේ සෑම ප්‍රදේශයකම ගනුදෙනුකරුවන් වෙත මූල්‍ය සේවා ලබා දීමට ඉන් සහාය සැලසී ඇත.

බැංකුවේ ප්‍රධාන කාර්යාලය වර්ග අඩි 29,344 ක බිම් ප්‍රදේශයක පිහිටා ඇති අතර, සමස්ථ ශාඛා ඉඩකඩ ව. අඩි 105,524 ක ක්ෂේත්‍රඵලයක් පුරා විහිදී ඇත.

මෙහි සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළදී වඩා ඉඩකඩ ඇති ශාඛා කාර්යාලයක් හරහා සේවා ලබා දීමේ අරමුණින් අපගේ අම්බලන්ගොඩ ශාඛාව වෙනත් ස්ථානයක් වෙත ගෙන යන ලදි. මීට අමතරව, විස්තීර්ණ හා වැඩිදියුණු කරන ලද ශාඛා පහසුකම් හරහා ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නංවනු පිණිස තිස්සමහාරාමය ශාඛාවද නවීකරණය කොට යළි විවෘත කරන ලදි. උපකරණ වෙනුවෙන් දරන ලද වියදම්වලට අමතරව ශාඛා නවීකරණය කිරීම වෙනුවෙන්ද 2020 වසරේදී බැංකුව රු. මිලියන 1.1 ක මුළු මුදලක් වැය කර තිබේ.

එමෙන්ම, අනාගතයේදී අපගේ ශාඛාවන් ව්‍යාප්තිය තවදුරටත් ඉහළ නැංවීම බැංකුවේ අපේක්ෂාවයි. කෙසේ වෙතත්, අතීතයේදී එච්ඩිඑෆ්සී බැංකුවට ඇතැම් සීමාකම්වලට මුහුණ පාන්නට සිදු වූ අතර, අනෙකුත් ආදායම් ඉහළ නංවා ගන්නා අතරම මෙහෙයුම් වියදම් අඩු කිරීම සහ ව්‍යාපාරික වර්ධනය ඉහළ නැංවීම තුළින් ඒ ආශ්‍රිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට බැංකුව අරමුණු කරයි. බැංකුවේ දේපල, පිරියත සහ උපකරණ අතරට රු. මිලියන 9.7 ක වටිනාකමකින් යුතු සින්නකර ඉඩමක්ද අයත් වේ.

වසර ගණනාවක් පුරාවට අපගේ බැංකුව කාර්යාල උපකරණ හා මෙවලම්, යන්ත්‍රෝපකරණ, තොරතුරු තාක්ෂණ දෘඩාංග, ගෘහභාණ්ඩ සහ පිරිද්දුම් ආදී වත්කම් වෙනුවෙන් විචක්ෂණශීලී ලෙස ආයෝජනය කර ඇති අතර ඉදිරියටත් එසේ කිරීමට කටයුතු කරනු ඇත. පරිගණක සහ අනෙකුත් උපකරණ වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 33 ක අතිරේක ආයෝජනයක් සිදු කිරීමට අමතරව බැංකුව කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ වෙනුවෙන් රු. මිලියන 22 ක් වියදම් කරන ලදි.

වාර්ෂික ක්ෂයවීම රු. මිලියන



තාක්ෂණික යටිතලපහසුකම්

2020 වසරේදී බැංකුව නවීන SD-WAN ජාලයක් වෙත මාරු වූ අතර, බැංකුවේ නවීකරණයන් සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් වර්ධනය පසුපස ඇති ප්‍රධානතම පදනම් ව්‍යුහය වන්නේ එයයි. මෙම සංක්‍රමණය සිදු කිරීමෙන් අනතුරුව බැංකුවේ ශාඛා සබැඳියාව උපරිම තලයකට ළඟා වී ඇත අතර මේ වන විට ශාඛා 39 ම ප්‍රධාන කාර්යාලය සමග තාක්ෂණික වශයෙන් සම්බන්ධ කර තිබේ.මේ නිසා දැන් විශාල දත්ත පරිමා තථ්‍යකාලීනව හුවමාරු කිරීමට අවකාශ උදා වී ඇත. මෙම විධිවිධානය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කරමින් ආපදා සහන පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමට ඉඩකඩ සලසන ලදි.

දෘඩාංග සහ මෘදුකාංගද ඇතුළත්ව තොරතුරු තාක්ෂණික යටිතලපහසුකම් නඩත්තු කිරීමේ මුළු පිරිවැය 2020 දී රු. මිලියන 65 ක් ලෙස වාර්තා වූ අතර බැංකුව තාක්ෂණික වශයෙන් නවීන හා අන්තර් සබැඳියාවෙන් යුතු මෙහෙයුම් ජාලයක් බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් අප විසින් වෙන් කර ඇති මුදල් ඉහළ යාම විමගින් පිළිබිඹු වේ. 2020 වසර තුළදී බැංකුව පරිගණක දෘඩාංග සහ මෘදුකාංග වෙනුවෙන් රු. මිලියන 40 කට අධික මුදලක් වැය කර තිබේ.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

බැංකුවේ ATM කාඩ්පත් හිමියන්ට රට පුරා විසිරී ඇති ATM යන්ත්‍ර 5,075 කට අධික ප්‍රමාණයක් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව ගනුදෙනුකරුවන් වෙත සලසා ඇත.

අස්පෘශ්‍ය වත්කම්

ඒවා නිශ්චිත වශයෙන්ම නිෂ්පාදිත ප්‍රාග්ධනය යටතට වර්ග කළ නොහැකි වුවද, අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකාර කණ්ඩ දෙකම වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමට පෙරමුණ ගනිමින් බැංකුවේ මූල්‍ය සේවා සැකසීමට පහසුවක් මෘදුකාංග සහ අන්තර්ජාල අවකාශ වෙතින් ලැබේ.

ඉදිරි පෙළ සහ පසු පෙළ මෙහෙයුම් නවීකරණය හා ඩිජිටල්කරණය කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව සිය වර්ධනය ඉලක්ක කර ගනිමින් මෘදුකාංග ආශ්‍රිත උපායමාර්ගික ආයෝජන සිදු කිරීමෙහි නිරතව සිටියි. කර්මාන්තයේ නවීකරණයන්ට අනුගත වන පරිදි උපරිම දත්ත සුරක්ෂිතතාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති සුරක්ෂිතතා මාර්ගෝපදේශවලට අනුකූලතාව දැක්වීම සහතික කරමින් පිළිගත් විකුණුම්කරුවන් වෙතින් ලබා ගනු ලැබෙන මෘදුකාංග ආශ්‍රිත ආයෝජනයන් ඉදිරියටත් සිදු කිරීමට බැංකුව පියවර ගනු ඇත.

ප්‍රාග්ධන වාර්තා

ස්වභාවික ප්‍රාග්ධනය



මෙම වාර්තාව පිළියෙළ කිරීමේ තවත් අරමුණක් වූයේ ඇතැම් ක්‍රියාකාරකම් නිසා පරිසරය වෙත ඉල්ලා වී ඇති බලපෑම නොසලකා හැරිය හැකි තරම් සුළු වුවද ස්වභාවික පරිසරයට කිසියම් ආකාරයක හෝ බලපෑමක් විල්ලා වී ඇති ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමයි. ප්‍රජා සංවර්ධනය වෙනුවෙන් කැප වූ බැංකුවක් වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව නිරතුරුව විශ්වාස කරන්නේ තිරසාර ව්‍යාපාරික පරිචයන් යොදා ගැනීම සහ පරිසරය සුරක්ෂිත කිරීම උදෙසා සැලකිය යුතු වගකීමක් තමන් සතුව පවතින බවයි.

එමෙන්ම, පරිසරය වෙත විල්ලා විය හැකි බලපෑම් අවම කිරීම උදෙසා ඒ ආශ්‍රිතව සලකා බැලිය යුතු කාරණා බැංකුවේ තීරණ හා මෙහෙයුම් තුළට ඒකාබද්ධ කිරීම ක්‍රමානුකූලව ඉහළ නැංවීමටද එච්ඩීඑෆ්සී බැංකුව කටයුතු සම්පාදනය කරමින් පවතී. මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වශයෙන් බැංකුව තිරසාර බැංකුකරණ මූලධර්මවලට (Sustainable Banking Principles) අත්සන් තබන ලදී. සංවර්ධනය සහ ප්‍රජාවන් හා පරිසරය සුරක්ෂිත කිරීම වෙනුවෙන් ධනාත්මක දායකත්වයක් ලබා දෙන බැංකුවල තිරසාර ආර්ථික වර්ධනය ප්‍රමුඛ ආධ්‍යාශය ලෙස තබා ගනිමින් ශ්‍රී ලංකා බැංකු සංගමය විසින් ඉහත කී තිරසාර බැංකුකරණ මූලධර්ම හඳුන්වා දෙන ලදී.

අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රතිචක්‍රීකරණය

පුවත් පත්, භාවිත කරන ලද කඩදාසි සහ කාර්ට්‍රිජ් ආදී සම්පත් නිසි පරිදි බැහැර කෙරෙන බව සහතික කරමින් ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට බැංකුව පියවර ගන්නා ලදී. 'Board PAC' හරහා විද්‍යුත් රැස්වීම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් කඩදාසි භාවිතය අඩු කිරීම වෙනුවෙන්ද බැංකුව දායක වී ඇත. මීට අමතරව, අනුමත කිරීම්ද විද්‍යුත් තැපෑල හරහාම ලබා ගැනීම දැනට සිදු කෙරේ. එමෙන්ම, එක් පැත්තක් පමණක් භාවිතයට ගෙන ඇති කඩදාසි අභ්‍යන්තර අරමුණු වෙනුවෙන් නැවත ප්‍රයෝජනයට ගනු ලැබේ.

බලශක්ති සංරක්ෂණය, කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්තිය

වගකීම්සහගත ආයතනික පුරවැසියෙකු වශයෙන් එච්ඩීඑෆ්සී බැංකුව විසින් බලශක්තිය සංරක්ෂණය කිරීම සහ තරමක් දුරට හෝ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අනලස් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලදී. කාර්යාල වේලාවෙන් අනතුරුව විදුලි උපකරණ ස්වයංක්‍රීයව ක්‍රියාවිරහිත කිරීම සඳහා හඳුන්වා දෙන ලද මධ්‍යගත හා මහල් පාදක විදුලි බල කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් පුද්ගලික පරිගණක, විදුලි

බුබුළු සහ වායුසමන යන්ත්‍ර ආදී විදුලි උපකරණ ආශ්‍රිත අනවශ්‍ය විදුලි පරිභෝජනය වැළැක්වීම උදෙසා ප්‍රධාන කාර්යාලය ආශ්‍රිතව ක්‍රියාමාර්ග ගෙන තිබේ. අනාගතයේදී බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පදනම මෙම උපායමාර්ගයෙන් සැපයේ.

බලශක්ති පරිභෝජනය සංරක්ෂණය කර ගැනීම සහ විදුලිබල කාර්යක්ෂමතාව උපරිමකරණය ඉලක්ක කර ගනිමින් වායුසමන යන්ත්‍ර ක්‍රියාත්මක කරනු ලබන්වේ උපරිම වායුසමන මට්ටම 24 ක් ලෙස පවත්වා ගනිමිනි. මීට අමතරව, බලශක්තිය සහ ඒ වෙනුවෙන් වැය වන පිරිවැය උපරිමයෙන් ඉතිරි කර ගැනීම උදෙසා සියලුම සාමාන්‍ය විදුලි බුබුළු වෙනුවට එල්ඊඩී බුබුළු යොදා ගැනීමට පියවර ගනිමින් තිබේ. එපමණක්ද නොව, කාර්යාල වාහන ගමන් කරන දුර ප්‍රමාණය අඩු කිරීම තුළින් ඉන්ධන භාවිතය අඩු කිරීමටද බැංකුව පියවර ගෙන තිබේ.

2020 වසරේදී ක්‍රියාත්මක කරන ලද ණය උත්පාදන පද්ධතිය හේතුවෙන් ලිපි ලේඛන ප්‍රවාහනය කිරීම සහ කූරියර් කිරීමේ අවශ්‍යතාව ඉවත් කෙරුණි. සෘජු දායකත්වයක් නොවූවද මෙයද ලිපි ලේඛන අනවශ්‍ය ලෙස ප්‍රවාහනය කිරීම අඩු වීමට හේතු වී ඇති අතර කාබන් විමෝචනය අඩු වීමට එමඟින් දායකත්වය ලැබී ඇත.

සූර්ය විදුලි පැනල 84 ක් වෙනුවෙන් බැංකුව ආයෝජනය කරන ලද අතර ඒවා හයිඩ් පාක් කෝනර් ශාඛාව ආශ්‍රිතව ස්ථාපනය කරන ලදි. මේ වන විට සියයට සියයක්ම ශාඛා මෙහෙයුම් සඳහා අවශ්‍ය විදුලි බලය සැපයීමට එම පැනල සමත් වේ. අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද මෙම ක්‍රියාදාමයේ සාර්ථකත්වය හේතුවෙන් එය අනෙකුත් ශාඛාවලද ක්‍රියාත්මක කිරීමට පියවර ගැනෙනු ඇති අතර එම කටයුතු 2021 දී කළුතර හා අම්පාර ශාඛා කාර්යාල ආශ්‍රිතව ආරම්භ කිරීමට නියමිතව ඇත.

සොබාදහම පෝෂණය කිරීම

සංඛ්‍යාත්මකව සුළු වශයෙන් වුවද හැකි පමණින් සොබා දහම් මාතාව පෝෂණය කිරීමට දායක වෙමින් බැංකුවේ ශාඛාවල ගනුදෙනුකරුවන් අතර පැළ බෙදා හැරීමටද පියවර ගන්නා ලදි.

ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණය

අනුකූලතාව පිළිබඳ සභාපතිතුමියගේ වාර්තාව

2020 වසර සඳහා වූ අපගේ ආයතනික පාලන වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

අපගේ ප්‍රවේශය

සමාගමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, බැංකුවේ ආයතනික පාලන පිළිවෙත් පිළිබඳ තොරතුරු විශාල වශයෙන් හෙළිදරවු කිරීම සඳහා ව්‍යාප්ත කරන ලදි. බැංකුවේ වාර්තා කට්ටලයෙන් කොටසක් ආයතනික පාලනය පිළිබඳ සවිස්තර වාර්තාවකින් සමන්විත වන අතර එය මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර තිබේ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන නායකත්වයට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් හා වගවීම නගා සිටුවීම සහ සාධාරණත්වය හා විනිවිදභාවය පිළිබඳ මූලධර්ම බැංකුව පුරාවටම පවත්වා ගැනීම අවශ්‍ය වේ. අතිශයින්ම නියාමනයට ලක් වූ සහ අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ බැංකුවේ ආයතනික පාලන කාර්ය රාමුව කාර්යක්ෂම සහ අදාළතාවයෙන් යුතුව පවතින බවද බැංකුව සහතික කරයි. කර්මාන්තයේ නියාමනයන් සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවල සහාය නියාමන රාමුව වෙත ලැබෙන අතර මෙය, ජාත්‍යන්තර නිසි පරිචයන්ට සාපේක්ෂව අභ්‍යන්තර සංවර්ධනයන්ට ඔබින පරිදි හැඩගැස්වීම සඳහා නිරතුරුව සමාලෝචනය කෙරේ.

වාර්තාකරණය

මේ අනුව, අනිවාර්ය පදනමක් මත එච්ඩීඩීවිෆ්සී බැංකුව ශ්‍රී විසින් නිකුත් කර ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අදාළ වන 2007 අංක 12 දරන බැංකු පනතේ විධිවිධාන (සහ ඉන් අනතුරුව ඊට සිදු කර ඇති සංශෝධනයන්) අනුගමනය කර තිබේ.

ආයතනික පාලන වාර්තාවේ එක කොටස යටතේ අපගේ අනුකූලතා තත්ත්වය වාර්තා කර ඇත.

මීට අමතරව, එච්ඩීඩීවිෆ්සී බැංකුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2017 දී නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ නිසි පිළිවෙත් සංග්‍රහයද අනුගමනය කරන අතර ආයතනික පාලන වාර්තාවේ දෙක කොටස යටතේ අප ඊට දක්වන අනුකූලතාවෙහි තත්ත්වය වාර්තා කර ඇත.

එපමණක්ද නොව, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ අපගේ අනුකූලතා තත්ත්වය (7.10 වගන්තිය යටතේ) මෙහි ආයතනික පාලන වාර්තාවේ තුන්වන කොටසින් දක්වා ඇත.

ස්වාධීනතාව සහතික කිරීම

එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලන නියමයන්ට බැංකුව දක්වන අනුකූලතාවට අදාළ බාහිර විගණන වාර්තාවේ ප්‍රතිඵලද අපි වාර්තා කරමු. ''ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පිළිවෙත් ප්‍රකාශනය 4400' යටතේ නිකුත් කර ඇති විගණකවරුන්ගේ සිද්ධිවාචක ප්‍රතිඵල ආශ්‍රිත සොයාගැනීම් සියල්ලම මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක
සභාපතිනි

2021 මැයි 21 දින කොළඹදී ය.

ආයතනික පාලනය

මනා ආයතනික චර්යා ධර්ම, නිසි සුපරීක්ෂාව සහ විගවීම යන මූලධර්ම බැංකුවේ යහපැවැත්ම හා තිරසාරතාව සඳහා අතිශයින්ම වැදගත් බව එච්ඩිඑෆ්සී බැංකුව සැලකිල්ලට ගනියි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කර ඇති ආයතනික පාලන උපදෙස්වලට මෙරට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන අප බැංකුව නිසි අනුකූලතාව දැක්වීමට කැප වී සිටියි.

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් වශයෙන් කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා විනිමය සුරුකුම්පත් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීමේ වැගකීමක් සහ බැඳීමක් එච්ඩිඑෆ්සී සතුව පවතින අතර 2020 වසරේදී එකී අනුකූලතා අවශ්‍යතා සියල්ලම ඉටු කොට තිබේ.

අදාළ නියාමන කාර්ය රාමුව වෙත නිසි අනුකූලතාව දැක්වීම තුළින් සියලු නියාමන අධිකාරීන් සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සහ අභිලාෂ ගරුකොට ගත් තීන්දු ගැනීමට හැකියාව බැංකුව වෙත ලැබේ. මහජන මුදල් සහ මූල්‍ය අභිලාෂ සුරක්ෂිත කිරීමේ වගකීම පැවරී ඇති මූල්‍ය මැදහත්කරුවෙකු වශයෙන් එච්ඩිඑෆ්සී බැංකුව කෙරෙහි ලැබී ඇති මහජන විශ්වාසය නගා සිටුවීම සඳහා නිසි පාලන පිළිවෙත් පැවතීම වැදගත් වේ.

නියාමන අවශ්‍යතා සහ ආයතනික පාලන පිළිවෙත් වෙත දක්වන අනුකූලතාව නිරතුරුව සමාලෝචනය කිරීමට ලක් කරන අධ්‍යක්ෂ මණ්ඩලය සහ උප කමිටු නියාමන රාමුව සහ උපදෙස්වලට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් ආරක්ෂාකාරීව කටයුතු කරයි. ආචාර ධාර්මිකභාවයෙන් සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීමේ වටිනාකම් මගින් බැංකුවේ ආයතනික පාලන රාමුව සහ අනුකූලතා අවශ්‍යතා නගා සිටුවීමද සිදු කෙරේ. එම අනුකූලතාව දැක්වීම සහ වගකීම්සහගත පාලන පිළිවෙත්වලට ගරුකොට කටයුතු කිරීම නිසා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරික අරමුණු කළමනාකාරණය කර ගැනීමට අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර සියල්ලම සම්බන්ධයෙන් විචක්ෂණශීලීව තීරණ ගැනීමේ අවස්ථාව අප වෙත හිමි වේ.

(අදාළ සෑම වගන්තියකටම අනුව නියාමන අනුකූලතාව දැක්විය යුතු කාරණා මෙහි 89 සිට 118 දක්වා පිටුවල ඉදිරිපත් කර තිබේ).

පාලනය සම්බන්ධ වැදගත් කරුණු

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය

2020 ජනවාරි 29 දින බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් පිහිටුවා ගන්නා ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු සහ ප්‍රධාන කළමනාකාරණ නිලධාරීන්ට අදාළ වගකීම් සහ අධිකාරිත්ව මට්ටම් පිළිබඳ පැහැදිලි බෙදා වෙන් කිරීමක් එම ප්‍රඥප්තිය මගින් සැපයේ. බලය සමබර ලෙස බෙදා දැක්වීමට අදාළ මගපෙන්වීමක් සහ ඉහළ මට්ටමේ පාලනයක් හා වගවීමක් පවත්වා ගැනීම සඳහා වූ පසුබිමක්ද එයින් හිමි වේ. සභාපති තනතුර සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවලට අදාළ විධිවිධාන දැක්වීමට අමතරව එකී අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය පරාසය හා වගකීම්ද නිශ්චය කර දැක්වේ. එපමණක්ද නොව, එම ප්‍රඥප්තිය කළමනාකාරීත්වයට අදාළ වගකීම්, අනුප්‍රාප්තික සැලසුම් සහ වැටුප් හා දීමනා ආදියද සවිස්තර ලෙස දක්වයි.

පාලන ව්‍යුහය

බැංකුවේ මෙහෙයුම් සඳහා දිගු කාලීන තිරසාරත්වක් ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි බැංකුවේ පාලන ව්‍යුහය පැහැදිලි ලෙස හඳුනා ගනියි.



බැංකුවේ මෙහෙයුම් සහ ඊට අදාළ කටයුතු සම්බන්ධ සමස්ථ අධීක්ෂණ වගකීම පැවරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ උපායමාර්ගික වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අධීක්ෂණය සහ නිසි මගපෙන්වීම සපයන උප කමිටු පහක සාමාජිකත්වයද දරති.

ආයතනික පාලනය

පාලන රාමුව

පාර්ශ්වකරුවන්ගේ අභිලාෂ සුරක්ෂිත කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් බැංකුව අභ්‍යන්තර මෙන්ම බාහිර නියාමන කාර්ය රාමු, ප්‍රමිති සහ පිළිවෙත් සංග්‍රහයන්ටද අනුකූලතාව දක්වයි. බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් අප බැංකුව පහත දැක්වෙන නීති සහ රෙගුලාසි වෙතද අනුකූලතාව දැක්වීම අවශ්‍ය වේ. බාහිර නීති සහ රෙගුලාසි ගරු කරමින් කටයුතු කරන අභිනව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් කිසිදු අයුරකින් එකී රෙගුලාසි, ව්‍යවස්ථාපිත නියමයන් හෝ මගපෙන්වීම්වලට පරස්පරතා මතු නොවේ.



අනෙකුත් නෛතික ව්‍යවස්ථාවන්ට දක්වන අනුකූලතාව

එච්ඩීඑෆ්සී බැංකුව මූල්‍ය, ගිණුම්කරණ හා මුදල් ගනුදෙනුවලට අදාළ පහත දැක්වෙන නෛතික ව්‍යවස්ථා සහ රෙගුලාසි වෙතද අනුකූලතාව දක්වයි.

- 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත (2003 අංක 15 දරන සහ 2011 අංක 45 දරන පනත්වලින් සංශෝධිත)
- 1949 අංක 58 දරන මුදල් නීති පනත
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත
- 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත
- 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
- 2002 අංක 14 දරන චිකතු කළ අගය මත බදු පනත
- 2005 අංක 5 දරන මුදල් පනත
- 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
- 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
- 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත සහ ඊට සිදු කරන ලද සංශෝධන

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හුදෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර 2020 දෙසැම්බර් මාසය වන විට අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකු ඊට ඇතුළත් විය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන අධ්‍යක්ෂවරු ස්වකීය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් දරන දැනුම්, නිපුණතා සහ අත්දැකීම් සම්භාරයකට උරුමකම් කියන අතිශයින් කාර්යශූර වෘත්තිකයෝ පිරිසක් වෙති.

ස්ත්‍රී පුරුෂභාව විශ්ලේෂණය



විශේෂඥතා විවිධත්වය



පුහුණු

2020 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද 'බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන් සඳහා පැවැත්වූ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම' පිළිබඳ පුහුණු වැඩමුළුවකට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගී විය.

(මූල්‍ය බුද්ධි ඒකකය - ශ්‍රී ලංකාව). සහභාගී වූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ:

1. ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය (සභාපතිනි)
2. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන
3. ආචාර්ය එස්. එන්. මොරායස්
4. පී. ඒ. එස්. ඒ. කුමාර මහතා
5. එල්. ඊ. සුසන්ත සිල්වා මහතා
6. ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

උපායමාර්ගික වශයෙන් වැදගත් කාරණාවක් ඉස්මතු වූ විට සැලසුම් කෙරෙන රැස්වීම් හුරුණුකොට සාමාන්‍ය රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මසකම රැස් වේ. සමස්ථයක් ලෙස ගත් විට 2020 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 17 ක් පවත්වන ලද අතර එම සියලුම රැස්වීම්වලට දින 14 කට පෙර පූර්ව දැනුම්දීම් සිදු කරන ලදි. විශේෂ හෝ හදිසි තත්ත්ව මත රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වන අවස්ථාවලදී එම පූර්ව දැනුම්දීම් කාල සීමාව ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වෙයි. එම සෑම රැස්වීමකදීම සාකච්ඡා කිරීමට නියමිත කාරණා දැක්වෙන න්‍යාය පත්‍රයක් අදාළ රැස්වීම්වලට පෙරාතුව අධ්‍යක්ෂවරුන් වෙත ලබා දේ.

2020 වසරේදී 'Board PAC' ඇසුරින් අභිනව විද්‍යුත්-රැස්වීම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදි. වැඩි පහසුව සහ ගබඩා කිරීමේ අරමුණු වෙනුවෙන් ලේඛන සහ ප්‍රතිපෝෂණ ඩිජිටල්කරණයට ලක් කිරීමට ඉඩකඩ දැන් එම පද්ධතිය මගින් සැලසේ.

දත්ත එන්ක්‍රිප්ට් කිරීම සහ අදළ ආරක්ෂණ ප්‍රතිපත්ති සහිත වීය ඉතා සුරක්ෂිත පද්ධතියකි. මෙම ඊද්‍රා-ජ්ඤ පද්ධතිය මගින් ක්ෂණික තීරණ ගැනීම් සඳහාද සහායක් ලැබෙන අතර, ජංගම ටැබ්ලට් උපාංග යොදා ගෙන ලේඛන තථ්‍යකාලීනව යාවත්කාල කිරීමටද ඉඩකඩ සලසන හෙයින් භෞතික වශයෙන් ලිපි ලේඛන බෙදාහදා ගැනීමේ අවශ්‍යතාව එමගින් අවම කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය (සහභාගිත්වය/සුදුසුකම්)

නම	2020.12.31 දිනට අධ්‍යක්ෂ ධුරයේ තත්ත්වය	සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	නාම යෝජනා කමිටු රැස්වීම්	මානව සම්පත්/වේතන කමිටුව	විධිබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	සම්බන්ධීකරණ පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණ කමිටුව
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති	16/16	05/05	04/04	01/01	-	05/05
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	17/17	01/01	04/04	-	06/06	-
ආචාර්ය එස්. එන්. මොරායස්	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	15/17	01/01	01/01	03/04	05/06	01/02
පී. ඒ. එස්. ඒ. කුමාර මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	12/12	04/04	03/03	02/02	04/04	-
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	09/09	02/02	01/01	02/02	02/02	01/01
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	09/09	01/01	03/03	02/02	02/02	01/01
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	08/09	-	-	-	-	03/03
ඩී. එම්. එස්. අභයගුණවර්ධන මහතා (විශ්‍රාමික)	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	03/03	-	-	-	-	-
රොහාන් ද සිල්වා මහතා (විශ්‍රාමික)	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	02/03	-	-	-	-	-
එන්. විජයනාදන් මහතා (විශ්‍රාමික)	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	05/06	-	-	02/02	-	-
ආර්. ඒ. චූලානන්ද මහතා (විශ්‍රාමික)	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	08/08	02/02	01/01	-	01/02	02/02

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

බැංකුවේ ආයතනික පාලනය සහ මෙහෙයුම් සවිබල ගැන්වීම වෙනුවෙන් නිරන්තර කැපවීමෙන් කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි.

- යටත් පිරිසෙයින් වසර තුනක කාල සීමාවක් සඳහා බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රමවේද/යාන්ත්‍රණ සහ ප්‍රමාණනය කළ හැකි ඉලක්ක ආදිය පිළිබඳ ව්‍යාපාරික උපායමාර්ගය සම්බන්ධ තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් මෙන්ම ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහාද අදාළ වන අධිකාරත්වය සහ වගකීම් තීරණය කරයි.
- බැංකුවේ අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ ඒකාබද්ධතාව සමාලෝචනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස්වලට අනුගත වන පරිදි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගැනීම සහ පත් කිරීම සම්බන්ධ වගකීම සහ අධීක්ෂණ බලයද පැවරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතය.
- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි බැංකුවේ කටයුතු සම්බන්ධ නිසි අධීක්ෂණය සිදු කරනු ලැබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.
- ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන නාලිකා පිහිටුවීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් රැස් වේ.

නාම යෝජනා සහ පත් කිරීම්

නව අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම සහ පත් කිරීමට අදාළ වූ ප්‍රතිපත්ති හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලබන්නේ නාම යෝජනා කමිටුව විසිනි.

එමෙන්ම, ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා වූ පත් කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු නිර්ණායක සහ ගුණාංග ස්ථාපිත කරන්නේද නාම යෝජනා කමිටුව විසිනි.

විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ අතිරේක හෝ අභිනව විශේෂඥතා හා අනුප්‍රාප්තික සැලසුම් සලකා බලමින් එම කමිටුව අදාළ නිර්දේශ ලබා දීමද (කලින් කලට) සිදු කරයි.

අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම

අදාළ නිර්ණායක සැලකිල්ලට ගනිමින් සහ 1997 අංක 07 දරන එච්ඩීඑෆ්සී බැංකු පනතට අනුකූල වන පරිදි නාම යෝජනා කමිටුව දැනටමත් සිටින අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම සම්බන්ධයෙන් අදාළ නිර්දේශ ඉදිරිපත් කරයි. අයදුම්කරුවන් විචක්ෂණ ලෙස ඇගයීමට ලක් කෙරෙන විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් ඔස්සේ එය සිදු කෙරේ.

අධ්‍යක්ෂවරුන් ස්වකීය වගකීම් ක්‍රියාත්මක කිරීමේදී පළ කරන කාර්යසාධනය සහ දායකත්වයන් සලකා බැලීමද නාම යෝජනා කමිටුව සිදු කරයි.

අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

සෑම අධ්‍යක්ෂවරයෙකුම/වරියකම සිය රාජකාරී භාර ගැනීමට ප්‍රථමයෙන් බැංකුවේ සහ බැංකුවට අදාළ කාරණා සම්බන්ධ රහස්‍යභාවය ආරක්ෂා කරන බවටත්, එච්ඩීඑෆ්සී බැංකු පනතේ 34 වගන්තිය යටතේ නිශ්චය කර දක්වා ඇති අවස්ථාවල හැර අන් කිසිදු අවස්ථාවක බැංකුවේ ගනුදෙනුවලට අදාළ තොරතුරු කිසිවක් හෙළිදරවු නොකරන බවටත් ප්‍රතිඥා දෙමින් ප්‍රකාශනයකට අත්සන් තබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ උප කමිටු

ආයතනික පාලනය සවිමත් කිරීමේ අරමුණ වෙනුවෙන් සහ කමිටුවලට සුවිශේෂී කාරණා හසුරුවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු පහක් පිහිටුවා ඇත. මෙම උප කමිටු නිරන්තර පදනමක් මත රැස් වූ අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. මෙම ඒ ඒ කමිටු විසින් ශ්‍රී ලංකා මහ බැංකු නියාමනයන්ට අනුකූලව යොමු කිරීමේ අනුදේශ යොදා ගෙන ඇත.

- විගණන කමිටුව
- මානව සම්පත් හා වැටුප් කමිටුව
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- නාම යෝජනා කමිටුව
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ සමාලෝචන කමිටුව

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකා

ආයතනික පාලනය සම්බන්ධ නිසි පිළිවෙත් යොදා ගැනීම සහ ඒවාට අනුකූලව කටයුතු කිරීම සඳහා මනා බල සමබරතාවක් පවත්වා ගනු පිණිස සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා දෙක එකිනෙකින් වෙන් කර තිබේ. සභාපතිනියගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්, එච්ඩිඑෆ්සී පනත සහ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූල වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුව බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරික කටයුතු ආශ්‍රිත දෛනික කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරන ඉහළම අධිකාරිය වන්නේ ප්‍රධාන විධායක නිලධාරී වේ. ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන්ද කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් නිසි පරිදි ක්‍රියාත්මක කරමින් සඵලදායී ලෙස කටයුතු කරන බව සහතික කරමින් සභාපතිතුමා/තුමිය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි.

සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබෙන සමාගම් ලේකම් අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා වෙත උපදෙස් හා සේවාවන් ලබා දෙයි. ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවල නිශ්චය කර දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වා ගනු ලබන්නේද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සමාගම් ලේකම් විසිනි. ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස් හිමියන්ගේ රැස්වීම් උදෙසා ලේකම් සේවාවන් ලබා දීම සහ ව්‍යවස්ථාපිත රෙගුලාසි යටතේ අනිවාර්ය කර ඇති කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් වගකීම සමාගම් ලේකම් සතු වේ. සමාගම් ලේකම් විසින් ලබා දෙන වෘත්තීය සේවා සහ උපදේශනයන් ලබා ගැනීමේ අවස්ථාව සෑම අධ්‍යක්ෂවරයෙකුම වෙත හිමි විය යුතු වේ. පවත්වන ලද රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා වෙත ප්‍රවේශය සහිතව අදාළ වාර්තා පවත්වා ගැනීමද සමාගම් ලේකම් විසින් සිදු කළ යුතු බව අපේක්ෂිතය.

අදාළ නියාමන උපදෙස් සහ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූල වන පරිදි සභාපති වෙත සහයෝගය ලබා දීම සහ වාර්ෂික මහා සභා රැස්වීම් හා අති විශේෂ මහා සභා රැස්වීම් පැවැත්වීම තුළින් ආයතනික පාලනයට සහාය වීම සම්බන්ධයෙන් සමාගම් ලේකම් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. නියාමන අධිකාරීන් සමග නිසි සන්නිවේදනයන් පවත්වා ගැනීමේ වගකීම පැවරෙන්නේද සමාගම් ලේකම්වරිය වෙතයි.

ආයතනික පාලනය

අනුකූලතා සමාලෝචනය

2020 මූල්‍ය වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චය කර ඇති ආයතනික පාලන කාර්ය රාමුව, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව වෙත එච්ඩීඑෆ්සී බැංකුව දක්වා ඇති අනුකූලතා තත්ත්වය මින් ඉදිරියට විස්තර කෙරේ.

එක කොටස:

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා පනවා ඇති ආයතනික පාලන රාමුවට අනුකූලතාව දැක්වීම.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
3(1)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සුරක්ෂිතතාව හා සවිමත්භාවය සවිබල ගන්වා ඇති බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද	
	අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් බැංකුවට පුරාවටම සන්නිවේදනය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** උපායමාර්ගික අරමුණු සහ වටිනාකම් 2017-2020 කාල සීමාව සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්මට අන්තර්ගත කර තිබේ. 2020 අයවැය පිළියෙළ කරන ලද්දේ එම ආයතනික සැලැස්ම මත පදනම්ව වන අතර ඒ දෙකම සාකච්ඡා කොට බැංකුව පුරාවටම සන්නිවේදනය කිරීමට පියවර ගන්නා ලදි. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2021-2025 කාල සීමාව සඳහා වූ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කර ඇති අතර එය 2020 වසරේදී අනුමත කරන ලදි.
	ආ) බැංකුවේ සමස්ථ ව්‍යාපාරික උපායමාර්ගයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දීම. සමස්ථ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රමවේද සහ යාන්ත්‍රණයන් බැංකුවේ සමස්ථ ව්‍යාපාරික උපායමාර්ගයට ඇතුළත් වන අතර ඒවා නිසි පරිදි ලේඛනගත කර තිබීම. යටත් පිරිසෙයින් ඉදිරි වසර තුනක කාලය සඳහා වූ මිනුම්ගත කළ හැකි ඉලක්ක බැංකුවේ සමස්ථ ව්‍යාපාරික උපායමාර්ගයට අන්තර්ගත වීම.	**අනුකූලතාව දක්වා ඇත** 2017-2020 අතර කාලය සඳහා වූ සමස්ථ ව්‍යාපාරික උපායමාර්ගය ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්මක් පවතී. එපමණක්ද නොව, 2021 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2020 මාර්තු 3 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි. ආයතනික සැලැස්මට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ප්‍රතිපත්තිය, අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් දරාගත හැකි සීමාව යනාදියද අනුමත කර තිබේ.
	ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනා ගෙන ඇති අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා වන පද්ධති විචක්ෂණශීලී වන අතරම නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලැබීම.	**අනුකූලතාව දක්වා ඇත** අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලද අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි. බැංකුවට අදාළ ප්‍රධාන අවදානම් කළමනාකරණය කිරීම, නිරීක්ෂණය කිරීම සහ අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වූ පාලන ව්‍යුහය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ස්ථාපිත කෙරේ.
	ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන් කොටස් හිමියන් සහ ණය ගැනුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමග සිදු කෙරෙන සන්නිවේදනයන් සඳහා වූ ප්‍රතිපත්තියත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කරනු ලැබීම.	**අනුකූලතාව දැක්විය යුතු** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොමැත. කෙසේ වෙතත්, බැංකවේ විවිධ පාර්ශ්වකාර කණ්ඩායම් සමග සන්නිවේදනය කිරීම සඳහා වෙබ් අඩවිය සහ අනෙකුත් සන්නිවේදන නාලිකා බැංකුව සතුව තිබේ.
	ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ප්‍රමාණාත්මතාව සහ ඒකාබද්ධතාව සමාලෝචනය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධති ආශ්‍රිතව පැහැදිලි කරන ලද අභ්‍යන්තර විගණන කමිටුවේ කාලික වාර්තා විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර තිබේ.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ඊ) ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවල දක්වා ඇති පරිදි (1) ප්‍රතිපත්ති වෙත සැලකිය යුතු බලපෑමක් චල්ල කිරීමට, (2) ක්‍රියාකාරකම් මෙහෙයවීමට සහ (3) ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය අරබයා පාලනය ක්‍රියාවේ යෙදවීමට බලයලත් තනතුරුවල සිටින ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගෙන ඔවුන් පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්හි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගෙන ඔවුන් පත් කර තිබේ.
	උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යභාරය සුදුසු පරිදි අධීක්ෂණය කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුකූල වීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් කාර්යසාධන වාර්තා සලකා බලන ලද අතර අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා කලින් කල නිරීක්ෂණයන් සිදු කරන ලදි.
	ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් මෙන්ම ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහාද අදාළ වන අධිකාරත්වය සහ වගකීම් තීරණය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** ආයතනයට අදාළ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීමේ වගකීම එච්ඩිඑෆ්සී පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මේ අනුව, ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ ඉලක්ක සමස්ථ අයවැය ඉලක්ක සහ අදාළ දෙපාර්තමේන්තු ඉලක්ක සමග සබැඳී ඇත. මේ අනුව, 2020 වසර සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක පිහිටුවා ඇත. එමෙන්ම, පැහැදිලි කිරීම් කිසිවක් අවශ්‍ය වේ නම් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට කැඳවනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ වගකීම් ඔවුන්ට අදාළ රැකියා විස්තරවල නිශ්චය කොට දක්වා ඇති අතර ඔවුන්ට පැවරෙන අධිකාරීත්වයන් අධිකාරීත්ව සීමා පැවරීම යටතේ පැහැදිලි කර තිබේ.
	එ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සාමාජිකයන්ගේ පාලන පිළිවෙත්වල කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කර තිබේ. මේ අතරට: (1) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීම, (2) පිළිබැඳියා ගැටුම් කළමනාකරණය කර ගැනීම සහ (3) දුර්වලතා හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී සුදුසු වෙනස්කම් සිදු කිරීම ආදිය ඇතුළත් වීම.	**අනුකූලතාව දක්වා ඇත** ස්ව-ඇගයීම් ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතින අතර අධ්‍යක්ෂවරුන්ගේ පාලන පිළිවෙත් ඇගයීම ඊට ඇතුළත් වේ. 2020 වසර සඳහා වූ ස්වයං-ඇගයීම 2021 ජනවාරි මාසයේදී සිදු කරන ලද අතර, එය සමාලෝචනය කොට දුර්වලතා පවතින ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා එහි සාරාංශයක් 2021 පෙබරවාරි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ද ඇතුළත් සේවකයන් බඳවා ගැනීම සහ ඔවුන් උසස් කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්තියක් 2019 දී පිහිටුවා ගන්නා ලදි.
	ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අදාළ වන අනුප්‍රාප්තික සැලැස්මක්ද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක වෙමින් පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 පෙබරවාරි 14 දින 2019 වසර සඳහා වූ අනුප්‍රාප්තික සැලැස්මක් අනුමත කරන ලද අතර එය 2019.10.21 දින සංශෝධනය කරන ලදි.
	ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග නිරන්තර රැස්වීම් සැලසුම් කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් බැංකුවේ උපායමාර්ගය, ප්‍රතිපත්තිවල කාර්යසාධනය සහ ස්වකීය විෂය පරාසවලට අදාළ වන වෙනත් කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම් සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ක) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ බැංකුව සිය නියාමකයන් සමඟ හිතකර සබඳතාවක් පවත්වා ගනු ලැබෙන බව සහතික කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පියවර සහ ක්‍රමවේද ක්‍රියාත්මක කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ බැංකුව සිය නියාමකයන් සමඟ හිතකර සබඳතාවක් පවත්වා ගනු ලැබෙන බව සහතික කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පියවර සහ ක්‍රමවේද ක්‍රියාත්මක කර තිබේ.
	ග) බාහිර විගණකවරුන්ගේ සේවය ලබා ගැනීම සහ ඔවුන් අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ හිමිකාරත්වයෙන් 51% ක් රජයේ පොදු ව්‍යාපාර වෙත පැවරෙන හෙයින් මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එච්ඩීඑෆ්සී බැංකු පනතට අනුව බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපති ජනරාල් ය.
3(1)(ii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කර තිබීම. සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරුවලට අදාළ කාර්යභාරයන් හා වගකීම් මෙම අධ්‍යක්ෂවරුන් විසින් පනවා ඇති 3(5) නියමයට අනුකූල වීම.	**අනුකූලතාව දක්වා ඇත** බලය වෙන් කර තැබීම උදෙසා එච්ඩීඑෆ්සී බැංකු පනත මගින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දෙක එකිනෙකින් වෙන් කර දක්වා ඇත. ඒ අනුව, බැංකුවේ සභාපතිනිය පත් කර ඇත්තේ එච්ඩීඑෆ්සී පනතට අනුකූලවය. කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී පත් කරනු ලබන්නේද අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. එකී තනතුරුවල වගකීම් සහ කාර්යභාරය එච්ඩීඑෆ්සී පනතෙහි පැහැදිලිව නිශ්චය කර දක්වා ඇත. එච්ඩීඑෆ්සී බැංකුවේ පාලන රාමුව නිර්ණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 ජනවාරි 29 දින පිහිටුවා ගන්නා ලදි.
3(1)(iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර පදනමක් මත රැස් වී ඇති අතර, ආසන්න වශයෙන් මාසික විරාම සහිතව යටත් පිරිසෙයින් වසරකට දෙවතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වා ඇති අතර අවශ්‍යතා මතු වූ විට විශේෂ රැස්වීම්ද පැවැත්වීමට සැලසුම් කර තිබේ. 2020 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 17 ක් පවත්වන ලදි.
3(1)(iv)	විවිධ කාරණා සහ යෝජනා බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනය සහ අවදානම් කළමනාකරණය හා බැඳී ඇති විට වීවා නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නඩය පත්‍රයන්ට ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන් සියලුම දෙනාට ඉඩකඩ සලසන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** රැස්වීම් නඩය පත්‍ර පිළියෙළ කරන ලෙස සභාපතිනිය විසින් සමාගම් ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලද අතර, සභාපතිනිය සහ සමාගම් ලේකම්ගේ උපදේශනයන් ලබා ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරු සියලුම දෙනා ස්වකීය කාරණා ඇතුළත් කිරීමට නිදහස ලැබූහ.
3(1)(v)	රැස්වීම්වලට සහභාගී වීමට අවස්ථාව සෑම අධ්‍යක්ෂවරයෙකුම වෙත ලබා දෙනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට දින 7කට පෙරවත් ඒ පිළිබඳ දැනුම්දීම සිදු කර ඇත. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සියල්ලටම අදාළවද පූර්ව දැනුම්දීම් සිදු කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** රැස්වීම් පිළිබඳ පූර්ව දැනුම් දීම්, නඩය පත්‍ර සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නියම කරන ලද කාලය තුළදී බෙදා හරින ලදි.
3(1)(vi)	ආසන්නතම පූර්වගාමී මාස 12 ක කාලයක් තුළ පැවැත්වුණු රැස්වීම්වලින් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක් සඳහාවත් සහභාගී නොවී තිබුණු හෝ එක දිගට පැවැත්වුණු රැස්වීම් තුනකට සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි පියවර ගන්නා ලදි. සහභාගීත්වයක් ලෙස පිළිගත හැකි විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලට සහභාගී වීම.	**අනුකූලතාව දක්වා ඇත** 2020 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා අවශ්‍ය රැස්වීම් සංඛ්‍යාවට සහභාගී වී ඇත.
3(1)(vii)	1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන සන්තෘප්ත කරන සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබා දීමේ සහ අනෙකුත් නියාමන රෙගුලාසිවල දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීමේ මූලික වගකීම දරන අයෙකු සමාගම් ලේකම් ලෙස පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධානවලට අනුකූල වන පරිදි අදාළ සුදුසුකම් සපුරා ඇති නීතීඥවරියක සමාගම් ලේකම් ලෙස පත් කර තිබිණ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලේකම් සේවා ලබා දීම සහ අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසිවල දක්වා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ වගකීම ඇය සතු වේ. එමතුද නොව, සමාගම් ලේකම් ලෙස කටයුතු කිරීමට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇය 2020 දෙසැම්බර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් ලෙස පත් කර තිබේ.
3(1)(viii)	සමාගම් ලේකම් විසින් ලබා දෙන වෘත්තීය සේවා සහ උපදේශනයන් ලබා ගැනීමේ අවස්ථාව සෑම අධ්‍යක්ෂවරයෙකුම වෙතම ලබා දීම.	**අනුකූලතාව දක්වා ඇත** සමාගම් ලේකම්ගේ සේවාව සහ උපදේශනය ලබා ගැනීමේ අවස්ථාව අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා වෙනුවෙන් පවතී.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(1)(ix)	සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලැබෙන අතර, අධ්‍යක්ෂවරුන්ට එම වාර්තා විමර්ශනය කිරීමට ඉඩ සලසන ක්‍රමවේදයක් පැවතීම.	**අනුකූලතාව දක්වා ඇත** සමාගම් ලේකම් විසින් සියලුම රැස්වීම් වාර්තා පවත්වා ගනු ලැබෙන අතර අතීත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පත්‍රිකා සහ වාර්තා පරිශීලනය කිරීමට අවස්ථාව තිබේ.
3(1)(x)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවකට පහත කාරණා හෝ ඒවාට යොමු කිරීම් ඇතුළත් වීම: අ) අධ්‍යක්ෂ මණ්ඩලය ස්වකීය තීරණ ගැනීමේදී යොදා ගෙන ඇති දත්ත හා තොරතුරු පිළිබඳ සාරාංශයක්. ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කාරණා. ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය රාජකාරි නිසි සුපරීක්ෂාව සහ විචක්ෂණශීලීත්වය සහිතව ඉටු කර තිබේද යන්න නිරූපණය කෙරෙන ප්‍රතිවිරෝධයන්ට අදාළ ගැටලු සහ කරුණු සෙවීමේ සාකච්ඡා. ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්තිවලට සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දක්වා ඇති බව හැඟවෙන කාරණා. ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ වටහා ගැනීම සහ යොදා ගෙන ඇති අවදානම් කළමනාකරණ විධිවිධාන පිළිබඳ දළ සාරාංශයක්. (ඊ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ යෝජනා.	**අනුකූලතාව දක්වා ඇත** අවශ්‍ය තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල දක්වා ඇත. එනම්, (i) නිශ්චිත මාතෘකා සම්බන්ධයෙන් ගෙන ඇති ව්‍යාපාරික තීරණ (ii) විශේෂිත මාතෘකා පිළිබඳව සම්මත කරගෙන ඇති යෝජනා (iii) අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල නිර්දේශ (iv) කාරණා සම්බන්ධයෙන් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ සහ කාර්යසාධන සමාලෝචනය
3(1)(xi)	සාධාරණ ඉල්ලීමක් සිදු කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ වියදමින් සුදුසු අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදේශන ලබා ගැනීමට ඉඩ සලසන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රමවේද පැවතීම.	**අනුකූලතාව දක්වා ඇත** අවශ්‍යතා ඇති විට ස්වාධීන වෘත්තීය උපදේශනය ලබා ගැනීමට නිදහස අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
3(1)(xii)	අධ්‍යක්ෂවරුන්ට අදාළ පිළිබැඳියා ගැටුම් හා සබැඳි හෝ එවැනි පිළිබැඳියා ගැටුම් ඇති වීමට හැකියාවක් ඇති කාරණා සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම සඳහා සහ එකී කාරණා හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විසඳා ගැනීම උදෙසා ක්‍රමවේදයක් පැවතීම. කිසියම් අධ්‍යක්ෂවරයෙකු/වරියක තමන් හෝ තමන්ගේ සමීප ආශ්‍රිතයෙකු තුළ සැලකිය යුතු මට්ටමේ අභිලාෂයක් ඇති කවර හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී තිබේද යන්න පරීක්ෂා කිරීම. ඔහු/ඇය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍ර අයිතමයට අදාළ ඝන පූරණය සඳහා ගණනය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත**
3(1)(xiii)	බැංකුවේ දිශානතිය සහ පාලනය ස්ථිර ලෙසම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරීත්වය යටතේ පවතින බව හඳුනා ගැනීම සඳහා තීරණ ගැනීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විශේෂයෙන් පැවරී ඇති කාරණා පිළිබඳ විධිමත් සැලැස්මක් මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** ආරම්භක වශයෙන් 2013.07.23 දින පිහිටුවා ගන්නා ලද අධිකාරත්ව ආකෘතිය ක්‍රියාත්මකව තිබේ. ඉන් අනතුරුව එම අධිකාරත්ව ආකෘතිය සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට ඇතුළත් කර තිබේ.
3(1)(xiv)	බැංකුව සිය වගකීම් ඉටු කිරීමට අපොහොසත් බව හෝ එසේ වීමට ඉඩකඩ ඇති බව හෝ නුබුන්වත් බවට පත් වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන් හෝ වෙනත් ණයකරුවන් හේතුවෙන් ගෙවීම් අත්හිටුවීමට ආසන්න බව සැලකිල්ලට ලක් වන්නේ නම් කවර හෝ තීන්දුවක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර අදාළ තත්ත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ දැනුම්වත් කර ඇති බව.	**අනුකූලතාව දක්වා ඇත** බැංකුව නුබුන්වත් බවට පත් වීම සම්බන්ධයෙන් සැක පහළ කෙරුණු අවස්ථා කිසිවක් නොවීය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති මාසික මූල්‍ය ප්‍රකාශන බැංකුවේ තත්ත්වය සනාථ කරයි.
3(1)(xv)	මුදල් මණ්ඩලය මගින් අවශ්‍ය කෙරෙන මට්ටම් දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව ප්‍රාග්ධනීකරණය කර ඇත.	**තරමක් දුරට අනුකූලතාව දක්වා ඇත** බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතික අවශ්‍යතා ඉටු කර ඇත. රු. බිලියන 5 ක අවම ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවට බැංකුව අනුකූලතාව දක්වා ඇත. කෙසේ වෙතත්, 2019 අංක 05 දරන බැංකු පනතේ 02 වගන්තියේ නියමයට අනුව 2020.12.31 දින වන විට බැංකුව රු. බිලියන 7.5 ක් වූ අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉටු කළ යුතු වේ. කෙසේ වෙතත්, එම නියාමන අවශ්‍යතාව ඉටු කළ යුතු කාලය 2022 වර්ෂයේ අග දක්වා දීර්ඝ කරන ලදි.

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(1)(xvi)	එකී නියමයන් අතරින් 3 වන නියමයට දක්වන අනුකූලතාව පිළිබඳ විස්තර දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් පළ කරයි.	**අනුකූලතාව දක්වා ඇත** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලන නියමයට දක්වන අනුකූලතාව පිළිබඳ විස්තර ඇතුළත් ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ.
3(1)(xvii)	සෑම අධ්‍යක්ෂවරයෙකුම විසින් වාර්ෂිකව ඉටු කළ යුතු ස්වයං-ඇගයීම් ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති අතර එකී ඇගයීම් පිළිබඳ වාර්තාවක් පවත්වා ගනියි.	**අනුකූලතාව දක්වා ඇත** එම ස්වයං-ඇගයීම 2021 පෙබරවාරි 24 දින සිදු කරන ලදි. එමෙන්ම, අධ්‍යක්ෂවරුන් වෙතින් ඔවුන්ට අදාළ ස්වයං-ඇගයීම ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් බැංකුවේ පවතින අතර සමාගම් ලේකම් වාර්ෂිකව අධ්‍යක්ෂවරුන් සියලුම දෙනාගෙන් එකී ඇගයීම් පෝරම ලබා ගනියි.
3(2)	**අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**	
3(2)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ 7 කට නොඅඩු සහ 13 කට නොවැඩි අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකින් වීම.	**තරමක් දුරට අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලය 7 කට නොඅඩු සහ 13 කට නොවැඩි අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකින් සමන්විත විය. කෙසේ වෙතත්, 2020 ජූලි මාසය දක්වා බැංකුව එකී අවශ්‍යතාව ඉටු කර නොතිබිණ.
3(2)(ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂවරයෙකු හැර අන් කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නමය නොඉක්මවිය යුතුය.	**අනුකූලතාව දක්වා ඇත** 2020 වසර අවසානය වන විට කිසිදු අධ්‍යක්ෂවරයෙකු වසර නමයක සේවා කාලය ඉක්මවා නොතිබිණ.
	(ආ) කවර හෝ අධ්‍යක්ෂවරයෙකු වසර නමයකට අධික කාලයක් සේවය කරමින් සිටින්නේ නම් අදාළ සංක්‍රාන්ති විධිවිධාන අනුගමනය කර ඇතිද යන්න පරීක්ෂා කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවට අනුව කිසිදු අධ්‍යක්ෂවරයෙකු වසර නමයක සේවා කාලය ඉක්මවා නොතිබිණ.
3(2)(iii)	ප්‍රධාන විධායක නිලධාරිද ඇතුළුව විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් එක නොඉක්මවිය යුතුය.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.
3(2)(iv)	යටත් පිරිසෙයින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ යන දෙකෙන් ඉහළ ස්වාධීන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව සිටීම. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට පහත කාරණා අදාළ වේ නම් ඔවුන් ස්වාධීන වන්නේද යන්න පිරික්සා බැලීම:	**අනුකූලතාව දක්වා ඇත** 2020.12.31 දින වන විට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත විය. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී නිසි අනුකූලතාව දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රමාණවත් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකින් සමන්විත විය.
	අ) බැංකුවේ සියයට 1 කට වඩා වැඩි සෘජු හෝ වක්‍ර කොටස් හිමිකාරත්වයක් දැරීම	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**
	ආ) මෙහි මින්මතු 3(7) නියමයෙහි විස්තර කර ඇති පරිදි දැනට බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ක් ඉක්මවන කවර හෝ ව්‍යාපාරික ගනුදෙනුවක් තිබෙන්නේද හෝ අධ්‍යක්ෂවරයෙකු/වරියක වශයෙන් පත් කිරීමට ආසන්නතම පූර්වගාමී වසර දෙකක කාලයක් තුළදී එවැනි ගනුදෙනු සම්බන්ධතාවක් පැවතී ඇතිද යන වග.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**
	ඇ) අධ්‍යක්ෂවරයෙකු/වරියක ලෙස පත් කිරීමට ආසන්නතම පූර්වගාමී වසර දෙක කාලය තුළ බැංකුවේ සේවකයෙකු ලෙස කටයුතු කර තිබේද යන වග.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**
	ඈ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු/වරියක, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ නිලධාරී මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ බැංකුවේ හෝ වෙනත් බැංකුවක සැලකිය යුතු මට්ටමේ කොටස් හිමියෙකු වෙත සමීප සම්බන්ධයක් තිබුණේද යන වග. (මෙම අරමුණ සඳහා ''සමීප සම්බන්ධයක්'' යන්නෙන් අදහස් වන්නේ කලත්‍රයෙකු හෝ තමන්ගෙන් යැපෙන දරුවන් සිටීම වේ).	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**
	ඉ) බැංකුවේ සුවිශේෂී පාර්ශ්වකාරත්වයක් නියෝජනය කිරීම.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ඊ) පහත කාරණා අදාළ වන සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්හිමියෙකු වන්නේද යන්න: I. මෙම නියමයන් අතරින් 3(7) නියමයෙහි දක්වා ඇති පරිදි දැනට බැංකුව සමග ගනුදෙනුවක් පවත්වමින් සිටින, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ක් ඉක්මවන සමාගමක් II. බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවකයන් හෝ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරන හෝ සැලකිය යුතු කොටස් හිමියන් වන සමාගමක් III. බැංකුවේ වෙනත් කවර හෝ අධ්‍යක්ෂවරයෙකු මෙම නියමයන් අතරින් 3(7) නියමයෙහි දක්වා ඇති ආකාරයේ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනුවක් පවත්වමින් සිටින සමාගමක්	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය**
3(2)(v)	කිසියම් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්පයක් ලෙස වෙනත් අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති අවස්ථාවකදී එකී පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරුන්ට අදාළ නිර්ණායක සන්තෘප්ත කරන්නේද යන්න පරීක්ෂා කිරීම.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය** එවැනි අධ්‍යක්ෂවරයෙකු පත් නොකරන ලදී.
3(2)(vi)	ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා ක්‍රියාවලියක් බැංකුව සතුව තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ අධ්‍යක්ෂවරු සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
3(2)(vii)	බැංකුව විසින් නිශ්චය කර ඇති ඝන පූරණයට අධ්‍යක්ෂවරුන්ගෙන් 50% ක් ඇතුළත් විය යුතු බව සහ එම ඝන පූරණයෙන් 50% ක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම.	**කදපවකසඃ අසඵය** බැංකුවේ අධ්‍යක්ෂවරු සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
3(2)(viii)	සභාපතිගේ, විධායක අධ්‍යක්ෂවරුන්ගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය අධ්‍යක්ෂ කාණ්ඩය අනුව වාර්ෂික ආයතනික පාලන වාර්තාවෙහි හෙළිදරවු කිරීමට බැංකුව කටයුතු කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ඔවුන්ගේ තොරතුරු 2020 වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කර තිබේ.
3(2)(ix)	අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියා පටිපාටියක් තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කරනු ලබන්නේ එච්ඩිඑෆ්සී පනතේ 03 වගන්තියට අනුකූලවය. ඊට වැඩිමනත් වශයෙන් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියද අදාළ වේ.
3(2)(x)	අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලැබෙන සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන් පත් කිරීමෙන් අනතුරුව එළඹෙන පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ ඡන්දය දීමට යටත් වීම.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය** එවැනි තත්ත්වයක් උදා නොවීය.
3(2)(xi)	කිසියම් අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වන විට හෝ තනතුරින් ඉවත් කෙරෙන විට, අධ්‍යක්ෂ මණ්ඩලය පහත පියවර ගැනීම: අ) අදාළ අධ්‍යක්ෂවරයා/වරියගේ ඉල්ලා අස්වීම හෝ තනතුරින් ඉවත් කිරීම නිවේදනය කිරීම සහ අදාළ අධ්‍යක්ෂවරයා සහ බැංකුව අතර කවර හෝ විසම්මුතියක් වේ නම් ඊට අදාළ තොරතුරු ඇතුළත්ව එහෙත් ඊට සීමා නොවී එකී හේතුද හෙළිදරවු කරීමට කටයුතු කළ යුතුය, සහ ආ) කොටස් හිමියන්ගේ අවධානයට ලක් කළ යුතු කාරණා කිසිවක් තිබේද නැද්ද යන්න සනාථ කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	**අනුකූලතාව දක්වා ඇත** ප්‍රසිද්ධ දැනුම්දීම් කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රසිද්ධ දැනුම්දීම් සිදු කෙරේ.
3(2)(xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු/වරියක හෝ සේවකයෙකු වෙනත් බැංකුවක තනතුරක් සඳහා පත් කර, තෝරා ගෙන හෝ නම් කර තිබෙන්නේද යන්න හඳුනා ගැනීමට ක්‍රමවේදයක් පැවතීම.	**අනුකූලතාව දක්වා ඇත** වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන කිසි ප්‍රකාශනයන් මත පදනම්ව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර, තෝරා පත් කර හෝ නම් කර තිබේද යන්න හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රියාවලියක් බැංකුව සතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුවද අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ ඔවුන් සතු සුදුසුකම තක්සේරු කරයි.

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(3)	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම තක්සේරු කිරීම සඳහා වූ නිර්ණායක.**	
3(3)(i)	අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන පුද්ගලයෙකුගේ වයස අවු. 70 නොඉක්මවන බව පරීක්ෂා කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** වයස අවු. 70 ඉක්මවූ අධ්‍යක්ෂවරුන් කිසිවෙකු නොමැත.
	අ) සංක්‍රාන්තිමය විධිවිධානවලට අනුකූලතාව දක්වා ඇතිද යන්න.	**අවශ්‍යතාවක් ඉස්මතු නොවිය** එවැනි තත්ත්වයක් උදා නොවීය.
3(3)(ii)	අධ්‍යක්ෂවරයෙකු වශයෙන් තනතුර දරන පුද්ගලයෙකු බැංකුවේ ආශ්‍රිත සමාගම්ද ඇතුළත් සමාගම්/ව්‍යාපාර/ආයතන 20 කට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂ තනතුරු දරන්නේද යන්න පිරික්සීම	බැංකුවේ අධ්‍යක්ෂවරු කිසිවෙක් ඔවුන්ගේ ප්‍රකාශනවලට අනුව සමාගම් 20 ක අධ්‍යක්ෂධූර නොදරති.
3(3) (iii)	ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන පුද්ගලයෙකු එකී බැංකුවේ තමන්ගේ තනතුර අහෝසි වන දින සිට මාස 6 ක ඉකුත් වීමේ කාලයකට පෙරාතුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු/වරියක හෝ ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කර තිබේද යන්න පිරික්සීම.	සමාගම් ලේකම් මෙම අවශ්‍යතාව සම්බන්ධයෙන් අදාළ නිරීක්ෂණ සිදු කරන අතර 2020 වසර තුළදී වෙනත් බැංකුවක් වෙතින් කිසිදු පුද්ගලයෙකු අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී තනතුරුවලට පත් නොකරන ලදි.
3(4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලැබෙන කළමනාකරණ කාර්යභාරයන්**	
3(4)(i)	රාජකාරීන් පැවරීමට අදාළ විධිවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත**
3(4)(ii)	ඉහත 3(1) නියමයෙහි දක්වා ඇති කාර්යයන් පවරා ඇති විට පවා අධ්‍යක්ෂ මණ්ඩලය එකී කාරණා සම්බන්ධ වගකීම භාර ගෙන ඇතිද යන්න පිරික්සීම.	**අනුකූලතාව දක්වා ඇත**
3(4)(iii)	රාජකාරී පැවරීම් බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව පවතින්නේද යන්න සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට බැංකුවේ පිහිටුවා ඇති කාර්යභාරය පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** පවරා ඇති බලතල බැංකුවේ අවශ්‍යතාවලට අදාළව පවතින්නේද යන්න සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට එකී බලතල සමාලෝචනය කරයි.
3(5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**	
3(5)(i)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා එකිනෙකින් වෙන් කර ඇතිද සහ එකී තනතුරු එකම පුද්ගලයෙකු විසින් නොදැරිය යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** එච්ඩීඑෆ්සී බැංකු පනත මගින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දෙක එකිනෙකින් වෙන් කර දක්වා ඇත. සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දරන්නේ පුද්ගලයන් දෙදෙනෙකු විසිනි.
3(5)(ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු වීම. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන අවස්ථාවක නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු සුදුසු පරිදි සැකසූ යොමු කිරීමේ අනුදේශද සහිතව ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කර තිබේද යන්න පිරික්සීම. එකී ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා/වරිය නම් කිරීම බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කර තිබිය යුතුය.	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ සභාපති විධායක නොවන සහ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන අතර බැංකුව විසින් කිසිදු අධ්‍යක්ෂවරයෙකු/වරියක ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුරක් සඳහා නම් කර නොතිබිණ.
3(5)(iii)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කවර හෝ සම්බන්ධතාවක් තිබේ නම් ඒ බවද, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කවර හෝ සම්බන්ධතාවක් (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ වෙනත් සැලකිය යුතු/අදාල සම්බන්ධතා ඇතුළත්ව) පවතින්නේ නම් ඒ බවද වාර්ෂික වාර්තාවෙහි කොටසක් ලෙස අන්තර්ගත විය යුතු ආයතනික පාලන වාර්තාවෙහි හඳුනා ගෙන හෙළිදරවු කිරීම සඳහා ක්‍රමවේදයක් බැංකුව සතුව පැවතීම.	**අනුකූලතාව දක්වා ඇත** සිදු කර ඇති ප්‍රකාශනයන්ට අනුව එවැනි සම්බන්ධතා පවතින්නේ නම් ඒ බව හඳුනාගත හැකි අතර එකී තොරතුරු හෙළිදරවු කිරීම් 2020 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර තිබේ.
3(5)(iv)	සභාපති විසින් පහත අවශ්‍යතා ඉටු කරනු ලබන ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම: අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය දීම ආ) අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යක්ෂම ලෙස ක්‍රියා කරන බව සහ සිය වගකීම් නිසි ලෙස ඉටු කරන බව සහතික කිරීම ඇ) සියලුම ප්‍රධාන සහ සුදුසු ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි කාලීනව සාකච්ඡාවට ලක් කෙරෙන බව සහතික කිරීම	**අනුකූලතාව දක්වා ඇත** ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ: සභාපතිනිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය දෙනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටු කිරීමේදී සඵලදායී ලෙස ක්‍රියා කරන බව සහතික කරයි.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(5)(v)	සභාපති විසින් අනුමත කරන ලද නිල න්‍යාය පත්‍රයක් බෙදා හැරීමට සමාගම් ලේකම් කටයුතු කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** සභාපතිනිය අදාළ න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරිය සමඟ වාචිකව සාකච්ඡා කරන ලද අතර එය රැස්වීමට ප්‍රථමයෙන් තහවුරු කරන ලදි.
3(5)(vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතු කෙරෙන කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා වෙත නිසි හැඳින්වීම් සිදු කෙරෙන බව සභාපති විසින් සහතික කළ ය	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතු කෙරෙන කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වෙත නිසි හැඳින්වීම් සිදු කෙරෙන බව සභාපතිනිය සහතික කර ඇත. අදාළ රැස්වීම් ලේඛන සුපරීක්ෂාව්ව පරිශීලනය කිරීමට ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන් වෙත ලබා දෙමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඔවුන් අතර බෙදා හරිනු ලැබේ. පෙර මාසයේ පැවැත්වුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අදාළ වාර්තා අධ්‍යක්ෂවරුන් අතර බෙදා හරිනු ලැබෙන අතර ඉන් අනතුරුව එළැඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නිවැරදි කිරීම්/අනුමත කිරීම සඳහා ඒවා සභාගත කෙරේ.
3(5)(vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් පූර්ණ හ සක්‍රිය දායකත්වයක් දැක්වීම සඳහා අධ්‍යක්ෂවරුන් සියලුම දෙනාද, බැංකුවේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට නායකත්වය ලබා දීම සඳහා සභාපතිවරයා/වරියද දිරිමත් කෙරෙන ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
3(5)(viii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කරන ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
3(5)(ix)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් ඕනෑම විධායක රාජකාරියක් සෘජු අධීක්ෂණයට ලක් කිරීම ඇතුළු කටයුතුවල සභාපති නිරත විය යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් ඕනෑම විධායක රාජකාරියක් සෘජු අධීක්ෂණයට ලක් කිරීමට සභාපතිනිය සෘජුව මැදහත් නොවේ.
3(5)(x)	කොටස් හිමියන් සමඟ සවිලදායී ලෙස සන්නිවේදනයන් පවත්වා ගැනීම සහ කොටස් හිමියන්ගේ මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කිරීම සඳහා ක්‍රියාවලියක් පැවතීම.	**අනුකූලතාව දක්වා ඇත** කොටස් හිමියන් විසින් මතු කරනු ලබන කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කෙරෙන අවකාශය ලෙස වාර්ෂික මහා සභා රැස්වීම සැලකේ.
3(5)(xi)	ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරික කටයුතු පිළිබඳ දෛනික කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරන ඉහළම විධායකය ලෙස කටයුතු කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** එච්ඩීඑෆ්සී පනතට අනුව බැංකුවේ මෙහෙයුම් පිළිබඳ දෛනික කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරන විධායකය වන්නේ ප්‍රධාන විධායක නිලධාරී ය.
3(6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු**	
3(6)(i)	මෙම 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) නියමයන්හි දක්වා ඇති පරිදි යටත් පිරිසෙයින් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් බැංකුව විසින් පිහිටුවා තිබීම. සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකම වාර්තා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇති බව පරීක්ෂා කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලය සිය වාර්ෂික වාර්තාවෙහි සෑම කමිටුවකම රාජකාරි, භූමිකා සහ කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** 3(6)(i) මෙම 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) නියමයන්හි දක්වා ඇති පරිදි බැංකුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු පිහිටුවා ඇත. (i) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව (ii) අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (iii) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (iv) අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව (v) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම යොමු කෙරෙන අතර මේ සෑම කමිටුවක්ම වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇත.

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(6)(ii)	**විගණන කමිටුව**	
	අ) කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු/වරියක විය යුතු බව සහ ඔහු/ඇය සතුව අදාළ සුදුසුකම් හා පළපුරුද්ද තිබිය යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** 2019 මාර්තු 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති අතර ඔහුගේ පළපුරුද්ද අදාළ සුදුසුකම් කළඹෙහි පළ කර තිබේ.
	ආ) කමිටුවේ සාමාජිකයන් සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂවරු සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. 2020 වසර පුරාවටම මෙම කමිටුව සමන්විත වූයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකුගෙනි.
	ඇ) පහත කාරණාවලට අදාළව කමිටුව නිර්දේශ ඉදිරිපත් කර තිබීම: (i) අදාළ ව්‍යවස්ථාවලට අනුකූලව විගණන සේවා ලබා දීම සඳහා බාහිර විගණකවරයා පත් කිරීම (ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට විගණකවරුන් සඳහා නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම (iii) අදාළ ගිණුම් ප්‍රමිති යොදා ගැනීම, සහ (iv) විගණකගේ සේවා කාලය, විගනන ගාස්තු සහ කවර හෝ අයුරකින් විගණක ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම - විගණන හවුල්කරුගේ සේවා දායකත්වය වසර පහ නොඉක්මවිය යුතු බව සහ කලින් සේවා කාලය සම්පූර්ණ වූ දින සිට වසර තුනක කාලයක් ඉක්මවීමට පෙර එකී නිශ්චිත විගණන හවුල්කරු විගණනය සඳහා නැවත වතාවක් දායක වී නොමැත යන කොන්දේසිය මත.	**අනුකූලතාව දක්වා ඇත** 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26(2) වගන්තියට අනුව බැංකුවේ බාහිර විගණක ලෙස කටයුතු කරන්නේ විගණකාධිපති ජනරාල් ය. **අනුකූලතාව දක්වා ඇත** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට විගණකවරුන් සඳහා නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් කමිටුව නිර්දේශ ඉදිරිපත් කර ඇත. **අදාළ නොවේ** බැංකුවේ බාහිර විගණක ලෙස කටයුතු කරන්නේ විගණකාධිපති ජනරාල් ය. මේ නිසා, බාහිර විගණකවරුන්ගේ දායකත්වයට අදාළව කිසිදු භූමිකාවක නිරත වීමට බැංකුවට සිදු නොවේ.
	ඈ) බාහිර විගණකවරුන්ගේ ස්වාධීනතාව පිළිබඳව සහ විගණන කටයුතු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුව සිදු කර ඇති බවට ප්‍රකාශන කමිටුව විසින් ඔවුන්ගෙන් ලබා ගෙන තිබීම.	**අදාළ නොවේ** විගණකාධිපති ජනරාල්ගේ ස්වාධීනතාව සහ කාර්යක්ෂමතාව රටෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නිසා.
	ඉ) අදාළ රෙගුලාසිවලට අනුකූල වන පරිදි විගණන නොවන සේවා ලබා දීම සඳහා බාහිර විගණකගේ මැදහත්වීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් කමිටුව විසින් ක්‍රියාත්මක කර තිබීම.	**අදාළ නොවේ** බැංකුවේ බාහිර විගණක ලෙස කටයුතු කරන්නේ විගණකාධිපති ජනරාල් විසින් නිසා මෙම අවශ්‍යතාව ඉස්මතු නොවීය.
	ඊ) විගණන කටයුතු ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව අදාළ විගණන කටයුත්තේ පරාසය බාහිර විගණක සමග සාකච්ඡා කොට සනාථ කිරීම.	**අදාළ නොවේ** 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ 3 සහ 4 උප වගන්ති මගින් විගණනයේ පරාසය සහ තරම තීරණය කිරීමේ අභිමතානුසාරී බලතල විගණකාධිපති ජනරාල් වෙත පවරා තිබේ.
	උ) හෙළිදරවු කිරීම සඳහා පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල ඒකාබද්ධතාව අධීක්ෂණය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමට ක්‍රියාවලියක් කමිටුව සතුව පවතින අතර ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙතින් පහත දෑ ලබා ගැනීම සඳහාද ක්‍රමවේදයක් තිබීම: (i). තීන්දු ගැනීමට අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර (ii). ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිළිවෙත්වල කවර හෝ වෙනස්කමක් (iii) ව්‍යාපාරික අඛණ්ඩතා උපකල්පනය (iv) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නෛතික අවශ්‍යතාවලට දක්වන අනුකූලතාව (v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුකූලව සැලකිය යුතු මට්ටමේ ගැලපුම්	**අනුකූලතාව දක්වා ඇත** කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති විට එය විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල නිලධාරී කමිටු ඇස්වීම්වලට සහභාගී වන නිසා අවශ්‍ය වූ විට මෙකී ක්ෂේත්‍ර සම්බන්ධ පැහැදිලි කිරීම් ලබා ගැනේ.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ඌ) විගණන කාර්යයට අදාළ කාරණා සම්බන්ධයෙන් විධායක කළමනාකාරිත්වය නොමැති විය කමිටුව බාහිර විගණකවරුන් මුණ ගැසී තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** විගණකාධිපති ජනරාල්ගේ නියෝජිතයන් බැංකුවේ රැඳී සිටින අතර කමිටුව ඔවුන්ව නිරන්තරයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී නියෝජිතයෙකු සෑම විටමද හමු වේ.
	එ) කමිටුව විසින් බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ බැංකුව ඊට දක්වා ඇති කළමනාකරණ ප්‍රතිචාරය සමාලෝචනය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** කමිටුව විසින් 2019 වසර සඳහා වූ කළමනාකරණ ලිපිය සහ බැංකුව ඊට දක්වා ඇති කළමනාකරණ ප්‍රතිචාරය සමාලෝචනය කර තිබේ.
	ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව කමිටුව පහත පියවර අනුගමනය කළ යුතුය.	
	I. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය, කාර්යභාරය සහ සම්පත්වල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම සහ එම දෙපාර්තමේන්තුවට සිය කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය අධිකාරී බලය තිබෙන බවට සතුටට පත් වීම	**අනුකූලතාව දක්වා ඇත** කාර්ය පරාසය සහ සම්පත් අවශ්‍යතාව ඇතුළත් අභ්‍යන්තර විගණන සැලැස්ම 2020 පෙබරවාරි 7 දින පවත්වන ලද රැස්වීමේදී අංක AC/20/01/07 දරන රැස්වීම් වාර්තාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.
	II. අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය වූ විට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබෙන බව සහතික කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාවට අභ්‍යන්තර විගණන වැඩසටහන ඇතුළත් වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. 2019 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමාලෝචනය කර ඇති අතර, 2020 වසරේ වාර්තාව තවමත් සමාලෝචනය කර නොමැත.
	III. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානීගේ හෝ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳව වූ කවර හෝ ඇගයීමක් හෝ තක්සේරු කිරීමක් සමාලෝචනය කිරීම	**අනුකූලතාව දක්වා ඇත** විගණන කමිටුව විසින් 2019 වසර සඳහා වූ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම් වාර්තාව සමාලෝචනය කරන ලද අතර 2020 සඳහා වූ සමාලෝචනය තවම සිදු කර නොමැත.
	IV. අභ්‍යන්තර විගණන ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහ අභ්‍යන්තර විගණන කාර්යභාරය උදෙසා බාහිර සේවා සැපයුම්කරුවන් පත් කිරීම හෝ ඔවුන්ගේ කාලය අවසන් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.	
	V. ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ කවර හෝ බාහිර සේවා සැපයුම්කරුවෙකු ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් කමිටුවට තොරතුරු ලැබී ඇතිද යන වග සහ එලෙස ඉල්ලා අස්වීමට තීරණය කළ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ බාහිර සේවා සැපයුම්කරුවන්ට එසේ කිරීමට හේතු වූ කාරණා දැක්වීමට අවස්ථාවක් ලබා දීමට විධිවිධාන පවතීද යන්න පරීක්ෂා කිරීම.	
	VI. අභ්‍යන්තර විගණන කාර්යභාරය එය විසින් විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීනව සිදු කෙරෙන්නේද යන්න පිරික්සීම.	**අනුකූලතාව දක්වා ඇත** අභ්‍යන්තර විගණන කාර්යභාරය එය විසින් විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීනව සිදු කෙරෙන අතර එම කාර්යභාරය සම්බන්ධයෙන් සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කෙරේ.
	ඔ) කමිටුව විසින් අභ්‍යන්තර විමර්ශනයන්හි ප්‍රධාන සොයාගැනීම් සහ ඒවාට දක්වා ඇති කළමනාකරණ ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇතිද යන්න තීරණය කිරීම සඳහා වාර්තා කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ කළමනාකරණ ප්‍රතිචාර විගණන කමිටුව විසින් සාකච්ඡාවට ලක් කරන ලද අතර අවශ්‍ය නිර්දේශ සිදු කරන ලදි
	ඕ) විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් තොරව කමිටුව යටතේ පිරිසෙයින් රැස්වීම් දෙකක්වත් බාහිර විගණකවරුන් සමඟ පවත්වා තිබීම.	අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවෙකු නොමැති නිසා මෙය අදාළ නොවේ.

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ක) පහත අවශ්‍යතා ඉටු වන බව සහතික කරනු පිණිස කම්ටුවේ යොමු කිරීමේ අනුදේශවල විධිවිධාන ඇතුළත් වීම: (i) සිය යොමුකිරීමේ අනුදේශ යටතේ පවතින කවර හෝ කාරණාවක් විමර්ශනය කිරීම සඳහා වූ පරම අධිකාරී බලය (ii) එසේ කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් (iii) තොරතුරු වෙත සම්පූර්ණ ප්‍රවේශ්‍ය අවස්ථාව (iv) බාහිර වෘත්තීය උපදේශන ලබා ගැනීමට සහ අවශ්‍ය වේ නම් නිසි පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වවලට සහභාගී වන ලෙස ඇරයුම් කිරීමට බලය	**අනුකූලතාව දක්වා ඇත**
	ග) යටත් පිරිසෙයින් හතර වතාවක්වත් කම්ටුව රැස් වී ඇති අතර රැස්වීම් වාර්තා පවත්වාගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** මෙහි සමාලෝචනයට ලක් වන 2020 වසර තුළදී විගණන කම්ටු රැස්වීම් හයක් (06) පවත්වා ඇති අතර අදාළ වාර්තා පවත්වාගෙන තිබේ.
	ච) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවෙහි පහත කාරණා හෙළිදරවු කර තිබීම: (v) විගණන කම්ටුවේ සවිස්තර ක්‍රියාකාරකම් (vi) වසර තුළදී පවත්වන ලද විගණන කම්ටු රැස්වීම් සංඛ්‍යාව (vii) ඒ ඒ අධ්‍යක්ෂවරයා/වරිය එකී රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ විස්තර	**අනුකූලතාව දක්වා ඇත** වාර්ෂික වාර්තාවෙහි විගණන කම්ටු වාර්ෂික වාර්තාව තුළ මෙම විස්තර දක්වා ඇත.
	ජ) කම්ටුවේ ලේකම් සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යභාරය භාර ප්‍රධානී වීම.	**අනුකූලතාව දක්වා ඇත** අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කම්ටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.
	ට) පහත කාරණාවලට අදාළ ක්‍රියාවලීන් තොරතුරු සැපයීමේ (විස්ල් බ්ලෝවින්) ප්‍රතිපත්තිය මගින් ආවරණය වේද යන්න පිරික්සීම: (i) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කාරණා ආශ්‍රිත අයෝග්‍යතා (ii) කම්ටුවට අදාළව එකී කාරණා සම්බන්ධ සාධාරණ හා ස්වාධීන විමර්ශන සිදු කිරීම සඳහා නිසි විධිවිධාන පවතීද යන්න සහතික කිරීම සහ, iii) සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග.	**අනුකූලතාව දක්වා ඇත** තොරතුරු සැපයීමේ (විස්ල් බ්ලෝවින්) ප්‍රතිපත්තිය ප්‍රතිපත්තිය - 2017/10/13 දින පිහිටුවන ලද අතර (08/53/HR/2017) 2019.10.21 දින එය සමාලෝචනය කරන ලදි. මෙම අවශ්‍යතාවට පහසුකම් සම්පාදනය කරනු පිණිස සපයනු ලැබෙන තොරතුරු ලබා ගැනීම සිදු කරන එක් නිලධාරියෙකු වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක නම් කර තිබේ.
3(6)(iii)	මානව සම්පත් සහ වැටුප් කම්ටුවට පහත රීති අදාළ වේද යන්න	
	අ) යොමු කිරීමේ අනුදේශ සහ රැස්වීම් වාර්තා සමාලෝචනය කිරීම තුළින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අදාළ වන වේතන (වැටුප්, දීමනා සහ අනෙකුත් මුදල් ගෙවීම්) තීරණය කිරීම සඳහා කම්ටුව විසින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂවරුන් සඳහා ගෙවනු ලබන වේතන තීරණය කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසින් පිටුවා ඇති මාර්ගෝපදේශ මාලාවක් පදනම් කරගෙන ය. ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ගෙවනු ලබන වේතන තීරණය කරනු ලබන්නේ සාමූහික එකඟතාව මත මානව සම්පත්/වැටුප් කම්ටුව විසිනි.
	ආ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වූ ඉලක්ක නිසි පරිදි ලේඛනගත කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා විධායක නොවන අයවළුන් වන නිසා විධායක අධ්‍යක්ෂවරුන්ට අදාළ වන ආකාරයේ මෙහෙයුම් හා සබැඳි කාරණා සම්බන්ධයෙන් ඔවුන් මැදහත් නොවේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අයවැයගත ඉලක්ක සාක්ෂාත් කිරීම සම්බන්ධයෙන් වගකීම් දරයි. කෙසේ වෙතත්, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වූ ඉලක්ක නිසි පරිදි ලේඛනගත කර තිබේ.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා පිහිටුවා තිබුණු ඉලක්ක සහ අරමුණුවලට සාපේක්ෂව ඔවුන්ගේ කාර්යසාධනය ආශ්‍රිත ඇගයීම් කලින් කලට සලකා බැලීමට කමිටුව පියවර ගෙන ඇති අතර, චේතන, ප්‍රතිලාභ සහ කාර්යසාධනය පාදක අනෙකුත් පාරිතෝෂික ගෙවීම් සමාලෝචනය කිරීම සඳහා වූ පදනම තීරණය කරනු ලැබීම.	**අනුකූලතාව දක්වා ඇත**
	ඈ) රැස්වීම් වාර්තා සමාලෝචනය කිරීමින් ප්‍රධාන විධායක නිලධාරීට අදාළ වන කාරණා සාකච්ඡාවට ලක් කෙරෙන විට කමිටුවේ රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහභාගී නොවන බවට ''යොමුකිරීමේ අනුදේශ'' මගින් සැලසීම.	**අනුකූලතාව දක්වා ඇත** මානව සම්පත් කමිටුවේ යොමුකිරීමේ අනුදේශ මගින් මෙම අවශ්‍යතාව ආමන්ත්‍රණය කෙරේ.
3(6)(iv)	නාම යෝජනා කමිටුවට අදාළව පහත රීති අදාළ වේද යන්න:	
	අ) නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම/පත් කිරීම සඳහා ක්‍රමවේදයක් කමිටුව විසින් ක්‍රියාත්මක කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කරනු ලබන්නේ එච්ඩිඑෆ්සී පනතේ විධිවිධානවලට අනුකූලවය. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියද ඊට අදාළ වේ. බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුව කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තෝරා ගැනීමට අදාළ ක්‍රමවේදය සහ එච්ඩිඑෆ්සී පනතේ 14(1) වගන්තියේ III කොටසට අදාළ විධිවිධාන ඇතුළත් වේ.
	ආ) තනතුරු දරමින් සිටින අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම කමිටුව විසින් නිර්දේශ කර (හෝ නිර්දේශ නොකර) තිබීම.	**අනුකූලතාව දක්වා ඇත**
	ඇ) රැකියා විස්තර සමාලෝචනය කිරීම තුළින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ගති ලක්ෂණ ආදී නිර්ණායක කමිටුව විසින් පිහිටුවා තිබීම.	**අනුකූලතාව දක්වා ඇත**
	ඈ) ඉහත 3(3) නියමයෙහි දක්වා ඇති සහ අදාළ ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි තමන් අදාළ තනතුරු දැරීමට යෝග්‍ය සහ සුදුසු පුද්ගලයන් වන බවට අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අත්සන් තබන ලද ප්‍රකාශනයක් ඔවුන්ගෙන් ලබා ගැනීමට කමිටුව කටයුතු කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර තිබේ.
	ඉ) විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළව විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් කමිටුව විසින් සැලකිල්ලට ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අදාළ වන අනුප්‍රාප්තික සැලැස්මක් පවතී. එය 2019.10.21 දින යාවත්කාල කරන ලදී.
	ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ මුලසුන දැරිය යුතු අතර එහි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු බව. ප්‍රධාන විධායක නිලධාරී ඇරයුම් මත රැස්වීම්වලට සහභාගී විය යුතුය.	**අනුකූලතාව දක්වා ඇත** විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු එම රැස්වීමෙහි මුලසුන දරා ඇත. ආරාධනා මත ප්‍රධාන විධායක නිලධාරී එම රැස්වීම්වලට සහභාගී වේ. කෙසේ වෙතත්, ප්‍රධාන විධායක නිලධාරී සියලුම රැස්වීම් සඳහා සහභාගී වී ඇත.
3(6)(v)	වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පහත රීති අදාළ වේද යන්න:	
	අ) කමිටුව යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු බව සහ ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන බව හා කමිටුව තමන්ට අදාළ බලතල රාමුව හා පවරා ඇති වගකීම තුළ කටයුතු කළ යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අනුකූලතා නිලධාරී, භාණ්ඩාගාර ප්‍රධානී, ණය ප්‍රධානී සහ අවදානම් නිලධාරී ආදී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් කමිටුව සමන්විත වේ.
	ආ) ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම ආදී සියලුම අවදානම් වර්ග නිසි අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු ඔස්සේ මාසික පදනමක් මත තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් කමිටුව සතු වීම. පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වලට අදාළව අවදානම් කළමනාකරණය බැංකුව සහ සමූහය යන පදනම් දෙකම මත සිදු කිරීම.	**අනුකූලතාව දක්වා ඇත**

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
	ඇ) ණය කමිටුව සහ වත්කම්-වගකීම් කමිටු ආදී කළමනාකරණ මට්ටමේ කමිටු සියල්ලටම අදාළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් කමිටුව විසින් සමාලෝචනය කර ඇති අතර කවර හෝ අවදානම් දර්ශකයක් වේ නම් ඒ බව කලින් කලට වාර්තා කිරීම.	**අනුකූලතාව දක්වා නොමැත** කමිටුවේ කාර්යක්ෂමතාව සහ ප්‍රමාණවත්භාවය සහතික කරනු පිණිස වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කළමනාකරණ මට්ටමේ කමිටු රැස්වීම්වල වාර්තා සමාලෝචනය කර නොමැත.
	ඈ) නිශ්චිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවලින් ඔබ්බට ගොස් ඇති අවදානම් දර්ශක සියල්ලම කමිටුව විසින් සමාලෝචනය කොට සලකා බලා තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අවදානම් දරාගත හැකි සීමා රාමුවක් පිහිටුවීමෙන් අනතුරුව දරාගත හැකි සීමාවන්ගෙන් ඔබ්බෙහි පිහිටි සියලු අවදානම් සමාලෝචනය කරමින් පවතී.
	ඉ) යටත් පිරිසෙයින් කාර්තුවකට වරක්වත් කමිටුව රැස් වී ඇති වාර ගණන.	**අනුකූලතාව දක්වා ඇත** කමිටුව කාර්තුමය පදනමක් මත රැස් වන අතර, 2020 මූල්‍ය වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම් හතරක් (04) පවත්වා තිබේ.
	ඊ) සුවිශේෂී අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකීම දරන නිලධාරීන් සම්බන්ධයෙන් ගත යුතු විධිමත් කාර්ය පටිපාටියක් කමිටුව විසින් සමාලෝචනය කොට පිහිටුවා ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** මෙම අරමුණ සඳහා විධිමත් ලෙස ලේඛනගත කර ඇති විනය කාර්ය පටිපාටියක් පවතින අතර, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටුව නම් වූ වෙනම අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් විසින් එය හසුරුවනු ලැබේ. 2020 වසරේදී එවැනි විනය ක්‍රියාමාර්ග 3 ක් ගනු ලැබිණ.
	උ) සෑම රැස්වීමක්ම පැවැත්වීමෙන් සතියක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයේ මත, එකඟතා සහ/හෝ සුවිශේෂී උපදෙස් ලබා ගැනීම පිණිස කමිටුව අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කිරීම.	**අනුකූලතාව දක්වා ඇත** කමිටු රැස්වීම්වලින් පසුව ඒවායෙහි වාර්තා වහාම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
	ඌ) බැංකුවේ සෑම ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රයකටම අදාළ සියලුම නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වන්නේද යන වග සහ අනුකූලතා ක්‍රියාවලිය ඉටු කරමින් කලින් කලට කමිටුවට වාර්තා කිරීම සඳහාම වෙන් වූ අනුකූලතා නිලධාරියෙකු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතරින් තෝරාගෙන තිබේද යන්න තක්සේරු කරනු පිණිස කමිටුව විසින් අනුකූලතා ක්‍රමවේදයක් පිහිටුවා තිබීම	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ අනුකූලතා ක්‍රියාවලිය මෙහෙයවනු ලබන්නේ අනුකූලතා නිලධාරී විසින් වන අතර අනුකූලතා අවදානම් තක්සේරුවක් අනුකූලතා නිලධාරී විසින් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
3(7)	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**	
3(7)(i)	මෙම නියමයෙහි අරමුණ වෙනුවෙන් ''සම්බන්ධිත පාර්ශ්ව'' ලෙස සැලකිය යුතු කවර හෝ පුද්ගලයෙකු සහ විශේෂයෙන්ම පහත කාණ්ඩවලට අයත් පුද්ගලයෙකු සමග බැංකුව සිදු කරන කවර හෝ ගනුදෙනුවක් නිසා ඉස්මතු විය හැකි ඕනෑම පිළිබැඳියා ගැටුම්ක් වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති හා ලේඛනගත කර ඇති ක්‍රමවේදයක් පැවතීම: අ) බැංකුවේ ඕනෑම පරිපාලිත සමාගමක් ආ) බැංකුවේ ඕනෑම ආශ්‍රිත සමාගමක් ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු/වරියක ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් කිසිවෙකු ඉ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු/වරියක සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු/නිලධාරිණියක අතර ඇති කවර හෝ සමීප සබඳතාවක් ඊ) බැංකුවේ ඕනෑම සැලකිය යුතු හිමිකාරත්වයක් දරන කොටස් හිමියෙකු උ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් කිසිවෙකු හෝ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුට සමීප සම්බන්ධතාවක් පවත්වන පුද්ගලයෙකු හෝ බැංකුවේ සැලකිය යුතු කොටස් හිමිකාරත්වයක් ඇති පුද්ගලයෙකු හෝ සතුව සැලකිය යුතු හිමිකාරත්වයක් පවතින කාරණාවක්	**අනුකූලතාව දක්වා ඇත** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ සම්බන්ධිත පාර්ශ්ව මාර්ගෝපදේශ ග්‍රහණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් පවතින අතර අදාළ කාරණා සම්බන්ධිත පාර්ශ්ව කමිටු මට්ටමේදී සාකච්ඡා කෙරේ. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ආසන්නතම සමාලෝචනය 2019 වසරේදී සිදු කරන ලදි. 2020 වසරේදී සංශෝධන කිසිවක් සිදු කර නොමැත.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(7)(ii)	මෙම නියමය මගින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව සමග සිදු කෙරෙන ගනුදෙනු ලෙස සැලකෙන පහත දැක්වෙන ගනුදෙනු වර්ග හඳුනා ගැනීම සහ වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් පැවතීම.	අනුකූලතාව දක්වා ඇත
	අ) වෙන් කළ යුතු උපරිම ප්‍රතිපාදන පිළිබඳ මුදල් මණ්ඩලයේ නියමයන්හි දක්වා ඇති කවර හෝ වර්ගයක ප්‍රතිපාදනයක් ලබා දීම.	
	ආ) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන යනාදී ස්වරූපවලින් බැංකුවේ කවර හෝ වගකීමක් නිර්මාණය කිරීම.	
	ඇ) බැංකුව වෙත ලබා දුන් හෝ බැංකුව වෙතින් ලබා ගත් මූල්‍ය හෝ මූල්‍ය නොවන කවර හෝ සේවාවක් ලබා දීම	
	ඈ) සම්බන්ධිත පාර්ශ්ව වෙත ප්‍රතිලාභ උදා කිරීමට හේතු විය හැකි හිමිකාරත්වය හා සබැඳි, රහස්‍ය හෝ වෙනත් ආකාරවලින් සංවේදී තොරතුරු බෙදාහදා ගැනීමට මග පෑදෙන පරිදි බැංකුව සහ ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයක් අතර වාර්තාකරණ වාහක සහ තොරතුරු ගලනයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීම.	
3(7)(iii)	එකම ව්‍යාපාර පවත්වා ගන්නා බැංකුවේ අනෙකුත් කොටස්කාර පාර්ශ්වවලට වඩා වැඩියෙන් ''වාසිදායක සැලකීමක්'' තුන්වැනි පාර්ශ්ව වෙත ලබා දෙන ස්වරූපයක් ගන්නා ඉහත 3(7)(i) නියමයෙහි දක්වා ඇති ආකාරයේ සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනුවල බැංකුව නිරත නොවන බව සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පැවතීම.	අනුකූලතාව දක්වා ඇත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව පිහිටුවන ලද අතර එවැනි සිදුවීමක් උද්ගත වේ නම් ඒ සම්බන්ධයෙන් පාලනයක් පවතී.
	අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් විචක්ෂණ ප්‍රතිශතයක් ඉක්මවා යන ''මූළු ශුද්ධ ප්‍රතිපාදනයක්'' සම්බන්ධිත පාර්ශ්ව වෙත ලබා දීම. මෙම උප නියමයේ අරමුණ සඳහා: (i) වෙන් කළ හැකි උපරිම ප්‍රතිපාදන පිළිබඳව 2007 අංක 7 දරන බැංකු පනතේ නියමයන්හි දක්වා ඇති පරිදි ''ප්‍රතිපාදනය'' යන්න අර්ථ ගැන්විය යුතුය. (ii) වසර 5 ක හෝ ඊට වැඩි කල් පිරීමක් සහිත බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ ණය උපකරණ වෙනුවෙන් සම්බන්ධිත පාර්ශ්වයක් විසින් සිදු කර ඇති මුදල් සහ ආයෝජන මූළු ප්‍රතිපාදනයෙන් අඩු කිරීම මගින් ''මූළු ශුද්ධ ප්‍රතිපාදනය'' ගණනය කළ යුතු වේ.	
	ආ) සම්බන්ධිත නොවන පාර්ශ්වයක් සමග සිදු කෙරෙන සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ හොඳම ණය ලබා දීමේ අනුපාතිකයට වඩා අඩු හෝ බැංකුවේ තැන්පතු අනුපාතිකයට වඩා වැඩි පොලී අනුපාතිකයක් අය කිරීම.	
	ඇ) සම්බන්ධිත නොවූ පාර්ශ්ව සමග සිදු කෙරෙන සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී පිහිටුවා ඇති කොන්දේසිවලින් ඔබ්බට දිවෙන වෙළෙඳ අලාභ සහ/හෝ කපා හැරීමේ ගාස්තු/කොමිස් ආවරණය කෙරෙන වාසිදායක කොන්දේසී වැනි අභිප්‍රේත සැලකීමක් ලබා දීම.	
	ඈ) ඇගයීම් ක්‍රමවේදයකින් තොරව සම්බන්ධිත පාර්ශ්වයක් වෙත සේවා ලබා දීම හෝ එකී පාර්ශ්වයක් වෙතින් මේවා ලබා ගැනීම:	
	ඉ) නීත්‍යනුකූල රාජකාරී හා කාර්යභාරයන්හි කාර්යසාධනය සඳහා අවශ්‍ය වන තොරතුරු හැරුණුකොට හිමිකාරත්වය, රහස්‍යභාවය හා සබැඳි හෝ වෙනත් ආකාරයක සංවේදී තොරතුරු බෙදාහදා ගැනීමට මග පාදන තොරතුරු ගලනයන් සහ වාර්තාකරණ ප්‍රවාහ පවත්වා ගැනීම.	
3(7)(iv)	බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබා දීම සඳහා ක්‍රමවේදයක් බැංකුව සතුව ඇති අතර, අදාළ අධ්‍යක්ෂවරයා/වරිය හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් එකී ප්‍රතිපාදන වෙන් කිරීමට පක්ෂව ඡන්දය ලබා දෙන රැස්වීමකදී ඒ සඳහා අවසන දෙනු ලබන බව හා කලින් කල මුදල් මණ්ඩලය විසින් තීරණය කෙරෙන පරිදි එම ප්‍රතිපාදනය සුරක්ෂිත කිරීම.	අනුකූලතාව දක්වා ඇත

ආයතනික පාලනය

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව		අනුකූලතා මට්ටම
3(7)(v)	අ)	බැංකුවක් විසින් කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගලයෙකුගේ සම්බන්ධිත පාර්ශ්වයක් හෝ එකී පුද්ගලයා සැලකිය යුතු උනන්දුවක් දක්වන කවර හෝ පාර්ශ්වයක් වෙත කවර හෝ ප්‍රතිපාදනයක් ලබා දී ඇති විට එකී පුද්ගලයා ඉන් පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබෙන බව සහ එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක කාලයක් ඇතුළත මුදල් මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා බැංකුව සුදුසු පියවර ගෙන ඇති බව සහතික කෙරෙන ක්‍රමවේදයක් පැවතීම.	අනුකූලතාව දක්වා ඇත
	ආ)	එකී සුරක්ෂිතතාව ඉහත 3(7)(v)(vi) නියමයෙහි දක්වා ඇති කාල සීමාව මඟින් සැපයී නොමැති විට එම ප්‍රතිපාදනය ලබා දීමට අදාළ කවර හෝ හිඟ ගාස්තුවක් ඊට අදාළ පොලියක් වේ නම් එයද සමඟින් අදාළ ප්‍රතිපාදනය ලබා දුන් කාලය වන විට නිශ්චය කර ඇති කාල සීමාව හෝ එම අධ්‍යක්ෂවරයා/වරිය පත් කළ දින සිට මාස දහ අටක කාලයක් අවසන් වන දින දක්වා වූ කාල සීමාව යන දෙකෙන් ඉහළ කාලයක් ඇතුළත අයකර ගැනීම සඳහා බැංකුව පියවර ගෙන තිබීම.	
	ඇ)	ඉහත උප නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට කවර හෝ අධ්‍යක්ෂවරයෙකු/වරියක අපොහොසත් වේ නම් ඔහු/ඇය තම අධ්‍යක්ෂ ධුරය අත්හැර දමා ඇති ලෙස සැලකෙන බව හෝ බැංකුව විසින් ඒ බව මහජනතාව වෙත හෙළි කර තිබීම.	
	ඈ)	ප්‍රතිපාදනය ලබා දුන් කාලය වන විට බැංකුවේ සේවකයෙකු ලෙස කටයුතු කළ කවර හෝ අධ්‍යක්ෂවරයෙකු/වරියක සහ බැංකුවේ එවැනි සේවකයන් සියලුම දෙනාට අදාළ වන ක්‍රමවේදයක් යටතේ ප්‍රතිපාදනයක් ලබා දී ඇති අවස්ථා සම්බන්ධයෙන් 3(7)(v)(c) වගන්තිය/නියමය අදාළ නොවීම.	
3(7)(vi)	ගාස්තු සහ/හෝ කොමිස් මුදල් කපා හැරීමකට අදාළව ඕනෑම සේවකයෙකු හෝ සේවකයෙකුට සමීප සම්බන්ධයක් පවත්වන අයෙකුට හෝ අදාළ සේවකයා හෝ සමීප සම්බන්ධිතයා සැලකිය යුතු උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශ්වයක් වෙත එම බංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් හැර වෙනත් පදනමක් මත බැංකුව විසින් කවර හෝ ප්‍රතිපාදනයක් හෝ ''වඩා වාසිදායක සැලකීමක්'' ලබා දෙන විට හෝ ඉහත 3(7)(v) නියමයට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කෙරෙන පරිදි එය සුරක්ෂිත කර ඇති විට එය හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් පැවතීම.		අනුකූලතාව දක්වා ඇත
3(7)(vii)	ඉහත 3(7)(ඩ) සහ 3(7)(v)(vi) නියම යටතේ බැංකුවක් විසින් ලබා දී ඇති ඕනෑම ප්‍රතිපාදනයක් සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රමවේදයක් පවතින අතර, එකී ප්‍රතිපාදනයේ කවර හෝ කොටසක් හෝ ඒ අනුව පැනවෙන කවර හෝ පොලියක් මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ලබා නොදෙන බවට සහ එවැනි අනුමැතියකින් තොරව ලබා දෙන කිසිදු මුදල් ප්‍රතිපාදනයක් වලංගු නොවන බවට සහතික කෙරෙන ක්‍රමවේදයක් පැවතීම.		අනුකූලතාව දක්වා ඇත මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 40 වන සටහන යටතේ හෙළිදරවු කර ඇති පරිදි කිසිදු සම්බන්ධිත පාර්ශ්වයක් වෙත වාසිදායක සැලකීම් කිසිවක් ලබා නොදෙන ලදි.
3(8)	**හෙළිදරවු කිරීම්**		
3(8)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ හෙළිදරවු කර තිබීම:		අනුකූලතාව දක්වා ඇත බැංකුව මෙම නියමයට සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට පළ කරයි.
	අ)	අධීක්ෂණ හා නියාමන අධිකාරීන් සහ අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති මඟින් නිර්දේශ කර ඇති ආකෘතිවලට අදාළව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට පළ කර ඇති අතර එකී ප්‍රකාශන සංක්ෂිප්ත ස්වරූපයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල පළ කර ඇති තිබීම.	
	ආ)	කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පුවත් පත්වල සංක්ෂිප්ත ස්වරූපයෙන් පළ කර තිබීම.	අනුකූලතාව දක්වා ඇත කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පුවත් පත්වල සංක්ෂිප්ත ස්වරූපයෙන් පළ කර ඇත.

කොටස	ආයතනික පාලන අවශ්‍යතාව	අනුකූලතා මට්ටම
3(8)(ii)	අධ්‍යක්ෂ මණ්ඩලය සිය වාර්ෂික වාර්තාවෙහි පහත දැක්වෙන අවම හෙළිදරවු කිරීම් සිදු කර තිබීම:	
	අ) සුවිශේෂී හෙළිදරවු කිරීම්ද ඇතුළත්ව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඒවාට අදාළ වන ගිණුම් ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කොට ඇති බවට ප්‍රකාශනයක්.	**අනුකූලතාව දක්වා ඇත** විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී බැංකුවට අදාළ වන ගිණුම් ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලතාව දක්වා ඇති බවට හෙළිදරවු කිරීමක් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනයෙහි සිදු කර ඇත.
	ආ) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සකස් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීමට හැකි බවටත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සිදු කර ඇත්තේ අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව බවටත් තහවුරු කෙරෙන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව.	**අනුකූලතාව දක්වා ඇත** මූල්‍ය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයතාව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දිය හැකි අයුරින් මූල්‍ය පද්ධතිය සකසා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කෙරෙන පහත දැක්වෙන වාර්තා වාර්ෂික වාර්තාවට ඇතුළත් වන අතර, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර තිබේ. ■ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ■ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය ■ මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
	ඇ) ඉහත 3(8)(ii)(ආ) නියමයෙහි දක්වා ඇති අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ බාහිර විගණකගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ සහතිකකරණ වාර්තාව 2020 වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කර ඇත.
	ඈ) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව හා හිමිකාරත්වයන් ආශ්‍රිත මාර්ගෝපදේශ, බැංකුව සමග සිදු කරනු ලබන ගනුදෙනු සහ බැංකුව විසින් ඔවුන්ට ගෙවනු ලබන මුළු ගාස්තු/වේතන ආදී අවශ්‍යතා සහිතව ඔවුන්ගේ නම්, සුදුසුකම්, වයස සහ පළපුරුද්ද යන විස්තර.	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂවරුන්ගේ නම්, සුදුසුකම්, වයස සහ පළපුරුද්ද පිළිබඳ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලයේ සුදුසුකම් කළඹ යටතේ හෙළිදරවු කර ඇත. එමෙන්ම, අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද ගාස්තු/වේතන පිළිබඳ විස්තර 2020 වාර්ෂික වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යටතේ හෙළිදරවු කර තිබේ.
	ඉ) 3(7)(iii) නියමයෙහි දක්වා ඇති පරිදි සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩ සියල්ලම වෙත මුළු ශුද්ධ ප්‍රතිපාදන ලබා දී ඇති බව. ඒ ඒ කාණ්ඩයේ සම්බන්ධිත පාර්ශ්ව වෙත ලබා දී ඇති ශුද්ධ මුළු ප්‍රතිපාදන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස හෙළිදරවු කළ යුතු වීම.	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි කොටසක්/ප්‍රතිශතයක් ලෙස ලබා දී ඇති මුළු ශුද්ධ ප්‍රතිපාදන 2020 වාර්ෂික වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශනවලට දක්වා ඇති 40 වන සටහනෙහි දක්වා ඇත.
	ඊ) බැංකුව විසින් සිය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ගෙවන ලද වේතනයන්හි සමුච්චිත වටිනාකම් සහ ගෙවන ලද වේතන, ලබා දුන් ප්‍රතිපාදන සහ බැංකුවෙහි සිදු කරන ලද තැන්පතු හෝ ආයෝජන වැනි පුළුල් කාණ්ඩ මගින් දක්වා ඇති පරිදි බැංකුව සිය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග පවත්වන ලද ගනුදෙනුවල සමුච්චිත වටිනාකම්.	**අනුකූලතාව දක්වා ඇත** මීට අදාළ විස්තර 2020 වාර්ෂික වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශනවලට දක්වා ඇති 40 වන සටහනෙහි දක්වා ඇත.
	උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික පාලනය වෙත දක්වන අනුකූලතාව පිළිබඳ බාහිර විගණකගේ වාර්තාව ලබා ගෙන තිබීම.	**අනුකූලතාව දක්වා ඇත** ආයතනික පාලනය වෙත දක්වන අනුකූලතාව පිළිබඳ බාහිර විගණකගේ වාර්තාව 2020 වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කර ඇත.
	ඌ) විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි හා නීති වෙත දක්වා ඇති අනුකූලතාව සහ කවර හෝ සැලකිය යුතු මට්ටමේ අනනකූලතාවක් වේ නම් එය නිවැරදි කිරීම සඳහා අනුගමනය කර ඇති විධිවිධාන හා අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක් සැකසීම.	**අනුකූලතාව දක්වා ඇත** විචක්ෂණ නියාමන අවශ්‍යතා, රෙගුලාසි හා අභ්‍යන්තර පාලනයන් වෙත අනුකූලතාව දැක්වීම පිළිබඳ විස්තර මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශන මගින් පැහැදිලිව දක්වා ඇත.
	එ) බැංකුවේ අවදානම් කළමනාකරණය ආශ්‍රිත දෝෂ සම්බන්ධ නියාමනමය හෝ අධීක්ෂණාත්මක කාරණා හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙම නියමයන්ට දක්වන කවර හෝ අනනුකූලතාවක් පිළිබඳ ප්‍රකාශනයක් සිදු කිරීම සහ එකී විස්තර මහජනයා වෙත හෙළිදරවු කළ යුතු බවට මුදල් මණ්ඩලය විසින් නියම කර තිබේ නම් එකී කාරණා ආමන්ත්‍රණය කිරීම සඳහා බැංකුව ක්‍රියාමාර්ග තිබීම.	**එවැනි සිදුවීම් කිසිවක් උද්ගත නොවිණ.**

ආයතනික පාලනය

දෙක කොටස

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ නිසි පිළිවෙත් සංග්‍රහය වෙත එච්ඩීඑෆ්සී බැංකුවේ අනුකූලතාව

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
අ) අධ්‍යක්ෂවරුන්				
අ.1 අධ්‍යක්ෂ මණ්ඩලය	**අනුකූලතාව දක්වා ඇත** අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණි. කරුණාකර, අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ බලන්න.			
අ 1.1 1. රැස්වීම	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති 3(1)(iii) නියමයට දක්වන අනුකූලතා තත්ත්වය බලන්න			
අ 1.2 2. අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම්	**අනුකූලතාව දක්වා ඇත** බැංකුවේ ආයතනික යහපාලනය සම්බන්ධ සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.			
අ 1.3 3. ස්වාධීන වෘත්තිකයන්ගේ උපදේශන සේවාවන්ට ඇති ප්‍රවේශය	**අනුකූලතාව දක්වා ඇත**			
අ 1.4 4. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	**අනුකූලතාව දක්වා ඇත** සමාගම සහ පාර්ශ්වකරුවන් අතර මැදහත්කාර භූමිකාවක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඉටු කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රමවේද සියල්ලම බැංකුවේ පවතින අදාළ නීතිවලට නිවැරදි අනුකූලතාව දක්වා ඇති බව සහතික කරමින් ඔහුගේ/ඇයගේ සේවා සහ උපදේශනය අධ්‍යක්ෂවරුන් සියලුම දෙනාට ලබා ගත හැක. සමාගම් ලේකම්වරිය නීතීඥවරියකි.			
අ 1.5 5. ස්වාධීන තීන්දු ගැනීම්	**අනුකූලතාව දක්වා ඇත**			
අ 1.6 6. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු විසින් ප්‍රමාණවත් කාලයක් හා ශ්‍රමයක් වැය කර තිබීම.	**අනුකූලතාව දක්වා ඇත**			
අ 1.7 7. බැංකුවේ මනා සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කර තිබීම	**අනුකූලතාව දක්වා ඇත**			
අ 1.8 8. පළමු වරට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කිරීමෙන් පසුව සහ ඉන් අනතුරුව අවශ්‍ය පරිදි සෑම අධ්‍යක්ෂවරයෙකුම වෙත සුදුසු පුහුණුව හිමි විය යුතුය.	**අනුකූලතාව දක්වා ඇත**			

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
අ.2 සභාපති සහ සමූහ ප්‍රධාන විධායක නිලධාරී				
අ 2.1 9. සභාපතිගේ සහ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම් බෙදා දැක්වීම	අනුකූලතාව දක්වා ඇත			
අ.3 සභාපතිගේ භූමිකාව				
අ 3.1 10. නිසි ආයතනික පාලනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් සභාපතිගේ භූමිකාව	අනුකූලතාව දක්වා ඇත			
අ.4 මූල්‍යමය විචක්ෂණභාවය				
අ 4 11. ප්‍රමාණවත් මූල්‍යමය විචක්ෂණභාවයක් සහ දැනුමක් පැවතීම	අනුකූලතාව දක්වා ඇත			
අ.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව				
අ 5.1 12. අධ්‍යක්ෂ මණ්ඩලයේ සවිමත් ස්වාධීන සංයුතියක් පැවතීම	අනුකූලතාව දක්වා ඇත			
අ 5.2 අ 5.3 13. ස්වාධීන අධ්‍යක්ෂවරුන්	අනුකූලතාව දක්වා ඇත			
අ 5.4 14. විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් සිය ස්වාධීනතාව පිළිබඳ ප්‍රකාශනයට අත්සන් තැබීම	අනුකූලතාව දක්වා ඇත			
අ 5.5 15. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනතාව තීරණය කිරීම	අනුකූලතාව දක්වා ඇත සමාලෝචනයට ලක් වන කාල පරිච්ඡේදය තුළ ස්වාධීන/ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂවරුන්ට අදාළ එම විස්තර අධ්‍යක්ෂ මණ්ඩල සුදුසුකම් කළඹ සහ වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි 40-47 සහ 124 සිට 127 දක්වා පිටුවලින් දක්වා ඇත.			
අ 5.6 16. විකල්ප අධ්‍යක්ෂවරුන්				අදාළ නොවේ
අ 5.7 17. සභාපති ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු/වරියක වන විට ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු/වරියක පත් කිරීම ආදිය.				අදාළ නොවේ
අ 5.8 18. ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ සමග සිදු කෙරෙන රහස්‍යභාවයෙන් යුතු සාකච්ඡා				අදාළ නොවේ
අ 59 19. විධායක නොවන අධ්‍යක්ෂවරුන් රැස්වීම				අදාළ නොවේ
අ 5.10 20. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල සඳහන් වැදගත් කරුණු වාර්තා කිරීම	අනුකූලතාව දක්වා ඇත			

ආයතනික පාලනය

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
තොරතුරු සැපයීම				
අ 6.1 21. කාලීන සහ සුදුසු පරිදි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ලක් දීම	අනුකූලතාව දක්වා ඇත			
අ 6.2 22. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අදාළ ප්‍රමාණවත් දැනුම්දීම්, න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා	අනුකූලතාව දක්වා ඇත			
අ.7 අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කිරීම්				
අ 7.1 23. නාම යෝජනා කමිටුව	අනුකූලතාව දක්වා ඇත කරුණාකර වැඩි විස්තර සඳහා 136 පිටුවෙහි දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව බලන්න.			
අ 7.2 24. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය තක්සේරු කිරීම	අනුකූලතාව දක්වා ඇත නාම යෝජනා කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමාලෝචනය කරනු ලැබෙන අතර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරයි.			
අ 7.3 25. අභිනවයෙන් පත් කළ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර කොටස් හිමියන් වෙත හෙළිදරවු කිරීම	අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂවරුන් සියළුම දෙනාගේ විස්තර කළඹ වාර්ෂික වාර්තාවෙහි පළ කර ඇත.			
අ.8 අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම				
අ 8.1 26. විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත් කිරීම	අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අලුතින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම් සියල්ලම කළ යුත්තේ 1997 අංක 07 දරන චිවිඩීවිෆ්සී පනතේ (2003 අංක 15 සහ 2011 අංක 45 දරන පනත් මගින් සංශෝධිත) විධිවිධානවලට අනුකූලව ය.			
අ 8.2 27. කොටස් හිමියන් විසින් අධ්‍යක්ෂවරුන් තෝරා පත් කිරීම	අනුකූලතාව දක්වා ඇත චිවිඩීවිෆ්සී පනතට අනුව සෑම අධ්‍යක්ෂවරයෙකුම සෑම වසර 3 කටම වරක් නැවත තෝරා පත් කිරීමට යටත් වේ.			
අ 8.3 ඉල්ලා අස්වීම් 28. අධ්‍යක්ෂවරුන් සිය ඉල්ලා අස්වීමේ තීරණවලට හේතු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය.	අනුකූලතාව දක්වා ඇත			
අ.9 අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම				
අ 9.1 29. අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම	අනුකූලතාව දක්වා ඇත			
අ 9.2 30. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටුවලට අදාළ වාර්ෂික ස්වයං-ඇගයීම්	අනුකූලතාව දක්වා ඇත			
අ 9.3 31. සෑම අධ්‍යක්ෂවරයෙකුම නැවත පත් කෙරෙන කාලය වන විට ඔහුගේ/ඇයගේ සහභාගීත්වය, දායකත්වය සහ මැදහත්වීම සමාලෝචනය කිරීම සඳහා ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතුය.	අනුකූලතාව දක්වා ඇත			

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
අ 9.4 32. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සකස් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීමට හැකි බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවලට අදාළ වාර්ෂික කාර්යසාධන ඇගයීම හෙළිදරවු කිරීම මණ්ඩලය වෙත අධ්‍යක්ෂවරුන් නැවත පත් කෙරෙන අවස්ථාවේදී අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සිදු කර ඇත්තේ අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව බවටත් තහවුරු කෙරෙන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව.	අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ කාර්යසාධනය අගයයි.			
අ.10 අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු හෙළිදරවු කිරීම				
අ 10 අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු හෙළිදරවු කිරීම	අනුකූලතාව දක්වා ඇත			
අ 10.1 33. අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර	අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂවරුන්ට අදාළ වීම විස්තර වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩල කළඹ යටතේ දක්වා ඇත.			
අ.11 කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය ඇගයීම				
අ.11 කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය ඇගයීම	අනුකූලතාව දක්වා ඇත			
අ 11.1 34. කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී සඳහා වූ මූල්‍ය ඉලක්ක	අනුකූලතාව දක්වා ඇත බැංකුවේ ආයතනික සැලැස්මට අනුකූල වේ.			
අ 11.2 35. කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය ඇගයීම	අනුකූලතාව දක්වා ඇත			
ආ. අධ්‍යක්ෂවරුන්ගේ වේතන				
ආ 1 වේතන හා දීමනා ක්‍රමවේද	අනුකූලතාව දක්වා ඇත බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට වැටුපක් හිමි නොවන අතර මුදල් අමාත්‍යාංශය විසින් නියම කර ඇති පරිදි ඔවුන්ට දීමනාවක් හිමි වේ.			
ආ 1.1 36. මානව සම්පත් සහ වේතන කමිටුව	අනුකූලතාව දක්වා ඇත වේතන ප්‍රතිපත්තියට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දැක්වීමේ වගකීම මානව සම්පත් හා වැටුප් කමිටුව වෙත පැවරේ.			
ආ 1.2 37. වේතන කමිටුවේ සංයුතිය	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, වැඩි විස්තර සඳහා මෙම වාර්ෂික වාර්තාවේ 134-135 පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටු වාර්තාව බලන්න.			

ආයතනික පාලනය

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ආ 1.3 38. වේතන කමිටුවේ සභාපති/සාමාජිකයන්ට අදාළ විස්තර වාර්ෂික වාර්තාවේ දක්වා තිබීම.	අනුකූලතාව දක්වා ඇත			
ආ 1.4 39. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ වේතන				අදාළ නොවේ (අධ්‍යක්ෂවරුන් සඳහා ගෙවීම් සිදු කරනු ලබන්නේ රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛවලට අනුවය).
ආ 1.5 40. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ වේතන				අදාළ නොවේ එච්ඩීඑෆ්සී බැංකු පනතට අනුව විධායක අධ්‍යක්ෂවරුන් කිසිවෙකු නොමැත.
ආ. 2 වේතන කමිටුවේ සංයුතිය				
ආ 2.1 41. විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංයුතිය සහ වේතන ආ 2.2 42. සමාගමේ දීර්ඝ කාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විධායක අධ්‍යක්ෂවරුන්ගේ වේතන සකස් කිරීම ආ 2.3 43. වේතන වෙනත් සමාගම් සමග සංසන්දනය කිරීම ආ 2.4 44. සමූහයේ අනෙකුත් වෙනත් සමාගම් සමග වේතන සංසන්දනය කිරීම ආ 2.5 45. විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වූ කාර්යසාධනය පාදක ගෙවීම් ආ 2.6 46. අධ්‍යක්ෂවරුන් සඳහා වූ විධායක ගෙවීම් කොටස ආ 2.7 47. විධායක අධ්‍යක්ෂවරුන්ගේ වේතන සකස් කිරීම ආ 2.8 48. අධ්‍යක්ෂවරුන්ගේ සේවය කලින් අවසන් කිරීමේදී ලබා දෙන ප්‍රතිලාභ ආ 2.9 49. අධ්‍යක්ෂවරුන්ගේ සේවය කලින් අවසන් කිරීමේදී ලබා දෙන ප්‍රතිලාභ (ආරම්භක හිවිසුමේ ඇතුළත් නොවූ) ආ 2.10 50. විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වූ වේතන මට්ටම				අදාළ නොවේ කරුණාකර, ආ 1. සඳහා වූ අදහස් බලන්න.

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ආ.3 වේතන හෙළිදරවු කිරීම				
ආ 3.1 51. වේතන හෙළිදරවු කිරීම	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, ආ 1. සඳහා වූ අදහස් බලන්න.			
ඇ. කොටස් හිමියන් සමග සබඳතා				
ඇ 1. වාර්ෂික මහා සභා රැස්වීම සප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීම සහ මහා සභා රැස්වීම් පැවැත්වීම	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ 1.1 52. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුම් දීම	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ 1.2 53. වෙනස් ගැටලු සියල්ලම සඳහා වෙනම යෝජනා තිබීම	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ 1.3 54. පෙරකලාසි ඡන්ද දායකයන් යොදා ගැනීම	**අනුකූලතාව දක්වා ඇත** පෙරකලාසි ඡන්ද සියල්ලම සහ කොටස් හිමියන් විසින් ඒ ඒ යෝජනාවට අදාළව ලබා දී ඇති ඡන්ද වාර්තා කිරීමේ ක්‍රමවේදයක් බැංකුව සතුව පවතී.			
ඇ 1.4 55. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු සියල්ලෙහිම සභාපතිවරුන් වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වී සිටීම.	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ 1.5 56. වාර්ෂික මහා සභා රැස්වීමේදී ඡන්දය දීම	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ.2 කොටස් හිමියන් සමග සිදු කෙරෙන සන්නිවේදනයන්				
ඇ 2.1 සිට ඇ 2.5 දක්වා 57. කොටස් හිමියන් සමග සිදු කෙරෙන සවලදායී සන්නිවේදනයන්	**අනුකූලතාව දක්වා ඇත** තොරතුරු ලබා ගැනීම උදෙසා සමාගම් (011-2423362) ලේකම් හෝ අදාළ සහකාරවරුන් සම්බන්ධ කර ගන්නා ලෙස කොටස් හිමියන්ගෙන් ඉල්ලුම් කෙරේ.			
ඇ.3 ප්‍රධාන හා වැදගත් ගනුදෙනු				
ඇ 3 ප්‍රධාන ගනුදෙනු	**අනුකූලතාව දක්වා ඇත**			
ඇ 3.1 58. ප්‍රධාන ගනුදෙනු	**අනුකූලතාව දක්වා ඇත** එච්ඩිඑෆ්සී බැංකුවේ වත්කම් පදනම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් වැල්ල කළ හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 185 වගන්තිය මඟින් නිශ්චය කර දක්වා ඇති ප්‍රධාන ගනුදෙනු කිසිවක් නොවීය.			
ඇ 3.2 59. හෙළිදරවු කිරීමේ අවශ්‍යතා සහ කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම	**අනුකූලතාව දක්වා ඇත**			

ආයතනික පාලනය

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ඈ. වගවීම සහ විගණනය				
ඈ 1. මූල්‍ය හා ව්‍යාපාරික ආකෘතිය, අවදානම් කළමනාකරණය පිළිබඳව වාර්තා කිරීම	අනුකූලතාව දක්වා ඇත			
ඈ 1.1 60. වාර්ෂික වාර්ෂික වාර්තාව සඳහා වූ අභ්‍යන්තර පාලන	අනුකූලතාව දක්වා ඇත			
ඈ 1.2 61. ව්‍යවස්ථාපිත සහ නියාමනාත්මක වාර්තාකරණය	අනුකූලතාව දක්වා ඇත			
ඈ 1.3 62. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සිය මතය පළ කිරීම	අනුකූලතාව දක්වා ඇත			
ඈ 1.4 63. වාර්ෂික වාර්තාවෙහි අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පළ කිරීම	අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 124 සිට 127 දක්වා පිටුවල දක්වා තිබේ.			
ඈ 1.5 64. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය	අනුකූලතාව දක්වා ඇත මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය මෙම වාර්ෂික වාර්තාවේ 143 සිට 144 දක්වා පිටුවල දක්වා තිබේ.			
ඈ 1.6 65. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය	අනුකූලතාව දක්වා ඇත කරුණාකර 58-87 පිටු බලන්න.			
ඈ 1.7 66. බරපතල ගණයේ ප්‍රාග්ධන අලාභ දැනුම් දීම උදෙසා අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම				අදාළ නොවේ
ඈ 1.8 67. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු	අනුකූලතාව දක්වා ඇත			
ඈ.2 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය				
ඈ.2 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය	අනුකූලතාව දක්වා ඇත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සහ අවදානම් කළමනාකරණ වාර්තාව සඳහා කරුණාකර, පිළිවෙළින් පිටු අංක 128-129 සහ 140-141 බලන්න.			
ඈ 2.1 68. අභ්‍යන්තර පාලන පද්ධතිය, අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්ෂික ඇගයීම	අනුකූලතාව දක්වා ඇත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සහ අවදානම් කළමනාකරණ වාර්තාව සඳහා කරුණාකර, පිළිවෙළින් පිටු අංක 128-129 සහ 140-141 බලන්න.			
ඈ 2.2 69. සමාගම මුහුණ දෙන ප්‍රධාන අවදානම් වර්ග	අනුකූලතාව දක්වා ඇත			

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ඇෆ 2.3 70. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ අවශ්‍යතාව	අනුකූලතාව දක්වා ඇත විගණන කමිටු වාර්තාව සඳහා කරුණාකර 139 පිටුව බලන්න.			
ඇෆ 2.4 71. අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව සහ අදාළ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සඳහා	අනුකූලතාව දක්වා ඇත			
ඇෆ 2.5 72. අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම්	අනුකූලතාව දක්වා ඇත			
ඇෆ.3 විගණන කමිටුව				
ඇෆ.3 විගණන කමිටුව	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, විගණන කමිටු වාර්තාව සඳහා 139 පිටුව බලන්න.			
ඇෆ 3.1 73. විගණන කමිටු සංයුතිය	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, විගණන කමිටු වාර්තාව සඳහා 139 පිටුව බලන්න.			
ඇෆ 3.2 74. විගණන කමිටුවේ යොමුකිරීමේ අනුදේශ සහ අධිකාරීත්වය හා රාජකාරි	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, විගණන කමිටු වාර්තාව සඳහා 139 පිටුව බලන්න.			
ඇෆ 3.3 75. විගණන කමිටුවේ හෙළිදරවු කිරීම්	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, සාමාජිකත්වය පිළිබඳ විස්තර සඳහා පිටු අංක 139 හි දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව බලන්න.			
ඇෆ. 4 අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව				
ඇෆ.4 සම්බන්ධිත පාර්ශ්ව	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා 137 සිට 138 දක්වා පිටු බලන්න. සමාලෝචන කමිටුව			
ඇෆ 4.1 76. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු බණ්ඩ 24 ප්‍රමිතිය ප්‍රකාරව වනු ඇත.	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා 137 සිට 138 දක්වා පිටු බලන්න. සමාලෝචන කමිටුව			
ඇෆ 4.2 77. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුවේ සංයුතිය	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව සඳහා 137 සිට 138 දක්වා පිටු බලන්න.			
ඇෆ 4.3 78. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුවේ යොමුකිරීමේ අනුදේශ සහ අධිකාරීත්වය හා රාජකාරි	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව සඳහා 137 සිට 138 දක්වා පිටු බලන්න.			

ආයතනික පාලනය

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ඈ. 5 ව්‍යාපාරික පිළිවෙත් සංග්‍රහය සහ ආචාර ධර්ම				
ඈ.5 සිට ඈ. 5.4 දක්වා ව්‍යාපාරික පිළිවෙත් සංග්‍රහය සහ ආචාර ධර්ම	යොදා ගත යුතුව ඇත			
ඈ.5.1 79. ව්‍යාපාරික පිළිවෙත් සංග්‍රහය සහ ආචාර ධර්ම	අනුකූලතාව දක්වා ඇත			
ඈ. 6 ආයතනික පාලන හෙළිදරවු කිරීම්				
ඈ.6 සිට ඈ 6.1 දක්වා 80. ආයතනික පාලන හෙළිදරවු කිරීම්	අනුකූලතාව දක්වා ඇත			
ඉ. කොටස් හිමියන්				
ඉ. ආයතනික ආයෝජකයන්				
ඉ.1 සිට ඉ 1.1 දක්වා 81. කොටස් හිමියන්ගේ ජන්ද	අනුකූලතාව දක්වා ඇත තම ජන්දය පාවිච්චි කරන ලෙස ආයතනික කොටස් හිමියන් දිරිමත් කෙරේ. එමෙන්ම, ආයෝජන සිදු කිරීම හෝ තීරණ ගැනීමෙන් වැළකී සිටීම සම්බන්ධයෙන් තම ජන්දය භාවිත කරන ලෙස මෙන්ම අවශ්‍ය නම් ස්වාධීන උපදේශන ලබා ගැනීම උදෙසාද ඔවුන් දිරිමත් කෙරේ.			
ඉ.2 ආයතනික පාලනය හෙළිදරවු කිරීම් ඇගයීම				
ඉ. 2 82ග ආයතනික පාලන ක්‍රියාදාම ඇගයීම	අනුකූලතාව දක්වා ඇත			
ඊ. අනෙකුත් ආයෝජකයන්				
ඊ.1 ආයෝජනය/තීරණවලින් වැළකීම 83. සමාගම්වල කොටස් වෙනුවෙන් සෘජු ආයෝජන සිදු කරන තනි කොටස් හිමියන්ව එවුන් සිදු කරන ආයෝජන හෝ තීරණ ගැනීමෙන් වැළකී සිටීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විශ්ලේෂණ සිදු කරන ලෙස හෝ ස්වාධීන උපදේශන ලබා ගන්නා ලෙස දිරිමත් කිරීම.	අනුකූලතාව දක්වා ඇත			
ඊ.2 කොටස් හිමියන්ගේ ජන්දය දීම්	අනුකූලතාව දක්වා ඇත පුද්ගලික ගනුදෙනුකරුවන් මහා සභා රැස්වීම්වලට සහභාගී වීම සහ ස්වකීය ජන්දය චීවායෙහිදී පාවිච්චි කිරීම බැංකුව අගය කරයි.			
ඊ 2.1 84. තනි පුද්ගල කොටස් හිමියන්ගේ ජන්දය දීම්	අනුකූලතාව දක්වා ඇත			
ඵ. Internet of Things **සහ සයිබර් සුරක්ෂිතතාව**				
ඵ.1 85. සයිබර් සුරක්ෂිතතා අවදානම	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කර ඇති තොරතුරු සුරක්ෂිතතා උපායමාර්ගය (පාදම් සුරක්ෂිතතා ප්‍රමිතිය) යොදා ගැනීමට විධිවිධාන සීදැනටමත් පියවර ගෙන තිබේ.			
ඵ.2 86. සයිබර් සුරක්ෂිතතා අවදානම කළමනාකරණ ප්‍රතිපත්තියක් යොදා ගැනීම				

මාර්ගෝපදේශය	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
ළ.3 87. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙනුවෙන් නිරන්තර සහ ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීම	පානන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිශීලක දැනුම්වත්භාවය ඉහළ නැංවීම තුළින් සුරක්ෂිතතා පාලනය, අවදානම් තක්සේරුකරණය සහ අවදානම් කළමනාකරණය ආදී ක්ෂේත්‍ර ඒමඟින් ආවරණය කෙරේ.			
ළ.4 88. අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කල සිදු කරන ස්වාධීන සමාලෝචන සහ සහතිකකරණයන් ඔස්සේ සයිබර් සුරක්ෂිතතා අවදානම කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරනු ලැබෙන බව සහතික කරයි.	මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය සෑම මසකම රැස් වන තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරී කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලැබේ.			
ළ.5 89. සයිබර් සුරක්ෂිතතා අවදානම හඳුනා ගැනීම සහ කළමනාකරණය කර ගැනීම සඳහා වන ක්‍රියාවලිය වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කිරීම.				
ඌ. පරිසරය, සමාජය සහ පාලනය				
ඌ.1 පරිසර, සමාජ හා පාලන වාර්තාකරණය	පවතින පිළිවෙත් වැඩිදියුණු කිරීම			
ඌ. 1.1 90. සමාගම් විසින් තොරතුරු ලබා දිය යුතුය				
ඌ 1.2. පාරිසරික සාධක	පවතින පිළිවෙත් වැඩිදියුණු කිරීම			
ඌ 1.2.1 91. සමාගමක පාරිසරික පාලනය				
ඌ 1.3 සමාජමය සාධක	පවතින පිළිවෙත් වැඩිදියුණු කිරීම			
ඌ 1.3.1 92. සමාගමේ ව්‍යාපාරික ආකෘතිය				
ඌ 1.4 පාලනය	පවතින පිළිවෙත් වැඩිදියුණු කිරීම			
ඌ 1.4.1 93. පාලන ව්‍යුහයක් පිහිටුවීම				
පාරිසරික, සමාජ සහ පාලන සාධක ආශ්‍රිත අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව	පවතින පිළිවෙත් වැඩිදියුණු කිරීම			
ඌ 1.5.1 94. අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම				

ආයතනික පාලනය

තුන කොටස

කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත සමාගම් සඳහා වූ ආයතනික පාලන රීතිවල 7.10 වගන්තිය යටතේ දැක්වෙන ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවලට එච්ඩීඑෆ්සී බැංකුව දක්වන අනුකූලතාව.

අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ තොරතුරු හෙළිදරවු කිරීම්	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
7.10.1 (අ) සිට (ඇ) දක්වා (i) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන නිවැරදි විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පිළිබඳ තහවුරු කිරීම	අනුකූලතාව දක්වා ඇත			
7.10.2 (අ) (ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන නිවැරදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පිළිබඳ තහවුරු කිරීම	අනුකූලතාව දක්වා ඇත			
7.10.2 (ආ) (iii) තම ස්වාධීනතාව හෝ ස්වාධීන නොවීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදු කරනු ලබන ප්‍රකාශනය	අනුකූලතාව දක්වා ඇත			
7.10.3 (අ) (iv) අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනතාව හෝ ස්වාධීන නොවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික තීන්දුව	අනුකූලතාව දක්වා ඇත			
7.10.3 (ආ) (v) අධ්‍යක්ෂවරුන් මෙම සුදුසුකම සපුරා නොතිබිණ.				අදාළ නොවේ
7.10.3 (ඇ) (vi) සෑම අධ්‍යක්ෂවරයෙකුටම අදාළ කෙටි ජීව හා සුදුසුකම් දත්ත පත්‍රිකාවක්	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, පිටු අංක 40 සිට 47 දක්වා ඇති අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ බලන්න.			
7.10.3 (ඈ) (vii) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අලුතින් අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමෙන් අනතුරුව අදාළ සමාගම විසි අධ්‍යක්ෂවරයාගේ කෙටි සුදුසුකම් පත්‍රිකාවක් මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කිරීම සඳහා කොටස් හුවමාරුව වෙත ලබා දිය යුතුය. විසි සුදුසුකම් කළඹට ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ සඳහන් කර ඇති කාරණා සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් විය යුතුය.	කදපවකසඛ අසඛය			
වේතනවලට සහ වේතන කමිටුවට අදාළ හෙළිදරවු කිරීම්				
7.10.5 (අ) (viii) වේතන කමිටුවේ සාමාජිකත්වය දරන නිවැරදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව.	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, පිටු අංක 134 සිට 135 දක්වා බලන්න.			
7ග10ග5 (අ) (ix) වෙනම වේතන කමිටුවක් පිහිටීම	අනුකූලතාව දක්වා ඇත			
7.10.5(අ) (x) වේතන කමිටුවේ සභාපති	අනුකූලතාව දක්වා ඇත කරුණාකර, වාර්තාවේ 134-135 පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටු වාර්තාව බලන්න.			

අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ තොරතුරු හෙළිදරවු කිරීම්	පූර්ණ අනුකූලතාව	අර්ධ අනුකූලතාව	අනනුකූලතාව	අදාළ නොවේ
7.10.5 (ආ) (xi) වේතන කමිටුවේ කාර්යභාරයන්	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, වාර්තාවේ 134-135 පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටු වාර්තාව බලන්න.			
7.10.5 (ඇ) (xii) වේතන කමිටුවේ සේවය කරන අධ්‍යක්ෂවරුන්ගේ නම්	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, පිටු අංක 134 සිට 135 දක්වා බලන්න.			
7.10.5 (ඇ) (xiii) වැටුප් ප්‍රතිපත්තිය	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, පිටු අංක 134 සිට 135 දක්වා ඇති මානව සම්පත් හා වැටුප් කමිටුව පිළිබඳ වාර්තාව බලන්න.			
7.10.5 (ඇ) (xiv) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ගෙවන ලද පාරිශ්‍රමිකයන්හි සමුච්චිත වටිනාකම (මුදල් සහ මුදල් නොවන ප්‍රතිලාභ ඇතුළත්ව)	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, පිටු අංක 170 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 11 වන සටහන බලන්න.			
විගණන කමිටු වාර්තාව යටතේ ඇති අන්තර්ගතයන්				
7.10.6 (අ) (xv) නිවැරදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව.	**අනුකූලතාව දක්වා ඇත** 7.10.6.(අ). රීතියට අනුකූලව අවශ්‍ය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව විගණන කමිටුවට ඇතුළත් බව එච්ඩීඑෆ්සී බැංකුව සනාථ කරයි.			
7ග10ග6 (අ) සහ 7.10.6 (ඇ) (xvi) වෙනම විගණන කමිටුවක් පිහිටීම	**අනුකූලතාව දක්වා ඇත**			
7.10.6 (ආ) (xvii) විගණණ කමිටුවේ කාර්යභාරයන්	**අනුකූලතාව දක්වා ඇත** ශ්‍රී ලංකා මහ බැංකුවේ 3(6) රීතිය සහ මූල්‍ය චක්‍රලේඛ යටතේ අනිවාර්ය කර ඇති කාර්යයන්හි විගණන කමිටුව නිරත වෙයි.			
7.10.6 (ඇ) (xviii) විගණන කමිටුවේ සේවය කරන අධ්‍යක්ෂවරුන්ගේ නම්කරුණාකර,139 පිටුව බලන්න.	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර,139 පිටුව බලන්න.			
7.10.6.(අ) සහ 7.10.6(ඇ) (xix) විගණන කමිටුවේ සභාපති	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර,139 පිටුව බලන්න.			
7.10.6 (අ) සහ 7.10.6 (ඇ) (xx) සභාපතිගේ සුදුසුකම්	**අනුකූලතාව දක්වා ඇත** කරුණාකර, පිටු අංක 40 සිට 47 දක්වා ඇති අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් කළඹ බලන්න.			
7.10.6 (අ) සහ 7.10.6 (ඇ) (xxi) කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ සහභාගීත්වය	**අනුකූලතාව දක්වා ඇත**			
7.10.6 (ඇ) (xxii) බාහිර විගණකවරුන්ගේ ස්වාධීනතාව				**අදාළ නොවේ** බැංකුවේ බාහිර විගණක ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලංකාවේ විගණකාධිපති ජනරාල් ය.

අවදානම් කළමනාකරණ වාර්තාව

වසර ගණනාවක් පුරාවටම ස්වකීය සාමාන්‍ය මෙහෙයුම් අතරට අවදානම් කළමනාකරණය අන්තර්ග්‍රහණය කරගත් සංස්කෘතියක පන්නරය ලබමින් එච්ඩීඩබ්ලිසී සිය අවදානම් කළමනාකරණ කාර්ය රාමුව සවිබල ගන්වා ගෙන තිබේ.

මේ වන විට අවදානම් කළමනාකරණය බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ මෙහෙයුම් ඉලක්කවලට ගැලපෙන පරිදි අපගේ වර්ධන හා උපායමාර්ගික දිශානතිය තුළට මනාව ඒකාබද්ධ කර තිබේ.

මේ නිසා ඉස්මතු විය හැකි අවදානම් සහ ඒවා අවම කිරීමේ ක්‍රමවේද පිළිබඳව බැංකුවේ පිරිස් බලකාය දැනුම්වත්ව තබන පදනම් ස්ථම්භයක් ලෙස සවිමත් අවදානම් කළමනාකරණය ක්‍රියා කරයි.

සිය මෙහෙයුම් සියල්ලම පුරාවට අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරන එච්ඩීඩබ්ලිසී බැංකුව අනලස් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සියලුම අවදානම් නිරාවරණයන් අවම කර ගැනීම උදෙසා නිරතුරුවම සිය අවදානම් කළමනාකරණ පිළිවෙත් හා විධිවිධාන සවිබල ගන්වයි. කොවිඩ් 19 වසංගතයේ බලපෑම සහ ඒ අනුව සිදු කෙරුණු රට වසා දැමීම් හමුවේ බැංකුවේ මෙහෙයුම් කෙරෙහි අවදානම් කළමනාකරණය නිසා ඒල්ල වූ දායකත්වය සුවිශාල විය.

අක්‍රිය ණය නිසා ඒල්ල වන බලපෑම සැලකිය යුතු මට්ටමේ එකක් වන හෙයින් බැංකුවේ ණය තත්ත්වය සහ නියාමන සාධක වෙත දක්වන අනුකූලතාව නිසි අවශ්‍යතාවලට ගැලපෙන පරිදි පවතින බව සහතික කරමින් හා බැංකුවේ සමස්ථ ස්ථායීතාව සුරක්ෂිත කළ හැකි අවදානම් දරා ගැනීමේ මට්ටම් පවත්වා ගනිමින් අපගේ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් දෙපාර්තමේන්තුව සමග එක්ව නිරතුරුවම අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරයි.

2020 දී මුහුණ පෑ ප්‍රධාන අවදානම් අභියෝග

සාමාන්‍යයෙන් බැංකුව සාර්ව හා ක්ෂුද්‍ර පාරිසරික සාධක තුළ වෙනස්කම් නිසා මතු වන අවදානම්වලට මුහුණු දෙයි. 2020 වසරේදී තාක්ෂණික වැඩිදියුණු කිරීම් නිසා උද්ගත වූ අභියෝගවලට මුහුණ දෙමින් නව බැංකු නිපැයුම් ප්‍රවර්ධනය කිරීම සහ නියාමන අධිකාරීන්හි පාලනයන් ඉහළ නැවීම සිදු කරන අතරම කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා බැංකුවට පෙර නොවූ විරූ අභියෝගයකට මුහුණ පාන්නට සිදු විය.

එමෙන්ම, 2019 වසරේදී 13.6% ලෙස පැවැති බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකය 2020 දී රට වසා දැමීමේ තීරණ හේතුවෙන් 20.2% දක්වා ඉහළ ගොස් ඇති අතර ආර්ථිකයේ විවිධ අංශ වටා ඒකරාශී වී තිබුණු අවිනිශ්චිතතා නිසා අපගේ අක්‍රිය ණය කළඹ ඉහළ යාම ඒ අනුව සිදු විය.

ණය සහන කොන්දේසි සහ ණය ආපසු ගෙවීම් ප්‍රමාද වීම නිසා අක්‍රිය ණය ප්‍රමාණය ඉහළ යාමේ අවදානම ජය ගැනීමටද බැංකුවට සිදු වී තිබේ. මීට අමතරව, බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික සහ ආයතනික ගනුදෙනුකරුවන් ආශ්‍රිත ව්‍යාපාරික වර්ධනය පහළ බැසීමට හේතු වූ ආර්ථික මන්දගාමීත්වයේ බලපෑම් සමනය කර ගැනීමේ අභියෝගයටද බැංකුව මුහුණ පා සිටියි.

නිසැක වශයෙන්ම, ගනුදෙනුකරුවන් සවිගන්වමින් මූල්‍ය සේවා ලබා දෙන අතරම අවදානම් අවම කර ගැනීම සඳහා ප්‍රධාන විධිවිධාන සවිබල ගැන්වීම කෙරෙහි බැංකුවේ අවධානය නොවෙසන්ව යොමු වී පැවතිණ. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී:

- සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස තබා ගෙන ලබා දුන් ණයද ඇතුළත්ව ගනුදෙනුකරුවන් 43% ක් ආවරණය කරමින් බැංකුව ණය සහන පහසුකම් ලබා දෙන ලදි.
- මේ අනුව, කල්බදු සහ සංචාරක කර්මාන්තයේ ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් මාස 12 ක ණය සහන කාලයට අමතරව අනෙකුත් ගනුදෙනුකරුවන් සඳහා මාස හයක ණය නැවත ගෙවීමේ සහන කාලයක් ලබා දෙන ලදි.
- ඇතැම් අවස්ථාවලදී අවම නියාමන අවශ්‍යතාවද ඉක්මවා යමින් ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය ස්වරූපයෙන් මෘදු ණය ලබා දීමටද පියවර ගැණිණ.
- නිවාස ණය ආපසු ගෙවීම් ප්‍රතිසංවිධානය කරමින් පහසු හා දරා ගත හැකි කොන්දේසි යටතේ ඇතැම් ගනුදෙනුකරුවන් වෙත ණය ලබා දෙන ලදි.
- ව්‍යාපාරික ගනුදෙනුකරුවන් නැවතත් හිතකර ව්‍යාපාරික තත්ත්වයක් අත්කර ගන්නා තුරු ඔවුන් වෙත සහන කාල සීමා ලබා දීමට බැංකුව පියවර ගත්තේය.
- ආර්ථිකය මන්දගාමීව පැවැති කාල සීමාව තුළ මුහුණ පාන්නට සිදු වූ පීඩනයන් අඩු කරමින් බැංකුව විසින් දේපල වෙන්දේසි කිරීම හා ණය ගෙවීම් පැහැර හැර තිබුණු ගනුදෙනුකරුවන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම කල් දැමීමද සිදු කෙරිණ.

අවදානම් කළමනාකරණ ක්‍රමවේද සහ ශක්‍යතා සවිබල ගැන්වීම උදෙසා ගත වූ වර්ෂ තුළ මෙන්ම මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදීද බැංකුව ක්‍රියාමාර්ග කිහිපයක්ම අනුගමනය කළේය.

- ගනුදෙනුකරුවන් වෙත නිරන්තර සිහිකැඳවීම් යැවීමේ සහ ණය ගෙවීම් රැස්කර ගැනීමේ ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් සකස් කරන ලද ගෙවීම් පැහැර හැරීම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- එම ගෙවීම් පැහැර හැරීම් කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව අදාළ සේවකයන් සියලුම දෙනා වෙත ලබා දෙන ලදි.
- බැංකුවේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන අංගයක් ලෙස අවදානම් කළමනාකරණ සංස්කෘතිය සවිගැන්වීම.
- බැංකුවේ ව්‍යාපාරික හා නියාමන අවශ්‍යතාවලට අනුගත වන පරිදි අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්ය රාමුව අදාළ අවදානම් ප්‍රතිපත්ති හා ආකෘතිද සමගින් සමාලෝචනය කරන ලදි.
- විවිධාකාර ක්ෂුද්‍ර හා සාර්ව මට්ටම්වල කම්පනයන් හමුවේ නොසැලී සිටීමට බැංකුවට ඇති නම්‍යශීලී හැකියාව සහතික කරනු පිණිස, ඉස්මතු විය හැකි අවදානම් හා අවිනිශ්චිතතා හඳුනා ගනිමින් නිරන්තර පීඩන පරීක්ෂාවන් සිදු කරන ලදි.
- ශාඛා මෙහෙයුම්වල කාර්යක්ෂමතාව හා සඵලදායීතාව අධීක්ෂණය කරනු පිණිස බැංකුවේ ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ප්‍රධාන අවදානම් සාධකවලට අනුකූල වන පරිදි මෙහෙයුම් ප්‍රගති පුවරුවක් (operational dashboard) දියත් කරන ලදි.

- බැංකුවේ අවදානම් පරිසරය ආශ්‍රිත වෙනස්කම්වලට අනුගත වන පරිදි හානිකරණ ප්‍රතිපාදන ප්‍රතිපත්ති සංශෝධනය කරනල දි. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ බාසල් ෂෂෂ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි මෙය සිදු කරන ලදි.
- ණය අනුමත කිරීම ආශ්‍රිතව බැංකුවට හිතකර මට්ටම් පවත්වා ගැනීම සහතික කරමින් ණය කාර්ය ගලනය 2019 වසරේදී ප්‍රතිව්‍යුහගත කරන ලදි. එම ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව, මේ වන විට රු. මිලියන 1.5 ට වඩා වැඩි වටිනාකමකින් යුතු ණය ඉල්ලුම් බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඇගයීමට ලක් කෙරේ. වසංගතයේ ව්‍යාප්තියට පෙර කාලය තුළ ඉහළ අක්‍රිය ණය අනුපාතික වළක්වා ගැනීමට සහායක් මධ්‍යගත ණය බෙදාහැරීමේ ක්‍රියාවලිය මගින් ලැබිණ.
- මේ වන විට බැංකුව ණය අධීක්ෂණ හා සමාලෝචන යාන්ත්‍රණයන් ආශ්‍රිතව සවිමත් අවදානම් සංස්කෘතියක් අනුග මනය කරයි. එමෙන්ම, අක්‍රිය ණය, තැන්පතු, ද්‍රවශීලතා අනුපාතිකය, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව ආදිය ආශ්‍රිතව පවතින අවදානම් දරා ගැනීමේ සීමාව පිළිබිඹු වන පරිදි විචක්ෂණ අවදානම් මට්ටම් නැවත නිශ්චය කර ගැනීමටද බැංකුව ක්‍රියා කර ඇත.
- ඉහළ ගුණාත්මකභාවයක් සහ අඩු අවදානමක් සහිත කළඹවල් හඳුනා ගැනීමටද සහාය වෙමින් බැංකුව විසින් ණය දීම් පසුපස ඇති අවදානම් තක්සේරු කරනු පිණිස අවදානම් පාදක මිලකරණ ක්‍රියාවලියක්ද පිහිටුවා ගන්නා ලදි.

බැංකුවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් දැනට පවතින හා ඉදිරියේදී උද්ගත විය හැකි අවදානම් වෙනතකට යොමු කරන අතරම බැංකුව සිය වර්ධන අරමුණු සමගින් ප්‍රගතිය කරා ගමන් කිරීමේදී පහත අභියෝගවලටද මුහුණ දෙමින් සිටී:

- රු. මිලියන 7,500 ක අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාව ඉටු කිරීම
- බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම ඊඊ සිට ආයෝජන ශ්‍රේණිය දක්වා වැඩිදියුණු කර ගැනීම
- සයිබර් සුරක්ෂිතතාව ඉහළ නංවා ගැනීම සහ තොරතුරු තාක්ෂණික යටිතලපහසුකම් සංවර්ධනය කර ගැනීම
- සංකේන්ද්‍රණ අවදානම අවම කර ගැනීම සඳහා පවතින අරමුදල් ක්‍රමවේදය ප්‍රතිව්‍යුහගත කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත ලබා දී ඇති ණය සහාය වැඩසටහන කළමනාකරණය කර ගැනීම

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

අපගේ ප්‍රධාන මෙහෙයුම් තුළට අවදානම් කළමනාකරණ සංස්කෘතියක් අන්තර්ග්‍රහණය කර ගනිමින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාවේ යොදවයි.

වැඩිදියුණු වූ තීන්දු ගැනීමේ ක්‍රියාවලියක නිරත වීමට මෙන්ම අවදානම් කළමනාකරණය කර ගැනීම උදෙසා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීමට එමගින් බැංකුවට ඉඩකඩ සැලසේ. බැංකුවේ දෙපාර්තමේන්තු සහ කාර්යභාරයන් සියල්ලම මෙන්ම බැංකුවේ ස්ථායීතාව හා සාර්ථකත්වය කෙරෙහි බලපෑම් ඇති කරන බාහිර සාධකද සම්බන්ධයෙන් විස්තීර්ණ දැක්මක් ලබා ගැනීම ඊට ඇතුළත් වේ.

මෙම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව හරහා බැංකුවේ අවදානම් කමිටුව අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ ස්ථාපිත දරා ගැනීමේ සීමා ඇතුළත ඒවා පාලනය කිරීම සිදු කරයි.

බැංකුව කෙරෙහි බලපෑමක් චිල්ල කරනු ඇතැයි හඳුනාගෙන ඇති අවදානම් කළමනාකරණය කිරීම සඳහා අදාළ පාලන හා ප්‍රමිති සැපයෙන මෙම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව මගින් එකී අවදානම් අවම කර ගැනීමේදී ක්‍රියාත්මක කර තිබිය යුතු පිළිවෙත්ද සැපයේ.

අවදානම් කළමනාකරණ සංස්කෘතිය

බැංකුවේ ප්‍රධානතම කාර්යභාරයන් තුළට අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් ග්‍රහණය කර ගැනීමටද නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේ. මේ අනුව, බැංකුවේ මෙහෙයුම් වෙත බලපෑමක් චිල්ල කළ හැකි අවදානම් හඳුනා ගනු පිණිස මේ වන විට ප්‍රගාමී අවදානම් බුද්ධි සංස්කෘතියක් ක්‍රියාත්මක කර තිබේ. අපගේ කෙටි, මධ්‍ය හා දීර්ඝ කාලීන වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවැනි ප්‍රගාමී අවදානම් කළමනාකරණයක් පැවතීම අතිශයින්ම වැදගත් වේ. එවැනි අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කර ඇති අතරම, පවතින වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස රට වසා දැමීමත් සමගින් දැකිය හැකි වූ ආකාරයේ අනපේක්ෂිත අවදානම් නිරාවරණයන් කළමනාකරණය කර ගැනීමේ අරමුණින් බැංකුවට ඉස්මතු විය හැකි අවදානම් වළක්වා ගැනීමටද අපි දැනට කටයුතු කරමින් සිටින්නෙමු.

අපගේ සේවකයන් සතු වෘත්තීය භූමිකා හා බැඳී ඇති අවදානම් පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කෙරෙන සංස්කෘතියක් ව්‍යාප්ත කර ඇති නිසා ඔවුහු එකී අවදානම් විනිවිදභාවයෙන් හා කඩිනමින් කළමනාකරණය කර ගන්නා අතරම ඒවා ඉහළ නිලධාරීන් වෙත යොමු කිරීමද සිදු කරති.

අවදානම් පාලන ව්‍යුහය

බැංකුවේ පාලන ධූරාවලියද අවදානම් සාකච්ඡා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා පැහැදිලි දැක්මක් සපයයි. බැංකුවේ අවදානම් කළමනාකරණය මෙහෙයවනු ලබන්නේ ප්‍රගාමී හා විචක්ෂණ අවදානම් පාලන හා කළමනාකරණ ප්‍රවේශයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණය සපයමින් අවදානම් කළමනාකරණය සඳහා වූ උපායමාර්ගය හා ප්‍රතිපත්ති සැලසුම් කරන ප්‍රධාන කළමනාකාරවරයෙකු (අවදානම් කළමනාකරණය) විසිනි.

බැංකුවට අවදානම් දරා ගත හැකි සීමාව ආශ්‍රිත දිගු කාලීන මගපෙන්වීම ලබා දීම සහ මෙහෙයුම් පවත්වා ගැනීමේදී අවදානම් පාලන ක්‍රමවේදය යොදා ගැනීම සිදු කරනු ලබන්නේ ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ විධායක කණ්ඩායම විසිනි.

අවදානම් කළමනාකරණය විෂයික සමස්ථ අධීක්ෂණය සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. කළමනාකාරීත්වය විසින් සෑම කල්හිම බැංකුවේ අවදානම් නිරාවරණයන් පැහැදිලිව හා අංග සම්පූර්ණව ඇගයීමට ලක් කොට, අධීක්ෂණය කොට හා පාලනයකින් යුතුව පවත්වා ගනු ලැබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

අවදානම් කළමනාකරණ වාර්තාව



ත්‍රිත්ව ආරක්ෂණ තල

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ

- අවදානම් ප්‍රතිපත්ති, ක්‍රමවේද හා ආකෘති
- අවදානම් දරා ගැනීමේ සීමා
- අවදානම් දැනුම්දීම්

කළමනාකරණ මට්ටම

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
- අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

- ආයතනික කළමනාකරණ කමිටුව
- වත්කම් හා වගකීම් කමිටුව
- ණය කමිටුව
- ආයෝජන කමිටුව
- තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරී කමිටුව

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

මෙහෙයුම් මට්ටම් ආශ්‍රිතව අවදානම් කළමනාකරණ පිළිවෙත් අධීක්ෂණය සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අනෙකුත් සියලුම කමිටු විසින් පිහිටුවා ඇති පාලන පරාමිතික මෙහෙයුම් මට්ටම් සියල්ලටම අනුගත බව සහතික කරනු පිණිස ඔවුහු නිරන්තර නිරීක්ෂණයන් සිදු කරති. ව්‍යාපාරික උපායමාර්ග සහ නිපැයුම් සංවර්ධනයෙහි නිරත වී සිටින මෙම දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයකින් නව ව්‍යාපාරික මාර්ග වෙත විදසුන් හා ප්‍රතිපෝෂණ සපයයි.

මෙහි දෙවන තලයේදී කළමනාකරණ කමිටුව විසින් ව්‍යාපාරික හා අවදානම් කළමනාකරණය සහතික කෙරේ. එම කමිටුවලට අදාළ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්ති සහ යොමුකිරීමේ අනුදේශවල පිහිටුවා ඇත. ව්‍යාපාරික කටයුතු සහ අවදානම් කළමනාකරණය අතර නිසි සමබරතාවක් පවතින බව ඒ සෑම කමිටුවකම සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

ඉහළම තලයේදී ස්වාධීන අවදානම් කළමනාකරණය, තහවුරු කිරීම, ප්‍රතිපත්ති සමාලෝචනය සහ අනුකූලතාව ආදියට අදාළ කාර්යභාරයන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව විසින් ඉටු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ප්‍රඥප්තියෙහි දක්වා ඇති වගකීම්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව බැංකුවේ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ ආයතනික පාලන අවශ්‍යතා මෙම ප්‍රඥප්තියට ඇතුළත් වේ.

බැංකුව පුරාවටම අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරී ඇත. බැංකුවේ අවදානම් නිරාවරණයන් සහ ඒ ආශ්‍රිත තොරතුරු සමාලෝචනය කිරීම සඳහා මෙම කමිටුව සෑම කාර්තුවකම රැස් වේ. සමස්ථ අවදානම් විශ්ලේෂණය පිළිබඳ වාර්තා එහිදී අධීක්ෂණය කෙරෙන අතර බැංකුවේ ප්‍රාග්ධනය, අවදානම් දරා ගැනීමේ සීමාව, අවදානම් සීමා, ආතති පරීක්ෂාව සහ බැංකුව මුහුණ දෙන ඕනෑම ප්‍රධාන අවදානමකට අදාළ කාරණා ආදිය සාකච්ඡා කෙරේ. එමෙන්ම, ණය අවදානම, වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, තොරතුරු පද්ධතිවල සුරක්ෂිතතාව ආශ්‍රිත අවදානම සහ අනුකූලතා අවදානම ආදී ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු එකී වාර්තා මගින් සැපයේ.

අවදානම් දරා ගැනීමේ සීමා

අවදානම් දරා ගැනීමේ සීමා හඳුනා ගැනීම නිසා වේගයෙන් ව්‍යාප්ත වන හා ඉහළ වාෂ්පශීලතාවකින් යුතු බාහිර ව්‍යාපාරික වටපිටාව තුළ ඉස්මතු වනු ක්ෂණික කම්පනයන් හා වෙනස්වීම් හමුවේ නොසැලී සිටීමට බැංකුවට ඇති හැකියාව තක්සේරු කිරීමට ඉඩකඩ සැලසේ.

අවදානම් දරා ගැනීමේ සීමාව යනු විශේෂයෙන්ම බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී බැංකුව දරා ගැනීමට සූදානම් හා එසේ කිරීමට කැමැත්තක් දක්වන අවදානම් මට්ටමයි. නියාමන අවශ්‍යතා ඉටු කිරීමට අමතරව සියලුම ප්‍රධාන අවදානම් වර්ග හරහා බැංකුව දරා ගැනීමට සූදානම් අවදානම් මට්ටම ඉන් හඳුනා ගැනේ. මෙම අවදානම් දරා ගැනීමේ සීමාව තීරණය කිරීමේදී ව්‍යවස්ථාපිත රෙගුලාසි, ණය ලබා ගැනීමේ ගිවිසුම් හා බැංකුවේ මෙහෙයුම් සීමා සහ බාහිර විචල්‍යයන් සැලකිල්ලට ගනු ලැබේ.

පැහැදිලිව නිශ්චය කර දක්වා ඇති කාර්ය රාමුව ඇසුරින් බැංකුව සෑම අවදානම් ක්ෂේත්‍රයක්ම යටතේ දරාගත හැකි අවදානම් සීමා මට්ටම් හඳුනා ගෙන තිබේ. අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරනු ලබන්නේ මෙකී පූර්ව නිශ්චිත අවදානම් දරා ගැනීමේ සීමා තුළ වේ. බාහිර පරිසරය සහ ඒ ආශ්‍රිත වෙනස්වීම් වෙතින් එල්ල විය හැකි කම්පනයන් හමුවේ නොසැලී සිටීමට තමන්ට ඇති හැකියාව පුරෝකථනය කිරීම සඳහා බැංකුව ආතති පරීක්ෂාවන්ද සිදු කරයි.

ඇතැම් අවස්තාවල අවදානම් දරා ගැනීමේ සීමාව කැප කිරීමට සිදු වන විට හෝ බැංකුව විසින් දරා ගැනීමට කැමති සීමාව ඉක්මවා යන විට හෝ එකී අවදානම් නිරාවරණ සීමා දරාගත හැකි හා බැංකුවට භාරගත හැකි පරාසයකට ගෙන එනු පිණිස අභ්‍යන්තර පාලන ක්‍රමවේද සමගින් අවදානම් අවම කිරීමේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබේ.

ආතති පරීක්ෂාව

ආතති පරීක්ෂාව යනු ඉස්මතු වීමට ඉඩ ඇති බරපතල ගණයේ තත්ත්වයන්ට බැංකුව නිරාවරණය වීමට ඇති හැකියාව තක්සේරු කිරීමේදී ඉතාම වැදගත් හා මූලික මෙවලමකි. බංකුවේ ව්‍යාපාරයට සැලකිය යුතු සංවේදීතාවක් දක්වන පැතිකඩ සඳහා කළඹ-සුවිශේෂී ආතති පරීක්ෂාවන් සිදු කිරීමට අමතරව, සෑම අවදානම් ක්ෂේත්‍රයක්ම සැලකිල්ලට ගනිමින් කාර්තුමය පදනමක් මත ආතති පරීක්ෂා සිදු කෙරේ. එකී පැතිකඩ හා ක්ෂේත්‍රවලට ණය, ද්‍රවශීලතා සහ පොලී දරන වත්කම් හා වගකීම් ආදිය ඇතුළත් වේ.

අවදානම් සීමා ගලපා ගැනීම සහ දරා ගත හැකි සීමා නැවත ප්‍රකාශ කිරීම සඳහා ක්‍රමවේදයක් ලෙස ආතති පරීක්ෂාවල ප්‍රතිඵල උපකාරී වේ. බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේදී අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලියද සමගින් සාමාන්‍ය ආතති පරීක්ෂා සිදු කරනු ලැබේ. ඉන් අනතුරුව, සවිස්තරව වාර්තාගත කර ඇති විවිධ අවදානම් තත්ත්ව අවම කිරීමේ ක්‍රියාමාර්ගද සමගින් ආතති පරීක්ෂාවල ප්‍රතිඵල වාර්තා කෙරේ: මෙය, කළමනාකරණ කමිටුව වෙතත් ඉන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතත් ඉදිරිපත් කෙරෙන සවිස්තර වාර්තාවකි.

අවදානම් කළමනාකරණ වාර්තාව

අවදානම් අනුරූපණය

බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පරිසරවලට අදාළ අවදානම් අවම කර ගැනීමට ඉඩකඩ අවදානම් අනුරූපණය මගින් සැලසේ. සෑම අවදානම් සාධකයකම බරපතලකම සහ උද්ගත වීමේ ශීඝ්‍රතාව නිරූපණය කෙරෙන අවදානම් අනුරූපණයක් නොහොත් සිතියමක් පිළියෙළ කරනු ලැබෙන අතර, එකී අවදානම් සඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දෙමින් ඒ ආශ්‍රිත සමස්ථ දැක්මක් කළමනාකාරිත්වය වෙත සැපයේ. එමෙන්ම, අවදානම් අනුරූපණය හේතුවෙන් බැංකුවට අදාළ අවදානම් හා ඒවා කළමනාකරණය කර ගැනීම පිළිබඳ සාකල්‍යවාදී දැක්මක් ලබා දේ.

බැංකුව හා බැඳී ඇති අවදානම් අවම කර ගැනීමේ අඛණ්ඩ ප්‍රයත්නයක් වශයෙන් ඒ ඒ අවදානමේ බරපතලකම හා උද්ගත වීමේ ශීඝ්‍රතාව දැක්වෙන අවදානම් සිතියමක් පිළියෙළ කිරීම ඉන් අනතුරුව සිදු වේ. මේ මගින් බැංකුව හා බැඳී ඇති අවදානම් පිළිබඳ අංග සම්පූර්ණ දැක්මක් කළමනාකාරිත්වය වෙත සැපයෙන අතර මේ නිසා ඔවුන්ට වඩා හෙළිදින් අවදානම් කළමනාකරණය සිදු කිරීමට අවස්ථාව උදා වේ. අවදානම් භාර ගැනීම, මාරු කිරීම, වළක්වා ගැනීම සහ අඩු කිරීම ඔස්සේ විවිධ විකල්ප තෝරා ගැනීම පිළිබඳ සමස්ථ වැටහීමක් අවදානම් අනුරූපණය මගින් සමාගම වෙත සැපයේ.

ණය අවදානම සහ ණය කළඹ ආශ්‍රිත අවදානම	අක්‍රිය ණය අනුපාතිකය (සේවක අර්ථසාධක අරමුදල පාදක ණය හැර)	ඇපකාර ණය මත ණය සංකේන්ද්‍රණය	හානිකරණ ආවරණය	කළඹ ආන්තිකය
ද්‍රවශීලතා අවදානම	ස්ථාවර තැන්පතු සංකේන්ද්‍රණය	මුළු වත්කම්වලට ආයෝජන	ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය	ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය
පොලී අනුපාතිකය සහ වෙළෙපොල අවදානම	බරිත සාමාන්‍ය වීක්ෂණ මුදල් අනුපාතිකය (AWPR) මත ස්ථාවර තැන්පතු අවදානම් වාරිකය	ස්ථාවර තැන්පතුවලට ණය	පොලී ආදායමට සාපේක්ෂ පොලී පිරිවැය	මුළු වත්කම්වලට සාපේක්ෂ ණය ගැනීම්
මෙහෙයුම් අවදානම	NLL (%) මත ලියා හැරීම්	ශාඛා විගණන (අඩු අනුපාතික %)	ශේෂ පත්‍රයේ වර්ධනය (වර්ෂාන්තර)	සේවකයෙකුට සාපේක්ෂ ලාභය (රු.) - මාසික
නුඹුන්වත් බව සහ ප්‍රාග්ධනය මත අවදානම	අවම ප්‍රාග්ධනය සඳහා හිඟය	ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව අනුපාතිකය	මුළු වත්කම්වලට සාපේක්ෂ සාමාන්‍ය කොටස් අනුපාතිකය	අවදානම් බරතැබූ වත්කම් අනුපාතිකය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත වාර්තා කෙරෙන අවදානම් කළමනාකරණයේ පරාසය සහ ප්‍රධාන අන්තර්ගතය

අවදානම්	පරාසය
සමස්ථ අවදානම	අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරුකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම
	නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තත්ත්වය සහ සීමා සමඟ සැසඳීමේදී ප්‍රවණතා
	නියාමන සහ උපදේශන/අභ්‍යන්තර සීමා ඇතුළත්ව සමස්ථ අවදානම් සීමා පද්ධතිය
	ඉහළම හා නැගී එන උපායමාර්ගික හා සමස්ථ ව්‍යාපාරික අවදානම් විශ්ලේෂණය ආශ්‍රිත ප්‍රධාන අවදානම් හා සමස්ථ නිරාවරණ පිළිබඳ ආතති පරීක්ෂාවන්.
ණය අවදානම	පූර්ව ණය අවදානම් කළමනාකරණය
	රු. මිලියන 1.5 න් ඉහළ ණය සඳහා වූ අභ්‍යන්තර ණය අවදානම් ශ්‍රේණිගත කිරීම
	ණය අවදානම් ප්‍රතිපත්ති සහ අධිකාරිත්වය පැවරීම
	ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය
	කාර්ය මණ්ඩල පුහුණු හා දැනුම් හුවමාරු සැසි
	ණය පරිපාලන අංශය යටතේ ණය බෙදා හැරීම මධ්‍යගත කිරීම
	පශ්චාත් ණය අවදානම් කළමනාකරණය
	ණය සමාලෝචනය යාන්ත්‍රණය. ණය ශ්‍රේණිගත කිරීමේ ආකෘති තහවුරු කිරීම
	අවදානම් දරා ගැනීමේ සීමා අධීක්ෂණය
	සමීප නිරීක්ෂිත ලැයිස්තුව (Watch List) සමාලෝචනය
	අවදානම් පාදක මිලකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම
ණය සහ ද්‍රවශීලතා අවදානම	ද්‍රවශීලතා හා වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය සහ යාවත්කාල කිරීම
	ද්‍රවශීලතාව සහ භාණ්ඩාගාර වෙළෙඳපොල අවදානම් විශ්ලේෂණය පිළිබඳ වාර්තාව
	භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය සහ ඕනෑම සීමාවක් සමාලෝචනය කිරීම
	බාසල් III අවශ්‍යතා පිළිබඳද්‍රවශීලතා අවදානම් නිරීක්ෂණය
	වත්කම් හා වගකීම් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කිරීම
මෙහෙයුම් අවදානම්, තොරතුරු තාක්ෂණ හා පද්ධති සුරක්ෂිතතා අවදානම	ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ වාර්තා සහ පවත්වන ලද ආපදා අවස්ථාවන්හිදී යථා තත්තවයට පත් වීම අරමුණු කරගත් පුහුණු අභ්‍යාස.
	ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ වාර්තා සහ පවත්වන ලද ආපදා අවස්ථාවන්හිදී යථා තත්තවයට පත් වීම අරමුණු කරගත් පුහුණු අභ්‍යාස.
	බාහිර සිදුවීම් නිසා උද්ගත වන අභ්‍යන්තර අලාභ සිද්ධි හා අවදානම් විශ්ලේෂණය කිරීම
	තොරතුරු පද්ධති අවදානම්, නෛතික අවදානම් පුද්ගල අවදානම් ආයදි නිරීක්ෂණය කිරීම
අනුකූලතා අවදානම	රීති සහ රෙගුලාසි වෙත බැංකුව දක්වන අනුකූලතා තත්ත්වය
	සිදු කරන ලද අනුකූලතා පරීක්ෂාවල ප්‍රතිඵල සහ අනුකූලතා අවදානම් මට්ටම් තක්සේරුව
	නව රීති හා රෙගුලාසි පිළිබඳ වාර්තාව
	අනුකූලතාව හා සබැඳි ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සමාලෝචනය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

රු. මිලියන 250 ක වටිනාකමින් යුතු රජයේ නිත්‍ය බැදුම්කරයක් සහ අභ්‍යන්තරික වශයෙන් උත්පාදනය කරන ලද ලාභ ඇසුරින් අතිරේක ස්ථර (AT1) ප්‍රාග්ධනයක් ඔස්සේ 2019 සහ 2020 යන දෙවසරේ අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා වලට දායකත්වය දැක් වූ හෙයින්, මේ වන විට රු. බිලියන 7.5 ක් වන ව්‍යවස්තික ප්‍රාග්ධන සීමාව කරා ලඟා වීම උදෙසා අමතර රු. බිලියන 1.5 ක අවශ්‍යතාවයකට එච්ඩිඑෆ්සී බැංකුව මුහුණ දී ඇත.

අභ්‍යන්තරික උත්පාදනය කරගනු ලැබෙන ලාභ/රඳවා ගත් ඉපැයීම් හරහා මෙම අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීමට බැංකුවට 2022 වසර අවසානය දක්වා කාලය ඇත.

2022 වසර දක්වා බැංකුවේ ප්‍රාග්ධන ආයෝජන රැස් කිරීමේ සැලැස්ම



ප්‍රාග්ධනය ආශ්‍රිත පරතරය සමනය කර ගැනීම සහ වේගවත් වර්ධනයක් සඳහා සහාය වීම උදෙසා විවිධ පැති කෙරෙන් බැංකුවේ වර්ධන අරමුණු සලකා බලමින් පසු අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකසන ලදි. එකී වර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ආදායම හා ලාභ ඉහළ නංවා ගැනීම සහ වෙළෙඳපොල හා නිපැයුම් විවිධාංගීකරණය ආදිය ඊට ඇතුළත් වූ අතර, ඉදිරි වසර තුළදී අවශ්‍ය ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමට එමඟින් මත පෑදෙනු ඇතැයි අපේක්ෂිතය.

2020 වසරේදී අවම ව්‍යවස්ථාපිත සීමාව වූ 12.5% මනාව ඉක්මවා යමින් 20.67% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගැනීමට බැංකුවට හැකි විය. සවිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගැනීම වෙනුවෙන් බැංකුව දක්වන කැපවීම මින් මනාව පිළිබිඹු වන අතර මෙය ඉදිරි වසර තුළදීද මෙය නොවෙනස්ව තිරසාර ලෙස පවත්වා ගැනෙනු ඇත.

බාසල් III ප්‍රාග්ධන සමූහයේ අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලියට අනුගත වන පරිදි බැංකුව සිය අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරුකරණ ක්‍රියාවලිය සවිමත් කර ගන්නා ලදි. අභ්‍යන්තර සහ බාහිර කම්පන අවශෝෂණය කර ගන්නා අතරම එකී සෑම අවදානමක්ම සැලකිල්ලට ගනිමින් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමට ක්‍රමවේදයක් අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරුකරණ ක්‍රියාවලිය මඟින් සැපයේ.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

එච්ඩීඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2020 මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති ජනරාල්ගේ වාර්තාවද සමගින් මෙහි සමාලෝචනය කෙරෙන වසර සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාව කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

1. පොදු විස්තර

එච්ඩීඩීඑෆ්සී බැංකුව යනු 1998 අංක 30 දරන බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රසිද්ධ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. 2019 දෙසැම්බර් 10 දක්වා බැංකුව නිවාස හා ඉදිකිරීම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවැති අතර ඉන් අනතුරුව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලදි.

ඉහතද සඳහන් කර ඇති පරිදි මෙම වාර්ෂික වාර්තාව මගින් 2020 මූල්‍ය වර්ෂය (ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා) ආවරණය කෙරෙන අතර පවතින ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා සහ නිසි ගිණුම්කරණ පිළිවෙත්වලට අනුකූලව මෙය පිළියෙළ කර තිබේ.

තවද, මෙම වාර්ෂික වාර්තාව 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත (සහ අදාළ සංශෝධන), 2007 අංක 07 දරන සමාගම් පනත (අදාළ අවස්ථාවල), 1988 අංක 30 දරන බැංකු පනත සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති යනාදිය වෙත නිසි අනුකූලතාව දක්වයි.

කොටස් හිමියන්ගේ සහ බැංකුවේ නිසි අභිලාෂ හා සුභසිද්ධිය සහතික කරනු පිණිස අවශ්‍ය වන හා වැදගත් මට්ටමේ තොරතුරු සියල්ලම මෙහි හෙළිදරවු කර තිබෙන අතර අදාළ ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කොට අනුමත කර තිබේ.

2. ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුවේ පරමාර්ථ වෙත කිසිදු වෙනසක් සිදු නොකරමින් නිවාස ඉදිකිරීම් සහ ඒ හා සබැඳි වෙනත් අරමුණු වෙනුවෙන් මූල්‍ය සහාය ලබා දෙමින් බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව සිදු කෙරී ඇත. මීට අමතරව, බැංකු පනතේ ෂඩ වන උපලේඛනයේ ලබා දී ඇති ව්‍යාපාරික කටයුතුවලද බැංකුව නිරත වෙයි. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් ආශ්‍රිත වෙනස්කම් කිසිවක් සිදු නොවීය.

3. ව්‍යාපාර සමාලෝචනය

බැංකුවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ 12 වන පිටුවෙහි දක්වා තිබේ.

මෙම සමාලෝචනය සිදු කෙරෙන වසර තුළ බැංකුවේ සමස්ථ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, මෙහෙයුම්වල තත්ත්වය සහ වැදගත් සිද්ධි පිළිබඳව සභාපතිතුමියගේ පණිවුඩය (30 සිට 33 දක්වා පිටු) සහ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (34 සිට 37 දක්වා පිටු) මගින් සාකච්ඡාවට බඳුන් කෙරේ.

2020 වසර සඳහා වූ මෙහෙයුම් සමාලෝචනයක් සහ මෙහෙයුම් ප්‍රතිඵල මෙහි 152 සිට 153 දක්වා පිටුවල සඳහන් ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත. මෙකී වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාවෙහි වැදගත් කොටසක් ලෙස සැලකේ.

4. අනාගත සංවර්ධනයන්

එච්ඩීඩීඑෆ්සී බැංකුවේ අනාගත සංවර්ධනයන් සියල්ලම ඉහත කී පනතේ විධිවිධාන සහ නිවාස සංවර්ධනය අරමුණු කරගත් රජයේ තීරණවලට අනුකූල වනු ඇත. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඉහත සභාපතිතුමියගේ පණිවුඩය සහ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය බලන්න.

5. මූල්‍ය ප්‍රකාශන

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ 1988 අංක 30 දරන බැංකු පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව පිළියෙළ කරන ලදි. 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාවෙහි වැදගත් කොටසක් ලෙස සැලකේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ 152 සිට 191 දක්වා පිටුවල දක්වා තිබේ.

6. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම සමාලෝචිත වසරට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගෙන ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ 157 සිට 166 දක්වා පිටුවල දක්වා තිබේ. ස්කන්ධය වෙනස් වීමේ බලපෑම පිළිබඳ ප්‍රකාශනය මෙම වාර්ෂික වාර්තාවේ 156 පිටුවෙහි දැක්වේ.

7. විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

එච්ඩීඩීඑෆ්සී බැංකුවේ විගණක ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා විගණකාධිපති ජනරාල් විසින් මෙහි සමාලෝචනයට ලක් වන කාල පරිච්ඡේදයට අදාළ එච්ඩීඩීඑෆ්සී බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණනය සිදු කරන ලද අතර විගණකාධිපති ජනරාල්ගේ එකී වාර්තාව මෙහි 145 සිට 151 දක්වා පිටුවල දැක්වේ.

8. අඛණ්ඩතා පදනම

පුරෝකථනය කළ හැකි අනාගතය තුළ අඛණ්ඩව මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් බැංකුව සතු බවට සාධාරණ අපේක්ෂාවක් නිසි විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. මේ නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩතා පදනම යොදා ගෙන ඇත.

9. ආදායම

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ආදායම රු. මිලියන 7,856 ක් ලෙස වාර්තා විය. මෙම ආදායම පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ 01 සිට 02 දක්වා සහ 05 සිට 07 දක්වා සටහන්වල දැක්වේ.

10. ලාභය හා මුදල් විසර්ජනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ආදායම හා බදුවලට පෙර ලාභය සහ බැංකුවේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු වටිනාකම රු. මිලියන 1,381 ක් වූ අතර එම කාල පරිච්ඡේදය සඳහා බදුවලට පසු ලාභය රු. මිලියන 708 ක් ලෙස වාර්තා වී ඇත.

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු. මි.	2020 රු. මි.
මූල්‍ය සේවාවන් මත විකතු කළ අගය මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද	470	313
බදුකරණය සඳහා ප්‍රතිපාදන	299	360
බදුවලට පසු සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ලාභය	476	708
රඳවාගත් ලාභය/(සමුච්චිත අලාභ) - ඉදිරියට ගෙන ආ	3,275	3,680
විසර්ජනය සඳහා ඇති ලාභය	476	708
යොමිත පළමු හා අවසන් ලාභාංශ බෙදා දීම	-	16
සංචිත අරමුදල් සඳහා මාරු කිරීම්	71	106
ඉදිරියට ගෙන ආ රඳවාගත් ලාභය	3,680	4,266

11. සංචිත

2020 දෙසැම්බර් 31 දිනට මුළු සංචිත වටිනාකම රු. මිලියන 4,820 ක් විය. මීට අදාළ විස්තර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලට සටහන් 35-37 දක්වා ලබා දී ඇත.

12. පරිත්‍යාග

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුව පරිත්‍යාග කිසිවක් සිදු කර නොමැත.

13. ව්‍යවස්ථාපිත ගෙවීම්

බැංකුවේ සහ සේවකයන්ගේ පාලනයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මෙහි නියමිත දින දක්වා නිසි පරිදි සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරු තම දැනුමේ හා විශ්වාසයේ හැටියට සතුටට පත් වෙති.

14. බදුකරණය සඳහා ප්‍රතිපාදන

2020 වසර සඳහා ආදායම් බදු බැංකුවේ මෙහෙයුම් නිසා උත්පාදනය වී ඇති බදු අය කළ හැකි ආදායම වෙතින් 28% ක අනුපාතිකයක් යටතේ ලබා දී ඇති අතර මීට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 171 වන පිටෙහි දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවලට සටහන 13 යටතේ හෙළිදරවු කර තිබේ.

15. ලාභාංශ

2020 වසරේදී බැංකුවේ කොටසකට රු. ශත විසි පහක (රු. 0.25) ලාභාංශයක් (අවසන්) ගෙවීමටත් (විගණකාධිපති ජනරාල් වෙතින් බැංකුවේ නුබුන්වත්භාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීමට යටත්ව), එකී ලාභාංශය ගෙවීම සඳහා වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමටත් අධ්‍යක්ෂවරු නිර්දේශ කළහ. මෙම ලාභාංශයේ මුළු වටිනාකම රු. මිලියන 16.178 කි (ආසන්න වශයෙන්).

16. දේපල, පිරියත සහ උපකරණ හා සින්නක්කර දේපල ඒ. ජයමහ

දේපල, පිරියත සහ උපකරණ සඳහා ප්‍රාග්ධන වියදම රු. මිලියන 55 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර මෙහි 176 සිට 178 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට 20 සටහන යටතේ දක්වා ඇත.

17. සින්නක්කර දේපලවල වෙළෙඳපොල වටිනාකම

සින්නක්කර දේපලවල වෙළෙඳපොල වටිනාකම පිළිබඳ විස්තර 178 පිටෙහි දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවලට සටහන 20.2 මගින් දක්වා ඇත.

18. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව උද්ගත වී ඇති සිදුවීම්

බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව උද්ගත වී ඇති, එමෙන්ම ගැලපීම් සිදු කිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කිරීම අවශ්‍ය වන සැලකිය යුතු මට්ටමේ සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

19. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2020 දෙසැම්බර් 31 දිනට පැවැති බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 962 ක් වූ අතර සාමාන්‍ය කොටස් 64,710,520 කින් විය සමන්විත විය.

20. කොටස් තොරතුරු සහ ණයකර

කොටස් සහ ණයකරවලට අදාළ තොරතුරු මෙම වාර්තාවේ 198 සිට 200 දක්වා පිටුවල දැක්වේ.

21. පාර්ශ්වකරුවන් සියලු දෙනා වෙත එක සමානව සැලකීම

කොටස් හිමියන් සමග මුලදී විකඟ වූ කොන්දේසිවලට අනුකූලව ඔවුන් සියලු දෙනාටම එක සමානව සලකා තිබේ.

22. අධ්‍යක්ෂ මණ්ඩලය

කරුණාකර, වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජික අධ්‍යක්ෂ ලැයිස්තුව සහ ඔවුන් සතු සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහා 38 සිට 47 දක්වා පිටුවලට ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ පරිච්ඡේදය බලන්න.

මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කිරීම් සහ ඉල්ලා අස්වීම්

අංකය	නම	සමාලෝචිත කාලය තුළ පත් කිරීම	සමාලෝචිත කාලය තුළ ඉල්ලා අස්වීම්
01.	ආර්. චිම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය	2020/01/02 (අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස පත් කරන ලදි)	-
02.	පී. ඒ චිස්. අතුල කුමාර මහතා	2020/03/11	-
03.	චිල්. ඊ. සුසන්ත සිල්වා මහතා	2020/08/10	-
04.	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ	2020/08/10	-

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අංකය	නම	සමාලෝචිත කාලය තුළ පත් කිරීම	සමාලෝචිත කාලය තුළ ඉල්ලා අස්වීම
05.	ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා	2020/08/10	-
06.	ඩී. එම්. එස්. අභයගුණවර්ධන මහතා	2020/02/11	2020/08/14
07.	එන් ආර්. අනීස් මහත්මිය	-	2020/01/06
08.	රොහාන් ද සිල්වා මහතා	-	2020/03/01
09.	එන්. විජයනාදන් මහතා	-	2020/06/29
10.	ආර්. ඒ. චූලානන්ද මහතා	-	2020/08/13

23. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් හුවමාරුව වැනි ආයතන විසින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ නියමයන්හි දක්වා ඇති අදාළ උප කමිටු පත් කරන ලද අතර එකී උප කමිටුවල සාමාජිකත්වය, රාජකාරි, වගකීම් සහ කාර්යසාධනය පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 134 සිට 141 දක්වා පිටුවල දැක්වේ

24. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

කරුණාකර, 91 පිටෙහි දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම් ආශ්‍රිත සහභාගීත්ව විස්තර බලන්න.

25. මූල්‍ය මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

එච්ඩීඑෆ්සී බැංකුවේ කටයුතු පිළිබඳ සාධාරණ දැක්මක් නියෝජනය වන පරිදි බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කරුණාකර, මෙම වාර්ෂික වාර්තාවේ 143 සිට 144 දක්වා පිටුවල දක්වා ඇති සහ වාර්ෂික වාර්තාවේ වැදගත් කොටසක් වන මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය බලන්න.

26. අධ්‍යක්ෂවරුන් සතු අභිලාෂ

තමන් උනන්දුවක් දක්වන කාරණාවලට අදාළ සාකච්ඡා, අනුමත කිරීම් හෝ ඡන්දය දීම් හෝ ගිවිසුම් අත්සන් කිරීම් සම්බන්ධයෙන් සහභාගී වීමෙන් අධ්‍යක්ෂවරුන් වැළකී තිබේ.

එමෙන්ම, අධ්‍යක්ෂවරුන් තමන් විසින් උනන්දුවක් දක්වනු ලබන කාරණා සම්බන්ධයෙන් සිය ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින බව සහතික කරනු පිණිස සිය අභිලාෂ (කිසිවක් හෝ වේ නම්) හෙළිදරවු කර තිබේ.

27. කොටස් හිමිකාරත්වය දැරීම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අභිලාෂ

අධ්‍යක්ෂවරුන් කොටස් හිමිකාරත්වය දැරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ:

	2020/12/31	2020/01/01
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය	කිසිවක් නැත	කිසිවක් නැත
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන	1,000	1,000
ආචාර්ය එස්. එන්. මොරායස්	1,000	1,000
පී. ඒ. එස්. අතුල කුමාර මහතා	කිසිවක් නැත	කිසිවක් නැත
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා	1,000	කිසිවක් නැත
ජ්‍යෙ. මහාචාර්ය ඒ. ජයමහ	1,000	කිසිවක් නැත
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා	කිසිවක් නැත	කිසිවක් නැත
එකතුව	4,000	2,000

28. ණයකර සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ අභිලාෂ

අධ්‍යක්ෂවරුන් විසින් ණයකර හිමිකාරත්වය දැරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ:

2020 දෙසැම්බර් 31 දිනට	2020	
	ණයකර සංඛ්‍යාව	වටිනාකම (රු.)
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය	කිසිවක් නැත	කිසිවක් නැත
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන	කිසිවක් නැත	කිසිවක් නැත
ආචාර්ය එස්. එන්. මොරායස්	කිසිවක් නැත	කිසිවක් නැත
පී. ඒ. එස්. අතුල කුමාර මහතා	කිසිවක් නැත	කිසිවක් නැත
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා	කිසිවක් නැත	කිසිවක් නැත
ජ්‍යෙ. මහාචාර්ය ඒ. ජයමහ	කිසිවක් නැත	කිසිවක් නැත
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා	කිසිවක් නැත	කිසිවක් නැත
එකතුව		

29. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළදී සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළව කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති රීතිවලට බැංකුව අනුකූලතාව දක්වා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය නිවේදනය කරයි. සැලකිය යුතු මට්ටමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 190 පිටෙහි දක්වා ඇත. වාර්ෂික වාර්තාව

30. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර 170 පිටෙහි මූල්‍ය ප්‍රකාශනවලට සටහන 11 යටතේ දක්වා ඇත.

31. පරිසරය සුරැකීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුමට හා විශ්වාසයට අනුව බංකුව අදාළ පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දක්වා ඇත. බැංකුව පරිසරයට හානිකර බලපෑම් ඇති කරන ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

32. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

මෙහි සමාලෝචනයට ලක් වන කාල පරිච්ඡේදය තුළදී අවදානම් කළමනාකරණයට අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගන්නා ලදි. කරුණාකර, බැංකුවේ අවදානම් තක්සේරු වාර්තාව සඳහා පිටු අංක 119 සිට 23 බලන්න.

තවද, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නිරන්තර පදනමක් මත සමාලෝච කර තිබේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව යන කමිටු දෙකම සිය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම ඉදිරිපත් කරයි.

කරුණාකර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පිළිබඳ විස්තර සඳහා පිටු අංක 139 ද අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳ ස්වාධීන විගණන වාර්තාව සඳහා 130-130 පිටුද බලන්න.

33. ආයතනික පාලනය

කරුණාකර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලන නියමයන්හි අවශ්‍යතාවලට අනුකූලව ආයතනික පාලන වාර්තාව සහ ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පිළිවෙත් ප්‍රකාශනය 4400 යටතේ විගණකවරුන් විසින් නිකුත් කර ඇති සිද්ධිවාචක සොයාගැනීම් වාර්තාව සඳහා 89 සිට 118 දක්වා පිටු බලන්න.

34ග අදාළ නීති සහ රෙගුලාසි වෙත අනුකූලතාව දැක්වීම

පාලන නීති සහ රෙගුලාසිවලට අදාළව බැංකුවේ අනුකූලතා තත්ත්වය අනුකූලතා නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වර්තා කරයි. අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට, බැංකුව හෙළිදරවු කිරීමට බැඳී සිටින කිසිදු විධිවිධානයක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍රාකාර නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීමක් සිදුව නැති අතරම, බැංකුව කෙරෙහි සැලකිය යුතු තරමේ මූල්‍යමය බලපෑමක් වීල්ල කිරීමට හේතු විය හැකි කිසිදු ආකාරයක අක්‍රමිකතාවක් බැංකුවේ කළමනාකාරිත්වය හෝ සේවකයන් අතින් සිදුව නොමැත.

එමතුද නොව, 1997 අංක 07 දරන එච්ඩිඑෆ්සී පනත (හා ඊට සිදු කර ඇති සංශෝධන), 1988 අංක 30 දරන බැංකු පනත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති තීරණ හා නියමයන්, 1949 අංක 58 දරන මුදල් නීති පනත, 2007 අංක 7 දරන සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2005 අංක 5 දරන මුදල් පනත, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති, 1987 අංක 36 දරන විනිමය සුරුකුම්පත් කොමිෂන් සභා පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත හා එකී ව්‍යවස්ථාවන්ට පනවා ඇති සංශෝධන ඇතුළු ව්‍යවස්ථාපිත අවශ්‍යතා නිසා උද්ගත වන සියලුම නියාමන හා විචක්ෂණශීලීත්ව අවශ්‍යතාවන්ට බැංකුව අනුකූලතාව දක්වා ඇත.

35ග විගණකවරුන් පත් කිරීම

1997 අංක 07 දරන එච්ඩිඑෆ්සී පනත මගින් නියම කර ඇති පරිදි සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති ජනරාල් අප බැංකුවේ විගණක ලෙස තවදුරටත් කටයුතු කරයි.

36ග විගණකවරුන් සඳහා පාරිශ්‍රමික සහ බැංකුව සමග ගිවිසුම්ගතව සිටීමේ ඔවුන්ගේ අභිලාෂය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණන ගාස්තු වශයෙන් බැංකුව විසින් විගණකවරුන් වෙත රු. මිලියන 2.2 ක මුදලක් ගෙවන ලදි. විගණකවරුන් සතුව ඒ හැර වෙනත් කිසිදු සබඳතාවක් හෝ ගිවිසුම්ගත අභිලාෂයක් බැංකුව සමග නොමැත.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම්වත්භාවයට අනුව බැලූ කල ඉහත හෙළිදරවු කර ඇති කාරණා හැර අන් කිසිදු සම්බන්ධයක් හෝ උනන්දුවක් විගණකවරුන්ට බැංකුව සමග නැත.

37ග විගණන කමිටුව

විගණන කමිටුවේ සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ 139 දක්වා පිටෙහි දක්වා තිබේ.

38ග රැස්වීම් පිළිබඳ දැනුම් දීම

1997 අංක 07 දරන එච්ඩිඑෆ්සී පනතේ 35 වගන්තියට අනුව බැංකුවේ 36 වන වාර්ෂික මහා සභා රැස්වීම 2020 මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 9 ක කාලයක් ඇතුළත පැවැත්වෙනු ඇති අතර, ඊට අදාළ පූර්ව දැනුම්දීම් නිසි කාලය තුළ කොටස් හිමියන් වෙත යොමු කෙරෙනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මුතිය සහිතව අත්සන් තබන ලදි.



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක
සභාපතිනි



කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය
සමාගම් ලේකම් 2021 මැයි 21

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරන බැංකු පනතේ 3(8)(ii)(b) නියමයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ('බැංකුව') තුළ ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. එකී ප්‍රමාණාත්මතාව හා කාර්යක්ෂමතාව සලකා බැලීමේදී අවදානම සහ ප්‍රතිලාභ යන සාධක දෙක පාලිත පදනමක් මත සමබරතාවයෙන් යුතුව පවත්වා ගත යුතු බව බැංකුව පිළිගන්නා අතර, ඒ අනුව, බැංකුවට අවදානම් දරා ගත හැකි සීමාවන්ට පරස්පර වන ඕනෑම තත්ත්වයක් අවධාරණය කිරීමේ අරමුණ සහිතව අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන්ම සැලසුම් කර තිබේ.

මෙම තත්ත්වය තුළ, මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය අලාභ හෝ වංචා ආශ්‍රිත ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියට සැපයිය හැක්කේ සාධාරණ සහතිකයක් මිස පූර්ණ සහතිකයක් නොවේ.

බැංකුව මුහුණ පාන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් බැංකුව විසින් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපාරික වටපිටාව හෝ නියාමන මාර්ගෝපදේශ ආශ්‍රිත වෙනස්වීම් කිසිවක් සිදු වූ වහාම මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති වැඩිදියුණු කිරීම එකී ක්‍රියාවලියට ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධයෙන් බැංකුවල අධ්‍යක්ෂවරුන් වෙත සැපයෙන මාර්ගෝපදේශ' වලට අනුකූලව මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තර සමාලෝචනයන්ට ලක් කෙරේ.

එම මාර්ගෝපදේශයෙහි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සම්බන්ධයෙන් ලබා දී ඇති ගිණුම්කරණ මූලධර්ම සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර තිබේ.

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීභාවය පිළිබඳ සාධාරණ සහතිකකරණයක් ලබා දීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

බැංකුව මුහුණ පාන අවදානම් හඳුනා ගැනීම සහ එකී අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා ඉවහල් වන සුදුසු අභ්‍යන්තර පාලනයන් සැකසීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම තුළින් බැංකුවේ කළමනාකාරිත්වය අවදානම් හා පාලනය සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

මූල්‍ය වාර්තාකරණයට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ ඒකාබද්ධතාව සමාලෝචනය කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ක්‍රියාවලීන් අතරට පහත කාරණා ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ එකී මෙහෙයුම් බැංකුවේ සංස්ථාපිත අරමුණු, උපායමාර්ග හා වාර්ෂික අයවැය මෙන්ම අනුමත කර ඇති ප්‍රතිපත්ති හා ව්‍යාපාරික දිශානතීන්ටද අනුකූලව සිදු කෙරෙන බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ කමිටු පිහිටුවා ඇත.
- ප්‍රතිපත්ති හා ක්‍රමවේද වෙත දක්වන අනුකූලතාව සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ස්වකීය විගණන කටයුතු අතරවාරයේදී අඛණ්ඩ පදනමක් මත පරීක්ෂා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කර ඇති වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව ශාඛා සහ දෙපාර්තමේන්තු සියල්ලටම අදාළව විගණනයන් සිදු කරනු ලැබේ. සම්පූර්ණ කර ඇති අභ්‍යන්තර විගණන කටයුතුවල සොයාගැනීම් සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ ස්වකීය තක්සේරුව අභ්‍යන්තර විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම කමිටුව විසින් විගණනයන් පිළිබඳ යාවත්කාලීනයන් සහ අනුමත විගණන සැලැස්මේ පරාසය, ප්‍රමාණවත්භාවය හා එමගින් ආවරණය වන කෙෂ්ත්‍ර යනාදිය සමාලෝචනය කරනු ලැබෙන අතර සතුටුදායක මට්ටමක නොපවතින කවර හෝ විගණනයක් වේ නම් ඒ පිළිබඳව අනුගමනය කළ යුතු කාර්ය සැලසුම් හා ඒවායෙහි ක්‍රියාත්මක වීමේ තත්ත්වය සමාලේචනය කරමින් සවිස්තර සාකච්ඡා සිදු කොට ඇත.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවද බාහිර විගණක, නියාමන අධිකාරීන් හා කළමනාකාරිත්වය විසින් හඳුනා ගනු ලැබ ඇති ගැටළු සමාලෝචනය කරන අතරම, අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා කාර්යක්ෂමතාව තක්සේරු කරයි. මෙම කමිටුව අවදානම් තක්සේරුව, විගණනයන්හි පරාසය සහ අභ්‍යන්තර විගණන කටයුතුවල ගුණාත්මකභාවය ආදී කෙෂ්ත්‍ර කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරමින් අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීමද සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වාර්තා නිරන්තර පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කෙරේ. බැංකුවේ විගණන කමිටුව විසින් ඉටු කරනු ලැබෙන ක්‍රියාකාරකම් සම්බන්ධ වැඩිදුර තොරතුරු මෙහි 139 පිටෙහි 'අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව' මගින් දක්වා ඇත.

- මූල්‍ය වාර්තාකරණය හා සබැඳි අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කිරීමේදී බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වැදගත් ගිණුම් තොරතුරු හා හෙළිදරවු කිරීම් සමග බැඳී ඇති ක්‍රමවේද හා පාලනයන් සියල්ලම සංසන්දනාත්මකව සලකා බලන ලදි. බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් එකී ක්‍රමවේද හා පාලනයන්හි සැකැස්ම හා සඵලදායීතාව අබණ්ඩ පදනමක් මත විමර්ශනය කරන ලදි. මෙහි සමාලෝචනයට ලක් වන වසරට අදාළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව වූ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් සිදු කරන ලද අදහස් දැක්වීම් හා නිර්දේශ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ආශ්‍රිත අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදුරටත් සවිමත් කරනු පිණිස බැලීමට නියමිතය.
- 'මූල්‍ය උපකරණ' සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය SLFRS 9 - යන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතියේ අවශ්‍යතා ඉටු කරනු පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

  ඒ සඳහා අවශ්‍ය ආකෘති ක්‍රියාත්මක කර ඇති අතර ක්‍රියාවලි හා පාලනයන් සකස් කර තිබේ. එමෙන්ම, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඇතුළු පාර්ශ්වකරුවන් සියලුම දෙනා වෙනුවෙන් ප්‍රමාණවත් පුහුණු හා දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් හා සැසි පවත්වා තිබේ.

  SLFRS 9 ප්‍රමිතියට අනුකූලතාව දැක්වීම සහ තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන කළමනාකරණ තොරතුරු පද්ධති සහ වාර්තා වටා බැඳී ඇති ක්‍රියාවලීන් හා පාලනයන් මෙන්ම අවදානම් කළමනාකරණයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කිරීම් තවදුරටත් සවිමත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අබණ්ඩව කටයුතු කරනු ඇත.

- කොවිඩ්-19 වසංගතය නිසා පොලී අනුපාතික මත ලබා දෙන ලද ණය සහන සහ හානිකරණ ප්‍රතිපාදන මූල්‍ය වාර්තාකරණයේදී නිවැරදිව ග්‍රහණය වී ඇති බව සහතික කරනු පිණිස 2020 වසරේදී බැංකුව සිය අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් වැඩිදුරටත් සවිමත් කර ගන්නා ලදි. එමෙන්ම, රට වසා දමා තිබුණු කාලවලදී ප්‍රධාන මට්ටමේ සැසඳුම් සියල්ලම කිසිදු බාධාවකින් තොරව සිදු කරන ලද බවද කළමනාකාරිත්වය සහතික කර තිබේ.

තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලි මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය තුළින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වසනීයත්වයට සහ බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබා දීමට සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

බාහිර විගණකවරුන් විසින් විසින් ප්‍රකාශනය පිළිබඳව සිදු කරන ලද සමාලෝචනය

විගණකාධිපති ජනරාල් විසින් 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සමාලෝචනය කොට, බැංකුවේ මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි සැකැස්ම හා ඵලදායීතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගනු ලැබ ඇති ක්‍රියාවලිය පිළිබඳ ස්වකීය වටහා ගැනීමට පරස්පර වන බවක් විශ්වාස කිරීමට තමන්ට සිදු වන කිසිවක් සිය අවධානයට ලක් නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කර ඇති ස්වාධීන සහතිකකරණ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 130 සහ 131 සිට 131 පිටුවල දක්වා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි අත්සන් කළේ,



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක
සභාපතිනි
2021 මැයි 21



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන
සභාපති - විගණන කමිටුව
2021 මැයි 21



පාලිත ගමගේ මහතා
ප්‍රධාන විධායක නිලධාරී
2021 මැයි 21

කොළඹ දී ය.

අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ සහතිකකරණ වාර්තාව



සභාපති,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය බැංකුවේ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සම්බන්ධයෙන් විගණකාධිපති ජනරාල් විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබෙන සහතිකකරණ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාවේ අරමුණ වන්නේ 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් මූල්‍ය වාර්තාකරණය (''ප්‍රකාශන'') සඳහා වූ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් සහතිකයක් ලබා දීම යි.

කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2007 අංක 12 දරන බැංකු පනතේ 3 (8) (සස) (ආ) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද ''අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ'' ප්‍රකාරව එකී ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීම දරයි.

මාගේ වගකීම සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050 ට අනුකූලතාව

මාගේ වගකීම වන්නේ මා විසින් සිදු කරන ලද විගණන කටයුත්ත පදනම් කරගෙන ඉහත කී ප්‍රකාශනය සම්බන්ධයෙන් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දීමයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු සඳහා වන සහතිකකරණ වාර්තාව - තහවුරු කිරීමේ කාර්යයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 3050 ට අනුකූලව මාගේ කාර්යභාරය ඉටු කර ඇත.

ඉටු කරන ලද කාර්ය සාරාංශය

මාගේ කාර්යය ඉටු කරන ලද්දේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙළ කරන ලද ලේඛනගත කිරීම් මගින් ප්‍රකාශනය සනාථ වන්නේද යන්න සහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලීන් එමගින් සුදුසු පරිදි පිළිබිඹු වන්නේද යන්න තහවුරු කිරීම සඳහාය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ඉටු කරන ලද ක්‍රියා පටිපාටීන් නියැදි පදනම මත ලබා ගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගනු ලැබන ඇති ක්‍රියාවලීන් සඳහා උපකාරී වන ලේඛනවල පැවැත්ම වෙත මූලික වශයෙන් සීමා වේ.

ප්‍රකාශනය මගින් අවදානම් හා පාලනයන් සියල්ලම ආවරණය වන්නේද යන්න මා විසින් සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් සහ පාලන කාර්ය පටිපාටීන්හි සඵලදායීතාව පිළිබඳ මතයක් පළ කිරීම හෝ SLSAE 3050 ප්‍රමිතියට අනුව අවශ්‍ය නොවේ. එමෙන්ම, වාර්ෂික වාර්තාවෙහි අනාවරණය වන කිසියම් සැලකිය යුතු ගැටලුවල වැදගත් අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලබන ක්‍රියාවලීන්ගෙන් සත්‍ය වශයෙන්ම එකී ගැටලුවලට පිළියම් යෙදෙන්නේද යන්න මා විසින් සලකා බැලීමද SLSAE 3050 ට අනුව අවශ්‍ය නොවේ.

ප්‍රකාශනය පිළියෙළ කිරීමට අදාළ වන සිදුවීම හෝ ගනුදෙනුව සම්බන්ධයෙන් බැංකුවේ ස්වභාවය පිළිබඳ මාගේ අවබෝධය සම්බන්ධයෙන් වූ මාගේ විනිශ්චය, මෙහිදී තෝරා ගන්නා ලද ක්‍රියා පටිපාටිය මත රඳා පවතී.

ලබා ගන්නා ලද සාක්ෂි මාගේ නිගමනය සඳහා උචිත පදනමක් ලබා දීමට ප්‍රමාණවත් හා සුදුසු බව මාගේ විශ්වාසය වේ.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි පදනම් කරගෙන, වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් ප්‍රකාශනය බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා සඵලදායීතාව සමාලෝචනයෙහි ලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ක්‍රමවේදය පිළිබඳ මාගේ අවබෝධයට අනුකූල නොවන බව විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මාගේ අවධානයට ලක් වී නොමැත.



ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති ජනරාල්

ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ සහතිකකරණ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

RECEIVED
19 MAY 2021
HDFC / CHMD





සභාපති,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (එච්ඩීඑෆ්සී) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන නියමයන්ට දක්වන අනුකූලතාව පිළිබඳව විගණකාධිපති ජනරාල් විසින් එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන සිද්ධිවාචක සොයාගැනීම් වාර්තාව - 2020 දෙසැම්බර් 31.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලන නියමයන්හි අවශ්‍යතා ඉටු කරනු පිණිස පිළියෙළ කොට ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ ආයතනික පාලන වාර්තාවට අදාළව මෙම වාර්තාවට එකතු කර ඇති ඇමුණුම 01 හි දක්වා ඇති ක්‍රමවේද මා විසින් ක්‍රියාත්මක කරන ලදි. කල්තියා එකඟ වූ ක්‍රමවේදීය සම්බන්ධතා ක්‍රියාකාරකම්වලට අදාළ වන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400ිඃඕඝ්‍ඃ 4400* වල දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම ක්‍රියාකාරකම සිදු කර තිබේ. එම ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලද්දේ හුදෙක්ම ආයතනික පාලන නියමයන්හි අවශ්‍යතාවලට අනුකූලතාව දැක්වීම සඳහා ඔබ වෙත සහාය වීම උදෙසා ය.

මාගේ සොයාගැනීම් මෙම වාර්තාවට එක් කර ඇති ඇමුණුම 01 හි වාර්තා කරමි.

ඉහත ක්‍රමවේද මගින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ ශ්‍රී ලංකා සමාලෝචන කාර්යයන් පිළිබඳ ප්‍රමිතිවලට අනුකූලව සිදු කරන ලද විගණනයක් හෝ සමාලෝචනයක් ස්ථාපිත නොවන හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ නියමයන්ට දක්වා ඇති අනුකූලතාව පිළිබඳ කිසිදු සහතිකකරණයක් මම ප්‍රකාශ නොකරමි.

මා විසින් අමතර ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලද්දේ නම් හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ ශ්‍රී ලංකා සමාලෝචන කාර්යයන් පිළිබඳ ප්‍රමිතිවලට අනුකූලව විගණන හෝ සමාලෝචන කටයුත්තක් සිදු කරන ලද්දේ නම් හෝ ඔබ වෙත වාර්තා කෙරෙනු ඇති වෙනත් කාරණා මාගේ අවධානයට ලක් වීමට ඉඩ තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මාගේ වාර්තාව හුදෙක්ම මෙම වාර්තාවේ පළමු ඡේදයෙහි දක්වා ඇති අරමුණ සහ ඔබගේ දැනගැනීම සඳහා පමණක් වන අතර එම වාර්තාව වෙනත් කිසිදු අරමුණක් සඳහා යොදා ගැනීම හෝ වෙනත් පර්ශ්ව වෙත බෙදා හැරීම හෝ සිදු නොකළ යුතුය.

මෙම වාර්තාව ඉහත නිශ්චය කර දක්වා ඇති අයිතමවලට පමණක් අදාළ වන අතර සමස්ථයක් ලෙස ගත් කල ශ්‍රී ලංකා එච්ඩිඑෆ්සී බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කිසිවක් මෙමගින් ආවරණය නොවේ.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති ජනරාල්

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටුව

සංයුතිය හා රැස්වීම්

මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටුවේ සාමාජිකයෝ මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, මූල්‍ය ආදී ක්ෂේත්‍ර රැසක පුළුල් දැනුම් සම්භාරයකට හා පළපුරුද්දකට හිමිකම් කියති.

මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළදී කමිටුව සිව් වතාවක් (04) රැස් විය.

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් මානව සම්පත් හා වැටුප් කමිටුවේ සේවය කරයි/කර තිබේ.

කමිටුවේ සාමාජිකයන් සහ 2020 දී පවත්වන ලද රැස්වීම් සඳහා ඔවුන් දැක්වූ සහභාගීත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයා/වරිය	කාල සීමාව (කමිටුවේ	සහභාගි වීමට සුදුසුකම් ලැබූ රැස්වීම්	සහභාගි වූ රැස්වීම්
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය - කමිටුවේ සභාපතිනි (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 ජනවාරි 29 දින පත් විය	4	4
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 ජූලි 29 දින පත් විය	4	4
පී. ඒ. එස්. අතුල කුමාර මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 31 දින පත් විය	3	3
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 31 දින පත් විය	3	3
ආර්. ඒ. චූලානන්ද මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 සැප්තැම්බර් 26 දින පත් වූ අතර 2020 අගෝස්තු 13 දින විශ්‍රාම ගියේය	1	1
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	1	1
ආචාර්ය එස්. එන්. මොරායස් (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	1	1

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සුදුසුකම් පැතිකඩ 40-47 පිටුවල දක්වා තිබේ.

ආරාධනා මත නිරතුරුව සහභාගී වන්නන්

බැංකුවේ සමස්ථ කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරන නිලධාරියා වන කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තමන්ට අදාළ කාරණා සාකච්ඡාවට ලක් කෙරෙන රැස්වීම් හැර කමිටුවේ අන් සියලුම රැස්වීම්වලට සහභාගී විය යුතුය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය මෙම කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කළාය.

මානව සම්පත් හා වැටුප් කමිටුව ඊට අදාළ විකඟ වූ යොමු කිරීමේ අනුදේශ හා කොන්දේසිවලට අනුකූලව වන අතර, එය වගවීම හා විනිවිදභාවය පිළිබඳ කොන්දේවලට කැප වෙමින් හා බැංකුවේ පවතින පාරිශ්‍රමික (වැටුප් හා දීමනා) ක්‍රමවේද සාධාරණ බවත් ඒවා කාර්මාන්තයේ ප්‍රමිති, බැංකුවේ කාර්යසාධනය සහ බැංකුවේ සහ එහි කොටස් හිමියන් සතු දිගු කාලීන අභිලාෂ හා අවශ්‍යතාවලට අනුකූල වන බවත් සහතික කරමින් කටයුතු කරයි.

ප්‍රතිපත්තිය

මානව සම්පත් කළමනාකරණ හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බැංකුව තුළ සඵලදායී මානව සම්පත් කළමනාකරණයක් සිදු කරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටුව ප්‍රධාන වශයෙන්ම වගකීම දරයි.

මේ අනුව, මානව සම්පත් හා වැටුප් කමිටුව පහත කාරණා සම්බන්ධයෙන් වගකීම දරයි:

1. බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍යමය ගෙවීම්).
2. කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වූ ඉලක්ක පිහිටුවිය යුතු වේ.
3. පිහිටුවා ඇති ඉලක්ක සහ අරමුණුවලට සාපේක්ෂකව කමිටුව කලින් කලට ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය තක්සේරු කොට ඔවුන්ගේ පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධනය පාදක පාරිතෝෂික සංශෝධනය කිරීමේ පදනම තීරණය කළ යුතුය.
4. තනතුරු නාම වෙනස් කිරීම.
5. සියලුම දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සහ බැංකුවේ සේවකයන් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම අධීක්ෂණය කිරීම.
6. කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සේවා කාල දීර්ඝ කිරීම.
7. සේවකයන්ගේ විනය හා සම්බන්ධ කාරණා පිළිබඳ තීරණ ගැනීම/ හෝ අභියාචනා නිර්ණය කිරීම (බැංකුවේ විනය කාර්ය පටිපාටියට අනුව අවශ්‍ය වේ නම්).
8. සේවකයන්ගේ දුක්ගැනවිලිවලට අදාළ සියලුම අභියාචනා.
9. කළමනාකාරිත්ව අධිකාරී මට්ටමේ සීමාව ඉක්මවා යන සේවකයන්ට අදාළ සියලු කාරණා (අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරිත්වය යටතට ගැනෙන සුවිශේෂී කාරණා හැර).
10. කමිටුව වෙනුවෙන් සුදුසු යොමුකිරීමේ අනුදේශ මාලාවක් පිහිටුවා ගැනීම සහ එය සමාලෝචනය/සංශෝධනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

කමිටුව වෙත යොමු කෙරෙන හා විශේෂයෙන්ම පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම:

1. සමස්ථ ලංකා බැංකු සේවක වෘත්තීය සමිතිය සමග බැංකුව එළැඹ ඇති සාමූහික ගිවිසුම.
2. බැංකුවේ සංවිධාන ව්‍යුහය.
3. අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කිරීම්, බඳවා ගැනීම් කාර්ය පටිපාටිය.
4. නව තනතුරු නිර්මාණය කිරීම, තනතුරුවල පිහටුවීම්, කාර්ය මණ්ඩලය සහ කාර්ය මණ්ඩල අයවැය.
5. මානව සම්පත හා බැඳි සියලුම කාරණාවලට අදාළ ප්‍රතිපත්ති.
6. විනය කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීම/ හෝ අභියාචනා නිර්ණය කිරීම (බැංකුවේ විනය කාර්ය පටිපාටියට අනුව අවශ්‍ය වේ නම්).
7. කළමනාකාරිත්වයේ සහ මානව සම්පත් කමිටුවේ අධිකාර බලතල සීමාවෙන් ඔබ්බට යන සේවකයන්ට අදාළ සියලු කාරණා.

මෙහි සමාලෝචනයට ලක වන කාල සීමාව තුළදී කමිටුව තමන් වෙත පැවරී ඇති වගකීම් නිසි පරිදි ඉටු කිරීම උදෙසා අවශ්‍ය සියලු විධිවිධාන අනුගමනය කරන ලද අතර, කාර්ය මණ්ඩලයට අදාළ වැදගත් ප්‍රතිපත්ති කිහිපයක්ම නිර්දේශ කිරීම සම්බන්ධයෙන් සාර්ථක වී ඇත.

2020 දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

- වැටුප් නොවන ප්‍රතිලාභ අරමුණු කරගත් සාමූහික ගිවිසුමක් සමස්ථ ලංකා බැංකු සේවක වෘත්තීය සමිතිය සමග ඇතිකර ගන්නා ලෙස කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලද.
- සේවක මණ්ඩලය සඳහා පුහුණු සැලැස්මක් නිර්දේශ කොට එය ක්‍රියාත්මක කිරීමටද කමිටුව පියවර ගත්තේය.
- සේවක උසස් වීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද කමිටුව නිර්දේශ ඉදිරිපත් කළේය.

සේවක වාර්තාව

වර්ෂය ආරම්භයේදී පිහිටුවනු ලැබූ ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රමවේදයක් මත පදනම් වූ අභිනව කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයක් බැංකුව විසින් සිය සේවකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදි. මෙම නව පද්ධතිය මගින් කාර්යසාධනය අරමුණු කරගත් ඉලක්ක වෙනුවෙන් වඩා හොඳින් කටයුතු කරනු පිණිස සේවකයන් සියලුම දෙනා වෙත දිරිගැන්වීමක් ලබා දෙනු ඇතැයි අපේක්ෂිතය.

2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සේවකයන් පිළිබඳ වාර්තාව පහත වගුවෙන් දැක්වේ.

කාණ්ඩය	දෙසැම්බර් 31 දිනට එකතුව
ආයතනික කළමනාකාරිත්වය	11
ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු	26
ප්‍රාදේශීය කළමනාකාරවරු	5
විධායක කාර්ය මණ්ඩලය	279
විධායක නොවන කාර්ය මණ්ඩලය (ලේකම්වරු, බැංකු සහකාරවරු, පොදු වගකීම් පැවරුණු සේවකයන්, කාර්යාල සහකාරවරු, රියදුරන්, ව්‍යාපාර ප්‍රවර්ධන සහකාරවරු, කනිෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන සහකාරවරු, ව්‍යාපාර ප්‍රවර්ධන අභ්‍යාසලාභීන්, ජංගම බැංකුකරණ සහකාරවරු)	312
එකතුව	**633**

(බැංකුවේ ශ්‍රම බලකායෙන් 37% ක් කාන්තා සේවිකාවන්ගෙන් ද, 63% ක් පිරිමි සේවකයන්ගෙන් ද සමන්විත විය).

සාරාංශය

මානව සම්පත් ප්‍රතිපත්ති අලුතින් හඳුන්වා දීම සහ සවිමත් කිරීම සඳහා බැංකුව අඛණ්ඩව අවධානය යොමු කරමින් කටයුතු කරනු ඇත.



ආර්. වී්. ආර්. ඩබ්ලිව්. මංචනායක
සභාපතිනි



කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය
සමාගම් ලේකම්

2021 මැයි 21 දින
කොළඹ දී ය.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව

සංයුතිය හා රැස්වීම්

ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ මුලසුන දැරිය යුතු අතර එහි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු වේ.

මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළදී කමිටුව පස් වතාවක් (05) රැස් වී තිබේ.

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් නාම යෝජනා කමිටුවේ සේවය කරයි/කර තිබේ:

කමිටුවේ සාමාජිකයන් සහ 2020 දී පවත්වන ලද රැස්වීම් සඳහා ඔවුන් දැක්වූ සහභාගීත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයා/වරිය	කාල සීමාව (කමිටුවේ)	සහභාගි වීමට සුදුසුකම් ලැබූ රැස්වීම්	සහභාගි වූ රැස්වීම්
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය - කමිටුවේ සභාපතිනි (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 ජනවාරි 29 දින පත් විය	5	5
පී. ඒ. එස්. අතුල කුමාර මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 31 දින පත් විය	4	4
ආර්. ඒ. චූලානන්ද මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 සැප්තැම්බර් 26 දින පත් වී 2020 අගෝස්තු 13 දින විශ්‍රාම ගියේය	2	2
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	2	2
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	1	1
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	1	1

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සුදුසුකම් පැතිකඩ 40-47 පිටුවල දක්වා තිබේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය මෙම කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කළාය.

කමිටුව වගකීම්

ප්‍රධාන වශයෙන්ම අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම පැවරී ඇති නාම යෝජනා කමිටුව පහත කාරණා සම්බන්ධයෙන් වගකීම් දරයි:

1. අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම/පත් කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
2. අධ්‍යක්ෂ මණ්ඩලය සතු සමස්ථ වගකීම් ඉටු කිරීම උදෙසා කිසියම් අධ්‍යක්ෂවරයෙකු/වරියක විසින් දක්වා ඇති දායකත්වය සහ කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් ඔහු/ඇය නැවත අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට අදාළ නිර්දේශ ලබා දීම.
3. රැකියා විස්තර සමාලෝචනය කිරීම තුළින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ගති ලක්ෂණ ආදී නිර්ණායක පිහිටුවීම.
4. ඉහත 3(3) නියමයෙහි දක්වා ඇති සහ අදාළ ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් එකී තනතුරු දැරීමට යෝග්‍ය සහ සුදුසු පුද්ගලයන් බව සහතික කරනු පිණිස සුදුසු ක්‍රමවේදයක් පිහිටුවීම.
5. විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ අතිරේක හෝ අභිනව විශේෂඥතා හා අනුප්‍රාප්තික සැලසුම් සලකා බලමින් එම කමිටුව අදාළ නිර්දේශ ලබා දීම (කලින් කල).

මෙහි සමාලෝචනයට ලක වන කාල සීමාව තුළදී කමිටුව ඉහත දක්වා ඇති නාම යෝජනා කමිටුවේ බලතල ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේ.

2020 මූල්‍ය වර්ෂය තුළ ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

- 2020 වසර තුළදී කමිටුව පහත අධ්‍යක්ෂවරුන් අලුතින් පත් කිරීමට නිර්දේශ කර තිබේ.
- ඩී. ව . සරත් අභයගුණවර්ධන මහතා (කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජිත) විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ, පී. ඒ. එස්. අතුල කුමාර මහතා (මහා භාණ්ඩාගාරයේ නියෝජිත) විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ, එල්. ඊ. සුසන්ත සිල්වා මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ), ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) සහ ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ).
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ වාර්ෂික යෝග්‍යතාව සහ නිසි දිවුරුම් ප්‍රකාශන සම්බන්ධයෙන් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදි.
- ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ උසස් වීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව කමිටුව විසින් අවශ්‍ය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන ලදි.



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය
සභාපතිනි



කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය
සමාගම් ලේකම්

2021 මැයි 21 දින
කොළඹ දී ය.

අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව

සංයුතිය හා රැස්වීම්

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් බහුතරයක් සහිත සාමාජිකත්වයකින් මෙම කමිටුව සැදුම් ලබයි. විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් අතරින් එක් අයෙකු කමිටුවේ සභාපති ලෙස පත් කර තිබේ.

මෙහි 'ස්වාධීනතාව' යන්න නිර්වචනය කිරීම සඳහා යොදා ගැනෙන නිර්ණායක 7.10.5 ලැයිස්තුගත වීම් රීතියෙහි දක්වා ඇති නිර්ණායකම වේ. (කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති - 9.2.2)

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුවේ සේවය කරයි/කර තිබේ. එමතුද නොව, මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළදී කමිටුව පස් වතාවක් (05) රැස් වී තිබේ.

කමිටුවේ සාමාජිකයන් සහ 2020 දී පවත්වන ලද රැස්වීම් සඳහා ඔවුන් දැක්වූ සහභාගීත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයා/වරිය	කාල සීමාව (කමිටුවේ)	සහභාගී වීමට සුදුසුකම් ලැබූ රැස්වීම්	සහභාගී වූ රැස්වීම්
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය - කමිටුවේ සභාපතිනි (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 ජනවාරි 29 දින පත් විය	5	5
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 31 දින පත් විය	3	3
ආචාර්ය එස්. එන්. මොරායස් (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 සැප්තැම්බර් 26 දින සිට 2020 අගෝස්තු 30 දින දක්වා (කමිටුව අලුත් කිරීම මත)	2	1
ඒල්. ඊ. සුසන්ත සිල්වා මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 දෙසැම්බර් 16 දින පත් විය	1	1
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 දෙසැම්බර් 16 දින පත් විය	1	1
ආර්. ඒ. චූලානන්ද මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 සැප්තැම්බර් 26 දින පත් වී 2020 අගෝස්තු 13 දින විශ්‍රාම ගියේය	2	2

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සුදුසුකම් පැතිකඩ 40-47 පිටුවල දක්වා තිබේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය මෙම කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කළාය.

බැංකුවේ නියාමන අධිකාරීන් වන ශ්‍රී ලංකා විනිමය සුරුකුම්පත් කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ආදිය විසින් කලින් කලට නියම කරනු ලැබෙන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ වගකීම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව වෙත පැවරේ.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළව බැංකුව සඳහා වූ ප්‍රතිපත්තිය සහ යොමුකිරීමේ අනුදේශ

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කාර්යක්ෂම කිරීමේ සහ බැංකුව කිසිදු ආකාරයක වාසිදායක සැලකීමක් සම්බන්ධිත පාර්ශ්ව වෙත ලබා නොදෙන බව සහතික කරනු පිණිස එකී ගනුදෙනු සම්බන්ධයෙන් අසම්බන්ධිත ප්‍රමිතිය පිළිබඳ මූලධර්ම යොදා ගැනීමේ අරමුණින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය සහිතව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් සහ ඊට අදාළ යොමුකිරීමේ අනුදේශ පිහිටුවා ගන්නා ලදි.

එමෙන්ම, කිසියම් සම්බන්ධිත පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක වාසිදායක සැලකීමක් දැක්වීමකින් තොරව එකී පාර්ශ්ව සමග කටයුතු කිරීමේදී බැංකුව අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් පිහිටුවන ලද අතර, අවශ්‍යතා උද්ගත වූ විට කමිටුව දැනට පවතින ප්‍රතිපත්තිය සහ යොමුකිරීමේ අනුදේශ සමාලෝචනය කළ යුතු වේ. ඒ අනුව අදාළ සංශෝධන සිදු කෙරෙනු ඇත.

පරාසය සහ කැපවීම

- ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නියාමන අධිකාරීන් විසින් පනවා ඇති නියමයන්ට අනුව සම්බන්ධිත පාර්ශ්ව සමග සිදු කෙරෙන ගනුදෙනුවක් නිසා උද්ගත විය හැකි ඕනෑම ආකාරයක පිළිබැඳියා ගැටුමක් පරිපාලනය කිරීමේ වගකීමද කමිටුවට පැවරේ.
- සියලුම සම්බන්ධිත කටයුතු බැංකුවේ පරම අභිමතයට හේතු වන අයුරින් සහ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් කිසිවෙකු හෝ සැලකිය යුතු මට්ටමේ කොටස් හිමියෙකු තමන් දරන තනතුරු සිය පෞද්ගලික යහපත තකා යොදා ගැනීමෙන් වළක්වාලමින් ඉටු කෙරෙන බව සහතික කිරීම.
- මේ අනුව, ශ්‍රී ලංකා විනිමය සුරුකුම්පත් කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ විධිවිධානවලට අනුකූලව සහ අසම්බන්ධිතතා මූලධර්ම ගුරුකොට ගනිමින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම කමිටුව වෙත පැවරේ.
- මේ නිසා, කමිටුව විසින් බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නිර්වචය කිරීමේ අරමුණ සඳහා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් සහ එහි යොමුකිරීමේ අනුදේශ පිහිටුවා ගන්නා ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

- මෙහි සලකා බලනු ලැබෙන වසර තුළදී සමාලෝචිත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළ අදහස්/නිරීක්ෂණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිසි පරිදි සන්නිවේදනය කර ඇත.
- ඉහත ක්‍රියාමාර්ගවලට අමතරව, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීතිවල 9 වන වගන්තියේ අවශ්‍යතාවක් ලෙස දැක්වෙන පරිදි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධයෙන් වාර්ෂික වාර්තාවෙහි නිසි හෙළිදරවු කිරීම් සිදු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට උපදේශනය සැපයීමද කමිටුවේ විෂය පරාසයට ඇතුළත් වෙයි.
- එපමණක්ද නොව, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්, අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ සමීප පවුලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරුද ඇතුළත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළ තොරතුරු ලබා ගැනීම හා බැංකුවේ දත්ත රැස් කිරීමේ පද්ධතිය වෙත ඇතුළු කිරීම සහ එකී තොරතුරුවල නිරවද්‍යතාව සහතික කිරීම සඳහා අධීක්ෂණ පද්ධති ක්‍රියාත්මක කර ඇත.

2020 දී සිදු කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

- කරුණාකර, මෙහි සමාලෝචනයට ලක වන කාල සීමාව තුළදී සිදු කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ විස්තර සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 40 වන සටහන බලන්න.
- නියමිත ආකෘතිවලට අනුව වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කළ යුතු කිසිදු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක (ලැයිස්තුගත වීමට අදාළ රීති 9.3.2. හි දක්වා ඇති පරිදි කවර හෝ පුනරාවර්තී නොවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක හෝ පුනරාවර්තී සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක) බැංකුව නිරත නොවීය.

ආර්. වී්. ආර්. ඩබ්ලිව්. මංචනායක
සභාපති

කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය
සමාගම් ලේකම්

2021 මැයි 21 දින
කොළඹ දී ය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

කොළඹ කොටස් හුවමාරුවේ ''ලැයිස්තුගත වීමට අදාළ රීති'' හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලන නියමයන් වෙත සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා විනිමය සුරුකුම්පත් කොමිෂන් සභාව එක්ව නිකුත් කර ඇති ''ආයතනික පාලනය පිළිබඳ නිසි පිළිවෙත් සංග්‍රහය'' වෙත අනුකූල වන පරිදි බැංකුවේ විගණන කමිටුව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය සඳහා වූ මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

වර්ෂය අවසානය වන විට විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකුගෙන් (05) මෙම කමිටුව සමන්විත විය.

- කේ. ඩී. ගුණවර්ධන මහතා
- ඒ. ජයමහ මහතා
- ආචාර්ය එස්. එන්. මොරායස්
- පී. ඒ. එස්. අතුල කුමාර මහතා
- එල්. ඊ. සුසන්ත සිල්වා මහතා

විගණන කමිටු රැස්වීම්

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලද අතර, එකී රැස්වීම්වලට කමිටු සාමාජිකයන් සහභාගී වීමට අදාළ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ ආයතනික පාලනය කොටසින් දක්වා ඇත. බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී එම රැස්වීම්වලට නිරන්තර පදනමක් මත සහභාගී වූහ. ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කර ඇත.

අවශ්‍යතා උද්ගත වූ විට මෙම රැස්වීම්වලට සහභාගී වීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් අදාළ නිලධාරීන් හටද ආරාධනා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ආරාධනය මත ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකුද (බැංකුවේ බාහිර විගණක) මෙම කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී කටමුිව පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම්වල නිරත විය:

- මූල්‍ය වාර්තාකරණය

  මූල්‍ය වාර්තාකරණයට අදාළ වැදගත් කාරණා, ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත වෙනස්කම් සහ අදාළ වෙනත් ඕනෑම කාරණාවක් අධීක්ෂණය කිරීම තුළින් කමිටුව විසින් වාර්ෂික හා අතුරු මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට අදාළ අනෙකුත් ඕනෑම ආකාරයක විධිමත් නිවේදන ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධතාව සහතික කරන ලදී.

- අභ්‍යන්තර පාලනයන්, අවදානම් කළමනාකරණ පද්ධති සහ අනුකූලතා අවශ්‍යතා.

  පවතින ක්‍රමවේද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා ඉටු කිරීමට ප්‍රමාණවත් බව සහතික කිරීම සහ බැංකුව මුහුණ දුන් සැලකිය යුතු මට්ටමේ අවදානම් සියල්ලම හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම උදෙසා කමිටුව විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද සහ අවදානම් කළමනාකරණ පද්ධති නිරන්තර සමාලෝචනයන්ට ලක් කරන ලදී.

  එකී අවශ්‍යතා ඉටු කිරීම සඳහා අදාළ පද්ධති හා ක්‍රමවේද වෙත දැක්විය යුතු අනිවාර්ය අනුකූලතාව අධීක්ෂණය කිරීමටද කමිටුව පියවර ගෙන ඇත.

- අභ්‍යන්තර විගණන කාර්යභාරය

  බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණයට සාපේක්ෂව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය, කාර්යභාරය සහ සම්පත්වල ප්‍රමාණවත්භාවය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. අභ්‍යන්තර විගණන කාර්යභාරය විය විසින් විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීනව සිදු කෙරෙන්නේද යන්නද කමිටුව විසින් සහතික කරන ලදී. කමිටුව විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය හා තක්සේරු කොට අනුමත කරන ලදී. අභ්‍යන්තර විගණන ප්‍රධානී සහ එහි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඇගයීම් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වනු පිණිස සමාලෝචනය කරන ලදී.

- බාහිර විගණනය සහ අනෙකුත් ව්‍යවස්ථාපිත විගණනයන්

  බාහිර විගණකවරුන්ගේ සොයා ගැනීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කළ ව්‍යවස්ථාපිත විමර්ශනයන් කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, විධිවිධාන උල්ලංඝන කිරීම්, වංචා හා දෝෂ වළක්වා ගැනීමේ අනලස් ඉදිරි ක්‍රියාමාර්ග අනුගමනය කරනු පිණිස ආයතනික කළමනාකාරිත්වය හා සම්බන්ධ වී කටයුතු කර තිබේ.

  2020 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යවස්ථාපිත විමර්ශන වාර්තාව 2019 හි සහ ජාතික විගණන කාර්යාලය විසින් සිය 'කළමනාකරණ ලිපිය 2019' හි ඉස්මතු කරන ලද කාරණා සම්බන්ධයෙන් බැංකුවේ කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කරන ලද නිවරදකරණ විධිවිධාන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පසුවිපරම් කර තිබේ.

අභ්‍යන්තර මූල්‍ය පාලන, ගිණුම් පිළිවෙත් සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන

සහතිකකරණ ලබා දෙන පාර්ශ්වයන්හි වාර්තා කිරීම්වලට අනුව, බැංකුවේ අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතිය සහ ගිණුම්කරණ පිළිවෙත් කෙරෙන් අවිශ්වසනීය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන බිහි වීම සඳහා පදනමක් සපයන කිසිවක් කමිටුවේ අවධානයට ලක් වී නොමැත.

බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වැදගත් කාරණා සියල්ලම අතින් සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලතාව දක්වන බවට කමිටුව සෑහීමකට පත් වන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.



කේ. ඩී. ගුණවර්ධන
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2021 අප්‍රේල් 5 දින

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සංයුතිය හා රැස්වීම්

මෙහි සමාලෝචනයට ලක වන කාල සීමාව තුළ සුසන්ත සිල්වා මහතා (අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ වත්මන් සභාපති) සහ එන්. විජයනාදන් මහතා (2020 ජූනි 29 දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විශ්‍රාම ගිය) යන අය අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ මුලසුන දැරූහ. ඔවුන් දෙදෙනාම විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් ය. මීට අමතරව, මෙහි සමාලෝචනයට ලක වන කාල සීමාව තුළ මෙම කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළ සෙසු සාමාජිකයන්ද විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය.

මෙහි සමාලෝචනය කෙරෙන කාල සීමාව තුළ කමිටුව සිව් වතාවක් (04) රැස් විය.

කමිටුවේ සාමාජිකයන් සහ 2020 දී පවත්වන ලද රැස්වීම් සඳහා ඔවුන් දැක්වූ සහභාගිත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයා)/වරිය	කාල සීමාව (කමිටුවේ)	සහභාගි වීමට සුදුසුකම් ලැබූ රැස්වීම්	සහභාගි වූ රැස්වීම්
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා - කමිටුවේ සභාපති (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 10 දින පත් විය	02	02
පී. ඒ. එස්. අතුල කුමාර මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 මාර්තු 11 දින පත් විය	02	02
ආචාර්ය එස්. එන්. මොරායස් (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2019 ජූනි 28 දින පත් විය	04	03
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	2020 අගෝස්තු 10 දින පත් විය	02	02
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)	ආරාධනාව මත	01	01
එන්. විජයනාදන් මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) - විශ්‍රාම යන තුරු කමිටුවේ සභාපති ලෙස සේවය කළේය.	2019 ජූනි 30 දින පත් වී 2020 ජූනි 29 දින විශ්‍රාම ගියේය	02	02

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සුදුසුකම් පැතිකඩ 40-47 පිටුවල දක්වා තිබේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය මෙම කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කළාය.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ මූලික වගකීම්

කමිටුවේ ප්‍රධාන වගකීම් පහත දැක්වේ:

1. මෙම කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග සමීපව කටයුතු කළ යුතු අතර කමිටුව සඳහා පවරා ඇති කාර්ය රාමුව තුළ හා පැවරී ඇති අදාළ වගකීම්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අවශ්‍ය තීරණ ගත යුතු වේ.
2. සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ කමිටුව බැංකුවේ සියලුම අවදානම් (ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම ආදී) තක්සේරු කළ යුතු වේ.
3. සුවිශේෂී අවදානම් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සහ කමිටුව විසින් නියම කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත එකී අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා ණය කමිටුව හා වත්කම්-වගකීම් කමිටුව ආදී කළමනාකරණ මට්ටමේ කමිටු සියල්ලෙහිම ප්‍රමාණාත්මතාව හා ගුණාත්මකභාවය සමාලෝචනය කළ යුතුය.
4. කමිටුව කඩිනම් නිවරදකරණ පියවර ගත යුතුය.

   ඇතැම් සුවිශේෂී අවදානම් නිසා විල්ල විය හැකි බලපෑම් බැංකුවේ ප්‍රතිපත්ති සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා, නියමයන් හා චක්‍රලේඛ මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලැබ ඇති විචක්ෂණශීලී සීමාවන් ඉක්මවා යන අවස්ථාවලදී එකී බලපෑම් අවර කිරීම සඳහා කමිටුව කඩිනම් නිවරදකරණ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ.
5. යාවත්කාලීන කරන ලද ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්ද ඇතුළත්ව සියලුම ආකාරවල අවදානම් පැතිකඩ කළමනාකරණය හා අවම කිරීම උදෙසා යටත් පිරිසෙයින් කාර්තුවකට වරක්වත් කමිටුව රැස් විය යුතු වේ.
6. අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන කට්ටල ඔස්සේ (ඊ-රැස්වීම් පද්ධතියෙහි කොටසක් ලෙස පිහිටුවා ඇති) කමිටුව යාවත්කාලීන වාර්තා ලබා ගත යුතු වේ.
7. සුවිශේෂී අවදානම් හඳුනා ගැනීමට අසමත් වීම සම්බන්ධයෙන් වගකීම අදාළ නිලධාරීන් වෙත පැවරීමට කමිටුව පියවර ගත යුතු අතරම කමිටුව විසින් නිර්දේශිත සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් නියම කර ඇති කඩිනම් නිවරදකරණ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට වගබලා ගත යුතුය.
8. අධ්‍යක්ෂ මණ්ඩලයේ මත, එකඟතාව සහ/හෝ සුවිශේෂී උපදෙස් බලාපොරොත්තුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දෙමින් සෑම රැස්වීමක්ම පැවැත්වූ දින සිට සතියක කාලයක් ඇතුළත අවදානම් තක්සේරුකරණ වාර්තාවක් ඉදිරිපත් කොට කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදේශනය ලබා දිය යුතුය.
9. බැංකුවේ සෑම ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රයකටම අදාළ සියලුම නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීමේ අනුකූලතා ක්‍රමවේදයක් කමිටුව ස්ථාපිත කළ යුතු වේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතරින් තෝරා ගන්නා ලද අනුකූලතා නිලධාරියෙකු විසින් බැංකුවේ අනුකූලතා කාර්යභාරය මෙහෙයවනු ලැබිය යුතු අතර ඒ පිළිබඳව කලින් කල කමිටුව වෙත වාර්තා කළ යුතුය.

10. අනුකූලතාව හා සබැඳි කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් හා අධීක්ෂණ කටයුතු ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහාය වේ. මේ අනුව, බැංකුවේ විවිධාකාර අනුකූලතා සහ නියාමන අවදානම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්විය යුතු අනුකූලතා වැඩසටහන්, ප්‍රතිපත්ති හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම පිළිබඳව කමිටුව සමාලෝචන සිදු කරයි.
11. කමිටුව වෙත සුවිශේෂයෙන් යොමු කෙරෙන හෝ අධ්‍යක්ෂ මණ්ඩල ගොනුකිරීම් ඔස්සේ කමිටුවේ අවධානයට ලක් වන බැංකුව වෙත ක්‍රමානුකූල බලපෑමක් එල්ල කිරීමට ඉඩ ඇති කාරණා, එකම අවදානම් ප්‍රතිඵල නැවත නැවත උද්ගත වීම වැළැක්වීමේ හෝ ඉස්මතු වන අවදානම් කළමනාකරණය කිරීමේ පැහැදිලි පරමාර්ථය සහිතව, සමාලෝචනය කොට ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් වෙත ආපසු යොමු කෙරේ.
12. බැංකුවේ අවදානම් නිරාවරණයන් සහ ඒවාට අදාළ බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වෙත මග පෙන්වීම.

2020 දී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය

1. බැංකුවේ සහ ගනුදෙනුකරුවන්ගේ අභිලාෂ හා අවශ්‍යතා අතර මනා සමතුලිතභාවයක් පවත්වා ගැනීම තුළින් කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද බැංකුවේ මෙහෙයුම් කළමනාකරණය කර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලදි.
2. ඒ අනුව බැංකුවේ දැනට පවතින අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා පූර්ණ වැඩිදියුණු කිරීම් සිදු කරන ලදි.
3. බැංකුවේ පාලනය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සහ දරාගත හැකි අවදානම් සීමාව පිහිටුවා එය සමාලෝචනය කොට කර්මාන්තයේ මිනුම් සමග ගැලපෙන පරිදි අවදානම් අධීක්ෂණ සීමා හැඩගැස්වීම සඳහා කාර්ය රාමුවක් පිහිටුවන ලදි.
4. පවතින ප්‍රාග්ධන වෙළෙඳපොල කෙරෙහි ඇති බලපෑම සහ අතිරේක වශයෙන් අවශ්‍ය වන ප්‍රාග්ධනය කෙරෙහි ඇති බලපෑම සලකා බලමින් ආතති පරීක්ෂා කාල සීමා දීර්ඝ කිරීම තුළින් සමස්ථ ආතති පරීක්ෂා කාර්ය රාමුව වැඩිදියුණු කරන ලදි.
5. තොරතුරු තාක්ෂණ මෙහෙයුම් හා සබැඳි අවදානම්ද ඇතුළුවණය, මෙහෙයුම්, උපායමාර්ගික, මූල්‍ය හා ද්‍රවශීලතා අවදානම් ආවරණය කරමින් අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ මිනුම්ගත කිරීම වැඩිදියුණු කරන ලදි.
6. පවතින අවදානම් කළමනාකරණ රාමුව සවිමත් කිරීම සහ නව ක්‍රමවේදීය වෙනස්කම් මාලාවක් හඳුන්වා දීම තුළින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගන්වන ලදි.
7. අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය ප්‍රතිව්‍යුහගත කරමින් අවදානම් ශ්‍රේණිගත කිරීමේ යාන්ත්‍රණය ඔස්සේ ණය අවදානම් කළමනාකරණය සවිමත් කරන ලද අතර එකී අවදානම් තක්සේරු ක්‍රමවේදය සවිගන්වනු පිණිස එහි පරාසය හා ආවරණීත ක්ෂේත්‍රය ඉහළ නංවන ලදි.
8. ණය අනුමත කිරීමේ කටයුතු කාර්යක්ෂම කරමින් පිරිවැටුප් කාල සහ කඩදාසි භාවිතය සැලකිය යුතු ලෙස අඩු කිරීමේ අපේක්ෂාවෙන් ණය අවදානම අවම කිරීමේ කාර්යයන් වැඩිදියුණු කරන ලදි.
9. ප්‍රධාන අවදානම් දර්ශක අලුත් කිරීම තුළින් ප්‍රගති පුවරු හරහා අවදානම් අධීක්ෂණය වැඩිදියුණු කරන ලද අතර ඒ ආශ්‍රිත කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කලින් කල වාර්තා කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ කාර්ය සාරාංශය

බැංකුව තුළ සවිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ස්ථාපිත කරනු පිණිස අදාළ අවදානම් තක්සේරු කිරීම්, අධීක්ෂණයන් හා ඒවා කළමනාකරණය කිරීමට සහාය දක්වන අවදානම් කළමනාකරණ රාමුවක්ද අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් පිහිටුවන ලදි. අදාළ තීරණ ගනු ලබන්නේ බැංකුවේ අභ්‍යන්තර අවදානම් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ නියාමන අධීක්ෂණ අවශ්‍යතාවලට අනුකූලව ය.

අදාළ ගැටලු විසඳීම සඳහා බැංකුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගද සමගින් මහජනයාගේ දැනගැනීම පිණිස හෙළිදරවු කළ යුතු බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ මුදල් මණ්ඩලය විසින් පෙන්වා දී ඇති නියාමන හෝ අධීක්ෂණ ගැටලු හෝ බැංකුවේ අවදානම් කළමනාකරණය ආශ්‍රිත අඩුපාඩු හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනනුකූල වීම් හෝ කිසිවක් නොවූ බව කටමුත්ව සහතික කරයි.



ඩබ්ලිව්. ඊ. සුසන්ත සිල්වා මහතා
සභාපති



කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය
සමාගම් ලේකම්

2021 මැයි 21 දින
කොළඹ දී ය.



මුල්‍ය වාර්තා

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

1997 අංක 7 දරන එච්ඩීඑෆ්සී පනතේ (2003 අංක 15 සහ 2011 අංක 45 දරන පනත් මගින් සංශෝධිත) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් සතු වගකීම පහත ප්‍රකාශනයෙහි දක්වා ඇත.

එමෙන්ම, මූල්‍ය ප්‍රකාශනවලට අදාළව බාහිර විගණක සතු වගකීම් විගණකාධිපති ජනරාල්ගේ වාර්තාවෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන් සෑම මූල්‍ය වර්ෂයක්ම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඒවා වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අවසන් වූ වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනාදියෙන් හා ඒවාට යොදා ඇති සටහන්වලින් සමන්විත වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මගින් පහත කාරණා සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් පළ කෙරේ:

1. 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය
2. අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ ලාභ හෝ අලාභ

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අදාළව අධ්‍යක්ෂවරුන් විසින් පහත කරුණු සහතික කළ යුතු වේ:

1. නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන සංගත ස්වභාවයකින් යොදා ගෙන ඇති අතර කවර හෝ සැලකිය යුතු මටටමේ වෙනසක් වේ නම් එය හෙළිදරවු කර හා විස්තර කර ඇති බව.
2. සාධාරණ හා විචක්ෂණභාවයකින් යුතු තීන්දු ගැනීම් හා තක්සේරුකරණ සිදු කර ඇති බව.
3. බැංකුව අදාළ ප්‍රමිති සියල්ලම කෙරෙහි අදාළතාව අනුව අනුකූලතාව දක්වා ඇති බව.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සාංගමික අඛණ්ඩතා පදනම සාධාරණව යොදා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් ප්‍රමාණයක් බැංකුව සතුව පවතින බවද අධ්‍යක්ෂවරුන් සහතික කළ යුතු වේ.

එමෙන්ම, බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සාධාරණ නිරවද්‍යතාවක් සහතිව හෙළිදරවු කිරීම සඳහා ප්‍රමාණවත් තරමේ ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් පවත්වා ගනු ලැබෙන බව සහතික කිරීමේ වගකීමක්ද අධ්‍යක්ෂවරුන් සතු වේ.

මෙම වාර්තාවෙහි ඉදිරිපත් කෙරෙන මූල්‍ය ප්‍රකාශන, 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව පිළියෙළ කර ඇති අතර ඒවා අදාළ ගිණුම් පොත් සමග සැසඳෙන අතරම, එකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2007 අංක 07 දරන සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත, 1998 අංක 30 දරන බැංකු පනත සහ ඊට සිදු කරන ලද සංශෝධන, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනතේ නියමයන් (කලින් කල සංශෝධන කර ඇති පරිදි), කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා විනිමය සුරුකුම්පත් කොමිෂන් සභාව විසින් එක්ව නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ නිසි පිළිවෙත් සංග්‍රහය යනාදියේ අවශ්‍යතාවලට අනුකූලතාව දක්වයි.

මීට අමතරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති නියමිත ආකෘතියටද මෙම මූල්‍ය ප්‍රකාශන අනුකූලතාව දක්වයි.

මෙම වර්ෂය පුරාවටම බැංකුව මුහුණ පෑ සැලකිය යුතු මට්ටමේ අවදානම් හඳුනා ගැනීම, වාර්තා කිරීම, තක්සේරු කිරීම හා කළමනාකරණය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් සථලදායී හා විස්තීර්ණ පද්ධති ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර, ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර සමාලෝචනයට ලක් වේ.

අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටිය සහ බැංකු ව්‍යාපාරය නිසි අයුරින් පවත්වා ගෙන යාම, බැංකුවේ වත්කම් සුරක්ෂිත කිරීම, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා හඳුනා ගැනීම හා වැළැක්වීම සහ බැංකුව සතු වාර්තාවල නිරවද්‍යතාව හා විශ්වසනීයභාවය හැකිතාක් ප්‍රායෝගික අයුරින් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන අනෙකුත් පාලනයන්ද මීට ඇතුළත් වේ.

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ සිදු කරන ලද එකී සමාලෝචනයන්හි ප්‍රතිඵල මෙම වාර්ෂික වාර්තාවේ 129-128 පිටුවල දැක්වෙන ''මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයෙහි'' දක්වා ඇත. ''මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය'' පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතිකකරණ වාර්තාව මෙහි 130-131 පිටුවල දැක්වේ.

බැංකුව විසින් නිසි පරිදි ගිණුම් පොත් පවත්වා ගනු ලැබෙන බව සහ අධ්‍යක්ෂවරුන් සිය නිරන්තර රැස්වීම්වලදී හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සෘජුවම සමාලෝචනය කරන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව 139 පිටුවෙහි දැක්වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

එමෙන්ම, අතුරු මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පූර්වයෙහි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදු කරනු ලැබෙන සමාලෝචනයකින් හා නිර්දේශයකින් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසි මූල්‍ය වාර්තා අනුමත කිරීමද සිදු කරයි.

මෙම වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල වේකාබද්ධතාව හා වාස්තවිකභාවය සම්බන්ධයෙන් තමන්ට අදාළ වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනියි. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට, බැංකුවේ බාහිර විගණක වන ශ්‍රී ලංකා විගණකාධිපති ජනරාල් හට මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිය ස්වාධීන විගණන මතය ප්‍රකාශ කිරීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් සිදු කළ යුතු බවට තමන් විසින් සුදුසු හා අවශ්‍ය යැයි සලකන කවර හෝ සමාලෝචන හා පරීක්ෂණ කටයුත්තක් ඉටු කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවක්ම හා පහසුකමක්ම ඔවුන් වෙත සැපයීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතු වේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ සමාගම් පනතේ 150 (1) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ වගකීම දරන නිලධාරියා වන ප්‍රධාන විධායක නිලධාරී විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහතික කර තිබේ.

එමෙන්ම, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් තබා ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට හෝ අවශ්‍ය අවස්ථාවලදී බැංකුව විසින් ගෙවිය යුතුව තිබුණු සියලුම නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ලම නිසි පරිදි ගෙවා ඇති බවට බැංකුවේ අධ්‍යක්ෂවරු සිය දැනීමේ හා විශ්වාසයේ හැටියට සෑහීමට පත් වෙති.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි තමන් සිය වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය
සභාපතිනි

2021 මැයි 21 දින
කොළඹදී ය.

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAF/ 01/C/HDFC/1/20/25

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 10 May 2021

RECEIVED
10 MAY 2021
HDFC / CHMD

සභාපති,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (''බැංකුව'') 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය හා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනාදියෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම මාගේ විධානය යටතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(I) වගන්තිය ප්‍රකාරව සිදු කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මාගේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

1. 2 මතය සඳහා පදනම

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විසින් සිදු කරන ලදි. එකී ප්‍රමිති යටතේ මා සතු වගකීම මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් 'විගණක සතු වගකීම' යන කොටසෙහි වැඩිදුර විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම සඳහා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කාරණා

ප්‍රධාන විගණන කාරණා යනු මාගේ වෘත්තීය විනිශ්චයට අනුව අදාළ කාල සීමාව සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ විගණනයෙහි පැනෙන ඉතාම වැදගත් කාරණා වේ. සමස්ථයක් ලෙස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ විගණය සහ වය පාදක කරගෙන මාගේ මතය සකස් කර ගැනීම යන සන්දර්භය තුළ එකී කාරණා සැලකිල්ලට ගන්නා ලද අතර, එම කාරණා සම්බන්ධයෙන් වෙනම මතයක් මා විසින් සපයනු නොලැබේ.

ප්‍රධාන විගණන කාරණාව	විගණනයේදී එම කාරණාව ආමන්ත්‍රණය කළ අයුරු
ක්‍රමක්ෂය අගයට මිනුම් කළ ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 1,445 ක හානිකරණ ප්‍රතිපාදන අඩු කළ විට රු. මිලියන 41,192 ක් ලෙස වාර්තා වන (සටහන 18) සහ 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම්වලින් 67.5% ක් නියෝජනය කරන ණය හා අත්තිකාරම්. 3.ආ සටහනෙහි විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම් කෙරෙන විවැනි මූල්‍ය වත්කම් මත හානිකරණ ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 මූල්‍ය උපකරණ ප්‍රමිතියට අනුකූලව ය (SLFRS 9).	මාගේ වාර්තාවේ දිනට ලබා ගත හැකි වූ උචිතම තොරතුරු මත පදනම්ව, කොවිඩ්-19 වසංගතයේ බලපෑම සහ ඊට අදාළ කර්මාන්තයීය ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් බැංකුවේ හානිකරණ ගණනය කිරීම් සහ ඊට අදාළ ක්‍රමවේදය SLFRS 9 ප්‍රමිතිය වෙත දක්වන අනුගතභාවය මා විසින් තක්සේරු කරන ලදි. මා විසින් අනුගමනය කරන ලද විගණන ක්‍රමවේද අතරට පහත දෑ අන්තර්ගත විය: ■ හානිකරණ අධීක්ෂණ මට්ටම් තක්සේරුවද ඇතුළත්ව ණය හා අත්තිකාරම් සඳහා වූ හානිකරණ තක්සේරුකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හා කළමනාකාරිත්වය විසින් හානිකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා අනුමත කිරීම ආදියට සාපේක්ෂව අදාළ අවස්ථාවලදී පාලනයන්හි සැකැස්ම, ක්‍රියාත්මක වීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව මා විසින් තක්සේරු කරන ලදි. ■ වැදගත් තොරතුරු මුල් ලේඛන හා ගිණුම් වාර්තා සමග තුලනය කිරීම තුළින් ගණනය කිරීම් සඳහා යොදා ගෙන ඇති දත්තවල අංගසම්පූර්ණභාවය සහ නිවැරදිභාවය මා විසින් පරීක්ෂා කරන ලදි.

ප්‍රධාන විගණන කාරණාව	විගණනයේදී එම කාරණාව ආමන්ත්‍රණය කළ අයුරු
පහත හේතූන් මත මෙය ප්‍රධාන විගණන කාරණාවක් ලෙස පෙනී ගොස් ඇත: ■ සංකීර්ණ ගණනය කිරීම් ඇතුළත් වූ ණය හානිකරණය සඳහා වාර්තාගත වූ ප්‍රතිපාදනයෙහි සැලකිය යුතු බව, සහ ■ උපකල්පන, විනිශ්චයන් සහ ඇස්තමේන්තුගත කිරීම්වල තරම නිසැක වශයෙන්ම ගණනය කිරීම් හා බැඳී තිබේ. හානිකරණ ප්‍රතිපාදනය තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වය විසින් යොදා ගෙන ඇති ප්‍රධාන වැදගත් විනිශ්චය ක්ෂේත්‍ර, තක්සේරු කිරීම් සහ උපකල්පන අතරට පහත දෑ ඇතුළත් විය: ■ කොවිඩ්-19 වසංගතය නිසා විල්ල විය හැකි වූ බලපෑම් සහ කර්මාන්තය තුළින් ඒවාට දක්වන ලද ප්‍රතිචාර (උදා - රාජ්‍ය මූල්‍ය උත්තේජන පැකේජ සහ බැංකුව විසින් ලබා දෙන ලද ණය සහන විධිවිධාන). ■ ලබා දෙන ලද කොවිඩ්-19 වසංගතය හා සබැඳි එවැනි උත්තේජන පැකේජ හා සහන විධිවිධාන සහ බලපෑමට ලක් වූ ණය හා අත්තිකාරකම් මත හඳුනා ගත් පොලී ආදායම් ප්‍රමාණය වෙත එමගින් විල්ල වූ බලපෑම හේතුවෙන් ගනුදෙනුකාර ගිවිසුම් සැලකිය යුතු ලෙස වෙනසකට ලක් වී තිබේද හෝ නොමැතිද යන්න තීරණය කිරීම, සහ ■ අනාගතයේදී අපේක්ෂිත මූල්‍යමය අලාභ කෙරෙහි හේතු විය හැකි කොවිඩ්-19 වසංගතය නිසා සිදු වීමට ඉඩ ඇති පුළුල් පරාසයක ආර්ථික බලපෑම් හමුවේ සාර්ව ආර්ථික අවස්ථා සකස් කිරීම හා අන්තර්ග්‍රහණය කර ගැනීමද ඇතුළත් ඉදිරිගාමී සාර්ව ආර්ථික සාධක.	■ පාදක වූ ගණනය කිරීම් පරීක්ෂා කළෙමි. ■ ඉහත කාරණාවලට අමතරව, පහත දැක්වෙන අවධානිත ක්‍රමවේද අනුගමනය කරන ලදි: හානිකරණ සඳහා කේවල වශයෙන් තක්සේරු කරනු ලැබෙන ණය හා අත්තිකාරම් නියැදියක් සඳහා: - හානිකරණ සිදු වීම සම්බන්ධ කවර හෝ භව්‍යතාවක් පවතින්නේද යන්න තීරණය කරනු පිණිස කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබ ඇති නිර්ණායකවල යෝග්‍යතාව තක්සේරු කිරීම, සහ - කොවිඩ්-19 වසංගතය නිසා කර්මාන්ත කෙරෙහි විල්ල විය හැකි බලපෑම, ඒ සඳහා ගනු ලබන උපායමාර්ගික ප්‍රතිචාර ක්‍රියාමාර්ග, ඇප වටිනාකම් සහ අනාගත මුදල් ප්‍රවාහයන්හි වටිනාකම සහ කාලය ආදිය කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරමින් ක්‍රියාත්මක කරන ලද විධිවිධානවල සාධාරණභාවය තක්සේරු කිරීම. හානිකරණ සඳහා සාමූහික වශයෙන් තක්සේරු කරනු ලැබෙන ණය හා අත්තිකාරම් නියැදියක් සඳහා: - ඉදිරිගාමී තොරතුරු හා බලපරතල සිද්ධිද ඇතුළත්ව කළමනාකාරිත්වය විසින් ප්‍රයෝජනයට ගෙන ඇති උපකල්පන හා ඇස්තමේන්තුවල සාධාරණභාවය තක්සේරු කිරීම. - කොවිඩ්-19 නිසා විල්ල වීමට ඉඩ ඇති බලපෑම් සලකා බැලීමේදී සිදු විය හැකි මගහැරීම් තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබෙන පදනම සහ දත්ත අවශ්‍ය පරිදි තක්සේරු කිරීම.

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

ප්‍රධාන විගණන කාරණාව	විගණනයේදී එම කාරණාව ආමන්ත්‍රණය කළ අයුරු
	රජයේ මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ග සහ ලබා දුන් ණය සහන නිසා බලපෑමට ලක් වන ණය හා අත්තිකාරම් සඳහා: - තීන්දුවල උචිතභාවය, ගනුදෙනුකාර ගිවිසුම් සැලකිය යුතු ලෙස වෙනසට ලක්ව තිබේද නැද්ද යන්න සහ එහි ප්‍රතිඵලයක් ලෙස උද්ගත වනු ඇති ගිණුම්කරණ ගම්‍යතා නිර්ණය කිරීම උදෙසා යොදා ගෙන ඇති ගණනය කිරීම් හා දත්තවල සාධාරණභාවය යනාදිය තක්සේරු කිරීම, සහ - එකී බලපෑමට ලක් වූ ණය හා අත්තිකාරම් මත හඳුනා ගෙන ඇති පොලී ආදායමේ සාධාරණභාවය තක්සේරු කිරීම. ■ 3.ආ, 3.ඇ. vi, 8 සහ 18 සටහන්වලින් දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනවලට අදාළ හෙළිදරවු කිරීම්වල ප්‍රමාණවත්භාවය මා විසින් තක්සේරු කරන ලදි.

1.4 බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් වෙනත් තොරතුරු

බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත තොරතුරු වෙනත් තොරතුරු යටතට ඇතුළත් වන නමුදු මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණකගේ වාර්තාවෙහි දිනයට පසුව මා වෙත ලබා දෙනු ඇතැයි අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මාගේ විගණන වාර්තාව ඊට ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතිකකරණයක් මම සිදු නොකරමි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ විගණනයට අදාළව මා සතු වගකීම වන්නේ ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු ලබා ගත හැකි විට ඒවා කියවීම සහ එසේ කිරීමේදී මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේදී මා විසින් ලබා ගන්නා ලද දැනුම සමග එකී වෙනත් තොරතුරු පරස්පර වන්නේද, එසේත් නොමැති නම් සැලකිය යුතු තරමේ සාවද්‍ය ප්‍රකාශනයකට ලක්ව තිබේද යන්න සලකා බැලීම වේ.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි සැලකිය යුතු මට්ටමේ සාවද්‍ය ප්‍රකාශනයන් පවතින බව මා විසින් නිගමනය කරනු ලැබෙන්නේ නම් ඒ බව නිවැරදි කිරීම සඳහා පාලන වගකීම් පැවරී ඇති පුද්ගලයන් වෙත සන්නිවේදනය කිරීමට මා කටයුතු කළ යුතු වේ. නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශන තවදුරටත් එහි පවතින්නේ නම් එකී කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබෙන මාගේ වාර්තාවට ඇතුළත් කෙරෙනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ පාලන කරන පාර්ශව සතු වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සාංගමික අඛණ්ඩතාව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර, බැංකුවේ මෙහෙයුම් ඈවර කිරීමට කළමනාකාරිත්වය අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් හෝ හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු හෙළිදරවු කිරීමද කළමනාකාරිත්වයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණය අවේක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශ්ව විසින් දරනු ලැබේ.

2018 අංක 19 දරන ජාතික විගණන 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් හෙළිදරවු කෙරෙන බවට සහතික කිරීමක් නොවනු ඇත. කේවල හා සාමූහික ලෙස වංචා සහ වැරදි බලපෑම හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශන සිදු විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් සිදු වන්නා වූ බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේචනාන්විත මගහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුදු, අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණභාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවු කිරීම්වල යෝග්‍යතාව අගයන ලදි.
- සිද්ධි හෝ තත්ත්ව හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළතාව තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා විසින් නිගමනය කරනු ලබන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරවු කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවු කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වෙතත්, අනාගත සිද්ධි හෝ තත්ත්ව මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.
- හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තගර්තය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ සිද්ධි උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ද යන්න ඇගයීමට ලක් කරන ලදි.

මාගේ විගණන කෘත්‍යය තුළදී හඳුනා ගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කාරණා පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්ව දැනුම්වත් කරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුළත් වේ:

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට බැංකුව විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වා ගනු ලැබ ඇත.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශ මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්ව තිබේ.

2.2 අනුගමනය කළ ක්‍රියාමාර්ග හා ලබා ගත් සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත ප්‍රකාශ සිදු කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය:

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාව අනුව, බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුවට අදාළ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාව අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාව අනුව, බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාව අනුව, බැංකුවේ සම්පත් සකසුරුවම්දායී ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කොට භාවිත කර නොමැති බව.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති ජනරාල්

ආදායම් ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා (සංඛ්‍යාවන් රු. වලිනි)

විස්තරය	සටහන්	බැංකුව	
		2020	2019
ආදායම	1	7,856,433,563	8,090,464,850
පොලී ආදායම	2	7,456,679,454	7,683,161,881
පොලී වියදම්	3	(4,475,280,757)	(4,783,234,818)
ශුද්ධ පොලී ආදායම	4	2,981,398,697	2,899,927,063
ගාස්තු හා කොමිස් ආදායම	5	303,220,609	358,302,968
ගාස්තු හා කොමිස් වියදම		-	-
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම		303,220,609	358,302,968
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	6	(475,000)	500,000
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	7	97,008,500	48,500,000
මුළු මෙහෙයුම් ආදායම		3,381,152,806	3,307,230,031
අඩු කළා: හානිකරණ ගාස්තු/(ප්‍රතිවර්තන)	8	326,526,071	322,893,049
ශුද්ධ මෙහෙයුම් ආදායම		3,054,626,735	2,984,336,982
අඩු කළා: වියදම්			
කාර්ය මණ්ඩල පිරිවැය	9	1,174,051,364	1,164,468,698
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	10	156,638,262	163,763,041
වෙනත් වියදම්	11	342,815,612	411,624,661
මුළු වියදම්		1,673,505,239	1,739,856,401
වැට් බදු, ජා.ගො.නැ. බදු හා ණය ආපසු ගෙවීමේ බදුවලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)		1,381,121,497	1,244,480,582
අඩු කළා: මූල්‍ය සේවා මත වැට් බදු, ජා.ගො.නැ. බදු හා ණය ආපසු ගෙවීමේ බදු	12	312,685,504	469,972,694
වැට් බදු, ජා.ගො.නැ. බදු හා ණය ආපසු ගෙවීමේ බදුවලට පසු මෙහෙයුම් ලාභ/(අලාභ)		1,068,435,993	774,507,887
ආශ්‍රිත හා හවුල් ව්‍යාපාරවල ලාභ කොටස		-	-
බදුවලට පෙර ලාභ/(අලාභ)		1,068,435,993	774,507,887
අඩු කළා: බදු වියදම්	13	360,299,190	298,795,445
වසර සඳහා ලාභ/(අලාභ)		708,136,803	475,712,442
ලාභ මත කොටසකට ඉපැයීම්			
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම්	14	10.94	7.35
සාමාන්‍ය කොටසකට තනුක ඉපැයීම්	14	10.94	7.35

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා (සංඛ්‍යාවන් රු. වලිනි)

විස්තරය	සටහන්	විස්තරය	
		2020	2019
වසර සඳහා ලාභය		708,136,803	475,712,442
ආදායම් ප්‍රකාශනය වෙත නැවත වර්ගීකරණය කෙරෙනු ඇති අයිතම			
විදේශ මෙහෙයුම් පරිවර්තනය මත විනිමය වෙනස්කම්		-	-
මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් මත ශුද්ධ ලාභ/(අලාභ)		-	-
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)		-	-
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය උපකරණ		-	-
වෙනත් (දක්වන්න)		-	-
අඩු කළා: ආදායම් ප්‍රකාශනය වෙත නැවත වර්ගීකරණය කෙරෙනු ඇති අයිතමවලට අදාළ බදු වියදම්		-	-
එකතුව		-	-
ආදායම් ප්‍රකාශනය වෙත නැවත වර්ගීකරණය නොකෙරෙන අයිතම			
ස්කන්ධයෙහි ආයෝජන මත සාධාරණ අගයේ වෙනස් වීම්		-	-
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය උපකරණ		-	-
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම වෙනස් වීමට අදාළ සාධාරණ අගයේ වෙනස් වීම්		-	-
සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ බැඳීම් නැවත මිනුම්ගත කිරීම	30.1	(62,813,625)	(20,118,822)
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස් වීම්		-	-
ආශ්‍රිත හා හවුල් ව්‍යාපාරවල ලාභ කොටස		-	-
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් නැවත මිනුම්ගත කිරීම මත ලාභ හෝ අලාභ		-	-
වෙනත් (දක්වන්න)		-	-
අඩු කළා: ආදායම් ප්‍රකාශනය වෙත නැවත වර්ගීකරණය නොකෙරෙන අයිතමවලට අදාළ බදු වියදම්	24	17,581,815	5,633,270
එකතුව	24	(45,231,810)	(14,485,552)
වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු)		(45,231,810)	(14,485,552)
වසර සඳහා වෙනත් මුළු ආදායම්		662,904,993	461,226,890
බෙදා දෙනවා			
කොටස් හිමියන්		662,904,993	461,226,890
පාලනයට යටත් නොවන හිමිකම්		-	-
එකතුව		662,904,993	461,226,890

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 දිනට (සංඛ්‍යාවන් රු. වලිනි)

විස්තරය	සටහන්	බැංකුව	
		2020	2019
වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	15	305,889,183	421,218,289
බැංකුවල ඇති තැන්පතු	16	9,859,832,746	7,539,925,299
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වත්කම්			
- සාධාරණ අගයට කල් පිරෙන	17	-	19,250,000
ක්‍රමක්ෂීත පිරිවැයට මූල්‍ය වත්කම්			
- ණය හා අත්තිකාරම්	18	41,191,989,221	41,215,592,671
- ණය හා වෙනත් උපකරණ	19	7,546,155,115	4,880,392,998
දේපල, පිරියත සහ උපකරණ	20	223,329,120	227,519,410
අස්පෘශ්‍ය වත්කම්	21	127,569,519	152,780,789
කල්බදු වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්	22	369,641,853	351,112,109
ආයෝජන දේපල	23	1,016,500,000	920,000,000
විලම්බිත බදු වත්කම්	24	205,078,464	112,649,070
වෙනත් වත්කම්	25	183,800,368	114,205,713
මුළු වත්කම්		61,029,785,590	55,954,646,348
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	26	2,408,780,533	953,384,855
ක්‍රමක්ෂීත පිරිවැයට මූල්‍ය වගකීම්			
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	27	47,947,005,442	42,504,294,457
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	27	1,429,155,847	1,603,783,508
නිකුත් කළ ණය සුරැකුම්පත්	28	1,422,976,094	4,042,358,842
කල්බදු වගකීම්	29	349,436,509	310,149,189
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	30	777,800,209	635,835,310
ප්‍රවර්තන බදු බැරකම්	31	441,773,065	333,629,689
වෙනත් බැරකම්	32	189,595,136	185,394,569
මුළු වගකීම්		54,966,522,835	50,568,830,420
ණය ප්‍රාග්ධනය			
නිත්‍ය බැඳුම්කර	33	281,250,000	266,708,172
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	34	962,092,936	962,092,936
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	35	245,008,482	209,601,642
රඳවාගත් ඉපැයීම්	36	4,281,474,432	3,679,558,147
වෙනත් සංචිත	37	293,436,903	267,855,033
කොටස් හිමියන්ගේ මුළු හිමිකම්		5,782,012,753	5,119,107,758
පාලනයට යටත් නොවන හිමිකම්		-	-
මුළු ස්කන්ධය		5,782,012,753	5,119,107,758
මුළු ස්කන්ධය සහ වගකීම්		61,029,785,590	55,954,646,348
කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම රු.		89.35	79.11
අසම්භාව්‍ය බැරකම් හා බැඳීම්	38	380,011,076	432,241,260
ගිවිසුම් තොරතුරු			
සේවක සංඛ්‍යාව		633	558
ශාඛා සංඛ්‍යාව		39	39

157 සිට 202 දක්වා පිටුවල දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) වලට අනුකූලව පිළියෙළ කර තිබේ.



එච්. ඒ. අනුර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී



පාලිත ගමගේ මහතා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලද මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.



ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය
සභාපතිනි



ඩබ්ලිව්. ඊ. එස්. සිල්වා මහතා
අධ්‍යක්ෂ

දිනය: 2021/04/08 දින කොළඹ දී ය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා (සංඛ්‍යාවන් රු. වලිනි)

විස්තරය	සටහන්	බැංකුව	
		2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
පොලී ලැබීම්	02,16,18,19	6,853,438,756	7,104,296,774
පොලී ගෙවීම්	03,26,27,28	(4,611,304,430)	(4,202,627,702)
ශුද්ධ කොමිස් ලැබීම්	05	220,895,586	222,437,514
වෙළෙඳාම් ආදායම		-	-
සේවකයන්ට ගෙවීම්	09,30	(1,031,508,502)	(1,061,302,484)
මූල්‍ය සේවාවන්ට අදාළ විකතු කළ අගය මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද	12,31	(312,108,857)	(496,325,295)
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබීම්	05	86,345,914	189,119,434
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ගෙවීම්	11,32	(421,834,965)	(486,837,714)
මෙහෙයුම් වත්කම්වල වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		783,923,502	1,268,760,527
මෙහෙයුම් වත්කම්වල (ඉහළ)/පහළ යාම:			
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂයන්		-	-
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	18	512,157,498	(3,014,868,675)
වෙනත් වත්කම්	25	(75,296,503)	(205,930,984)
		436,860,995	(3,220,799,659)
මෙහෙයුම් වගකීම්වල ඉහළ/(පහළ) යාම			
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	27	5,601,520,370	4,931,556,554
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම් - ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු	28	(2,590,621,542)	-
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	26	1,283,050,246	249,901,382
වෙනත් බැරකම්	32	(3,512,767)	(34,997,315)
		4,290,436,307	5,146,460,622
ආදායම් බදුවලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		5,511,220,803	3,194,421,490
ගෙවන ලද ආදායම් බදු	13,31	(334,650,981)	(38,272,244)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		5,176,569,822	3,156,149,246
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත සහ උපකරණ/අස්පෘශ්‍ය වත්කම් මිල දී ගැනීම්	20,21	(54,992,378)	(68,100,964)
දේපල, පිරියත සහ උපකරණ/අස්පෘශ්‍ය වත්කම් විකිණීමෙන් ඉදිරියට ගෙන ආ ශේෂය	20,21	368,500	701,513
ආයෝජන වෙතින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	16,17,19	(5,237,595,050)	(3,128,239,211)
ආයෝජන වෙතින් ලද ලාභාංශ	05	320,000	240,800
වෙනත්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්		(5,291,898,928)	(3,195,397,862)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ඉදිරියට ගෙන ආ ශුද්ධ මුදල්		-	-
වෙනත් ස්කන්ධය උපකරණ නිකුත් කිරීමෙන් ඉදිරියට ගෙන ආ ශුද්ධ මුදල්		-	-
යටත් කරන ලද ණය නිකුත් කිරීමෙන් ඉදිරියට ගෙන ආ ශුද්ධ මුදල්	33	-	250,000,000
යටත් කරන ලද ණය ආපසු ගෙවීම්		-	-
යටත් කරන ලද ණය මත ගෙවූ පොලී		-	-
පාලනයට යටත් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම්		-	-
මවු සමාගමේ කොටස් හිමියන් වෙත ලාභාංශ ගෙවීම්		-	-
වෙනත් ස්කන්ධ උපකරණ හිමියන්ට ලාභාංශ ගෙවීම්		-	-
වෙනත්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්		-	250,000,000
මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ ඉහළ/(පහළ) යාම		(115,329,106)	210,751,384
කාල සීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		421,218,289	210,466,904
කාල සීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		305,889,183	421,218,289
මුදල් හා මුදල් සමාන දෑ සැසඳුම්			
අතැති මුදල්		155,040,702	150,212,979
බැංකුවල පවතින ශේෂයන්		150,848,481	271,005,310
		305,889,183	421,218,289

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

(සංඛ්‍යාවන් රු. වලිනි) බැංකුව

විස්තරය	සටහන්	ඡන්ද හිමි සංඛ්‍යාව කොටස්	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	ධඤ සංචිතය	රඳවාගත් ඉපැයීම්	වෙනත් සංචිත	එකතුව	පාලනයට යටත් නොවන හිමිකම්	මුළු ස්කන්ධය
2019-01-01 දිනට ශේෂය		64,710,520	962,093	185,816	(45,597)	3,275,203	298,034	4,675,548		4,675,548
පෙර වසරේ ගැලපීම්	34-37	-	-	-	(17,667)	-	-	(17,667)	-	(17,667)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්		-	-	-	-	-	-	-	-	-
වසර සඳහා ලාභ/(අලාභ)	36	-	-	-	-	475,712	-	475,712		475,712
වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු)	30	-	-	-	(14,486)	-	-	(14,486)	-	(14,486)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්					(14,486)	475,712		461,227		461,227
ස්කන්ධය තුළ සෘජුවම හඳුනා ගත් ස්කන්ධ හිමියන් සමඟ ගනුදෙනු		-	-	-	-	-	-	-	-	-
ප්‍රසාද නිකුතුව		-	-	-	-	-	-	-	-	-
හිමිකම් නිකුතුව		-	-	-	-	-	-	-	-	-
ආයෝජන අරමුදල් මාරු කිරීම් කාල සීමාව තුළ සංචිත වෙත මාරු කිරීම්		-	-	-	-	-	-	-	-	-
		-	-	-	-	-	-		-	-
ලාභාංශ ගෙවීම්	34-37	-	-	23,786	-	(71,357)	47,571	-	-	-
ප්‍රධාන කාර්යාලය වෙත මාරු කළ දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මත ලාභය (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්)		-	-	-	-	-	-	-	-	-
ලාභාංශ ගෙවීම්		-	-	-	-	-	-	-	-	-
ප්‍රධාන කාර්යාලය වෙත මාරු කළ දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මත ලාභය (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්)		-	-	-	-	-	-	-	-	-
වෙනත්		-	-	-	-	-	-	-	-	-
ස්කන්ධ හිමියන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු		-	-	23,786	-	(71,357)	47,571	-	-	-
2019-12-31 දිනට ශේෂය		64,710,520	962,093	209,602	(77,750)	3,679,558	345,605	5,119,108		5,119,108

විස්තරය	සටහන්	ඡන්ද හිමි සංඛ්‍යාව කොටස්	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	ධඤ සංචිතය	රඳවාගත් ඉපැයීම්	වෙනත් සංචිත	එකතුව	පාලනයට යටත් නොවන හිමිකම්	මුළු ස්කන්ධය
2020-01-01 දිනට ශේෂය	34-37	64,710,520	962,093	209,602	(77,750)	3,679,558	345,605	5,119,108	-	5,119,108
පෙර වසරේ ගැලපීම්		-	-	-	-	-	-	-	-	-
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්		-	-	-	-	-	-	-	-	-
වසර සඳහා ලාභ/(අලාභ)	36	-	-	-	-	708,137	-	708,137	-	708,137
වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු)	30	-	-	-	(45,232)	-	-	(45,232)	-	(45,232)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්		-			(45,232)	708,137		662,905		662,905
ස්කන්ධය තුළ සෘජුවම හඳුනා ගත් ස්කන්ධ හිමියන් සමඟ ගනුදෙනු		-	-	-	-	-	-	-	-	-
කොටස් නිකුතුව/පවරන ලද ප්‍රාග්ධනයේ ඉහළ යාම		-	-	-	-	-	-	-	-	-
ප්‍රසාද නිකුතුව		-	-	-	-	-	-	-	-	-
හිමිකම් නිකුතුව		-	-	-	-	-	-	-	-	-
කාල සීමාව තුළ සංචිත වෙත මාරු කිරීම	34-37	-	-	35,407	-	(106,221)	70,814	-	-	-
ලාභාංශ ගෙවීම්		-	-	-	-	-	-	-	-	-
ප්‍රධාන කාර්යාලය වෙත මාරු කළ ලාභය		-	-	-	-	-	-	-	-	-
දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මත ලාභය		-	-	-	-	-	-	-		
වෙනත්		-	-	-	-			-	-	-
ස්කන්ධ හිමියන් සමඟ මුළු ගනුදෙනු		-	-	35,407	(45,232)	(106,221)	70,814			
2020-12-31 දිනට ශේෂය		64,710,520	962,093	245,008	(122,982)	4,281,474	416,418	5,782,013	-	5,782,013

විගණන ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

වාර්තාකරණ ඒකකය

ශ්‍රී ලංකා එච්ඩිඑෆ්සී බැංකුව 1956 ජාතික නිවාස පනතේ 11 වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සමාජයක් වශයෙන් පිහිටුවන ලදි.

ඉනික්බිති එය 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත යටතේ සංස්ථාපිත කරන ලද අතර, ඉන් අනතුරුව, 1988 අංක 30 දරන බැංකු පනතේ සඩ වන උපලේඛනයේ සහ ඊට සිදු කරන ලද සංශෝධනවල දැක්වෙන සියලුම ක්‍රියාකාරකම්වල නිරත වීමට බැංකුවට බලය පවරන 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (සංශෝධිත) හා 2011 අංක 45 දරන සංශෝධන පනත ප්‍රකාරව එය වෙත ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය ලබා ගන්නා ලදි.

එච්ඩිඑෆ්සී බැංකුවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ කොළඹ 02, ජාතික නිවාස සංවර්ධන අධිකාරී ලේකම් කාර්යාලය යන ස්ථානයෙහි පිහිටා තිබේ.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1) අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනාදිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති අතර එහිදී හැකි සෑම අවස්ථාවකදීම වෛතිහාසික පිරිවැය පදනම සහ සාධාරණ අගයට මිනුම්කරණය කිරීමේ ගිණුම්කරණ ක්‍රමවේදය නිරතුරුව යොදා ගෙන ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි.

විශේෂිත ව්‍යාපාර සියල්ලම සඳහා අනිවාර්ය කර ඇති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී උපයෝගී කරගන්නා ලදි.

ඒ අනුව ඉහත ප්‍රමිතීන් ප්‍රකාරව සංසන්දනාත්මක සංඛ්‍යාවන්ද නැවත සඳහන් කර වාර්තා කරන ලදි.

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අදාළ රීති සඳහා අවශ්‍ය වන සුදුසු හෙළිදරවු කිරීම්ද මෙකී මූල්‍ය ප්‍රකාශන මඟින් සැපයේ.

2.ආ). ව්‍යවහාරික හා පිළියෙළ කිරීමේ මුදල් ඒකකය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි මෙහෙයුම් පවත්වා ගනු ලැබෙන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 - ''මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම'' මඟින් ලබා දී ඇති අවසර ප්‍රකාරව වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර ආසන්නතම රුපියලට වටයා ඇත.

2.ඇ). මූල්‍ය වාර්තාකරණය පිළිබඳ වගකීම

1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන හා ඊට සිදු කර ඇති සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

''මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම'' පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි සහ 'මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි'' පැහැදිලි කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය තමන් සතු වගකීම පිළිගනියි.

2.ඈ). ගිණුම් ආකෘතිය සහ ඉකුත් වූ වසරේ සංඛ්‍යා

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කර ඇති ගිණුම්කරණ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කර ඇති අතර, එහිදී බැංකුව විසින් යොදා ගනු ලැබ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 - ''මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම'' ප්‍රකාරව ගත වූ වසරේදී යොදා ගන්නා ලද ප්‍රමිතිවලට අනුරූප වේ.

2.ඉ). මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ වත්කම් හා බැරකම් ඒවායෙහි ස්වභාවය අනුව කාණ්ඩගත කොට ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවේ හා කල් පිරීමේ රටාවේ අනුපිළිවෙළට දක්වා තිබේ. බැංකුවේ වත්කම් හා වගකීම් (බැරකම්) වලට අදාළ කල්පිරීමේ රටා පිළිබඳ විශ්ලේෂණයක් 'කල්පිරීමේ පරතර විශ්ලේෂණ වාර්තාවෙහි' ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වත්කම් හා වගකීම් හිලවු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන්නේ, හඳුනා ගත් වටිනාකම් හිලවු කිරීම සඳහා ප්‍රවර්තන ලෙස බලගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේ නම් පමණක්ම වන අතර, ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කර ගැනීමට හා සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායයක් ඇත්තේ නම් පමණි.

කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථකථනයක් මඟින් අවශ්‍ය වන්නේ නම් හෝ අවසර ලබා දෙන්නේ නම් මිස, බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් හෙළිදරවු කර ඇති පරිදි ආදායම හා වියදම්, ආදායම් ප්‍රකාශනයෙහි හිලවු නොකරනු ලැබේ.

විගණන ප්‍රතිපත්ති

2.ඊ). ප්‍රමාණාත්මකතාවය සහ ඒකරාශි වීම

සමාන අයිතමවල ඒ ඒ ප්‍රමාණාත්මක කාණ්ඩය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. ස්වභාවය හෝ කාර්යය අතින් එක සමාන නොවන අයිතම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 01 'මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම' මගින් ප්‍රමාණාත්මක නොවන ලෙස අවසර දී ඇත්නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.උ). තුලනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සිදු කිරීම සහ පවතින වසරේ ඉදිරිපත් කිරීමට වඩා හොඳින් අනුකූල වනු පිණිස තුලනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කෙරේ.

3. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, තක්සේරු කිරීම් සහ උපකල්පන

3.අ). අඛණ්ඩතා පදනම

කළමනාකාරිත්වය විසින් තමන්ට අඛණ්ඩතා පදනමක් මත පැවතීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමක් සිදු කරන ලද අතර පුරෝකථනය කළ හැකි අනාගතය සඳහා ව්‍යාපාරය පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතු බවට සෑහීමකට පත් වේ. එපමණක්ද නොව, අඛණ්ඩ පදනමක් මත පැවතීමට බැංකුවට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සංශයන් මතු කරන කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා කිසිවක් කළමනාකාරිත්වයේ අවධානයට හසුව නොමැත.

මේ නිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පදනම මත පිහිටා පිළියෙළ කිරීම සිදු කෙරෙනු ඇත.

3.ආ). වත්කම් ඇගයීම

3.ආ.i). ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්

ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම්, අනාගතයේ සිදු විය හැකි ණය අලාභ සඳහා හානිකරණ අඩු කොට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇත.

හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන

මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ

ජීව කාල අපේක්ෂිත බැරකම් අලාභ සහ ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය අලාභ යන ක්‍රම දෙකම යොදා ගනිමින් සමාගම අලාභ ප්‍රතිපාදන මිනුම්කරණය කරයි. අපේක්ෂිත ණය අලාභය තක්සේරු කිරීමේදී සමාගම, කිසියම් මූල්‍ය වත්කමක ණය අවදානම වැහි මූලික හඳුනා ගැනීමේ සිට සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිද යන්න හඳුනා ගනියි.

මේ සඳහා, අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමෙන් තොරව ලබා ගත හැකිව පවතින හා අදාළ වන සාධාරණ සහ සහාය ලබා ගත හැකි තොරතුරු සමාගම විසින් සලකා බලනු ලැබේ. බැංකුවේ වෛතිහාසික අත්දැකීම්, සබුද්ධික ණය ඇගයීම් සහ ඉදිරිගාමී තොරතුරු පාදක කරගත් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක තොරතුරු හා විශ්ලේෂණ මීට ඇතුළත් වේ.

සිදු විය හැකි හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන

සිදු විය හැකි හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන, ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් සියල්ලම සම්බන්ධයෙන් 'මූල්‍ය උපකරණ: බැංකුවල මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීම සහ මිනුම්කරණය කිරීම' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09 ට අනුකූලව සිදු කෙරෙන අඛණ්ඩ සමාලෝචනයක් මත පදනම්ව වෙන් කරනු ලැබේ.

ණයවල සාධාරණ අගය ගණනය කරනු පිණිස පහත දැක්වෙන ඇගයීම් ක්‍රමවේද යොදා ගන්නා ලදි:

1. සාමූහික හානිකරණ ක්‍රමවේදය
2. කේවල හානිකරණ ක්‍රමවේදය

සාමූහික හානිකරණ ප්‍රතිපාදන

සිදු විය හැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ 'මූල්‍ය උපකරණ: බැංකුවල මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීම සහ මිනුම්කරණය' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09 ට අනුකූලව ය. කේවල හානිකරණ සැලකිය යුතු මට්ටමක නොපවතින විට පිරිවටන අනුපාතික ක්‍රමවේදය යොදා ගෙන සාමූහික හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීමට බැංකුව හුරුව සිටී අතර කර්මාන්තයේ විචල්‍යයන් සැලකිල්ලට ගනිමින් ණය වාර්ක ගෙවීම් හිඟවීම ආශ්‍රිත අලාභ ගලපන ලදි.

කේවල හානිකරණ ප්‍රතිපාදන

විකිණීම සඳහා අත්පත් කර ගන්නා ලද දේපල

සැලකිය යුතු කාල සීමාවක් සඳහා ගනුදෙනුකරුවන් තම ගෙවීම් වගකීම් පැහැර හරින්නේ නම් විවිධිවග්සී බැංකුව වෙත උකස් කර ඇති දේපල වෙන්දේසි කරනු ලබන අතර, විවැනි වෙන්දේසිවලදී බැහැර නොකෙරෙන දේපල, ණය හා අත්තිකාරම් යටතේ දක්වා ඇති අත්පත් කර ගන්නා ලද දේපල ලෙස පිළිගනු ලැබේ.

සාධාරණ තහවුරුවක් සහිතව මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීමද සමගින් එකී දේපල තක්සේරු කිරීම කේවල පදනමක් මත සිදු කෙරේ.

රු. මිලියන 10 ට වැඩි ණය සහ මාස 36 ක හිඟ වාර්ක සහිත ඇපකාර ණය

මාස 36 කට අධික කාලයක් සඳහා හිඟ වාර්ක පවතින සියලුම ඇපකාර ණය ඇතුළත්ව උකස්, මුදල් හා සේවක අර්ථසාධක අරමුදල් ණය සහ අනාගතයේ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සාධාරණ තහවුරුවක් පවතින රු. මිලියන 10 කට වැඩි වටිනාකමක් සහිත ණය හැර වෙනත් ණය සඳහා කේවල හානිකරණ ප්‍රතිපාදන වෙන් කරන ලදි.

3.ආ.ii). දේපල, පිරියත සහ උපකරණ

වත්කමෙහි පිරිවැය වෙත, සප්‍රයෝජනාත්මක තත්ත්වයක් කරා එය ගෙන ඒම සඳහා අවශ්‍ය අනෙකුත් වියදම් එකතු කොට මැනීමෙන් මේවා ආරම්භයේදී වාර්තාගත කරනු ලැබෙන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව පිළියෙළ කර ඇති, මාස 3 ක කාලයක් නොඉක්මවන, නවතම තක්සේරු වාර්තාව යොදා ගනිමින් සාධාරණ අගයයෙහි විස්තර වෙනම හෙළිදරවු කරනු ලැබේ.

හඳුනා ගැනීමේ පදනම

කිසියම් වත්කමක් හා බැඳී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව තුළට ගලා ඒමේ භව්‍යතාවක් පවතින බව පෙනී යයි නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මිනිය හැකි නම් දේපල, පිරියත සහ උපකරණ මූල්‍ය ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

මිනුම්කරණ පදනම

පිරිවැයෙන් පහත දක්වා ඇති පදනම මත ලබා දී ඇති සමුච්චිත ක්ෂය වීම් අඩු කර මිනුම්කරණය කොට දේපල, පිරියත සහ උපකරණ දක්වනු ලැබේ.

ක්ෂය වීම් ප්‍රතිපත්තිය

විවිධ වර්ගවල වත්කම්වලට අදාළ තක්සේරුගත ආයුකාලයන්ට සාපේක්ෂව සරල රේඛීය පදනමක් මත පහත අනුපාතික යටතේ ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

වත්කම් වර්ගය	වාර්ෂික %
ගොඩනැගිලි	6 2/3
කාර්යාල උපකරණ	12.50
ලී බඩු හා සවිකුරු	10.00
වාහන සහ යතුරු පැදි	20.00
පිරියත සහ යන්ත්‍රෝපකරණ	25.00
ආම්පන්න සහ උපකරණ	12.50

වර්ෂය තුළ භාවිත කළ වත්කම් සඳහා මුළු වාර්ෂික ක්ෂය වීම් දක්වා ඇති අතර අපහරණ වර්ෂය සඳහා කිසිදු ක්ෂය වීමක් ඉදිරිපත් කොට නොමැත. විවිධ වර්ගවල වත්කම් භාවිතය ආරම්භ කළ දින සිට ක්ෂය වීම ගණනය කිරීමේදී උද්ගත වන ප්‍රායෝගික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 55 වගන්තියෙන් බැහැර වී තිබේ.

3.ආ.iii). අස්පෘශ්‍ය වත්කම්

මිල දී ගන්නා ලද පරිගණ මෘදුකාංගවල වටිනාකම බැංකුවේ අස්පෘශ්‍ය වත්කම්වලට ඇතුළත් වේ.

හඳුනා ගැනීමේ පදනම

කිසියම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබෙන්නේ එහි පිරිවැය විශ්වසනීය ලෙස මිනිය හැකි විට සහ එය නිසා සැලසෙනු ඇතැයි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව තුළට ගලා ඒමේ භව්‍යතාවක් පවතින විට පමණි.

මිනුම්කරණ පදනම

වෙන වෙනම අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්, ඒවායෙහි මූලික හඳුනා ගැනීම මත පිරිවැයට මිනුම්කරණය කෙරේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂය වීමක් සහ ඕනෑම හානිකරණ අලාභයක් පිරිවැයෙන් අඩු කොට ලැබෙන වටිනාකම අනුව අස්පෘශ්‍ය වත්කම් දක්වනු ලැබේ.

ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය සහ ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාල, සීමිත හෝ අසීමිත ලෙස අගයනු ලැබේ. සීමිත ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාල සමග සංසන්දනාත්මකව ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රයෝජනවත් සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය කාල සීමාව සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය යටත් පිරිසෙයින් සෑම මූල්‍ය වර්ෂයක්ම අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය හෝ එය තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව ආශ්‍රිත වෙනස් වීම්, ක්‍රමක්ෂිත කාල සීමාව හෝ ක්‍රමවේදය සුදුසු පරිදි වෙනස් කිරීම තුළින් දක්වනු ලැබෙන අතර ඒවා ගිණුම්කරණ තක්සේරු කිරීම්වල වෙනස් වීම් ලෙස සලකනු ලැබේ.

සීමිත ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම් මත අදාළ වන ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශනයෙහි වියදම් කාණ්ඩය තුළ, අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි කෘත්‍යයට සංගත වන පරිදි හඳුනා ගැනේ.

හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

අස්පෘශ්‍ය වත්කම්, බැහැර කෙරෙන විට හෝ එහි භාවිතයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අත් වනු ඇතැයි අපේක්ෂා නොකෙරෙන විට හෝ හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ. වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම නිසා සිදු විය හැකි කවර හෝ ලාභයක් හෝ අලාභයක් (ඉවත් කිරීමෙන් ලද මුදල හා වත්කමේ ඉදිරියට ගෙන ආ ශේෂය අතර වෙනස ලෙස ගණනය කෙරේ) එකී හඳුනා ගැනීම ඉවත් කරන ලද වසරේ මූල්‍ය ප්‍රකාශනයෙහි 'වෙනත් මෙහෙයුම් වියදම්' කොටසේ හඳුනා ගනු ලැබේ.

අසීමිත ප්‍රයෝජනවත් ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම් කිසිවක් බැංකුව සතු නොවේ.

වත්කම් වර්ගය	වාර්ෂික %
පරිගණක මෘදුකාංග - විදේශීය	25.00
පරිගණක මෘදුකාංග - දේශීය	25.00
ප්‍රධාන යෙදුම් මෘදුකාංග	10.00

3.ආ.සඩ). ආයෝජන දේපල

ආයෝජන දේපල, පවතින වෙළෙඳපොල වටිනාකම සහ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ ඉදිරිපත් කර ඇති ඉදිරියට ගෙන ආ වටිනාකම හා වෙළෙඳපොල වටිනාකම අතර වෙනස අනුව හඳුනා ගෙන මූල්‍ය තත්ත්වය යටතේ කාණ්ඩගත කරනු ලැබේ.

විගණන ප්‍රතිපත්ති

3. අ). මූල්‍ය වත්කම්

3.අ.ඍ) පිළිගැනීම සහ මිනුම්කරණය

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය අනුව හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මිනුම් නොකෙරෙන මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය සහ ඊට ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනා ගැනේ.

ණය හා අත්තිකාරම්, ඒවා උත්පාදනය වූ දිනට සාධාරණ අගය ඔස්සේ මූලිකව හඳුනා ගැනෙන අතර බොහෝ අවස්ථාවලදී මෙය ලබා දුන් ණය වටිනාකම වන අතර ඉන් අනතුරුව සිදු කෙරෙන මිනුම්කරණය කිරීම් ක්‍රමක්ෂීත පිරිවැය ඔස්සේ සිදු කෙරේ.

කිසියම් මූල්‍ය වත්කමක ක්‍රමක්ෂීත පිරිවැය යනු, ප්‍රධාන ආපසු ගෙවීම් අඩු කළ මුළු මුදල් ප්‍රමාණය අතර යම් වෙනසකට සවිල පොලී අනුපාතික ක්‍රමය භාවිත කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කළ හෝ අඩු කළ හා අක්‍රියවීම හෝ ලබා ගත නොහැකි වීම හේතුවෙන් හානිකරණ සඳහා යම් අඩු කිරීමක් වෙන් නම් එය අඩු කළ මූල්‍ය වත්කමක් මුල් හඳුනා ගැනීමේදී මිනිනු ලබන ප්‍රමාණය වේ.

අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනට, එනම්, බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම් විධිවිධානවලට පාර්ශ්වයක් වන දිනයේදී, හඳුනා ගැනේ.

3.අ.ii) වර්ගීකරණය

මූලික හඳුනා ගැනීමේදි බැංකුව සිය මූල්‍ය වත්කම් පහත කාණ්ඩවලට වර්ගීකරණය කරයි:

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව

මූල්‍ය වත්කම් ඉන් අනතුරුව මිනුම්කරණය කිරීම ඒවායෙහි වර්ගීකරණයන් මත පදනම් වේ.

ක්‍රමක්ෂීත පිරිවැයට මිනිනු ලබන මූල්‍ය වත්කම්

කිසියම් මූල්‍ය වත්කමක් මගින් පහත කොන්දේසි දෙකම සන්තෘප්ත කෙරේ නම් සහ එය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව හඳුනා ගෙන නොමැති වත්කමක් නම්, ක්‍රමක්ෂය පිරිවැය මත මිනුම් කෙරේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කර ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම රඳවා සිටීම (5.3.2.3 සටහනෙහි විස්තර කර ඇති), සහ
- විශේෂ කොට දක්වන ලද දිනයන්හිදී, හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් සහ හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ මුදල් ප්‍රවාහයන් පැවතීම.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්

ණය උපකරණයක් මගින් පහත කොන්දේසි දෙකම සන්තෘප්ත කෙරේ නම් සහ එය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව හඳුනා ගෙන නොමැති නම්, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කර ගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම තුළින් අරමුණ සාක්ෂාත් කරගනු ලැබෙන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම රඳවා සිටීම සහ
- විශේෂ කොට දක්වන ලද දිනයන්හිදී, හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් සහ හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ මුදල් ප්‍රවාහයන් පැවතීම.

විකිණීම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණයක මුල් හඳුනා ගැනීමේදී, බැංකුව ඉන් අනතුරුව මතු විය හැකි වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය ඔස්සේ ඉදිරිපත් කරනු ඇත. මෙම තෝරා ගැනීම ආයෝජන මගින් ආයෝජන පදනමක් මත සිදු කරනු ලැබේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂීත පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ග කර ඇති ඒවා හැර අන් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

උපකරණ පහත කොන්දේසිවලට යටත් වන විට මූල්‍ය වත්කම් අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස සාධාරණ අගයට මිනුම්කරණය කරනු ලැබේ.

- විකිණීම සඳහා තබා ඇති විට, හෝ
- සාධාරණ අගය පදනමක් මත අභ්‍යන්තරිකව කළමනාකරණය, තක්සේරු හෝ වාර්තා කරනු ලැබෙන විට, හෝ
- වෙනත් ආකාරයකින් ඉස්මතු වීමට ඉඩ අති ගිණුම්කරණ නොගැලපීමක් වීම වත්කම නම් කිරීම නිසා සැලකිය යුතු ලෙස අඩු වන හෝ වළක්වාලන විට, හෝ
- වෙනත් ආකාරයකින් ගිවිසුම යටතේ අවශ්‍ය වනු ඇති, මුදල් ප්‍රවාහ සැලකිය යුතු පරිදි වෙනසට ලක් කරන අත්‍යන්තගත ව්‍යුත්පන්න අන්තර්ගත වන විට.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වත්කම්

මීට අමතරව, මූලික හඳුනා ගැනීමේදී, වෙනත් ආකාරයකින් ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව හෝ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව හෝ මිනුම්කරණය කිරීම සඳහා වූ අවශ්‍යතා සන්තෘප්ත කරන කිසියම් මූල්‍ය වත්කමක්, එසේ කිරීම මගින් වෙනත් අයුරකින් ඉස්මතු වීමට ඉඩ ඇති ගිණුම්කරණ නොගැලපීමක් සැලකිය යුතු මට්ටමින් අඩු කෙරෙන්නේ නම් හෝ වළක්වාලන්නේ නම්, බැංකුව අවලංගු කළ නොහැකි නම් කිරීමක් සිදු කරනු ඇත.

බැංකුව වාර්තාකරණ දිනට කිසිදු මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද වත්කමක් වශයෙන් මූලික හඳුනා ගැනීමේදී නම් කර නොමැත.

විස්තරය	2020			2019		
	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වත්කම්	-	-	-	19,250	-	-

සාධාරණ අගයට මිනුම්කරණය කර නොමැති මූල්‍ය උපකරණ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති පරිදි ඉදිරියට ගෙන ආ ශේෂ සහ ක්‍රමක්ෂීත පිරිවැය අනුව ඉදිරියට ගෙන ආ සියලුම මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයයන් පිළිබඳ සංසන්දනයක් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

විස්තරය	2020 දෙසැම්බර් 31 දිනට		2019 දෙසැම්බර් 31 දිනට	
	ඉදිරියට ගෙන ආ වටිනාකම	සාධාරණ අගය	ඉදිරියට ගෙන ආ වටිනාකම	සාධාරණ අගය
	රු. 000	රු. 000	රු. 000	රු. 000
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	305,889	305,889	421,218	421,218
බැංකුවල ඇති තැන්පතු	9,859,832	9,859,832	7,539,925	7,539,925
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වත්කම්	-	-	19,250	19250
ක්‍රමක්ෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	41,157,836	41,157,836	41,215,592	41,215,592
ක්‍රමක්ෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය උපකරණ	7,546,155	7,546,155	4,880,392	4,880,392
මූල්‍ය වගකීම්		-		-
බැංකුවලට ගෙවිය යුතු	2,408,780	2,408,780	953,384	953,384
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	47,947,005	47,947,005	42,504,294	42,504,294
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	1,710,405	1,710,405	1,870,491	1,870,491
නිකුත් කළ ණය සුරැකුම්පත්	1,422,976	1,422,976	4,042,358	4,042,358

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම

ව්‍යාපාරය කළමනාකරණය කරගනු ලැබෙන ආකාරය සහ කළමනාකාරිත්වය වෙත තොරතුරු ලබා දෙනු ලබන ආකාරය වඩාත්ම හොඳින් පිළිබිඹු වීම හේතුවෙන් කිසියම් වත්කමක් කළඹ මට්ටම අනුව දරා සිටිනු ලබන ව්‍යාපාරික ආකෘතියක අරමුණු සම්බන්ධ තක්සේරුවක් බැංකුව විසින් සිදු කරනු ලබයි.

මෙහිදී සලකා බැලෙන තොරතුරු අතරට පහත දෑ ඇතුළත්ය:

- කළඹ සඳහා වූ ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ භාවිතය තුළ එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය. විශේෂයෙන්ම, කළමනාකාරිත්වය සතු උපායමාර්ගය ගිවිසුම්ගත පොළී ආදායම ඉපැයීම, නිශ්චිත පොළී අනුපාත කළඹක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාල සීමාව එම වත්කම් සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන වගකීම්වල කාල සීමාවට ගැලපීම හෝ වත්කම් විකිණීම තුළින් මුදල් ප්‍රවාහ උපලබ්ධි කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්නේද යන්න.
- කළඹෙහි කාර්යසාධනය ඇගයීමට ලක් කොට බැංකු කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලැබෙන්නේ කෙසේද යන්න.
- ව්‍යාපාරික ආකෘතියේ කාර්යසාධනය කෙරෙහි බලපෑම් විල්ල කරන අවදානම් (හා එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳා සිටින මූල්‍ය වත්කම්) සහ එකී අවදානම් කළමනාකරණය කර ගනු ලබන්නේ කෙසේද යන්න.
- ව්‍යාපාරය කළමනාකරණය කරනු ලබන පාර්ශ්ව සඳහා හිලවු කිරීම් සිදු කෙරෙන්නේ කෙසේද යන්න -

  උදා - හිලවු කිරීම සිදු කරනු ලබන්නේ කළමනාකරණීත වත්කම්වල සාධාරණ අගය හෝ එක්රැස් කරගනු ලැබෙන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම්වද යන්න, සහ
- පෙර කාල වකවානු කුළ විකිණීම් සිදු කළ වාර ගණන, විකිණුම් පරිමාව හා සිදු කළ කාලය යනාදිය සහ එකී විකිණුම් සිදු කිරීමට හේතු හා අනාගත විකිණුම් කාර්යයන් පිළිබඳ අපේක්ෂා. කෙසේ වෙතත්, විකිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සලකා බලනු ලබන්නේ කේවල වශයෙන් නොව, මූල්‍ය වත්කම කළමනාකරණය කර ගැනීම සඳහා වූ බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කරගනු ලැබ ඇත්තේ කෙසේද සහ මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගෙන ඇත්තේ කෙසේද යන්න පිළිබඳ සමස්ථ තක්සේරුවක කොටසක් වශයෙනි.

විගණන ප්‍රතිපත්ති

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වනාහි හුදෙක්ම ප්‍රාග්ධන මුදල හා පොලී ගෙවීම් සඳහා වන්නක්ද යන්න තක්සේරු කිරීම.

මෙම තක්සේරුවේ අරමුණ සඳහා 'ප්‍රාග්ධන මුදල' යන්න නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය වශයෙනි. මුදලේ කාල වටිනාකම සහ යම් නිශ්චිත කාල සීමාවක් තුළ හිඟ වී ඇති ප්‍රාග්ධන මුදල් වටිනාකම හා බැඳී ඇති ණය අවදානම හා අනෙකුත් මූලික ණය දීමේ අවදානම් හා පිරිවැය මෙන්ම ලාභ ආන්තිකය සඳහා වූ සලකා බැලීම වශයෙන් 'පොලිය' නිර්වචනය කෙරේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වනාහි හුදෙක්ම ප්‍රාග්ධන මුදල හා පොලී ගෙවීම් සඳහා වන්නක්ද යන්න ඇගයීමේදී බැංකුව අදාළ මූල්‍ය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමක් තුළට, එම කොන්දේසිය සන්තෘප්ත කිරීමට නොහැකි වන ආකාරයට එහි කාල ගණනය හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ප්‍රමාණය වෙනසට බඳුන් කරන ගිවිසුම්ගත කොන්දේසියක් අන්තර්ගත වේද යන්න තක්සේරු කිරීම ඊට ඇතුළත් වේ.

මෙම තක්සේරුව සිදු කිරීමේදී බැංකුව පහත කාරණා සලකා බලයි:

- මුදල් ප්‍රවාහවල ප්‍රමාණය හා කාල ගණනය වෙනස් කිරීමට ඉඩ ඇති අසම්භාව්‍ය සිදුවීම්.
- ලීවරණ ලක්ෂණ.
- පූර්ව ගෙවීම් හා කාලය දීර්ඝ කිරීමේ කොන්දේසි.
- සුවිශේෂී වත්කම් කෙරෙන් මුදල් ප්‍රවාහ සඳහා බැංකුවට ඇති හිමිකම් පෑම සීමා කෙරෙන කොන්දේසි, සහ
- මුදල් සලකා බැලීම හෝ කාල වටිනාකම වෙනස් කරන ලක්ෂණ.

කලින් කල අලුත් කරනු ලැබෙන දිනයන්හිදී පොලී අනුපාතිකය සංශෝධනය කිරීමට යෝජනා කිරීමේ විකල්පය බැංකුව වෙත පැවරෙන දිගු කාලීන ස්ථාවර අනුපාතික ණය කළඹක් බැංකුව විසින් පවත්වා ගනු ලබයි. මෙම අලුත් කිරීමේ හිමිකම් අදාළ සංශෝධනය කරනු ලබන කාලයේදී පවතින වෙළෙඳපොල අනුපාතවලට සීමා වේ. මෙහිදී, සංශෝධිත පොලී අනුපාතය පිළිගැනීමේ හෝ දඩ මුදල් ගෙවීමකින් තොරව අදාළ ණය මුදල සම මිලට නිදහස් කරගැනීමේ විකල්පය ගනුදෙනුකරුවන් වෙත හිමි වේ.

මුදලේ කාල වටිනාකම, ණය අවදානම, වෙනත් මූලික ණය අවදානම් සහ හිඟ මුල් මුදල හා බැඳී ඇති පිරිවැය ආදිය සලකා බැලෙන අයුරින් මෙම විකල්පය නිසා පොලී අනුපාතය වෙනස් වන හෙයින් මෙකී ණයවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු හුදෙක්ම මුල් ප්‍රාග්ධන මුදල හා පොලී ගෙවීම් වන බව බැංකුව විසින් නිර්ණය කරගෙන ඇත.

3.3.iii) ප්‍රතිවර්ගීකරණය

- මූලික හඳුනා ගැනීමේදී ණය හා අත්තිකාරම් හා ලැබිය යුතු දෑ ලෙස නිර්වචනය වනු ඇති මූල්‍ය වත්කම් හැර වෙනත් මූල්‍ය වත්කම්, දුර්ලභ අවස්ථාවලදී, ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය යන කාණ්ඩයෙන් ඉවතට ගෙන වෙනත් කාණ්ඩයක් තුළට වර්ගීකරණය වීමට ඉඩ ඇත.

- අදාළ ප්‍රතිපත්තිය

  කිසියම් මූල්‍ය වත්කම් විශේෂයක් කළමනාකරණය කිරීම සඳහා වූ සිය ව්‍යාපාරික ආකෘතියේ අරමුණ බැංකුව විසින් වෙනස් කරනු ලබන විට එවැනි දුර්ලභ අවස්ථාවලදී පමණක් හැර මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමෙන් පසුව ප්‍රතිවර්ගීකරණය කරනු නොලැබේ.

  එවැනි ප්‍රතිවර්ගීකරණය කිරීම් සඳහා අවසරයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 මගින් නොසැපයෙන හෙයින් මූල්‍ය වගකීම් ප්‍රතිවර්ගීකරණය කරනු නොලැබේ.

- මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය සඳහා වූ කාල ගණනය

  ව්‍යාපාරික ආකෘතිය වෙනස් කිරීමෙන් අනතුරුව, ඉන් බලපෑමට ලක් වන වත්කම් සියල්ලම බැංකුව ඊළඟ වාර්තාකරණ කාල සීමාවේ පළමු දිනයේ සිට අනාගතයේ භාවිත කළ හැකි වශයෙන් ප්‍රතිවර්ගීකරණය කරයි. පූර්ව කාල සීමා ප්‍රතිපකාශිත නොකෙරේ.

මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය මිනුම්කරණය

- 'ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය' අනුව මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කිරීම
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව.

  ප්‍රතිවර්ගීකරණ දිනය මත සාධාරණ අගය, නව ඉදිරියට ගෙන යන දළ වටිනාකම බවට පත් වේ. එකී නව ඉදිරියට ගෙන යන දළ වටිනාකම මත පදනම්ව සඵල පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ. ඉන් පසුව සාධාරණ අගය ආශ්‍රිත වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනේ.

- ක්‍රමක්ෂිත පිරිවැය අනුව

  ප්‍රතිවර්ගීකරණ දිනය මත සාධාරණ අගය, නව ඉදිරියට ගෙන යන දළ වටිනාකම බවට පත් වේ. එකී නව ඉදිරියට ගෙන යන දළ වටිනාකම මත පදනම්ව සඵල පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ.

- 'වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට' මනින ලද ණය උපකරණ ප්‍රතිවර්ගීකරණය කිරීම

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව

  වෙනත් විස්තීර්ණ ආදායමේ සමුච්චිත ශේෂය, ප්‍රතිවර්ගීකරණ දිනය මත ලාභ හා අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

- ක්‍රමක්ෂිත පිරිවැය අනුව

  මූල්‍ය වත්කම සාධාරණ අගය අනුව ප්‍රතිවර්ගීකරණය කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායමෙහි සමුච්චිත ශේෂය ඉවත් කරනු ලැබෙන අතර, ප්‍රතිවර්ගීකරණය කරන ලද සාධාරණ අගය ගැලපීම සඳහා එය යොදා ගැනේ. එම ගලපන ලද වටිනාකම ක්‍රමක්ෂිත පිරිවැය බවට පත් වේ.

  මූලික හඳුනා ගැනීමේදී තීරණය කරන ලද සඵල පොලී අනුපාතිකය සහ ඉදිරියට ගෙන යන දළ වටිනාකම, ප්‍රතිවර්ගීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස ගලපනු නොලැබේ.

- 'ක්‍රමක්ෂිත පිරිවැය' අනුව ණය උපකරණ ප්‍රතිවර්ගීකරණය කිරීම

- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව.

  වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගනු ලැබෙන ඕනෑම වෙනස්කමක් සහිතව වත්කම සාධාරණ අගය අනුව නැවත මිනුම්කරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේදී තීරණය කරන ලද සඵල පොලී අනුපාතිකය ප්‍රතිවර්ගීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස ගලපනු නොලැබේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව

  ප්‍රතිවර්ගීකරණ දිනය මත සාධාරණ අගය, නව ඉදිරියට ගෙන යන දළ වටිනාකම බවට පත් වේ. ක්‍රමක්ෂිත පිරිවැය සහ සාධාරණ අගය අතර වෙනස ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ.

3.ඇ3සඩ) මූල්‍ය වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

කිසියම් වත්කමක් වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිවිසුම්ගත හිමිකම ඉකුත් වී ඇති විට හෝ එලෙස මුදල් ප්‍රවාහ ලැබීමට තමන්ට ඇති හිවිසුම්ගත හිමිකම බැංකුව විසින් වෙනත් මූල්‍ය වත්කම් වෙත මාරු කරනු ලැබ ඇති විට හා පහත කොන්දේසිවලින් එකක් අදාළ වන විට මූල්‍ය වත්කම්, හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබේ:

- එක්කෝ සියලුම අවදානම් සහ හිමිකාරත්ව ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා ඇති විට,

  නැතහොත්,

- අවදානම් හා ප්‍රතිලාභ සියල්ලම බැංකුව විසින් සැලකිය යුතු ලෙස පවරා ඇති විට හෝ මූල්‍ය වත්කමේ පාලනය තමන් සතුවා රඳවා ගෙන නොමැති විට.

3.ඇ.ඩ) සාධාරණ අගය මිනුම්කරණය

''සාධාරණ අගය'' යනු, වත්කමක් විකිණීම සඳහා ලැබෙන හෝ වෙළෙඳපොලට සහභාගී වන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී වගකීමක් නොහොත් බැරකමක් මාරු කිරීම හෙවත් අන් අයට පැවරීම සඳහා මුල් මුදල මිණුම්කරණ දිනට හෝ එසේ නොමැති නම් එම දිනට බැංකුවට ප්‍රවේශය ඇති වඩාත්ම වාසිදායක වෙළෙඳපොල අනුව ගෙවනු ලබන මිල වේ.

කිසියම් බැරකමක සාධාරණ අගය මගින්, එය කාර්යක්ෂම නොවීමේ අවදානම පිළිබිඹු වේ.

කිසියම් උපකරණයක් සඳහා වන සක්‍රීය වෙළෙඳපොලෙහි සඳහන් කරන ලද මිල ලබා ගත හැකිව පවතින විට එය යොදා ගනිමින් බැංකුව එහි සාධාරණ අගය මිනුම්කරණය කරයි. වත්කමට හෝ බැරකමට අදාළ ගනුදෙනු ප්‍රමාණවත් වාර ගණනක් සහිතව සහ අඛණ්ඩ පදනමක් මත මිල තොරතුරු ලබා දීමට පරිමාවක් සහිතව සිදු කෙරෙන්නේ නම් කිසියම් වෙළෙඳපොලක් සක්‍රිය වෙළෙඳපොලක් ලෙස සැලකේ.

සක්‍රීය වෙළෙඳපොලෙහි සඳහන් කර ඇති මිලක් නොපවතින්නේ නම්, එවිට, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනෙන සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් ප්‍රයෝජනයට ගැනීම අවම කෙරෙන තක්සේරුකරණ ක්‍රමවේදයක් බැකුව යොදා ගනියි. කිසියම් ගනුදෙනුවක් සඳහා මිල නියම කිරීමේදී වෙළෙඳපොල සහභාගී වන්නන් විසින් සැලකිල්ලට ගනු ලබන සාධක සියල්ලම එකී තෝරාගත් තක්සේරුකරණ ක්‍රමවේදයට අන්තගර්ත වේ.

කිසියම් මූල්‍ය උපකරණයක මූලික හඳුනා ගැනීමේදී සාධාරණ අගය ලබා ගැනීම සඳහා වන හොඳම සාක්ෂිය වන්නේ සාමාන්‍යයෙන් ගනුදෙනු මිල වේ. ලබා දී ඇති හෝ ලැබී ඇති සාධාරණ අගය ඉන් අදහස් වේ. මූලික හඳුනා ගැනීමේදී සාධාරණ අගය අදාළ උපකරණයේ ගනුදෙනු මිලෙන් වෙනස් බව සහ කිසියම් වත්කමක් හෝ බැරකමක් සඳහා වන සක්‍රීය වෙළෙඳපොලෙහි ප්‍රකාශිත මිල කෙරෙන් හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල වෙතින් ලබා ගත හැකි දත්ත පමණක් උපයෝගී කර ගනු ලැබෙන තක්සේරුකරණ ක්‍රමවේදයක් මත පදනම්ව හෝ එම ක්‍රම දෙකෙන් එකක් මගින්වත් සාධාරණ අගය ප්‍රත්‍යක්ෂ නොවන බව බැංකුව විසින් තීරණය කරනු ලබන්නේ නම්, එවිට, මූලික හඳුනා ගැනීමේදී සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස විලම්බනය කරනු පිණිස ගලපා ඇති සාධාරණ අගය අනුව, එකී මූල්‍ය උපකරණය මිනුම්කරණය කරනු ලැබේ.

ඉන් අනතුරුව, නිරීක්ෂණය කරනු ලැබෙන වෙළෙඳපොල දත්ත ලබා ගත හැකි හෝ ගනුදෙනුව අවසන් කෙරෙන දිනය ඉකුත් නොවන යම් කාලයක් තුළ උපකරණයේ ආයු කාලයට සාපේක්ෂව සුදුසු පදනමක් මත පිහිටා එකී වෙනස ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනෙනු ලැබේ.

විගණන ප්‍රතිපත්ති

සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද කිසියම් වත්කමක් හෝ බැරකමක් සතුව ලංසු මිලක් සහ කැඳවුම් මිලක් පවතින්නේ නම්, එවිට, වත්කම් හා දීර්ඝ වෙළෙඳපොල තත්ත්ව සහිත උපකරණ ලංසු මිලක් මත ද, බැරකම් හා කෙටි වෙළෙඳපොල තත්ත්ව සහිත උපකරණ කැඳවුම් මිලක් මත ද බැංකුව විසින් මිනුම්කරණය කරනු ලබයි.

වෙළෙඳපොල හෝ ණය අවදානමට ඇති මීළඟ නිරාවරණය පදනම් කරගෙන බැංකුව විසින් කළමනාකරණය කරගනු ලැබෙන වෙළෙඳපොල අවදානම හෝ ණය අවදානම වෙත නිරාවරණය වී ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් කළඹවල්, යම් නිශ්චිත අවදානම් නිරාවරණයක් සඳහා කිසියම් ශුද්ධ වෙළෙඳපොල තත්ත්වයක් විකිණීම සඳහා ලැබෙන (හෝ ශුද්ධ කෙටි තත්ත්වයක් පැවරීම සඳහා ගෙවනු ලැබෙන) මිලක් පදනම් කරගෙන මිනුම්කරණය කරනු ලැබේ. කළඹෙහි ඇති වී ඒ කේවල උපකරණයට සාපේක්ෂව අවදානම් ගැලපීම පදනම් කරගෙන කේවල වත්කම් හා වගකීම් වෙත, කළඹ පාදක ගැලපුම් වෙන් කරනු ලැබේ.

කිසියම් ඉතුරුම් තැන්පතුවක සාධාරණ අගය, ඉල්ලුම අනුව මුදල් ප්‍රමාණය ගෙවිය යුතු පළමු දිනට වට්ටම් අඩු කිරීමෙන් අනතුරුව ගෙවිය යුතු මුදලට වඩා අඩු නොවේ.

මෙම වෙනස උද්ගත වූ කාල සීමාව වන වාර්තාකරණ කාල සීමාවේ අවසානයට සාධාරණ අගය ධුරාවලියේ විවිධ මට්ටම් අතර පැවරීම් බැංකුව හඳුනා ගනියි.

3.ඇ.vi). **හානිකරණ හඳුනා ගැනීම සහ මිනුම්කරණය**

අදාළ ප්‍රතිපත්තිය

- මූල්‍ය වත්කම් මත හානිකරණ හඳුනා ගැනීම

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය නොකෙරෙන පහත දැක්වෙන මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ සඳහා බැංකුව අලාභ ප්‍රතිපාදන වෙන් කිරීම් හඳුනා ගනියි.

- ණය උපකරණ වන මූල්‍ය වත්කම්
- ලැබිය යුතු කල්බදු ගෙවීම්
- නිකුත් කරන ලද මූල්‍ය ඇප ගිවිසුම්
- නිකුත් කරන ලද ණය බැඳීම්

ස්කන්ධය ආශ්‍රිත ආයෝජන මත කිසිදු හානිකරණ අලාභයක් හඳුනා නොගැනේ.

මාස 12 ක ආයු කාලයක් සහිත අපේක්ෂිත ණය ලාභ ලෙස මිනුම්කරණය කරනු ලැබෙන පහත දැක්වෙන උපකරණ හැර අනෙකුත් උපකරණ සඳහා බැංකුව ආයුකාලීන අපේක්ෂිත ණය අලාභවලට සමාන ප්‍රමාණයක අලාභ ප්‍රතිපාදන මිනුම් කරයි.

- වාර්තාකරණ දිනය වන විට අඩු ණය අවදානමක් පවතිනු ඇතැයි නිර්ණය කර ඇති ණය ආයෝජන සුරුකුම්පත්, සහ
- මූලික හඳුනා ගැනීමේ සිට ණය අවදානම සැලකිය යුතු තරමින් වැඩි වී නොමැති වෙනත් මූල්‍ය උපකරණ (ලැබිය යුතු කල්බදු ගෙවීම් හැර).

කිසියම් ණය සුරුකුමක ණය අවදානම් ශ්‍රේණිගත කිරීම ගෝලීය වශයෙන් පිළිගත් 'ආයෝජන ශ්‍රේණිය' පිළිබඳ නිර්වචනයට සමාන වන විට එය සතුව අඩු ණය අවදානමක් පවතින බව බැංකුව සලකයි. මාස 12 ආයු කාලයක් සහිත අපේක්ෂිත ණය අලාභ යනු, වාර්තාකරණ දිනයෙන් මාස 12 ක කාලයකට පසුව මූල්‍ය වත්කමක් මත පවා සිදු විය හැකි ගෙවීම් පැහැර හැරීමක ප්‍රතිඵලයක් ලෙස උද්ගත විය හැකි අපේක්ෂිත ණය අලාභයේ කොටසයි.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන ඉදිරිපත් කිරීම

  අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ ප්‍රතිපාදන වෙන් කිරීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ:
- ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්: වත්කමෙහි ඉදිරියට ගෙන යන දළ වටිනාකමෙන් අඩු කිරීමක් ලෙස.
- ණය බැඳීම් සහ මූල්‍ය ඇප ගිවිසුම්: සාමාන්‍යයෙන්, නිශ්චිත ප්‍රතිපාදනයක් ලෙස.
- ඉටු කරන ලද හා ඉටු නොකරන ලද සංචරක දෙකම කිසියම් මූල්‍ය උපකරණයක් තුළ විද්‍යමානව පවතින විට හා ණය බැඳීම් සංරචකය මත ඇති අපේක්ෂිත ණය අලාභය, ඉටු කරන ලද ණය බැඳීම් සංරකචය මත අපේක්ෂිත ණය අලාභයෙන් වෙන් කර හඳුනා ගැනීමට බැංකුවට හැකියාවක් නොමැති විට: සංරචක දෙකම සඳහා සංයුක්ත අලාභ ප්‍රතිපාදනයක් බැංකුව ඉදිරිපත් කරයි. එම සංයුක්ත වටිනාකම් ප්‍රමාණය, ඉටු කරන ලද ණය බැඳීම් සංරචකයේ ඉදිරියට ගෙන යන දළ වටිනාකම වෙතින් අඩු කිරීමක් ලෙස ඉදිරිපත් කෙරේ.

  ඉටු කරන ලද ණය බැඳීම් සංරචකයේ ඉදිරියට ගෙන යන දළ වටිනාකමට සාපේක්ෂව කවර හෝ අතිරික්ත අලාභ ප්‍රතිපාදනයක් වේ නම්, එය ප්‍රතිපාදනයක් ලෙස ඉදිරිපත් කෙරේ.
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන ණය උපකරණ: මෙකී වත්කම්වල ඉදිරියට ගෙන යන වටිනාකම වන්නේ ඒවායෙහි සාධාරණ අගය වන නිසා ඒ සඳහා කිසිදු අලාභ ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගැනේ. කෙසේ වෙතත්, අලාභ ප්‍රතිපාදනය හෙළිදරවු කොට සාධාරණ අගය සංචිතයෙහි හඳුනා ගනු ලැබේ.

- මූල්‍ය වත්කම් වෙනස් කිරීම

කිසියම් මූල්‍ය වත්කමක කොන්දේසි වෙනසට භාජනය වී තිබේ නම්, එවිට, එකී වෙනසට ලක් වූ මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සැලකිය යුතු තරමින් වෙනස්ද යන්න බැංකුව විසින් අගයනු ලැබේ.

ඒ අනුව, එම මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, මුල් මූල්‍ය වත්කම වෙතින් ලැබෙන මුදල් ප්‍රවාහයන්ට අදාළ ගිවිසුම්ගත හිමිකම් ඉකුත් වී අතැයි සැලකේ. එවැනි අවස්ථාවකදී, මුල් මූල්‍ය වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබෙන අතර, සාධාරණ අගය වෙත කවර හෝ ගනුදෙනු පිරිවැයක් වේ නම් එය එකතු කොට නව මූල්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ. මෙම

සංශෝධනයෙහි කොටසක් ලෙස ලැබෙන ඕනෑම ගාස්තු මුදලක් පහත පරිදි මිනුම්කරණය කෙරේ:

- නව වත්කමෙහි සාධාරණ අගය තීරණය කිරීම සඳහා සලකා බලනු ලැබෙන ගාස්තු සහ හිමිකම් ලබන ගනුදෙනු ගාස්තු ප්‍රතිපූරණය කිරීමේ ගාස්තු එම වත්කමේ ආරම්භක මිනුම්කරණයට ඇතුළත් කෙරේ, සහ
- අනෙකුත් ගාස්තු, හඳුනා ගැනීම ඉවත් කිරීම මත ලාභ හෝ අලාභවල කොටසක් ලෙස ඇතුළත් කෙරේ.

ණය ගැනුම්කරු මූල්‍යමය දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති විට මුදල් ප්‍රවාහ වෙනසකට ලක්ව තිබේ නම්, එවිට, එම වෙනස් කිරීමෙහි අරමුණ වන්නේ සැලකිය යුතු තරමින් වෙනස් කොන්දේසි සහිත නව වත්කමක් උත්පාදනය කිරීමටත් වඩා මුල් ගිවිසුම්ගත කොන්දේසිමය බැඳීම් ආපසු අයකර ගැනීම උපරිමය දක්වා ගෙන ඒමයි. මුදල් ප්‍රවාහ අහෝසි කිරීමකට හේතු වන පරිදි කිසියම් මූල්‍ය වත්කමක් වෙනස් කිරීමට බැංකුව සැලසුම් කරන්නේ නම්, එම වෙනස් කිරීම සිදු වීමට ප්‍රථම වත්කමෙහි කොටසක් කපා හැරිය යුතුද යන්න පළමුව සලකා බලයි (කපා හැරීම් ප්‍රතිපත්තිය සඳහා පහත බලන්න). මෙම ප්‍රවේශය නිසා ප්‍රමාණාත්මක ඇගයීමෙහි ප්‍රතිඵල වෙත බලපෑම් වැල්ල වන අතර, එවැනි අවස්ථාවලදී හඳුනා ගැනීම ඉවත් කිරීමේ නිර්ණායක බොහෝ විට සන්තෘප්ත නොකෙරෙන බවක් ඉන් අදහස් වේ.

ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කමකට අදාළ වෙනස් කිරීමක ප්‍රතිඵලයක් ලෙස එම මූල්‍ය වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම සිදු නොවන්නේ නම්, එවිට, බැංකුව විසින් පළමුව එකී වත්කමේ ඉදිරියට ගෙන යනු ලබන දළ වටිනාකම නැවත ගණනය කොට එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ගැලපුම වෙනස් කිරීම් ප්‍රතිලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභවල හඳුනා ගනු ලැබේ. පාවෙන අනුපාතික සහිත මූල්‍ය වත්කම් සඳහා, වෙනස් කිරීම් ලාභය හෝ අලාභය ගණනය කරනු පිණිස යොදා ගන්නා ලද මුල් සඵල පොලී අනුපාතිකය එම වෙනස් කිරීම සිදු කෙරෙන කාලයේ පවතින වෙළෙඳපොල තත්ත්වයන් පිළිබිඹු වන පරිදි ගලපනු ලැබේ. ඒ අනුව ඉස්මතු වන ඕනෑම පිරිවැයක් හෝ ගාස්තුවක් සහ වෙනස් කිරීමේදී ලැබෙන ගාස්තු මගින්, වෙනස් කරන ලද මූල්‍ය වත්කමෙහි ඉදිරියට ගෙන යන දළ වටිනාකම ගලපනු ලබන අතර එම වත්කමෙහි ඉදිරි වී ඇති කාල සීමාවට සාපේක්ෂව එකී ගාස්තු ක්‍රමක්ෂය කෙරේ.

එවැනි වෙනස් කිරීමක් සිදු කරනු ලබන්නේ ගැනුම්කරුගේ මූල්‍ය දුෂ්කරතාවක් හේතුවෙන් නම්, එවිට, හානිකරණ අලාභද සමගින් එහි ලාභය හෝ අලාභය ඉදිරිපත් කරනු ලැබේ. වෙනත් අවස්ථාවලදී, සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගෙන ගණනය කරන ලද පොලී ආදායක් ලෙස එය ඉදිරිපත් කෙරේ.

■ මූල්‍ය වත්කම් කපා හැරීම

කිසියම් ණයක් හෝ සුරැකුමක් රැස්කර ගැනීමට නොහැකි තත්ත්වයේ බව බැංකුව තීරණය කරන විට එකී ණය හෝ ආයෝජන ණය සුරැකුම සහ ඒ හා සබැඳි ඕනෑම ප්‍රතිපාදනයක් බැංකුව විසින් හානිකරණ අලාභ සඳහා කපා හරිනු ලැබේ. ණය ලබා ගන්නා/නිකුත් කරන පාර්ශ්වයට තවදුරටත් අදාළ ණය බැඳීම ගෙවීමට හැකියාවක් නොපවතින පරිදි සහ ණය සඳහා ලබා දී ඇති ඇපයෙහි ශේෂය මුළු ණය නිරාවරණයම ගෙවා දැමීමට ප්‍රමාණවත් නොවන පරිදි ගැනුම්කරුගේ/නිකුත් කරන්නාගේ මූල්‍ය තත්ත්වයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වීම ආදී තොරතුරු සලකා බැලීමෙන් පසුව එම තීරණය ගනු ලැබේ.

සුළු වටිනාකම් සහිත සම්මත ණය සඳහා ණය බැඳීම් කපා හැරීම් තීරණය ගනු ලබන්නේ සාමාන්‍යයෙන් නිපැයුම් සුවිශේෂී අතීත හිඟ ගෙවීම් තත්ත්වය පදනම් කරගෙන වේ.

3.අ). මූල්‍ය වගකීම්

3.අ.i) මූල්‍ය වගකීම් පිළිගැනීම සහ මිනුම්කරණය

■ අදාළ ප්‍රතිපත්තිය

මූලික හඳුනා ගැනීමේදී බැංකුව මූල්‍ය ඇප සහ ණය බැඳීම් හැර වෙනත් මූල්‍ය වගකීම් පහත දැක්වෙන කාණ්ඩ අතරින් එකක් තුළට වර්ගීකරණය කරයි:

■ ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම්, සහ
■ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වගකීම්
■ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ඉන් අනතුරුව මිනුම්කරණය

මූල්‍ය වගකීම් මිනුම්කරණය ඒවායෙහි වර්ගීකරණයන් මත පදනම් වේ.

■ ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වගකීම් බැංකුව විසින් නිකුත් කරනු ලැබෙන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නොදැක්වෙන මූල්‍ය වගකීම් ඒවා අත්පත් කර ගැනීම මත යෙදවෙන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් හෝ සඵල පොලී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින්, ඒවාට සෘජුව අදාළ වන ගනුදෙනු පිරිවැය සාධාරණ අගය වෙත එකතු කොට මූලිකව හඳුනා ගනු ලැබේ.

එම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එකී මූල්‍ය වගකීම්, සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂිත පිරිවැය අනුව මිනුම්කරණය කරනු ලැබේ.

ඉතුරුම් තැන්පතු, ජංගම තැන්පතු, ස්ථාවර/කාලික තැන්පතු, ඇමතුම් තැන්පතු, තැන්පතු සහතික සහ ණයකර ඇතුළු තැන්පතු වගකීම්, ක්‍රමක්ෂිත පිරිවැය අනුව මිනුම්කරණය කරනු ලැබෙන මූල්‍ය වගකීම් ලෙස වර්ග කෙරේ.

සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි 'පොලී ආදායම' යටතේ ඇතුළත් කර තිබේ. වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබෙන විට ආදායම් ප්‍රකාශනය තුළ සහ සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේ ලාභ හා අලාභද හඳුනා ගනු ලැබෙයි.

■ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වගකීම් අතරට, අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ඇති व्युත්පන්න වගකීම් ඇතුළත් වේ.

විගණන ප්‍රතිපත්ති

3.ඈ.ii) මූල්‍ය වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

කිසියම් මූල්‍ය වගකීමක ගිවිසුම්ගත බැඳීම් ඉටු කර ඇති විට, අහෝසි කර ඇති විට හෝ ඉකුත් වී ඇති විට බැංකුව එය හඳුනා ගැනීමට ලක් කරයි.

3.ඈ.iii) බැංකුවලට ගෙවිය යුතු වටිනාකම්, නිකුත් කළ ණය සුරැකුම්පත් සහ වෙනත් ණය ගැනීම්

සාමාන්‍යයෙන් වෙළෙඳ දිනයට යෙදෙන, එමෙන්ම, උද්ගත වන සෘජුව අදාළ කළ හැකි ගනුදෙනු පිරිවැය අඩු කළ විට ලැබුණු වටිනාකම් ප්‍රමාණය වන සාධාරණ අගය අනුව මූලිකව මිනුම්කරණය කරන ලද, ප්‍රතිපාර්ශ්ව සමග වූ වැඩපිළිවෙළවල ගිවිසුම්ගත විධිවිධානවලට බැංකුව එළැඹෙන විට මූල්‍ය වගකීම් හඳුනා ගනු ලැබේ. මූල්‍ය වගකීම් ඉන් අනතුරුව මිනුම්කරණය කරනු ලබන්නේ ලද වටිනාකම් හා උද්ගත වූ සෘජුව අදාළ කළ හැකි ගනුදෙනු පිරිවැය සහ උපකරණයේ අපේක්ෂිත ආයු කාලයට සාපේක්ෂ නිදහස් කර ගැනීමේ වටිනාකම අතර වෙනස ක්‍රමක්ෂය කරනු පිණිස සළුල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමිනි.

3.ඈ.iv) ප්‍රතිපාදනය

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට ඇති කිසියම් වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යාමේ ඉඩකඩ පවතින විට හා එම බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගැනේ.

3.ඈ.v) විකුණුම් හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්

සුරැකුම්පත් කිසියම් පූර්වනිශ්චිත මිලකට ප්‍රතිමිලදී ගැනීමේ බැඳීමකට යටත්ව විකුණනු ලැබූ විට ඒවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉතිරි වන අතර, ලැබුණු මුදල් වටිනාකමට අදාළව වගකීමක් වාර්තා කරනු ලැබේ.

විකිණීමේ බැඳීමකට යටත්ව මිලදී ගන්නා ලද සුරැකුම්පත් (''ප්‍රති හැරවුම් ප්‍රතිමිලදී ගැනීම්'') මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගැනෙන අතර, ගෙවන ලද මුදල් වටිනාකම ''ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ බැංකුවලින් ලැබිය යුතු'' හෝ ''ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු'' යටතේ සුදුසු පරිදි වාර්තා කරනු ලැබේ.

විකිණුම් හා ප්‍රතිමිලදී ගැනුම් මිල අතර වෙනස පොලිය ලෙස සලකනු ලැබෙන අතර එය, බැංකු හා ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් සඳහා වූ ගිවිසුම්වල ආයු කාලයට සාපේක්ෂව හඳුනා ගනු ලැබේ.

3.ඉ). විශ්‍රාමික ප්‍රතිලාභ

විශ්‍රාමික ප්‍රතිලාභ

නිශ්චිත විශ්‍රාමික සැලසුම්: 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයන් සඳහා බැංකුවේ සේවයට එක් වූ දින සිට ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සහ, වසර 15 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශේෂ සේවකයන් සඳහා ආයුගණක තක්සේරුව යොදා ගනිමින් සමස්ථ ලංකා බැංකු සේවක වෘත්තීය සමිතිය සමග ඇති කරගත් සාමූහික ගිවිසුම ප්‍රකාරව විශේෂ පාරිතෝෂිකයක් ගෙවීම වෙනුවෙන් ප්‍රතිපාදන ගිණුම්වල වෙන් කර තිබේ.

මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙනත් වගකීම් යටතේ කාණ්ඩගත කර තිබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ - නිශ්චිත දායකත්ව සැලසුම්

- සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලැබෙන සේවක අර්ථසාධක අරමුදල වෙත බැංකුව සහ බැංකුවේ සේවකයන් අදාළ වැටුප්වලින් පිළිවෙළින් 12% ක සහ 8% ක දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදල වෙත ලබා දෙයි.

- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලැබෙන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත බැංකුව සෑම සේවකයෙකුගේම වැටුපෙන් 3.0% ක් දායක කරයි.

3.ඊ). වෙනත් බැරකම්

ගාස්තු, වියදම් හා ගෙවිය යුතු පාරිතෝෂික/විශ්‍රාමික ප්‍රතිලාභ සහ අනෙකුත් ප්‍රතිපාදන වෙනත් බැරකම්වලට ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ගෙවීමට අපේක්ෂිත වටිනාකම්වලින් මෙකී වගකීම් බැරකම් නොහොත් වගකීම් වාර්තා කෙරේ.

3.උ). ආදායම හඳුනා ගැනීම

- ණය හා අත්තිකාරම් මත පොලී ආදායම

සළුල පොලී අනුපාතික ක්‍රමය යොදා ගෙන සියලුම ණය සඳහා ආයුගණක පදනමක් මත පොලී ආදායම හඳුනා ගැනේ.

- කල් ඉක්මවූ ශුද්ධ පොලී ආදායම

ණය වාරික ප්‍රමාද වී ගෙවීමට අදාළ කල් ඉකුත්වීම මත පොලිය, සේවක අර්ථසාධක අරමුදල් ණය හැර වෙනත් ණය සඳහා මුදල් පදනම මත හඳුනා ගැනේ.

3.ඒ) වියදම්

- තැන්පතු, ණය ගැනීම් මත පොලිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි විධිවිධානවලට අනුකූලව, ණය ගැනීම් සඵල පොලී අනුපාතික ක්‍රමයට අනුව හඳුනා ගනු ලැබෙන අතර ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

- වෙනත් වියදම්

මෙහෙයුම් සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම සේවා තත්ත්වයකින් පවත්වා ගැනීම සඳහා නඩත්තු කිරීම ආශ්‍රිතව උද්ගත වන වියදම් සියල්ලම වසර සඳහා වූ ලාභ හෝ අලාභ ගණනය කරනු පිණිස ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කොට ආයුගණක පදනම මත හඳුනා ගනු ලැබේ.

3.ඓ). බදුකරණය

ආදායම් බදු වියදම්, පවතින වසර සඳහා බදු සහ විලම්බිත බදු අඩු කොට සැදුම් ලබයි. ආදායම් බදු වියදම් ස්කන්ධය තුළ හඳුනා ගැනීම සිදු කෙරෙන අවස්ථාවක් වන එකී වියදම් ස්කන්ධය තුළ ඍජුවම හඳුනා ගැනෙන අයිතමවලට සම්බන්ධ වන තරමට හැර, අන් අවස්ථාවලදී ආදායම් බදු වියදම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

- ප්‍රවර්තන බදු

පවතින මෙන්ම පෙර වර්ෂවලට අදාළව බදු අය කිරීමේ බලයලත් අධිකාරීන් වෙතින් අයකර ගැනීමට හා ඒවාට ගෙවීමට අපේක්ෂිත වටිනාකම් ප්‍රමාණවලින් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. එම වටිනාකම් ගණනය කරනු පිණිස යොදා ගැනෙන බදු අනුපාතික සහ බදු නීති වන්නේ, බලාත්මක කර ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට සැලකිය යුතු තරමින් බලාත්මකව ඇති ඒවා ය. මේ අනුව, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ ඊට සිදු කර ඇති සංශෝධනවල සඳහන් විධිවිධානවලට අනුකූලව බදු අයකිරීමේ අරමුණු වෙනුවෙන් වසර සඳහා ගලපන ලද ලාභය මත පදනම්ව බදුකරණ ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. ''ආදායම් බදු'' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි අවශ්‍යතාවක් වන බදු වියදම්වල ප්‍රධාන සංරචක, සඵලදායී බදු අනුපාතික සහ බදුවලට පෙර ලාභය හා වියදම් අතර වෙනස සම්බන්ධයෙන් වූ සැසඳුමක්ද සටහනට ඇතුළත් වේ.

- විලම්බිත බදු අයකිරීම

විලම්බිත බදුකරණය බැරකම් නොහොත් වගකීම් ක්‍රමවේදය මත පදනම්ව සැපයේ. මූල්‍ය ප්‍රකාශනවල අයිතම හඳුනා ගනු ලැබූ කාලයට වඩා වෙනස් කාලයක් තුළ ආදායම් බදු අරමුණු සඳහා ඒවාට ඉඩ දී ඇති විට උද්ගත වන කාලමය වෙනසෙහි බදු බලපෑම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනෙන අතර, පවතින බදුකරණ අනුපාතිකයට අනුව විලම්බිත බදු ප්‍රතිපාදන තුළ ඇතුළත් කරනු ලැබේ.

- මූල්‍ය සේවා මත විකතු කළ අගය මත බදු

මූල්‍ය සේවා මත විකතු කළ අගය මත බදු ගණනය කිරීම සඳහා වූ පදනම වන්නේ සේවකයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික සහ ආදායම් බදුවලට පෙර ගිණුම්කරණ ලාභය වන අතර, එය නිර්දිෂ්ඨ අනුපාතික මත ගණනය කරන ලද ක්ෂය වීම් සඳහා ගලපනු ලැබේ.

කාල සීමාව සඳහා වූ ලාභය නිර්ණය කර ගැනීමේදී අයකරනු ලැබෙන විකතු කළ අගය මත බදු ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබේ.

3.ඔ). මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දළ මුදල් ලැබීම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට ලක් කෙරෙන ''මුදල් ප්‍රවාහ ප්‍රකාශනය'' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 ට අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙළ කිරීමේ ඍජු ක්‍රමවේදය යොදා ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කරන ලදි.

කෙටි කාලීන, අධික ද්‍රවශීලතාවකින් යුතු හා පහසුවෙන් මුදල් වටිනාකම් බවට හැරවිය හැකි හා වටිනාකම ආශ්‍රිත සැලකිය යුතු නොවන තරමේ වෙනස්කම් සිදු වීමේ අවදානමට යටත් ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.ඕ) ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය පරිදි බදුවලට පසු ශුද්ධ ලාභයෙන් 5% ක් සියලුම බෙදා හැරීම්වලට පෙර ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කෙරේ.

3.ක) සාමාන්‍ය සංචිත අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය පරිදි බදුවලට පසු ශුද්ධ ලාභයෙන් 10% ක් ලාභාංශ බෙදා දීමට පෙර ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කෙරේ.

3. ග) සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ බැරකමක් ලෙස සලකනු ලැබෙන අතර, වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත කිරීමෙන් පසුව ඒවා ස්කන්ධයෙන් අඩු කෙරේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කරනු ලැබෙන, වසර සඳහා වූ සාමාන්‍ය කොටස් මත ලාභාංශ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරවු කර තිබේ.

3.ච) කොටසකට ඉපැයීම්

බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වන ලාභය හෝ අලාභය, කාල සීමාව තුළ බර තබන ලද හිඟ සාමාන්‍ය කොටස් සංඛ්‍යා සාමාන්‍යයෙන් බෙදීමෙන් මූලික කොටසකට ඉපැයීම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වන ලාභය හෝ අලාභය, තනුක කිරීමට හැකියාවක් පවතින සාමාන්‍ය කොටස් සියල්ලෙහිම බලපෑමට ගලපන ලද බර තබන ලද හිඟ සාමාන්‍ය කොටස් සංඛ්‍යා සාමාන්‍යයෙන් බෙදීමෙන් තනුක කරන ලද කොටසකට ඉපැයීම ගණනය කෙරේ.

විගණන ප්‍රතිපත්ති

3.ජ) තොග තක්සේරුකරණය

පරිභෝජනය කළ හැකි කොටස්, පිරිවැය අනුව වාර්තා කෙරෙන අතර, පළමුව අත්පත් කරගනු ලැබෙන වත්කම් පළමුව විකිණීමේ පදනම මත තොග අයිතම නිකුත් කරනු ලැබේ.

3.ට) වෙනත් ආයතන සම්බන්ධ අභිලාෂ

ශේෂ පත්‍රයේ දිනට වෙනත් ආයතන සම්බන්ධ සැලකිය යුතු මටටමේ අභිලාෂ කිසිවක් නොමැත.

3.ඩ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 - කල්බදු

බැංකුව විසින් මෙහෙයුම් කල්බදු පදනම මත අත්පත් කරගෙන ඇති වත්කම් ලෙස කල්බදු භාවිතයට අයිතිය ඇති වත්කම් පිළිබිඹු වන අතර එහි දී යොදා ගනු ලැබ ඇති වට්ටම් අනුපාතිකය වන්නේ මූලිකව 2019 දී සහ ඉනික්බිති බැංකුව සතු අරමුදල්වල මූල්‍ය පිරිවැයයි. අදාළ අරමුදල් පිරිවැය, කාල සීමාව තුළ සමුච්චිත පදනම කල්බදු ගිවිසුම අත්සන් තබන ලද මාසයට පෙර පරිහරණය කර තිබේ.

වත්කමෙහි ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය යනු කල්බදු ගිවිසුමේ කාල සීමාව වන අතර, ක්ෂය කිරීම් ක්‍රමවේදය යනු වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලයට සාපේක්ෂව යොදා ගැනෙන සරල රේඛීය ක්‍රමයයි.

ආදායම් ප්‍රකාශනය වෙත හර කොට ක්ෂය වීම් හා ක්‍රමක්ෂය පිරිවැය යටතේ කාණ්ඩගත කොට සරල රේඛීය ක්‍රමවේදය යොදා ගනිමින් ක්ෂය වීම් දක්වා ඇත. වට්ටම් අනුපාතිකය යොදා ගැනීමේදී උද්ගත වූ මූල්‍ය පිරිවැය, ආදායම් ප්‍රකාශනය වෙත හර කොට පොලී අනුපාතික පිරිවැය යටතේ වර්ගීකරණය කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

1. මුළු ආදායම

වර්ෂය	2020	2019
පොලී ආදායම (2 සටහන)	7,456,679,454	7,683,161,881
පොලී නොවන ආදායම (5-7 සටහන්)	399,754,109	407,302,968
එකතුව	7,856,433,563	8,090,464,850

2. පොලී ආදායම

වර්ෂය	2020	2019
මුදල් හා මුදල් සමාන දෑ	-	-
ශ්‍රී ලංකා මහ බැංකුව සමග ශේෂයන්	-	-
බැංකුවල ඇති තැන්පතු	741,092,793	686,970,623
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වත්කම්	-	-
- සාධාරණ අගය අනුව මනින ලද	-	-
- සාධාරණ අගය අනුව දක්වන ලද	-	-
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම්	-	-
- ණය හා අත්තිකාරම්	6,206,932,278	6,361,030,227
- ණය හා වෙනත් උපකරණ - රජයේ සුරැකුම්පත් *	264,834,716	337,986,721
- වෙනත්	243,819,666	297,174,311
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්	-	-
වෙනත්	-	-
මුළු පොලී ආදායම	7,456,679,454	7,683,161,881

3. පොලී වියදම්

වර්ෂය	2020	2019
බැංකුවලට ගෙවිය යුතු	74,669,135	69,448,561
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වගකීම්	-	-
- සාධාරණ අගය අනුව මනින ලද	-	-
- සාධාරණ අගය අනුව දක්වන ලද	-	-
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම්	-	-
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	3,823,973,435	4,082,383,907
- ණය සුරැකුම් හිමියන්ට ගෙවිය යුතු	413,838,922	461,108,507
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	162,799,265	170,293,844
වෙනත්	-	-
මුළු පොලී වියදම්	4,475,280,757	4,783,234,818
ශුද්ධ පොලී ආදායම (02-03 සටහන්)	2,981,398,697	2,899,927,063

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

*** ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ශුද්ධ පොලී ආදායම**

වර්ෂය	2020	2019
පොලී ආදායම	264,834,716	337,986,721
අඩු කළා: පොලී වියදම්	-	-
ශ්‍රී ලංකාවෙන් ලැබිය යුතු ශුද්ධ පොලී ආදායම	264,834,716	337,986,721

5. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

වර්ෂය	2020	2019
ගාස්තු හා කොමිස් ආදායම	303,220,609	358,302,968
ගාස්තු හා කොමිස් වියදම්	-	-
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	303,220,609	358,302,968
සමන්විත අයිතම:		
ණය	251,350,055	279,645,693
කාඩ්පත්	-	-
වෙළෙඳාම් හා ප්‍රේෂණ මුදල්	-	-
ආයෝජන බැංකුකරණය	-	-
තැන්පතු	-	-
ඇපකර	-	-
වෙනත්	51,870,554	78,657,275
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	303,220,609	358,302,968

6. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය උපකරණ වෙතින් ශුද්ධ සාධාරණ අගය ලාභ/(අලාභ)

වර්ෂය	2020	2019
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වත්කම් මත ලාභය	(475,000)	-
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වත්කම් මත අලාභ	-	500,000
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වගකීම් මත ලාභය	-	-
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය වගකීම් මත අලාභ	-	-
එකතුව	(475,000)	500,000

7. ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම

වර්ෂය	2020	2019
ආයෝජන දේපල මත ලාභ/(අලාභ)	96,500,000	48,500,000
දේපල, පිරියත සහ උපකරණ මත ලාභ/(අලාභ)	508,500	-
විදේශ විනිමය ප්‍රතිතක්සේරු කිරීම මත ලාභ/(අලාභ)	-	-
කපා හරින ලද ණය අයකර ගැනීම	-	-
අඩු කළා: කපා හරින ලද ණය	-	-
වෙනත්	-	-
එකතුව	97,008,500	48,500,000

8. හානිකරණ ගාස්තු

විවරණය	2020	2019
ක්‍රමකෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		
1 අවධිය	(65,341,583)	(11,629,386)
2 අවධිය	(82,925,249)	(2,866,741)
3 අවධිය	468,765,848	284,321,741
ක්‍රමකෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය උපකරණ		
1 අවධිය	(649,953)	(1,559,812)
2 අවධිය	-	-
3 අවධිය	6,677,007	54,627,247
වෙනත්	-	
එකතුව	326,526,071	322,893,049

9. පුද්ගල වියදම්

විවරණය	2020	2019
වැටුප් හා ප්‍රසාද දීමනා (9.1 ඇතුළත්ව)	768,142,904	753,724,311
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායක වීම්	98,234,453	95,116,878
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන (30.1 සටහන)	114,199,715	105,663,945
කොටස් පාදක වියදම්	-	-
වෙනත්	193,474,292	209,963,564
එකතුව	1,174,051,364	1,164,468,698

9.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා පාරිශ්‍රමික

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා පාරිශ්‍රමික	66,661,163	76,446,594
එකතුව	66,661,163	76,446,594

10. ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය කිරීම්

විවරණය	2020	2019
දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම්	59,234,064	60,361,306
භාවිතයට අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය කිරීම්	72,612,928	75,178,766
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම්	24,791,270	28,222,968
එකතුව	156,638,262	163,763,041

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

11. වෙනත් වියදම්

විස්තරය	2020	2019
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	1,626,000	1,642,000
විගණකගේ පාරිශ්‍රමික	2,209,283	3,767,526
විගණකවරුන් සඳහා ගෙවන ලද විගණන නොවන ගාස්තු	-	-
වෘත්තිමය හා නෛතික වියදම්	14,909,268	18,479,963
මෙහෙයුම් කල්බදු වියදම්	-	-
කාර්යාල පරිපාලන හා ආයතන වියදම්	75,738,535	76,279,538
ප්‍රවාහන හා සබැඳි වියදම්	28,632,730	29,865,651
මුද්‍රණ හා තැපැල් ගාස්තු	26,710,820	42,064,904
රක්ෂණය සහ සයිබර් ආරක්ෂාව සඳහා වියදම්	41,253,214	45,041,119
ව්‍යාපාර සංවර්ධනය හා අලෙවි ප්‍රචාරණ	29,174,627	45,641,154
පරිගණක බලපත්‍ර	47,424,949	41,005,665
වෙනත්	75,136,186	107,837,141
එකතුව	342,815,612	411,624,661

12. මූල්‍ය සේවා මත වැට්, ජා.ගො.නෑ. හා ණය ආපසු ගෙවීමේ බදු

විස්තරය	2020	2019
වසර සඳහා ලාභය මූල්‍ය සේවා මත එකතු කළ අගය බදු	312,685,504	273,591,054
පෙර වසරේ (අඩි)/ඌන ප්‍රතිපාදන	-	1,487,934
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත මුළු බදු	312,685,504	275,078,988
වසර සඳහා ලාභය මූල්‍ය සේවා මත ජා.ගො.නෑ.	-	33,647,388
පෙර වසරේ (අඩි)/ඌන ප්‍රතිපාදන	-	198,391
මූල්‍ය සේවා මත මුළු ජා.ගො.නෑ. බදු	-	33,845,779
වසර සඳහා ලාභය මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු	-	161,047,280
පෙර වසරේ (අඩි)/ඌන ප්‍රතිපාදන	-	648
ණය ආපසු ගෙවීමේ මුළු බදු	-	161,047,928
එකතුව	312,685,504	469,972,694

13. බදු වියදම්

වර්ෂය	2020	2019
ප්‍රවර්තන බදු වියදම්		
ප්‍රවර්තන වර්ෂය	435,146,769	309,423,162
පෙර වසරේ ප්‍රතිපාදන	-	26,526,633
විලම්බිත බදු වියදම්		
බදු අනුපාතික වෙනස් වීමේ බලපෑම	-	-
තාවකාලික වෙනස් වීම්	(74,847,579)	(37,154,350)
පෙර වසරේ ප්‍රතිපාදන	-	-
එකතුව	360,299,190	298,795,445

අ). බදු වියදම් සැසඳුම

වර්ෂය	2020	2019
බදුවලට පෙර ලාභ/(අලාභ)	1,068,435,993	774,507,887
බදු අරමුණු සඳහා අවසර දිය නොහැකි වියදම්	1,018,126,392	1,138,014,426
බදු අරමුණු සඳහා අවසර දිය හැකි වියදම්	(532,466,782)	(807,439,590)
කාල සීමාව සඳහා ආදායම් බදු (අදාළ වන බදු අනුපාතිකයට අනුව ගිණුම්කරණ ලාභය)	299,162,078	216,862,208
පෙර කාල සීමා සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදුවලට අදාළ ගැලපුම්	-	26,526,633
විලම්බිත බදු	(74,847,579)	(37,154,350)
එකතු කළා: බදු අරමුණු සඳහා අඩු කරගත නොහැකි වියදම්වල බදු බලපෑම	285,075,390	318,644,039
(අඩු කළා): හදු අරමුණු සඳහා අඩු කරගත හැකි වියදම්වල බදු බලපෑම	(149,090,699)	(226,083,085)
කාල සීමාව සඳහා බදු වියදම්	360,299,190	298,795,445
	-	-
සඵල පොලී අනුපාතිකය (ප්‍රවර්තන වර්ෂයේ බදු මත)	41%	40%
විලම්බිත බදු සමඟ සඵල පොලී අනුපාතිකය	34%	35%

ආ). ආදායම් ප්‍රකාශනයෙහි විලම්බිත බදු (බැර)/අයකිරීම් පහත අයිතමවලින් සමන්විත වේ:

වර්ෂය	2020	2019
විලම්බිත බදු වත්කම්	87,869,532	42,884,725
විලම්බිත බදු වගකීම්	13,021,953	5,730,375
වෙනත් තාවකාලික වෙනස් වීම්	-	-
ආදායම් ප්‍රකාශනයට (බැර)/අය කෙරෙන විලම්බිත බදු	(74,847,579)	(37,154,350)

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

14. කොටසකට ඉපැයීම්

වර්ෂය	2020	2019
සාමාන්‍ය ස්කන්ධ හිමියන්ට හිමි ශුද්ධ ලාභය	708,136,803	475,712,442
ගලපන ලදි:		
වරණීය කොටස් මත පොලිය	-	-
පරිවර්තිත බැඳුම්කර මත පොලිය	-	-
සාමාන්‍ය ස්කන්ධ හිමියන්ට හිමි ශුද්ධ ලාභය	-	-
තනුකකරණයේ බලපෑමට අනුව ගලපන ලද	-	-
බර තබන ලස සාමාන්‍ය කොටස් සංඛ්‍යා සාමාන්‍යය	64,710,520	64,710,520
කොටසකට මූලික ඉපැයීම්	10.94	7.35
තනුකකරණයේ බලපෑම	-	-
පරිවර්තිත බැඳුම්කර	-	-
පරිවර්තිත වරණීය කොටස්	-	-
වෙනත්	-	-
තනුකකරණයේ බලපෑමට අනුව ගලපන ලද බර තබන ලද සාමාන්‍ය කොටස් සංඛ්‍යා සාමාන්‍යය	-	-
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම්	10.94	7.35
සාමාන්‍ය කොටසකට තනුක ඉපැයීම්	10.94	7.35

15. මුදල් හා මුදල් සමාන දෑ

වර්ෂය	2020	2019
අතැති මුදල්	155,040,702	150,212,979
බැංකුවල ඇති ශේෂයන්	150,848,481	271,005,310
ඒකෂණ මුදල් සහ කෙටි කාලීන දැනුවීම් මුදල්	-	-
එකතුව	305,889,183	421,218,289

16. බැංකුවල ස්ථාපිත මුදල්

වර්ෂය	2020	2019
වාණිජ බැංකුවල ස්ථාපන	8,779,757,301	7,028,630,110
විශේෂිත බැංකුවල ස්ථාපන	1,080,664,100	511,998,317
එකතුව	9,860,421,401	7,540,628,427
අඩු කළා: හානිකරණ	(588,655)	(703,128)
හානිකරණ අඩු කළ	9,859,832,746	7,539,925,299

17. ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගැනෙන මූල්‍ය වත්කම්

වර්ෂය	2020	2019
සාධාරණ අගය අනුව මනින ලද		
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (උපකරණ අනුව වෙන් කර ඇති)		
ස්කන්ධ සුරැකුම්	-	19,250,000
ආයතනික ණය සුරැකුම්	-	-
වෙනත්	-	-
මුළු එකතුව	-	19,250,000
සාධාරණ අගය අනුව දක්වන ලද		
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (උපකරණ අනුව වෙන් කර ඇති)		
ස්කන්ධ සුරැකුම්	-	-
ආයතනික ණය සුරැකුම්	-	-
වෙනත්	-	-
මුළු එකතුව	-	-
එකතුව	-	19,250,000

අ. විශ්ලේෂණය

වර්ෂය	2020	2019
ඇප තබා ගැනීම අනුව		
සුරැකුම් වශයෙන් ඔඩපනය කරන ලදි	-	-
නිදහස් කරන ලද	-	-
දළ එකතුව	-	-
මුදල් ඒකකය අනුව		
ශ්‍රී ලංකා රුපියල්	-	19,250,000
ඇ. ඒ. ජ. ඩොලර්	-	-
දළ එකතුව	-	19,250,000

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

18. ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූලය වත්කම් - ණය හා අත්තිකාරම්

වර්ෂය	2020	2019
දළ ණය හා අත්තිකාරම්		
1 අවධිය	23,367,269,719	26,142,376,268
2 අවධිය	5,018,679,789	5,544,116,401
3 අවධිය	14,250,983,175	10,673,352,334
එකතුව	42,636,932,682	42,359,845,002
(අඩු කළා): සමුච්චිත හානිකරණ:		
1 අවධිය	(108,035,006)	(173,376,589)
2 අවධිය	(53,538,744)	(136,463,993)
3 අවධිය	(1,283,369,711)	(834,411,750)
එකතුව	(1,444,943,461)	(1,144,252,332)
ශුද්ධ ණය හා අත්තිකාරම්	41,191,989,221	41,215,592,671

අ). විශ්ලේෂණය

වර්ෂය	2020	2019
නිෂ්පාදනය අනුව		
අයිරා		
වෙළෙඳ මූල්‍ය		
ලැබිය යුතු කල්බදු කුලී	1,270,038,566	1,312,546,261
ක්‍රෙඩිට් කාඩ්පත්		
උකස්	427,413,509	293,087,824
කාර්ය මණ්ඩලය සඳහා ලබා දුන් ණය	1,623,475,565	1,576,761,135
කාල ණය		
කෙටි කාලීන		
දිගු කාලීන	39,316,005,041	39,177,449,782
වෙනත්		
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (උපකරණ අනුව වෙන් කර ඇති)		
වෙනත්		
දළ එකතුව	42,636,932,682	42,359,845,002
මුදල් ඒකකය අනුව		
ශ්‍රී ලංකා රුපියල්	42,636,932,682	42,359,845,002
දළ එකතුව		
කර්මාන්තය අනුව		
කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය	2,477,944,918	330,842,387
නිෂ්පාදන	11,164,004	-
සංචාරක කර්මාන්තය	3,500,413	-
ප්‍රවාහන	-	-
ඉදිකිරීම්	32,148,076,921	32,938,854,903
වෙළෙන්දන්	-	-
නව ආර්ථිකය	7,598,270,624	8,672,996,893
වෙනත්	397,975,801	417,150,819
දළ එකතුව	42,636,932,682	42,359,845,002

ආ). සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ සංචලනයන්

වර්ෂය	2020	2019
1 අවධිය		
01/01 දිනට ආරම්භක ශේෂය	173,376,589	188,682,965
ආදායම් ප්‍රකාශනයට අය කෙරෙන/(නැවත ඇතුළත් කෙරෙන)	(65,341,583)	(15,306,376)
වසර තුළදී කපා හැරීම්	-	-
වෙනත් සංචලනයන්	-	-
12/31 දිනට අවසන් ශේෂය	108,035,006	173,376,589
2 අවධිය		
01/01 දිනට ආරම්භක ශේෂය	136,463,993	139,330,733
ආදායම් ප්‍රකාශනයට අය කෙරෙන/(නැවත ඇතුළත් කෙරෙන)	(82,925,249)	(2,866,741)
වසර තුළදී කපා හැරීම්	-	-
වෙනත් සංචලනයන්	-	-
12/31 දිනට අවසන් ශේෂය	53,538,744	136,463,993
3 අවධිය		
01/01 දිනට ආරම්භක ශේෂය	845,643,942	550,090,009
ආදායම් ප්‍රකාශනයට අය කෙරෙන/(නැවත ඇතුළත් කෙරෙන)	468,765,848	284,321,741
වසර තුළදී කපා හැරීම්	(19,807,886)	-
වෙනත් සංචලනයන්	-	-
12/31 දිනට අවසන් ශේෂය	1,283,369,711	834,411,750
එකතුව	1,444,943,461	1,144,252,332

19. ක්‍රමයෙන් පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

භාණ්ඩාගාර බිල්පත්

නිකුත් කරන්නා	යොමු අංකය	2020	2019
ශ්‍රී ලංකා රජය වෙත ලබා දෙන ණය	LKA36420A246	-	496,795,830
ශ්‍රී ලංකා රජය	LKA36420A246	-	496,795,830
ශ්‍රී ලංකා රජය	LKA36420A105	-	997,460,224
ශ්‍රී ලංකා රජය	LKA18219G191	-	972,603,284
ශ්‍රී ලංකා රජය	LKA18221D236	985,837,151	-
ශ්‍රී ලංකා රජය	LKA18221D236	985,837,151	-
ශ්‍රී ලංකා රජය	LKA18221D236	985,837,151	-
ශ්‍රී ලංකා රජය	LKA18221E283	1,962,518,931	-
මුළු එකතුව		4,920,030,384	2,963,655,167
ආයතනික ණය උපකරණ		525,513,661	857,492,327
භාර සහතික		551,580,809	-
වෙනත් (වාණිජ පත්‍ර සහ බැංකුවල නොවන තැන්පතු)		1,549,030,261	1,059,245,504
මුළු එකතුව		7,546,155,115	4,880,392,998

අ. විශ්ලේෂණය

මුදල් ඒකකය අනුව			
ශ්‍රී ලංකා රුපියල්		7,546,155,115	4,880,392,998
දළ එකතුව		7,546,155,115	4,880,392,998

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

නිකුත් කරන්නා	යොමු අංකය	2020	2019
ආයෝජනවල			
මුළු ආයෝජන		7,610,914,977	4,939,011,332
අඩු කළා: හානිකරණ ප්‍රතිපාදන		(64,759,862)	(58,618,334)
ඉදිරියට ගෙන ආ අගය		7,546,155,115	4,880,392,998

20. දේපල, පිරියත සහ උපකරණ

අ. දේපල, පිරියත සහ උපකරණ - බැංකුව

විස්තරය	සින්නකරකර ඉඩම් හා ගොඩනැගිලි	කල්බදු දේපල	පරිගණක දාඩාංග	කාර්යාල උපකරණ, ලී බඩු සහ සවිකුරු	වෙනත්	එකතුව
2020 (ප්‍රවර්තන වර්ෂය)						
පිරිවැය/සාධාරණ අගය						
2020/01/01 දිනට ආරම්භක ශේෂය	17,575,000	11,650,000	146,478,534	351,920,150	128,283,215	655,906,899
එකතු කිරීම්	-	-	33,292,206	21,832,072	11,047	55,135,325
බැහැර කිරීම්	-	-	-	-	2,079,620	2,079,620
විනිමය අනුපාත විචලනය	-	-	-	-	-	-
ගැලපීම්	-	-	-	142,950	-	142,950
2020/12/31 දිනට අවසන් ශේෂය	17,575,000	11,650,000	179,770,741	373,609,271	126,214,642	708,819,654
අඩු කළා: සමුච්චිත ක්ෂය වීම්/ක්‍රමක්ෂය කිරීම්						
2020/01/01 දිනට ආරම්භක ශේෂය	4,668,300	9,320,000	95,940,218	219,723,548	98,735,421	428,387,487
වසර සඳහා අය කිරීම්	518,700	2,330,000	15,819,578	32,552,208	8,013,577	59,234,064
එකතු කිරීම්	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	51,397	2,079,620	2,131,017
විනිමය අනුපාත විචලනය	-	-	-	-	-	-
ගැලපීම්	-	-	-	-	-	-
2020/12/31 දිනට අවසන් ශේෂය	5,187,000	11,650,000	111,759,796	252,224,359	104,669,378	485,490,534
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	12,388,000	-	68,010,944	121,384,912	21,545,264	223,329,120
2019 (ප්‍රවර්තන වර්ෂය)						
පිරිවැය/සාධාරණ අගය						
2020/01/01 දිනට ආරම්භක ශේෂය	17,575,000	11,650,000	126,878,906	332,033,177	122,032,362	610,169,446
එකතු කිරීම්	-	-	20,795,609	25,451,575	10,426,780	56,673,964
බැහැර කිරීම්	-	-	1,195,981	4,981,221	-	6,177,202
විනිමය අනුපාත විචලනය	-	-	-	-	-	-
ගැලපීම්	-	-	-	583,382	4,175,927	4,759,308
2020/12/31 දිනට අවසන් ශේෂය	17,575,000	11,650,000	146,478,534	351,920,150	128,283,215	655,906,899
(අඩු කළා): සමුච්චිත ක්ෂය වීම්						
2020/01/01 දිනට ආරම්භක ශේෂය	4,149,600	21,997,392	83,418,700	189,532,703	88,586,084	387,684,479
වසර සඳහා අය කිරීම්	518,700	2,330,000	13,424,529	33,938,739	10,149,338	60,361,306
එකතු කිරීම්	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	903,010	3,747,895	-	4,650,905
විනිමය අනුපාත විචලනය	-	-	-	-	-	-
ගැලපීම්	-	15,007,392	-	-	-	15,007,392
2020/12/31 දිනට අවසන් ශේෂය	4,668,300	9,320,000	95,940,219	219,723,548	98,735,422	428,387,489
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	12,906,700	2,330,000	50,538,316	132,196,602	29,547,793	227,519,410

20ග1 දේපල, පිරියත හා උපකරණවල ක්ෂය වීම සහ අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය තත්ත්වය

2020 දී	සම්පූර්ණයෙන් ක්ෂය වූ/ක්‍රමක්ෂිත	ක්ෂය වන/ ක්‍රමක්ෂය වන	එකතුව
සින්නකරකර දේපල, පිරියත හා උපකරණ			
ඉඩම් හා ගොඩනැගිලි	-	7,780,500	7,780,500
පරිගණක දෘඩාංග	68,593,442	111,177,299	179,770,741
පරිගණක මෘදුකාංග	80,044,681	216,156,548	296,201,228
කාර්යාල උපකරණ, ලී බඩු සහ සවිකුරු	71,295,483	302,313,788	373,609,271
දේපල, පිරියත හා උපකරණ:	11,888,888	29,297,673	41,186,561
ආම්පන්න	49,425	68,506	117,931
මෝටර් වාහන	56,487,720	16,741,762	73,229,482
සින්නකරකර දේපල, පිරියත හා උපකරණවල එකතුව	288,359,638	683,536,075	971,895,713
කල්බදු දේපල, පිරියත හා උපකරණ			
ඉඩම් හා ගොඩනැගිලි		-	-
මෝටර් වාහන	-	11,650,000	11,650,000
කල්බදු දේපල, පිරියත හා උපකරණවල එකතුව	-	11,650,000	11,650,000
මුළු දේපල, පිරියත සහ උපකරණ වටිනාකම	288,359,638	695,186,075	983,545,713

2019 දී	සම්පූර්ණයෙන් ක්ෂය වූ/ක්‍රමක්ෂිත	ක්ෂය වන	එකතුව
සින්නක්කර දේපල, පිරියත හා උපකරණ			
ඉඩම් හා ගොඩනැගිලි	-	7,780,500	7,780,500
පරිගණක දෘඩාංග	53,229,722	93,248,812	146,478,534
පරිගණක මෘදුකාංග	85,590,013	219,330,195	304,920,208
කාර්යාල උපකරණ, ලී බඩු සහ සවිකුරු	71,295,483	280,624,667	351,920,150
පිරියත හා යන්ත්‍රෝපකරණ	31,222,708	9,963,853	41,186,561
ආම්පන්න	49,425	57,456	106,881
මෝටර් වාහන	47,738,840	27,570,262	75,309,102
සින්නකරකර දේපල, පිරියත හා උපකරණවල එකතුව	289,126,191	638,575,745	927,701,936
කල්බදු දේපල, පිරියත හා උපකරණ			
ඉඩම් හා ගොඩනැගිලි		-	-
මෝටර් වාහන	-	11,650,000	11,650,000
කල්බදු දේපල, පිරියත හා උපකරණවල එකතුව	-	11,650,000	11,650,000
මුළු දේපල, පිරියත සහ උපකරණ වටිනාකම	289,126,191	650,225,745	939,351,936

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

20.2 බැංකුවේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු

ස්ථානය	විශාලත්වය	ගොඩනැගිලි - වර්ග අඩි	ශුද්ධ පොත් අගය	වෙළෙඳපොල වටිනාකම
කළුතර ශාඛාව - අංක 13, ඥානෝදය මාවත, කළුතර	P7.535	3,420	17,575,000	45,000,000

තක්සේරු දිනය	2020 දෙසැම්බර් 21
තක්සේරුකරුගේ නම	ඩබ්ලිව්. ඩී. සිරිපාල, FIV(SL)
තක්සේරුකරුගේ සුදුසුකම	සංස්ථාපිත ස්වාධීන තක්සේරුකරු

20.3.

අ). තාවකාලිකව අක්‍රිය දේපල, පිරියත සහ උපකරණ
2020 දේපල, පිරියත සහ උපකරණ අක්‍රියව පැවැති දේපල, පිරියත සහ උපකරණ කිසිවක් නොවීය (2019: කිසිවක් නැත).

ආ). සක්‍රිය ප්‍රයෝජනයෙන් ඉවත් කර අති දේපල, පිරියත සහ උපකරණ
2020 දෙසැම්බර් 31 දිනට සක්‍රිය ප්‍රයෝජනයෙන් ඉවත් කර තිබුණු දේපල, පිරියත සහ උපකරණ කිසිවක් නොවීය (2019: කිසිවක් නැත).

ඇ). දේපල, පිරියත සහ උපකරණ මත හිමිකම් සීමා
2020 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත සහ උපකරණ මත හිමිකම් සීමා කිසිවක් නොවීය (2019: කිසිවක් නැත).

ඈ). බැරකම්වලට සුරැකුම් ලෙස ඔඩපනය කරන ලද දේපල, පිරියත සහ උපකරණ
බැරකම්වලට සුරැකුම් ලෙස ඔඩපනය කරන ලද දේපල, පිරියත සහ උපකරණ කිසිවක් නොවීය (2019: කිසිවක් නැත).

ඉ). දේපල, පිරියත සහ උපකරණ අයිතම සඳහා තුන්වැනි පාර්ශ්ව වෙතින් ලැබෙන වන්දි
හානිකරණය වූ, අස්ථානගත වූ හෝ අත්හැර දමන ලද දේපල, පිරියත සහ උපකරණ අයිතම සඳහා මහි සමාලෝචනයට ලක් වන වසර තුළදී තුන්වැනි පාර්ශ්ව වෙතින් වන්දි කිසිවක් ලැබී නොමැත (2019: කිසිවක් නැත).

21. අස්පාශ්‍ය වත්කම්

2020 වර්ෂය	පරිගණක මෘදුකාංග - දේශීය	පරිගණක මෘදුකාංග - විදේශීය	ප්‍රධාන බැංකුකරණ මෘදුකාංගය	එකතුව
පිරිවැය/සාධාරණ අගය				
2020/01/01 දිනට ආරම්භක ශේෂය	27,524,506	78,053,844	199,341,858	304,920,208
එකතු කිරීම්	-	-	-	-
බැහැර කිරීම්	8,158,980	-	-	8,158,980
විනිමය අනුපාත විචලතාව	-	-	-	-
ගැලපීම්	560,000	-	-	560,000
2020/12/31 දිනට අවසන් ශේෂය	18,805,526	78,053,844	199,341,858	296,201,228
(අඩු කළා): සමුච්චිත ක්ෂය වීම්	-	-	-	-
2020/01/01 දිනට ආරම්භක ශේෂය	21,176,269	71,160,593	59,802,557	152,139,419
වසර සඳහා අය කිරීම්	2,139,339	2,717,745	19,934,186	24,791,270
එකතු කිරීම්	-	-	-	-
බැහැර කිරීම්	8,158,980	-	-	8,158,980
විනිමය අනුපාත විචලතාව	-	-	-	-
ගැලපීම්	140,000	-	-	140,000
2020/12/31 දිනට අවසන් ශේෂය	15,016,628	73,878,338	79,736,743	168,631,709
(අඩු කළා): හානිකරණ	-	-	-	-
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	3,788,898	4,175,507	119,605,115	127,569,519

2019 වර්ෂය	පරිගණක මෘදුකාංග - දේශීය	පරිගණක මෘදුකාංග - විදේශීය	ප්‍රධාන බැංකුකරණ මෘදුකාංගය	එකතුව
පිරිවැය/සාධාරණ අගය				
2019/01/01 දිනට ආරම්භක ශේෂය	19,501,911	70,473,513	199,341,858	289,317,281
එකතු කිරීම්	8,022,595	7,580,332	-	15,602,927
බැහැර කිරීම්	-	-	-	-
විනිමය අනුපාත විචලනතාව	-	-	-	-
ගැලපීම්	-	-	-	-
2019/12/31 දිනට අවසන් ශේෂය	27,524,506	78,053,844	199,341,858	304,920,208
(අඩු කළා): සමුච්චිත ක්ෂය වීම්				-
2019/01/01 දිනට ආරම්භක ශේෂය	18,659,167	65,388,912	39,868,372	123,916,451
වසර සඳහා අය කිරීම්	2,517,101	5,771,681	19,934,186	28,222,968
එකතු කිරීම්	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-
විනිමය අනුපාත විචලනතාව	-	-	-	-
ගැලපීම්	-	-	-	-
2019/12/31 දිනට අවසන් ශේෂය	21,176,269	71,160,593	59,802,557	152,139,419
(අඩු කළා): හානිකරණ	-	-	-	-
2019/12/31 දිනට ශුද්ධ පොත් අගය	6,348,237	6,893,251	139,539,301	152,780,789

22. කල්බදු වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්

	2020	2019
ක්ෂය වීම් අඩු කොට කල්බදු වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්	369,641,853	351,112,109
බෙදා දැක්වීම		
ආරම්භක ශේෂය (පිරිවැය)	351,112,109	339,717,087
එකතු කිරීම්: වසර තුළ එකතු කිරීම්	91,142,671	86,573,788
අඩු කළා: වසර සඳහා ක්‍රමක්ෂය	72,612,928	75,178,766
අවසාන ශේෂය	369,641,853	351,112,109

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

23. ආයෝජන දේපල

අ. සාධාරණ අගය අනුව ආයෝජන දේපල

වර්ෂය	2020	2019
පිරිවැය/සාධාරණ අගය		
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	920,000,000	871,500,000
එකතු කිරීම්	96,500,000	48,500,000
බැහැර කිරීම්	-	-
විනිමය අනුපාත විචලතාව	-	-
ගැලපීම්	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	1,016,500,000	920,000,000
(අඩු කළා): සමුච්චිත ක්ෂය විමි		
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	-	-
වසර සඳහා අය කිරීම්	-	-
එකතු කිරීම්	-	-
බැහැර කිරීම්	-	-
විනිමය අනුපාත විචලතාව	-	-
ගැලපීම්	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	-	-
(අඩු කළා): හානිකරණ	-	-
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	1,016,500,000	920,000,000
දෙසැම්බර් 31 දිනට වෙළඳ අගය	1,016,500,000	920,000,000

23.1 ආයෝජන දේපල තක්සේරුකරණ විස්තර

ස්ථානය	විශාලත්වය (පර්චස්)	ඔප්පු අංකය	බැංකුව 2020	බැංකුව 2019
අංක 441, සංඝරාජ මාවත, කොටහේන, ඇතුල් නැගෙනහිර කෝට්ටේ	59.20	1127	242,000,000	242,000,000
අංක 192, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත, කොටහේන කොළඹ 13.	123.20	1124	677,000,000	591,000,000
අංක 192, (කොටසක්) ශ්‍රී සංඝරාජ මාවත, කොටහේන කොළඹ 13.	15.00	1126	82,500,000	72,000,000
අවිස්සාවේල්ල - නිවාස ව්‍යාපෘතියෙහි	106.00		15,000,000	15,000,000
එකතුව			1,016,500,000	920,000,000

ඉඩම් ප්‍රතිතක්සේරුකරණය

අංක 441, ශ්‍රී සංඝරාජ මාවත, කොටහේන, නැගෙනහිර ඇතුල්කෝට්ටේ. ඔප්පු අංක - 1127.
අංක 192, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත, කොටහේන, කොළඹ 13.
අංක 192, (කොටසක්) ශ්‍රී සංඝරාජ මාවත, කොටහේන, කොළඹ 13.

* 2020 වසර තුළදී අවිස්සාවේල්ල ව්‍යාපෘතියේ ප්‍රතිතක්සේරුකරණයන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිශ්කාෂන ලැබෙන තුරු සලකා නොබලන ලදි.

තක්සේරුකරුගේ නම	ඩබ්ලිව්. ඩී. සිරිපාල, FIV(SL)
තක්සේරුකරුගේ සුදුසුකම	සංස්ථාපිත ස්වාධීන තක්සේරුකරු
තක්සේරුකරණ දිනය	2020 දෙසැම්බර් 20.

අවිස්සාවේල්ල නිවාස ව්‍යාපෘතිය ප්‍රතිතක්සේරු කිරීම

තක්සේරුකරුගේ නම	ඩබ්ලිව්. ඩී. සිරිපාල, FIV(SL)
තක්සේරුකරුගේ සුදුසුකම	සංස්ථාපිත ස්වාධීන තක්සේරුකරු
තක්සේරුකරණ දිනය	2020 දෙසැම්බර් 20.

තක්සේරුකරණයේ පදනම

මෙම දේපල තක්සේරු කිරීම විකුණුම් සැසඳුම් ප්‍රවේශය යොදා ගෙන සිදු කරන ලදි. සාමාන්‍යයෙන් මෙම ප්‍රවේශය, ආයෝජනය කළ හැකි (නිදහස්) ඉඩම් සහ ඉහළම හා හොඳම භාවිතය දැනට පවතින පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යොදා ගැනෙන ඉඩම් සඳහා හොඳම අගයයක් සහිත තක්සේරුව ලබා දෙයි. අනෙකුත් ඉඩම් විකිණුම් තක්සේරු කරනු ලබන මෙම ප්‍රවේශය මඟින් වීවා, තක්සේරු කෙරෙමින් පවතින දේපල සමග සංසන්දනය කිරීමද සිදු කෙරේ. මෙහිදී සලකා බැලිය යුතු පළමු කාරණයක් වන්නේ සංසන්දනය කළ හැකි වෙළෙඳාම් සියල්ලම අතර ඇති වෙළෙඳපොල තත්ත්වයන් සහ එකී සංසන්දනාත්මක වත්කම්හි දිනයේ සිට ඒකක මිල ගණන්වල සිදු විය හැකි වෙනස්කම්ද ඇතුළත් විෂයය අතර සැසඳීමක් සිදු කිරීමයි.

සලකා බැලිය යුතු දෙවන කරුණ වන්නේ උසස් වත්කම් ස්ථානය නිසා ඉහළ ඒකක මිලක් බිහි වීමට ඉඩ ඇති ස්ථානය සැසඳීමට ලක් කිරීමයි.

තුන්වැනි සලකා බැලීම විය යුත්තේ විශාලත්වය නොහොත් තරම සැසඳීමයි. අන් සියලු සාධක එක සමාන වන විට කුඩා විශාලත්වයක් මඟින් සාමාන්‍යයෙන් විශාල වෙළෙඳපොලවලට වඩා ඉහළ ඒකක මිලක් සුළු විශාලත්වයේ වෙළෙඳපොල ආශ්‍රිතව ඇති කෙරේ. කෙසේ වෙනත්, කොළඹ නගර සීමාව සහ අනෙකුත් තදාසන්න ප්‍රදේශ තුළ වාණිජමය අරමුණු සඳහා විශාල වෙළෙඳපොල ස්ථාන උදෙසා ඉහළ ඒකක මිලක් යොදා ගැනේ.

වෙළෙඳපොල ස්ථානවල පිහිටීම හා අනෙකුත් නෛතික සීමාවන්ද ඇතුළත්ව වීවායෙහි අනෙකුත් වත්කම්වලට සාපේක්ෂව ඒකක අගය කෙරෙහි ධනාත්මක හෝ ඍණාත්මක බලපෑමක් විල්ල කිරීමට හැකියාව ඇති අවසරලත් භාවිතයන් සලකා බැලීම සිවි වන කාරණය වෙයි.

අන් සියලු සාධක එක සමානව පවතින විට, සවලදායී සංවර්ධනය සඳහා වඩා හිතකර සහ අඩු නියත ස්වරූපයක් ඇති වත්කම්වලට වඩා ඉහළ ඒකක මිලකට විකිණීමේ නැඹුරුවක් සහිත සමාන පැතිකඩ ඇති වත්කම් සමග වෙළෙඳපොල පිරිසැකැස්ම සංසන්දනය කිරීම පස් වන කාරණය වෙයි.

සලකා බැලිය යුතු සය වැනි කාරණය වන්නේ, අන් සියලු සාධක සමානව පවතින විට, අනෙකුත් උපයෝජ්‍යතාවන්ට වඩා ඒකක පදනමක් මත විකිණීමේ නැඹුරුවක් ඇති උපයෝජ්‍යතා සතු වත්කම් සමග උපයෝජ්‍යතා සැසඳීමයි. මෙපරිද්දෙන්ම, මහ නගර සභා උපයෝජ්‍යතා සේවාවන්ට ප්‍රවේශය ඇති දේපල, පෞද්ගලික ළිඳක් සහ ගලි පද්ධතියක් සහිත වීවාට වඩා ඒකක පදනමක් මත වඩා ඉහළ වටිනාකමක් සහිත විය හැක.

සලකා බැලිය යුතු සත් වැනි කාරණය වන්නේ අලෙවි තත්ත්ව සැසඳීමයි. සුවිශේෂයෙන් දක්වා ඇත්තේ නම් මිස, කිසිදු සුවිශේෂී ගැණුම්කාර හෝ විකුණුම්කාර අභිප්‍රේරණයක්, විශේෂ සහන හෝ සැලකිය යුතු පුද්ගලික දේපල අන්තර්ගත වීමක් සනසන්දනීය දේපලෙහි විකුණුම් මිල කෙරෙන් ගම්‍ය වන බවක් පෙන්නුම් නොකෙරේ. විකිණුම් මිල කෙරෙහි බලපෑම් ඇති කරනු ඇති බවට හඳුනාගෙන ඇති විකිණුම් තත්ත්ව සියල්ලම තක්සේරු කරු විසින් විශ්ලේෂණය කොට ඇත.

විෂයය වන දේපල

තක්සේරුවට භාජනය කෙරෙන දේපල සතුව නෛතික සීමාකම් හේතුවෙන් මේ වන විට අත්හැර දමා ඇති ඉතාම පැරණි ගොඩනැගිල්ලක් තිබේ. මේ නිසා, සියලුම ගොඩනැගිලි දිරාපත් වී හෝ ජරාවාස වී හෝ තිබේ. මෙම ඉඩම/භූමිය පිහිටා ඇත්තේ සංඝරාජ මාවතට මඳක් අභ්‍යන්තරයේ ය. මෙම ප්‍රදේශය, ජනප්‍රිය හා මනාව ස්ථාපිතව ඇති නාගරික කාර්යාල, උද්‍යාන ආදී සන්සන්දනීය වත්කම් හේතුවෙන් අතිශයින් ඉහළ තදබදයකට ලක් වන ප්‍රදේශයකි. මෙම ගොඩනැගිලි තක්සේරු අරමුණේදී සලකා බැලීමට ලක් නොවේ.

බොහෝ දුරට ඒකාකාර හැඩයක් ගන්නා අක්කර 0 - රූඩ් 3 - පර්චස් 18.20 ක ක්ෂේත්‍රඵලයකින් යුතු ඉඩමකි.

වෙළෙපොල ප්‍රවණතා

ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් නව කාර්යාල ඉඩකඩක් ලබා දීමේ අවශ්‍යතාව ක්‍රමානුකූලව ඉහළ නගිමින් පවතින අතර පමණ ඉක්මවා හෝ පමණට අඩුවෙන් ගොඩනැගිලි ඉදි කෙරෙනු ඇති බවට සලකුණු කිසිවක් නොමැත. වාණිජමය සංවර්ධනය උදෙසා උචිත ඉඩමේ වටිනාකම ගත වූ වසර්ෂය තුළදී ඉහළ ගොස් ඇති අතර එම ඉහළ යාමේ අනුපාතය ආසන්න දළ වශයෙන් උද්ධමන අනුපාතියට සමාන බව පෙනී ගොස් ඇත. වාණිජමය ගොඩනැගිලි සඳහා වූ කුලී ගාස්තු සහ දේපල වටිනාකම්ද ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, එම ඉහළ යාම උද්ධමන අනුපාතයට වඩා තරමක් අඩු බව පෙනී ගියේය.

උක්ත කාරණා සියල්ලම, සුවිශේෂයෙන්ම අදාළ ප්‍රදේශය ආශ්‍රිත ඉල්ලුම සහ පවතින ඉඩම් වටිනාකම් යනාදිය සලකා බැලීමේදී තක්සේරුවට ලක් කෙරෙන වත්කම, ඉඩම මිලදී ගැනීම සඳහා සාධාරණ වනු ඇත.

හඳුනා ගන්නා ලද සන්සන්දනීය වත්කම් නොහොත් දේපලවල ගලපන ලද මිල පරාසය පර්චසයකට රු. 5,000,000 සිට රු. 10,000,000 අතර බවට හඳුනා ගන්නා ලද අතර සාමාන්‍ය මිල ලක්ෂ්‍යය පර්චසයකට රු. 7,500,000 කි. මෙම විශ්ලේෂණය පදනම්ව බැලූ කල, වෙළෙඳපොලෙහි ස්ථානගතව පවතින මෙම තක්සේරුවට ලක් වන දේපලෙහි නිශ්චය දේපල නිපැයුම්වලට අදාළ පවතින වෙළෙඳපොල වටිනාකම, පර්චසයකට රු. 5,500,000 ක් වූ වටිනාකමකින් නියෝජනය වන්නේය යන්න මාගේ මතය වේ.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

කොවිඩ්-19 පිළිබඳ අදහස් දැක්වීම

මේ වන විට රට තුළත්, සමස්ථ ලෝකය පුරාත් ව්‍යාප්තව පවතින කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2020 මාර්තු 11 දින ගෝලීය වසංගතයක් වශයෙන් නම් කරන ලද අතර එමගින් දේශීය මෙන්ම ගෝලීය වෙළෙඳපොලවල් කෙරෙහිද බලපෑම් එල්ල වනු ඇති බව ප්‍රකාශිත විය.

මෙම වාර්තාකරණ දිනය වන විට, වසංගත තත්ත්වය අප රට තුළ ව්‍යාප්ත වීම සිදු වෙමින් පවතින අතර මේ නිසා මෙම වසංගත තත්ත්වයේ කවර හෝ බලපෑමක් මේ මොහොතේ සාධාරණ ලෙස තක්සේරු කිරීම හා ඇස්තමේන්තුගත කිරීම පමණට වඩා ඉක්මන් ප්‍රයත්නයක් ලෙස සැලකේ. කෙසේ වෙතත්, වසංගතයේ දැනට පවතින බලපෑම සලකා බැලීමේදී එමගින් දේපල වටිනාකම කෙරෙහි බරපතල ගනයේ බලපෑමක් එල්ල වනු ඇති බවක් මා විසින් නොසලකනු ලැබේ.

තීන්දු අපේක්ෂිත නඩු

ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 383/17 - **ශ්‍රේෂ්ඨාධිකරණය**

ණය අයකර ගැනීම්වලට අදාළ සාමාන්‍ය නඩුව හැරුණුකොට බැංකුවට එදිරිව පනවා ඇති එකම නඩුව වන්නේ මෙයයි. ආයෝජන දේපල සම්බන්ධයෙන් වෙනත් කිසිදු නඩුවක් නොමැත.

ක්ෂේත්‍ර කළමනාකාර තනතුර සඳහා උසස්වීම් අපේක්ෂාවෙන් ශාඛා කළමනාකාරවරුන් තිදෙනෙකු විසින් (නුවර එළිය, මාතර සහ කුරුණෑගල) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කර තිබේ.

මෙම නිලධාරීන් තිදෙනා අතරින් දෙදෙනෙකු සඳහා උසස්වීම් ලබා දී ඇත. පෙත්සම්කරුවන් විසින් එම නඩු ඉවත් කර ගෙන ඇති නමුදු නඩු සඳහා තීන්දු මෙතෙක් ලැබී නොමැත.

24. ශුද්ධ විලම්බිත බදු වත්කම්/(වගකීම්)

වර්ෂය	2020	2019
01/01 දිනට විවෘත කරන ශේෂය	112,649,070	87,528,467
ප්‍රතිප්‍රකාශිතයන්	-	-
පෙර වසරේ ගැලපීම්	-	(17,667,016)
- ලාභ සහ අලාභ	74,847,579	37,154,349
- වෙනත් විස්තීර්ණ ආදායම්/රඳවාගත් ඉපයීම්	17,581,815	5,633,270
12/31 දිනට වසා දැමෙන ශේෂය	205,078,464	112,649,070
විලම්බිත බදු වත්කම්	288,779,489	183,328,142
විලම්බිත බදු වගකීම්	83,701,025	70,679,072
ශුද්ධ විලම්බිත බදු වත්කම්/(වගකීම්)	205,078,464	112,649,070
	-	-

25. වෙනත් වත්කම්

වර්ෂය	2020	2019
ලැබිය යුතු වටිනාකම්	134,800,311	76,107,581
තැන්පතු හා ගෙවීම්	354,000	751,850
විවිධ ණය හිමියන්	27,156,437	17,594,382
වෙනත්	21,489,620	19,751,900
එකතුව	183,800,368	114,205,713

26. බැංකුවලට ගෙවිය යුතු

වර්ෂය	2020	2019
ණය ගැනීම්	2,408,780,533	953,384,855
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්	-	-
වෙනත්	-	-
එකතුව	2,408,780,533	953,384,855

27. ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වගකීම්

විවරණය	2020	2019
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	47,947,005,442	42,504,294,457
බැංකුව විසින් නිකුත් කළ ණය සුරුකුම්	-	-
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරුකුම්පත්	-	-
වෙනත්	1,429,155,847	1,603,783,508
එකතුව	49,376,161,289	44,108,077,966
අ. තැන්පත්කරුවන්ට ගෙවිය යුතු වටිනාකම් විශ්ලේෂණය		
නිෂ්පාදනය අනුව		
ඉල්ලුම් තැන්පතු (ජංගම ගිණුම්)		
ඉතුරුම් තැන්පතු	7,445,107,940	6,572,129,660
ස්ථාවර තැන්පතු	40,501,897,502	35,932,164,798
වෙනත් තැන්පතු	-	-
එකතුව	47,947,005,442	42,504,294,457
මුදල් ඒකකය අනුව		
ශ්‍රී ලංකා රුපියල්	47,947,005,442	42,504,294,457
ඇ. ඒ. ජ. ඩොලර්	-	-
මහා බ්‍රිතාන්‍ය පවුම්	-	-
වෙනත්	-	-
එකතුව	47,947,005,442	42,504,294,457

28. නිකුත් කළ ණය සුරුකුම්

විවරණය	2020	2019
බැංකුව විසින් නිකුත් කළ	1,422,976,094	4,042,358,842
වෙනත් පරිපාලිතයන් විසින් නිකුත් කළ	-	-
එකතුව	1,422,976,094	4,042,358,842
වසර 1 ක් තුළ ලැබිය යුතු	-	2,621,133,483
වසර 1 ට පසුව ලැබිය යුතු	1,422,976,094	1,421,225,359
එකතුව	1,422,976,094	4,042,358,842

අ. නිකුත් කළ ණය සුරුකුම් විස්තර

වර්ගය	කල් පිරීමේ මුල් මුදල	පොලි අනුපාතිකය සහ ආපසු ගෙවීමේ නියමයන්	නිකුත් කළ දිනය	කල් පිරීමේ දිනය	බැංකුව 2020	බැංකුව 2019
බැංකුව විසින් නිකුත් කළ						
ලැයිස්තුගත, සුරුකුම්ගත, මුදාහැරිය හැකි සහ ශ්‍රේණිගත 5 අවුරුදු වාර්ෂික ණයකර (අර්ධ ස්ථාවර)	2,012,990,000	11%	2015 නොවැම්බර් 20	2020 නොවැම්බර් 20	-	2,035,787,264
ලැයිස්තුගත, සුරුකුම්ගත, මුදාහැරිය හැකි සහ ශ්‍රේණිගත 5 අවුරුදු වාර්ෂික ණයකර (පාවෙන - කාර්තුමය)	578,240,000	AWPLR+1.5	2015 නොවැම්බර් 20	2020 නොවැම්බර් 20	-	585,346,218
ලැයිස්තුගත, සුරුකුම්ගත, මුදාහැරිය හැකි සහ ශ්‍රේණිගත 10 අවුරුදු වාර්ෂික ණයකර (ස්ථාවර වාර්ෂික))	1,408,770,000	12%	2015 නොවැම්බර් 20	2025 නොවැම්බර් 20	1,422,976,094	1,421,225,359
මුළු එකතුව					1,422,976,094	4,042,358,842

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

සන්සන්දනීය රජයේ සුරැකුම්පත්වල පොලී අනුපාතිකය

ණයකර වර්ගය	පොලී අනුපාතිකය %		රජයේ සුරැකුම්පත් පොලී අනුපාතිකය %	
	2020.12.31	2019.12.31	2020.12.31	2019.12.31
ණයකර - වසර 5 - 2015 (පාවෙන, කාර්තුමය 2020)	Matured	AWPLR +1.5%	6.59	9.87
ණයකර - වසර 5 - 2015 (අර්ධ ස්ථාවර 2020)	Matured	10.50	6.59	9.87
ණයකර - වසර 10 - 2015 (වාර්ෂික ස්ථාවර, 2025)	12.00	12.00	9.99	10.23

පොලී ආවරණය

ණයකර වර්ගය	පොලී ආවරණය අනුපාතිකය (කාලික)	
	2020.12.31	2019.12.31
ණයකර - වසර 5 - 2015 (පාවෙන, කාර්තුමය 2020)	42.27	28.61
ණයකර - වසර 5 - 2015 (අර්ධ ස්ථාවර 2020)	12.04	10.19
ණයකර - වසර 10 - 2015 (වාර්ෂික ස්ථාවර, 2025)	13.34	12.94

ණය/ස්කන්ධය

ණයකර වර්ගය	ණය/ස්කන්ධ අනුපාතිකය	
	2020.12.31	2019.12.31
ණයකර - වසර 5 - 2015 (පාවෙන, කාර්තුමය 2020)	0%	11.43%
ණයකර - වසර 5 - 2015 (අර්ධ ස්ථාවර 2020)	0%	39.77%
ණයකර - වසර 10 - 2015 (වාර්ෂික ස්ථාවර, 2025)	24.61%	27.76%

සමාලෝචිත වසර තුළ ණයකරවල වෙළෙඳපොල මිල

ණයකර වර්ගය	2020			2019		
	ඉහළම මිල	අඩුම මිල	අවසන් විකිණුම් මිල	ඉහළම මිල	අඩුම මිල	අවසන් විකිණුම් මිල
ණයකර - වසර 5 - 2015 (පාවෙන, කාර්තුමය 2020)	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි
ණයකර - වසර 5 - 2015 (අර්ධ ස්ථාවර 2020)	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි	නොවිකුණන ලදි
ණයකර - වසර 10 - 2015 (වාර්ෂික ස්ථාවර, 2025)	100	100	100	100	100	100

29. කල්බදු වගකීම

	2020	2019
මූලික හඳුනා ගැනීම (ආරම්භක ශේෂය)	310,149,189	282,551,299
නව ගිවිසුම මත කල්බදු වගකීම	82,216,599	72,972,946
එකතු කළා: ක්‍රමක්ෂිත පොලිය	33,880,454	33,382,431
අඩු කළා: ගෙවීම්	(76,809,733)	(78,757,487)
අවසාන ශේෂය	349,436,509	310,149,189

30. විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

	2020	2019
සාමාන්‍ය පාරිතෝෂික ප්‍රතිපාදන	446,575,293	369,533,735
විශේෂ පාරිතෝෂික ප්‍රතිපාදන	331,224,917	266,301,575
එකතුව	777,800,209	635,835,310

30.1 නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායක වීම්

2020 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම්හි ආයුගණක තක්සේරුව ගිණුම්කරණ හෙළිදරවු කිරීම්:	සාමාන්‍ය පාරිතෝෂිකය රු.	විශේෂ පාරිතෝෂිකය රු.	එකතුව රු.
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස් වීම			
2020 ජනවාරි 01 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස් වීම් සඳහා ප්‍රතිපාදනය	369,533,735	266,301,574	635,835,309
කාල සීමාව සඳහා පොලී පිරිවැය	40,648,711	29,293,173	69,941,884
කාල සීමාව සඳහා ප්‍රවර්තන සේවා පිරිවැය	26,302,419	17,955,413	44,257,831
කාල සීමාව තුළ ඉවත් වූවන් සඳහා ගෙවූ පාරිතෝෂික	(18,509,842)	(16,538,599)	(35,048,440)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස් වීම් මත ආයුගණක (ලාභ)/අලාභ	28,600,270	34,213,355	62,813,625
2020 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස් වීම් සඳහා ප්‍රතිපාදනය	446,575,293	331,224,917	777,800,209
ශේෂ පත්‍රයෙහි සහ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇති වටිනාකම්			
ශේෂ පත්‍රයෙහි හඳුනා ගෙන ඇති වගකීම්			
2020 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	446,575,293	331,224,917	777,800,209
2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ආයුගණක ලාභ/(අලාභ)	-	-	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයෙහි හඳුනා ගෙන ඇති වගකීම්	446,575,293	331,224,917	777,800,209
ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇති වියදම්			
පොලී පිරිවැය	40,648,711	29,293,173	69,941,884
ප්‍රවර්තන සේවා පිරිවැය	26,302,419	17,955,413	44,257,831
ක්ෂණිකව හඳුනා ගත් ශුද්ධ ආයුගණක (ලාභ)/අලාභ	28,600,270	34,213,355	62,813,625
ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇති වියදම්	95,551,399	81,461,941	177,013,341
ශේෂ පත්‍රයෙහි හඳුනා ගෙන ඇති ශුද්ධ වගකීම්වල චලනයන්			
2020 ජනවාරි 01 දිනට ආරම්භක ශුද්ධ වගකීම	369,533,735	266,301,574	635,835,309
ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇති වියදම්	95,551,399	81,461,941	177,013,341
කාල සීමාව තුළ ඉවත් වූවන් සඳහා ගෙවූ පාරිතෝෂික	(18,509,841)	(16,538,599)	(35,048,440)
කාල සීමාව තුළ ඉවත් වූවන් සඳහා ගෙවිය යුතු පාරිතෝෂික			
2020 දෙසැම්බර් 31 දිනට වසා දැමෙන ශුද්ධ වගකීම	446,575,293	331,224,917	777,800,209

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

තක්සේරුකරණ උපකල්පන:

මර්ත්‍යතාව : 1960/70 ක මර්ත්‍යතා චක්‍රයක්
ආබාධිතතාව : මර්ත්‍යතාවයෙන් 10% කි.
සේවක පිරිවැටුප් අනුපාතික: 2%

සාමාන්‍ය විශ්‍රාම ගැනීමේ වයස: අවු. 60 (නිශ්චිව කර ඇති විශ්‍රාම ගැනීමේ වයසට වඩා වියපත් සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයේදී විශ්‍රාම යනු ඇති බව උපකල්පනය කෙරේ)

වට්ටම් අනුපාතිකය : වසරකට 8%
වැටුප් ඉහළ නැංවීමේ අනුපාතික: ස්ථිර කාර්ය මණ්ඩලය: මූලික වැටුප: වසරකට 18%. මීළඟ සමාලෝචනය 2021 ජූලි මාසයේදී සිදු කිරීමට නියමිතය. වැටුප් වැඩි කිරීමේ පරාස සමාලෝචනය: වසරකට 18%. මීළඟ සමාලෝචනය 2021 ජූලි මාසයේදී සිදු කිරීමට නියමිතය.
ජීවන වියදම් දීමනා ගැලපුම : වසරකට 18%. මීළඟ සමාලෝචනය 2021 ජූලි මාසයේදී සිදු කිරීමට නියමිතය.

විශ්‍රාමික පාරිතෝෂික සූත්‍රය: සාමාන්‍ය පාරිතෝෂිකය - යටත් පිරිසෙයින් වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සෑම සේවකයෙකුම සිය මරණයට පෙරාතුව සමාගමෙන් ඉවත් වන්නේ නම් ඔහු/ඇය විසින් සම්පූර්ණ කරන ලද සෑම සේවා වර්ෂයකටම අදාළ අර්ධ මාසික වේතනය වැටුප.

සේවකයෙකුගේ මරණයකදී: ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා: සම්පූර්ණ කරන ලද වර්ෂයකටම අදාළව සෑම සේවකයෙකුම සඳහා මාස දෙකක වේතනය වැටුප, මාස 6 ක අවම වැටුප් සීමාවකට යටත්ව
අනෙකුත් සේවකයන් සඳහා: ඉහත ප්‍රතිලාභවලින් අඩක ගෙවිය යුතුය.
විශේෂ පාරිතෝෂිකය - යටත් පිරිසෙයින් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සෑම සේවකයෙකුම සඳහා අර්ධ මාසික වේතනය වැටුප.

2 වගුව: සාරාංශගත ප්‍රතිඵල (කාණ්ඩය අනුව)

කාණ්ඩය	සේවක සංඛ්‍යාව	ගෙවන ලද මූලික වැටුප් (රු.)	ගෙවන ලද වෙනත් දීමනා	සාමාන්‍ය පාරිතෝෂික ප්‍රතිපාදන (රු)	විශේෂ පාරිතෝෂික ප්‍රතිපාදන (රු.)	මුළු PV-DBO (රු.) (සාමාන්‍ය + විශේෂ පාරිතෝෂික)
ස්ථිර	541	33,024,524	17,820,027	440,680,997	324,953,602	765,634,600
අභ්‍යාසලාභී	20	272,000	0	190,059	79,380	269,439
කොන්ත්‍රාත්	73	2,141,375	0	353,470	114,545	468,015
එකතුව	634	35,437,899	17,820,027	441,224,526	325,147,527	766,372,053

3 වගුව: නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගය පිළිබඳ සංවේදිතා විශ්ලේෂණය

වෙනස් වූ උපකල්පනය (අනෙකුත් සියලු උපකල්පන නොවෙනස්ව පැවැති විට)	මුළු PV-DBO (රු.) (සාමාන්‍ය + විශේෂ පාරිතෝෂික)
වට්ටම් අනුපාතිකයෙහි 1% ඉහළ යාම	702,282,993
වට්ටම් අනුපාතිකයෙහි 1% පහළ යාම	841,073,042
වැටුප් වැඩි වීමෙහි 1% ඉහළ යාම	789,427,959
වැටුප් වැඩි වීමෙහි 1% පහළ යාම	744,133,414

සවිස්තර ගිණුම්කරණ හෙළිදරවු කිරීම්:

	සාමාන්‍ය පාරිතෝෂිකය - විශේෂ පාරිතෝෂිකය
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ බෙදා දැක්වීම (රු.)	
පළපුරුද්ද මත ගැලපීම් (මූල්‍ය හා ජනවිකාසනය)	(18,345,068.00)
මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන්	92,739,821.63
ජන විකාසනවල වෙනස්වීම් හේතුවෙන්	(11,581,128.63)
එකතුව	62,813,625.00

ඉදිරි වර්ෂවලදී නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගය බෙදී යාම (රු.) 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ

	සාමාන්‍ය පාරිතෝෂිකය - විශේෂ පාරිතෝෂිකය
2022 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය තුළ	33,180,419.30
2023 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය තුළ	49,817,800.55
2024 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය තුළ	43,057,396.35
2025 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය තුළ	63,070,895.67
ඉදිරි වසර 5 ට ඔබ්බෙන්	50,430,026.95
ඊළඟදා බැංවි 5 හැරී	526,815,514.64
	766,372,053.47
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල බරිත සාමාන්‍ය කාල සීමාව (වසරවලින්)	9.66

ආයුගණකවරයාගේ නම	වීම්. පූපාලනාදන්
ආයුගණන දිනය	2021 ජනවාරි 26
තක්සේරුකරණ ක්‍රමය	ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය

31. ප්‍රවර්තන බදු වගකීම්

වර්ෂය	2020	2019
01/01 දිනට විවෘත කරන ශේෂය	333,629,689	57,327,668
වසර සඳහා අය කිරීම් - ආදායම් බදු	435,146,769	309,423,162
වසර සඳහා අය කිරීම් - පෙර වසරේ ගැලපීම්	-	26,526,633
වසර සඳහා අය කිරීම් - වෙනත් බදු	319,756,444	474,949,765
වසර සඳහා මුළු අය කිරීම්	754,903,213	810,899,560
වසර සඳහා බදු ගෙවීම්	(646,759,838)	(534,597,539)
12/31 දිනට වසා දැමෙන ශේෂය	441,773,065	333,629,689

32. වෙනත් වගකීම්

වර්ෂය	2020	2019
විවිධ ණය හිමියන්	71,441,613	121,264,898
ගෙවිය යුතු පොලී	-	-
ශේෂ පත්‍රයෙන් බැහැර ණය නිරාවරණයන්වලට අදාළ හානිකරණ (10 සටහන)	-	-
වෙනත් ගෙවිය යුතු දෑ	118,153,524	64,129,671
එකතුව	189,595,136	185,394,569

33. නිත්‍ය බැඳුම්කර

	2020	2019
ප්‍රාග්ධනය	250,000,000	250,000,000
පොලී	31,250,000	16,708,172
එකතුව	281,250,000	266,708,172

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

අරමුණු අංකය	අපේක්ෂිත අරමුණු	වෙන් කළ වටිනාකම	යෝජිත උපයෝජ්‍ය දිනය	ඉදිරියට ගෙන ආ මුදල් වෙතින් වෙන් කළ වටිනාකම (අ)	ඉදිරියට ගෙන ආ මුළු මුදලේ % ක් ලෙස	ප්‍රයෝජිත වටිනාකම (ආ)	වෙන් කළ මුදලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගත් ප්‍රතිශතය (ආ)/(අ)	සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොමැති නම් එම අරමුදල් ආයෝජනය කළ කාරණයද ඇතුළුව පැහැදිලි කිරීම
1	ණය කළඹ ඉහළ නැංවීම	රු. මි. 250	14-06-2019	රු. මි. 250	100%	රු. මි. 250	100%	සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත
2	බැකුවේ ස්ථර 1 ප්‍රාග්ධන පදනම ඉහළ නැංවීම	රු. මි. 250	14-06-2019	රු. මි. 250	100%	රු. මි. 250	100%	සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත

34. ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය

	2020	2019
ප්‍රාග්ධනය	962,092,936	962,092,936
එකතුව	962,092,936	962,092,936

35. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

වර්ෂය	2020	2019
01/01 දිනට ආරම්භක ශේෂය	209,601,642	188,424,906
ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 ගැලපුම්/ප්‍රතිප්‍රකාශිතයන්	-	(2,608,886)
කාල සීමාව තුළ සංචිත වෙත මාරු කිරීම්	35,406,840	23,785,622
12/31 දිනට වසා දැමෙන ශේෂය	245,008,482	209,601,642

36. රඳවාගත් ඉපයීම්

වර්ෂය	2020	2019
01/01 දිනට ආරම්භක ශේෂය	3,679,558,147	3,319,553,632
ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 ගැලපුම්/ප්‍රතිප්‍රකාශිතයන්	-	(44,351,060)
වසර සඳහා ලාභය	708,136,803	475,712,442
වෙනත් සංචිත වෙත මාරු කිරීම් සහ ගැලපුම්	(106,220,518)	(71,356,866)
ලාභාංශ	-	-
12/31 දිනට වසා දැමෙන ශේෂය	4,281,474,432	3,679,558,147

37. වෙනත් සංචිත

අ. බැංකුව - ප්‍රවර්තන වර්ෂය (2020)

විස්තරය	2020/01/01 දිනට ආරම්භක ශේෂය	චලනයන්/මාරු කිරීම් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 ගැලපුම්	2020/12/31 දිනට අවසන් ශේෂය
සාමාන්‍ය සංචිත	345,604,782	70,813,680	416,418,462
ප්‍රත්‍යාගණන සංචිත	(0)	-	(0)
මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සංචිතය	-	-	-
විදේශ මුදල් පරිවර්තන සංචිතය	-	-	-
සමුච්චිත වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	(77,749,748)	(45,231,810)	(122,981,558)
වෙනත්	-	-	-
එකතුව	267,855,033	25,581,870	293,436,903

ආ. බැංකුව - පෙර වර්ෂය (2019)

විස්තරය	2019/01/01 දිනට ආරම්භක ශේෂය	චලනයන්/මාරු කිරීම්	2019/12/31 දිනට අවසන් ශේෂය
සාමාන්‍ය සංචිත	303,251,309	42,353,473	345,604,782
ප්‍රත්‍යාගණන සංචිත	28,886,773	(28,886,773)	-
මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සංචිතය	-	-	-
විදේශ මුදල් පරිවර්තන සංචිතය	-	-	-
සමුච්චිත වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	(45,597,180)	(32,152,568)	(77,749,748)
වෙනත්	-	-	-
එකතුව	286,540,902	(18,685,869)	267,855,033

38. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

වර්ෂය	2020	2019
ඇපකර	7,623,000	5,870,000
බැඳුම්කර	-	-
ණයවර ලිපි	-	-
වෙනත් අසම්භාව්‍ය අයිතම	-	-
මුදා නොහරින ලද ණය	372,388,076	426,371,260
වෙනත්	-	-
එකතුව	380,011,076	432,241,260

39. සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය

වර්ෂය	2020	2019
ශුද්ධ වත්කම්	5,782,012,753	5,119,107,758
සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	64,710,520	64,710,520
සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය	89.35	79.11

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සංඛ්‍යා රුපියල්වලිනි)

39.1 කල් පිරීම් පරතර විශ්ලේෂණය

ශේෂ පත්‍ර දිනයේ සිට අදාළ ගිවිසුම්ගත කල් පිරීමේ දිනය දක්වා ඉතිරිව ඇති කාලය මත පනදම් වූ වත්කම් හා වගකීම් විශ්ලේෂණයක් පහත දැක්වේ:

2020 දෙසැම්බර් 31 දිනට (රු. 000')	මාස 1 දක්වා	1 - 3 මාස	3 - 12 මාස	1 - 5 වර්ෂ	වසර 5 ට වැඩි	එකතුව
වත්කම්						
මුදල්	155,041	-	-	-	-	155,041
බැංකුවලින් ලැබිය යුතු	150,848		-	-	-	150,848
ආයෝජන	3,252,794	5,843,161	7,416,680	893,353	-	17,405,988
ණය හා අත්තිකාරම්	353,284	1,267,835	7,081,355	14,409,486	18,080,029	41,191,989
ස්ථාවර වත්කම්	-	-	-	-	720,540	720,540
වෙනත් වත්කම්	19,659	60,367	76,057	84,282	1,165,015	1,405,379
මුළු වත්කම්	3,931,626	7,171,363	14,574,092	15,387,121	19,965,584	61,029,786
2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිශතය	6.44	11.75	23.88	25.21	32.71	100.00
2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිශතය	14.05	7.41	16.48	27.46	34.60	100.00
වගකීම්						
මුළු ප්‍රාග්ධන අරමුදල	-	-	-	-	5,782,013	5,782,013
තැන්පතු	5,350,033	9,253,538	16,053,043	8,937,391	8,353,001	47,947,005
ණය ගැනීම්	677,272	148,487	754,435	3,049,262	912,707	5,542,162
වෙනත් බැරකම්	165,071	41,455	505,998	504,563	541,519	1,758,605
මුළු වගකීම්	6,192,375	9,443,480	17,313,476	12,491,216	15,589,239	61,029,786
2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිශතය	10.15	15.47	28.37	20.47	25.54	100.00
2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිශතය	8.07	11.15	40.45	12.60	27.74	100.00

39.2 කල් පිරීම් විශ්ලේෂණය - කල්බදු වගකීම්

	මාස 1 දක්වා	1-3 මාස	3-12 මාස	1-5 වර්ෂ	වසර 5 ට වැඩි	එකතුව
කල්බදු වගකීම	5,330,125	10,660,250	47,971,123	285,475,011	-	349,436,509

40. බැංකුව සමග ඇති ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ අභිලාෂය

නම	සම්බන්ධිත පාර්ශ්වය	තනතුර	ගනුදෙනු (රු.මි.)	ගනුදෙනුවල ස්වභාවය	නියාමන ප්‍රාග්ධනයේ %
ඩී. එම්. ඒ. කේ. දිසානායක මහතා	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	උප සභාපති	35.00	කුලී/ඉතුරුම් තැන්පතු	0.59 %
ආර්. එම්. ආර්. වසන්තා මංචනායක මහත්මිය	අධ්‍යක්ෂ - එච්ඩීඩබ්ලිසී	සභාපති	10.00	ඉතුරුම්/ස්ථාවර තැන්පතු	0.17%
කේ. ඩී. ගුණවර්ධන මහතා	අධ්‍යක්ෂ - එච්ඩීඩබ්ලිසී	අධ්‍යක්ෂ	0.11	ඉතුරුම්/ස්ථාවර තැන්පතු	0.00%
පී. ඒ. එස්. අතුල කුමාර මහතා	අධ්‍යක්ෂ - එච්ඩීඩබ්ලිසී	අධ්‍යක්ෂ	0.07	ඉතුරුම්/ස්ථාවර තැන්පතු	0.00%
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා	අධ්‍යක්ෂ - එච්ඩීඩබ්ලිසී	අධ්‍යක්ෂ	0.16	ඉතුරුම්/ස්ථාවර තැන්පතු	0.00%
එස්. එන්. මොරායස් මහතා	අධ්‍යක්ෂ - එච්ඩීඩබ්ලිසී	අධ්‍යක්ෂ	0.32	ඉතුරුම්/ස්ථාවර තැන්පතු	0.01%
	එකතුව		45.660		0.78%

40.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග පවත්වන ලද ගනුදෙනු පහත දැක්වේ (ශේෂය 12.31 දිනට)	2020 රු.000'	නියාමන ප්‍රාග්ධනයේ %
ණය හා අත්තිකාරම්	58,052	0.98%
තැන්පතු	48,349	0.82%
එකතුව	106,401	1.80%

41. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසුව උද්ගත වූ සිදුවීම්

බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව උද්ගත වී ඇති, එමෙන්ම ගැලපීම් සිදු කිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කිරීම අවශ්‍ය වන සැලකිය යුතු මට්ටමේ සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

42. අනුකූලතාව සඳහා අවශ්‍ය අවම කොටස් හිමියන්

5 විකල්පය	අනුකූලතාව සඳහා අවශ්‍ය අවම කොටස් හිමියන්		
	පාවීමට ගලපන ලද වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය	පොදු කොටස් හිමි ප්‍රතිශතය	පොදු කොටස් හිමියන් සංඛ්‍යාව
අවම	Less Than 2.5 Bn	20%	500
පවතින	0.84	35.80%	2,383

43. ඔඩපනය කරන වත්කම්

	පහසුකම් වර්ගය	පහසුකමේ වටිනාකම රු. මිලියන	සුරැකුමෙහි ස්වභාවය	සුරැකුම් වටිනාකම (රු.මිලියන)	2020-12-31 දිනට ශේෂය (රු. මිලියන)
(1)	අයිරා (සම්පත් බැංකුව)	300	සුරැකුම් නොකළ	-	(90)
(2)	ණය ගැනීම් (කාල ණය) (1) (සම්පත් බැංකුව)	1,750	කළඹෙහි කොටස	998	983
(3)	ණය ගැනීම් (කාල ණය) (ලංකා බැංකුව)	500	සුරැකුම් නොකළ	-	317
(4)	ණය ගැනීම් (කාල ණය) (PABC)	500	සුරැකුම් නොකළ	-	492
(5)	අයිරා (ලංකා බැංකුව)	500	සුරැකුම් නොකළ	-	(450)
(6)	ණය ගැනීම් (MCB)	250	කළඹෙහි කොටස	335	70

	පහසුකම් වර්ගය	පහසුකමේ වටිනාකම රු. මිලියන	සුරැකුමෙහි ස්වභාවය	සුරැකුම් වටිනාකම (රු.මිලියන)	2020-12-31 දිනට ශේෂය (රු. මිලියන)
(1)	ලැයිස්තුගත, සුරැකුම් කළ, මුදවා ගත හැකි ණයකර	1,409	සුරැකුම් නොකළ	-	1,402



අතිරේක තොරතුරු

මූල්‍ය උපකරණ මිනුම්ගත කිරීම

(සංඛ්‍යා රුපියල්වලිනි)

අ). මිනුම්කරණ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය කිරීම - 2020.12.31 දිනට

විස්තරය	AC	FVPL	FVOCI	වෙනත්	එකතුව
වත්කම්					
මුදල් හා මුදල් සමාන දෑ	-	-	-	305,889,183	305,889,183
ශ්‍රී ලංකා මහ බැංකුව සමග ශේෂයන්	-	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	9,859,832,746	-	-	-	9,859,832,746
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		-	-	-	-
ණය හා අත්තිකාරම්	41,191,989,221	-	-	-	41,191,989,221
ණය උපකරණ	7,546,155,115	-	-	-	7,546,155,115
ස්කන්ධ උපකරණ	-	-	-	-	-
මුළු මූල්‍ය වත්කම්	58,597,977,083	-	-	305,889,183	58,903,866,266
වෙනත් වත්කම්	-	-	-	2,125,919,323	2,125,919,323
මුළු වත්කම්	58,597,977,083	-	-	2,431,808,506	61,029,785,590

විස්තරය	AC	FVPL	වෙනත්	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	2,408,780,533	-	-	2,408,780,533
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වගකීම්	-	-	-	-
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	47,947,005,442	-	-	47,947,005,442
- ණය සුරැකුම් හිමියන්ට ගෙවිය යුතු	1,422,976,094	-	-	1,422,976,094
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	1,710,405,847	-	-	1,710,405,847
මුළු මූල්‍ය වගකීම්	53,489,167,916	-	-	53,489,167,916
වෙනත් බැරකම්	349,436,509	-	1,409,168,411	1,758,604,919
ස්කන්ධය	-		5,782,012,753	5,782,012,753
මුළු වගකීම් සහ ස්කන්ධය	53,838,604,424	-	7,191,181,164	61,029,785,590

AC - ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්/වගකීම්

FVPL - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම්/වගකීම්

FVOCI - වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

මූල්‍ය උපකරණ මිනුම්ගත කිරීම

ආ). බැංකුව - පෙර වර්ෂය (2019.12.31 දිනට)

විස්තරය	AC	FVPL	FVOCI	වෙනත්	එකතුව
වත්කම්					
මුදල් හා මුදල් සමාන දෑ	-	-	-	421,218,289	421,218,289
ශ්‍රී ලංකා මහ බැංකුව සමග ශේෂයන්	-	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	7,539,925,299	-	-	-	7,539,925,299
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-
ණය හා අත්තිකාරම්	41,215,592,671	-	-	-	41,215,592,671
ණය උපකරණ	4,880,392,998	-	-	-	4,880,392,998
ස්කන්ධ උපකරණ	-	19,250,000	-	-	19,250,000
මුළු මූල්‍ය වත්කම්	53,635,910,968	19,250,000	-	421,218,289	54,076,379,257
වෙනත් වත්කම්	-	-	-	1,878,267,092	1,878,267,092
මුළු මූල්‍ය වත්කම්	53,635,910,968	19,250,000	-	2,299,485,380	55,954,646,348

විස්තරය	AC	FVPL	වෙනත්	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	953,384,855	-	-	953,384,855
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-
ක්‍රමකෂිත පිරිවැයට මූල්‍ය වගකීම්	-	-	-	-
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	42,504,294,457	-	-	42,504,294,457
- ණය සුරැකුම් හිමියන්ට ගෙවිය යුතු	4,042,358,842	-	-	4,042,358,842
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	1,870,491,681	-	-	1,870,491,681
මුළු මූල්‍ය වගකීම්	49,370,529,835	-	-	49,370,529,835
වෙනත් බැරකම්	310,149,189	-	1,154,859,568	1,465,008,757
ස්කන්ධය	-	-	5,119,107,758	5,119,107,758
මුළු වගකීම් සහ ස්කන්ධය	49,680,679,024	-	6,273,967,326	55,954,646,348

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

ප්‍රාග්ධන පදනම 2020 දෙසැම්බර් 31 දිනට	2020 (රු.000')	2019 (රු.000')
මුළු පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධනය		
ගෙවා නිමි සාමාන්‍ය කොටස්/පොදු ව්‍යාපාර වස්තු/පැවරූ ප්‍රාග්ධනය	647,105	647,105
කොටස් වාරික	314,988	314,988
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	245,008	209,602
ප්‍රකාශිත රඳවාගත් ලාභ/(සමුච්චිත අලාභ)	4,281,474	3,679,558
සමුච්චිත වෙනත් විස්තීර්ණ ආදායම්		
සාමාන්‍ය හා වෙනත් සංචිත	416,418	345,605
මුළු විකතුව	5,904,994	5,196,858
CET1 ප්‍රාග්ධනයට සිදු කළ මුළු ගැලපීම්		
විලම්බිත බදු වත්කම් (ශුද්ධ)	205,078	112,649
වෙනත් අස්පෘශ්‍ය වත්කම් (ශුද්ධ)	127,570	152,781
කොටස් හිමිකාරත්ව සැලැස්මක් යටතේ බැංකුවේ කොටස් මිල දී ගැනීම සඳහා බැංකුවේ සේවකයන් වෙත ලබා දෙන ලද අත්තිකාරම්		
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 10 කට අධික ප්‍රමාණයක හිමිකාරත්වය බැංකුව සතුව නොපවතින බැංකු හෝ මූල්‍ය ආයතනයක ප්‍රාග්ධනය වෙනුවෙන් සිදු කළ ආයෝජන		27,941
ගැලපුම්වලින් පසුව මුළු පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධනය	5,572,346	4,903,486
ගැලපුම්වලින් පසුව අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය		
අතිරේක ස්ථර 1 ප්‍රාග්ධන උපකරණ	250,000	250,000
මුළු ස්ථර 1 ප්‍රාග්ධනය	5,822,346	5,153,486
විකතු කිරීම්වලින් පසුව ස්ථර 2 ප්‍රාග්ධනය		
සාමාන්‍ය ප්‍රතිපාදන (1 හා 2 අවධි හානිකරණය)	134,804	252,429
අඩු කිරීම්		
නිකුත් කර ඇති ප්‍රාග්ධනය දරන ජන්ද හිමිකමෙන්සියයට 10 කට අධික ප්‍රමාණයක හිමිකාරත්වය බැංකුව සතුව නොපවතින මූල්‍ය ආයතනයක ප්‍රාග්ධනය වෙනුවෙන් සිදු කළ ආයෝජන		252,429
ස්ථර ෂෂ ප්‍රාග්ධනය:	134,804	
ප්‍රාග්ධන පදනම	5,957,151	5,153,486
අවදානම් ගලපන ලද මුළු ශේෂයන් (ණය අවදානම, වෙළෙඳපොල අවදානම, මෙහෙයුම් අවදානම)	28,819,963	26,931,562
අවදානම් ගලපන ලද ප්‍රාග්ධන අනුපාතික		
පොදු කොටස් ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතිකයෆ	19.34%	18.21%
ස්ථර I (මුළු ස්ථර 1 ප්‍රාග්ධනය/ මුළු අවදානම් ගලපන ලකද ශේෂ) **	20.20%	19.14%
ස්ථර II (ප්‍රාග්ධන පදනම / මුළු අවදානම් ගලපන ලද ශේෂ) ***	20.67%	19.14%

* අවමය 7.00 ** අවමය 8.50% *** අවමය 12.50%

අවදානම් ගලපන ලද ශේෂ පත්‍ර නිරාවරණය - රු. 000'

2020 දෙසැම්බර් 31 දිනට	ශේෂය		අවදානම් බරතැබීම්	අවදානම් ගලපන ලද ශේෂය	
	2020	2019	(%)	2020	2019
නිරාවරණය					
මුදල් - දේශීය මුදල් ඒකකය	155,041	150,213	0%		
ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	4,920,030	2,963,655	0%		
ශ්‍රී ලංකා මහ බැංකුව			0%		
රාජ්‍ය අංශයේ ආයතන මත හිමිකම්			100%		
ණය හා අත්තිකාරම්					
පදිංචි දේපල ඇප මගින් සුරැකුම් කළ හිමිකම්					
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් ලත් හිමිකම්	10,318,465	10,820,351	50%	5,159,232	5,410,176
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් නොලත් හිමිකම්	553,545	1,493,076	100%	553,545	1,493,076
සේවක අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස පවතින නිවාස ණය	11,119,023	10,179,298	0%		-
මුදල් ආන්තික ණය	1,712,333	1,687,318	0%		-
ස්වර්ණාභරණ ණය			0%		-
විචක්ෂණ අනුපාතයට ණය අනුපාතය 70% හෝ ඊට අඩු වන	22,511	14,301	0%		-
විචක්ෂණ අනුපාතයට ණය අනුපාතය 70% ට වැඩි සහ 100% අඩු වන	225,104	75,772	20%	45,021	15,154
විචක්ෂණ අනුපාතයට ණය අනුපාතය 100% හෝ ඊට වැඩි වන	175,184	202,964	100%	175,184	202,964
වෙළෙඳ ආයෝජන		25,000			
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් ලත් සුළු හිමිකම්			75%		
නිශ්චල දේපල ඇප මගින් සුරැකුම් කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික නිරාවරණ	1,258,581	1,448,417	60%	755,148	869,050
වෙනත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික නිරාවරණ	1,366,207	279,622	75%	1,024,655	209,716
ඒකාල නිරාවරණ	7,930,156	8,360,656	75%	5,947,617	6,270,492
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් නොලත් සුළු හිමිකම්	20,516	53,240	100%	20,516	53,240
ස්ථිර දේපල ඇප මගින් සුරැකුම් කළ හිමිකම්			100%		
අක්‍රිය වත්කම්					
නියමිත දින පසු වූ පදිංචි දේපල උකසට තැබූ ණය					
සුවිශේෂී ප්‍රතිපාදන 20% ට වැඩි වන	582		50%	291	
සුවිශේෂී ප්‍රතිපාදන 20% ට අඩු වන	2,231,504	1,393,860	100%	2,231,504	1,393,860

2020 දෙසැම්බර් 31 දිනට	ශේෂය		අවදානම් බරතැබීම්	අවදානම් ගලපන ලද ශේෂය	
	2020	2019	(%)	2020	2019
ඇපකරුවන් සහිත නිවාස ණය හා වෙනත් කල්බදු					
සුවිශේෂී ප්‍රතිපාදන 20% ට වැඩි වන			100%		
සුවිශේෂී ප්‍රතිපාදන 20% ට අඩු වන	1,816,083	1,239,491	150%	2,724,124	1,859,237
මාස තුනකට අඩු කාලයකදී දේශීය වාණිජ බැංකුවලින් ලැබිය යුතු (AAA to BBB-)	8,386,474	6,751,499	20%	1,677,295	1,350,300
මාස තුනකට අඩු කාලයකදී දේශීය වාණිජ බැංකුවලින් ලැබිය යුතු (BB+ to B-)	557,324	511,998	50%	278,662	255,999
මාස තුනකට වැඩි කාලයකින් දේශීය වාණිජ බැංකුවලින් ලැබිය යුතු (AAA to AA-)	25,766		20%	5,153	
මාස තුනකට වැඩි කාලයකින් දේශීය වාණිජ බැංකුවලින් ලැබිය යුතු (A+ to BBB-)	1,554,347	1,204,187	50%	777,174	602,093
මාස තුනකට වැඩි කාලයකදී දේශීය වාණිජ බැංකුවලින් ලැබිය යුතු (BB+ to B-)			100%		
මූල්‍ය ආයතන/ප්‍රාථමික වෙළෙඳ ඒකක/මූල්‍ය සමාගම් මත හිමිකම් (AAA to AA-)		201,283	20%		40,257
මූල්‍ය ආයතන/ප්‍රාථමික වෙළෙඳ ඒකක/මූල්‍ය සමාගම් මත හිමිකම් (A+ to BBB- සහ ශ්‍රේණිගත නොවූ)	2,161,871	1,784,488	50%	1,080,935	892,244
මූල්‍ය ආයතන/ප්‍රාථමික වෙළෙඳ ඒකක/මූල්‍ය සමාගම් මත හිමිකම් (BB+ to B-) සහ ශ්‍රේණිගත නොවූ	287,189	327,712	100%	287,189	327,712
වෙනත් මූල්‍ය ආයතන මත හිමිකම්	508,639	276,555	50%	254,320	138,278
සංස්ථා මත හිමිකම් (BBB+ to BB-)			100%		
සංස්ථා මත හිමිකම් (BB- ට පහළ)	64,490	58,469	150%	96,735	87,703
සංස්ථා මත හිමිකම් (ශ්‍රේණිගත නොවූ)	228,293	535,551	100%	228,293	535,551
ස්ථාවර වත්කම්	223,329	227,519	100%	223,329	227,519
වෙනත් වත්කම්	1,519,239	1,385,318	100%	1,519,239	1,385,318
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් ලත් සුළු හිමිකම්					
- ශේෂ පත්‍රයෙන් බැහැර	59,341,826	53,651,814		25,065,163	23,619,940
නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් ලත් සුළු හිමිකම් - ශේෂ පත්‍රයෙන් බැහැර	7,623	5,870	100%	7,623	5,870
මුළු අවදානම් බරතැබූ වත්කම්	59,349,449	53,657,684		25,072,786	23,625,810
මෙහෙයුම් අවදානම සඳහා මුළු අවදානම් ගලපන ලද ශේෂය				3,747,177	3,265,752
වෙළෙඳපොල අවදානම සඳහා මුළු අවදානම් ගලපන ලද ශේෂය					40,000
අවදානම් ගලපන ලද මුළු ශේෂයන් (ණය අවදානම, වෙළෙඳපොල අවදානම, මෙහෙයුම් අවදානම)				28,819,963	26,931,562

කොටස් තොරතුරු

2020-12-31 දිනට

කොටස් හිමියන්ගේ සංයුතිය හා බෙදී යාම (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.6(X) ට අනුව)

කොටස් හිමියන්	2020 දෙසැම්බර් 31								
	නේවාසික			අනේවාසික			එකතුව		
	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%
1 - 1,000	1,710	923,737	1.43	5	1,309	0.00	1,715	925,046	1.43
1,001 - 10,000	531	1,901,242	2.94	4	13,000	0.02	535	1,914,242	2.96
10,001 - 100,000	121	2,889,785	4.47	1	50,000	0.08	122	2,939,785	4.55
100,001 - 1,000,000	15	2,735,149	4.23	2	260,180	0.40	17	2,995,329	4.63
1,000,000 ට වැඩි	3	46,781,118	72.29	1	9,155,000	14.15	4	55,936,118	86.44
එකතුව	2,380	55,231,031	85.35	13	9,479,489	14.65	2,393	64,710,520	100.00

කොටස් හිමියන්	2019 දෙසැම්බර් 31								
	නේවාසික			අනේවාසික			එකතුව		
	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%
1 - 1,000	1,609	910,014	1.41	7	2,169	0.00	1,616	912,183	1.41
1,001 - 10,000	525	1,888,162	2.92	3	11,000	0.02	528	1,899,162	2.94
10,001 - 100,000	119	2,796,504	4.32	1	50,000	0.08	120	2,846,504	4.40
100,001 - 1,000,000	16	2,856,373	4.41	2	260,180	0.40	18	3,116,553	4.81
1,000,000 ට වැඩි	3	46,781,118	72.29	1	9,155,000	14.15	4	55,936,118	86.44
එකතුව	2,272	55,232,171	85.35	14	9,478,349	14.65	2,286	64,710,520	100.00

කොටස් හිමියන්ගේ සංයුතිය හා බෙදී යාම (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.6(x) ට අනුව)

	2020 දෙසැම්බර් 31				2019 දෙසැම්බර් 31			
	කොටස් හිමියන් සංඛ්‍යාව	%	කොටස් සංඛ්‍යාව	%	කොටස් හිමියන් සංඛ්‍යාව	%	කොටස් සංඛ්‍යාව	%
පුද්ගලික	2,263	94.57	6,089,635	9.41	2,152	94.14	5,940,730	9.18
ආයතන	130	5.43	58,620,885	90.59	134	5.86	58,769,790	90.82
එකතුව	2,393	100.00	64,710,520	100.00	2,286	100.00	64,710,520	100.00

විශාලතම කොටස් හිමියන් 25 දෙනා (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.6 (III) ට අනුව)

	කොටස් හිමියාගේ නම	කොටස් සංඛ්‍යාව 2020	ප්‍රතිශතය 2020	කොටස් සංඛ්‍යාව 2019	ප්‍රතිශතය 2019
1	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	32,180,000	49.73	32,180,000	49.73
2	එල් ඕ එල් සී හෝල්ඩින් පී එල් සී	9,707,740	15.00	9,707,740	15.00
3	තර්ස්ටන් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්	9,155,000	14.15	9,155,000	14.15
4	සම්පත් බෑන්ක් පී එල් සී /ආචාර්ය ටී. සෙන්තිවර්ල්	4,893,378	7.56	4,893,378	7.56
5	නාගරික සංවර්ධන අධිකාරිය	300,000	0.46	300,000	0.46
6	සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	300,000	0.46	300,000	0.46
7	ආචාර්ය ආර්. ආර්. ද සිල්වා	295,126	0.46	295,126	0.46
8	සම්පත් බෑන්ක් පී එල් සී/ඒ. සිදම්පලම් මහතා	258,054	0.40	258,054	0.40
9	ෆින්කෝ හෝල්ඩිංස් (පෞද්.) සමාගම	185,000	0.29	185,000	0.29
10	සීමාසහිත වික්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම	180,000	0.28	180,000	0.28
11	ඩී. වී ද සොයිසා මහතා	170,000	0.26	170,000	0.26
12	එස්. සී. පෙරේරා මහතා	164,030	0.25	164,030	0.25
13	රවර්ඩ් පීරිස් ෆයිනෑන්ෂල් සර්විසස් පුද්. සමාගම/ඒ. ඒ. කරීම්	148,074	0.23	141,485	0.22
14	එස්. එන්. සී. ඩබ්ලිව්. එම්. ඩී. සී. කන්දෙගෙදර මහතා	139,568	0.22	139,568	0.22
15	ආචාර්ය වයි. සේන	133,180	0.21	133,180	0.21
16	එස්. අභිෂේක් මහතා	128,709	0.20	128,709	0.20
17	සෙසෙකා ලිමිටඩ්	127,000	0.20	127,000	0.20
18	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	120,000	0.19	120,000	0.19
19	මාර්ග සංවර්ධන අධිකාරිය	120,000	0.19	120,000	0.19
20	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	120,000	0.19	120,000	0.19
21	සීවිෆ්සීසී බෑන්ක් පී එල් සී/ එන් වී එල් ඩයස්/ ඩී ඩයස්	106,588	0.16	106,588	0.16
22	එස්. දුර්ගා මෙනවිය	88,500	0.14	88,500	0.14
23	ජී. වී. එම්. පී. චන්දන මහතා	86,072	0.13	-	-
24	ඒ. එච්. මුණසිංහ මහතා	85,000	0.13	85,000	0.13
25	පී. ජී. පියසිරි මහතා	74,134	0.11	-	-
	එකතුව	59,296,171	91.63	59,296,171	91.63

කොටස් තොරතුරු

වෙළෙඳපොල මිල ගණන් (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.6 (XI) ට අනුව)

	2020 රු.	2019 රු.
වැඩිම	41.50	35.00
අඩුම	14.00	20.00
වර්ෂය අග	36.20	32.00

අනුපාතික පිළිබඳ තොරතුරු (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.6(XI) ට අනුව)

	2020	2019
කොටසකට ලාභාංශ (රු.)	0.25	-
ලාභාංශ ගෙවීමේ අනුපාතිකය (%)	2.28	-
කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.)	89.35	79.11
කොටසකට ඉපැයීම් (රු.)	10.94	7.35

අධ්‍යක්ෂවරුන් සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සතු කොටස් හිමිකාරත්වය (2020 දෙසැම්බර් 31 දින)

නම	2020	2019
ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය	Nil	Nil
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන	1,000	1,000
ආචාර්ය එස්. එන්. මොරායස්	1,000	1,000
පී. ඒ. එස්. ඒ. කුමාර මහතා	Nil	Nil
එල්. ඊ. එස්. සිල්වා මහතා	1,000	Nil
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ	1,000	Nil
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා	Nil	Nil
පාලිත ගමගේ මහතා (කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී)	Nil	Nil

ප්‍රසිද්ධ කොටස් හිමිකාරත්වය (කොළඹ කොටස් හුවමාරුවේ රීති අංක 7.13.1 ට අනුව)

	2020	2019
ප්‍රසිද්ධ කොටස් හිමියන් සංඛ්‍යාව	2,383	2,272
ප්‍රසිද්ධ කොටස් හිමිකාරත්වය	23,168,429	23,156,274
ප්‍රසිද්ධ කොටස් හිමිකාරත්වයේ ප්‍රතිශතය	35.803%	35.784%

අගය එකතු කිරීමේ ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

රු. 000'	බැංකුව			
	%	2020	%	2019
පොලී ආදායම		7,456,679		7,683,162
වෙනත් ආදායම්		399,754		407,303
දළ ආදායම		7,856,434		8,090,465
සේවා පිරිවැය		4,812,186		5,189,793
මුළු අගය එකතු කිරීම්		3,044,248		2,900,672
සේවකයන් වෙත බෙදා දෙන ලද				
(වැටුප් හා ප්‍රතිලාභ)	38.6	1,174,051	40.1	1,164,469
රජය වෙත	22.3	678,895	26.7	773,835
ආදායම් බදු	11.8	360,299	10.3	298,795
එකතු කළ අගය මත බදු, ජා.ගොඩ.නැ. බදු හා මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු	10.3	312,686	16.2	469,973
ජාතිය ගොඩනැගීමේ බද්ද	-	-	-	-
කෘෂි භෝග රක්ෂණ බද්ද	0.2	5,792	0.2	4,822
මුද්දර ගාස්තු	0.0	119	0.0	245
	22.3		26.7	
කොටස් හිමියන් වෙත (ලාභාංශ)	-	-	-	-
		*		*
ව්‍යාය තුළ රඳවා ගත්	39.1	1,191,301	33.2	962,369
රඳවාගත් ඉපැයීම්	23.3	708,137	16.4	475,712
ක්ෂය කිරීම්	5.1	156,638	5.6	163,763
ණය අලාභ ප්‍රතිපාදන	10.7	326,526	11.1	322,893
මුළු අගය බෙදා හැරීම්	100.0	3,044,248	100.0	2,900,672





දස වාර්ෂික සාරාංශය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය (රු. මිලියන)	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
මෙහෙයුම් ප්‍රතිඵල										
ආදායම	2,386	2,744	3,803	4,566	4,925	5,928	6,978	7,120	8,090	7,856
පොලී ආදායම	2,261	2,635	3,528	4,378	4,660	5,473	6,614	6,679	7,683	7,457
පොලී වියදම්	1,354	1,805	2,469	2,535	2,539	3,509	4,742	4,441	4,783	4,475
වෙනත් ආදායම්	82	110	275	188	265	455	365	442	407	400
මෙහෙයුම් වියදම්	620	762	938	1,123	1,288	1,409	1,472	1,668	1,740	1,674
අලාභ සඳහා ප්‍රතිපාදන	10	1	87	131	89	160	-57	93	323	327
බදුවලට පෙර ලාභය	402	176	309	777	1,009	848	821	919	1,244	1,381
ආදායම් බදු හා මූල්‍ය වැට් බදු	186	120	151	402	500	365	407	354	769	673
බදු අය කිරීමට පසු ලාභය	216	56	158	375	509	483	414	564	476	708
වගකීම් සහ කොටස් හිමියන්ගේ අරමුදල්										
පාරිභෝගික තැන්පතු	12,336	14,695	18,902	24,479	28,593	32,123	36,655	37,016	42,504	47,947
ණය ගැනීම්	3,556	3,214	5,257	6,213	9,037	8,863	7,917	6,653	6,866	5,542
වෙනත් බැරකම්	1,699	500	834	840	920	872	920	860	1,465	1,759
කොටස් හිමි අරමුදල්	2,337	2,391	2,575	2,886	3,364	3,821	4,232	4,757	5,119	5,782
එකතුව	19,927	20,801	27,567	34,418	41,913	45,679	49,724	49,285	55,955	61,030
වත්කම්										
ණය හා අත්තිකාරම්	14,888	15,966	19,701	23,357	26,685	30,260	34,968	37,949	41,216	41,192
මුදල්,කෙටි කාලීන හා ව්‍යවස්ථාපිත අරමුදල්	3,960	3,679	6,601	8,997	11,852	11,807	11,027	7,592	11,984	17,186
HTC & Sell, FVTPL ආයෝජන				850	2,043	2,053	2,115	2,014	877	526
දේපල, පිරියත සහ උපකරණ	250	288	290	296	435	478	513	466	380	351
වෙනත් වත්කම්	830	868	975	918	898	1,080	1,101	1,264	1,498	1,775
එකතුව	19,927	20,801	27,567	34,418	41,913	45,679	49,724	49,285	55,955	61,030
අනුපාතික										
කොටස් හිමි අරමුදල් සාමාන්‍යය මත ලාභය (%)	10.3	2.35	6.36	13.72	16.30	13.46	10.29	12.56	9.63	12.99
ආදායම වර්ධනය (%)	6.0	15.0	38.6	20.1	7.9	20.3	17.7	2.0	13.6	-2.9
වත්කම් සාමාන්‍යය මත ලාභය (%)	1.2	0.27	0.65	1.21	1.33	1.10	0.87	1.14	0.90	1.21
තැන්පතුවලට අත්තිකාරම් හා ණය ගැනීම් (%)	106.7	112.2	122.6	131.4	141.0	135.4	127.5	115.1	119.8	129.9
කොටස් හිමි අරමුදල් මත දේපල, පිරියත හා උපකරණ (%)	10.7	12.0	11.2	10.3	12.9	12.5	12.1	9.8	7.4	6.1
කොටස් හිමි අරමුදල්වලට මුළු වත්කම්	8.53	8.70	10.70	11.93	12.46	11.95	11.75	10.36	10.93	10.53
කොටස් තොරතුරු										
කොටසකට වෙළෙපොල අගය (රු.)	රු. 100/- කොටස් සඳහා		රු. 10/- කොටස් සඳහා							
ඉහළ (රු.)	1,900.0	119.0	52.5	52.5	76.5	70.0	44.5	30.0	30.0	41.5
පහළ (රු.)	546.0	44.0	48.2	48.2	58.5	46.5	31.7	23.0	23.0	14.0
සමීප (රු.)	1,400.3	50.6	49.6	49.6	67.1	47.2	32.7	26.0	26.0	36.2
කොටසකට ඉපැයීම් (රු.)	3.34	0.86	2.44	5.79	7.87	7.47	6.40	8.72	7.35	10.94
මිල ඉපයීම් අනුපාතය	419.47	58.84	20.31	8.57	8.53	6.32	5.11	2.98	3.54	3.31
කොටසකට ශුද්ධ වත්කම් (රු.)	36.11	36.95	39.80	44.60	51.98	59.05	65.39	73.51	79.11	89.35
කළඹ										
හිමිකාරත්වය - රජයේ %	51	51	51	51	51	51	51	51	51	51
- පෞද්ගලික %	49	49	49	49	49	49	49	49	49	49
සේවක සංඛ්‍යාව	505	488	488	477	561	570	567	561	558	633
ශාඛා සංඛ්‍යාව	31	32	33	36	38	38	39	39	39	39
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව (ප්‍රවේශ)	255	360	652	775	854	3,000+	4,350	4,850	5,132	5,075

* - 2020 සිට ඉදිරියට කොන්ත්‍රාත් සේවකයන්ද සලකා බැලේ.

ආයතනික තොරතුරු

නම් හා ලිපිනයන්

ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බැංකුව
(ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව) මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය (වැඩිදුර විස්තර සඳහා පිටු අංක 124 හි අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව බලන්න).

ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය

ලිපිනය: තැ.පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02.

දුරකතනය	: 2356800, 2446241, 2446239, 2447354
ෆැක්ස්	: 2446392, 2356829, 2356827
වෙබ් අඩවිය	: www.hdfc.lk
විද්‍යුත් තැපෑල	: hdfc@hdfc.lk

නීතිමය පදනම

2003 අංක 15 හා 2011 අංක 45 දරන පනත් මඟින් සංශෝධිත 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ සංස්ථාපිත කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

කොටස් වෙළෙඳපොලෙහි ලැයිස්තුගත වීම

බැංකුව සාමාන්‍ය කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ආර්. එම්. ආර්. වසන්ති මංචනායක මහත්මිය (සභාපති)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන (අධ්‍යක්ෂ)
ආචාර්ය එස්. එන්. මොරායස් (අධ්‍යක්ෂ)
පී. ඒ. එස්. අතුල කුමාර මහතා (අධ්‍යක්ෂ)
එල්. ඊ. සුසන්ත සිල්වා මහතා (අධ්‍යක්ෂ)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ජයමහ (අධ්‍යක්ෂ)
ඩී. එම්. ඒ. කේ. දසනායක මහතා (අධ්‍යක්ෂ)
එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා (අධ්‍යක්ෂ)

සමාගම් ලේකම්

දර්ශනී ද සිල්වා මහත්මිය
නීතීඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් - MBA & LLM

දුරකතනය	: 2423362
විද්‍යුත් තැපෑල	: dharshani.d@hdfc.lk

රෙජිස්ට්‍රාර්වරු

එස්එස්පී කෝපරේට් සර්විසස් පුද්. සමාගම

ලිපිනය	: 101, ඇතුළු මල් පාර, කොළඹ 03.
දුරකතනය	: 2573894
ෆැක්ස්	: 2573609
විද්‍යුත් තැපෑල	: sspsec@sltnet.lk

ඉදිකිරීම් සමාජයක් ලෙස සංස්ථාපිත වර්ෂය

1984

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ස්ථාපිත වර්ෂය

2003

විගණක

විගණකාධිපති ජනරාල්

ශ්‍රේණිගත කිරීම්

බැංකුව වෙත ෆිච් රේටිං ලංකා පුද්. සමාගම වෙතින් BB +Stable (lka) ශ්‍රේණිගත කිරීම ලැබී තිබේ.

බැංකුකරුවන්

ලංකා බැංකුව
ආයතනික ශාඛාව, ඇචලන් චතුරස්‍රය, කොළඹ 1.
සම්පත් බැංකුව
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.
මහජන බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02.
කමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්
කමර්ෂල් මන්දිරය, යූනියන් පෙදෙස ශාඛාව, කොළඹ 02.
ජාතික රක්ෂණ භාර අරමුදල
අංක 242, යූනියන් පෙදෙස ශාඛාව, කොළඹ 02.
එම්සීබී බෑන්ක් ලිමිටඩ්
ප්‍රධාන ශාඛාව, අංක 8, ලීඩන් බැස්ටියන් පාර, කොළඹ 01.

ආයතනික කළමනාකාරිත්වය

පාලිත ගමගේ මහතා - ප්‍ර.වි.නි./කළමනාකාර අධ්‍යක්ෂ

ඒ. ජේ. අතුකෝරල මහතා - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

ඩබ්. ඩබ්. ඩී. එස්. සී. පෙරේරා මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති හා අයකර ගැනීම්

සී. ආර්. පී. බාලසූරිය මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර හා ගෙවීම්

එච්. ඒ. අනුර මහතා - ප්‍රධාන මූල්‍ය නිලධාරී

ඩී. එම්. ඩී. එම්. කේ. දිසානායක මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - ණය

කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් කළමනාකරණ හා සමාගම් ලේකම්

ඩබ්. එන්. ඩී. බොතේජු මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන

කේ. ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා - සහකාර කළමනාකාර - අනුකූලතා නිලධාරී

ඒ. එම්. නීලචන්ද්‍ර මහතා - ප්‍රධාන කළමනාකාර - තොරතුරු තාක්ෂණ

අයි. නිශාන්ත මහතා - ප්‍රධාන කළමනාකාර - අවදානම් කළමනාකරණ

ආයෝජක තොරතුරු

අනුර හෙට්ටිආරච්චි මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

දුරකතනය	: 2356802, 2446241, 2446239 D/L 2356802
ෆැක්ස්	: 2356829
විද්‍යුත් තැපෑල	: anura.h@hdfc.lk

Designed & Produced by
mediaWIZE®
Annual Reports



ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බැංකුව
තැ.පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02.